ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය



2021
වාර්ෂික වාර්තාව

ජල සම්පාදන අමාත්‍යාංශය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

පානීය ජලය සැපයීමේ වගකීම මුලින්ම පැවරී තිබුනේ පොදු වැඩ දෙපාර්තමේන්තුවට වන අතර පසුව එය 1965 දී ජල සම්පාදන දෙපාර්තමේන්තුව බවට පත් කරන ලදි. ඉන් පසුව 1975 දී සම්මත කළ පාර්ලිමේන්තු පණත මගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පිහිටුවන ලදි.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය දැනට ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබමින් පවතියි.

වාර්තාව පිළිබඳ දැනුම් දීම.

ජල සම්පාදන කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා
ජල සම්පාදන අමාත්‍යාංශය
ලක්දිය මැදුර
අංක 35, සුනිල් මාවත
පැලවත්ත - බත්තරමුල්ල.

ප්‍රිය මහත්මයාණෙනි,

වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන - 2021
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

1971 අංක 38 දරණ මූල්‍ය පණතේ 14 (2) වගන්තිය අනුව 2021 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔබ තුමන් වෙත මේ ගෞරවයෙන් ඉදිරිපත් කර සිටිනු ලැබේ.

මෙයට, ඔබේ විශ්වාසී

නිශාන්ත රණතුංග
සභාපති
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

දැක්ම :

තාක්ෂණ හා සේවා විශිෂ්ඨත්වය තුලින් ශ්‍රී ලංකාවේ අභිමානවත්ම උපයෝගීතා සැපයීමේ ආයතනය බවට පත්වීම.

මෙහෙවර :

පාරිභෝගික තෘප්තිමත්භාවය සහතික කෙරෙන තිරසාර විසඳුම් තුලින් ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් සැලසීමෙන් ජාතියට සේවය කිරීම.

ඉලක්ක:

- දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවත්නා යෝජනා ක්‍රමයන් හා දියත් කරනු ලබමින් පවත්නා ව්‍යාපෘතීන් (සේවා මට්ටම් වැඩි දියුණුකිරීම හා සේවා ආවරණය නංවාලීම).
- නව ව්‍යාපෘතීන් (සේවා ආවරණය නංවාලීම).
- ණය සේවා හා අතිරේක ආදායම් උත්පාදනය
- අය ක්‍රම ප්‍රතිපත්තිය හා ආදායම නංවාලීම.
- දැනට පවත්නා සංවිධාන ව්‍යුහයෙහි හා ක්‍රියාත්මක වීමෙහි ඵලදායිතාවය හා කාර්යක්ෂම තාවය වැඩි දියුණු කිරීම.
- ව්‍යාපාරික කාර්යක්ෂමතාවය සඳහා සංවිධානමය ප්‍රතිසංස්කරණ.

අන්තර්ගත මාතෘකා

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වාර්තාව පිළිබඳ දැනුම් දීම i
දැක්ම, මෙහෙවර සහ ඉලක්ක ii

ආයතනික පරිපාලනය

ආයතනික පරිපාලනය 01
සංවිධාන ව්‍යුහය 08
ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ පණිවුඩය 11
සභාපතිතුමාගේ ප්‍රකාශය 12

ප්‍රමුඛ ව්‍යාපාරික හා සංඛ්‍යා ලේඛනාත්මක විශ්ලේෂණය

ක්‍රියාත්මක තත්වයේ පවතින ජල සම්පාදන යෝජනා ක්‍රම 16
සාමූහික සැලැසුම් 17
ජල සම්පාදනයේ හා ජල පිළිසැකැස්මේ ප්‍රධාන කාර්ය සාධනය 20
මෙහෙයුම් සාරාංශය 22
ආයෝජන සාරාංශය 26
කාර්ය මණ්ඩලය 28

අවදානම් තක්සේරුව හා ලිහිල් කිරීමේ ක්‍රමෝපායයන්

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - ව්‍යවසායික අවදානම කළමනාකරණය කිරීම 32

මූල්‍ය හා මෙහෙයුම් ක්‍රමෝපායයන් විශ්ලේෂණය කිරීම

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ විශ්ලේෂණය 36
මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳ විශ්ලේෂණය 37

කළමනාකරණයේ සාකච්ඡා හා ආර්ථික අගය එකතු කිරීම පිළිබඳ ප්‍රකාශය

මිනිස් බල සංවර්ධනය හා පුහුණුව 42
සේවයේ උත්කෘෂ්ඨභාවය හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ විසඳුම් 44
වාණිජ ක්‍රියාකාරකම් 45
ග්‍රාමීය ජල සම්පාදනය හා සනීපාරක්ෂණය 46
පොදු ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන 47
බල ශක්ති කළමනාකරණය 48
මධ්‍යම රසායනාගාරය 49
ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම 49
භූගත ජලය 49
සැපැයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය 50
සංවර්ධනය 51
පර්යේෂණ හා සංවර්ධනය 51
භූගෝලීය තොරතුරු පද්ධතිය හා සිතියම්කරණය 52
ජලය සඳහා ඉඩම් ලබා ගැනීම 52
පාරිභෝගිකයා හා වත්කම් කළමනාකරණය 53
ජල සම්පාදන හා සනීපාරක්ෂණ සේවාවන්ගේ උත්කෘෂ්ඨ භාවය පිළිබඳ මධ්‍යස්ථානය (CEWAS) 55
ජල පිළිසැකැසුම් අංශය 55
දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතින විදේශීය/ දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන් 56
පෙළ ගස්වනු ලැබ ඇති ව්‍යාපෘතීන් 69
ක්‍රම සම්පාදනය හා සැලැසුම් කිරීම (ජල සම්පාදන ව්‍යාපෘතීන්) 69
ක්‍රියාත්මක වන ජල පිළිසැකැසුම් යෝජනා ක්‍රම 73
ක්‍රියාත්මක කරනු ලබමින් පවතින ජල පිළිසැකැසුම් ව්‍යාපෘතීන් 74
ක්‍රම සම්පාදනය හා සැලැසුම් කිරීම (ජල පිළිසැකැසුම්) 77

යටිතල පහසුකම් සංවර්ධනය

ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථාන 82
තිරසාර භාවය හා හදිසි අවස්ථා ප්‍රතිචාර 95
විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව 97
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 103
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 129
කෙටි යෙදුම් 165
සංස්ථානික තොරතුරු 167



“ ජලය නැත, ජීවිතයක් නැත, නිල් වර්ණයක් නැත, හරිත වර්ණයක් නැත.”
සිල්වියා අර්ල්

ආයතනික පරිපාලනය



විසල් දඹුල්ල ජල පවිත්‍රාගාරය

ආයතනික පරිපාලනය

නිවැරදි පරිපාලනයක් හා අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපිත කිරීම මගින් සංවිධානයේ අගය හා පුරවැසියන් වෙත සලස්වනු ලබන (සමාජීය හෝ මූල්‍ය) ප්‍රතිලාභයන් සහතික කිරීම සඳහා අඛණ්ඩ පරිදි පාරදෘෂ්‍ය භාවය ක්‍රියාත්මක කිරීම හරහා මණ්ඩලයේ ක්‍රියාකාරකම් හා සම්බන්ධ වන විවිධ නියෝජිතයින් සමග විශ්වාසනීයත්වය පිළිබඳ වාතාවරණයක් ගොඩ නගා ගැනීම හා එය දිගටම පවත්වාගන යාම වැදගත් වේ. මෙම තත්ත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික අරමුණු සාක්ෂාත් කර ගන්නා අතරම ආයතනික පරිපාලන ක්‍රමෝපායයන් යොදා ගැනීම ඉතා වැදගත් වේ.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යනු ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වනු ලබන ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වේ. එහි මෙහෙයුම් කටයුතු සිදු කරගෙන වනු ලබන ගත වූ වසර 47 ක කාල සීමාව තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් එහි ආවරණය හා සේවා මට්ටම සැලැකිය යුතු අන්දමින් ව්‍යාප්ත කරනු ලැබ තිබේ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන රාජකාරි කටයුතු ඉටු කිරීමෙහි වගකීම් භාරය දරා සිටිනු ලැබේ.

- දේශීය හා විදේශීය අරමුදල් හා ප්‍රදානයන්ගේ සහාය ලබා ගනිමින් ජල සම්පාදන හා මලාපවහන ව්‍යාපෘතීන් සැලැසුම් කිරීම, ක්‍රමසම්පාදනය හා ඉදි කිරීම.
- ගණුදෙනුකරුවන් වෙත තෘප්තිදායක සේවාවක් සම්පාදනය කර දීමේ අරමුණ සහිතව ජල සම්පාදන හා මලාපවහන යෝජනා ක්‍රමයන්හි ක්‍රියාත්මක හා නඩත්තු කටයුතු සිදු කිරීම.
- පාරිභෝගිකයාට දරා ගත හැකි අය ක්‍රමයක් හරහා ජල ගාස්තු අය කිරීම.
- ප්‍රජා මූල සංවිධානයන්, පලාත් පාලන අධිකාරීන් හා පෞද්ගලික / රාජ්‍ය අංශ ආයතනයන් වෙත පානීය ජල සම්පාදනය සම්බන්ධයෙන් තාක්ෂණික සහාය ලබා දීම.

ආයතනයේ අභ්‍යන්තර හා බාහිර නියාමනය

බාහිර නියාමනය සඳහා වන ව්‍යවස්ථාපිත පනත් හා චක්‍රලේඛ

- 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පණත හා 1992 අංක 13 දරණ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පණත
- මුදල් පණත
- 2018 අංක 19 දරන ජාතික විගණන පණත
- භාණ්ඩාගාර චක්‍ර ලේඛන
- මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලැබ ඇති රජයට අයත් ව්‍යවසායයන් (SOE) හි පාලනය සඳහා වූ මාර්ගෝපදේශයන්

අභ්‍යන්තර නියාමනය සඳහා වන ප්‍රතිපත්ති හා යාන්ත්‍රණයන්

- සාමූහික සැලැසුම
- බඳවා ගැනීමේ හා තෝරා ගැනීමේ ප්‍රතිපත්තීන්
- විනය සංග්‍රහය
- රථ වාහන භාවිතාව පිළිබඳ ප්‍රතිපත්තිය
- සේවක දුක් ගැනැවිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ ප්‍රතිපත්තිය
- අභ්‍යන්තර චක්‍ර ලේඛන
- පාරිභෝගික ප්‍රඥප්තිය
- වාණිජ මෙහෙයුම්, මානව සම්පත් කළමනාකරණය හා ව්‍යාපෘති කළමනාකරණය සඳහා වූ තොරතුරු තාක්ෂණ පද්ධතිය

අධ්‍යක්ෂ මණ්ඩලය

ආයතනයේ කටයුතු වල මනා විනිවිදභාවය හා වගවීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට අමතරව ඒ ඒ කමිටු වෙත පවරනු ලැබ ඇති කරුණු සමාලෝචනය කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටුව, බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සමාලෝචන කමිටුව හා වෙනත් අනු කමිටු ගණනාවක් පත් කර ඇත.



අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව හා වගකීම

සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෝ සිය නිල රාජකාරී කටයුතු ඉටු කිරීමේදී ක්‍රමෝපාය, කාර්ය සාධනය හා ව්‍යාපාරික කටයුතු වල ප්‍රමිතිය හා සම්බන්ධ ගැටළු පිළිබඳව අවංක භාවය පිළිබඳ ඉහළ හැඟීමක් හා ස්වාධීන විනිශ්චය හා මිශ්‍ර වූ සිය දක්ෂතාවයන් හා දැනුම සමග කටයුතු කරති. ස්වාධීන හා විධායක නොවන අධ්‍යක්ෂ වරුන්ගේ වග කීම වන්නේ සභාපති වරයා හා සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් ඉදිරිපත් කරනු ලබන පහත සඳහන් යෝජනාවන් සම්බන්ධයෙන් සිය ස්වාධීන මතය ඉදිරිපත් කිරීම වේ.

- රැස්වීම ආරම්භ කිරීමට පෙර සියළුම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවන් කියවා බැලීමෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලයේ වැඩ කටයුතු වලට ක්‍රියාකාරී ලෙස සහභාගි වීම.
- ආයතනයේ ඉලක්කයන් හඹා යාම සඳහා වූ මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන ක්‍රමෝපායයන් සකස් කිරීමෙහි ලා නිර්දේශයන් හා මග පෙන්වීම් ඉදිරිපත් කිරීම.
- මූල්‍ය, මානව සම්පත් හා සමූහික සැලැසුම් සමාලෝචනය කර අනුමත කිරීම.
- ආයතනයේ මෙහෙයුම් කටයුතු ආයතනික විෂය පථය තුළ හා පණතේ විධි විධානයන් අනුව ක්‍රියාත්මක කරනු ලබන බවට වග බලා ගැනීම.
- පාලන පද්ධතිය හා අනුකූල තාවය පසු විපරම් කිරීම.
- ප්‍රතිපත්තීන්ට අදාල සියළුම තීරණ සැලැසුමේ අනුමත විෂය පථය තුළ ගැනීම.
- අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණ පද්ධතීන් අධීක්ෂණය කිරීම.
- විශේෂිත වශයෙන්ම ක්‍රමෝපායික මග පෙන්වීම් ඵලදායක ලෙස ක්‍රියාත්මක කිරීම පහසුකරණය කිරීමෙහි ලා උපයෝගී වන මෙහෙයුම් හා අදාල තීරණයන් ගැනීමේදී කළමනාකරණය වෙත ප්‍රමාණවත් ලෙස අධිකාරී බලය දෙනු ලැබ ඇති බවට වග බලා ගැනීම.
- ව්‍යවස්ථානුකූල ලේඛනයන් තුළ කිසියම් සංශෝධනයන් කරනු ලැබ තිබේ නම් ඒවා අනුමත කිරීම.
- අදාල සියලුම පාර්ශවයන් සමග කරනු ලබන සියළුම ගනුදෙනු ව්‍යවස්ථානුකූලව කරනු ලබන බවට වග බලා ගැනීම.
- හොඳම ප්‍රාගුණ්‍යයන් යොදා ගැනීම. බැඳියාවන් හා බැඳියා පිළිගැටුම් කිසිවක් තිබේ නම් ඒවා සම්බන්ධව සභාපති වරයා දැනුවත් කිරීම හා වාර්ෂිකව නව ප්‍රකාශනයන් කිරීම සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙතින් අපේක්ෂා කරනු ලැබේ.

සභාපතිවරයාගේ භූමිකාව

සභාපතිවරයාගේ ප්‍රධාන භූමිකාව වන්නේ මණ්ඩලයේ අභිමතාර්ථයන් හා ඉලක්ක ලඟා කර ගැනීම සඳහා වන ඵල දායක ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට හා අනු කමිටු වලට නායකත්වය දෙමින් එම කමිටු කළමනාකරණය කිරීම වන්නේය. ආයතනයෙන් පිටත බාහිර පාර්ශවයන් සමග කටයුතු කිරීමේදී ආයතනය නියෝජනය කරනු ලබන්නේ සභාපති වරයා විසින් වන අතර ආයතනික පරිපාලනයේ සියළුම පැතිකඩයන් සම්බන්ධයෙන් අදාල පාර්ශවයන් සම්බන්ධීකරණය සිදු කරනු ලබන්නේ සභාපති වරයා විසිනි.

මූල්‍ය කටයුතු හා සම්බන්ධ විෂය පිළිබඳව තමන්ගේ විශේෂිත විෂය දැනුම මඟින් හේතූන් හා විනිශ්චය මත පදනම් වූ ඵලදායී මූල්‍ය මග පෙන්වීම් ලබා දීමේ හැකියාව මහා භාණ්ඩාගාරයේ නියෝජිත අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකවරිය සතුව තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීනත්වය රැක ගැනීම සඳහා සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම පිණිස අවශ්‍යයැයි හැඟෙන අවස්ථාවන්හිදී ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගනියි. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනයට භාජනය කරනු ලබන වර්ෂය තුළදී නෛතික, ප්‍රවර්ධන, ප්‍රසම්පාදන හා තොරතුරු තාක්ෂණ කාරණා සම්බන්ධයෙන් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගන්නා ලදි.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ භූමිකාව

- නිවැරදි ලෙස සිය වගකීම් ඉෂ්ඨ කිරීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය හා එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත මග පෙන්වීම්, ආචාර ධර්ම හා පාලනය සම්බන්ධයෙන් මධ්‍ය ප්‍රභවයක් වශයෙන් කටයුතු කිරීම.
- සභාපති වරයා හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය ලබා දීම.
- සියළුම කාර්ය පටිපාටීන් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් හා ආයතනයට අදාල හොඳම ප්‍රාගුණ්‍යයන් අනුගමනය කරමින් සිදු කරනු ලබන බවට සහතික කිරීම.
- නව ප්‍රාගුණ්‍යයන් හා නියාමනය සම්බන්ධ වෙනස් කම් ඇසුරෙන් පරදු ධාරීන්ගේ අවශ්‍යතාව මත සමස්ත පාලන රාමුව ක්‍රමවත් ලෙස සමාලෝචනයට භාජනය කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පාලනය කරනු ලබන පටිපාටිය අනුගමනය කිරීම; වගකීම්, රීතීන් හා රෙගුලාසීන් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මග පෙන්වීම හා උපදෙස් ලබා දීම.
- රැස්වීම පවත්වනු ලැබීමට අඩු තරමින් දින 5 කට පෙර සාකච්ඡා කරනු ලැබීමට නියමිත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවන් අධ්‍යක්ෂ මණ්ඩලය අතර නිසි ලෙස බෙදා හරිනු ලබන බවට වග බලා ගැනීම.
- තීරණය හදිසි කාරණාවක් සම්බන්ධයෙන් වන කල්හී හැර කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් සංසරණය මඟින් ගනු නොලබන බවට වග බලා ගැනීම.
- සභාපති වරයා සමග එක් වී රැස්වීම් න්‍යාය පත්‍ර පිළියෙල කිරීම හා රැස්වීමට ඉදිරිපත් කරනු ලැබීමට නියමිත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා, සංදේශ හෝ ඉදිරිපත් කිරීම් සම්බන්ධයෙන් ප්‍රධාන විධායක නිලධාරී තැන හා කළමනාකරණය සමග සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවීම හා ඒවාට සහභාගි වීම සහ උචිත ආකාරයකට අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු හා සම්බන්ධ අතිශයින්ම නිවැරදි රැස්වීම් වාර්තා පවත්වාගෙන යාම.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටු වල ලේකම් වරයා වශයෙන් අදාල කටයුතු ඉටු කිරීම.
- කොටස් කරුවන් සමග පවත්වනු ලබන මහා සභා රැස්වීම් හෝ වාර්ෂික කාර්ය සාධන සමාලෝචන රැස්වීම් පවත්වනු ලැබීමට අවශ්‍ය වැඩ පිළිවෙල අදාල පරිදි සකස් කිරීම.
- ආයතනික වාර්ෂික වාර්තාව, ගිණුම් වාර්තා හා අතුරු වාර්තාවන් පළ කිරීමේදී හා බෙදා හැරීමේදී ආයතනයේ අභ්‍යන්තර හා බාහිර උපදේශකයින් සමග සාකච්ඡා කරමින් එම කටයුතු සම්බන්ධීකරණය කිරීම.

සංවිධානයට අදාල මෙහෙයුම් හා සංවිධානයේ පාලනය පිළිබඳ කරුණු සාකච්ඡා කිරීම සඳහා මසකට නොවැඩි කාල අන්තරයන් අතර අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රමවත් ලෙස රැස් වනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට අදාල සියළුම රැස්වීම් වාර්තා හා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවන් ප්‍රලේඛනය කරනු ලබන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇතැම් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අවසාන තීරණ ගැනීමේ හිමි කම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත රඳවා තබා ගනිමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටු වෙත පවරනු ලැබ ඇත. සැලැකිල්ලට භාජනය කළ යුතුව ඇති කාරණා සවිස්තරාත්මක ලෙස විශ්ලේෂණය කිරීමේ හා විවාදාත්මක කරුණු විසඳීමේදී උපායශීලී ප්‍රවේශයක් අනුගමනය කිරීමේ හැකියාව මේ හරහා ලැබී තිබේ. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත කාර්යයන් පවරනු ලැබ ඇත්තේ ඒ ඒ අයගේ විශේෂඥතාවයන් වෙත අවධානය යොමු කරමින් වේ. මීට අමතරව ගැඹුරු ලෙස විශ්ලේෂණය කිරීම අවශ්‍ය වන අවසථාවන් සඳහා අවස්ථා විශේෂිත අනු කමිටු ද කලින් කල පත් කරනු ලැබිණ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතුව ඊටම අයත් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවක් ක්‍රියාත්මක වන අතර එය සමන්විත වන්නේ විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ වරුන් 3 දෙනෙකුගෙන් වන අතර, එකී විගණන කමිටුවේ රැස්වීම් වාර්තාවන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වල න්‍යාය පත්‍ර අයිතමයක් වශයෙන් ගනු ලැබිණි.

2021 මුදල් වර්ෂය තුළදී පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් න්‍යාය පත්‍රයන් තුළ පහත සඳහන් කරුණු හා අයිතමයන් ඇතුලත් විය :

- පසුගිය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තාව අනුමත කිරීම
- එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවෙන් පැන නැගෙන කරුණු
- ප්‍රගති සමාලෝචනය
- ව්‍යවස්ථාපිත කාරණා
- පාර්ලිමේන්තුව තුළ පැන නැගුන ප්‍රශ්න
- ප්‍රතිපත්තීන්ට අදාල කාරණා හා අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ හෝ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු කාරණා
- විගණකාධිපති වරයාගේ විමසුම් හා වාර්තාව
- පෞද්ගලික කාරණා
- වෙනත් කරුණු

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගිත්වය

අධ්‍යක්ෂ මණ්ඩලය සෑම මසක් තුළදීම හා එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම අවශ්‍ය කරන තත්ත්වයන් යටතේ වෙනත් අවස්ථාවන්හිදී ද රැස් විය. විසංගත සමය තුළ නිරෝධායනය කරනු ලැබීමට භාජනය වූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් මෙන්ම එහි මෙහි යාම සීමා කරනු ලැබ තිබී කාලයන් තුළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සූම් (Zoom) තාක්ෂණය ඔස්සේ රැස්වීම් වලට සහභාගි වූහ.

		අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම		විගණන හා කළමනාකරණ රැස්වීම	
		නියමිත රැස්වීම් සංඛ්‍යාව	සහභාගි වූ රැස්වීම් ගණන	නියමිත රැස්වීම් සංඛ්‍යාව	සහභාගි වූ රැස්වීම් ගණන
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයාගේ නම	**තනතුර**				
නිශාන්ත රණතුංග මහතා	සභාපති	17	17 න් 17	අදාල නැත	අදාල නැත
නිමල් ආර්. රණවක මහතා	උප සභාපති	17	17 න් 16	අදාල නැත	අදාල නැත
ඉංජි.ටී.එම්.ආර්.පී.තෙන්නකෝන්	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	17	17 න් 15	7	7 න් 6
ඉංජි.ලක්ෂ්මන් රණසිංහ	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	17	17 න් 17	අදාල නැත	අදාල නැත
නයනා නාතවිතාරණ මිය****	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	4	4 න් 4	අදාල නැත	අදාල නැත
ඒ. ආර්. වික්‍රමසිංහ මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	17	17 න් 17	7	7 න් 7
බී.එන්. දම්මින්ද කුමාර මහතා**	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	12	12 න් 12	2	7 න් 2
වෛද්‍ය වී. ටී.එස්. කේ. සිරිවර්ධන ***	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	12	12 න් 12	අදාල නැත	අදාල නැත
වෛද්‍ය එල්.. ටී. ගම්ලත් *	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	3	3 න් 3	අදාල නැත	අදාල නැත
ඩබ්.එම්. ආර්. පී. වීරසිංහ මහතා - නිරීක්ෂක	අති. ලේකම් ජල සම්පාදන අමාත්‍යාංශය	17	17 න් 16	අදාල නැත	අදාල නැත

* වෛද්‍ය එල්. ටී. ගම්ලත් 2021 පෙබරවාරි 8 වැනි දින විශ්‍රාම ගත්තේය.

** බී. එන්. දම්මින්ද කුමාර මහතා 2021 අගෝස්තු 09 වැනි දින ඉල්ලා අස් විය.

*** වෛද්‍ය වී. ටී. එස්. කේ. සිරිවර්ධන 2021 මාර්තු 12 වැනි දින පත් කර ගන්නා ලදි.

**** නයනා නාතවිතාරණ මහත්මිය 2021 සැප්තැම්බර් 23 වැනි දින පත් කර ගන්නා ලදි.

අධ්‍යක්ෂ මණ්ඩලය



නිශාන්ත රණතුංග මහතා (සභාපති)

දක්ෂතා හා විශේෂඥතාවය

- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය, 2003 සැප්තැම්බර්, බටහිර සිඩ්නි විශ්ව විද්‍යාලය
- පෞද්ගලික අංශයේ හා මාධ්‍යයේ වසර 20 කට අධික පෘථුල කළමනාකරණ අත් දැකීම් හා
- සංනිවේදන, රාජ්‍ය පරිපාලන හා ව්‍යාපාර කළමනාකරණ අත් දැකීම් හා හැකියාවන්

වෙනත් සංවිධානයන් තුළ දරණ ලද තනතුරු:

- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී
- සීමා සහිත මිහින් එයාර් (පෞද්ගලික) ගුවන් සේවයේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී
- ප්‍රචාරක සංගමයේ ආසියානු ආයතනයේ උප සභාපති
- සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ සභාපති හා අධ්‍යක්ෂ
- සීමා සහිත මොබිටෙල් (පෞද්ගලික) ආයතනයේ අලෙවි කළමනාකරු



නිමල් ආර්. රණවක මහතා (උප සභාපති)

දක්ෂතා හා විශේෂඥතාවය

- නීතිඥ වෘත්තිය

වෙනත් පත් වීම්

- සභාපති, ප්‍රජාතන්ත්‍රවාදී වාම පෙරමුණ

වෙනත් සංවිධානයන් තුළ දරණ ලද තනතුරු:

- සභාපති, රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
- ශ්‍රමික හා සුභ සාධන උපදේශක - සෞදි අරාබියානු රාජයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය



වෛද්‍ය ලක්ෂ්මන් ගම්ලත් (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)

දක්ෂතා හා විශේෂඥතාවය

- සෞඛ්‍ය අමාත්‍යාංශයේ පාරිසරික සෞඛ්‍යය, වෘත්තීය සෞඛ්‍යය හා ආහාර සුරක්ෂිතතාව පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
- ආහාර උපදේශක කමිටුවේ සාමාජික
- ශ්‍රී ලංකාව සඳහා වූ ජාතික කොඩෙක්ස් සම්බන්ධීකරණ ලක්ෂ්‍යය
- ශ්‍රී ලංකාව සඳහා වූ ජාතික ඉන්ෆෝසාන් (INFOSAN) සම්බන්ධීකරණ ලක්ෂ්‍යය

වෙනත් සංවිධානයන් තුළ දරණ ලද තනතුරු:

- පලබෝධ නාශක උපදේශක කමිටුවේ සාමාජික
- ජාතික වෘත්තීය ප්‍රමන්ත්‍රණ කමිටුවේ සාමාජික



වෛද්‍ය වී.ටී.එස්.කේ. සිරිවර්ධන (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)

දක්ෂතා හා විශේෂඥතාවය

- වෛද්‍ය උපාධිය (රුහුණ), විද්‍යාපති වෛද්‍ය පරිපාලනය - කොළඹ)
- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - වැඩ බලන (පාරිසරික සෞඛ්‍යය, වෘත්තීය සෞඛ්‍යය හා ආහාර සුරක්ෂිතතාව) 2021 සිට 2022 දක්වා
- වසර 16 ක කාලයක් තුළ වෛද්‍ය පරිපාලකයකු වශයෙන් කටයුතු කිරීම

වෙනත් පත් වීම්

- ආහාර උපදේශක කවුන්සිලයේ ලේකම්
- ආහාර උපදේශක කමිටුවේ සෞඛ්‍ය හිමිකම් පෑම්, රෙගුලාසි හා තාක්ෂණික යන අනු කමිටු වල සභාපති
- සභාපති, මහජන සෞඛ්‍ය ආහාර රසායනාගාරයන්ගේ සභාපති
- වෛද්‍ය විද්‍යාලයයීය වෛද්‍ය පරිපාලකයින්ගේ කවුන්සිලයේ සාමාජික

වෙනත් සංවිධානයන් තුළ දරණ ලද තනතුරු

- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, දෙහිඕවිට 1989 සිට 1996
- අංගොඩ මානසික ආරෝග්‍ය ශාලාවේ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී - 1996 සිට 2003 දක්වා
- වැඩ බලන අධ්‍යක්ෂ, රත්නපුර මහ රෝහල - 2004 සිට 2006 දක්වා
- මොණරාගල දිස්ත්‍රික්කයේ හා කොළඹ දිස්ත්‍රික්කයේ කලාපීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ - 2006 සිට 2014 දක්වා
- සෞඛ්‍ය අමාත්‍යාංශයේ බෝ නොවන රෝග අංශයේ අධ්‍යක්ෂ - 2014 සිට 2019 දක්වා
- අධ්‍යක්ෂ, පාරිසරික සෞඛ්‍යය, වෘත්තීය සෞඛ්‍යය හා ආහාර සුරක්ෂිතතාව - 2019 සිට 2022 දක්වා.



බී. එන්. දමින්ද කුමාර මහතා (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)

දක්ෂතා හා විශේෂඥතාවය

- සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- රාජ්‍ය පරිපාලනය පිළිබඳ සහතිකය
- මයික්‍රොසොෆ්ට් ඔෆිස් යොදා ගැනීම් පිළිබඳ සහතිකය
- පරිපාලන කටයුතු වලට අදාල වන ඉංග්‍රීසි භාෂාව

වෙනත් පත් වීම්

- පළාත් සභා හා පලාත් පාලන පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වරයා ලෙස කටයුතු කරයි

අනිකුත් සංවිධානයන් තුළ දරණ ලද තනතුරු

- සභාපති, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විශ්‍රාම මණ්ඩල ඒකකය - 2015 සිට 2016 දක්වා
- තිරසාර බල ශක්ති අධිකාරී මණ්ඩලයේ සාමාජික - 2018 සිට 2019 දක්වා
- ජල මණ්ඩලයේ සාමාජික - 2020 සිට 2021 දක්වා



අකලංකා රසුජානි වික්‍රමසිංහ මහත්මිය

(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකා)

දක්ෂතා හා විශේෂඥතාවය

- මූල්‍ය කටයුතු පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය
- ආශ්‍රිත වර ලත් කළමනාකරණ ගණකාධිකාරී (එක්සත් රාජධානිය)
- කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනය (ඇමෙරිකා එක්සත් ජනපදය)
- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යා උපාධිය
- ඕස්ට්‍රේලියානු පරිගණක සංගමයේ සාමාජික
- රජය සතු ව්‍යවසායයන් සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම
- රජය සන්තක ව්‍යවසායයන් අධීක්ෂණය කිරීමේ හා පසු විපරම් කිරීමේ වසර 15 ක පළ පුරුද්ද

වෙනත් පත් වීම්

- මුදල් අමාත්‍යාංශය යටතේ වූ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ
- මණ්ඩල අධ්‍යක්ෂ, සීමා සහිත රොබෝ විද්‍යාවේ උත්කෘෂ්ඨ තාවය වෙනුවෙන් වූ (පෞද්ගලික) මධ්‍යස්ථානයේ මණ්ඩල අධ්‍යක්ෂ

වෙනත් සංවිධානයන් තුළ දරණ ලද තනතුරු

- මණ්ඩල අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා වතු සංස්ථාව - 2011 සිට 2015 දක්වා
- මණ්ඩල අධ්‍යක්ෂ, සීමා සහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම - 2011 සිට 2015 දක්වා
- මණ්ඩල අධ්‍යක්ෂ, සීමා සහිත බී සී සී ලංකා පෞද්ගලික සමාගම - 2015 සිට 2019 දක්වා



නයනා නාතවිතාරණ මහත්මිය (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකා)

දක්ෂතා හා විශේෂඥතාවයන්

- වාණිජ (විශේෂ) ශාස්ත්‍රවේදී උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
- විමධ්‍යගත කිරීම හා රජයන් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
- ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව (එක් අවුරුදු පාඨ මාලාව), ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, කොළඹ 07

වෙනත් පත් වීම්

- පලාත් සභා හා පලාත් පාලන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ පරිපාලන හා පුහුණු ක්‍රියාකාරකම් පිළිබඳ සමස්ත අධීක්ෂණය
- පලාත් සභා හා පලාත් පාලන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන විදේශ අරමුදල් උපයෝගි කර ගනිමින් දියත් කරනු ලැබ ඇති ව්‍යාපෘතීන් නියාමනය කිරීම සඳහා වූ ජාතික මෙහෙයුම් කමිටුවේ සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීම.
- පාර්ලිමේන්තු උපදේශක කමිටුව හා අය වැය විවාදය සම්බන්ධීකරණය කිරීමේ වැඩ කටයුතු
- දේශීය හා විදේශීය පුහුණු කිරීම් වැඩ සටහන් හා සම්බන්ධ පරිපාලන වැඩ කටයුතු
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක වශයෙන් කටයුතු කිරීම
- ශ්‍රී ලංකා තිරසාර බල ශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක වශයෙන් කටයුතු කිරීම

වෙනත් සංවිධානයන් තුළ දරණ ලද තනතුරු

- රත්නපුර දිස්ත්‍රික්කයේ සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුර
- බලංගොඩ සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුර
- දැරණියගල සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුර
- සබරගමුව පලාත් සභාවේ සමුපකාර සේවා කොමිෂන් සභාවේ ලේකම් තනතුර
- කෑගල්ල දිස්ත්‍රික්කයේ (මාවනැල්ල, දෙහිඕවිට හා දැරණියගල) සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුර
- තිඹිරිගස්යාය සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුර
- විද්‍යා හා තාක්ෂණ වේද අමාත්‍යාංශයේ සහකාර ලේකම් තනතුර
- කාන්තා සවි බල ගැන්වීම් හා සමාජ සුභ සාධන අමාත්‍යාංශයේ ළමා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ තනතුර
- රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුර
- කම්කරු දෙපාර්තමේන්තුවේ (ක්‍රම සම්පාදන, පර්යේෂණ, පුහුණු කිරීම් හා පළ කිරීම් අංශයේ) කොමසාරිස් තනතුර
- පොල් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර
- පලාත් පාලන හා පලාත් සභා අමාත්‍යාංශයේ (පරිපාලන හා පුහුණු කිරීම්) අතිරේක ලේකම් තනතුර



ආර්. ඒ. සරත් ලක්ෂ්මන් රණසිංහ මහතා (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)

දක්ෂතා හා විශේෂඥතාවය

- වර ලත් ඉංජිනේරු (HMIE, MIIE, FIAE (SL) – සාමාජික අංකය 1ESL (HMIE 6172)EC ලියාපදිංචි අංකය 103678
- උපදේශක යාන්ත්‍රික ඉංජිනේරු, ලියා පදිංචි පාඩු සැකැසුම් කරු, රජයේ බලය ලත් ආරක්ෂක පරීක්ෂක ඉංජිනේරු, ISO 9000/2000 උපදේශක
- විනාශ නොවන පරීක්ෂක (SM)
- ජාතික වෘත්තීය සුදුසු කම් 5 හා 6 මට්ටම් තක්සේරු කරු
- මුළු දිවයිනටම සමාදාන විනිශ්චයකාර

වෙනත් පත්වීම්

- උපදේශක ඉංජිනේරු

වෙනත් සංවිධානයන්හි දරණු ලබන තනතුරු

- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව - මෝටර් තාක්ෂණික සහකාර සාමාන්‍යාධිකාරී
- ජනතා පොහොර ව්‍යසායයන් හා සම්බන්ධ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු/ කළමනාකරු
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ඉංජිනේරු වරයකු වශයෙන් අනුයුක්ත වී සිටීම.



ටී. එම්. ආර්. පී. තෙන්නකෝන් මහතා (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)

දක්ෂතා හා විශේෂඥ තාවය

- ව්‍යුහාත්මක ඉංජිනේරු සැලැසුම්කරණය
- ඉදිකිරීම් ව්‍යාපෘති කළමනාකරණය
- ගොඩනැගිලි ඉදිකිරීම් උපදේශක

වෙනත් පත් කිරීම්

- විනිශ්චයකාර නිවාසයේ 2 වැනි අදියර හා 3 වැනි අදියර ව්‍යාපෘතියේ
- මහාධිකරණ හා දිස්ත්‍රික් අධිකරණ සංකීර්ණයේ 2 වැනි අදියර
- අධිකරණ අමාත්‍යාංශයේ හා විනිශ්චයකාර වරුන්ගේ ආයතනයේ 3 වැනි අදියර

  මෙම ව්‍යාපෘතීන්ගේ උපදේශක ඉංජිනේරු වරයා ලෙස කටයුතු කිරීම.
- හේලීස් පෙන්ටන්ස ආයතනයේ උපදේශක ඉංජිනේරු

  වෙනත් සංවිධානයන් තුළ දරණු ලබන තනතුරු
- සීමා සහිත ෆ්‍රී ලාන්ස් ඇන්ඩ් ඇඩ්වකසි පෞද්ගලික ආයතනයේ උපදේශක ඉංජිනේරු වරයා වශයෙන් කටයුතු කිරීම.
- සීමා සහිත තුඩාව සහෝදර සමාගමේ ව්‍යාපෘති කළමනාකරු වශයෙන් කටයුතු කිරීම.
- සීමා සහිත තුඩාව සහෝදර සමාගමේ වැඩ බිම් භාර ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු වරයා වශයෙන් කටයුතු කිරීම
- සීමා සහිත තුඩාව සහෝදර සමාගමේ වැඩ බිම් කළමනාකරු වශයෙන් කටයුතු කිරීම.
- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නේවාසික ඉංජිනේරු වරයා වශයෙන් කටයුතු කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් විසින් සම්මත කර ගන්නා ලද යෝජනාවකට අනුව මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් පහත සඳහන් ප්‍රකාශය කරන ලදි :

අ. ඔවුන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිය සේවයෙහි යොදවනු ලැබ නැත්තේය.

ආ. තමන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් පත් කරනු ලැබ සිටින වර්ෂ 2 ක කාලය තුළ ස්ථිතිය සමග සෘජු ලෙස හෝ වක්‍ර ලෙස කිසිදු වැදගත් භෞතික ව්‍යාපාරික සම්බන්ධතාවයක් පවතින්නේ නැත.

ඇ. ඔවුන් කිසිවෙක් ගත වූ වසර 5 ක කාලය තුළදී පාර්ලිමේන්තු මන්ත්‍රී වරයකු, පලාත් සභා මන්ත්‍රී වරයකු හෝ පලාත් පාලන ආයතනයක මන්ත්‍රී වරයකු වශයෙන් ඡන්දයෙන් පත් කර ගනු ලැබ නැත.

ඈ. මෙම රජයට අයත් ව්‍යවසාය සිය විෂය පාත්‍රතාවය යටතේ ඇති රේඛීය ඇමැතිවරයා / රාජ්‍ය ඇමතිවරයා හෝ නියෝජ්‍ය ඇමතිවරයා සමග සමීප පවුල් සම්බන්ධතාවයක් ඔවුන් සතුව නැත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලදි.

සම්පූර්ණ නම : නිශාන්ත රණතුංග

තනතුර : සභාපති

අත්සන :

දිනය : 2022. 05. 27

සංවිධාන ව්‍යුහය



අධ්‍යක්ෂ මණ්ඩලය

1. සභාපති
2. උප සභාපති
3. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
4. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
5. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
6. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
7. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
8. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
9. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

10. සාමාන්‍යාධිකාරී
11. අතිරේක සාමාන්‍යාධිකාරීන්
12. කොට්ඨාස හාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්
13. පලාත් හාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්
14. ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්

ජ්‍යෙෂ්ඨ කළමනාකරණය

සාමාන්‍යාධිකාරී
(2021 දෙසැම්බර් 31 වැනි දිනට)

ඉංජිනේරු ටී. එස්. විජේතුංග
(2020.10.15 සිට අද දක්වා)
B Sc Eng, MBA, M Sc (Planning), MA (Financial Economics), MIM (SL), PG Dip (Finance)-ICA (SL), Dip. (Mgmt)-DK, C.Eng, FIE (SL)

අතිරේක සාමාන්‍යාධිකාරිවරුන්
(2021 දෙසැම්බර් 31 වැනි දිනට)

01. ඉංජිනේරු සී. සී. එච්. එස්. ප්‍රනාන්දු (බටහිර) -
(2019.06.20 සිට අද දක්වා)
B. Sc Eng, MPM, PG Dip (OSLO University), C. Eng, FIE (SL), MIM (SL)

02. ඉංජිනේරු ආචාර්ය අයි. එම්. ඩබ්ලිව්. කේ. ඉලංගසිංහ මහත්මිය (ප්‍රතිපත්ති හා ක්‍රම සම්පාදන)
(2020. 10. 15 සිට අද දක්වා)
B. Sc (Eng), M Eng (Japan), Phd, C. Eng, MIE (SL)

03. ඉංජිනේරු එස්. ජී. ජී. රාජ් කුමාර් (සාමූහික සේවා)
(2020. 09. 07 සිට අද දක්වා)
B Sc Eng (Hons), M Sc (Denmark), MBA (PIM US), M Eng (Moratuwa), C Eng, FIE (SL)

04. ඉංජිනේරු කේ. ඩී. පී. එෆ්. සිරිවර්ධන (මධ්‍යම / වයඹ / සබරගමුව) (2020. 10. 15 සිට අද දක්වා)
M Sc (Environ. Eng) Denmark, PG Dip (Cons. Mgmt), Moratuwa, C. Eng, FIE (SL)

05. ඉංජිනේරු ටී. ඩබ්ලිව්. එස්. පෙරේරා (ජල සම්පාදන ව්‍යාපෘති) (2019. 02. 12 සිට 2021. 09. 22 දක්වා)
B Sc Eng (Hons), M Sc (Development Science), C Eng, MIE (SL)

ඉංජිනේරු කේ. පී. ආර්. එස්. සමරසිංහ (ජල සම්පාදන ව්‍යාපෘති)
(2021. 01. 13 සිට අද දක්වා)
M Sc (WSP Eng) Netherlands, M Sc (Eng) Moratuwa, C Eng, FLE (SL), AM (OACETT) Canada

06. ඉංජිනේරු එම්. කේ. ඩී. ජේ. එච්. මිගොඩ (උතුර / උතුරු මැද)
(2021. 09. 23 සිට අද දක්වා)
B Sc Eng, M Sc (Water Management), C Eng, FIE (SL)

07. ඉංජිනේරු ආර්. ඒ. ඒ. රණවක (දකුණු / නැගෙනහිර)
(2020. 08. 18 සිට 2021. 01. 12 දක්වා)
B Sc Eng (Hons),PG Dip ((Env. Eng & Mgmt), C Eng, FIE (SL)

ඉංජිනේරු ආර්. එස්. ලියනගේ (දකුණු / ඌව / නැගෙනහිර)
(2021. 07. 27 සිට අද දක්වා)
B sc Eng, PGD (Mgmt), M Sc (Water & Environmental Resources Mgmt), MBA, M Sc (Water Resources Mgmt) Holland, C Eng, FIE (SL), MIM

08. ඉංජිනේරු රංජිත් කුලනාථ (මලාපවහන)
(2017. 04. 10 සිට 2021.02.26 දක්වා)
B Sc Eng, PG Dip (Const. Mgmt), PG Dip (Environ. Engineering), C Eng, FIE (SL)

ඉංජිනේරු අයි. ඒ. ඩබ්ලිව්. එදිරිවීර (ජල පිළිසැකසුම්)
(2021. 02. 27 සිට අද දක්වා)
B Sc Eng, M Sc (Water Resources Mgmt), M Sc (Development Studies), C Eng, FIE (SL), MIWA (UK)

09. ඉංජිනේරු එස්. ඒ. රෂිඩ් (පාරිභෝගික හා වත්කම් කළමනාකරණ)
(2021. 05. 10 සිට අද දක්වා)
B Sc Eng, M Sc (Sanitary Eng) Netherlands, PG Dip (Structural Engineering Design (SL), C Eng, MIE (SL)

10. ජී. කේ. ඉද්දමල්ගොඩ මහතා (මානව සම්පත් කළමනාකරණ)
(2013. 07. 23 සිට අද දක්වා)
B Sc (B Admin), Dip in Per. Mgmt, MA (Mgmt & Admin) London.

11. ආර්. ඒ. එම්. එස්. විරසේන (මුදල්)
(2019. 01. 24 සිට අද දක්වා)
B Com (Sp), PGDBM (Col), ACA

ප්‍රධාන කාර්යාලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් -
(2021 දෙසැම්බර් 31 වැනි දිනට)

01. එන්. වයි.එස්. අබේගුණවර්ධන මහත්මිය (කාර්මික සබඳතා)
BA, P G. Dip in Mgmt (PIM),Member (IMSL)

02. ආර්. එම්. ඒ. බණ්ඩාර මහතා (සැපයීම් හා ද්‍රව්‍ය කළමනාකරණ)
B Sc (Business Administration – Spl), Dip in (Purchasing & Materials Mgmt)

03. එම්. එම්. එස්. පීරිස් මහත්මිය (මුදල්)
B Sc (Accountancy & Finance Mgmt), ACA (SL)

04. ඒ. ජී.එස්. කුමාර මහතා (පිරිවැය)
B Com (Sp), M Sc (Mgmt), FCA

05. ජී. ඒ. පී. පත්මනාත මහතා (වාණිජ)
B Sc (P Adm. Spl), MBA, MSLIM, Fellow (IMSL), Member (IMSL), Asso. Member (IPFDA)

06. ඉංජිනේරු ජේ. චන්ද්‍රදාස (තොරතුරු තාක්ෂණ)
B Sc Eng, PG Dip (e Gov), M Sc (GIS/RS), MPA (e Gov), C Eng, MIE (SL), MBSC, MIEEE

07. එම්. ඒ. එස්. එස්. කේ. චන්ද්‍රසිරි මහතා (මානව සම්පත්)
BBM (HR), MBA, Final Part 1 – ICA, Adv. Mgmt, HR Mgmt, Cet. Course in Com Literary

08. යූ. ජේ. සමරසිංහ මහතා (අභ්‍යන්තර විගණන)
B Sc (Accounting & F.Management), M Sc (Service Mgmt), Fellow (ICA), Member (CIMA)

09. ඉංජිනේරු ජේ. එල්. සීක්කුගේ (ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති) ජල සම්පාදන ව්‍යාපෘති
B Sc. Eng (Hons), MBA (PIM – SRJ), PG Dip (Const. Mgmt), PG Diploma in Drinking Water Management (Germany), C. Eng, MIE (SL)

10. ඉංජිනේරු ධනේෂ් ගුණතිලක (ජල පිළිසැකැසුම්)
B SC. Eng (Hons), PG Dip Env. Eng & Mgmt (Moratuwa), M Sc Sanitary Eng (UNESCO – IHE – Delf), C. Eng. Intl P Eng, FIE (SL) MCIWEM (UK)

11. ඉංජිනේරු එම්. කේ. ඒ. ජේ. එම්. විජේසිංහ (මහත්මිය) (සාමූහික සැලසුම්)
B Sc Eng, M Sc Sanitary Eng. (UNESCO – IHE – Delf), C. Eng. (IESL)

12. ඉංජිනේරු ඒ. මුණසිංහ (ක්‍රම සම්පාදන හා සැලැසුම්)
B Sc. Eng, (Hons), M Eng. (H & WR) (Netherlands), C. Eng. MIE (SL)

13. **ඉංජිනේරු එම්. ඒ. සී. හේමවන්ද්‍ර (මහත්මිය)**
(සුළු නගර හා ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම)
B Sc. Eng, PG Dip (Env. & Mgmt), PG Dip (Stra. Eng), MIE (SL)

14. **ඉංජිනේරු ජේ.ඒ. ඒ. පී. ජයසිංහ (සංවර්ධන) - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආවරණ)**
B Sc. Eng, PG Dip (Con. Project Mgmt), C Eng. (IESL)

15. **ඉංජිනේරු වී. පී. යූ. රංජිත් (යාන්ත්‍රික හා විද්‍යුත්)**
B Sc. Eng, IESL (Part III), MBA, PG Dip (WSDWWT), C. Eng. (IESL)

පළාත් භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් (2021 දෙසැම්බර් 31 වැනි දිනට)

01. **ඉංජිනේරු ජී. වී. විජේරත්න (මධ්‍යම)**
B Sc. Eng, M Sc (Water Resource Engineering & Mgmt), PG Dip (Mgmt), C Eng. MIE (SL)

02. **ඉංජිනේරු සුදේෂන් (නැගෙනහිර)**
B Sc. Eng, M Sc (Const. Mgmt), M Sc (Structural Engineering Designs), C Eng. Intl P Eng, FIE (SL)

03. **ඉංජිනේරු ඩබ්ලිව්. ජී. සී. එල්. වීරසේකර (සබරගමුව)**
B Sc. Eng, MBA, PG Dip. (Const. Mgmt), M Sc (Structural Engineering Designs), C Eng. Intl P Eng FIE (SL)

04. **ඉංජිනේරු එම්. ටී. එම්. රසිල් (බටහිර දකුණ)**
B Sc. Eng (Hons), PG Dip (Structural Engineering Designs), PG Dip. (Cons. Mgmt), PG Dip (Project Mgmt), C. Eng, MIE (SL)

05. **ඉංජිනේරු ඒ. කේ. කපුරුගේ (බටහිර මධ්‍යම)**
B Sc Eng, M Sc Eng, C Eng (IESL)

06. **ඉංජිනේරු එන්. යූ. කේ. රණතුංග (බටහිර උතුර)**
B Sc Eng, PG Dip (Env. Eng), Master in Development Studies, FIE (SL)

07. **ඉංජිනේරු එල්. පී. ඒ. පී. පෙරේරා (නිෂ්පාදන) - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආවරණ)**
B Sc Eng, M Eng (P mgmt.), PG Dip (Bus. Mgmt), C Eng, MIE (SL)

08. **ඉංජිනේරු එම්. එම්. එම්. නසීල් (උෟව)**
B Sc. Eng, M Eng (W & E R Mgmt), PG Dip (Env. W. Resource), C Eng (IESL)

09. **ඉංජිනේරු ඒ. මහතන්තිල (දකුණ)**
B Sc Eng, C Eng (IESL), PG Dip (Env. Eng. & Mgmt), Prof Dip (UNESCO – IHE)

10. **ඉංජිනේරු ඒ. එම්. ඒ. රෆීක් (උතුර)**
B Sc Eng, C Eng (IESL), M Eng (W R Mgmt)

11. **ඉංජිනේරු ඩී. වී. මැදවත්ත (වයඹ)**
B Sc. Eng, PG Dip (W & W.W & Eng. Eng), C Eng (IESL), Fellow (IESL), MBA

12. **ඉංජිනේරු ටී. එම්. එම්. එච්. තෙන්නකෝන් (මහත්මිය)**
(උතුරු මැද හා දැදුරුඔය ජල සම්පාදන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ)
B Sc Eng, PG Dip. (Cont.Mgmt), M Sc (W R Mgmt), MBA, , C Eng (IESL)

ව්‍යාපෘති අධ්‍යක්ෂ වරුන් වශයෙන් කටයුතු කරනු ලබන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් (2021 දෙසම්බර් 31 වැනි දිනට)

01. **ඉංජිනේරු එන්. එච්. ඩී. පී. ධර්මපාල**
(ගම්පහ අත්තනගල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය)
B Sc. Eng, M Sc (Const. Project Mgmt), PG Dip Env. Eng. & Mgmt), C Eng, FIE (SL)

02. **ඉංජිනේරු ටී. බාරතිදාසන්**
(යාපනය කිලිනොච්චිය ජල සම්පාදන ව්‍යාපෘතිය)
B Eng (India), M Eng (Moratuwa), M Sc Eng (UNESCO – IHE), PGD (Rajarata), C Eng, MIE SL

03. **ඉංජිනේරු එන්. ඒ. එස්. ශාන්ත**
(කැළණි දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය)
B Sc Eng., PG Dip (Stru. Design), C Eng (IESL)

04. **ඉංජිනේරු ටී. ආර්. ජේ. ප්‍රනාන්දු**
(කළුගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය)
B Sc Eng, C. Eng. (IESL), Member CCP enf MIE – Australia, Member (M ASCE), PG Dip. (IR), IRBCIS, PG Dip. (Con Mgmt)-OUSL

05. **ඉංජිනේරු ජී. එම්. තිලකරත්න**
(පොල්ගහවෙල, පොතුහැර හා අලවිව වේකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය)
B Sc Eng., MBA, M Sc (Eng), PG Dip (Env. Eng & Mgmt), FIE (SL), M Sc (Eng), C Eng (IESL)

06. **ඉංජිනේරු ඒ. පී. ගුණවර්ධන (මහත්මිය)**
(ආනමඩුව වේකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය)
B Sc. Eng, MBA, C Eng (IESL)

ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පණිවුඩය



ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සියළුම වැදගෙනෙදා ක්‍රියාකාරකම් ස්වභාවයෙන්ම අංක 6 දරණ තිරසාර සංවර්ධන ඉලක්කය, එනම් ''සියළු දෙනාට ජලය හා සනීපාරක්ෂණය සුලභ ලෙස තිබීම හා ඒවා තිරසාර ලෙස කළමනාකරණය කිරීම සහතික කිරීම'' සාක්ෂාත් කර ගැනීම කෙරෙහි දිශානතිගත වී තිබෙන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ක්‍රියාශීලී ලෙස යෙදී සිටින්නේ ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම අරමුණු කර ගත් වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීමෙහි වේ. ''සියළු දෙනා වෙත ආරක්ෂිත ජලය ලබා දීම'' යන්න ''තිරසාර ඉලක්කයන්'' යනුවෙන් පරිණාමනය වීම රටෙහි ජාතික ප්‍රතිපත්ති රාමුව වන ''සෞභාග්‍යයේ හා ශ්‍රී විභූතියේ දැක්ම'' යන්න තුළ පිළිගනු ලැබ ඇති අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ජල සම්පාදන අමාත්‍යාංශයේ උපදෙස් හා මග පෙන්වීම් යටතේ 2030 වර්ෂය වන විට (6. 1 සියළු දෙනා වෙත සුරක්ෂිත හා දැරිය හැකි ගාස්තුවකට ජලය ලබා ගැනීමේ පොදු හා සාධාරණ ප්‍රවේශය ලබා දීමේ හැකියාව සාක්ෂාත් කර ගැනීම හා 6. 2 කාන්තාවන්, ගැහැණු ළමුන් හා අනතුරට භාජනය විය හැකි තත්ත්වයන් තුළ සිටින පුද්ගලයින් වෙත විශේෂ අවධානය යොමු කරමින් සියළුම දෙනා වෙත ප්‍රමාණවත් හා සාධාරණ සනීපාරක්ෂණ හා ස්වස්ථතා පහසුකම් ලබා ගැනීමේ හැකියාව සාක්ෂාත් කර ගැනීම හා විවෘත මළ පහ කිරීමේ පුරුද්ද අවසන් කිරීම යන) අනු ඉලක්කයන් හා අදාල සාක්ෂාත් කර ගැනීම පසු විපරම් කිරීම සඳහා සහ වාර්තා කිරීම සඳහා අදාල ජාතික දර්ශකයක් ගොඩ නැගීමෙහි හා ඉලක්කයන් සකස් කිරීමෙහි යෙදී සිටී.

2021 වර්ෂයේදී මුළු ජන ගහණයෙන් 55.8% ක් වෙත නල මාර්ගික ජලය ලබා දීම හා මුළු ජන ගහණයෙන් 2. 08% ක් වෙත නල මාර්ගික මළ අපවහන පහසුකම් ලබා දීම අරමුණු කර ගනිමින් දැනටමත් පිහිටුවාගනු ලැබ ඇති ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම සඳහා අමාත්‍යාංශය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමග සමීප ලෙස වැඩ කටයුතු කිරීමෙහි නියැලී සිටී.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ව්‍යාපාරික කාර්යක්ෂමතා පැතිකඩයන් වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් අමාත්‍යාංශය විකී මණ්ඩලය සමග සමීප ලෙස වැඩ කටයුතු කරමින් සිටී. සංවිධානය ප්‍රති ව්‍යුහගත කිරීමට අමතර වශයෙන් කාර්යක්ෂම ලෙස සම්පත් ඵලදායීව යොදා ගැනීම, ආදායම් රහිත ජල පරිමාව අවම කිරීම, භාණ්ඩ තොග කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම හා වැඩ කිරීමේ නවීන ශිල්පීය ක්‍රමයන් හරහා ඵලදායිතාවය නංවා ලීම ආදිය දැනට නිරීක්ෂණ ලෙස අධ්‍යයනයට භාජනය කරනු ලබමින් පවතී.

ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය සංවර්ධනය කිරීමේ අපගේ ප්‍රයත්නයේදී අප වෙත සිය සහයෝගය ලබා දුන් අපගේ බොහෝ අරමුදල් සම්පාදක හවුල් කරුවන් වෙත අමාත්‍යාංශය සිය කෘතඥතාවය පුද කර සිටියි. ජල සම්පාදනය හා සනීපාරක්ෂණය පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි ලා අතිගරු ජනාධිපති තුමන් වෙතින්, ගරු අග්‍රාමාත්‍ය තුමන් වෙතින් හා ජල සම්පාදන කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය තුමන් වෙතින් අප වෙත ලැබුණ නායකත්වය හා මග පෙන්වීම් සම්බන්ධයෙන් මගේ අවංක කෘතඥතාවය ප්‍රකාශ කර සිටීමට මම මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගනිමි. අප සියළු දෙනා වෙත ලබා දෙන ලද මග පෙන්වීම් සම්බන්ධයෙන් ජල සම්පාදන කටයුතු පිළිබඳ ගරු රාජ්‍ය අමාත්‍ය තුමන් වෙත මගේ ස්තුතිය පුද කර සිටින්නෙමි. අපගේ සියළුම වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී අප වෙත අඛණ්ඩ ලෙස ඔවුන් විසින් ලබා දෙන ලද සහාය පිළිබඳව ද මහා භාණ්ඩාගාරයේ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ද මගේ ස්තුතිය පුද කර සිටින්නෙමි.

ඉහළ ගුණාත්මයේ හා කාර්යක්ෂම ජල සම්පාදන සේවාවන් හා මළාපවහන සේවාවන් පොදු මහ ජනතාව වෙත සම්පාදනය කර දීම සඳහා සහ සිය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමේ අරමුණ සහිතව 2021 වර්ෂය සඳහා සහ ඉන් ඔබ්බට පෙළ ගස්වනු ලැබ ඇති විවිධ සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම පිණිස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දරනු ලබන ප්‍රයත්නයන් සර්ව ප්‍රකාරයෙන්ම සාර්ථක වේවා යැයි මම ප්‍රාර්ථනා කර සිටින්නෙමි.

ආචාර්ය (ඉංජිනේරු) ප්‍රියත් බී. වික්‍රම
ලේකම්
ජල සම්පාදන අමාත්‍යාංශය



> **මේ සම්බන්ධයෙන් මුහුණ දෙන්නට සිදු වුන ප්‍රධාන අභියෝගයක් වන්නේ නව ජල සම්පාදන සම්බන්ධතාවයන් සංඛ්‍යාව වැඩි කිරීම විය. ගත වී ඇති වසර 10 ක කාලය තුළදී එක් වසරක් තුළදී ලබා දෙන ලද නව ජල සම්පාදන සම්බන්ධතාවයන් සංඛ්‍යාව 138,000 ක් ඉක්මවා ගොස් තිබුනේ නැත. වසංගත තත්ත්වය නිසා නිරන්තරයෙන්ම සාමාන්‍ය තත්ත්වයෙහි ඇති වුන බිඳ වැටීම් මධ්‍යයෙහි පවා 2021 වර්ෂය තුළදී එම සංඛ්‍යාව 192,087 ක් දක්වා වර්ධනය කිරීමට අපට හැකි විය.**

කොවිඩ් 19 විසින් අප වෙත උගන්වන ලද පාඩම වන්නේ ඉතා කුඹුදු වෛරසයක් සතුව මුළු ලෝකයක් දණ ගැස්වීමේ හැකියාව තිබෙන බවය. ජන ගහණයක සෞඛ්‍ය තත්ත්වය අනතුරෙහි හෙලනු ලැබ ඇති විට හුදෙක් ආර්ථික වර්ධනය පමණක් නොව ශිෂ්ඨාචාරය පවා උපද්‍රවයට පත් වීමේ තත්ත්වයට පත් විය හැකි වේ. ජාතියක සෞඛ්‍යය තුළ ඇති ප්‍රධාන අංගයන් වන්නේ පිරිසිදු ජලය හා සනීපාරක්ෂණය වේ. ජීවත් විය හැකි ජීවිතයක හා අර්ථාන්විත සංවර්ධනයක අත්‍යවශ්‍ය කුළුණු වන්නේ එම අංගයන්ය.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පිහිටුවනු ලැබ ඇත්තේ ලාංකික ජනතාව වෙත පිරිසිදු ජලය හා සනීපාරක්ෂණ පහසුකම් ලබා ගැනීමේ හැකියාව සහතික කරනු පිණිස වන්නේය. මෙම ආයතනයේ සභාපතිවරයා වශයෙන් වූ මගේ නිල කාලය තුළදී මගේ අවධානය යොමුව තිබෙන්නේ 2020 - 2025 පස් වර්ෂය සඳහා පිළියෙල කරනු ලැබ ඇති ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සංයුක්ත සැලැසුමේ අන්තර්ගත ඉලක්කයන් හා අරමුණු සාක්ෂාත් කර ගැනීම කෙරෙහි වේ.

මේ සම්බන්ධයෙන් මුහුණ දෙන්නට සිදු වුන ප්‍රධාන අභියෝගයක් වන්නේ නව ජල සම්පාදන සම්බන්ධතාවයන් සංඛ්‍යාව වැඩි කිරීම විය. ගත වී ඇති වසර 10 ක කාලය තුළදී එක් වසරක් තුළදී ලබා දෙන ලද නව ජල සම්පාදන සම්බන්ධතාවයන් සංඛ්‍යාව 138,000 ක් ඉක්මවා ගොස් තිබුනේ නැත. වසංගත තත්ත්වය නිසා නිරන්තරයෙන්ම සාමාන්‍ය තත්ත්වයෙහි ඇති වුන බිඳ වැටීම් මධ්‍යයෙහි පවා 2021 වර්ෂය තුළදී එම සංඛ්‍යාව 192,087 ක් දක්වා වර්ධනය කිරීමට අපට හැකි විය. මේ අනුව මුළු ජල සම්පාදන සේවා සම්බන්ධතා සංඛ්‍යාව මුළු ජන ගහණයෙන් 45. 8% ක් ආවරණය කරමින් මිලියන 2.75 ක් දක්වා ඉහළ නැංගේය.

අහිතකර ජාතික තත්ත්වයන් මධ්‍යයේ වුව ද 2021 වර්ෂය තුළදී නල මාර්ගික මළ අපවහන සේවා සම්බන්ධතාවයන් 3471 ක සංඛ්‍යාවක් සම්පාදනය කර දීමේ හැකියාව අප වෙත ලැබිණි. 2021 වර්ෂයේ අවසානය වන විට අපගේ අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන්හි මුළු ප්‍රතිකාරක ධාරිතාවය එක් දිනකට ඝණ මීටර 90, 500 ක් දක්වා ඉහළ නැංගේය.

ප්‍රස්තුත වර්ෂය තුළදී අරමුදල් ලබා ගෙන මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් 23 ක සංඛ්‍යාවක් වෙනුවෙන් ද, මළාපවහන ව්‍යාපෘතීන් 3 ක සංඛ්‍යාවක් වෙනුවෙන් ද, දේශීය බැංකු විසින් අරමුදල් සම්පාදනය කරනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන් 11 ක සංඛ්‍යාවක් වෙනුවෙන් ද, මධ්‍ය පරිමාණ හා සුළු පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් 3 ක සංඛ්‍යාවක් වෙනුවෙන් ද, එක් ජල අංශයේ ප්‍රජා පහසුකාරක වැඩ සටහනක් වෙනුවෙන් හා ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘතීන් 5 ක සංඛ්‍යාවක් වෙනුවෙන් ද මුදල් වෙන් කිරීම් කර දෙන ලදි. මෙම ව්‍යාපෘතීන් අතුරින් එක් මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතියක් හා දේශීය බැංකු විසින් අරමුදල් සම්පාදනය කර දෙනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන් 02 ක සංඛ්‍යාවක් ප්‍රස්තුත වර්ෂය තුළදීම සම්පූර්ණයෙන් නිම කිරීමේ හැකියාව අප වෙත ලැබිණි.

නිධන්ගත වකු ගඩු රෝගයේ බල පෑමට ගොදුරු වී ඇති ප්‍රදේශයන් තුළ ජීවත් වන ජනතාව වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම ද ගත වූ වර්ෂය තුළදී අපගේ තවත් එක් ප්‍රමුඛතාවයක් විය. ප්‍රස්තුත වර්ෂය තුළදී මෙම පරමාර්ථය වෙනුවෙන් රුපියල් මිලියන 222 කට වැඩි මුදල් ප්‍රමාණයක් වැය කරනු ලැබ ඇත.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ මග පෙන්වීම් හා අනුකූල ලෙස නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 288 ක සංඛ්‍යාවක් තුළ

ජල සුරක්ෂිතතා සැලැසුම් සංවර්ධනය කරන ලදි. මීට අමතර වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිය මධ්‍යම රසායනාගාරය හා කලාපීය රසායනාගාරයන් මගින් ජල නියැදීන් පරීක්ෂණයට භාජනය කිරීම අඛන්ඩ ලෙස සිදු කරන ලදි. 2021 වර්ෂය සඳහා වූ විශ්ලේෂණාත්මක දත්තයන්ට අනුව ක්ෂුද්‍ර ජීවී පරීක්ෂණයන්ගෙන් 98.8% ක ප්‍රතිශතයක් සතුටුදායක තත්ත්වයන් පෙන්නුම් කරනු ලැබ තිබේ.

ව්‍යාපාරික කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ කොටසක් වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ සිය ප්‍රයත්නය කලාප මට්ටමේ බොහෝ කෙටි කාලීන හා දීර්ඝ කාලීන පියවරයන් ක්‍රියාත්මක කරමින් හා එමෙන්ම විදේශීය අරමුදල් යොදා ගනිමින් කොළඹ තුළ මහා පරිමාණ ව්‍යාපෘතීන් දියත් කොට ක්‍රියාත්මක කරමින් ද අඛන්ඩ ලෙස කරගෙන යන ලද්දේය. ඒවායෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2021 වර්ෂයේ අවසානය වන විට දීප ව්‍යාප්ත ආදායම් රහිත ජලයේ ප්‍රතිශතය 25. 82% ක් දක්වා පහත බැස තිබිණි. සිය ව්‍යාපාරික කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ තවත් එක් පියවරක් වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2021 වර්ෂය පුරාම තොරතුරු තාක්ෂණය වෙත සිය අවධානය අඛන්ඩ ලෙස යොමු කිරීම සිදු කරන ලද්දේය.

සිය සංස්ථානික හා ජාතික ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමේ කාර්යයේදී ජල සම්පාදන අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත තම අවල සහයෝගය ලබා දෙමින් මග පෙන්වීම් කරන ලද්දේය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය තිරසාර භාවය සහතික කිරීමේදී ණය සේවා ප්‍රතිව්‍යුහගත කිරීම හරහා මූදල් අමාත්‍යාංශය විසින් දෙන ලද සහාය ප්‍රධාන අත්‍යවශ්‍ය භූමිකාවක් ඉටු කළේය. ප්‍රශ්න, ගැටළු හා අභියෝගයන්ට බහුලව මුහුණ දෙන්නට සිදු වී ඇති මේ වකවානුව තුළදී ගාස්තු නංවා ලීමකින් තොරව ඉදිරි දියුණුව සඳහා විශාල පියවර ගැනීමේ හැකියාව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ලැබුණ බව සඳහන් කළ යුත්තේය.

2021 වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඒ තුළ බොහෝ ව්‍යුහාත්මක වෙනස් කම් සිදු කරන ලද අතර ඵලදායී තාවය, කාර්යක්ෂමතාවය හා ගණුදෙනුකාර සේවාවන් වැඩි දියුණු කිරීමේ පරමාර්ථයෙන් නව සේවක තනතුරු හඳුන්වා දෙන ලදි. ගණුදෙනුකාර හා වත් කම් කළමනාකරණ අංශය පිහිටුවීම, ජලය හා සනීපාරක්ෂණය සඳහා උත්කෘෂ්ඨ භාව මධ්‍යස්ථානය පිහිටුවීම, දැනුම, පුහුණුව හා මිනිස් බල සංවර්ධනය යන ප්‍රධාන අංශයන් තුනෙන් සමන්විත වූ ක්‍රමෝපායික ව්‍යාපාර ඒකකය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය තුළ ස්ථාපිත කිරීම සිදු කරන ලද අතර නවීකරණ, පර්යේෂණ හා සංවර්ධන හා ගුණාත්ම රසායනාගාර සේවාව 2021 නොවැම්බර් 19 වැනි දින අඩ වශයෙන් ස්ථාපිත කරන ලදි. මේ අතර පර්යේෂණ හා සංවර්ධන අංශය හා නවීකරණ මධ්‍යස්ථානය ඒකාබද්ධ පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල තුළ ස්ථාපිත කරන ලදි.

2022 වර්ෂය තුළදී අපගේ අවධානය ප්‍රධාන වශයෙන්ම යොමු කරනු ලබන්නේ පසු ගිය වසර පහක කාලය තුළ අප විසින් කරන ලද යෝධ ආයෝජනයන් සේවා සම්බන්ධතාවයන් සංඛ්‍යාව වර්ධනය කර ගැනීමේ අපේක්ෂාවෙන් දියත් කරනු ලබන ව්‍යාපාරයක් මගින් ආදායම් බවට පත් කර ගැනීම සඳහා වන්නේය. දැනට ක්‍රියාත්මක වෙමින් පවතින යෝජනා ක්‍රමයන් නිෂ්පාදන හා ධාරිතා නංවා ලීම, බෙදා හැරීමේ හිඩැස් පිරවීම හා ව්‍යාප්ති වැඩ සටහන් මගින් උපරිම ප්‍රයෝජ්‍යකරණයට පත් කරනු ලබනවා ඇත. මේ සඳහා ජල සම්පාදන ගාස්තු වැඩි කිරීමක් අවශ්‍ය වනු ඇති අතර 2012 වර්ෂයේ සිට ජල සම්පාදන ගාස්තු වෙනස් වීමක් සිදු වී නැත. අඩු පරිභෝජනයක් සහිත ගණුදෙනු කරුවන් හට අනාගත ජල සම්පාදන ගාස්තු වැඩි කිරීමකින් කිසිදු බල පෑමක් සිදු නොවනු ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිය කැප වූ හා කාර්යක්ෂම කාර්ය මණ්ඩලයේ සහාය සහිතව අපගේ අවසාන ඉලක්කය වූ සියළුම ලාංකික ජනතාව වෙත ජලය හා සනීපාරක්ෂණය සම්පාදනය කර දීම අරමුණු කර ගත් සිය ප්‍රයත්නයන් 2022 වර්ෂය තුළදී වඩාත් ශක්තිමත් කරනු ලබනවා ඇත.



නිශාන්ත රණතුංග
සභාපති
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය



“ ළිඳ වියලී ගොස් ඇති විට අපි ජලයේ අගය දැනගන්නෙමු ”

බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින්

පුරාවිද්‍යා හා සංස්කෘතික වෙනස්කම් විශ්ලේෂණය

සීගිරිය ජල උද්‍යානය

ක්‍රියාත්මක තත්ත්වයේ පවතින ජල සම්පාදන යෝජනා ක්‍රම

පලාත / කලාපීය සේවා මධ්‍යස්ථානය	ජල සම්පාදන යෝජනා ක්‍රම සංඛ්‍යාව
මධ්‍යම	36
නැගෙනහිර	56
උතුරු මධ්‍යම	32
වයඹ	16
උතුර	34
සබරගමුව	24
දකුණ	51
ඌව	35
බටහිර මධ්‍යම	19
බටහිර උතුර	21
බටහිර දකුණ	13
එකතුව	337





2020 - 2025 සංයුක්ත සැලැසුම ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය

සමාලෝචනයට භාජනය වන වර්ෂය 2021 - 2025 සංයුක්ත සැලැසුමේ ප්‍රථම වර්ෂය විය. මෙම වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සංයුක්ත සැලැසුම විසින් පිහිටුවනු ලැබ ඇති ඉලක්කයන් හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අඛන්ඩ ලෙස වැඩ කටයුතු කරගෙන යමින් සිටින ලදි.

ජල සම්පාදනය හා සනීපාරක්ෂණ සේවාවන් ආවරණය කිරීම හා සම්බන්ධ ඉලක්කය සපුරා ගැනීම සඳහා වූ ක්‍රියාකාරකම් ජල සම්පාදන හා ජල පිළි සැකැසුම් අංශයන් හා සියළුම කලාපිය සහාය මධ්‍යස්ථානයන් විසින් මුළු රට පුරාම ක්‍රියාත්මක කරන ලදි. ආසන්න වශයෙන් ජන ගහණයෙන් සියයට 94.3% කට පමණ සුරක්ෂිත පානීය ජලය ලබා ගැනීමේ හැකියාව ඇති අතර ඉන් සියයට 54.2% කට සුරක්ෂිත පානීය ජලය ලැබෙන්නේ රට පුරා ක්‍රියාත්මක වන නල මාර්ගික ජල සම්පාදන යෝජනා ක්‍රමයන් මගිනි. ජන ගහණයෙන් සියයට 2.08% ක් වෙත නල මාර්ගික මළ අපවහන පහසුකම් සපයා දෙනු ලැබ ඇත. ව්‍යාපාරික කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීමෙහි ලා 2021 වර්ෂය තුළදී ආදායම් රහිත ජල පරිමාව අවම කිරීම සඳහා දරන ලද විශේෂ ප්‍රයත්නයන් හා බල ශක්ති පිරිවැය අඩු කිරීමට දරන ලද විශේෂ ප්‍රයත්නයන් සැලැකිය යුතු මට්ටමක තිබුණ අතර ගණුදෙනු කරුවන් වෙත සපයනු ලබන සේවාවන් වැඩි දියුණු කිරීම කෙරෙහිද ප්‍රමුඛත්වය ලබා දෙන ලදි. තොරතුරු තාක්ෂණ වැඩි දියුණු කිරීමට ගත් මූලික ක්‍රියා මාර්ග යන්, පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්, ආයතන සංවර්ධනය හා කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ කටයුතු ද මෙම ඉලක්කය සාක්ෂාත් කර ගැනීමෙහි ලා දායක විය. ''ව්‍යාපාරික කාර්යක්ෂමතාවය උදෙසා සංවිධානමය ප්‍රතිසංස්කරණ'' යන ඉලක්කය සපුරා ගැනීමෙහි ලා අභ්‍යන්තර විගණන අංශය හා රජයේ විගණන අංශය යන අංශයන් දෙකම විසින් වග වීම හා පාරදෘෂ්‍ය භාවය හා සම්බන්ධ ගැටළු පිළිබඳව කටයුතු කරන්නට යෙදුනි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ගණුදෙනු කරුවන් හැර සෙසු ජන ගහණයේ පානීය ජල හා සනීපාරක්ෂණ තත්ත්වය වැඩි දියුණු කිරීමේ සමාජයීය වගකීම සම්බන්ධයෙන් ගත් කල හේතු නොදන්නා නිදන්ගත වකුගඩු රෝගයට ගොදුරු වනු ලැබ ඇති ප්‍රදේශයන් හා සුරක්ෂිත පානීය ජල පහසුකම් නොමැති ග්‍රාමීය ප්‍රජාවන් වෙත තිබෙන සම්පත් උපයෝගි කර ගනිමින් ප්‍රමුඛත්වය ලබා දෙන ලදි. ප්‍රජා මූල සංවිධානයන් විසින් කළමනාකරණය කරනු ලබන යෝජනා ක්‍රමයන් වෙත තාක්ෂණික සහාය ලබා දීම ද කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් මගින් සිදු කරන ලදි.

ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ වැඩ කටයුතු 2021 වර්ෂය තුළදී අඛන්ඩ ලෙස ක්‍රියාත්මක කරන ලදි. ප්‍රජාව විසින් පරිභෝජනය කරනු ලබන සියළුම ජලයේ ආරක්ෂිත බව සහතික කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ප්‍රයත්න දරනු ලබයි. මෙම සන්දර්භය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා ජල සුරක්ෂිතතා සැලැසුම් සංවර්ධනය කරනු ලබයි. 2021 වර්ෂයේ අවසානය වන විට විවිධ පියවරයන්හි තිබුණ නාගරික ජල සුරක්ෂිතතා සැලැසුම් 288 ක සංඛ්‍යාවක් ජල සුරක්ෂිතතා සැලැසුම් උපදේශක ඒකකයේ සහාය සහිතව කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්හි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන් විසින් දිවයින පුරා සංවර්ධනය කර තිබිණි.

පිහිටුවනු ලැබ ඇති ඉලක්කයන් හා අරමුණු සාර්ථක ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා කාලීන සමාලෝචනයන් සිදු කිරීම වැදගත් වන බව සැලැකිල්ලට ගනු ලැබ තිබිණි. සංවර්ධනයේ හා ව්‍යාපාරික කාර්යක්ෂමතාවයේ ප්‍රගතිය 2021 වර්ෂය තුළ පවත්වන්නට යෙදුන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් තුළදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් කළමනාකරණ තොරතුරු වාර්තාව හා ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන් මගින් සමාලෝචනයට භාජනය කරන ලදි.

ප්‍රකාශිත ඉලක්කයන් සපුරා ගැනීමේ ප්‍රගතිය

ඉලක්කය		ප්‍රධාන අරමුණු		2021 අවසානයට ඉලක්කය	2021 අවසානයට සපුරා ගැනීම
1,2	සේවා මට්ටම් වැඩි දියුණුකිරීම් හා සේවා ආවරණය නංවාලීම	1.	මුළු නල මාර්ගික ජල සම්පාදන ආවරණය	59.5%	54.2%
		2.	නල මාර්ගික මළ අපවහන ආවරණය	2.12%	2.08%
		3.	සුරක්ෂිත ජලය ලබා ගැනීමේ හැකියා ආවරණය	99.6%	94.3%
3	ණය සේවා හා අතිරේක ආදායම් ජනනය කිරීම	4.	ආදායම් රහිත ජලය (දීප ව්‍යාප්ත ලෙස)	23.09%	25.82%
		5.	සේවා සම්බන්ධතා 1000 ක් සඳහා මුළු කාර්ය මණ්ඩලය	3.28	3.38
4	ගාස්තු ප්‍රතිපත්තිය හා ආදායම නංවාලීම	6.	මුළු පුනරාවර්තන පිරිවැයට බල ශක්ති වැය	15.89%	13.45%
		7.	මුළු පුනරාවර්තන පිරිවැයට නඩත්තු වැය	6.48%	5.89%
		8.	මුළු පුනරාවර්තන පිරිවැයට ආයතනික වැය	4.51%	3.78%
5	පවත්නා සංවිධාන ව්‍යුහයේ හා ක්‍රියාකාරිත්වයේ ඵලදායිතා හා කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීම	9.	මුළු බිල් සංඛ්‍යාවට ඇස්තමේන්තු කළ බිල් සංඛ්‍යාව	1.0%	3.2%
		10.	අය කර ගැනීමේ කාර්යක්ෂමතාවය	100%	108%
		11.	ගිණුම් ලැබෙන කාලය	දින 30 යි	දින 29 යි
		12.	මානව සම්පත් සංවර්ධනය කිරීම ප්‍රවර්ධනය කිරීම		
			අ. අභ්‍යන්තර පුහුණු (සහභාගි වූවන් සංඛ්‍යාව)	9,120	2,462
			ආ. රට තුළ බාහිර පුහුණුව (සේවක සංඛ්‍යාව)	284	212
			ඇ. විදේශ පුහුණුව (සේවක සංඛ්‍යාව)		48
6	ව්‍යාපාරික කාර්යක්ෂමතාවය සඳහා සංවිධානමය ප්‍රතිසංස්කරණ	13.	ගණුදෙනු කාර සේවාවන් වැඩි දියුණු කිරීම හා මහජන පැමිණිළි වලට ක්ෂණිකව කටයුතු කිරීම මුළු දිවයින පුරා ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් (පාසැල් / වෙනත්)	100	**
		14.	බල ශක්ති කාර්යක්ෂම ව්‍යාපෘති හරහා වාර්ෂික ඉතිරි කිරීම්	මිලියන 42 යි	මිලියන 45 ය
		15.	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් ක්‍රමවත්, විමර්ෂණාත්මක හා පරීක්ෂණාත්මක ක්‍රියාකාරකම් අඛන්ඩ ලෙස සිදු කරගෙන යනු ලබන අතර ඒවා ක්‍රියාත්මක කරනු ලබන්නේ කාර්යක්ෂම ව්‍යාපාරික හා මෙහෙයුම් හා නඩත්තු කටයුතු කිරීම සඳහා නව දැනුම ලබා ගැනීම සඳහා වන්නේය		
		16	ගණුදෙනු කරුවන් සමග හා සංස්ථාපිත සම්බන්ධතාවයන් වැඩි දියුණු කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ආයෝජනය කරනු ලැබ ඇති අතර එය සතුව සිය ව්‍යාපාරික කටයුතු වැඩි දියුණු කිරීම සඳහා සහ සර්වව්‍යාපී තොරතුරු හා සන්නිවේදන සංවර්ධන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහා ජාල ද්වාරයක් තිබේ.		

17.	මානව සම්පත් සංවර්ධනය, කළමනාකරණ තොරතුරු පද්ධතිය හා ව්‍යාපාරික සැලැසුම පිළිබඳව කළමනාකරණ හා ව්‍යාපාරික මෙවලම් පූර්ණ පරාසයක් සංවර්ධනය කිරීම අදාලව මූලික ක්‍රියාකාරකම් දියත් කරන ලදි		
	■ මූල්‍ය අධිකාරි බලය පැවැරීම		
	■ අය වැය පාලනය හා මූල්‍ය රෙගුලාසි පිළිබඳ පුහුණුව ලබා දීම		
	■ වත් කම් අගය කිරීම		
	■ වැඩිදියුණු කළ කළමනාකරණ තොරතරු පද්ධතිය හා සමායෝජනය		
	■ වාණිජ මෙහෙයුම් පිළිබඳ විගණනයන්	55	57
	■ ගබඩා හා සැපයුම් පිළිබඳ විගණනයන්	62	78
	■ ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම පිළිබඳ විගණනයන්	26	22
	■ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ගැන විගණනයන්	42	39
	■ ක්ෂෙත්‍ර 18 ක් තුළ මුළු විගණන කිරීම	516	550

** රට තුළ පැවැති වසංගත තත්ත්වය නිසා ප්‍රගතියක් පෙන්වා නැත.

ජල සම්පාදනයේ හා ජල පිළිසැකැස්මේ ප්‍රධාන කාර්ය සාධනය.

" සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී සපයන ලද නව ජල සම්පාදන සම්බන්ධතා 192,087 සමග ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සම්පාදනය කර දෙනු ලබන නල මාර්ගික පානීය ජලයෙන් ආවරණය වන ජන ගහණය සියයට 45.8% ක් දක්වා වර්ධනය විය."

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ විෂය පාත්‍රතාව යටතේ මහා පරිමාණ, මධ්‍ය පරිමාණ හා සුළු පරිමාණ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 337 ක සංඛ්‍යාවක් හා අපජල කළමනාකරණ යෝජනා ක්‍රම 14 ක සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී සපයන ලද නව ජල සම්පාදන සම්බන්ධතා 192,087 සමග ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සම්පාදනය කර දෙනු ලබන නල මාර්ගික පානීය ජලයෙන් ආවරණය වන ජන ගහණය සියයට 45.8% ක් දක්වා වර්ධනය විය. වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සම්පාදනය කර දෙනු ලබන නල මාර්ගික ජල සම්පාදන ආවරණය සියයට 100% ක් විය යුතු බවට පිහිටුවාගන්නා ලද ඉලක්කය සපුරා ගැනීමත් සමග දීප ව්‍යාප්ත ලෙස මුළු ජන ගහණයෙන් සියයට 54.2% ක මුළු ප්‍රතිශතයක් නල පානීය ජල සම්පාදනයේ ආවරණය ලබයි.

ප්‍රස්තුත වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් විදෙස් අරමුදල් යොදා ගෙන කරනු ලබන ක්‍රියාත්මක වන මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් 15 ක සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා ණය ලබාගෙන ඇත්තේ මහා භාණ්ඩාගාරය විසිනි. ඒ අතර වෙනත් මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් 8 ක සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් විදේශීය හා දේශීය බැංකු වෙතින් ණය ලබාගෙන ඇත. ඊට අමතර වශයෙන් රටේ නල මාර්ගික ජල සම්පාදන ආවරණය වැඩි කිරීම සඳහා දේශීය බැංකු අරමුදල් වලින් ක්‍රියාත්මක වන ජල සම්පාදන ව්‍යාපෘතීන් 11 ක සංඛ්‍යාවක් ද, සුළු පරිමාණ හා මධ්‍ය පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් 3 ක සංඛ්‍යාවක් ද, ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘතීන් 5 ක සංඛ්‍යාවක් හා ජල අංශයේ ප්‍රජා පහසුකාරක ව්‍යාපෘතියක් ද ප්‍රස්තුත වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි. මේ අතුරින් එක් මහා පරිමාණ විදෙස් අරමුදල් ජල සම්පාදන ව්‍යාපෘතියක් ද, දේශීය බැංකු අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරන ලද ජල සම්පාදන ව්‍යාපෘතීන් 02 ක සංඛ්‍යාවක් හා එක් ජල අංශයේ ප්‍රජා පහසුකාරක ව්‍යාපෘතියක් ද රටේ විවිධ ප්‍රදේශයන් තුළ ප්‍රස්තුත වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලද අතර මේ හේතුකොට ගෙන නව සේවා සම්බන්ධතාවයන් සැපැයීමේ හා සිටින පාරිභෝගිකයන් වෙත සපයනු ලබන සේවාවන්ගේ තත්ත්වය වැඩි දියුණු කිරීමේ හැකියාව ලැබිණි.

තවද නල මාර්ගික මළ අපවහන ආවරණය වැඩි කිරීම සඳහා සහ සනීපාරක්ෂණ පහසු කම් වැඩි දියුණු කිරීම සඳහා විදෙස් අරමුදල් යොදා ගනිමින් සිදු කරන ලද ජල පිළිසැකැසුම් ව්‍යාපෘතීන් 03 ක සංඛ්‍යාවක් ද ප්‍රස්තුත වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි.

ජලයේ සුරක්ෂිත භාවය සහතික කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මධ්‍යම රසායනාගාරය විසින් කලාපීය රසායනාගාරයන්ගේ ද සහාය ලබා ගනිමින් මෙහෙයුම් පසු විපරම් කටයුතු හා හරි වැරදි බැලීම් පසු විපරම් කටයුතු සිදු කරනු ලබයි. 2021 වර්ෂය තුළදී ලබා ගත් විශ්ලේෂණාත්මක දත්තයන් අනුව හෙලිදරව් වී ඇත්තේ මුළු පරීක්ෂණ නියැදි සංඛ්‍යාව අතුරින් සියයට 98.8% ක් බැක්ටීරියා විද්‍යාත්මක පරීක්ෂණයන්ගෙන් සතුටුදායක ප්‍රතිඵල පෙන්නුම් කරනු ලබන බවයි.

ප්‍රස්තුත වර්ෂය තුළදී ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ විවිධ ක්‍රියා මාර්ගයන් ක්‍රියාත්මක කරන ලදි. කොළඹ නගරය තුළ අර්බුදකාරී ප්‍රදේශයන් තෝරා ගැනීමෙන් අනතුරුව මුදා තැබූ මායිම් ස්ථාපිත කොට තුළු ගලනය මැන බලන ලදි. දෘෂ්‍යමාන කාන්දු වීම් හඳුනා ගැනීම සඳහා රාත්‍රී සමීක්ෂණයන්, සොරොව් සමීක්ෂණයන් හා ගෙන් ගෙට සමීක්ෂණයන් සිදු කොට වම කාන්දු වීම් නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදි. ප්‍රස්තුත වර්ෂයේ අවසානය වන විට කොළඹ නගරය තුළ හා දීප ව්‍යාප්ත මට්ටමේ ආදායම් රහිත ජල පරිමාවන් පිළිවෙලින් සියයට 34.75 ක් හා සියයට 25.82 වශයෙන් සටහන් විය.

වර්ධනය වෙමින් පවතින මෙහෙයුම් වියදම් වලට ගැලැපෙන පරිදි ජල ගාස්තු සංශෝධනයක් 2012 වර්ෂයේ සිට සිදු කරනු ලැබ නැත. මේ හේතුව නිසා මෑත වසර කිහිපය තුළදී සිය මුදල් ප්‍රවාහය කළමනාකරණය කිරීම හා සම්බන්ධ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට මණ්ඩලයට සිදු විය. ශේෂ පත්‍රය ශක්තිමත් කිරීම සඳහා හිඟ හිටවනු ලැබ ඇති ණය ප්‍රමාණය සම කොටස් බවට පරිවර්තනය කිරීමට 2014 වර්ෂයේ මහා භාණ්ඩාගාරය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණය තිබියදීත් නව ණය හා සම්බන්ධ බැඳීම් හේතුකොට ගෙන එය සැලැසුම් කළ පරිදි සාර්ථක වූයේ නැත.

2020 වර්ෂය අවසානයේ ලංකා රුපියල් 508,913,642 ක ලාභයක් උපයාගනු ලැබ තිබුණද 2021 වර්ෂය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ලංකා රුපියල් 3,135,546,998 ක පාඩුවක් වාර්තාගත කරනු ලැබ ඇත.

ප්‍රධාන සංඛ්‍යා ලේඛන : ජල සම්පාදන		**2020**	**2021**	**විචලනය %**
ජල සම්පාදන පද්ධතීන් සංඛ්‍යාව		331	**337**	1.81
නල මාර්ගික ජල නිෂ්පාදනය (ඝණ මීටර මිලියන)		782	**815**	4.22
නල මාර්ගික ජල පරිභෝජනය (ඝණ මීටර මිලියන)		589	**605**	2.72
ගෘහස්ථ සම්බන්ධතාවයන් සංඛ්‍යා	අ. බස්නාහිර පලාත	1,005,424	**1,068,600**	6.28
	ආ. වෙනත් පලාත්	1,349,127	**1,464,762**	8.57
ගෘහස්ථ සම්බන්ධතාවයන් මුළු සංඛ්‍යාව		2,354,551	**2,533,362**	7.59
පොදු ජල කණු (සංඛ්‍යාව)	අ. බස්නාහිර පලාත	471	**468**	0.64
	ආ. වෙනත් පලාත්	752	**730**	2.93
මුළු පොදු ජල කණු සංඛ්‍යාව		1,223	**1,198**	2.04
ගෘහස්ථ නොවන සම්බන්ධතා සංඛ්‍යාව	අ. බස්නාහිර පලාත	97,920	**103,208**	5.40
(මුළු ජල කණු සංඛ්‍යාව සමග)	ආ. වෙනත් පලාත්	107,766	**115,754**	7.41
ගෘහස්ථ නොවන සම්බන්ධතා මුළු සංඛ්‍යාව (මුළු ජල කණු සංඛ්‍යාව සමග)		205,686	**218,962**	6.45
සේවා සම්බන්ධතා මුළු සංඛ්‍යාව		2,560,237	**2,752,324**	7.50
මාසික ගෘහස්ථ පරිභෝජනයේ සාමාන්‍යය	අ. බස්නාහිර පලාත	18.52	**17.49**	-
(ගෘහස්ථ සම්බන්ධතාවයකට ඝණ මීටර)	ආ. වෙනත් පලාත්	14.26	**13.73**	-
ජල නිෂ්පාදනයේ පුනරාවර්තන වැය සාමාන්‍යය (ඝණ මීටරයකට රුපියල්)		38.64	**42.58**	-
අලෙවි කරන ලද ඒකකයක මුළු පිරිවැය සාමාන්‍යය (ඝණ මීටරයකට රුපියල්		49.06	**57.37**	-
ඒකකයක ආදායම් සාමාන්‍යය (බිල් කිරීමඟ/පරිභෝජනය) (ඝණ මී/ රුපියල්)		42.78	**47.82**	-
මාසික ගෘහස්ථ බිල් සාමාන්‍ය අගය (රුපියල්)	අ. බස්නාහිර පලාත	862.17	**781.97**	9.30
	ආ. වෙනත් පලාත්	524.93	**485.68**	7.48
මුදල් අය කර ගැනීමේ කාර්යක්ෂමතාවය		0.93	**1.08**	16.13
ගැඹුරු ළිං (සංඛ්‍යා)	අ. සාරන ලද	150	**200**	33.33
	ආ. සාර්ථක වූ	134	**166**	23.88
ආදායම් රහිත ජලය (%)	අ. බස්නාහිර පලාත	25.86	**27.06**	(4.64)
	ආ. වෙනත් පලාත්	23.31	**24.50**	(5.11)
	ඇ. දීප ව්‍යාප්ත	24.63	**25.82**	(4.83)
ප්‍රධාන සංඛ්‍යා ලේඛන : ජල පිළිසැකසුම්				
ගෘහස්ථ සේවා සම්බන්ධතාවයන්	අ. බස්නාහිර පලාත	17,104	**17,203**	0.58
	ආ. වෙනත් පලාත්	859	**3,520**	309.77
ගෘහස්ථ නොවන සම්බන්ධතාවයන්	අ. බස්නාහිර පලාත	1,300	**1,410**	8.46
	ආ. වෙනත් පලාත්	249	**850**	241.37
නිවාස යෝජනා ක්‍රම සම්බන්ධතාවයන් (තොග)	අ. බස්නාහිර පලාත	3,666	**3,666**	-
	ආ. වෙනත් පලාත්	-	**-**	-
මුළු මළාපවහන සම්බන්ධතාවයන්	අ. දීප ව්‍යාප්ත	23,178	**26,649**	14.98
	ආ බස්නාහිර පලාත	22,070	**22,279**	0.95
	ඇ. වෙනත් පලාත්	1,108	**4,370**	294.40
වෙනත් ප්‍රධාන සංඛ්‍යා ලේඛන				
මුළු ආදායම (ලංකා රුපියල් මිලියන - අගය එකතු කළ බද්ද රහිතව)		27,762	**25,657**	(7.58)
මුළු පුනරාවර්තන වියදම් (ලංකා රුපියල් මිලියන)		30,286	**36,559**	(20.71)
සේවා සම්බන්ධතාවයන් 1000 කට මුළු කාර්ය මණ්ඩලය		3.66	**3.38**	7.65
මුළු සංවර්ධන වැය (ලංකා රුපියල් බිලියන)		100.86	**92.90**	(7.89)

සැලකිය යුතුයි : * අගය එකතු කිරීමේ බද්ද රහිතව

+ විචලනය වාසිදායක තත්ත්වයක් දක්වයි.

" 2020 වර්ෂයේ පානීය ජල නිෂ්පාදනය හා සමග සංසන්දනාත්මක ලෙස බලන කල වැඩි වී ඇති සියයට 4.22% ත් සමග ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2021 වර්ෂය තුළදී පානීය ජල නිෂ්පාදනය ඝණ මීටර 815 ක් විය."

ජල සම්පාදනය

පානීය ජල නිෂ්පාදනය

2020 වර්ෂයේ පානීය ජල නිෂ්පාදනය හා සමග සංසන්දනාත්මක ලෙස බලන කල වැඩි වී ඇති සියයට 4.22% ත් සමග ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2021 වර්ෂය තුළදී පානීය ජල නිෂ්පාදනය ඝණ මීටර 815 ක් විය. ගත වූ වසර 10 තුළ පානීය ජල නිෂ්පාදනයේ ප්‍රවණතාවය පහත දක්වනු ලැබ ඇති ප්‍රස්තාර සටහන මගින් පෙන්වා දෙනු ලැබ ඇත. ප්‍රධාන වශයෙන්ම අඹතලේ, ලබුගම, කලටුවාව, බියගම, බම්බුකුලිය, කඳාන හා කෙත්හේන යන මධ්‍යස්ථානයන් විසින් වර්ෂය තුළදී නිෂ්පාදනය කරන ලද 51.62% ක් වූ නිෂ්පාදන ප්‍රතිශතය මගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ප්‍රස්තුත වර්ෂය තුළදී නිෂ්පාදනය කරන ලද ජල පරිමාණයේ ප්‍රධාන කොටසට හිමි කම් කියන්නේ බස්නාහිර පලාතේ ජල සම්පාදන පද්ධතිය විසින් වේ.



2021 වර්ෂය තුළදී පලාත් අනුව ජල නිෂ්පාදනය



නිෂ්පාදන පිරිවැය

2020 වර්ෂය හා සාපේක්ෂකව මුළු නිෂ්පාදන පිරිවැය (රුපියල් මිලියන) ප්‍රභේදනය මෙහි පහත දක්වනු ලැබ ඇත:

නිෂ්පාදන පිරිවැය ඝණ මීටරයකට රුපියල්

2020	2021
49.06	57.37

නිෂ්පාදන පිරිවැය = මුළු පිරිවැය / අලෙවි කළ ඒකක

නිෂ්පාදන පිරිවැය



සේවා සම්බන්ධතාවයන් සංසන්දනය කිරීම

පළාත / සභාය සේවා මධ්‍යස්ථානය	පළාත / සභාය සේවා මධ්‍යස්ථානය අනුව සම්බන්ධතා සංඛ්‍යාව			ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල කලාපය	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල කලාපය අනුව සම්බන්ධතා සංඛ්‍යාව		
	2020 දෙසැම්බර් අවසානයට	**2021 දෙසැම්බර් අවසානයට**	වෙනස %		2020 දෙසැම්බර් අවසානයට	**2021 දෙසැම්බර් අවසානයට**	වෙනස %
බටහිර මධ්‍යම	515,176	**543,011**	6.37	ප්‍රමුඛතාවය	1,885	**1,896**	0.58
				කොළඹ නගරය	145,130	**145,712**	0.40
				කෝට්ටේ	181,270	**185,605**	2.39
				මහරගම	186,891	**209,798**	12.26
බටහිර උතුර	305,299	**332,861**	9.03	කැළණිය	220,646	**236,010**	6.96
				ගම්පහ	84,653	**96,851**	14.41
බටහිර දකුණ	282,869	**295,936**	4.62	දෙහිවල	112,796	**114,425**	1.44
				කළුතර	74,324	**76,608**	3.07
				පානදුර	95,749	**104,903**	9.56
මධ්‍යම	291,357	**307,592**	5.57	මහනුවර උතුර	112,070	**120,332**	3.37
				මහනුවර දකුණ	94,122	**97,488**	3.58
				මහනුවර නැගෙනහිර	85,165	**89,772**	5.41
වයඹ	95,308	**108,403**	13.74	කුරුණෑගල	95,308	**108,403**	13.74
උතුරු මැද	144,495	**160,011**	10.74	අනුරාධපුර	144,495	**160,011**	10.74
සබරගමුව	127,668	**137,450**	7.66	රත්නපුර	66,587	**73,523**	10.42
				කෑගල්ල	61,081	**63,927**	4.66
දකුණු	343,093	**360,999**	5.22	හම්බන්තොට	118,673	**125,047**	5.37
				මාතර	103,645	**107,377**	3.60
				ගාල්ල	120,773	**128,575**	6.46
ඌව	120,006	**131,191**	13.49	බණ්ඩාරවෙල	70,432	**79,628**	13.06
				මොනරාගල	49,574	**56,563**	14.10
උතුරු	31,575	**37,090**	17.47	යාපනය			
				මන්නාරම	31,575	**37,090**	17.47
				වවුනියාව			
නැගෙනහිර	303,391	**332,780**	9.69	අම්පාර	71,714	**79,888**	11.40
				ත්‍රිකුණාමලය	84,768	**93,636**	10.46
				අක්කරෙයිපත්තු	86,836	**93,224**	7.36
				මඩකලපුව	60,073	**66,032**	9.95
එකතුව	**2,560,237**	**2,752,324**	**7.50**	**එකතුව**	**2,560,237**	**2,752,324**	**7.50**

සම්බන්ධතා වර්ධනය



වාර්ෂික බිල්කිරීම හා මුදල් අය කරගැනීම් සංසන්දනය කිරීම



මාසික ගෘහස්ත පරිභෝජන සාමාන්‍යය (සම්බන්ධතාවයකට ඝණ මීටර)



මාසික ගෘහස්ත බිල් පතෙහි සාමාන්‍යය



බිල් කිරීමට අදාල සංඛ්‍යා ලේඛන

විස්තරය	2020 (රුපියල් මිලියන)	2021 (රුපියල් මිලියන)
බිල් කිරීමේ ඉලක්කය (අඟය එකතු කළ බද්ද රහිතව)	25,056	29,043
සැබෑ බිල් කිරීම (අඟය එකතු කළ බද්ද රහිතව)	25,218	25,657
මුදල් රැස් කිරීමේ ඉලක්ක (අඟය එකතු කළ බද්ද රහිතව)	28,211	35,305
සැබෑ මුදල් රැස් කිරීම (අඟය එකතු කළ බද්ද රහිතව)	25,424	29,872

පාරිභෝගික වර්ගය අනුව අලෙවි කරන ලද ජල පරිමාව හා ලැබුණු ආදායම (2021)

පාරිභෝගික වර්ගය	අලෙවි කළ පරිමාව		ආදායම	
	ඝණ මීටර 000	%	රුපියල් මිලියන	%
ඍජු බිල් කිරීම #	463,378	76.72	18,461	65.30
පාසැල්	4,832	0.80	108	0.38
කුලී නිවාස වතු	2,255	0.37	103	0.37
පොදු ජල කණු සම්පාදනය	266	0.04	5	0.02
රජයේ ආයතන හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පරිශ්‍රයන්	35,651	5.91	2,373	8.39
වාණිජ හා කර්මාන්ත	57,347	9.48	5,571	19.71
සංචාරක හෝටල්	2,268	0.37	206	0.73
නාවික කටයුතු	147	0.02	75	0.27
ආයෝජන මණ්ඩලය	4,180	1.85	748	2.64
ආගමික පරිශ්‍රයන්	5,518	0.91	125	0.44
උප එකතුව	**582,840**	**96.37**	**27,775**	**98.25**
තොග බිල් කිරීම්	18,276	3.02	320	1.13
වෙනත් *	3,666	0.61	175	0.62
මුළු එකතුව	**604,782**	**100.00**	**28,270**	**100.00**

\# ගෘහස්ත, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිල නිවාස, රජයේ නිල නිවාස, තට්ටු නිවාස, අගය එකතු කළ බද්ද රහිත ගෘහස්ත, සමෘද්ධි ගෘහස්ත හා සමෘද්ධි කුලී නිවාස වතු

* ඍජු බිල් කිරීම යටතට නොවැටෙන හෝ ඉහත දැක්වෙන පරිදි විශේෂිත කර නොමැති අනිකුත් සියළුම බිල් කිරීමේ වර්ගයන් '' වෙනත් '' යන්න යටතේ ගොනු කරනු ලැබ ඇති අතර අඩු කිරීම් හිලවු කිරීම් ද මෙම වර්ගයට ඇතුලත් කරනු ලැබ ඇත.

පාරිභෝගික වර්ගයන් අනුව ජලය පරිභෝජනය කිරීමේ ප්‍රතිශතය



පාරිභෝගික වර්ගයන් අනුව ආදායම් ප්‍රතිශතය



ආයෝජන සාරාංශය

" මෙම මූල්‍යකරණ ක්‍රමෝපායයන් සියල්ල විසින් 2021 වර්ෂය තුළදී ජල සම්පාදන හා මළාපවහන අංශය තුළ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ලංකා රුපියල් බිලියන 92.9 ක ආයෝජනයක් කිරීම."

වර්ෂ 2017 සිට 2021 දක්වා ජල සම්පාදන හා මළාපවහන අංශය තුළ කරන ලද මුළු ආයෝජනය.



මූල්‍ය ප්‍රභවයන්

2021 වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිය සංවර්ධන ක්‍රියාකාරකම් අඛන්ඩ ලෙස ක්‍රියාත්මක කරගෙන යමින් ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ වූ සෞභාග්‍යයේ දැක්ම තුළ අන්තර්ගත සියළු දෙනා වෙනුවෙන්ම ජලය නම් වැඩ සටහන සාක්ෂාත් කර ගැනීමේ අරමුණ සහිතව නව ව්‍යාපෘතීන් දියත් කරන ලද්දේය.

ශ්‍රී ලංකා ජන රජය විසින් මහා භාණ්ඩාගාර අරමුදල් මඟින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත රුපියල් බිලියන 93.57 ක මුදලක් වෙන් කර දෙන ලද්දේය. මහා භාණ්ඩාගාර වෙන් කිරීම සපයා දෙන ලද්දේ දේශීය අරමුදල් වශයෙන් ලංකා රුපියල් බිලියන 37.58 ක් ද, විදේශ ණය අරමුදල් වශයෙන් ලංකා රුපියල් බිලියන 48.95 ක් ද, විදේශීය ආධාර මුදල් ප්‍රදානයන් වශයෙන් ලංකා රුපියල් බිලියන 0.57 ක් හා ගෘහස්ත සහභාගයට අදාල විදේශීය මූල්‍යකරණය වශයෙන් ලංකා රුපියල් බිලියන 6.47 ක් ද යනාදී වශයෙනි. ඉහතින් සඳහන් කරනු ලැබ ඇති මහා භාණ්ඩාගාර අරමුදල් අතුරින් මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් වෙනුවෙන් රුපියල් බිලියන 51.72 ක මුදල් ප්‍රමාණයක් වෙන් කරන ලද අතර මහා පරිමාණ මළාපවහන ව්‍යාපෘතීන් වෙනුවෙන් රුපියල් බිලියන 6.17 ක මුදල් ප්‍රමාණයක් ද වෙන් කරන ලදි. ''සියළු දෙනා වෙනුවෙන්ම ජලය'' වැඩ සටහන යටතේ දීප ව්‍යාප්ත ලෙස ඇති සියළුම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් තුළම ජල සම්පාදන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා රුපියල් බිලියන 29.81 ක මුදල් ප්‍රමාණයක් වෙන් කර දෙන ලදි. මතු වෙමින් පවතින කුඩා නගර (කුඩා හා මධ්‍යම පරිමාණ) වෙනුවෙන් ජලය සම්පාදනය කර දීම පිණිස කුඩා පරිමාණ හා මධ්‍ය පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘති උපයෝජ්‍යතා විතැන් කිරීම හා ඉඩම් අත්පත් කර ගැනීම් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් දේශීය අරමුදල් ලංකා රුපියල් බිලියන 3.88 ක මුදල් ප්‍රමාණයක් සම්පාදනය කර දෙන ලද්දේය. ජල සම්පාදන අංශයේ ප්‍රජා පහසුකරණය යටතේ වූ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය අරමුදල් වලින් ලංකා රුපියල් මිලියන 2.91 ක මුදල් ප්‍රමාණයක් හා විදේශීය ප්‍රදානයන්ගෙන් ලංකා රුපියල් මිලියන 40.0 ක මුදල් ප්‍රමාණයක් සම්පාදනය කර දෙන ලදි. එසේම ග්‍රාමීය හා ප්‍රාදේශීය ජල සම්පාදන ව්‍යාපෘතීන් සංවර්ධනය කිරීම වෙනුවෙන් ලංකා රුපියල් බිලියන 0.98 ක මුදල් ප්‍රමාණයක් හා මණ්ඩලය විසින් ලබා ගන්නා ලද මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් වෙනුවෙන් ලංකා රුපියල් බිලියන 0.96 ක මුදල් ප්‍රමාණයක් ද සම්පාදනය කර දෙන ලදි.

ඉහත කී වෙන් කිරීමෙන් 2021 වර්ෂය මුළුල්ලේ ක්‍රියාත්මක සැලැසුම ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා රුපියල් බිලියන 48.21 ක අගයකින් යුත් මහා භාණ්ඩාගාර අරමුදල් උපයෝගී කර ගනු ලැබ ඇත. මීට අමතර වශයෙන් 2021 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරනු ලබමින් පවතින මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් වෙනුවෙන් ලංකා රුපියල් බිලියන 35.10 ක වැයක් ද, ''සැමට ජලය'' වැඩ සටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් වෙනුවෙන් ලංකා රුපියල් බිලියන 7.58 ක වැයක් ද, මහා පරිමාණ මළ අපවහන ව්‍යාපෘතීන් වෙනුවෙන් ලංකා රුපියල් බිලියන 4.65 ක වැයක් ද, මතු වෙමින් පවතින කුඩා නගර වෙනුවෙන් ලංකා රුපියල් බිලියන 0.15 ක වැයක් ද, ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ලංකා රුපියල් බිලියන 0.44 ක වැයක් ද, ජල අංශයේ ප්‍රජා පහසුකරණ ව්‍යාපෘතීන් වෙනුවෙන් ලංකා රුපියල් මිලියන 2.92 ක වැයක් හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ලබා ගන්නා ලද ක්‍රියාත්මක කරනු ලබමින් පවතින මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් වෙනුවෙන් ලංකා රුපියල් බිලියන 0.29 ක වැයක් ද දරනු ලැබිණ.

ලංකා රුපියල් බිලියන 48.22 ක් වූ වැයට අමතර වශයෙන් මහා භාණ්ඩාගාර අරමුදලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් ජාතික ඉතිරි කිරීමේ බැංකු ණය සේවා ලෙසින් ලංකා රුපියල් මිලියන 343.21 මුදල් ප්‍රමාණයක් හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් අරමුදල් වලින් ලංකා රුපියල් මිලියන 633 ක මුදල් ප්‍රමාණයක් ද උපයෝගී කර ගන්නා ලදි.

ශ්‍රී ලංකා ජන රජයේ සෘජු වෙන් කිරීම් වලට අමතර වශයෙන් ශ්‍රී ලංකා ජන රජයේ සහතිකය මත ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සෘජු ලෙස විදේශීය / දේශීය බැංකු වෙතින් ලබා ගන්නා ලද ලංකා රුපියල් බිලියන 27.64 ක මුදල් ප්‍රමාණයක් ද ජල සම්පාදන ව්‍යාපෘතීන් වෙනුවෙන් වැය කරන්නට යෙදුනි. මීට අමතර ලෙස 2021 වර්ෂය තුළදී ලංකා රුපියල් බිලියන 3.08 ක ණය පහසුකම් දේශීය බැංකු වෙතින් ලබා ගනිමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දේශීය බැංකු අරමුදලින් ක්‍රියාත්මක වන ජල සම්පාදන ව්‍යාපෘතීන් 11 ක සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරන ලදි.

ඒ හැරුන විට මහා භාණ්ඩාගාරය විසින් ජාතික ඉතිරි කිරීමේ බැංකු ණය සේවා ගෙවීම් කිරීම සඳහා ලංකා රුපියල් බිලියන 13.04 ක මුදලක් උපයෝගී කර ගන්නා ලදි.

මෙම මූල්‍යකරණ ක්‍රමෝපායයන් සියල්ල විසින් 2021 වර්ෂය තුළදී ජල සම්පාදන හා මළාපවහන අංශය තුළ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ලංකා රුපියල් බිලියන 92.9 ක ආයෝජනයක් කිරීමේ ද, ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම හා පුනරුත්ථාපන වැඩ කටයුතු හරහා සිය ව්‍යාපාරික කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා ලංකා රුපියල් බිලියන 1.62 ක් ආයෝජනය කිරීමේ ද හැකියාව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ලැබිණි. වර්ෂය තුළදී කරන ලද ආයෝජනයන්ගේ මුළු අගය ලංකා රුපියල් බිලියන 94.52 ක් විය.

2020 / 2021 ප්‍රාග්ධන අය වැය ලේඛනය යටතේ ලැබුණ ප්‍රාග්ධන අරමුදල් උපයෝගි කර ගැනීම

විස්තරය	2020		2021	
විදේශ සහභාගය (ලංකා රුපියල් මිලියන)	39,005	62%	**38,338**	**77%**
විදේශ ආධාර හා අදාල දේශීය සහභාගය (ලංකා රුපියල් මිලියන)	2,640	50%	**1,703**	**18%**
දේශීය ව්‍යාපෘතීන් වෙනුවෙන් ඒකාබද්ධ අරමුදල් (ලංකා රුපියල් මිලියන)	1,387	50%	**8,174**	**24%**
ණය සේවා ගෙවීම්				
එකතුව	40,033	61%	**48,216**	**52%**

මෙම තත්ත්වය පහළ මට්ටමේ ප්‍රයෝජ්‍යකරණයකට හේතු විය. තවද කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා පැන නැගුන කලින් නොදක්නා ලද ගැටළු වෙන් කර දෙන ලද ප්‍රාග් ධන අරමුදල් වල පහළ මට්ටමේ ප්‍රයෝජ්‍යකරණයට බල පාන ලද තවත් එක් ප්‍රධාන හේතුවක් විය.

2021 වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පුනරුත්ථාපන වැඩ කටයුතු වෙනුවෙන් ලංකා රුපියල් මිලියන 1,289.59 ක මුදල් ප්‍රමාණයක් ද, ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ වැඩ කටයුතු වෙනුවෙන් ලංකා රුපියල් මිලියන 312.88 ක මුදල් ප්‍රමාණයක් ද, බල ශක්ති ඉතිරි කිරීමේ වැඩ කටයුතු වෙනුවෙන් ලංකා රුපියල් මිලියන 130.08 ක මුදල් ප්‍රමාණයක් ද, ප්‍රාග් ධන අයිතමයන් මිළ දී ගැනීම වෙනුවෙන් ලංකා රුපියල් මිලියන 66.00 ක මුදල් ප්‍රමාණයක් හා මළ අපවහන යෝජනා ක්‍රමයන් නඩත්තු කිරීම වෙනුවෙන් ලංකා රුපියල් මිලියන 17.0 ක මුදල් ප්‍රමාණයක් ද ආයෝජනය කරනු ලැබ ඇත. මෙම ක්‍රියාකාර කම් ප්‍රධාන විශයෙන්ම ක්‍රියාත්මක කරනු ලැබ ඇත්තේ 2021 වර්ෂය දක්වා වූ කාල සීමාව ඇතුලත රජය විසින් කරනු ලැබ ඇති ආයෝජනයන්ගෙන් උපයා ගන්නා ලද ආදායම් උපයෝගී කර ගනිමින් වේ. තවද, පුනරුත්ථාපන වැඩ කටයුතු යටතේ ප්‍රමුඛතාවය දෙන ලද්දේ අනුග්‍රාහකයින්ගේ සහාය නොලැබෙන හෝ යෝජනා ක්‍රමයන් වැඩි දියුණු කිරීම සඳහා විශේෂ වෙන් කිරීම් සිදු කොට නොමැති යෝජනා ක්‍රමයන් කෙරෙහි වන්නේය.

අරමුදල් සපයන නියෝජිත ආයතනයන් හා අදාල ශ්‍රී ලංකා රජයේ අරමුදල් හරහා ලැබුණ විදේශ ආධාර දායකත්වය



2021 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලද ව්‍යාපෘති පිළිබඳ විස්තර

කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය	ව්‍යාපෘතියේ නම	ඒජන්සිය	මුළු ඇස්තමේන්තු පිරිවැය ලංකා රුපියල් මිලියන	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
බස්නාහිර	කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය	ඊ.ඩී.ඩබ්ලිව්.සී. - කොරියාව	11,795.00	156,753
වයඹ	දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය	එක්ස්සිම් බැංකුව	10,227.00	90,700
උතුරු මැද	මැදිරිගිරිය ජලසම්පාදන ව්‍යාපෘතිය (බෙ. අදි II)	ශ්‍රී ලංකා රජය	1,500.00	35,000
ඌව	ඇටම්පිටිය ජලසම්පාදන ව්‍යාපෘතිය	ශ්‍රී ලංකා රජය	2,244.00	160,000
	බණ්ඩාරවෙල ජලසම්පාදන ක්‍රමය	ශ්‍රී ලංකා රජය	225.00	40,000
දකුණ	අන්දරගස්යාය ජලසම්පාදන ක්‍රමය	ශ්‍රී ලංකා රජය	214.00	13,500
බටහිර දකුණ	ව්‍යාපෘති වල මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ වත්කම් කළමනාකරණය වැඩිදියුණු කිරීම ප්‍රා.සේ.ම (බ.දකුණ)	ශ්‍රී ලංකා රජය	567.00	-

කාර්ය මණ්ඩලය

> “ 2020 වර්ෂයේ අවසානයට සේවා සම්බන්ධතාවයන් එක් දහසකට තිබුණ සේවක සංඛ්‍යා අනුපාතය වූ 3.66 සිට 2021 වර්ෂයේ අවසානයට 3.38 ක් දක්වා අඩු කර ගැනීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත හැකියාව ලැබිණි. ”

කාර්ය මණ්ඩල සංඛ්‍යා

කාර්ය මණ්ඩලය	2020	2021
(අ). ස්ථිර	9,227	9,063
(ආ). අනියම්	0	0
(ඇ). කොන්ත්‍රාත්	132	207
(ඈ). යන්ත්‍රාගාර තාක්ෂණික වෘත්තීය ආධුනික හා උපාධිධාරී පුහුණුලාභීන්	24	26
එකතුව	**9,383**	**9,296**

2021 වර්ෂය අවසාන වන විට ස්ථිර කාර්ය මණ්ඩලය 9063 ක සංඛ්‍යාවක් ද, කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය 207 ක සංඛ්‍යාවක් හා යන්ත්‍රාගාර තාක්ෂණික වෘත්තීය ආධුනික හා උපාධිධාරී පුහුණු ලාභීන් 26 ක සංඛ්‍යාවක් ද සේවයේ යොදවනු ලැබ සිටි අතර කොන්ත්‍රාත් පදනම යටතේ සිටි බොහෝ සේවකයින් සේවයට බඳවා ගනු ලැබ තිබුනේ විදේශ අරමුදල් ව්‍යාපෘති වල සේවය කිරීම සඳහා වේ.

2020 දෙසැම්බර් මාසයේ අවසානය වන විට සිටි මුළු කාර්ය මණ්ඩල සංඛ්‍යාව 87 කින් අඩු වී තිබෙන්නේ විවිධ වර්ගයන්ට අයත් සේවකයින්ගේ විශ්‍රාම යාම්, ඉල්ලා අස් වීම්, සේවය අතහැර යාම් හා මිය යාම් වැනි හේතූන් නිසා වේ.

2020 වර්ෂයේ අවසානයට සේවා සම්බන්ධතාවයන් එක් දහසකට තිබුණ සේවක සංඛ්‍යා අනුපාතය වූ 3.66 සිට 2021 වර්ෂයේ අවසානයට 3.38 ක් දක්වා අඩු කර ගැනීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත හැකියාව ලැබිණි.

ප්‍රධාන කාර්ය කෘත්‍යයන් අනුව කාර්ය මණ්ඩලය බෙදී ගොස් ඇති අන්දම



ස්ථානය අනුව කාර්ය මණ්ඩලය බෙදී ගොස් ඇති අන්දම



කාර්ය මණ්ඩල ප්‍රතිලාභ.

- ප්‍රස්තුත වර්ෂය තුළදී ඵලදායිතා දිරි ගැන්වීමේ දීමනා සහිතව ලංකා රුපියල් 42,000.00 මුදලක් වාර්ෂික ප්‍රසාද දීමනා වශයෙන් කාර්ය මණ්ඩලය වෙත ගෙවනු ලැබ ඇත.
- මීට පෙර වර්ෂ වලදී මෙන්ම මෙම වර්ෂය තුළදීද ලබා නොගත් වෛද්‍ය නිවාඩු වෙනුවෙන් මුදල් ගෙවීමට කටයුතු කරන ලදි.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත සහනදායී ගාස්තු වලට ප්‍රවාහන පහසුකම් සපයා දෙන ලදි.
- සේවයේ යෙදී සිටියදී මිය ගිය ස්ථිර සේවකයින් වෙනුවෙන් මරණ දීමනා ලබා දෙන ලදි.
- සේවකයින් වෙත දේශීය හා විදේශීය පුහුණු පහසුකම් සලස්වා දෙන ලදි.
- සේවකයින් වෙත තේ දීමනාව වශයෙන් එක් අයෙකුට ලංකා රුපියල් 650.00 ක් වූ මාසික දීමනාවක් දෙන ලදි.
- සේවකයින් වෙත එක් අයෙකුට බාහිර රෝගී අංශ ප්‍රතිකාර දීමනාව වශයෙන් මාසිකව ලංකා රුපියල් 833.33 ක දීමනාවක් ලබා දෙන ලදි.
- රාජ්‍ය බැංකු හරහා ණය පහසු කම් ලබා දෙන ලදි (පිළිවෙලින් මහජන බැංකුව හා ලංකා බැංකුව හරහා නිවාස ණය පහසු කම් හා වාහන ණය පහසු කම් ලබා දෙන ලදි)
- ඊට අමතර වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දස මස් හා එක් අවුරුදු ණය පහසු කම් සලස්වා දෙන ලදි (පොලිය 4.2%).
- උත්සව අත්තිකාරම් වශයෙන් එක් සේවකයකු හට ලංකා රුපියල් 10,000.00 බැගින් ගෙවන ලදි.
- 2021 වර්ෂය තුළදී සේවකයින් 139 දෙනෙකු අතර 12 මාසයේ ණය වශයෙන් ලංකා රුපියල් 59,942,034.00 ක මුදල් ප්‍රමාණයක් හා සේවකයින් 1897 දෙනෙකු අතර 10 මාසයේ ණය වශයෙන් ලංකා රුපියල් 673,467,399.00 ක මුදල් ප්‍රමාණයක් ද සහනදායී පොළී අනුපාතයන් යටතේ බෙදා හරින ලදි.
- බරපතල රෝගී තත්ත්වයන් වෙනුවෙන් වැය කරන ලද වෛද්‍ය වියදම් වලට අමතර වශයෙන් සේවකයින් (ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් ඇතුළු) විසින් දරන ලද වෛද්‍ය වියදම් උපදානය කිරීම මත (ආසන්න වශයෙන්) ලංකා රුපියල් මිලියන 119 ක මුදල් ප්‍රමාණයක වැයක් දරණ ලදි.

කාර්ය මණ්ඩලයේ පඩිනඩි හා ප්‍රතිලාභ

2020 හා 2021 වර්ෂයන්හි කාර්ය මණ්ඩල පඩිනඩි සසඳා බැලීම

විස්තරය	2020 රු.මිලි.	2021 රු.මිලි.
වැටුප්	11,522	15,168
සේවක අර්ථ සාධක අරමුදල වෙත දායක වීම	968	1,177
සේවක භාර අරමුදල වෙත දායක වීම	242	294
එකතුව	**12,732**	**16,639**



“කාලය ගත වීමේදී හා ජලය සමග සියළු දේ වෙනස් වෙයි.”

ලෙනාඩෝ ඩා වින්සි

අධ්‍යාපනික පත්‍රිකාවල හා ලිපිවල සිරිංකි කළෝපයෙන්

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - ව්‍යවසායික අවදානම කළමනාකරණය කිරීම.

අවදානම් කළමනාකරණය ඵලදායී කාර්ය සාධන කළමනාකරණයේ හා පාලනයේ ඉතා වැදගත් අංගයක් වශයෙන් හඳුනා ගනු ලැබ ඇත. නිරන්තරයෙන් පරිනාමය වන ආර්ථික හා ව්‍යාපාරික පරිසරය හා අභියෝගාත්මක ව්‍යාපාරික මෙහෙයුම් හේතුකොට ගෙන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත අවදානම් තත්ත්වයන් හා අවස්ථාවන් ඇති වන අතර ඒවා සතුව වටිනාකම් සෝදාපාළු කිරීමේ හෝ නංවාලීමේ විභව හැකියාව තිබේ. හොඳින් ව්‍යුහගත වූ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් විසින් මණ්ඩලය වෙත ප්‍රතිලාභ ලැබෙන පරිදි පාලනය කරන ලද ආකාරයකට අවදානම් තත්ත්වයන්ට මුහුණ දීමට කළමනාකරණය ධෛර්යමත් කරනු ලබයි. එම නිසා වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය වෙත බල පෑම් වල්ල විය හැකි අවදානම් තත්ත්වයන් හඳුනා ගනිමින් ඒවා කළමනාකරණය කිරීමේ ක්‍රියාවලියක් තිබීමේ අවශ්‍යතාවයක් පැන නගී. ක්‍රමවත් ප්‍රවේශයක් මගින් අවදානම් තත්ත්වයන් කාලීන ලෙස හඳුනා ගැනීමත්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අවදානම් අභිලාෂයන් අනුව ඒවායේ තත්ත්වය විනිශ්චය කිරීමත්, ඒවා ඵලදායී ලෙස පසුවිපරම් කිරීම හා කළමනාකරණය කිරීමත් සහතික කරනු ලබයි. කළමනාකරණ රාමුවක් මගින් අවිනිශ්චිතතාවයන් හා ඒ හා බැඳුන අවදානම් තත්ත්වයන් හඳුනා ගැනීමේ හැකියාව හා ඒවා සම්බන්ධයෙන් ඵලදායී ලෙස කටයුතු කිරීමේ හැකියාව කළමනාකරණය වෙත ලබා දෙනු ලබන අතර පරදුධාරී වටිනාකම් ගොඩ නැගීමේ හැකියාව කළමනාකරණය තුළ නංවා ලනු ලබයි. අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය අවදානම් තත්ත්වයන් හඳුනා ගැනීමේ, විශ්ලේෂණය කිරීමේ, අගැයීමේ හා පසුවිපරම් කිරීමේ විවිධ ප්‍රතිපත්තීන්, ක්‍රියා පිළිවෙල හා ප්‍රාගුණ්‍යයන් වෙත අවධානය යොමු කරමින් ඊට අනුගාමික ලෙස අවදානම් තත්ත්වයන් ඇති වීමේ ප්‍රවණතාවයන් අවම කිරීමේ හා හඳුනා ගනු ලැබ ඇති අවදානම් තත්ත්වයන්ගේ බල පෑම් අවම කිරීමේ විසඳුම් හඳුනාගනු ලබයි.

අවදානම් කළමනාකරණ ව්‍යුහය

අවදානම් තත්ත්වයන් හඳුනා ගැනීමේ, ඒවා උචිත පරිදි කළමනාකරණය කිරීමේ හා අභිලාෂය හා නොගැලැපෙන අවදානම් තත්ත්වයන් හඳුනා ගැනීමේ මූලික වග කීම දරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. මෙම කාර්යය සාමාන්‍යයෙන් පවරනු ලැබ ඇති විගණන හා කළමනාකරණ කමිටුව විසින් අවදානම් තත්ත්වයන් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය කිරීම හා පසුවිපරම් කිරීම සඳහා ස්ථාපිත කරනු ලැබ ඇති පද්ධතීන් හා ක්‍රමයන් ඇතුළු අවදානම් තත්ත්වයන් කළමනාකරණය කිරීමේ ක්‍රියාවලියෙහි ඵලදායී තාවය සමාලෝචනයට භාජනය කළ යුතු අතර විගණන කමිටුවේ කොටසක් වූ අභ්‍යන්තර විගණන කාර්යය විසින් මෙම ක්‍රියාවලියෙහි ඉතා වැදගත් භූමිකාවක් ඉටු කරනු ලබයි.

අංක	අවදානම් තක්සේරුව	ලිහිල් කිරීමේ ක්‍රමෝපායයන්
01.	**නල මාර්ගික ජලය දූෂණය වීම** ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මුහුණ පානු ලබන ඉහළම අවදානම් තත්ත්වය මේ වන අතර වය ආන්තික ප්‍රතිවිපාකයන්ට හේතු වෙයි.	■ සුරක්ෂිත පානීය ජලය සහතික කිරීම සඳහා තුළු මුව මට්ටම ඇතුළු හැකි සෑම මට්ටමකදීම උග්‍ර ගුණාත්ම පරීක්ෂණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම. ■ කර්මාන්තයේ විශේෂඥතාවයක් ඇති සුදුසුකම් ලත් වෘත්තිකයින් පිරිසක් බඳවා ගෙන ක්ෂේත්‍රය පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීම සඳහා ඔවුන් පුහුණු කිරීම ■ උසස් තත්ත්වයේ පරීක්ෂණ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය කරන සියළුම උපකරණයන්ගෙන් සමන්විත ජාත්‍යන්තර ප්‍රමිතිකරණ සංවිධාන (ISO) තත්ත්වයේ රසායනාගාරයන් නඩත්තු කිරීම. ■ ජල ගුණාත්ම පරීක්ෂණ ක්‍රියාවලිය කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන මට්ටම් වල ස්ථාන භාර නිලධාරී මට්ටමේ හා කළමනාකාර මට්ටමේ සහ ඊට අමතර වශයෙන් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේද පසුවිපරමට භාජනය කරනු ලබයි.
02.	**සේවකයින්ගේ ආරක්ෂාව පිළිබඳ අවදානම් තත්ත්වය** කොවිඩ් 19 වසන්ගත තත්ත්වය හේතුකොට ගෙන ඇති වූ අවිනිශ්චිත තත්ත්වයන් නිසා අවදානම් කළමනාකරණය නව මානයක් ගෙන ඇත. කොවිඩ් 19 වසංගතය විසින් අවදානම් තත්ත්ව කළමනාකරණය නව ඉහළ මට්ටම් වෙත ගෙන ගොස් ඇති අතර අවදානම් තත්ත්වයන් විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ දීප ව්‍යාප්ත මෙහෙයුම් කෙරෙහි පැතිර පවතින ලෙස බල පෑම් ඇති කර තිබෙන හෙයින් අවදානම් කළමනාකරණයේ වැදගත් කම අන් කවරදාකටවත් වඩා දැනෙන්නට පටන් ගෙන ඇත.	■ සෞඛ්‍ය බල ධාරීන් විසින් නිකුත් කරනු ලබන මග පෙන්වීම් අනුගමනය කරනු ලබන අතර සේවකයින් හට මග පෙන්වීම් කරනු ලැබේ. ■ සේවකයින් වැඩ වාර සටහනක පදනමක් මත සේවයේ යෙදෙන අතර ගෙදර සිට රාජකාරී කිරීමේ වැඩ පිළිවෙල හා පහසු කම් යොදනු ලැබ ඇත. ■ උණ තත්ත්ව පරීක්ෂා කිරීම්, අහඹු පි.සී.ආර් පරීක්ෂණ හා අත් සනීපාරක්ෂක පහසුකම් වැනි වැඩ බිමේ ආරක්ෂක කාර්ය පටිපාටීන් දියත් කරන ලදි. ■ බාධාවකින් තොරව මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීම අබන්ධ ලෙස කරගෙන යාමට හැකි වන පරිදි ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පුළුල් ලෙස අවදානම් තත්ත්වයන් තක්සේරු කිරීම සිදු කොට මෙහෙයුම් කාර්ය මණ්ඩලයේ සෞඛ්‍යය හා ආරක්ෂාව සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදි.

03.	**ණය අවදානම** කොවිඩ් 19 වසංගත තත්ත්වය සමග අහිතකර ආර්ථික තත්ත්වයන් පැවැති අතර ඒ හේතුකොට ගෙන ඇති වූ රට වසා දැමීමේ තත්ත්වයන් නිසා ගණුදෙනු කරුවන් තුළ ණය ලබා ගැනීමේ සුදුසුකම පහළ බසින ලදි.	■ වර්තමාන තත්ත්වය මත පදනම් වෙමින් බිල් කරන ලද ණය ගැතියන්ගෙන් ණය රැස් කිරීමේ ක්‍රියාවලිය නැවත අගැයුම් කිරීම හා ණය සීමාවන් නැවත පරීක්ෂා කිරීම සිදු කරන ලදි. අදාල කර ගත හැකි සෑම අවස්ථාවකදීම බිල් කරන ලද ණය ගැතියන් වෙත රතු බිල් ඉදිරිපත් කිරීමේ හා සේවා සම්බන්ධතාවයන් විසන්ධි කිරීමේ සීමාවන් ප්‍රති අගැයීමකට ලක් කරන ලද අතර, ගණුදෙනු කරුවන්ගේ ණය ලබා ගැනීමේ සුදුසුකම් සහතික කිරීම පිණිස දැඩි ප්‍රති අගැයීම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරන ලදි. ■ අය කර ගත යුතු සියළුම වෙළෙඳ ණය අදාල කාර්ය මණ්ඩල සාමාජිකයින් සමග පවත්වනු ලබන මාසික රැස්වීම් වලදී කළමනාකරණ කාර්යාලය හා කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් විසින් පසුවිපරමට භාජනය කරන ලදි. මෙම රැස්වීම් වලදී කල් පසු වී ගොස් ඇති ණය පිළිබඳව සාකච්ඡාවට බඳුන් කරනු ලබන අතර, එසේ කල් පසු වී ගොස් ඇති ණය මුදල් අය කර ගැනීම සඳහා අනුගාමී ක්‍රියා කිරීමට හා එසේ කල් පසු වී ඇති ණය මුදල් අය කර ගැනීමට ද අවශ්‍ය පියවර ගනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන මාසික වාර්තා තුළ ණය වල වයස පිළිබඳ විශ්ලේෂණයක් අන්තර්ගත වේ. ■ දීර්ඝ කාල සීමාවක් මුළුල්ලේ හිඟ හිටවනු ලැබ ඇති ණය මුදල් අය කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ නීතිපති වරයාගේ සහයෝගය ලබා ගනිමින් නීත්‍යානුකූල ලෙස ක්‍රියා කිරීමේ පියවර ගනු ලැබේ.
04.	**විනිමය අනුපාතික අවදානම** අනිකුත් ව්‍යවහාරික මුදල් වලට අනුපාතික ලෙස රුපියලේ අගය ක්ෂය වී තිබීම හේතුකොට ගෙන වසංගත කාලය තුළදී ආරම්භ කරනු ලැබ ඇති ජල සම්පාදන ව්‍යාපෘතීන් බොහෝ සංඛ්‍යාවක් මත හා ''සැමට ජලය'' වැඩසටහන මත සෘජු බල පෑම් ඇති කරමින් මිළ දී ගැනීම් පිරිවැය ඉහළ නගිමින් පවතී.	■ විදේශීය ව්‍යවහාර මුදල් ගෙවීම් කිරීම සඳහා වඩාත්ම වාසිදායක විනිමය අනුපාතිකය ලබා ගැනීම පිණිස රජයේ අධීක්ෂණාත්මක අංශයන් සමග සම්බන්ධතා පවත්වාගෙන යාම සිදු කරනු ලැබේ.
05.	**ද්‍රවශීලතා අවදානම** ගණුදෙනු කරුවන් විසින් ණය පියවීමේදී ඇති වන ප්‍රමාදයන් නිසා ප්‍රමාණවත් ලෙස අරමුදල් සපයා ගැනීමට නොහැකි වීම. ණය ආපසු ගෙවීමට ඇති නොහැකියාව නිසා ණය වශයෙන් ලබා ගනු ලබන මුදල් පියවීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ විදිනෙදා වැඩ කටයුතු බාධා රහිත ලෙස කරගෙන යාම කෙරෙහි අහිතකර ලෙස බල පානු ඇත.	■ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය තුළ අනාගත මුදල් අවශ්‍යතාවයන් පිළිබඳ දැනුවත් භාවය සහතික කිරීම පිණිස මුදල් ප්‍රවාහ සටහන් පිළියෙල කිරීම. ■ කෙටි දැනුම් දීමකින් පසුව හදිසි මුදල් ප්‍රවාහ අවශ්‍යතාවයන් ලබා ගැනීමේ හැකියාව සහතික කිරීම සඳහා මහා භාණ්ඩාගාරය සමග ශක්තිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ගොඩ නගා ගනු ලැබ ඇත. ■ කලින් පුරෝකථනය කරනු ලැබ ඇති මුදල් අවශ්‍යතාවයන් ආවරණය කිරීම සඳහා පහසු කම් සූදානම් කරනු ලැබ ඇත.
06.	**භාණ්ඩ ලේඛන/ ඉහළ තොග රඳවා ගැනීම් යල් පැන යාමේ ස්වභාවය** භාණ්ඩ ලේඛන අයිතමයන් මද වේගයෙන් භාවිතයට ගනු ලබන හෙයින් ඒවා යල් පැන යාමේ අවදානමක් තිබේ.	■ තොග මට්ටම් අඩු කිරීම සඳහා සහ තොග යල් පැන යාමේ ප්‍රවනතාවය අඩු කිරීම සඳහා තොග භාණ්ඩ ඇණවුම් කිරීම සිදු කරනු ලබන්නේ ඉල්ලුම හා සමග අනුකූල වෙමින් වේ. ■ ලේඛන භාණ්ඩ වල වයස් විශ්ලේෂණයන් සමාලෝචනයට බඳුන් කරනු ලබන අතර ජල අලෙවි මට්ටම් වැඩි කිරීමට හා භාණ්ඩ තොග මට්ටම් අඩු කිරීමට අදාල ක්‍රමෝපායයන් ක්‍රියාත්මක කරනු ලැබේ. ■ භෞතික භාණ්ඩ ලේඛන හරි වැරදි බැලීම් කරන අතර යල් පැන ගිය හා හානි වූ භාණ්ඩ හඳුනා ගෙන ඒවා බැහැර කිරීම සඳහා අවශ්‍ය වැඩ කටයුතු කරනු ලැබේ.
07.	**සයිබර් අවදානම** තොරතුරු තාක්ෂණ පද්ධතීන් තුළ ඇති විය හැකි සුරක්ෂිතතා බිඳ වැටීම් හා පද්ධති බිඳ වැටීම් හේතුකොට ගෙන මෙහෙයුම් වලට අදාල හා රහස්‍ය දත්ත නැති වීමේ අවදානම හා තොරතුරු තාක්ෂණ පද්ධතීන් බිඳ වැටීම නිසා මෙහෙයුම් වලට බාධා ඇති වීමේ අවදානම	■ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් හා දත්ත කාර්යක්ෂමතාවය පවත්වාගෙන යාම සඳහා සුරක්ෂිතතාවය මත කරනු ලබන තාක්ෂණික තක්සේරු කිරීම ඇතුළු විස්තීර්ණ පාලන ක්‍රම හා සමාලෝචනයන් ස්ථාපිත කරනු ලැබ තිබේ. ■ වැඩ බිම් වලින් පිටත මධ්‍යගත ප්‍රභවයක් වෙත ප්‍රවේශ වීම කළමනාකරණය කරනු ලබන දර්පන පරිගණක වැඩ සටහන් තිබීම. ■ කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත කාර්යාලයීය ලැප්ටොප් පරිගණක වැනි සුරක්ෂිත යටිතල පහසුකම් සපයා දෙනු ලැබ තිබීම.



“ජලය ජීවිතය වන අතර පිරිසිදු ජලය යනු සෞඛ්‍යයයි.”

ඕඩ්‍රි හෙප්බර්න්



මූලාශ්‍ර හා මෙතෙක් සම්පාදනයන් විශ්ලේෂණය කිරීම

කුමාර පොකුණ - පොළොන්නරුව

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ විශ්ලේෂණය

ලාභදායීතාවය

ගත වූ වසර දහය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දළ ලාභ උපයාගෙන තිබුණ ද 2018, 2019 හා 2021 වර්ෂයන් තුළදී ශුද්ධ පාඩු අත් විඳිනු ලැබ ඇත.



විකුණුම් එදිරිව පිරිවැය

මුළු විකුණුම් ප්‍රමාණයන්, විකුණුම් පිරිවැය හා පරිපාලන පිරිවැය ගත වූ වසර දහය තුළදී අඛන්ඩ ලෙස වර්ධනය වී තිබේ. කෙසේ වුව ද පරිපාලන වියදම් වල වර්ධනය වීම විකුණුම් පිරිවැයේ වර්ධනය වීම ඉක්මවා ගොස් තිබේ.



ආදායම එදිරිව වියදම්

ආදායම ගණනය කරනු ලබන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ලැබෙන සියළුම ආදායම් ඇතුලත් කොට වන අතර වියදම තුළට ද දරනු ලබන සියළුම වියදම් ඇතුළු වේ. වියදම් වැඩි වීම ආදායමේ වැඩි වීම ඉක්මවා යයි.



වියදම් අනුපාතිකය

මෙම අනුපාතිකය ජලය අලෙවි කිරීම මගින් උපයා ගනු ලබන එක් රුපියලකට එදිරිව දරණු ලබා ඇති වියදම් ගණනය කරනු ලබයි. 2016 වර්ෂය තුළදී මෙම අනුපාතිකය ආකර්ෂණීය මට්ටමක තිබුණ අතර වී කෙසේ වුව ද අනිකුත් සියළුම වර්ෂයන් තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් එක් රුපියලක් උපයා ගැනීම පිණිස එක් රුපියලකට වැඩි වියදමක් දරනු ලැබ ඇත.



සම කොටස් වලට ණය අනුපාතිකය

සම කොටස් වලට ණය අනුපාතිකය මගින් පෙන්නුම් කරනු ලබන්නේ සම කොටස් හා ණය වල සමානුපාතය වේ



ද්‍රවශීලතාවය

සිය වර්තමාන වත් කම් උපයෝගී කර ගනිමින් වර්තමාන බැර කම් ගෙවනු ලැබීම සඳහා මණ්ඩලය සතුව ඇති හැකියාව නිශ්චය කරනු ලබන්නේ ප්‍රවර්තන අනුපාතිකය විසින් වේ.



ගණනය කරනු ලැබ ඇති මූලික අනුපාතිකයන්ගේ සාරාංශය පහත දක්වනු ලැබ ඇති පරිදි වේ.

විස්තරය	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021
දළ ලාභ අනුපාතිකය	38 %	41 %	39 %	37 %	43 %	41 %	36 %	36 %	40 %	34 %
ශුද්ධ ලාභ අනුපාතිකය	3 %	6 %	7 %	5 %	12 %	8 %	-2 %	-5 %	2 %	-11 %
සම කොටස් මත ලැබීම්	0.20%	0.51%	0.60%	0.33%	0.88 %	0.51 %	-0.15 %	-0.28 %	0.12 %	-0.63 %
යොදවන ලද ප්‍රාග්ධනය මත ලැබීම්	0.0017	0.0041	0.0049	0.0031	0.0076	0.0041	-0.0011	-0.0019	0.0008	-0.004
ප්‍රවර්තන අනුපාතිකය	1.20	1.28	1.78	3.65	5.97	4.14	2.81	1.48	1.84	1.40
ඉක්මන් අනුපාතිකය	0.92	0.98	1.36	2.98	5.34	3.72	2.48	1.34	1.63	1.22
වියදම් අනුපාතිකය	1.1	1.02	1.01	1.09	0.99	1.04	1.13	1.15	1.09	1.19
සම කොටස් වලට ණය අනුපාතිකය	0.17	0.17	0.17	0.05	0.12	0.19	0.26	0.36	0.44	0.48

මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳ විශ්ලේෂණය

නල මාර්ගිය ජල සම්පාදන සම්බන්ධතා ආවරණය (%)



දීප ව්‍යාප්ත මුළු ජල සම්පාදන සම්බන්ධතා සංඛ්‍යාව හා නව ජල සම්පාදන සම්බන්ධතා සංඛ්‍යාව



මුළු නල මාර්ගිය ජල සම්පාදන සම්බන්ධතා ආවරණය තුළට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සම්පාදනය කර දෙනු ලබන නල මාර්ගික ජලය, ප්‍රාදේශීය බල ධාරීන් විසින් සපයනු ලබන නල මාර්ගික ජලය හා ප්‍රජා මූල සංවිධානයන් විසින් සපයනු ලබන ජලය අන්තර්ගත වේ. 2021 වර්ෂය තුළදී ගෘහස්ත පදනම මත බලන කල මුළු නල මාර්ගිය ජල සම්පාදන සම්බන්ධතා ආවරණය 54.2 % ක් වූ අතර ඒ සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ දායකත්වය 44.6 % ක ප්‍රතිශතයක් විය.

ජල සම්පාදන සම්බන්ධතා මුළු සංඛ්‍යාව තුළට හා නව සම්බන්ධතා සංඛ්‍යාව තුළට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දෙනු ලැබ ඇති ගෘහස්ත මෙන්ම ගෘහස්ත නොවන ජල සම්පාදන සම්බන්ධතාවයන් ඇතුලත් වේ. 2021 වර්ෂය තුළදී නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් ලබා දීමේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සැලැකිය යුතු වැඩි දියුණුවක් සාක්ෂාත් කර ගනිමින් නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 192.087 ක සංඛ්‍යාවක් ලබා දීමට සමත් වූ අතර මුළු ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් සංඛ්‍යාව 2,752,324 ක් දක්වා වර්ධනය විය.

සමස්ත ජල ගුණාත්ම ප්‍රතිශතය



ජල ගුණාත්මය විසින් නියෝජනය කරනු ලබන්නේ ගත වූ වර්ෂයන් තුළ ප්‍රමිති පරාමිතීන් තෘප්තිමත් කිරීමට සමත් වූ ක්ෂුද්‍ර පෙව විද්‍යාත්මක පරීක්ෂණයන්ගේ ප්‍රතිශතයයි. අදාල අනුපාතිකය මැණීමේ කාර්යය සඳහා සියළුම වැඩ සම්බන්ධයෙන් හා බෙදා හැරීමේ පද්ධතීන් සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණයන්ගේ සැලැකිල්ලට ගන්නා ලදි. 2021 වර්ෂය තුළදී එය 98.8 % විය.

ආදායම් රහිත ජලය (%)



මෙම ප්‍රස්තාර සටහන විසින් ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමෙහි ලා සාක්ෂාත් කර ගනු ලැබ ඇති වාර්ෂික ප්‍රගතිය නියෝජනය කරනු ලබයි. 2021 වර්ෂය තුළදී දීප ව්‍යාප්ත ආදායම් රහිත ජල පරිමාව සියයට 25.8 % ක් විය.

සේවා සම්බන්ධතා 1000 කට කාර්ය මණ්ඩලය



මෙම අනුපාතිකය මගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ගණුදෙනු කරුවන් 1000 ක් වෙනුවෙන් සේවය කරනු ලබන කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව විස්තර කරනු ලබයි. 2021 වර්ෂයේ අවසානය වන විට මෙම සංඛ්‍යාව 3.38 මට්ටමේ රඳවා ගැනීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත හැකියාව ලැබිණි.

සේවා සම්බන්ධතාවයන් 1000 කට ඇති දෝෂ සහිත ජල මනු සංඛ්‍යාව



මෙම අනුපාතිකය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවා සම්බන්ධතාවයන් 1000 ක පොකුරක් වෙනුවෙන් හඳුනාගනු ලැබ ඇති දෝෂ සහිත ජල මනු සංඛ්‍යාව ගණනය කරනු ලබයි. 2019 වර්ෂයේ සිට රට තුළ පැවැති වසංගත තත්ත්වය හේතුකොට ගෙන අවශ්‍ය උපාංග නොමැති වීම නිසා 2021 වර්ෂයේ අවසානය වන විට මෙම සංඛ්‍යාව 23.1 ක් විය.

සේවා සම්බන්ධතාවයන් 1000 ක් වෙනුවෙන් නිකුත් කරනු ලැබ ඇති ඇස්තමේන්තු බිල් සංඛ්‍යාව



- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවා සම්බන්ධතාවයන් 1000 ක සංඛ්‍යාවකට තිබෙන්නා වූ ඇස්තමේන්තු කරන ලද බිල් සංඛ්‍යාව මෙම අනුපාතය විසින් නියෝජනය කරනු ලැබේ. මෙම සංඛ්‍යාංකයට අනුව, 2021 වර්ෂයේ අවසානය වන විට, රට තුළ පැවැති ලෝක වසංගත තත්ත්වය හේතුකොට ගෙන පාරිභෝගිකයින් 1000 ක සංඛ්‍යාවකට ඇස්තමේන්තු කරන ලද බිල් 31 ක සංඛ්‍යාවක් ජනනය වී ඇත.

නිපදවන ලද ජලය එක් ඝණ මීටරයක් වෙනුවෙන් දරනු ලැබ ඇති බල ශක්ති පිරිවැය (එක් ඝණ මීටරයකට ලංකා රුපියල්)



මෙම අනුපාතිකය විසින් නිපදවනු ලැබ ඇති එක් ජලය ඝණ මීටරයක් වෙනුවෙන් දරනු ලැබ ඇති බල ශක්ති වැය ගණනය කරනු ලබයි. 2016 වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතුව ආකර්ෂණීය අනුපාතිකයක් පැවැතිනි. කෙසේ වුව ද අනිකුත් වර්ෂයන් තුළදී නොයෙක් හේතූන් නිසා සැලැකිය යුතු පිරිවැයක් දැරීමට සිදු වී ඇත.

ලැබිය යුතු ණය ගිණුම් කාල සීමාව (දින ගණන)



ලැබිය යුතු ණය ගිණුම් කාල සීමාව අනුපාතිකය විසින් විස්තර කරනු ලබන්නේ සිය ජල බිල් පත පියවීම සඳහා මණ්ඩලයේ ගණුදෙනු කරුවකු විසින් ගනු ලබන කාල සීමාව (දින සංඛ්‍යාව) වේ. 2021 වර්ෂය තුළදී එම දින සංඛ්‍යාව දින 27 ක් විය.

මෙහෙයුම් අනුපාතිකය



මෙහෙයුම් අනුපාතිකය සංවිධානය වෙනුවෙන් වූ තවත් එක් වැදගත් දර්ශකයක් වේ. මෙම අනුපාතිකය විසින් ආදායම හා වියදම අතර ඇති අනුපාතිකය පැහැදිළි කරනු ලබන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් උපයාගනු ලැබ ඇති එක් රුපියලක් වෙනුවෙන් වැය කරනු ලැබ ඇති මුළු වියදම් අනුපාතිකය 2021 වසර තුළදී 1.104 ක් විය.

තොග කාර්යක්ෂමතාවය



මෙම අනුපාතිකය මගින් විස්තර කරනු ලබන්නේ එක් සේවා සම්බන්ධතාවයක් වෙනුවෙන් දරණු ලැබ ඇති ඉන්වෙන්ටරි පොත් අගයේ අනුපාතයයි. 2021 වර්ෂය තුළදී මෙම අගය එක් සේවා සම්බන්ධතාවයකට ලංකා රුපියල් 3.249 ක් සේ දිස් විය.

සේවා සම්බන්ධතාවයන් 1000 කට ගණුදෙනු කරුවන් විසින් කරනු ලැබ ඇති පැමිණිලි සංඛ්‍යාව



මෙම අනුපාතිකය සේවා සම්බන්ධතාවයන් 1000 කට ගණුදෙනු කරුවන් වෙතින් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව නියෝජනය කරයි. මෙම අනුපාතිකයේ අඩු අගයක් මගින් පෙන්වා දෙනු ලබන්නේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු වල කාර්ය සාධනය හා ගණුදෙනු කරුවන් සම්බන්ධයෙන් සංවිධානය විසින් දක්වනු ලබන සැලැකිල්ලේ කාර්යක්ෂමතාව වන්නේය.



“ ජල චක්‍රය හා ජීවන චක්‍රය යනු දෙකක් නොව එකක් බව අපි අමතක කරන්නෙමු.”

ජැකෙස් අයිව්ස් කොස්ටෝ

කළමනාකරණයේ සාකච්ඡා හා
ඇර්ථික අංග වශයෙන් කිරම පිළිබඳ ප්‍රකාශය

මිනිස්බල සංවර්ධනය හා පුහුණුව

රාජ්‍ය ආයතනයන් තුළ මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා සේවා මට්ටම් වැඩි දියුණු කිරීම

2021 වර්ෂයේ පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය හා අංශ ප්‍රධානීන් වෙතින් ලැබුණ විශේෂ පුහුණු අවශ්‍යතාවයන් මත පදනම් වෙමින් මිනිස්බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය විසින් 2021 වර්ෂය වෙනුවෙන් (දුරස්ත පුහුණු වැඩ සටහන් 115 ක සංඛ්‍යාවක් හා පන්ති කාමර තුළ පුහුණු වැඩ සටහන් 189 ක සංඛ්‍යාවක් වශයෙන්) අභ්‍යන්තර පුහුණු වැඩ සටහන් 304 ක සංඛ්‍යාවක් සැලැසුම් කරන ලද අතර 2021 වර්ෂය තුළදී විවිධ වර්ගයන්ට අයත් සේවක මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් අභ්‍යන්තර පුහුණු වැඩ සටහන් 102 ක සංඛ්‍යාවක් පවත්වන ලද අතර එම වැඩ සටහන් වලට (කළමනාකරණ මට්ටමේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 250 ක සංඛ්‍යාවක් ද, අනිකුත් විධායක ශ්‍රේණි වලට අයත් කාර්ය මණ්ඩල සාමාජිකයින් 1045 ක සංඛ්‍යාවක් ද, අධීක්ෂණ මට්ටමේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 518 ක සංඛ්‍යාවක් ද, ලිපිකාර හා සමාන්තර කාර්ය මණ්ඩල සාමාජිකයින් 516 ක සංඛ්‍යාවක් හා මෙහෙයුම් කාර්ය මණ්ඩල සාමාජිකයින් 97 ක සංඛ්‍යාවක් ද යනාදී වශයෙන්) කාර්ය මණ්ඩල සාමාජිකයින් 2462 ක මුළු සංඛ්‍යාවක් සහභාගි වන ලදි.

2021 වර්ෂය තුළදී පැවැති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුකොට ගෙන පන්ති කාමර තුළදී පැවැත්වීමට සැලැසුම් කරන ලද පුහුණු වැඩ සටහන් වැඩි සංඛ්‍යාවක් පැවැත්වය නොහැකි වූ අතර ඒ නිසා පුහුණු වැඩ සටහන් ගූගල් මීට් හා සූම් මගින් දුරස්ත ලෙස පැවැත්වීමට මිනිස්බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය විසින් වැඩ පිළිවෙල සකස් කරන ලදි.

රට තුළ පිහිටි වෙනත් පුහුණු කිරීමේ ආයතන මගින් පවත්වන ලද පුහුණු වැඩ සටහන්

මිනිස්බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය විසින් සේවක මණ්ඩල සාමාජිකයින් 212 ක සංඛ්‍යාවක් වෙනුවෙන් වෙනත් පුහුණු කිරීම් ආයතන මගින් බාහිර පුහුණුව ලබා දීමට අවශ්‍ය වැඩ පිළිවෙල සකස් කරන ලදි.

මෙම පුහුණු කිරීම් වැඩ සටහන් තුළට දේශීය විශ්ව විද්‍යාලයයන් මගින් පවත්වන ලද ශාස්ත්‍රපති හා පශ්චාත් උපාධි වැඩ සටහන් හා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය, ශ්‍රී ලංකාවේ පුද්ගල කළමනාකරණය පිළිබඳ වරලත් ආයතනය, ඉදි කිරීම් උපකරණ පුහුණු කිරීම් මධ්‍යස්ථානය, ඉදි කිරීම් පුහුණු කිරීම් හා සංවර්ධනය සඳහා වූ ආයතනය, ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනය, නිවාස සැලැසුම් කිරීමේ හා ඉදි කිරීමේ මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ආදිය වැනි විවිධ පිළිගනු ලැබූ ආයතනයන් විසින් පවත්වනු ලබන ඩිප්ලෝමා හා සහතික පාඨ මාලාවන් අන්තර්ගත වේ.

විදේශ පුහුණුව හා නිල සංචාර

කෙටි කාලීන අධ්‍යාපන ශිෂ්‍යත්වයන්

2021 වර්ෂය තුළදී මණ්ඩලයේ සේවක මණ්ඩල සාමාජිකයින් හතලිස් අට (48) ක සංඛ්‍යාවක් වෙත කෙටි කාලීන පුහුණු ලබා දෙන ලද අතර එය සිදු කරන ලද්දේ ජපානයෙන්, සිංගප්පූරුවෙන් ඉන්දියාවෙන් හා චීනයෙන් ලැබුණ මූල්‍ය සහාය උපයෝගී කර ගනිමින් වේ.

දීර්ඝ කාලීන අධ්‍යාපන ශිෂ්‍යත්වයන්

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ විධායක නිලධාරීන් හය (06) ක සංඛ්‍යාවක් වෙත කොරියාවෙන් හා ප්‍රංශයෙන් ලැබුණ මූල්‍ය ආධාර මගින් පහතින් සඳහන් කරනු ලැබ ඇති ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවන් හැදෑරීමේ අවස්ථාව උදා විය.

ජාත්‍යන්තර විධායක ශාස්ත්‍රපති වැඩ සටහන ධඩඔ ඇග්‍රෝ පැරිස් ටෙක්, ප්‍රංශය - සහභාගි වූවන් 3 න් දෙනෙකි.

2021 වර්ෂයේ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවන් සඳහා වූ KOICA ශිෂ්‍යත්ව වැඩ සටහන - ස්ත්‍රී පුරුෂ සමාජ භාවය හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩ සටහන - කොරියන් ජන රජය - එක් අයෙකු සහභාගි වන ලදි.

පාරිසරික ප්‍රතිපත්තිය පිළිබඳ අනාගත ගෝලීය නායකයන් සඳහා වූ ශාස්ත්‍රපති වැඩ සටහන - කොරියන් ජන රජය - දෙදෙනෙක් සහභාගි වූහ.

මීට අමතර වශයෙන් 2021 වර්ෂය තුළදී මිනිස්බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබමින් පැවැති විවිධ ව්‍යාපෘතීන් හා වෙනත් මෙහෙයුම් හා නඩත්තු වැඩ කටයුතු වෙනුවෙන් වූ නැව් ගත කිරීම් පූර්ව පරීක්ෂණයන් සිදු කිරීම සඳහා විදේශ ගත වීම පිණිස නිලධාරීන් 07 ක සංඛ්‍යාවක් වෙත පහසුකම් සලස්වා දෙනු ලැබිණි.

කාර්මික පුහුණුව

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ආධුනිකයින් 550 ක සංඛ්‍යාවක් වෙත කාර්මික පුහුණුව ලබා දෙන ලද අතර ඒ අය අතුරින් පහත දක්වනු ලැබ ඇති ආධුනිකයින් 250 ක සංඛ්‍යාවක් වෙත එම පැවැරුම කරන ලද්දේ මිනිස්බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය මගින් වේ : උපාධි අපේක්ෂකයින්, ජාතික තාක්ෂණික ඩිප්ලෝමා / උසස් ඉංජිනේරු ජාතික ඩිප්ලෝම ශිෂ්‍යයින්, කර්මාන්ත ආධුනිකයින්, තාක්ෂණික විද්‍යාලයයන් තුළ ඉගෙනුම ලබන සිසුන්, වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය තුළ ඉගෙනුම ලබන සිසුන්, ගිණුම් තාක්ෂණ ශිල්පීන්ගේ ආයතනයේ ඉගෙනුම ලබන සිසුන්, වෘත්තීය පුහුණු අධිකාරිය තුළ ඉගෙනුම ලබන සිසුන් හා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය තුළ ඉගෙනුම ලබන සිසුන් ආදී වශයෙනි.

2021 වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත සපයා දෙන ලද පුහුණුව වෙනුවෙන් වූ ප්‍රධාන දර්ශක

පුහුණු වර්ගය	ප්‍රධාන දර්ශකය	ප්‍රතිඵල (%)
අභ්‍යන්තර පුහුණු කිරීම්	වැඩ සටහන් මෙහෙයවීමේ කාර්යක්ෂමතාවය	33.55
	පුහුණු කිරීම් මගින් සිදු වී ඇති මානව සම්පත් සංවර්ධනය	26.30
	පුහුණු වැඩ සටහන් සඳහා සහභාගිත්වය	97.50
	පුහුණු වැඩ සටහන් වෙනුවෙන් අරමුදල් උපයෝගී කර ගැනීම	4.13
රට තුළ බාහිර පුහුණු වැඩ සටහන්	බාහිර පුහුණු කිරීම් ලබා දීමේ කාර්යක්ෂමතාවය	74.65
	පුහුණු කිරීම් මගින් සිදු වී ඇති මානව සම්පත් සංවර්ධනය	2.19
	පුහුණු වැඩ සටහන් වෙනුවෙන් අරමුදල් උපයෝගී කර ගැනීම	81.13
විතෙර පුහුණුව හා සංචාර	පුහුණු වැඩ සටහන් වෙනුවෙන් අරමුදල් උපයෝගී කර ගැනීම	21.50
	විතෙර සංචාරයන් හා පුහුණුව ලබා දීම	කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව 42
		කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව 06
කාර්මික පුහුණුව	ආධුනිකයින් වෙත සේවාස්ථ පුහුණුව ලබා දීම	ශිෂ්‍යයින් සංඛ්‍යාව 250

මිනිස් බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය හරහා සපයන ලද පුහුණු කිරීම් සාරාංශය

2021 ප්‍රගති වාර්තාව -
මිනිස් බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය



2020 හා 2021 පුහුණු වැඩසටහන් සඳහා
සහභාගි වීම සංසන්දනය කිරීම



සේවයේ උත්කෘෂ්ඨභාවය හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ විසඳුම්

තොරතුරු තාක්ෂණය - මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා සේවා මට්ටම් වැඩි දියුණු කිරීම

රාජ්‍ය ආයතනයන් තුළ මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා සේවා මට්ටම් වැඩි දියුණු කිරීම සඳහා යොදා ගත හැකි ඉතාමත්ම ඵලදායී මෙවලම වශයෙන් තොරතුරු තාක්ෂණය සලකනු ලැබේ. ඒ හේතුකොට ගෙන සංවිධානමය න්‍යාය පත්‍රය තුළ ඉහළම ප්‍රමුඛත්වයක් පරිගණක කරණය වෙත ලබා දෙනු ලැබ ඇත. දැනට ක්‍රියාත්මක කරමින් යනු ලබන පරිගණක කරණ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් විවිධ පියවර ගනු ලබමින් පවතී. මෙම ප්‍රයත්නය තුළදී දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතින තොරතුරු තාක්ෂණික විසඳුම් හා ඒ හා අදාල යටිතල පහසුකම් වැඩි දියුණු කරනු ලබන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ අංශය විසින් ප්‍රස්තුත වර්ෂය මුළුල්ලේම නව මෘදුකාංග විසඳුම් ගණනාවක්ම එකතු කරනු ලැබ ඇති අතර යටිතල පහසුකම් වැඩි දියුණු කරනු ලැබ ඇත. එසේම ඇතැම් නව විසඳුම් ගණනාවක් පෙළ ගස්වනු ලැබ ඇති අතර ඒවා ඉතා ඉක්මනින් දියත් කරනු ලැබීම අපේක්ෂා කරනු ලැබේ.

වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීමේ කටයුතු කිරීම

2016 වර්ෂය තුළදී දියත් කරන ලද වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය විසින් ක්‍රියාත්මක මෙහෙයුම් කිරීමෙහි ලා වසර 4 කට අධික කාලයක් සම්පූර්ණ කරනු ලැබ ඇත. අන්ත පරිභෝජකයාගේ ප්‍රති පෝෂණය හා මෙහෙයුම් ප්‍රාගුණ්‍යයන් වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවයන් සැලැකිල්ලට ගනිමින් වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය සතු මෘදුකාංග පද්ධතිය සමග බොහෝ වැඩි දියුණු කිරීම් අන්තර්ගත කරනු ලැබ තිබේ. තවද නව සේවා සම්බන්ධතාවයන් ලබා දීම්, සේවා සම්බන්ධතාවයන් විසංධි කිරීම්, සේවා සම්බන්ධතාවයන් නැවත සංධි කිරීම් ආදිය හා ගණුදෙනු කරුවන් සිටින ස්ථානයන් තුළදී ගෙවීම් රැස් කිරීම වැනි ක්ෂෙත්‍ර මට්ටමේ මෙහෙයුම් පහසුකරණය කිරීමේ අරමුණින් ක්ෂෙත්‍ර සේවා ජංගම යෙදවුම වෙනුවෙන් වැඩි දුරටත් වැඩි දියුණු කිරීම් සිදු කරන ලදි.

දෘඩාංග හා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්

සැපයුම් කරුවන්ගේ හා සේවා සපයන්නන්ගේ සහාය සහිතව දෘඩාංග හා යටිතල පහසුකම් නඩත්තු කිරීම අභ්‍යන්තර දෘඩාංග කණ්ඩායමට අයත් එක් ප්‍රධාන කර්තව්‍යයක් විය. වර්ෂය තුළදී දෘඩාංග හා යටිතල පහසුකම් අඛණ්ඩ ලෙස වැඩි දියුණු කරන ලදි. දුර පිහිටි කාර්යාලයන් හා ගබඩාවන් වෙත ජාල සම්බන්ධකතාවය ව්‍යාප්ත කිරීම සිදු කරන ලදි.

තොරතුරු තාක්ෂණය හා මානව සම්පත්

තොරතුරු තාක්ෂණ පහසුකම් හා පද්ධතීන්ගේ විශ්වසනීයත්වය සැලැකිල්ලට ගනිමින් ඉහළ කළමනාකාරිත්වයන් විසින් අනාගත අවශ්‍යතාවයන් හා ගැලැපෙන පරිදි තොරතුරු තාක්ෂණ පිරිස් බලය වැඩි දියුණු කිරීම සඳහා සහ අභ්‍යන්තරික තොරතුරු තාක්ෂණික මානව සම්පත් ශක්තිමත් කිරීම පිණිස අවශ්‍ය පියවර ගන්නා ලදි. තොරතුරු තාක්ෂණ කණ්ඩායම ශක්තිමත් කිරීමේ අරමුණ සහිතව අංශය වෙත නව ඉංජිනේරු වරුන් බඳවා ගැනීම සඳහා තීරණ ගන්නා ලදි. එසේම අංශය තුළ ඇති වී තිබෙන ඇබෑර්තු පිරවීම සඳහා අවශ්‍ය මූලික පියවර ද ගන්නා ලදි.

කාර්යාල පරිශ්‍රය වැඩි දියුණුකිරීම

තොරතුරු තාක්ෂණ අංශයේ කාර්යාල පරිශ්‍රය ප්‍රති ව්‍යුහගත කිරීමේ අරමුණ සහිතව හා වැඩ කරන පරිසරය නව්‍යකරණය කිරීමේ අරමුණ සහිතව අවශ්‍ය පියවර ගන්නා ලදි. ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය විසින් සම්පාදනය කර දෙන ලද සැලැසුම් පදනම් කර ගනිමින් තොරතුරු තාක්ෂණ අංශය නවීකරණය කිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් සකස් කරන ලද අකර එකී කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සපයා ගන්නා ලද්දේ ප්‍රධාන කාර්යාලය වැඩි දියුණු කිරීම සඳහා වෙන් කරනු ලැබ තිබුණ අරමුදල් වලිනි.

සයිබර් ආරක්ෂාව හා පද්ධතීන් රැක ගැනීම

සංවිධානයට අයත් තොරතුරු තාක්ෂණ පද්ධතීන් ආරක්ෂා කර ගැනීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අවධානය යොමු කළ යුතු වැදගත් අංශයක් වශයෙන් සයිබර් ආරක්ෂාව සලකනු ලැබේ. සයිබර් ආරක්ෂාවේ තත්ත්වය වැඩි දියුණු කිරීම හා පද්ධතීන්ගේ විශ්වාසනීයත්වය නංවා ලීමේ අරමුණ සහිතව විවිධ පියවර ගන්නා ලදි. බලගතු අනවසර ප්‍රවේශයන් වැලැක්වීමේ උපකරණයක් මිළ දී ගෙන සවි කිරීමට කටයුතු කරන ලදි.

වාණිජ ක්‍රියාකාරකම්

ප්‍රධාන කාර්යාලය තුළ ක්‍රියාත්මක වන වාණිජ අංශයක් වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේ අරමුණ සහිතව කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් හා කලාපීය මෙහෙයුම් හා වාණිජ කාර්ය මණ්ඩල සාමාජිකයින් සමග අපි සම්බන්ධීකරණය පවත්වාගෙන යන්නෙමු.

කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ වුව ද අනවශ්‍ය බිල් කිරීමේ සකස් කිරීම් වලක්වා ගැනීමේ අරමුණ සහිතව මනු කියවන්නන් මාර්ගයෙන් පාරිභෝගිකයින් වෙතින් සත්‍ය මනු කියවීම් ලබා ගැනීම සඳහා උපරිම ප්‍රයත්නය දරන ලද අතර ඒ මගින් පාරිභෝගික තෘප්තිය සහතික කිරීමේ හා පාරිභෝගිකයින්ගේ පැමිණිළි වලක්වා ගැනීමේ හැකියාව ලැබිණි.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ගණුදෙනු කරුවන් වෙත කරනු ලබන සේවාවන් ආරම්භ වන්නේ මෙහෙයුම් කණ්ඩායම් විසින් නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් ලබා දීම හා නව මළාපවහන සේවා සම්බන්ධතාවයන් ලබා දීමත් සමග වේ. වාණිජ අංශයන් විසින් සිය කාර්යයන් ආරම්භ කරනු ලබන්නේ නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් අනුමත කිරීම හා ස්ථිර කිරීමත් සමග වන්නේය.

ජංගම විකූණුම් ලක්ෂ්‍ය උපකරණයන් හඳුන්වා දීමත් සමග නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් වෙනුවෙන් මුදල් ගෙවීම් පහසුකරණය කිරීමට වාණිජ අංශය වෙත හැකියාව ලැබුණ අතර ගණුදෙනු කරුවාගේ පරිශ්‍රය තුළදීම කාඩ් පත් මගින් ගෙවීම් කිරීමේ හැකියාව උදා විය. මෙම පහසු කම ලංකා බැංකුව විසින් ලබා දෙන ලද තාක්ෂණික සහයෝගයෙන් 2021 වර්ෂයේ පෙබරවාරි මාසය තුළදී හඳුන්වා දෙන ලදි. ඔවුන් විසින් කිසිදු අය කිරීමකින් තොරව උපකරණ 200 කට වැඩි සංඛ්‍යාවක් ලබා දෙනු ලැබ ඇත. 2021 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට මෙම උපකරණයන් මගින් ගණුදෙනු කරුවන් 14000 ක සංඛ්‍යාවක් වෙතින් රුපියල් මිලියන 250 ක මුළු මුදල් ප්‍රමාණයක් රැස් කර ගැනීමේ හැකියාව ලැබිණි. මෙහි ලා වඩාත්ම වැදගත් කාරණය වන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මේ සඳහා කිසිදු කොමිස් මුදලක් ගණුදෙනු කරුවන් වෙතින් අය කර නොගැනීම වේ.

2022 වර්ෂය තුළදී පාරිභෝගික පරිශ්‍රයන් තුළදීම හිඟ මුදල් රැස් කිරීම සඳහා සහ ජල බිල් පත් වෙනුවෙන් මුදල් අය කර ගැනීමට හැකි වන පරිදි මෙම පහසු කම් දීර්ඝ කරනු ලබනවා ඇත. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අය කැමි ස්ථානයන්හිදී කාඩ් පත් මගින් ගෙවීම් කිරීමේ පහසුකම ද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අන්තර් ජාල ගෙවීම් ද්වාරය භාවිතා කරමින් හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ස්වයං සේවා පංගම යෙදවුම භාවිතා කරමින් මාර්ගගත ක්‍රමයට ගෙවීම් කිරීමේ පහසුකම ද විසින් පාරිභෝගික දැනුවත් භාවය ධෛර්යමත් වූ අතර සෑම වර්ගයකම ණය කාඩ් පත් හා හර කාඩ් පත් භාවිතා කරමින් මෙම ගෙවීම් කිරීම් පහසුකරණය කළ හැකි වේ.

ක්ෂණික කෙටි පණිවුඩ පහසුකම හේතුකොට ගෙන සියළුම ගෙවීම් කිරීම් පහසු විය. ගෙවීම තහවුරු කිරීම කෙටි පණිවුඩයක් යැවීම මගින් සිදු කිරීමේ හැකියාව තිබේ. මෙම පහසුකම සහතික කිරීම සඳහා විවිධ ක්‍රමෝපායයන් යොදා ගනිමින් පාරිභෝගිකයින්ගේ ජංගම දුරකථන අංක යාවත්කාලීන කරන ලදි. ජංගම දුරකථන අංක රැස් කිරීම සඳහා මණ්ඩලයේ සේවකයින් විසින් 2021.01.15 වැනි දින සිට 2021.3.31 වැනි දිනය දක්වා පාරිභෝගිකයින් අතර තරඟයක් පවත්වන ලද අතර එම තරඟය මගින් ජංගම දුරකථන අංක 250000 කට ආසන්න මුළු සංඛ්‍යාවක් රැස් කර ගැනීමේ හැකියාව උදා විය. මිලියන 2.7 ක මුළු සේවා සම්බන්ධතා සංඛ්‍යාව අතුරින් ආසන්න වශයෙන් සේවා සම්බන්ධතා මිලියන 2.3 කට අදාල ජංගම දුරකථන අංකයන් යාවත්කාලීන කර ගැනීමට හැකි විය.

අය කර ගත යුතු හිඟ මුදල් තත්ත්වය හා ණය වයස කොවිඩ් වසංගත සමය අතරතුර වර්ධනය විය. ගාස්තු රැස් කිරීම් සැලැකිය යුතු මට්ටමකින් පහත වැටුන අතර මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා සියළුම වර්ගයන්ට අයත් සේවක මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගිත්වය ලබා ගනිමින් වාණිජ අංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් අතිරේක දායකත්වයක් ලබා දෙන ලදි. ජල බිල් පත් සඳහා මුදල් රැස් කිරීමේ ජංගම වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදි. සේවා සම්බන්ධතාවයන් අත් හිටුවීමේ හා විසන්ධි කිරීමේ වැඩ සටහනක් 2021 සැප්තැම්බර් මාසය තුළදී ආරම්භ කරන ලදි. මෙම සාමූහික ප්‍රයත්නයන් කරණකොට ගෙන හහා සේවා සම්බන්ධතාවයන් විසන්ධි කිරීමේ වැඩ සටහන් හරහා 2021 ඔක්තෝබර් මාසය තුළදී ලංකා රුපියල් බිලියන 3 ක් ඉක්මවා ගිය වාර්තාගත ඉහළම මුදලක් රැස් කිරීමේ හැකියාව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ලැබිණි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සහිතව රැස් කර ගැනීමට නොහැකි තත්ත්වයක ඇති හිඟ මුදල් පොත් වලින් කපා හැරීම සඳහා කටයුතු කරනු ලැබ ඇත. ඉහල මට්ටම් වල සිටින පුද්ගලයින්ගෙන් අය කර ගත යුතුව ඇති හිඟ මුදල් අය කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබ ඇත. නීති පති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය වෙමින් හිඟ මුදල් අය කර ගැනීම සඳහා වූ නෛතික ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබ ඇත.

මාසය	මුළු හිඟ මුදල ලංකා රුපියල් මිලියන
ජනවාරි	5,311
පෙබරවාරි	5,219
මාර්තු	4,974
අප්‍රේල්	4,924
මැයි	5,924
ජුනි	6,018
ජූලි	5,709
අගෝස්තු	6,285
සැප්තැම්බර්	6,242
ඔක්තෝබර්	5,706
නොවැම්බර්	5,348
දෙසැම්බර්	5,045



ග්‍රාමීය ජල සම්පාදනය හා සනීපාරක්ෂණය

1. ගම සමග පිළිසඳර වැඩ සටහන

ග්‍රාමීය ප්‍රදේශයන් තුළ ජීවත් වනු ලබන ඌණ සේවිත / සේවා නොලබන ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් සම්පාදනය කිරීම නංවා ලීම සඳහා විශේෂ වැඩසටහනක් දියත් කරන ලදි. මෙම වැඩ සටහන යටතේ ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුවත් සමග එක් වී ජල සම්පාදන පහසු කම් වැඩි දියුණුකිරීමේ හා නංවා ලීමේ වග කීම පැවැරුනේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙතය.

මෙම වැඩ සටහන දිස්ත්‍රික්ක 17 ක් තුළ ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩ සටහන යටතේ හඳුනාගනු ලැබ තිබී පානීය ජල සම්පාදනය හා අදාල ගැටළු 138 ක සංඛ්‍යාවක් වෙනුවෙන් විසඳුම් සොයා ගැනීමේ වැඩ කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලදි. 2021 වර්ෂය තුළදී යෝජනා ක්‍රමයන් 31 ක සංඛ්‍යාවක දෝෂයන් නිදොස් කිරීමේ ව්‍යාපෘතීන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද අතර අනිකුත් වැඩ කටයුතු අදාල කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් විසින් ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ.

කුඩා නගර හා ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය විසින් වැඩ සටහන සම්බන්ධීකරණය කරනු ලබන අතර පවරනු ලබන කර්තව්‍යයන් බිම් මට්ටමේ ක්‍රියාත්මක කරනු ලබන්නේ අදාල කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් විසින් වේ. කුඩා නගර හා ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය විසින් මහනුවර දිස්ත්‍රික්කයේ (මීමුරේ ඇතුළු) උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කරනු ලබන යෝජනා ක්‍රමයන් 15 ක සංඛ්‍යාවක් වෙනුවෙන් වැඩ සටහන හා සම්බන්ධ යෝග්‍යතා අධ්‍යයනයන්, විස්තරාත්මක සැලැසුම් පිළියෙල කිරීම්, ප්‍රමාණ පත්‍රයන් පිළියෙල කිරීම්, රූප සටහන් පිළියෙල කිරීම්, ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ටෙන්ඩර් ලිපි ලේඛන පිළියෙල කිරීම ආදී වැඩ කටයුතු සිදු කරන ලදි. මෙහි ලා ප්‍රධාන අරමුණ වන ලද්දේ ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව හා එක් වී තාක්ෂණික සහාය ලබා දීම මෙන්ම දැනුම ලබා දීම ද වේ.

2. රජයේ පාඨශාලා සඳහා පානීය ජල සම්පාදන පහසුකම් ක්‍රියාතත්මක කිරීම

ලෝක බැංකුවේ අරමුදල් වලින් ක්‍රියාත්මක කරනු ලබන ආයෝජන ව්‍යාපෘතීන් යටතේ ක්‍රියාත්මක කරනු ලබන අවිනිශ්චිත හදිසි අවස්ථාවන් සඳහා ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාකාරකම් අනුව අධ්‍යාපන අමාත්‍යංශය මගින් රජයේ පාඨ ශාලාවන් වෙත පානීය ජල පහසුකම් සම්පාදනය කිරීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

මෙම වැඩ සටහන යටතේ වූ ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ සියළුම දිස්ත්‍රික්කයන් තුළ පවත්වාගෙන යනු ලබන රජයේ පාඨශාලාවන් ආවරණය වන පරිදි පානීය ජල පහසුකම් සම්පාදනය කර දීම වේ. මෙම වැඩ සටහන සැලැසුම් කරනු ලැබ ඇත්තේ වැඩ සටහනෙහි 1 වැනි පියවර හා 11 වැනි පියවර යටතේ දැනට පිළිවෙලින් පානීය ජලය ලබා ගැනීමේ පහසුකම් නොමැති පාඨශාලාවන් 689 ක සංඛ්‍යාවකට හා පාඨශාලාවන් 1056 ක සංඛ්‍යාවක් වෙත ආරක්ෂිත පානීය ජල පහසුකම් සම්පාදනය කර දීමේ හා සිසුන්ගේ සෞඛ්‍ය සම්පන්න ජීවන ශෛලිය නංවා ලීමේ හා සිසුන්ගේ සෞඛ්‍ය චර්යාවන් ප්‍රවර්ධනය කිරීමේ ද අරමුණු සහිතව වන්නේය.

ඒ අනුව, 2021 වර්ෂය තුළදී පාඨශාලාවන් 194 ක සංඛ්‍යාවක් වෙත හා 2022 වර්ෂය තුළදී පාඨ ශාලාවන් 300 ක සංඛ්‍යාවක් වෙත ද සුරක්ෂිත පානීය ජල පහසුකම් සම්පාදනය කර දීම සැලැසුම් කරනු ලැබ ඇති අතර මේ වෙනුවෙන් 2021 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 207 ක් වේ.

මේ වන විට 2021 වර්ෂය තුළදී පාඨශාලාවන් 64 ක සංඛ්‍යාවක් වෙත සුරක්ෂිත පානීය ජල පහසුකම් සම්පාදනය කර දෙනු ලැබ ඇති අතර ඉතිරි වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. මීට අමතර වශයෙන් 2022 වර්ෂය වෙනුවෙන් වූ ක්ෂේත්‍ර විමර්ෂණයන් සිදු කිරීම හා ඇස්තමේන්තු පිළියෙල කිරීම දැනට සිදු කරනු ලබමින් පවතී.

3. ශ්‍රී ලංකාවේ බෞද්ධ සිද්ධස්ථාන වෙනුවන් ජලය සම්පාදනය කර දීම

බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ඉල්ලීමට අනුව ශ්‍රී ලංකාවේ බෞද්ධ සිද්ධස්ථානයන් වෙත ජල සම්පාදන පද්ධතීන් සම්පාදනය කර දීම මේ යටතේ සිදු කරනු ලැබේ. එකී අමාත්‍යංශයය විසින් සපයනු ලැබ ඇති විස්තර වලට අනුව පානීය ජල පහසුකම් නොමැති බෞද්ධ සිද්ධස්ථාන 1044 ක සංඛ්‍යාවක් රට තුළ තිබේ.

වර්තමානය වන විට එකී අමාත්‍යංශය විසින් මේ හා සම්බන්ධ මූලික අධ්‍යයන කටයුතු කිරීම සඳහා සිද්ධස්ථාන 53 ක සංඛ්‍යාවක් තෝරා ගනු ලැබ ඇති අතර ඒ අනුව එම සිද්ධස්ථානයන් වෙනුවෙන් ව්‍යාපෘති වාර්තා පිළියෙල කරන ලෙස එකී අමාත්‍යංශය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙතින් ඉල්ලීමක් කරනු ලැබ ඇත.

මේ අනුව බෞද්ධ සිද්ධස්ථානයන් වෙත සුරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම ක්‍රියාත්මක කිරීම හා අදාල මූලික විමර්ෂණ කටයුතු, සැලැසුම් හා ඇස්තමේන්තු පිළියෙල කිරීම ආදිය කුඩා නගර හා ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය විසින් දැනට ක්‍රියාත්මක කරගෙන යමින් පවතී.

4. ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

ලෝක බැංකු අරමුදල් මත ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය අදාල දිස්ත්‍රික්ක හතක් තුළ දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. කුඩා නගර හා ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය (ST & RWS) විසින් මග පෙන්වීම් කිරීම, තාක්ෂණික සහාය ලබා දීම හා ව්‍යාපෘතියේ වැඩ කටයුතු පසු විපරමට භාජනය කිරීම කරගෙන යනු ලැබේ.

නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 02 ක සංඛ්‍යාවක්, ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 20 ක සංඛ්‍යාවක් හා වතු අංශයේ ජල සම්පාදන යෝජනා ක්‍රම 02 ක සංඛ්‍යාවක් සම්පූර්ණයෙන් නිම කරන ලද අතර ජල සම්පාදන යෝජනා ක්‍රම 79 ක සංඛ්‍යාවක් පුනරුත්ථාපනය කරන ලදි. ඒ අනුව සුරක්ෂිත පානීය ජලය ලැබීම හේතුකොට ගෙන ආසන්න වශයෙන් 13500 ක ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් වෙත ප්‍රතිලාභ ලැබී තිබේ. මීට අමතර ලෙස ආසන්න වශයෙන් ප්‍රතිලාභීන් 25000 ක සංඛ්‍යාවකට සෙත සලසමින් පෞද්ගලික වැසිකිලි 4267 ක සංඛ්‍යාවක් ද, පාඨශාලා සනීපාරක්ෂණ ව්‍යාපෘතීන් 07 ක සංඛ්‍යාවක් ද, එක් අඟවි ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ද, පොදු පහසුකම් මධ්‍යස්ථාන 02 ක් ද සම්පූර්ණයෙන් නිම කරන ලදි.

ජල සම්පාදන යෝජනා ක්‍රමයන් සැලැසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සමාජ විද්‍යාත්මක යෙදවුම් සමාජ විද්‍යා ඒකකය හා කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් හා අනුබද්ධිත සමාජ විද්‍යාඥයින් විසින් සම්පාදනය කර දෙන ලදි. ජල සම්පාදන ආවරණය සම්බන්ධ ග්‍රාම නිලධාරී වසම් මට්ටමේ දත්ත රැස් කිරීම ගාලු දිස්ත්‍රික්කය හැර අනිකුත් දිස්ත්‍රික්ක 24 ක සංඛ්‍යාව වෙනුවෙන් සම්පූර්ණයෙන් නිම කරන ලද අතර එය සිදු කරන ලද්දේ කලාපීය සමාජ විද්‍යාඥයින්ගේ සහාය ලබා ගනිමිනි. දිස්ත්‍රික්ක 05 ක සංඛ්‍යාවක් වෙනුවෙන් දත්ත ඇතුළු කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් නිම කරන ලද අතර ඉතිරි ග්‍රාම නිලධාරී වසම් වෙනුවෙන් දත්ත ඇතුළු කිරීමේ වැඩ කටයුතු සිදු කර ගෙන යමින් පවතී.

5. මතුවෙමින් පවත්නා නගර ව්‍යාපෘතිය තුළ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ (JICA) අරමුදල් භාවිතා කරමින් ක්‍රියාත්මක කරනු ලබන මතු වෙමින් පවත්නා නගර ව්‍යාපෘතිය තුළ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ අරමුණ වන්නේ උතුරු, නැගෙනහිර, උතුරු මැද හා ඌව යන පලාත් වල ග්‍රාමීය මාර්ග, මධ්‍ය හා සුළු පරිමාණ වාරි මාර්ග හා පානීය ජල පහසුකම් ආදී මූලික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම මගින් ප්‍රාදේශීය ජනයාගේ ජීවන තත්ත්වය නංවා ලීම හා ජීවනෝපායයන් සංවර්ධනය කිරීම වන්නේය.

ඒ අනුව, මතු වෙමින් පවත්නා නගර ව්‍යාපෘතිය තුළ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ පානීය ජල අංගයේ විෂය පථය වන්නේ ඉහත සඳහන් කරනු ලැබ ඇති පළාත් තුළ උප ව්‍යාපෘතීන් 42 ක සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීම වන අතර ඒ අතුරින් උප ව්‍යාපෘතීන් 11 ක සංඛ්‍යාවක් දැනටමත් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. මෙම වැඩ කටයුතු හා සම්බන්ධ සම්බන්ධීකරණ කටයුතු ක්‍රියාත්මක කරනු ලබන්නේ කුඩා නගර හා ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය විසින් වේ.

6. දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP)

මහවැලි සංවර්ධන හා පාරිසරික අමාත්‍යාංශයේ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP) යටතේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනේ ආධාර ඇතිව ක්‍රියාත්මක වන ව්‍යාපෘතියේ 2 වන අංගය වන පානීය ජල සම්පාදනය වැඩ සටහනෙහි සමස්ත ප්‍රගතිය පසු විපරම් කිරීමේ වැඩ කටයුතු හා කුඩා නගර හා ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය (ST & RWS) ක්‍රියාත්මක ලෙස සම්බන්ධ වී කටයුතු කරනු ලබයි.

මෙම ව්‍යාපෘතිය යටතේ යෝජනා ක්‍රමයන් හතරක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ යටතේ ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 1321 ක සංඛ්‍යාවක් සපයා දෙනු ලැබ ඇති අතර නව ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුනක සංඛ්‍යාවක් වෙත තාක්ෂණික සහාය හා මග පෙන්වීම් ලබා දෙනු ලැබ ඇත.

මීට අමතර වශයෙන් මෙම ව්‍යාපෘතිය යටතේ කුඩා නගර හා ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශයේ (ST & RWS) සම්බන්ධීකරණය සහිතව භූ ගත ජලය ප්‍රති ආරෝපනය කිරීමේ යෙදවුම් සම්පාදනය කර දෙනු ලැබ තිබේ.

පොදු ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන

මහජන සම්බන්ධතා ඒකකය විසින් ගණුදෙනුකාර කණ්ඩායම්, පාසැල් දරුවන් හා පාරිභෝගික සමිති ඉලක්ක කර ගනිමින් විවිධ අධ්‍යාපනික හා දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. මෙහි ලා ප්‍රධාන අවධානය යොමු කරනු ලැබ ඇත්තේ ජල සංරක්ෂණය, පාරිසරික පැතිකඩයන් හා ජලාශයන් ආරක්ෂා කර ගැනීම ආදිය කෙරෙහි වේ. මෙම කටයුත්ත මුළු රට පුරාම ක්‍රියාත්මක කරනු ලැබ ඇත. මේ යටතේ පාසැල් තුළ පවත්වන ලද වැඩ සටහන් සංඛ්‍යාව 10 ක් වූ අතර රාජ්‍ය ආයතනයන් තුළ හා පෞද්ගලික අංශයේ ආයතනයන් තුළ පවත්වන ලද වැඩ සටහන් සංඛ්‍යාව 07 ක් විය. ජල සම්පාදන සේවාවට අදාල බොහෝ විවිධ පැතිකඩයන් ආවරණය වන පරිදි ඉලක්ක කණ්ඩායම් වෙත අධ්‍යාපනය ලබා දීමේ අරමුණින් වාර සඟරාවන් පළ කරන ලද අතර එය එම අංශය විසින් ඉටු කරන ලද තවත් කර්තව්‍යයක් විය. ජලය සඟරාවේ නිකුතු 2021 වර්ෂයේ මාර්තු, ජුනි හා සැප්තැම්බර් යන මාස 3 තුළදී පළ කරන ලදි.

මහජන සම්බන්ධතා ඒකකය විසින් බහු ජන මාධ්‍ය ප්‍රචාරක කටයුතු වල නිරත වන ලදි. තොරතුරු, ජල සම්පාදන සේවාවන් විසන්ධි කිරීම හා අදාල ප්‍රකාශන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා සම්බන්ධ විශේෂ සිද්ධීන හා විවෘත කිරීමේ උත්සව පැවැත්වීම ආදිය හා සම්බන්ධ තොරතුරු මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් කරන ලදි. ඇතැම් මාධ්‍යයන් විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රතිරූපය කෙලෙසීම සඳහා යත්න දැරූ විට සත්‍ය තොරතුරු මහ ජනතාව වෙත ඉදිරිපත් කිරීම සඳහා මහජන සම්බන්ධතා අංශය විසින් ක්ෂණික ලෙස ක්‍රියා කරන ලදි.

බල ශක්ති කළමනාකරණය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය තුළ හා ඉන් බාහිර වශයෙන් මෙහෙයවනු ලබන ජල සම්පාදන හා මළාපවහන සේවාවන් ඉහළම ඵලදායී තත්ත්වයට නංවා ලීමේ අරමුණින් සියළුම යාන්ත්‍රික හා විදුලි විසඳුම් හා උපදෙස් හා අදාල සේවාවන් ලබා දීම සඳහා යාන්ත්‍රික හා විදුලි අංශය විසින් අවශ්‍ය වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

කොවිඩ් 19 වසංගත තත්ත්වය අතරතුර කාලය තුළදී යාන්ත්‍රික හා විදුලි අංශයට මුහුණ පෑමට සිදු වන ලද ප්‍රධාන අවදානම් තත්ත්වයන් අතුරින් එක් අභියෝගයක් වූයේ ආනයනය කිරීමේ සීමා කිරීම් සමග යාන්ත්‍රික හා විදුලි උපකරණ නඩත්තු කිරීම හා සම්පාදනය කිරීමයි. එම තත්ත්වය සැහැල්ලු කරන ලද්දේ ඉහළ ප්‍රමුඛත්වය අනුව නිරන්තරයෙන්ම නියමිත අවස්ථාවන්හි සිදු කළ යුතු ආපදා වැලැක්වීමේ නඩත්තු කටයුතු වලට සහභාගි වන ලෙස හා හැකි සෑම අවස්ථාවකදීම හා ස්ථානයකදීම යාන්ත්‍රික හා විදුලි උපකරණ රට තුළම නිෂ්පාදන කිරීම ප්‍රවර්ධනය කරන ලෙස කලාපයන් තුළ සේවයේ යෙදී සිටින යාන්ත්‍රික හා විදුලි කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත උපදෙස් ලබා දීම මගිනි.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය තුළ කරනු ලබන බලශක්ති භාවිතය විශ්ලේෂණය කිරීම ද යාන්ත්‍රික හා විදුලි අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර (විශේෂිත බල ශක්ති පරිභෝජනය අඩු කිරීම මගින්) බල ශක්ති කාර්යක්ෂමතාවය වැඩි දියුණු කරනු පිණිස කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්ට අනුයුක්තව කටයුතු කරනු ලබන අදාල කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහයෝගය සහිතව අදාල ව්‍යාපෘතීන් හඳුනා ගැනීමෙන් පසුව ක්‍රියාත්මක කරනු ලැබේ.

2021 වර්ෂය තුළදී විදුලි පරිභෝජනය වෙනුවෙන් දරන ලද වාර්ෂික පිරිවැය ආසන්න වශයෙන් ලංකා රුපියල් මිලියන 4,624 ක් වූ අතර එම මුළු පරිභෝජනයෙන් ලංකා රුපියල් මිලියන 4.439 ක් හෙවත් සියයට 96% ක ප්‍රතිශතයක් වැය කරනු ලැබ ඇත්තේ ජලය නිෂ්පාදනය කිරීම හා පොම්ප කිරීම වෙනුවෙන් වේ. තවද මළාපවහන ප්‍රතිකාරකරණය වෙනුවෙන් හා පොම්ප කිරීම වෙනුවෙන් ලංකා රුපියල් මිලියන 65 ක මුදලක් වැය කරනු ලැබ ඇත. ඒ අතර කාර්යාල ඉඩ කඩ සඳහා ආසන්න වශයෙන් ලංකා රුපියල් මිලියන 120 ක පමණ මුදල් ප්‍රමාණයක් වැය කරනු ලැබ ඇත. බල ශක්ති සංරක්ෂණය කිරීමේ වැඩ සටහන 2004 වර්ෂය තුළදී හඳුන්වා දෙන ලද අතර එම වැඩ සටහන ක්‍රම ක්‍රමයෙන් සැලැකිය යුතු ප්‍රගතියක් අත් කර ගනු ලැබ ඇත. ගත වූ දශක කිහිපය මුළුල්ලේ ක්‍රියාකාරකම් ගුණාත්මක වශයෙන් හා ප්‍රමාණාත්මක වශයෙන් උසස් මට්ටමක් දක්වා ඉහළ ශ්‍රේණිගත කරනු ලැබ ඇත. ගාස්තු වර්ග නිවැරදි කිරීම්, විදුලි හා යාන්ත්‍රික වැඩි දියුණු කිරීම් වැඩ කටයුතු හා බල ශක්ති සංරක්ෂණය කිරීමේ වැඩ සටහන් 2004 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාල සීමාව තුළ සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉහළ මට්ටමේ බල ශක්ති සංරක්ෂණයක් හා පිරිවැය ඉතිරි කිරීමක් සාක්ෂාත් කරගනු ලැබ තිබේ.

රට තුළ බල පැවැත්වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ පවා කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්ට අනුයුක්ත යාන්ත්‍රික හා විදුලි අංශයන්ගේ සහාය ලබා ගනිමින් 2021 වර්ෂය තුළදී බල ශක්ති විගණනයන් හා අධ්‍යයනයන් තුනක සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරනු ලැබීමට හැකි විය. 2021 වර්ෂය තුළදී ව්‍යාපෘති 15 ක සංඛ්‍යාවක වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට හැකි විය. මෙම සම්පූර්ණයෙන් නිම කරනු ලැබූ හා ක්‍රියාත්මක කරනු ලබමින් පැවැති ව්‍යාපෘතීන් වෙනුවෙන් 2021 වර්ෂය තුළදී වැය කරන ලද මුළු මුදල් ප්‍රමාණය ආසන්න වශයෙන් ලංකා රුපියල් මිලියන 124 ක් විය. මෙම ව්‍යාපෘතීන් හේතුකොට ගෙන ඉතිරි කර ගැනීමට හැකි වූ වාර්ෂික පිරිවැය ආසන්න වශයෙන් ලංකා රුපියල් මිලියන 45 ක් පමණ විය. (2021 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලබමින් පැවැති ව්‍යාපෘතීන් ඇතුළුව) 2022 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරනු ලැබීමට පෙළ ගස්වන ලද ක්‍රියාත්මක කරනු ලබමින් තිබී හා නව ව්‍යාපෘති සංඛ්‍යාව 24 ක් වූ අතර ඒ වෙනුවෙන් ආසන්න වශයෙන් රුපියල් මිලියන 300 ක පිරිවැය ආයෝජනයක් කරනු ලැබීමට අදහස් කරන ලදි.

ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ අපේක්ෂිත සමස්ත කාර්යක්ෂමතාවය හා විශ්වාසනීයත්වය පවත්වාගෙන යාම පිණිස කලාපයන් තුළ ඇති සියළුම යාන්ත්‍රික හා විදුලි උපකරණ හා සම්බන්ධ වැලැක්වීම් නඩත්තු වැඩ සටහන පිළිබඳ සැලැසුම එක් එක් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය හා අනුයුක්ත යාන්ත්‍රික හා විදුලි කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ද සහාය ලබා ගනිමින් යාන්ත්‍රික හා විදුලි අංශය විසින් පසුවිපරම් කරන ලද අතර එහි පරමාර්ථය වූයේ කිසිදු බිඳ වැටීමකින් තොරව මෙහෙයුම් වැඩ කටයුතු කිරීම සහතික කිරීමයි.

මට්ටම් පසුවිපරම් හා දුරස්ථ මෙහෙයුම් පද්ධතීන් සිටින කාර්ය මණ්ඩල සමග එක් වී සැලැසුම් කොට ප්‍රාදේශිකව ඉදි කොට කලාපීය යාන්ත්‍රික හා විදුලි කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහාය සහිතව තෝරා ගත් ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ස්ථාපිත කරන ලදි.

වාහන, ඉහළ මට්ටමේ මානව සංවර්ධන දර්ශකයක් සහිත රටවල් තුළ නිෂ්පාදනය කරන ලද ජල මනු ඇතුළු ජල මනු, තිරස් දිශානුගත විදින යන්ත්‍ර, අගල් කපන යන්ත්‍ර, ජල මනු අමතර කොටස් හා වෙනත් යාන්ත්‍රික හා විදුලි උපකරණ වෙනුවෙන් යාන්ත්‍රික හා විදුලි ටෙන්ඩර් ලියවිලි හා පිරිවිතර සකස් කරන ලදි. යාන්ත්‍රික හා විදුලි උපකරණ වලට අදාල සැලැසුම් කිරීම, ඉදි කිරීම, නඩත්තු කිරීම හා වෙනත් වැඩ කටයුතු සම්බන්ධ සියළුම සහාය වැඩ පිළිවෙල අවශ්‍යතාවය පැන නැඟී ඇති කල්හී කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් වෙත ලබා දෙන ලදි.

ඉහතින් සඳහන් කරනු ලැබ ඇති කරුණු වලට අමතර ලෙස ප්‍රවාහන අංශය, මධ්‍යම වැඩ පොල හා ගොඩනැගිලි නඩත්තු කිරීමේ අංශයන් ද පරිපාලනය කරනු ලබන්නේ යාන්ත්‍රික හා විදුලි අංශය විසින් වේ.

ප්‍රවාහන අංශය යාන්ත්‍රික හා විදුලි අංශය විසින් අධීක්ෂණය කරනු ලබන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතු සියළුම වාහන හා උපකරණ වලට අදාල වාහන බල පත්‍ර, රක්ෂණ කටයුතු, අළුත් වාහන ලියා පදිංචි කිරීමට අදාල කටයුතු සූදානම් කිරීම, කාර්යාලයීය කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරීම හා සුභ සාධන වැඩ කටයුතු වෙනුවෙන් වාහන වෙන් කර දීම, හදිසි අවස්ථාවන් සඳහා වාහන වෙන් කර දීම, දත්ත පද්ධතිය නඩත්තු කරගෙන යාම හා වැය විස්තර හා හදිසි අනතුරු පිළිබඳ විස්තර පිළියෙල කරනු ලබන්නේ යාන්ත්‍රික හා විදුලි අංශය විසින් වේ.

ගොඩනැගිලි නඩත්තු කිරීමේ අංශය වැඩ කටයුතු කරනු ලබන්නේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (යාන්ත්‍රික හා ඉංජිනේරු) යටතේ වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල සංකීර්ණය හා සොයිසා පුර, බඩෝවිට හා රාවතාවත්ත යන ස්ථානයන් තුළ පිහිටි මණ්ඩලයේ නිල නිවාස වලට අදාල සියළුම නඩත්තු කටයුතු ඉටු කරනු ලබන්නේ ගොඩනැගිලි නඩත්තු කිරීමේ අංශය විසින් වේ.

මධ්‍යම වැඩ පොල ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රධාන වැඩ පොල වන අතර ජල හා මළාපවහන ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් තුළ ස්ථාපිත කරනු ලැබ ඇති පොම්ප හා උපාංග ඇතුළු සියළුම යාන්ත්‍රික හා විදුලි උපකරණ වලට අදාල මෙහෙයුම් හා නඩත්තු කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය සහාය මධ්‍යම වැඩ පොල විසින් කලාපී සහාය සේවා මධ්‍යස්ථානයන් වෙත සපයා දෙනු ලබයි.

මධ්‍යම රසායනාගාරය

මධ්‍යම රසායනාගාරය වෙත සැබෑ කාලික ජල ගුණාත්ම දත්ත මාරු කිරීමේ පද්ධතිය වශයෙන් ජල ගුණාත්ම පසුවිපරම් ක්‍රමය දියත් කරනු ලැබ ඇත. 2021 වර්ෂයේ ජල ගුණාත්ම දත්තයන් මගින් හෙලිදරව් වී ඇත්තේ පානීය ජලයේ බැක්ටීරියා විද්‍යාත්මක ජල ගුණාත්මය සියයට 98.8 ක සතුටුදායක ප්‍රතිඵල පෙන්නුම් කරනු ලබන බව හා පානීය ජලයේ භෞතික හා රසායනික ගුණාත්මය සියයට 81.8 ක සතුටුදායක ප්‍රතිඵල පෙන්නුම් කරනු ලබන බවයි.

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ලද ගෘහස්ථ ආදායම් හා වියදම් සමීක්ෂණය හා සමාන්තර ලෙස මෙහෙයවන ලද ගෘහස්ථ පානීය ජල ගුණාත්මය පිළිබඳ ගෘහස්ථ සමීක්ෂණය සාර්ථක ලෙස නිම කරන ලදි.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් මධ්‍යම රසායනාගාරය, බටහිර දකුණු රසායනාගාරය, දෙහිවල රසායනාගාරය, බටහිර නිෂ්පාදන රසායනාගාරය, අඹතලේ රසායනාගාරය හා බියගම රසායනාගාරය, යාපනය රසායනාගාරය හා වවුනියා රසායනාගාරය වෙත ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානය (ISO)/ IES17025 : 2017 රසායනාගාර පිළිගැනීම ප්‍රදානය කරන ලදි. මේ අතර ඒ කාලයේදීම ජාතික ඵලදායිතා මහලේකම් කාර්යාලය විසින් වවුනියාව කලාපීය රසායනාගාරය වෙත හා මීගමුව කලාපීය රසායනාගාරය වෙත ඵලදායිත්ව තෑගිය ප්‍රදානය කරන ලදි.

ක්ලොරින් ඔන්සයිට් ජෙනරේෂන් ක්‍රමය නියමු අධ්‍යයනයක් වශයෙන් සාර්ථක ලෙස මෙහෙයවනු ලැබ ඇති අතර ඒ අනුව විෂ බීජ නාශක ක්‍රමය වැඩි දියුණු කිරීම හා මෙහෙයුම් පිරිවැය අවම කිරීම සඳහාත් දැනට භාවිතා කරනු ලබන විරංජන කුඩු මාත්‍රා කිරීමේ ක්‍රමය වෙනුවට මෙම ක්‍රමය ආදේශ කිරීම යෝජනා කරනු ලැබ ඇත.

ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම

වර්තමානයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දීප ව්‍යාප්ත ලෙස ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 337 ක සංඛ්‍යාවක් මෙහෙයුම් කරමින් හා කළමනාකරණය කරනු ලබමින් පවතී. 2021 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට සමස්ත ආදායම් රහිත ජල පරිමාව සියයට 25.82 % ක් වූ අතර 2024 වර්ෂයේ අවසානය වන විට මෙම ප්‍රමාණය නියයට 20 % ක් දක්වා පහතට ගෙන ඒමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඉලක්ක කරනු ලබයි. ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 337 ක සංඛ්‍යාව අතුරින් සියයට 20% කට අඩු ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 71 ක සංඛ්‍යාවක් තිබෙන අතර ඉතිරි ජල සම්පාදන යෝජනා ක්‍රම 266 ක සංඛ්‍යාව සියයට 20% ඉක්මවා ගිය ආදායම් රහිත ජල පරිමාවන් පෙන්නුම් කරනු ලබයි.

වර්තමාන සන්දර්භය අනුව ආදායම් රහිත ජල පරිමාව පිළිබඳ ගැටළුව සංවර්ධනය වෙමින් පවත්නා ශ්‍රී ලංකාව වැනි රටවල් තුළ ශීඝ්‍රයෙන් ඉහළ නගිමින් පවතී. මෙම ආදායම් රහිත ජල පරිමාව පිළිබඳ ගැටළුව ගැන බොහෝ අය තුළ කිසිදු දැනුමක් නොමැති අතර ගත වූ දශකය තුළදී කොළඹ නගර සීමාව තුළ ආදායම් රහිත ජල පරිමාව සියයට 50% ක ප්‍රතිශතයක් විය. තවද මෙම ගැටළුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය තුළ අති විශාල පාඩු සිදු වීමට හේතු වන අතර නීත්‍යානුකූල ජල පාරිභෝගිකයින් හටද එය ගැටළු පැන නැඟීමට හේතුවක් වී තිබේ. විවිධ ක්‍රමෝපායයන් හා වැඩ සටහන් මගින් ආදායම් රහිත ජල පරිමාව අවම කරනු ලැබීමට දරනු ලබන ප්‍රයත්නයන් සමග නව ජල සම්පාදන සම්බන්ධතා දීමේ පරිශ්‍රමය හරහා ජල සම්පාදන ගණුදෙනු කරුවන්ගේ පදනම නංවා ලීමට ද සැලැසුම් කරනු ලැබේ.

භූගත ජලය

භූගත ජල අංශය ප්‍රධාන වශයෙන්ම යෙදී සිටින්නේ නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙත ජලය සම්පාදනය කර දීමට අදාල භූගත ජල හා සම්බන්ධ වැඩ කටයුතු වල වන්නේය. මෙහි පහත දක්වනු ලැබ ඇති පරිදි භූගත ජල අංශය විසින් 2021 වර්ෂය තුළදී භූගත ජලය හා සම්බන්ධ බොහෝ වැඩ කටයුතු වල නියැලෙන ලදි.

ප්‍රස්තුත වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ජල විද්‍යාත්මක විමර්ෂණයන්, ගැඹුරු හා නොගැඹුරු මිහි විදමන් ඉදි කිරීම හා දීර්ඝ කාලීන ලෙස භූ ගත ජලය උකහා ගත හැකි වන පරිදි ළිං හා ජලධරයන් තක්සේරු කිරීමට අදාල වැඩ කටයුතු ද ක්‍රියාත්මක කරන ලදි. තවද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ගැඹුරු හා නොගැඹුරු නල ළිං සංවර්ධනය කිරීම ද, භූගත ජලය ප්‍රති ආරෝපණය කිරීමේ වැඩ කටයුතු ද, අත් පොම්ප අළුත්වැඩියා කිරීමේ කටයුතු හා පුනරුත්ථාපනය කිරීමේ කටයුතු ද, භූගත ජලයේ ගුණාත්ම සිතියම් පිළියෙල කිරීම හා භූගත ජලය හා සම්බන්ධ ගැටළු අධ්‍යයනය කිරීමේ කටයුතු ද සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදි.

මුළු සංඛ්‍යාවක් වශයෙන් ජල විද්‍යාත්මක විමර්ෂණයන් 568 ක සංඛ්‍යාවක් ද, බිම් විදමන් ඉදි කිරීම් 194 ක සංඛ්‍යාවක් ද, සෝදා හැරීම් හා ළිං සංවර්ධන කටයුතු කිරීම් 153 ක සංඛ්‍යාවක් ද, නව අත් පොම්ප ස්ථාපිත කිරීම් 4 ක සංඛ්‍යාවක් ද, අත් පොම්ප නල ළිං අළුත්වැඩියා කිරීම් හා පුනරුත්ථාපන කටයුතු කිරීම් 176 ක සංඛ්‍යාවක් ද, පොම්ප කිරීමේ පරීක්ෂණයන් 82 ක සංඛ්‍යාවක් ද, ප්‍රවාහ මැණීම් කටයුතු 3 ක සංඛ්‍යාවක් හා වේගයෙන් ජලය පිට කිරීම් 8 ක සංඛ්‍යාවක් ද ගත වූ 2021 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි.

අමාත්‍යාංශයේ වැඩ සටහන යටතේ භූගත ජල සංවර්ධන අංශය විසින් ළිං 29 ක සංඛ්‍යාවක් ඉදි කිරීම හා පාසැල් වලට ජලය සම්පාදනය කර දීමේ වැඩ සටහන් 25 ක සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීම සම්පූර්ණයෙන් නිම කරන ලදි. දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේ ද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නව ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේ හා වෙනත් ආයතනයන් තුළ ද ඇති භූගත ජල ප්‍රභවයන්ගේ මුළු ධාරිතාව දිනකට ජලය ඝණ මීටර 12068 කින් වර්ධනය කරන ලදි.

විදමන් කරුවන් හා විදමන් මෙහෙයුම් කරුවන් වෙනුවෙන් (නොගැඹුරු ළිං ඉදි කිරීම් සම්බන්ධයෙන් දින 10 ක වැඩ සටහන් හා ගැඹුරු ළිං ඉදි කිරීම් සම්බන්ධයෙන් දින 5 ක වැඩ සටහනක් ද වශයෙන්) පුහුණු වැඩ සටහන් දෙකක් සාර්ථක ලෙස පවත්වන ලදි. භූගත ජල බලධාරීන් හා භූගත ජලය භාවිතා කරන්නන් දැනුවත් කිරීම සඳහා ''ජල සම්පාදන යෝජනා ක්‍රමයන් සඳහා භූගත ජල ප්‍රභවයන් කළමනාකරණය කිරීම සඳහා මාර්ගෝපදේශ'' නමින් වූ ග්‍රන්ථයක් පළ කරන ලදි. මීට අමතර වශයෙන් අත් පොම්ප අළුත්වැඩිය කිරීම් කටයුතු වලදී ඵලදායී ලෙස 'භාවිතා කිරීම සඳහා අතිරික්ත අමතර කොටස් යොදා ගනිමින් නව 173 IM 3 සිලින්ඩර එකලස් කරන ලදි.

සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මෙහෙයුම් සඳහා කාලීන ලෙස සැපයුම් ලබා දීම සහතික කරමින් හා ඒ අතර ද්‍රව්‍ය ප්‍රති සම්පාදන හා ගබඩා කිරීම සම්බන්ධ නිවැරදි මිළ දී ගැණුම් ප්‍රතිපත්තීන් හා කාර්ය පටිපාටීන් පවත්වාගෙන යනු ලබමින් සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ අංශය විසින් සිය වැඩ කටයුතු ඉදිරියට කරගෙන යන ලදි.

සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ අංශය විසින් අඛන්ඩ ලෙස පැවැති රට වසා දැමීම්, මුහුදු ප්‍රවාහන ගාස්තු වල වැඩි වීම හා භාණ්ඩ ප්‍රවාහන නාවික සේවාවන් විසින් මුහුණ පාන ලද සීමා කිරීම් වැනි කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ මුහුණ දෙන්නට සිදු වූ බොහෝ අවහිර හා බාධක මධ්‍යයේ වුව ද 2021 වර්ෂය මුළුල්ලේම කිසිදු බාධාවකින් තොරව රසායනික ද්‍රව්‍ය සම්පාදනය කර දීම පිණිස දරණ ලද ප්‍රයත්නයන් ඉතාමත්ම සාර්ථක වූ බව සඳහන් කළ යුතු වේ. සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය හා සම්බන්ධ අදාල කාර්ය මණ්ඩලය විසින් වර්ෂය තුළදී සාක්ෂාත් කර ගනු ලැබීමට ඉලක්ක කරන ලද වැඩිම නව ජල සම්පාදන සම්බන්ධතා සංඛ්‍යාව ලබා දීම සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය කරන ද්‍රව්‍ය සපයා දීමට රට වසා දමා තිබි කාල සීමාවන් තුළදී පවා කැප වීමකින් යුතුව වැඩ කටයුතු කරන ලද අතර ඕනෑම තිරණාත්මක තත්ත්වයකට වුව ද මුහුණ දිය හැකි වන පරිදි ආරක්ෂක තොගයක් ද පවත්වාගෙන යාමට නිසි කටයුතු ඉටු කරන ලද අතර එසේ කිරීමට හැකි වූයේ අඛන්ඩ ලෙස අනුගාමී ක්‍රියාවන්හි යෙදීමේ හා අනුගමනය කරන ලද කාලීන ක්‍රමෝපායයන් වල ප්‍රතිඵලයක් වශයෙන් බව කිව යුතු වේ.

අපි පහත සඳහන් කරනු ලැබ ඇති ආයතනයන් සමග සම්බන්ධීකරණය වෙමින් නැව් බඩු තොග 450 කට අධික සංඛ්‍යාවක් නිශ්කාෂණය කර ගැනීමේදී නැව් භාණ්ඩ නිශ්කාෂණය කිරීමේ ඉහළ ප්‍රමිතියක් පවත්වාගෙන ගියෙමු. එම ආයතනයන් වන්නේ ජල සම්පාදන අමාත්‍යංශය, රජයේ මහා භාණ්ඩාගාරය, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, බැංකු, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, නැව් සමාගම් හා රක්ෂණ සමාගම් වේ. ප්‍රමාද ගාස්තු ගෙවීම මග හැරීම සඳහා එසේ නිශ්කාෂණය කිරීමේදී නිශ්කාෂණ ඒජන්සි විධිමත් භාවයන් අනුගමනය කරමින් හා අදාල නැව් භාණ්ඩ නිශ්කාෂණය කිරීමේ කාර්යක්ෂමතාවය පවත්වාගෙන යමින් වැඩ කටයුතු සිදු කළෙමු. මී අමතර වශයෙන් රුපියල් මිලියන 530 ක මුළු අගයකින් යුත් දේශීය මිළදී ගැණුම් වෙනුවෙන් අපි මිළ දී ගැනීමේ ඇණවුම් 953 ක සංඛ්‍යාවක් හා ප්‍රදාන ලිපි ආසන්න වශයෙන් 122 ක සංඛ්‍යාවක් නිකුත් කරන්නට කටයුතු කළෙමු.

නව ද්‍රව්‍ය මිළ දී ගැනීමෙන් තොරව දීප ව්‍යාප්ත ලෙස පිහිටා ඇති කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් තුළ තිබි අතිරික්ත ද්‍රව්‍ය නැවත බෙදා හැරීම මගින් රුපියල් මිලියන 53 ක මුදලක් ඉතිරි කර ගැනීමට මෙම ප්‍රස්තුත වර්ෂය තුළදී අපට හැකියාව ලැබිණි.

මුළු දිවයින පුරාම පිහිටි ගබඩා 318 සම්බන්ධ කිරීම සඳහා ඉන්වෙන්ටරි කළමනාකරණ මෘදුකාංගයක් හඳුන්වා දීමේ ක්‍රියාවලියක් දැනට දියත් කරනු ලැබ ඇති අතර අද වන විට ගබඩා 307 ක සංඛ්‍යාවක් සම්බන්ධ කරනු ලැබ ඇති අතර එම ක්‍රියාවලිය සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට ආසන්න තත්ත්වයක පවතී. දැනට ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවත්නා ඉන්වෙන්ටරි කළමනාකරණ පද්ධතියට අමතර වශයෙන් සියළුම ගණුදෙනු හා ශේෂයන් වෙන වෙනම හඳුනා ගැනීමේ කාර්යය සඳහා ජලය හා සම්බන්ධ සියළුම වැඩ සටහන් සම්බන්ධ ද්‍රව්‍ය මිළ දී ගැනීම් සටහන් කිරීමට හැකි වන පරිදි නව ඉන්වෙන්ටරි කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දෙනු ලැබීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබ තිබේ.

මේ කාලය වන විට ඉන්වෙන්ටරි කළමනාකරණ පද්ධතිය තුළ සටහන් කරනු ලැබ ඇති අයිතමයන්ගේ අගය මෙහෙයුම් කරගෙන යනු ලබමින් පවත්නා වැඩ සටහන් වල මුළු අගය වූ රුපියල් මිලියන 9,000 ක අගය අතුරින් ආසන්න වශයෙන් රුපියල් මිලියන 8,000 ක අගයකි.

2021 වර්ෂය තුළදී රුපියල් මිලියන 2485 ක මුළු අගයකින් යුත් කොන්ත්‍රාත් ලිපි ලේඛන 23 ක සංඛ්‍යාවක් අප විසින් පිළියෙල කරනු ලැබ ඇත. ප්‍රස්තුත වර්ෂය තුළදී අප විසින් අතිරික්ත හා යල් පැන ගිය භාණ්ඩ තොග 78 ක සංඛ්‍යාවක් වෙනුවෙන් මිළ ගණන් කැඳවීම් කරනු ලැබ ඇති අතර ඒවායේ ඇස්තමේන්තු කරන ලද වටිනාකම රුපියල් මිලියන 42 ක් වේ. අය වැය ලේඛන වෙන් කිරීම් තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට අප හට හැකියාව ලැබී තිබෙන අතර සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ අංශයේ සමස්ත කාර්ය සාධනය අපේක්ෂිත මට්ටම් කරා ළඟා වී තිබේ.

කොවිඩ් 19 වසංගත තත්ත්වය වර්ෂය පුරාම පැතිර පැවැති 2021 වර්ෂය තුළදී වුව ද කිසිදු බාධාවකින් තොරව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර 342 ක සංඛ්‍යාවක් වෙත රසායනික ද්‍රව්‍ය සම්පාදනය කර දීමට හැකි වීම හා නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය සම්පාදනය කර දීමට හැකි වීම ද සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ අංශය විසින් ප්‍රස්තුත වර්ෂය තුළදී සාක්ෂාත් කර ගනු ලැබූ සැලැකිය යුතු ජයග්‍රහණයක් බව කිව යුතුව ඇත.

සංවර්ධනය

ප්‍රස්තුත 2021 වර්ෂය තුළදී සංවර්ධන අංශය ප්‍රධාන වශයෙන්ම යෙදී සිටියේ ජලය උකහා ගැනීම් අනුමත කිරීම්, නව ප්‍රභව යෝජනාවන්, ප්‍රගතිය පසුවිපරම් කිරීමේ කටයුතු හා ජල සුරක්ෂිතතා සැලැසුම් විගණනය කිරීම් වැනි ජල සුරක්ෂිතතා සැලැසුම් හා සම්බන්ධ වැඩ කටයුතු වල හා ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් ඇතුළු ජල සම්පත් සංවර්ධන වැඩ කටයුතු වල හා හදිසි අවස්ථා සඳහා ප්‍රතිචාර දැක්වීමේ සැලැසුම යාවත්කාලීන කිරීම හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමග සම්බන්ධීකරණය පවත්වාගෙන යාම වැනි ජල සම්පත් සංවර්ධනය කිරීමේ කටයුතු වල වන්නේය.

ජල සම්පත් වෙන් කර දීම් හා ජලය උකහා ගැනීම සඳහා අනුමැතිය ලබා දීම් සම්බන්ධයෙන් කලාප හා අදාල පරදු ධාරී සංවිධානයන් අතර සම්බන්ධීකරණය ගොඩ නැගීම සඳහා නව සංවිධානයක් ගොඩ නගන ලදි. ජලය උකහා ගැනීමේ අනුමැතීන් 243 ක සංඛ්‍යාවක් ලබා ගන්නා ලද අතර 2025 සංයුක්ත සැලැසුමට අනුව වාරි මාර්ග දෙපාර්තමේන්තුව වෙතින් හා ශ්‍රී ලංකාවේ මහවැලි අධිකාරිය වෙතින් අනුමැතීන් 46 ක සංඛ්‍යාවක් ලැබීමට පෙළ ගස්වනු ලැබ තිබේ.

තඹුත්තේගම, එප්පාවල, රාජාංගනය හා ගිරිබාව ජල සම්පාදන ව්‍යාපෘතීන් වෙනුවෙන් මෙන්ම නොච්චියාගම වීකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් ද ජලය ලබා ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අංගමුව ජලාශය සමග අවබෝධතා ගිවිසුමකට ඇතුලත් වී ඇත. ගංගා ද්‍රෝණි 42 ක සංඛ්‍යාවකින් ජලය උකහා ගැනීමට අදාල විස්තර හා වීකාබද්ධ කළමනාකරණය සඳහා ගංගා ද්‍රෝණි ප්‍රමුඛතාගත කිරීම හා අදාල දත්තයන්, ජල ප්‍රභව දත්ත පද්ධතියක් පිළියෙල කිරීම, හා 2020 - 2025 අතර ජල සම්පත් සංවර්ධනය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා ක්‍රමෝපායික සැලැසුමක් කෙටුම්පත් කිරීම වැනි වැඩ කටයුතු නිම කොට වාරි මාර්ග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදි. ජල ප්‍රභවයන් හා වර්ග වැනි පරිපාලන මායිම් පදනම් කර ගනිමින් පිළියෙල කරන ලද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ දැනටමත් පවත්නා හා යෝජිත ජල උකහා ගැනීම් වලට අදාල විස්තර අන්තර්ගත ''ජල ප්‍රභවයන්'' යන නමින් යුත් කුඩා පොත් පිංචක් පිළියෙල කරන ලදි. මීට අමතර වශයෙන්, ගෝලීය ජල සංවිධානයන් වෙනුවෙන් ජාතික වශයෙන් නිශ්චය කරන ලද දර්ශකයන් පිළියෙල කිරීම ද, (මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද) ජාතික යොදා ගැනීම් සැලැසුම සම්බන්ධීකරණය කිරීම ද, වැඩ බිම් තුළ ආරක්ෂාව වෙනුවෙන් මාර්ගෝපදේශ පිළියෙල කිරීම ද, ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය තක්සේරු කිරීම ද, ව්‍යාපෘතීන් වෙනුවෙන් අවසර ලබා ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා මධ්‍යම පරිසර අධිකාරිය අතර සම්බන්ධීකරණය ඇති කිරීම ද ප්‍රධාන දායකත්වයන් අතර වූහ.

ජල සුරක්ෂිතතා සැලැසුම් උපදේශක වීකකයේ සහයෝගය සහිතව ජල සුරක්ෂිතතා සැලැසුම් වීකකය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් වූයේ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් 7 ක සංඛ්‍යාවක් තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වීම් කිරීම, එකී කලාපයන් තුළ විධිමත් හා විධිමත් නොවන විගණනයන් ක්‍රියාත්මක කිරීම, ජල සුරක්ෂිතතා සැලැසුම් පිළිබඳ පුහුණු වැඩ සටහන් පැවැත්වීම හා ලෝක සෞඛ්‍ය සංවිධානයේ හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සහාය සහිතව ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වන ලද බාහිර විධිමත් විගණනයන් සම්බන්ධීකරණය කිරීම ද වන්නේය. 2021 වර්ෂයේ මැයි මාසය තුළදී ජල සුරක්ෂිතතා සැලැසුම් හා අත් දැකීම් බෙදා හදා ගැනීම පිළිබඳ වෙබ් සම්මන්ත්‍රනයක් ද පවත්වන ලදි.

සියළුම මොඩියුල 11 ම ආවරණය කරමින් ජල සම්පාදන යෝජනා ක්‍රම 333 ක් වූ මුළු සංඛ්‍යාව අතුරින් ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 172 ක සංඛ්‍යාවක් තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. මේ අතර ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 117 ක සංඛ්‍යාවක් තුළ එම කටයුතු දැනට සිදු කරමින් යනු ලබන අතර ශේෂ වූ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 44 ක සංඛ්‍යාව තුළ 2022 වර්ෂය තුළදී එම කටයුතු ආරම්භ කරනු ලැබීමට නියමිතව ඇත.

පර්යේෂණ හා සංවර්ධනය

පර්යේෂණ තක්සේරු කමිටුව විසින් තෝරා ගනු ලැබ ඇති පර්යේෂණ අධ්‍යයන යෝජනාවන් 10 ක සංඛ්‍යාවක් සම්බන්ධයෙන් වූ පර්යේෂණ කටයුතු සිදු කරනු ලැබ ඇති අතර ඒවා සඳහා තෝරා ගනු ලැබූ මාතෘකාවන් වූයේ වේගවත් ගුරුත්ව පරිශ්‍රවණය සඳහා පුළුස්සන ලද පොල් කටු භාවිතා කිරීම, ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් තුළ එක් රැස් වන ගොහොදු මඩ නැවත භාවිතා කිරීමේ විභව හැකියාව, බෙදා හැරීමේ පද්ධතීන් තුළ යකඩ හා මැංගනීස් තැන්පත් වීම අවම කිරීම, ගෘහස්ත ජල මනු වල කාර්ය සාධන අගය කිරීම හා ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම කෙරෙහි ඒවායේ ඇති බල පෑම, ජල සම්පාදන ව්‍යාපෘතීන් හා සම්බන්ධ කොන්ත්‍රාත්තුමය ආරාවුල් වලට තුඩු දෙනු ලබන හේතූන් හා බල පෑම් සහ ඉදිරියට යා හැකි ආකාරයන් මත අවධානය යොමු කරන ලද අධ්‍යයනයන්, හක්මන ළිං ක්ෂේත්‍රය තුළ ඇති භූගත ජල ප්‍රති ආරෝපණ කලාපයන් හඳුනා ගැනීම පිණිස සමස්ථානිකයන් භාවිතා කිරීමේ ප්‍රයෝජන, භූගත ජලයේ ගුණාත්මය වැඩි දියුණු කිරීම සඳහා භාවිතා කළ හැකි වැසි ජල ප්‍රති ආරෝපණ ශිල්පීය ක්‍රමය, පාරිභෝගික සේවා සම්බන්ධතාවයන් වෙනුවෙන් ස්මාර්ට් ජල මණු හඳුන්වා දීම හා ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙනුවෙන් තොරතුරු අන්තර් ජාලය මත පදනම් වූ ස්මාර්ට් කළමනාකරණ පද්ධතිය ද විය.

මණ්ඩලය විසින් මුහුණ දෙනු ලබන මතු වෙමින් පවත්නා ගැටළු මත පදනම් වූ තවත් පර්යේෂණ මාතෘකාවන් කිහිපයක් ද ලැයිස්තුව හා එකතු කරන ලදි. සුන් බුන් අපද්‍රව්‍ය උපයෝගි කර ගනිමින් නිපදවන ලද පොලි ඇළුමිනියම් ක්ලෝරයිඩ් මාත්‍රා කිරීමේ සුදුසු භාවය පිළිබඳ අධ්‍යයනය කිරීම, දැනුවත් කිරීම මගින් පාදුක්ක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය තුළ පාරිභෝගිකයින් විසින් පානීය ජලය ලෙස නල මාර්ගික ජලය භාවිතා කිරීම නංවා ලීම, භූගත ජලය කෘත්‍රිම ලෙස ප්‍රති ආරෝපණය කිරීම, ශ්‍රී ලංකාවේ වියලි කලාපය තුළ පිහිටි තද පාෂාණ ජලධර පද්ධතීන් තුළ භූගත ජල ප්‍රවාහය නිර්නය කිරීම හා ප්‍රමාණාත්මක හා ගුණාත්මක වෙනස් වීම් තක්සේරු කිරීම : වයඹ පලාතේ වාරියපොල ගැහ හා නොදන්නා හේතූන් නිසා ඇති වන නිධන්ගත වකුගඩු රෝගයට හේතු හා වැලැක්වීම පිලිබඳ සිද්ධි අධ්‍යයනයක් කිරීම.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ අධ්‍යයන සම්මන්ත්‍රණය 2021

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදු කරන ලද ජල හා සනීපාරක්ෂණ පර්යේෂණයන් ඉස්මතු කර දක්වන ලද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2021 වර්ෂයේ පර්යේෂණ සම්මන්ත්‍රණය 300 කට අධික

පිරිසකගේ භෞතික හා තාත්වික ප්‍රාය වේදිකා සහභාගිත්වය සහිතව ඒකාබද්ධ පර්යේෂණ හා නිරූපන මධ්‍යස්ථාන (JRDC) ගොඩනැගිල්ල තුළදී 2021 වර්ෂයේ නොවැම්බර් මස 19 වැනි දින සාර්ථක ලෙස පවත්වන ලදි. එහිදී ''ගෝලීය ජල අභියෝගයන් හා ශ්‍රී ලංකාව ඉදිරියේ ඇති අවස්ථාවන්'' යන මැය යටතේ වූ ප්‍රධාන දේශනය පවත්වන ලද්දේ ආචාර්ය රවී ප්‍රනාන්දු මහතා විසිනි. එකී සම්මන්ත්‍රණ වැඩ සටහන තුළදී පර්යේෂණ පත්‍රිකා 13 ක සංඛ්‍යාවක් ප්‍රසිද්ධ කරන ලද අතර එහිදී අපගේ වෘත්තිකයින් අතර මෙන්ම වෙනත් සමාන්තර ආයතනයන් අතරත් පර්යේෂණ පිළිබඳ උනන්දුව නංවා ලීමේ හැකියාව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත උදා විය. ඊට අමතර වශයෙන් ඊට සමාන්තර ලෙස තාක්ෂණික ප්‍රදර්ශනයක් ද පවත්වන ලද අතර එමගින් ජල හා සනීපාරක්ෂණ ක්ෂේත්‍රය තුළ යොදා ගනු ලබන නවතම තාක්ෂණවේදය අත් විඳීමේ හැකියාව සහභාගි වන්නන් හට ලැබිණි.

පේරාදෙණියේ පිහිටි පර්යේෂණ හා සංවර්ධන අංශය ප්‍රතිස්ථානගත කිරීම. 2021 වර්ෂයේ නොවැම්බර් මස අවසානයේදී පර්යේෂණ හා සංවර්ධන අංශය පේරාදෙණිය, මීවතුර ඊ. ඕ. ඊ. පෙරෙයිරා මාවතෙහි පිහිටි අළුතින් ස්ථාපිත කරනු ලැබ ඇති JRDC ගොඩනැගිල්ල තුළ ප්‍රතිස්ථානගත කරනු ලැබ ඇත. ඉන් පසුව පර්යේෂණ හා සංවර්ධන අංශයේ වැඩ කටයුතු වඩාත් පර්යේෂණ - දිශානතිගතව ඇති කාර්ය පරිසරයක් තුළ අඛන්ඩ ලෙස සිදු කරගෙන යමින් පවතිනු ලබන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් වඩාත් යහපත් ඵලදායී තත්ත්වයක් අපේක්ෂා කළ හැකි වනු ඇත.

භූගෝලීය තොරතුරු පද්ධතිය හා සිතියම්කරණය

2021 වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලීය පරිශ්‍රය, ව්‍යුහයන් ඉදි කරනු ලැබ ඇති ව්‍යුහ ස්ථානයන්, හා ව්‍යාපෘති ප්‍රදේශය තුළ තිබෙන නල මාර්ග ජාල කොටස ද ආවරණය කරමින් මතුගම, අගලවත්ත හා අළුත්ගම ඒකාබද්ධ ව්‍යාපෘති ප්‍රදේශය තුළ භූගෝලීය තොරතුරු පද්ධති සමීක්ෂණ වැඩ කටයුතු සිදු කරන ලදි. මහරගම අපේක්ෂා ආරෝග්‍ය ශාලාවේ සිට ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත වීලනු ලැබ ඇති මළ අපවහන නල මාර්ගයේ භූගෝලීය තොරතුරු පද්ධති ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතු සම්පූර්ණයෙන් නිම කරන ලද අතර අදාල සංඛ්‍යාංක වලට පත් කරන ලද සිතියම් ජල පිළිසැකැසුම් අංශය වෙත භාර දෙන ලදි. ඊට අමතර වශයෙන් පානදුර කලාපීය සිතියම් යාවත්කාලීන කිරීමේ වැඩ කටයුතු ද ක්‍රියාත්මක කරන ලදි.

දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ග්‍රාම නිලධාරී වසම් මට්ටමේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල සම්පාදන ආවරණය, දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්ට අදාල විස්තර, ක්‍රියාත්මක කරනු ලබමින් පවත්නා ව්‍යාපෘති පිළිබඳ විස්තර, යෝජිත ව්‍යාපෘති පිළිබඳ විස්තර, ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් පිළිබඳ විස්තර, ජලය උකහා ගනු ලබන තුළු මුව හා ප්‍රධාන ගංගා ද්‍රෝණි පිළිබඳ විස්තර සමග 2020, 2025, 2030 හා 2050 යන වර්ෂයන්ට අදාල ප්‍රක්ෂේපිත ජන ගහණ ඝණත්වය ආදිය පිළිබඳ විස්තර ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය වෙනුවෙන් පිළියෙල කරනු ලබන විස්තීර්ණ ක්‍රමෝපායික ආයෝජන සැලැසුම (ප්‍රධාන සැලැසුම) සකස් කිරීමේදී ප්‍රයෝජනයට ගැනීම සඳහා පිළියෙල කරන ලදි.

ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 340 ක සංඛ්‍යාව අතුරින් මුළු රටම ආවරණය කරනු ලබන ජල සම්පාදන ජාලය පිළිබඳ තොරතුරු ක්ෂෙත්‍ර කාර්ය මණ්ඩලයට හා ඉහළ කළමනාකරණයට ලබාගත හැකි වන පරිදි සංවර්ධනය කරනු ලබන යෝජිත වෙබ් මත පදනම් වූ ජල වත්කම් කළමනාකරණ ක්‍රමය ගොඩ නැගීමේදී ප්‍රයෝජනයට ගැනීම සඳහා ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 318 ක සංඛ්‍යාවක් සම්බන්ධ භූගෝලීය දත්ත පද්ධතීන් සකස් කරනු ලැබ ඇත.

ජලය සඳහා ඉඩම් ලබා ගැනීම

වර්තමානයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මුහුණ පාමින් සිටිනු ලබන ප්‍රධානතම අභියෝගයක් වන්නේ ශ්‍රී ලංකාවේ ජනතාව වෙත පානීය ජල පහසුකම් සම්පාදනය කර දීම සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පිණිස අවශ්‍ය ඉඩම් අත් පත් කර ගැනීම හා කළමනාකරණය කිරීම වේ.

''2020 - 2025 සැමට ජලය'' වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ඉඩම් අත් පත් කර ගැනීම ප්‍රධාන අභියෝගයක් වේ. අත් පත් කර ගැනීමට අවශ්‍ය ඉඩම් වශයෙන් ඉඩම් 525 ක සංඛ්‍යාවක් හඳුනා ගැනීම අවශ්‍ය වී ඇති අතර 2021 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනය වන විට ඒ අතුරින් ඉඩම් 310 ක සංඛ්‍යාවක් හඳුනා ගැනීමේ වැඩ කටයුතු සිදු කරගෙන යමින් පැවැතිනි. ඉඩම් අත් පත් කර ගැනීමේ ප්‍රගතිය මෙහි පහතින් දැක්වෙන ප්‍රස්තාර සටහන මගින් පෙන්නුම් කර දෙනු ලැබ ඇත.

2020 - 2025 සියලුදෙනා වෙනුවෙන් ජලය වැඩ සටහන සඳහා ඉඩම් අත් පත් කර ගැනීමේ තත්ත්වය.



ඉඩම් උපරිම අන්දමින් ප්‍රයෝජනයට ගැනීම හා ඉඩම් වල ආරක්ෂාව ඇති කිරීමේ අරමුණින් 2021.10.11 වැනි දින ඉඩම් සති වැඩ සටහන දියත් කරන ලදි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය රැඳී සිටින ඉඩම් 2199 ක සංඛ්‍යාවක් හඳුනාගනු ලැබ ඇති අතර වර්තමාන තත්ත්වය දැක්වෙන දත්ත පද්ධතිය පිළියෙල කිරීම සම්පූර්ණයෙන් නිම කරන ලදි.

පාරිභෝගිකයා හා වත්කම් කළමනාකරණය

මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩ සටහනේ කැප වීම

ශ්‍රී ලංකා ජන රජය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සාමූහික ලෙස එක් වී මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩ සටහන නමින් වැඩ සටහනක් ක්‍රියාත්මක කරනු ලබන අතර එහි මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීමේ අධිකාරී බලය පවරනු ලැබ ඇත්තේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත වේ. ඒ සඳහා අරමුදල් සහාය ලබා දෙනු ලබන්නේ ආසියානු සංවර්ධන බැංකුව, ප්‍රංශ සංවර්ධන ඒජන්සිය හා ශ්‍රී ලංකා ජන රජය විසිනි. එකී ව්‍යාපෘතියේ එක් ප්‍රධාන අරමුණක් වන ලද්දේ ජලය බෙදා හැරීමේ පද්ධතිය නංවාලීම හා 2020 වර්ෂය වන විට ආදායම් රහිත ජල පරිමාවේ ප්‍රතිශතය සියයට 18 ක් දක්වා අඩු කිරීම ද විය. 2012 සිට 2021 දක්වා වූ වර්ෂයන් තුළ එම ප්‍රතිශතයේ අඛණ්ඩ අඩු වීමක් සිදු විය. 2012 වර්ෂය තුළදී ආදායම් රහිත ජල පරිමාවේ ප්‍රතිශතය සියයට 49.97 ක් වූ අතර එය ජල පාරිභෝගිකයින් වෙත බෙදා දෙන ලද ජල පරිමාවෙන් ආසන්න වශයෙන් අඩක් පමණ විය. අද දින වන විට එනම් 2021 වර්ෂයේ අවසානයට ආදායම් රහිත ජල පරිමාවේ ප්‍රතිශතය 29.82 ක් විය. ගත වූ වසර 09 තුළදී කොළඹ තුළ ආදායම් රහිත ජලය ජනනය වීමේ ප්‍රතිශතය සියයට 20 ක් දක්වා අවම කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත හැකියාව ලැබිණි. ආදායම් රහිත ජල පරිමාව අවම කිරීම බොහෝ වග කිව යුතු පාර්ශවයන් සම්බන්ධ වී වැඩ කළ යුතු සංකීර්ණ කාර්ය භාරයක් වන අතර ගත වූ වසර 10 ක කාලය මුළුල්ලේ ආදායම් රහිත ජල පරිමාවේ අඩු වීම් දැක්වෙන ප්‍රතිශතයන් විසින් ඒ බව පැහැදිළි ලෙස පෙන්නුම් කරනු ලබයි. ශ්‍රී ලංකා ජන රජය මෙන්ම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ද ගත වූ දශක කිහිපයක කාලය තුළදීට වඩා මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩ සටහන නම් වූ ව්‍යාපෘතිය ඇසුරින් ඉගෙන ගත් පාඩම් පදනම් කර ගනිමින් ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ හා ඒ පිළිබඳ දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහන් මෙහෙයවීම තුළින් වැඩි අවධානයක් යොමු කරමින් කටයුතු කරනු ලබයි.

සමස්ත දීප ව්‍යාප්ත ආදායම් රහිත ජලය පිළිබඳව පසුවිපරම් කිරීම සඳහා සහ කළමනාකරණය කිරීම සඳහා අතිරේක සාමාන්‍යාධිකාරී වරයකුගේ (අතිරේක සාමාන්‍යාධිකාරී - පාරිභෝගික හා වත්කම් කළමනාකරණ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සංවිධානමය ප්‍රතිසංස්කරණ කටයුතු යටතේ විශේෂ ඒකකයක් පිහිටුවනු ලැබ ඇති අතර ගලා යාම් පසු විපරම් කරමින් පාලනය කිරීම සඳහා ද, ජලය කාන්දු වීම් සොයා ගැනීම සඳහා සහ ක්‍රියාත්මක කාන්දු සමීක්ෂණයන් පැවැත්වීම සඳහා ද කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන මට්ටමේ අනු කණ්ඩායම් හඳුනාගනු ලැබ ඇත. දිස්ත්‍රික් මනු කියවීම් ප්‍රදේශයන් ඉම ලකුණු කිරීම සහ දැනට තිබෙන දිස්ත්‍රික් මනු කියවීම් ප්‍රදේශ මායිම් සියුම් සැකැසුම් කිරීම ආදායම් රහිත ජල පරිමා අංශයන් විසින් ඉටු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් විය.

පැහැදිළි ලෙස දක්නට ලැබෙන පාඩු අඩු කර ගැනීමේ කාර්යයේදී තථ්‍ය කාලීන මණු කියවීම් යෙදවුම මගින් දෝෂ සහගත මණු හඳුනාගනු ලබන අතර ඉන් පසු ඒවා පද්ධතියෙන් ජනනය කරනු ලබන වැඩ ඇණවුම් මගින් අදාල කලාපයන්ට අනුයුක්ත තාක්ෂණික කණ්ඩායම් වෙත යොමු කරනු ලැබේ. ඒ අනුව තාක්ෂණික කණ්ඩායම විසින් දෝෂ සහගත මණු වෙනුවට අළුත් මණු වම මස තුළදීම ස්ථාපිත කරනු ලබයි. ශූන්‍ය බිල් හෝ පිළිගත නොහැකි පරිභෝජනයන් වාණිජ මෙහෙයුම් පද්ධතිය මගින් හඳුනාගනු ලබන අතර පණිවුඩය තාක්ෂණික කණ්ඩායම වෙත යොමු කරනු ලබයි. ඉන් පසු තාක්ෂණික කණ්ඩායම විසින් ක්ෂෙත්‍ර අධ්‍යයනයක් සිදු කරනු ලබන අතර එහි ප්‍රතිඵලය මත පදනම් වෙමින් මණුව මාරු කළ යුතුද නැද්ද යන්න ඔවුන් විසින් තීරණය කරනු ලබයි.

හදිසි තත්ත්වයක් මතු වී තිබේ නම් හැර දැනට ජල කණු වලට බල පාන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනු ලබන්නේ නැත. බටහිර කලාපය තුළ දැනට ද ජල කණු කිහිපයක් තිබෙන අතර 2018 වර්ෂයේ අවසානයේදී සියළුම ජල කණු පෞද්ගලික සේවා සම්බන්ධතාවයන් බවට පරිවර්තනය කරන ලදි. කෙසේ නමුත් ජල කණු වෙනුවෙන් අය කර ගත යුතු සැලැකිය යුතු හිඟ මුදල් ප්‍රමාණයක් මේ වන විට ඉතිරි වී තිබේ.

නීති විරෝධී සේවා සම්බන්ධතාවයන් සංඛ්‍යාව අඩු කිරීම සඳහා පරිශ්‍රයන් විසන්ධි කිරීම, වාණිජ මෙහෙයුම් පද්ධතිය මගින් ශූන්‍ය බිල් හෝ පිළිගත නොහැකි පරිභෝජනයන් හඳුනා ගැනීම හා අහඹු ලෙස පරිශ්‍ර පරීක්ෂණයන් සිදු කරන ලදි. ඕනෑම නීති විරෝධී සේවා සම්බන්ධතාවයක් වෙනුවෙන් හා ජල සම්පාදනය හා සනීපාරක්ෂණය සම්බන්ධ ඕනෑම නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් තොරතුරු සැපයීම වෙනුවෙන් පැමිණිළි කිරීම හෝ තොරතුරු සැපැයීම සම්බන්ධයෙන් තීව්‍ර ක්‍රමයක්/ ප්‍රදාන ලබා දීමේ ක්‍රමයක් ස්ථාපිත කරනු ලැබ තිබේ. මෙම කාර්යයන්ට වැඩිමනත් වශයෙන් වාණිජ මෙහෙයුම් පද්ධතිය මගින් හා මණු කියවීම් යෙදවුම මගින් පරිභෝජන රටාවන් අහඹු ලෙස පසුවිපරම් කරනු ලබන අතර එහිදී මතු වනු දක්නට ලැබෙන අක්‍රමවත් තත්ත්වයන් හා සැක කටයුතු ක්‍රියාවන් පරීක්ෂණ සඳහා ඉදිරිපත් කරනු ලැබේ. විශේෂ කණ්ඩායම් පරීක්ෂණයන්ට අමතර ලෙස සිදු වෙමින් පවතින වංචාවන් හඳුනා ගැනීම සඳහා මනු කියවන්නන් පුහුණු කරනු ලැබේ.

ඉදිරි පියවර

ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම සඳහා ගනු ලැබ ඇති පියවර මෙහි පහත දක්වනු ලැබ ඇත.

- ඉතිරි ජල ප්‍රමාණය මැණ බැලීම ක්‍රියාත්මක කිරීම
- තොග මණු සවි කිරීම හා දිස්ත්‍රික් මණු ප්‍රදේශ හෙවත් ජල කලාප ස්ථාපිත කිරීම
- ජල කාන්දු වීම් අළුත්වැඩියා කිරීම සඳහා ප්‍රමිතිගත මෙහෙයුම් කාර්ය පටිපාටීන් ස්ථාපිත කිරීම
- දැනට පවත්නා කලාපයන් වෙනුවෙන් ආදායම් රහිත ජල පරිමා ඉලක්කයන් පිහිටුවා ගැනීම
- මණු කර නොමැති පරිභෝජනය සමාලෝචනය කිරීම හා තක්සේරු කිරීම
- ආදායම් රහිත ජල පරිමා පසුවිපරම් කිරීමේ මාසික රැස්වීම් පැවැත්වීම
- දැනට සවි කරනු ලැබ ඇති තොග මණු නිරන්තරයෙන් පරීක්ෂා කිරීම හා ක්‍රමාංකනය කිරීම
- ජල කාන්දු වීම් අඩු කිරීමට හා ජල කාන්දු පිළිබඳව කඩිනමින් කටයුතු කිරීම සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම
- දුරස්ත පසුවිපරම් පද්ධතිය මගින් (කොළඹ නාගරික සීමාව තුළ) අඛණ්ඩ පරිදි පීඩන වෙනස් වීම් පසුවිපරමට භාජනය කිරීම හා යම් ක්ෂණික හෝ ආදායම් රහිත ජල පරිමාව වැඩි වීමට තුඩු දිය හැකි වෙනස් කම් හඳුනා ගැනීම
- විශේෂිත වශයෙන් කාර්යය පවරනු ලැබ ඇති කණ්ඩායම් ලවා දෛනික මට්ටමින් රාත්‍රී ජල කාන්දු සමීක්ෂණය කිරීම සඳහා සැලැසුම් කරන ලද වැඩ සටහනක් දියත් කිරීම
- ගණුදෙනු කරුවන් වෙතින් හා පොදු ජනතාව වෙතින් තොරතුරු ලබා ගැනීම සඳහා වැඩි දියුණු කළ ඇමතුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම

- හදිසි අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායම සෑම විටම සේවයේ යෙදී සිටින අතර ජල කාන්දු පිළිබඳව වාර්තා වූ සැණින් ඔවුන් විසින් එකී ජල කාන්දු අළුත්වැඩියා කිරීම සඳහා පියවර ගනු ලැබීම
- වෑල්ව පාලනය කිරීම මගින් පද්ධතියේ පීඩනය පාලනය කිරීම හා තුළනය කිරීම හා පීඩනයට ඔරොත්තු දෙන වැල්ව හඳුන්වා දීම
- වේගවත් කරන ලද ආදායම් රහිත ජල පරිමා අඩු කිරීමේ වැඩ සටහන යටතේ ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
- ආසියානු සංවර්ධන බැංකුව සමග ප්‍රමන්ත්‍රණය ආරම්භ කොට ප්‍රතිඵල පදනම් වූ ණය වැඩ සටහන යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා ඉහළ මට්ටමේ ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ යෝජනා ක්‍රමයන් සඳහා ව්‍යාපෘතීන් ආරම්භ කිරීම
- පාඩු කළමනාකරණය කිරීමේ ධනාත්මක ප්‍රවේශයක් වශයෙන් ''ආදායම් - ජල අනුපාතය'' හඳුන්වා දීම

1939 ගණුදෙනු කරුවන් බලා ගැනීමේ ඇමතුම් මධ්‍යස්ථානය

1939 ඇමතුම් මධ්‍යස්ථාන සේවාව විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ එදිනෙදා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ඉතා වැදගත් භූමිකාවක් ඉටු කරනු ලබයි. කොවිඩ් 19 වසංගත තත්ත්වය පැතිරීමත් සමග මුහුණට මුහුණ ප්‍රති ක්‍රියාවන් හා ගණුදෙනු කරුවන් කලාපීය කාර්යාල වෙත සේවා ලබා ගැනීම පිණිස පැමිණීම සැලැකිය යුතු මට්ටමකින් අඩු විය. මෙම කාල සීමාව අතරතුරදී ඇමතුම් මධ්‍යස්ථාන මෙහෙයුම් මගින් ගණුදෙනු කරුවන් හා සම්බන්ධ වීමේදී, ගණුදෙනු කරුවන්ගේ දුක් ගැනවිලි වලට සවන් දීමේදී හා ගණුදෙනු කරුවන් වෙත අඛන්ඩ ලෙස සේවා සැපයීමේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සහාය කණ්ඩායම් වෙත අවශ්‍ය යෙදවුම් සම්පාදනය කර දෙමින් විශාල සහායක් ලබා දෙන ලද්දේය.

වර්තමානයේදී ඇමතුම් මධ්‍යස්ථාන කණ්ඩායම විසින් මාසික පදනමක් මත සාමාන්‍ය වශයෙන් ගත් කල ගණුදෙනු කරුවන්ගේ ඇමැතුම් 60000 ක සංඛ්‍යාවක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන අතර එම සේවාව පිළිබඳව අවශ්‍ය වැඩ කටයුතු සිදු කරනු ලබන්නේ කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලැබූ සේවා සපයන්නා වන සීමා සහිත ශ්‍රී ලංකා ටෙලිකොම් (පෞ) සමාගම විසින් වේ. මෙම මෙහෙයුමේ කැපී පෙනෙන ප්‍රතිඵලය ලෝක වසංගත කාල සීමාව තුළදී ද ලැබුණ අතර ඇමතුම් මධ්‍යස්ථාන නියෝජිතයින් අතුරින් බොහෝ දෙනෙක් සීමිත පහසුකම් යටතේ නිවසේ සිට වැඩ කටයුතු කිරීමට කැමැත්ත පළ කළහ. එයින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සන්නාම ප්‍රතිරූපය මත සිදු විය හැකි අහිතකර බල පෑම සැලැකිල්ලට ගත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කළමනාකරණය විසින් ඇමතුම් මධ්‍යස්ථාන මෙහෙයුම් ප්‍රතිසංස්කරණය කොට මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය සියළුම පහසුකම් වලින් සමන්විත ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයටම අයත් පරිශ්‍රයක් වෙත ඇමතුම් මධ්‍යස්ථාන මෙහෙයුම් ගෙන යාමට තීරණය කරන ලදි. මණ්ඩලයේ අවශ්‍යතාවයන් සඳහන් කරමින් ටෙන්ඩර් කැඳවීමක් සිදු කරන ලද අතර සමීප ලෙස අගැයීමට ලක් කිරීමෙන් අනතුරුව සුදුසු ටෙන්ඩර් කරුවකු තෝරා ගන්නා ලදි.

අළුතින් වැඩි දියුණු කොට නව මුහුණුවරක් දෙනු ලැබ ඇති මෙහෙයුම් වර්ෂ 2022 ජනවාරි 03 වැනි දින කොළඹ 10, මාලිග ාකන්දේ පිහිටි ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පරිශ්‍රය තුළදී ආරම්භ කරනු ලැබීමට නියමිත වේ. මෙම වැඩ පිළිවෙල සම්පූර්ණ වශයෙන්ම නවීකරණය කරනු ලැබ ඇති අතර නවීන තාක්ෂණවේදයෙන් සන්නද්ධ වූ නියෝජිතයින් 20 දෙනෙකු විසින් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන මෙහි ඔවුන්ගේ වැඩ කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පසුපස කාර්යාල මෙහෙයුම මගින් සමීප ලෙස පසුවිපරම් කරනු ලබයි. මීට අමතර වශයෙන් ඉදිරියේදී පැමිණෙන්නා වූ වර්ෂයන් තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අපේක්ෂිත නව සේවා සම්බන්ධතාවයන්ගේ වර්ධනය වීමත් සමග 1939 ඇමතුම් මධ්‍යස්ථාන මෙහෙයුම් කටයුතු මගින් සියළුම කලාපීය ඇමතුම් සම්බන්ධයෙන් කරනු ලබන කටයුතු මධ්‍යගත කිරීම අරමුණු කොට ගත් සැලැසුමක් ද දියත් කරනු ලැබ තිබේ. ඒ අනුව කථා හඬ ඇමතුම් හා වට්ස්ඇප්, වයිබර් හා මෙසෙන්ජර් ආදිය ඇතුළු සමාජ මාධ්‍ය හරහා එක් මසකට ගණුදෙනු කරුවන්ගේ දුක් ගැනවිලි 120000 කට සවන් දීමට හා ඒවා විසඳා දීමට අපේක්ෂා කරනු ලැබේ.

අළුතින් ස්ථාපිත කරන ලද ඇමතුම් මධ්‍යස්ථාන මෙහෙයුම ගණුදෙනු කරුවන්ගේ දුක් ගැනවිලි වෙනුවෙන් ඉක්මනින් විසඳුම් ලබා දීම, ආදායම් රහිත ජලය හේතුකොට ගෙන ඇති වන පාඩු අඩු කිරීම හා අවසන් ගණුදෙනු කරුගේ තෘප්තිය කෙරෙහි බල පෑමක් ඇති කරන අගය එකතු නොකරන ක්‍රියාකාරකම් අවසන් කිරීම ආදී කටයුතු වලදී උපකාරී වනු ඇත. මෙම නව වැඩ පිළිවෙලෙහි අරමුණ වන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සන්නාම ප්‍රතිරූපය නංවා ලීම සඳහා ගණුදෙනු කරුවන් වෙත ලබා දෙනු ලබන සහාය සේවාවන් වෙත ''උත්කෘෂ්ඨ භාවය'' ලබා දීම වන්නේය.

ජල සම්පාදන හා සනීපාරක්ෂණ සේවාවන්ගේ උත්කෘෂ්ඨ භාවය පිළිබඳ මධ්‍යස්ථානය (CEWAS)

දැනුම - පුහුණුව හා මිනිස් බල සංවර්ධනය, නවීකරණ - පර්යේෂණ හා සංවර්ධනය හා ගුණාත්මය - රසායනාගාර සේවාවන් නම් වූ ප්‍රධාන අංශයන් 3 කින් සමන්විත වූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ක්‍රමෝපායික ව්‍යාපාරික ඒකකය වන ජල සම්පාදන හා සනීපාරක්ෂණ සේවාවන්ගෙග් උත්කෘෂ්ඨ භාවය පිළිබඳ මධ්‍යස්ථානය වර්ෂ 2021 ක් වූ නොවැම්බර් මස 19 වැනි දින අඩ වශයෙන් ස්ථාපිත කරන ලදී. පර්යේෂණ හා සංවර්ධන ශාඛාව පේරාදෙනියේ පිහිටි නසෘෂක ගොඩනැගිල්ල තුළ ස්ථාපිත කරන ලද අතර එය සභාපතිවරයාගේ, සාමාන්‍යාධිකාරී වරයාගේ හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ ද සහභාගිත්වයෙන් 19 වැනි දින ආරම්භ කරන ලදී.

මෙම ප්‍රධාන අංශයන් තුන මගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ එදිනෙදා කටයුතු පහසුකරණය කරමින් ක්‍රියාත්මක කරනු ලබන වර්තමාන හා අනාගත වැඩසටහන් වලට අමතර වශයෙන්, මධ්‍යස්ථානය විසින් ක්‍රමෝපායික ව්‍යාපාරික ඒකකයක් වශයෙන් ක්‍රියා කරනු ලැබීම සම්බන්ධයෙන් වූ එහි ස්වාධීන වැඩ සටහන පිළියෙල කිරීම ද සිදු කරනු ලබනවා ඇත. එකී වැඩ සටහන් ජාතික හා ජාත්‍යන්තර සහයෝගි තාවය, මෙහෙයුම් පිරිවැය අඩු කිරීම ඉලක්ක කොට ගත් පර්යේෂණ පැවැත්වීම, සපයනු ලබන සේවාවන්ගේ හා නව තාක්ෂණික ක්‍රම වේදයන්ගේ ගුණාත්මය වැඩි දියුණු කිරීම හා ජල සම්පාදන අංශය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්යයන් වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි ද දිශානති ගත කරනු ලබනවා ඇත.

ජල සම්පාදන හා සනීපාරක්ෂණ සේවාවන්ගෙග් උත්කෘෂ්ඨ භාවය පිළිබඳ මධ්‍යස්ථානය (CEWAS) වෙබ් අඩවිය http://www.cewas.nwsdb.lk/ වේ.

ජල පිළිසැකැසුම් අංශය

සනීපාරක්ෂණ ප්‍රධාන සැලැසුම (2021 - 2030)

සනීපාරක්ෂණ ප්‍රධාන සැලැසුම පිළියෙල කිරීම 2021 වර්ෂය තුළ සිදු වූ එක් ප්‍රධාන සිද්ධියක් විය.

මෙම ක්‍රියාවලියේදී සියළුම සනීපාරක්ෂණ වෘත්තිකයින්, තීරණ ගනු ලබන්නන් හා සංවර්ධන කොටස් කරුවන් රට තුළ සියළු දෙනාම ඇතුලත් වන සනීපාරක්ෂණ තත්ත්වයක් අදියර ආකාරයකින් ඇති කරනු ලැබීමට තුඩු දෙන්නා වූ විසඳුම් හා ක්‍රමෝපායයන් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමග එක් වූහ.

ක්‍රියාත්මක කළ හැකි ප්‍රතිඵලයක් ඇති කර ගැනීමේ පරමාර්ථයෙන් රජයට අනුබද්ධ අදාල සංවිධානයන්, ආංශික කොටස් කරුවන් හා වෙනත් අදාල කොටස්කාර ආයතනයන් සමග සම්බන්ධීකරණයෙන් යුක්තව සනීපාරක්ෂණ වැඩ මුළු හා සනීපාරක්ෂණය පිළිබඳව පරදු ධාරීන් දිශානති ගත කිරීමේ වැඩ සටහන් පවත්වන ලදී.

සනීපාරක්ෂණ ප්‍රධාන සැලැසුම වර්ෂ 2021 නොවැම්බර් මස 17 වැනි දින ගරු අග්‍රාමාත්‍ය වරයාගේ නිල නිවාසය වන අරලිය ගහ මන්දිරයේදී ගරු අග්‍රාමාත්‍ය වරයා වෙත ගෞරවයෙන් පිළිගන්වන ලදී. මහනුවර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය ආරම්භ කිරීම වර්ෂ 2021 නොවැම්බර් මස 17 වැනි දින සිදු කරන ලදී.

ජාතික සනීපාරක්ෂණ ප්‍රතිපත්තිය - 2021

ජාතික සනීපාරක්ෂණ ප්‍රතිපත්ති කෙටුම් පත සම්බන්ධයෙන් වූ ඉදිරි මාර්ග ක්‍රියාකාරකම් පරදු ධාරීන් සමග සාකච්ඡා කරමින් ආරම්භ කරන ලදී.

නගර වෙනුවෙන් වූ සනීපාරක්ෂණ හා ස්වාස්ථ්‍ය විද්‍යාත්මක මූලාරම්භක ක්‍රියාවන් (SHIFT) විසින් අමාත්‍යංශය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමග සාකච්ඡා කරමින් ක්‍රියාත්මක කිරීමට නියමිත මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙල පිළියෙල කිරීමේ මූලාරම්භක පියවර ක්‍රියාත්මක කරන ලදී.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පණත - මළාපවහන අංශය

මළාපවහන ව්‍යාපෘතීන් හා වෙනත් ජල පිළිසැකැසුම් වැඩ කටයුතු ක්‍රියාත්මක කරනු ලැබීමට අවශ්‍ය වන්නා වූ සංශෝධනයන් මණ්ඩල පණත තුළ සිදු කිරීමේ මූලාරම්භක ක්‍රියාවන් සිදු කරන ලදී.

සනීපාරක්ෂණය පිළිබඳ පාසැල් අධ්‍යයන පටිපාටිය සංවර්ධනය කිරීම හා 'යොවුන් පර්යේෂකයා' වැඩ සටහන

2023 වර්ෂයේ සිට පාසැල් විෂය මාලාව තුළට ඇතුලත් කිරීම සඳහා හැකියා සංවර්ධනය කිරීම පිණිස හා පාසැල් පදනම් වූ සනීපාරක්ෂණ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම අරමුණු කොට ගෙන පාසැල් විෂය මාලාව තුළට සනීපාරක්ෂණ පැතිකඩයන් අන්තර්ගත කරමින් යෝජනා කෙටුම් පතක් පිළියෙල කොට ජාතික අධ්‍යාපන ආයතනය සමග සංසරණය කරන ලදී.

අධ්‍යාපන අමාත්‍යංශය සමග සම්බන්ධීකරණයෙන් යුක්තව දීප ව්‍යාප්ත ලෙස පාසැල් තුළ ක්‍රියාත්මක කිරීම අරමුණු කොට ගත් 'යොවුන් පර්යේෂකයා වැඩ සටහන' වෙනුවෙන් යෝජනාවක් කෙටුම්පත් කරන ලදී.

දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතින විදේශීය / දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන්.

ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ජල සම්පාදන ව්‍යාපෘතීන් විසින් ලබා ගෙන ඇති ජයග්‍රහණයන්.

2021 වර්ෂය තුළදී ඉදි කරනු ලබමින් හා වර්ධනය කරනු ලබමින් පැවැති විදේශීය / දේශීය අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරන ලද ජල සම්පාදන ව්‍යාපෘතීන්ගේ පිහිටීම දක්වනු ලබන සිතියම.



විදෙස් අරමුදල් වලින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන්

	ව්‍යාපෘතියේ නම	අරමුදල් සපයන නියෝජිත ආයතනය
1	වීසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය	CACIB – ප්‍රංශය
2	යාපනය - කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂණ	ආසියානු සංවර්ධන බැංකුව
3	දඩදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය	EDFC – ඛොරියාව
4	අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - 1 වැනි අදියර	ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය
5	ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	ICO - ස්පාඤ්ඤය
6	රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය	අපනයන ආනයන බැංකුව ඛොරියාව
7	මහනුවර උතුර පාත දුම්බර ජල සම්පාදන ව්‍යාපෘතිය	අපනයන ආනයන බැංකුව චීනය
8	අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - 11 වැනි අදියර	ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය
9	කළු ගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය	ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය
10	කිරම කවුචන ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	යුනිඇෆ්‍රැඩ්ව් බැංකුව, ඔස්ට්‍රියාව
11	ගම්පහ, අත්තනගල්ල හා මීතුවන්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය	CDBC - චීනය
12	හෙම්මාතගම ජල සම්පාදන ව්‍යාපෘතිය	ING බැංකුව, නෙදර්ලන්තය
13	තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය	චීන සංවර්ධන බැංකුව
14	පොල්ගහවෙල, පොතුහැර හා අලවිව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	ඉන්දියාවේ අපනයන ආනයන බැංකුව
15	අළුත්ගම, මතුගම හා අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	ඉන්දියාවේ අපනයන ආනයන බැංකුව හා ලංකා බැංකුව
16	කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය	EDFC ඛොරියාව
17	මිරුගොඩවත්තේ සිට කඩුවෙල දක්වා සම්ප්‍රේෂණ හා ජලය බෙදා හැරීමේ ප්‍රධාන නල මාර්ග ප්‍රති ස්ථාපනය කිරීම	යුනිඇෆ්‍රැඩ්ව් බැංකුව, ඔස්ට්‍රියාව හා මහජන බැංකුව
18	මාතර 4 වැනි පියවර	ජාතික සංවර්ධන බැංකුව, ශ්‍රී ලංකාව

දේශීය බැංකු අරමුදල් වලින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන්

A	ඇටම්පිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය	මහජන බැංකුව
B	ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය	හැටන් නැෂනල් බැංකුව
C	ගලගෙදර / මාවතගම ජල සම්පාදන ව්‍යාපෘතිය	DFCC බැංකුව
D	ගාල්ල පොකුරු ජල සම්පාදන ව්‍යාපෘතිය	මහජන බැංකුව හා ලංකා බැංකුව
E	හිරිදර ජල සම්පාදන ව්‍යාපෘතිය	මහජන බැංකුව
F	වීසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතිය	ලංකා බැංකුව
G	විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය	ජාතික සංවර්ධන බැංකුව
H	මැදිරිගිරිය ජලය බෙදා හැරීම 11 වැනි අදියර	ලංකා බැංකුව
I	කොළඹ නගරයෙන් නැගෙනහිර නගර ජල සම්පාදන ව්‍යාපෘතිය	ලංකා බැංකුව
J	බිලියන 3.5 ව්‍යාපෘතිය (ව්‍යාපෘති 22 ක සංඛ්‍යාවක්)	ලංකා බැංකුව

මහා භාණ්ඩාගාරය විසින් ලබා ගත් ණය මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්.

1. විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය

විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය සාර්ථක ලෙස සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. එය ඉලක්ක කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් වන මාතලේ දිස්ත්‍රික්කය තුළ පිහිටි මාතලේ, උකුවෙල, රත්තොට, නාඋල, අඹන්ගඟ කෝරලය, යටවත්ත හා පල්ලෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් වෙත ජලය නිකුත් කිරීම ආරම්භ කරනු ලැබ ඇත. එය සතුව 96000 ක සේවා සම්බන්ධතා ධාරිතාවයක් තිබේ.

විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් 5 ක සංඛ්‍යාවක් ඉදි කිරීම (සමස්ත ධාරිතාව දිනකට ඝණ මීටර 75000), තුළු මුව 5 ක සංඛ්‍යාවක් ඉදි කිරීම, සේවා ජලාශයන් 10 ක සංඛ්‍යාවක් ඉදි කිරීම හා කිලෝ මීටර 433 ක් දිගින් යුත් නල මාර්ග එලීම යන අංගයන්ගෙන් සමන්විත විය. අදාල කොන්ත්‍රාත්තුව සැලැසුම් කොට ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුවක් වූ අතර යුරෝ 105,645,791 + ලංකා රුපියල් 8,210,959 ක කොන්ත්‍රාත් මුදලකට එය ප්‍රදානය කරන ලද්දේ ප්‍රංශයේ ඕටීවී වියෝලා ආයතනය වෙතය. අදාල ඉදි කිරීම් කටයුතු 2017 අප්‍රේල් මාසයේ ආරම්භ කරන ලද අතර කොවිඩ් 19 වසංගත තත්ත්වය හා වෙනත් නොයෙක් අහියෝග මධ්‍යයේ එහි වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් ඉදි කිරීම සියයට 100 ක් ද, ජලාශ ඉදි කිරීම් සියයට 100 ක් හා නල එලීමේ වැඩ කටයුතු සියයට 87 ක් ද සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ගොඩනැගිලි හා නිල නිවාස ඉදි කිරීම් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ තිබේ. සමස්ත මූල්‍ය ප්‍රගතිය සියයට 99 ක් වේ.



උකුවෙල පිහිටි ඝණ මීටර 9000 ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

ව්‍යාපෘතියට අයත් මාතලේ, උකුවෙල, උඩතැන්න හා අඹන්ගඟ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර හතරේ වැඩ කටයුතු නිම කොට ඇති අතර ඇතැම් ඉතිරි නල එලීමේ වැඩ කටයුතු පවරනු ලැබ භාර දී ඇත. රත්තොට ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පවරනු ලැබ ඇති අතර එය මාස තුනක මෙහෙයුම් කාලයක් යටතේ ඇත.

2. යාපනය - කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය (ආසියානු සංවර්ධන බැංකුව 6 වැනි)

මෙම ව්‍යාපෘතිය දියත් කරනු ලැබ ඇත්තේ 2005 / 2006 වර්ෂයන් තුළදී හඳුනා ගන්නා ලද පානීය ජල හා සනීපාරක්ෂණ අවශ්‍යතාවයන් වැඩි දියුණු කිරීම පිණිස වන අතර රජය විසින් මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 164.04 ක් සඳහා 2011 වර්ෂයේදී ණය ගිවිසුමක් අත්සන් කරන ලදි. ඉන් අදහස් කරන ලද්දේ යාපනය අර්ධ ද්වීපයේ හා කිලිනොච්චියේ යාපනය නගරය තුළ, උප නගර තුළ, හා විවිධ කුඩා නගර තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 185 ක් තුළ ජීවත් වන 300000 ක ජන සංඛ්‍යාවක් වෙත ජලය සම්පාදනය කර දීම සඳහා වේ. මූලික වශයෙන් ජල ප්‍රභවය හඳුනා ගන්නා ලද්දේ වර්ධනය කළ ඉරනමඩු වැව වන අතර ඊට පසු තිරුවලාරු ඔසෝවී වාරි මාර්ගය වැඩි දියුණු කරන ලදි. ගොවී ජනතාව විසින් මුහුණ පානු ලබන දුෂ්කරතාවයන් සැලැකිල්ලට ගනිමින් තලෙයිඅඩ්ඩි පිහිටි මුහුදු ජල විලෝම ආශ්‍රැති කර දියෙන් ලුණු රසය ඉවත් කිරීමේ (Sea Water Reverse Osmosis Desalination) යන්ත්‍රාගාරයෙන් දිනකට ජලය ඝණ මීටර 24000 ක් නිෂ්පාදනය කොට එය ජල ප්‍රභවය වශයෙන් භාවිතා කිරීම සඳහා ව්‍යාපෘතිය ප්‍රති ව්‍යුහගත කරන ලද අතර ඒ අනුව ව්‍යාපෘති පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 266 ක් ලෙස සංශෝධනය කරන ලදි. මෙම අවස්ථාවේදී පවත්නා රජය විසින් අතිගරු ජනාධිපති තුමන්ගේ "සෞභාග්‍යයේ දැක්ම" යටතේ වූ "සියළුම දෙනා වෙනුවෙන් ජලය ලබා දීම" වෙනුවෙන් ඉහළ ප්‍රමුඛත්වය ලබා දී මුහුදු ජල විලෝම ආශ්‍රැති කර දියෙන් ලුණු රසය ඉවත් කිරීමේ (Sea Water Reverse Osmosis Desalination) කොන්ත්‍රාත්තුව 2021 වර්ෂය තුළදී ප්‍රදානය කරන ලදි.

ඔසොව් ජල කුළුණු 15 ක සංඛ්‍යාවක වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරන ලද අතර ඉතිරි ජල කුළුණු 05 ක සංඛ්‍යාවේ වැඩ කටයුතු නිම කරනු ලබමින් පවතින අවස්ථාවේ පවතී. කිලෝ මීටර 186 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රතිකාරිත ජලය සම්ප්‍රේෂණය කිරීමේ ප්‍රධාන නල මාර්ගය එලීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර කිලෝ මීටර් 9 ක දිගින් යුත් නල මාර්ගය එලීමේ කටයුතු මුහුදු ජල විලෝම ආශ්‍රැති කර දියෙන් ලුණු රසය ඉවත් කිරීමේ කොන්ත්‍රාත්තුව යටතේ නිම කරනු ලබනවා ඇත. මීට අමතර ලෙස කිලෝ මීටර 415 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ නල ජාලය එලීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. පූනකරි ජල සම්පාදන යෝජනා ක්‍රමය ඉදි කරන ලද අතර කිලිනොච්චි කුළුණෙන් (පවත්නා කිලිනොච්චි ජල සම්පාදන යෝජනා ක්‍රමයෙන්) ගුරුක්ව ප්‍රවාහය මඟින් ජලය සපයනු ලබන එය යාපනයේ මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දෙන ලදි. ඒ අනුව නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 261 ක සංඛ්‍යාවක් ලබා දෙන ලද අතර ඒ හරහා 1000 ක පොදු ජන සංඛ්‍යාවක් මෙම යෝජනා ක්‍රමයෙන් ප්‍රතිලාභ ලබති. වේලනෙයි හා මන්ඩාතිවු ජල කුළුණු ද ක්‍රියාත්මක වන භූගත ජල ප්‍රභවයන්ගෙන් ජලය ලබා ගනිමින් ජලය සම්පාදනය කර දීම සඳහා මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දෙන ලදි. උතුරු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර සහිතව දීර්ඝ කාලීන ජල ප්‍රභවය මත කරගෙන යනු ලබන සාධ්‍යතා අධ්‍යයනය අතර මුහුදු ජල විලෝම ආශ්‍රැති කර දියෙන් ලුණු රසය ඉවත් කිරීමේ (Sea Water Reverse Osmosis Desalination) කොන්ත්‍රාත්තුව වෙනුවෙන් සූර්ය බල ශක්තිය ලබා ගැනීමේ වැඩ කටයුතු ආසියානු සංවර්ධන බැංකුව විසින් පත් කරනු ලැබ ඇති උපදේශක වරයකු සමඟ යාපනය - කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය හා අනුයුක්ත ඡඑක්ෂඹ විසින් කරගෙන යනු ලබයි. මුහුදු ජල විලෝම ආශ්‍රැති කර දියෙන් ලුණු රසය ඉවත් කිරීමේ (Sea Water Reverse Osmosis Desalination) කොන්ත්‍රාත්තුවට අදාල සැලැසුම් කටයුතු නිම කිරීමේ අවස්ථාවේ පවත්නා අතර JC DN හා දූපත් අතර ජලය බෙදා හැරීමේ නල මාර්ග එලීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවතී. පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හා අවශ්‍ය ද්‍රව්‍ය වල හිඟය නිසා වැඩ කටයුතු ප්‍රමාද වෙයි.

2021 වර්ෂයේ අවසානයට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 60.55 ක් හා සියයට 44.04 ක් විය. වර්ෂ 2023 දෙසැම්බර් මාසය වන විට ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.



තලෙයිඅඩ්ඩි මුහුදු ජල විලෝම ආශ්‍රැති කර දියෙන් ලුණු රසය ඉවත් කිරීමේ යන්ත්‍රාගාරය වෙනුවෙන් ආරම්භක උත්සවයක් පවත්වන ලදි.

3. දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය

දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2016 වර්ෂයේ දෙසැම්බර් මස 22 වැනි දින ආරම්භ කරන ලද අතර දීර්ඝ කිරීම් කිහිපයක් දීමෙන් අනතුරුව වර්ෂ 2021 පෙබරවාරි මස 28 වැනි දින සාර්ථක ලෙස සම්පූර්ණයෙන් නිම කරන ලදි. ව්‍යාපෘතිය ඝණ මීටර 34500 ක ධාරිතාවයකින් යුත් තුළු මුවක් හා පොම්පාගාරයක් ඉදි කිරීම ද, කිලෝ මීටර 3.3 ක දිග ප්‍රමාණයකින් හා මිලි මීටර 500 ක විෂ්කම්භයකින් යුත් අමු ජලය පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය වැලීම ද, දිනකට ඝණ මීටර 15000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම ද, පිරිසිදු ජලය සම්ප්‍රේෂණය කිරීමේ නල මාර්ග වැලීම ද, මහව (ඝණ මීටර 1000), නාගොල්ලාගම (ඝණ මීටර 750) හා පොල්පිතිගම (ඝණ මීටර 1500) යන ඔසොව් කුළුණු 03 ක සංඛ්‍යාව ඉදි කිරීම ද, කිලෝ මීටර 266 ක දිග ප්‍රමාණයකින් යුත් බෙදා හැරීමේ පද්ධතිය ඉදි කිරීම ද, පොල්පිතිගම ස්ථාන භාර නිලධාරී කාර්යාලය හා නිල නිවාසය හා ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පරිශ්‍රය තුළ නිල නිවාස දෙකක් හා වෙනත් මෙහෙයුම් ගොඩනැගිලි ඉදි කිරීම ද යන අංගයන්ගෙන් සමන්විත විය. 2021 වර්ෂයේ අවසානයට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 100 ක් හා මූල්‍ය ප්‍රගතිය සියයට 95 ක් ද විය. ව්‍යාපෘතිය මගින් ඉලක්ක කරනු ලැබ ඇත්තේ මහව හා පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 112 ක සංඛ්‍යාවක් තුළ ජීවත් වන ආසන්න වශයෙන් පවුල් 25000 ක් වෙත සුරක්ෂිත පානීය ජලය ලබා දීම කෙරෙහි වේ. එම නිසා ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කිරීම හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගයේ බල පෑමට බඳුන් වී ඇති මහ ජනතාව වෙත ඉහළ ප්‍රතිලාභ ලබා දෙනු ඇත.

ව්‍යාපෘතිය සේවයේ යෙදවීමෙන් පසුව 2021 වර්ෂයේ අවසානය වන විට මහව හා පොල්පිතිගම ප්‍රදේශ වන ජනතාව වෙත නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 5000 ක් ලබා දෙන ලදි. ජල ප්‍රභවය (දැදුරු ඔය ජලාශය) තුළ සෘතුමය වශයෙන් ඇති වන මහා පරිමාණ අල්ගේ බෝ වීමට ප්‍රතිකාර කිරීමට හැකි වන පරිදි ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වැඩි දියුණු කිරීම සඳහා සහ පවත්නා ව්‍යාපෘතියේ වෙනසක් වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා බෙදා හැරීමේ පද්ධතියේ හිඩැස් පිරවීම පිණිස කිලෝ මීටර 260 ක දිග ප්‍රමාණයකින් යුත් නල මාර්ග වැලීම සඳහා කොරියාවේ අපනයන ආනයන බැංකුව විසින් අතිරේක ණය පහසුකමක් අනුමත කරනු ලැබ ඇත.

4. අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය (1 වැනි පියවර)

ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ (ජපන් යෙන් මිලියන 5,166) හා ශ්‍රී ලංකා ජන රජයේ (ලංකා රුපියල් මිලියන 2,789) අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ 1 වැනි පියවරෙහි වැඩ කටයුතු ආරම්භ කරන ලද්දේ වර්ෂ 2013 ජූලි මාසයේදී වන අතර ව්‍යාපෘතියේ මුළු පිරිවැය ලංකා රුපයල් මිලියන 11,515 ක් වේ.

මෙම ව්‍යාපෘතිය විසින් අරමුණු කරනු ලැබ ඇත්තේ 2034 වර්ෂය වන විට අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි මැදවච්චිය හා රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ ජීවත් වන 115600 ක් වන ජන ගහණයක් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම වේ.

මෙම ව්‍යාපෘතිය සමන්විත වන අංගයන් වන්නේ දිනකට ජලය ඝණ මීටර 39600 ක ධාරිතාවයකින් යුත් තුළු මුව, දිනකට ජලය ඝණ මීටර 9900 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, ඔසොව් ජල කුළුණු 4 ක සංඛ්‍යාවක් හා මුළු ධාරිතාවය ජලය ඝණ මීටර 7000 ක් වූ බිම් දෙණ 3 ක සංඛ්‍යාවක්, කිලෝ මීටර 89 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ග, කිලෝ මීටර 520 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ පද්ධතියක් හා මෙහෙයුම් ගොඩනැගිලි (ස්ථාන භාර නිලධාරී කාර්යාල, බලා ගන්නන්ගේ නිල නිවාස, ප්‍රාදේශීය ඉංජිනේරු නිල නිවාසය ආදී) ඉදි කිරීම ද වන්නේය.

ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 95.9 ක් හා සියයට 78.8 ක් විය.



මහකනදරාව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ තුළු මුව

5. විසල් කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩ සටහන (GCWWMIIP)

විසල් කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩ සටහන ව්‍යාපෘතිය මගින් ප්‍රධාන වශයෙන්ම ආවරණය කරනු ලබන්නේ කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය වන අතර ප්‍රදේශය තුළ මෙහෙයුම් කටයුතු හා නඩත්තු කටයුතු පහසුවෙන් කිරීමට හැකි වන පරිදි එම ප්‍රදේශය දිස්ත්‍රික් මණු ප්‍රදේශයන් 78 ක් වශයෙන් බෙදනු ලැබ ඇත. ව්‍යාපෘතියෙන් අපේක්ෂා කරනු ලබන ප්‍රධාන සම්පාදනයන් වන්නේ කිලෝ මීටර 795 ක දිග ප්‍රමාණයකින් යුත් (මුල් විෂය පථය කිලෝ මීටර 600 ක් විය) නල මාර්ගය ප්‍රති ස්ථාපනය කිරීම, කොළඹ මහ නගර මායිම දිගේ පද්ධති යෙදවුම් දහ හතක සංඛ්‍යාවක් ස්ථාපිත කිරීම, ජල මණු ප්‍රති ස්ථාන ගත කිරීම හා දෝෂ සහිත ජල මණු වෙනුවට අළුත් මණු යෙදීම, භූගෝලීය තොරතුරු පද්ධති ජාලය ක්‍රමාංකනය කිරීම හා යාවත් කාලීන කිරීම හා ගොඩනැගිලි ඉදි කිරීම වන්නේය.

ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ (1) කොළඹ නගරය තුළ සම්පාදනය කළ හැකි ජල පරිමාව වැඩි කිරීම හා කාර්යක්ෂමතාවය වැඩි කිරීම (2) බෙදා හැරීමේ පද්ධතිය නංවා ලීම හා 2022 වර්ෂය වන විට ආදායම් රහිත ජල පරිමාව සියයට 49 සිට සියයට 18 ක ප්‍රතිශතයට වඩා අඩු කිරීම (3) ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම සඳහා දීර්ඝ කාලීන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම හා (4) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ආයතනික, මෙහෙයුම් කිරීමේ හා ව්‍යාපෘති කළමනාකරණ ධාරිතාව නංවා ලීම ද වන්නේය. වර්ෂ 2013 දී ආසියානු සංවර්ධන බැංකුව සමග 01 වැනි ව්‍යාපෘතිය වෙනුවෙන් වූ ණය ගිවිසුම අත්සන් කිරීමත් සමග ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි. සියළුම ප්‍රති සම්පාදන පැකේජ සැලැසුම් හා සූදානම් කිරීම් කරන ලද්දේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත බඳවා ගන්නා ලද කාර්ය මණ්ඩල සාමාජිකයින් විසිනි. ව්‍යාපෘති අංක 01 හා ව්‍යාපෘති අංක 02 විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇත භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 98.8 ක් හා සියයට 86.5 ක් වූ අතර තවද 01 වැනි ණය කොටස වර්ෂ 2021 ජූනි 30 වැනි දින පියවන ලදි.

දිස්ත්‍රික් මණු ප්‍රදේශයන් 40 ක සංඛ්‍යාවක දිස්ත්‍රික් මණු ප්‍රදේශ ඉදි කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ඒ සමග දිස්ත්‍රික් මණු ප්‍රදේශයන් 29 ක් තුළ ආදායම් රහිත ජල පරිමා කළමනාකරණය කිරීමේ වැඩ කටයුතු සිදු කර ගෙන යනු ලබයි (රූපය 01). මෙයින් අදහස් කරනු ලබන්නේ අද දිනය වන විට කිලෝ මීටර් 795 දිග ප්‍රමාණයකින් යුත් (මුල් විෂය පථය කිලෝ මීටර 600 යි) නල මාර්ග අතුරින් කිලෝ මීටර 725 ක දිග ප්‍රමාණයකින් යුත් නල මාර්ග වැලීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති බවයි. තවද සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති දිස්ත්‍රික් මණු ප්‍රදේශයන් තුළ සිදු කරන ලද ආදායම් රහිත ජල කළමනාකරණය පිළිබඳ අධ්‍යයනයන්ගෙන් පෙනී යන්නේ ඒවා තුළ ආදායම් රහිත ජල පරිමාවන් සියයට 18 කට වඩා අඩු වී ඇති බවයි. ඊට අමතර වශයෙන් කොළඹ නගරය

කරා ඇතුළු වන යෙදවුම් ලක්ෂ්‍යයන් තුළ පද්ධති යෙදවුම් මණු ස්ථාපිත කිරීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ඉහතින් සඳහන් කොට ඇති ව්‍යාපෘතිය හා ක්‍රමවත් මෙහෙයුම් හා කළමනාකරණ ක්‍රියාකාරකම් හේතු කොට ගෙන කොළඹ නගරය තුළ ආදායම් රහිත ජල පරිමාව සියයට 30 ක් දක්වා අඩු වී තිබේ.

ඊට අමතර වශයෙන් ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස වූ සහාය ක්‍රියාකාරකමක් වශයෙන් ව්‍යාපෘතිය තුළට ගොඩනැගිලි පැකේජ ඇතුළු කරනු ලැබ තිබේ. එකී සහාය ක්‍රියාකාරකම් යටතේ වීලී හවුස් හි පොම්පාගාර හා වීලී හවුස් ප්‍රාදේශීය ඉංජිනේරු වරයාගේ කාර්යාලය ඉදි කිරීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරන ලදුව මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දෙනු ලැබ ඇත. මීට අමතර ලෙස මාලිගාකන්දේ නව ගොඩනැගිල්ල ඉදි කිරීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර එය මෙතෙක් මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දෙනු ලැබ නැත. තෙලවල පුහුණු කිරීම් මධ්‍යස්ථානය හා නවාතැන් පහසු කම් ඉදි කිරීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට ආසන්න තත්ත්වයක ඇති අතර එහි ව්‍යුහාත්මක ඉදි කිරීම් වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර එහි අවසන් වැඩ කටයුතු දැනට සිදු කරගෙන යනු ලබමින් පවතී.

කරුණු එසේ වුව ද පෙර නොවූ විරූ වසංගත තත්ත්වයක් හදිසියේම වේගයෙන් පැතිරී යාම හේතුකොට ගෙන කොන්ත්‍රාත්තු පැකේජයන් වෙනුවෙන් සැලැසුම් කරන ලද ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීමට ව්‍යාපෘතියට හැකියාවක් ලැබුනේ නැත. ව්‍යාපෘති ප්‍රදේශයන් අතුරින් ඉතා වැඩි සංඛ්‍යාවක් වයිරසයේ පැතිරී යාම පාලනය කිරීම සඳහා රජය විසින් වසා දමනු ලැබ තිබිණි. සැලැකිල්ලට ගත යුතු කරුණක් වශයෙන් කොළඹ නගරයේ උතුරු, නැගෙනහිර, බටහිර හා දකුණු කොටස් තුළ ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම සඳහා වූ පද්ධති පුනරුත්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව සම්පූර්ණයෙන් නිම කළ නොහැකි වූ අතර 2021 වර්ෂය තුළදී එම කොන්ත්‍රාත්තුවෙන් අපේක්ෂා කළ දේ සාක්ෂාත් කර ගත නොහැකි විය.

6. අඹතලේ ජල සම්පාදන පද්ධතීන් වැඩි දියුණු කිරීමේ හා බල ශක්ති ඉතිරි කිරීමේ ව්‍යාපෘතිය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අඹතලේ ජල සම්පාදන පද්ධතීන් වැඩි දියුණු කිරීමේ හා බල ශක්ති ඉතිරි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ (2012 / 2013) කොළඹ ප්‍රධාන සැලැසුමේ නිර්දේශයන් මත වේ. මෙම ව්‍යාපෘතිය මගින් අදහස් කරනු ලබන්නේ නිෂ්පාදනයේ විශ්වසනීයත්වය නංවා ලීම, බල ශක්තිය ඉතිරි කිරීමේ පියවර හඳුන්වා දීම හා අඹතලේ ජල සම්පාදන පද්ධතියේ ජල සම්ප්‍රේෂණ පහසුකම් වල කාර්යක්ෂමතාවය නංවා ලීම ද වන්නේය. ශ්‍රී ලංකා ජන රජය විසින් ආසියානු සංවර්ධන බැංකුවේ සහ ව්‍යාපෘතියේ සහභාග මූල්‍ය සම්පාදකයා වන ප්‍රංශ සංවර්ධන ඒජන්සියේ (AFD) සහාය සහිතව අඹතලේ ජල සම්පාදන පද්ධතීන් වැඩි දියුණු කිරීමේ හා බල ශක්ති ඉතිරි කිරීමේ ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි. ව්‍යාපෘතිය වෙනුවෙන් ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය අමෙරිකානු ඩොලර් මිලියන 100 ක් වේ.

විශේෂයෙන්ම කොවිඩ් 19 ලෝක වසංගත තත්ත්වය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පාලනයෙන් පිටස්තරව පවත්නා වෙනත් බොහෝ හේතු සංඛ්‍යාවක් හේතුකොට ගෙන ඉදි කිරීම් කොන්ත්‍රාත්තු හා උපදෙස් කොන්ත්‍රාත්තු හා සම්බන්ධ වැඩ කටයුතු ප්‍රමාද වූ බව කිව යුතු වේ. මේ හේතුව නිසා කොන්ත්‍රාත් කරුවන් හා උපදේශක විසින් කාලය දීර්ඝ කිරීම් ඉල්ලා සිටිනු ලැබ ඇති අතර නිවැරදි සමාලෝචනයකින් හා ඉංජිනේරු වරයාගේ අනුමැතිය සමග එම කාලය දීර්ඝ කිරීම් දෙනු ලබනවා ඇත.

එසේම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කොට භාර දීම සඳහා ව්‍යාපෘති පසු විපරම් කිරීමේ ඒකකය විසින් ඉදි කිරීම් කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය සමීප ලෙස පසු විපරම් කරගෙන යනු ලැබේ.

ව්‍යාපෘතිය විසින් භෞතික ප්‍රගතිය සියයට 91.5 ක් අතුරින් සියයට 57.8 ක් හා මූල්‍ය ප්‍රගතිය සියයට 91.0 ක් අතුරින් සියයට 43.9 ක් ද වශයෙන් සාක්ෂාත් කරගනු ලැබ ඇත.

7. ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් අරමුදල් සපයනු ලබන්නේ ස්පාඤ්ඤ රජය හා ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව විසින් වේ. ආනමඩුව, කොටවෙහෙර, නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ හා පුත්තලම, ගල්ගමුව, මුන්දලම හා මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි කොටසක් තුළ බල පවත්වන්නා වූ පානීය ජලය පිළිබඳ ගැටළුවට මෙම ව්‍යාපෘතිය විසින් ස්ථිර විසඳුමක් ලබා දෙනු ලබනවා ඇත. මෙම ව්‍යාපෘතිය විසින් දිනකට ජලය ඝණ මීටර 12500 ක ධාරිතාවයකින් යුත් නව තුළු මුවක් ඉඟිනිමිටිය ජලාශයේ ද, දිනකට ජලය ඝණ මීටර 11000 ක ධාරිතාවයකින් යුත් පූර්ණ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් හා කිලෝ මීටර 1 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ අමු ජල ප්‍රධාන නල මාර්ගයක් ද ඉදි කරනු ලබනවා ඇත. කිලෝ මීටර 61 ක දිග ප්‍රමාණයකින් යුත් පිරිසිදු ජලය සම්ප්‍රේෂණය කිරීමේ ප්‍රධාන නල මාර්ගය ජලය ඝණ මීටර 1500 ක, ජලය ඝණ මීටර 1000 ක හා ජලය ඝණ මීටර 300 ක 'ධාරිතාවයන්ගෙන් යුත් ජල කුළුණු 4 ක් වෙත ජලය සපයනු ලබන අතර සියළුම විද්‍යුත් යාන්ත්‍රික උපකරණයන්ගෙන් සමන්විත කිලෝ මීටර 328 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ පද්ධතියකින් හා ආයතන සංවර්ධනයෙන් ද ව්‍යාපෘතිය යුක්ත වේ. මෙම යෝජිත ව්‍යාපෘතියේ ඵකම අපේක්ෂාව වන්නේ සියළුම අභියෝගයන් මැඩ පවත්වමින් පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි වාසය කරනු ලබන ජනතාව වෙත සුරක්ෂිත නල මාර්ගික ජල පහසුකම් සම්පාදනය කර දීම වන අතර ඒ මගින් එම සේවාවන් ලබන ප්‍රදේශයන් තුළ වාසය කරන ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවෙනු ඇත.



ඡායා රූපය : නල එලීම

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුකොට ගෙන ඇති වූ විවිධ දුෂ්කරතාවයන් හා බාධාවන් මධ්‍යයේ වුව ද නල වීලීමේ වැඩ කටයුතු හා කුළුණු ඉදි කිරීමේ වැඩ කටයුතු සැලැකිය යුතු මට්ටමකට අඛණ්ඩ ලෙස කරගෙන යාමට ව්‍යාපෘතිය වෙත හැකියාව ලැබුණ අතර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීමේ වැඩ කටයුතු 2021 වර්ෂයේ ජනවාරි මස මැදදී ආරම්භ කරනු ලැබීමට අපේක්ෂා කරනු ලැබේ. තවද ව්‍යාපෘතිය විසින් 2021 දෙසැම්බර් මාසයේ අවසානය වන විට සියයට 70 ක භෞතික ප්‍රගතියක් හා සියයට 65 ක මූල්‍ය ප්‍රගතියක් සාක්ෂාත් කර ගනු ලැබ තිබේ.

8. රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය දිනකට ජලය ඝණ මීටර 4400 ක ධාරිතාවයකින් යුත් තුළු මුවක් හා අමු ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගයක් ඉදි කිරීම, දිනකට ජලය ඝණ මීටර 4000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම හා ගබඩාකරණ ජලාශයන් පහක සංඛ්‍යාවක් හා භුවන පොම්ප කිරීමේ ස්ථානයන් දෙකක

සංඛ්‍යාවක් ඉදි කිරීම යන අංගයන්ගෙන් සමන්විත වේ. සම්ප්‍රේෂණ හා ජලය බෙදා හැරීමේ නල මාර්ගයන් පිළිවෙලින් කිලෝ මීටර 20 ක දිග ප්‍රමාණයකින් හා කිලෝ මීටර 95 ක දිග ප්‍රමාණයකින් යුක්ත වේ. විෂය පථය තුළ සිදු කරන ලද වෙනස් කමක් හා කොවිඩ් 19 ලෝක වසංගත තත්ත්වය හේතුකොට ගෙන දින 250 ක කාලය දීර්ඝ කිරීමක් ලබා දෙන ලදි.



ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා තුළු මුව

2021 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබූ භෞතික ප්‍රගතිය සියයට 27.5 ක් හා මූල්‍ය ප්‍රගතිය සියයට 27.5 ක් විය. 2021 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සැලැසුම් කටයුතු සියයට 99 ක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ තිබිණි. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පරිශ්‍රය තුළ ව්‍යුහයන් ඉදි කිරීමේ වැඩ කටයුතු ආරම්භ කරනු ලැබ ඇත. කිලෝ මීටර 2.6 ක දිග ප්‍රමාණයකින් යුත් සම්ප්‍රේෂණ නල මාර්ග හා කිලෝ මීටර 11.2 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ නල මාර්ග ද වීලනු ලැබ ඇත. සේවා ජලාශයන් තුනක සංඛ්‍යාවක හා වීක් හුවන පොම්ප කිරීමේ ස්ථානයක ඉදි කිරීම් කටයුතු ආරම්භ කරනු ලැබ ඇත.

9. මහනුවර උතුර - පාත දුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

මහනුවර උතුර - පාත දුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය විසින් මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටි පාතදුම්බර, අකුරන, හාරිස්පත්තුව, පූජාපිටිය, මහනුවර කඩවත් සතර හා තුම්පනේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක සංඛ්‍යාව ආවරණය කරනු ලබයි. ඒ අතර දැනට ක්‍රියාත්මක කරනු ලබන දිනකට ජලය ඝණ මීටර 50000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ වීම ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 100000 ක් දක්වා වැඩි කිරීමෙන් පසුව ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබන ජන ගහණයේ සංඛ්‍යාව 470000 ක් වනු ඇත.



පෙරුම් ඒකකය

අරමුදල් සපයා ගනු ලබන ප්‍රභවයන් වන්නේ චීනයේ අපනයන ආනයන බැංකුව හා ශ්‍රී ලංකා ජන රජය වේ. අදාල කොන්ත්‍රාත්තුව ඇමෙරිකානු ඩොලර් මිලියන 194.83 හා ලංකා රුපියල් 8,356.25 ක මුදලකට හා ශ්‍රී ලංකා ජන රජයේ දායකත්වය වන ලංකා රුපියල් මිලියන 7313.94 ක කොන්ත්‍රාත් මුදල් ප්‍රමාණයකට ප්‍රදානය කරන ලදි. කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කටයුතු වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 21 වැනි දින ආරම්භ කරන ලද අතර වර්ෂ 2022 ක් වූ අගෝස්තු මස 20 වැනි දින ව්‍යාපෘතියේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට නියමිත වේ.

මහනුවර උතුර - පාත දුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය සමන්විත වන්නේ දැනට ක්‍රියාත්මක වන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 50000 ක පරිමාවේ සිට දිනකට ජලය ඝණ මීටර 100000 ක් දක්වා වර්ධනය කිරීම සඳහා වැඩි දියුණු කිරීම ද, තුළු මුව වැඩි දියුණු කිරීම ද, SR 27 ක සංඛ්‍යාවක් හා අළුත් PH 17 ක සංඛ්‍යාවක් ද, කිලෝ මීටර 570 ක දිග ප්‍රමාණයකින් යුත් බෙදා හැරීමේ නල මාර්ග හා කිලෝ මීටර 83 ක දිග ප්‍රමාණයකින් යුත් සම්ප්‍රේෂණ නල මාර්ග සම්පාදනය කොට වීලීම ද, ග්‍රාමීය ජල සම්පාදනය සඳහා ප්‍රතිපාදන හා ආදායම් රහිත ජල පරිමාව වැලැක්වීමේ හා අඩු කිරීමේ වැඩ සටහනක් ද යන අංගයන්ගෙන් වේ. මුළු භෞතික ප්‍රගතිය සියයට 62.0 ක් හා මූල්‍ය ප්‍රගතිය සියයට 48.4 ක් විය.

අස්ගිරිය පොම්පාගාරය ඉදි කිරීම සඳහා ඉඩම් අත් පත් කර ගැනීමේ ගැටළුවක් පැන නැගී ඇති අතර අපගේ ප්‍රධාන කොන්ත්‍රාත්කරු මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගයන් දිගේ නල වීලීම සඳහා ඇප බැඳුම්කරයක් වශයෙන් බැංකු සහතිකය පිළිගැනීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුකොට ගෙන ගැටළුවකට මුහුණ දී තිබේ.

10. අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය (11 වැනි අදියර)

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය (11 වැනි අදියර) ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථය වන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය, හොරොව්පොතාන, කහටගස් දිගිලිය හා කැබිතිගොල්ලෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ හා රඹෑව හා මැදවච්චිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් වල කොටසත් තුළ ජීවත් වන මහ ජනතාව වෙත සුරක්ෂිත නල මාර්ගික පානීය ජලය සම්පාදනය කර දීම වන්නේය. අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය (11 වැනි අදියර) වෙනුවෙන් ශ්‍රී ලංකා ජන රජය විසින් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය සමග ජපන් යෙන් 23,137 ක ණය මුදලක් සඳහා ණය ගිවිසුමක් අත්සන් කරන ලද අතර මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ශ්‍රී ලංකා ජන රජය විසින් ලංකා රුපියල් මිලියන 4,819 ක දායකත්වයක් සපයනු ලැබේ.



ආවරණය කරනු ලබන ප්‍රදේශය දැක්වෙන සිතියම

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයන් වන්නේ යාන් ඔය ජලාශය තුළ ඉදි කරනු ලබන දිනකට ජලය ඝණ මීටර 34800 ක ධාරිතාවයකින් යුත් තුළු මුව, 1 වැනි පියවර හා 11 වැනි පියවර වෙනුවෙන් වාහල්කඩ ඉදි කරනු ලබන දිනකට ජලය ඝණ මීටර 16500 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, තුළු මුව හා ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙනුවෙන් කරනු ලබන යාන්ත්‍රික

හා විද්‍යුත් මිණුම් උපකරණ ස්ථාපිත කිරීම හා ස්වයංක්‍රීයකරණ පද්ධතිය, බිම් දෙණ 10 ක සංඛ්‍යාවක් ඉදි කිරීම, ඔසොව් කුළුණු 11 ක සංඛ්‍යාවක් ඉදි කිරීම, මිලි මීටර 600 මෘදු යකඩ PN 16, කිලෝ මීටර 3.3 ක දිගින් යුත් අමු ජල නල මාර්ගය, කිලෝ මීටර 148 ක දිග ප්‍රමාණයකින් යුත් සම්ප්‍රේෂණ නල මාර්ග, කිලෝ මීටර 1053 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ ජාලය හා ජලය ඝණ මීටර 250 ක ධාරිතාවයකින් යුත් ඔසොව් කුළුණ හා අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ 1 පියවර යටතේ බවුසර වලින් ජලය සපයනු ලබන ප්‍රදේශයන් වෙනුවෙන් හා හුදෙකලා වූ ප්‍රදේශයන් වෙනුවෙන් ජල සේවා සම්පාදනය කර දීම සඳහා ආසන්න වශයෙන් කිලෝ මීටර 422.6 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ නල මාර්ගය ඉදිීම යන අංගයන් වන්නේය.

මෙම ව්‍යාපෘතිය පැකේජ 12 කට බෙදනු ලැබ ඇති අතර එම පැකේජයන් දැනට ක්‍රියාත්මක කරනු ලැබීමේ විවිධ පියවරයන් තුළ පවතී. 2021 වර්ෂයේ අවසානය වන විට සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 12.6 ක් හා සියයට 1.3 ක් විය.

කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා ඇති වූ රට වසා දැමීම්, ඇඳිරි නීතිය පැණවීම්, ගමන් කිරීමේ සීමාවන් හා ශ්‍රම හමුදාව සීමා කිරීම් වැනි 2020 ඔක්තෝබර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා සහ 2021 වර්ෂයේ මැයි මාසයේ සිට ජුලි මාසය දක්වා ශ්‍රී ලංකා ජන රජය විසින් පණවන ලද සීමාවන් හේතුකොට ගෙන ප්‍රතිසම්පාදන ක්‍රියාවලිය හා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය විසින් ERD හරහා අවසන් වකඟත්වයකට පැමිණීම අපේක්ෂා කරන ලද කාල සීමාවට වඩා වැඩි කාලයක් ගත්තේය.

11. කළු ගඟ ජල සම්පාදනය විස්තීර්ණ කිරීමේ ව්‍යාපෘතිය - 1

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ කළු ගඟ ජල සම්පාදන ව්‍යාපෘතියේ 1 වැනි පියවර යටතේ සේවා සපයනු නොලබන ප්‍රදේශයන් දක්වා නල මාර්ගික ජල සම්පාදන ආවරණය කිරීම දීර්ඝ කිරීම හා කළු ගඟ ජල සම්පාදන පහසු කම් වල මා වැඩ හා සම්ප්‍රේෂණය විස්තීර්ණ කිරීම මගින් හා ජලය බෙදා හැරීමේ ජාලයන් ප්‍රති ව්‍යුහගත කිරීම මගින් කළුතර හා කොළඹ දිස්ත්‍රික්කයන් තුළ දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතින ජල සම්පාදන ජාලයේ කාර්යක්ෂමතාවය නංවා ලීම වේ. මෙම ව්‍යාපෘතිය මගින් කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි කැස්බෑව, පාදුක්ක, මොරටුව, හෝමාගම, දෙහිවල හා රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ ජීවත් වන්නා වූ මහ ජනතාවගේ හා කළුතර දිස්ත්‍රික්කය තුළ පිහිටි බණ්ඩාරගම, පානදුර, කළුතර, හොරණ, මදුරුවල හා මිල්ලනිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ ජීවත් වන මහ ජනතාවයේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා අති විශාල දායකත්වයක් ලබා දෙනු ලබනවා ඇත. බුලත්සිංහල හා ඉංගිරිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ මතු වෙමින් පවත්නා පානීය ජල ඉල්ලුම සපුරා දීම වෙනුවෙන් එම ප්‍රදේශයන් සඳහා වෙනම තොග සැපැයුම් සම්පාදනය කරනු ලැබීමට හා ඒ සඳහා අවශ්‍ය ජලය බෙදා හැරීමේ ප්‍රධාන පෝෂණ ලක්ෂ්‍යයක් වෙත ජලය සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය නල මාර්ගය ඉදිීමට ද දැනට සැලැසුම් කරනු ලැබ ඇත.

ව්‍යාපෘතිය වෙනුවෙන් අරමුදල් සපයනු ලබන ඒජන්සිය වන්නේ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය වන අතර ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සි ණය SLP 11.7 යටතේ ජපන් යෙන් මිලියන 31,810 ක ණය මුදල් ප්‍රමාණයක් ලබා දෙනු ලබන අතර ශ්‍රී ලංකා ජන රජය විසින් ප්‍රතිබන්ධිත අරමුදල් වශයෙන් ලංකා රුපියල් මිලියන 10,282 ක මුදල් ප්‍රමාණයක් ඒ සඳහා ලබා දෙනු ඇත. ව්‍යාපෘතියට අදාල වැඩ කටයුතු 2020 දෙසැම්බර් 04 වැනි දින භෞතික වශයෙන් ආරම්භ කරන ලද අතර සැලැසුම් කරනු ලැබ ඇති ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව ඉහතින් සඳහන් කරන ලද ආරම්භක දිනයේ සිට මාස 65 ක කාලයක් වනු ඇත.

වර්ෂ 2024 වන විට රටේ සියළුම සේවා නොලබන ප්‍රදේශයන් වෙත පානීය ජල පහසුකම් ලබා දිය යුතුය යන්න නියම කරනු ලැබ ඇති රජයේ සංවර්ධන ඉලක්කයන් හා අනුගත වීම පිණිස ව්‍යාපෘති සිහිපත තුළ ප්‍රකාශ කරනු ලැබ ඇති කොන්ත්‍රාත්තු පැකේජයන්ගේ විෂය පථයන් ප්‍රති සංවිධානය කිරීම සඳහා වූ ක්‍රමෝපායයක් 2021 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද අතර ඒ අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මෙහෙයුම් හා නඩත්තු වැඩ කටයුතු සැලැස්මේ තාක්ෂණික දෘෂ්ඨි කෝනය අනුව යමින් ගණුදෙනු කරුගේ දොර එළිපත වෙත ජලය සම්පාදනය කර දීම සඳහා මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ප්‍රමුඛතාගත කරන ලදි.

ඒ කාරණා හැරෙන්නට දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතින කළු ගඟ ජල සම්පාදනය විස්තීර්ණ කිරීමේ ව්‍යාපෘතිය - 1 වැනි පියවරෙහි මුළු විෂය පථය සමන්විත වන්නේ උපදේශක සේවා කොන්ත්‍රාත්තුව, කඳාන කළු ගඟ දිගේ ඉදි කරනු ලබන දිනකට ජලය ඝණ මීටර 294000 ක ධාරිතාවයකින් යුක්ත වූ තුළු මුව, දිනකට ජලය ඝණ මීටර 14000 ක ධාරිතාවයකින් යුක්ත වන සේ දැනට ක්‍රියාත්මක වන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පහසුකමෙහි ධාරිතාවය නංවා ලීම, ආසන්න වශයෙන් කිලෝ මීටර 27.3 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය සම්පාදනය කොට එළීම, දළ වශයෙන් කිලෝ මීටර 107 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ පෝෂණ ප්‍රධාන නල මාර්ගය සම්පාදනය කොට එළීම, ආසන්න වශයෙන් කිලෝ මීටර 190 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ දෙවැනි ජලය බෙදාහැරීමේ ප්‍රධාන නල මාර්ගය සම්පාදනය කොට එළීම, බිම් ජලාශයන් හා පොම්පාගාරයන් 04 ක සංඛ්‍යාවක් කැස්බෑව, දෙල්කඳ, බණ්ඩාරගම හා කෙසෙල්වත්ත යන ස්ථානයන් තුළ ඉදි කිරීම හා මොරටුව බිම් ජලාශ පරිශ්‍රය තුළ අළුත් පොම්ප ස්ථාපිත කිරීම යන කර්තව්‍යයන්ගෙන් වේ. ව්‍යාපෘති පසුවිපරම් කිරීමේ ඒකකය විසින් හා උපදේශක විසින් අළුතින් ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත්තු පැකේජ ප්‍රතිසංවිධාන ක්‍රමෝපාය අගය කරමින් කරන ලද වෙනස් නොවන ප්‍රකල්පනයන් මත පදනම් වෙමින් හා ප්‍රතිසම්පාදන ක්‍රියාවලිය තුළදී පූර්ව සුදුසුකම් සැලැකිල්ලට ගැනීම අයින් කිරීමට කරන ලද යෝජනාව මත පදනම් වෙමින් ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය විසින් අවසානයේදී යෝජනා දෙකම වෙනුවෙන් සිය වකඟතාවය පළ කරන ලද අතර එය ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගන්නා ලද ඉතා වැදගත් ජයග්‍රහණයක් වේ.

අද දක්වා බලාත්මකව පවතින්නා වූ එකම කොන්ත්‍රාත්තු පැකේජය වන උපදේශක සේවා කොන්ත්‍රාත්තුව අනුව බලන කල 2021 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති මූල්‍ය ප්‍රගතිය සියයට 28.9 ක් වන අතර භෞතික ප්‍රගතිය සියයට 36.9 ක් වේ.

12. කිරම - කටුවන ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

කිරම - කටුවන ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය සැලැසුම් කරනු ලැබ ඇත්තේ කටුවන හා වලස්මුල්ල යන ප්‍රදේශයන් තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 34 ක සංඛ්‍යාවක් ආවරණය වන පරිදි විශ්වාසදායක පානීය ජල සේවාවක් සම්පාදනය කර දීම සඳහා වන්නේය.

මීට අදාල කොන්ත්‍රාත්තුව ඕස්ට්‍රියාවේ යුනි ක්‍රෙඩිට් බැංකුව විසින් විදේහ අරමුදල් වශයෙන් සම්පාදනය කර දෙන ලද යුරෝ මිලියන 10.485611 ක මුදල් ප්‍රමාණයකට හා ශ්‍රී ලංකා ජන රජය විසින් දේශීය අරමුදල් වශයෙන් සපයා දෙන ලද ලංකා රුපියල් මිලියන 700 ක මුදල් ප්‍රමාණයකට ප්‍රදානය කරන ලදි. ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කරන ලද්දේ වර්ෂ 2019 ජනවාරි මස 31 වැනි දිනයේදීය. තුළු මුව වෙනස් කිරීමට සිදු වූ නිසා හා අනපේක්ෂිත ලෙස පැන නැගුන කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුකොට ගෙන ඇති වූ ගැටළු නිසා ව්‍යාපෘතියේ කාල සීමාව වර්ෂ 2022 ජනවාරි මස 31 වැනි දිනය දක්වා දීර්ඝ කිරීමට සිදු විය.

මෙම ව්‍යාපෘතිය තුළට කිලෝ මීටර 1.9 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ඉහළ ඝණත්වයේ පොලි එතිලින් අමු ජල නල මාර්ගයක් සහිත

දිනකට ජලය ඝණ මීටර 3500 ක ධාරිතාවයකින් යුක්ත වූ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ද, කිලෝ මීටර 5.8 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ඉහළ ඝණත්වයකින් යුක්ත වූ පොලි එතිලීන් සම්ප්‍රේෂණ නල ජාලයක් ද, කිරම හා කටුවන යන ප්‍රදේශයන් දෙකම ආවරණය කරන කිලෝ මීටර 45 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ඉහළ ඝණත්වයේ පොලි එතිලීන් ජලය බෙදා හැරීමේ නල ජාලයක් ද ඇතුලත් වේ. අපේක්ෂා කරනු ලබන ප්‍රතිලාභීන්ගේ මුළු සංඛ්‍යාව 26000 ක ජන ගහණ සංඛ්‍යාවක් වන අතර සේවා සම්බන්ධතා 2000 ක් වැඩි දියුණු කිරීම හා සමග නව සම්බන්ධතාවයන් 3200 ක සංඛ්‍යාවක් සම්පාදනය කර දීමට අපේක්ෂා කරනු ලැබේ.

2021 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබී භෞතික ප්‍රගතිය සියයට 99 ක් වූ අතර එම ප්‍රගතිය තුළට ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ඉදිකිරීම් වැඩ කටයුතු සියයට 100 ක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබීම ද, බෙදා හැරීමේ හා සම්ප්‍රේෂණය කිරීමේ ජාල වල වැඩ කටයුතු සියයට 98 ක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබීම ද, ජලාශයන් ඉදි කිරීමේ වැඩ කටයුතු සියයට 100 ක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබීම හා තුළු මුව ඉදි කිරීමේ වැඩ කටයුතු සියයට 100 ක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබීම යනුවෙන් වූ ප්‍රධාන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමෙහි ලා සාක්ෂාත් කර ගන්නා ලද ප්‍රගතිය ඇතුලත් විය. 2021 වර්ෂය අවසානයට සාක්ෂාත් කර ගනු ලැබ තිබී මූල්‍ය ප්‍රගතිය සියයට 97 ක් විය. මේ හැරෙන්නට වාරිමාර්ග හදපාර්තමේන්තුවේ ඉල්ලීම මත කිරම ජලාශය නව අමු ජල ප්‍රභවය වශයෙන් තෝරා ගන්නා ලදී.

මණ්ඩලය විසින් ලබා ගත් ණය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්.

13. ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය

ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය මගින් අදහස් කරනු ලබන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී වසම් 443 ක සංඛ්‍යාවක් තුළ නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 88000 ක සංඛ්‍යාවක් සම්පාදනය කර දීමට හා දැනට ක්‍රියාත්මක වන ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 22000 ක සංඛ්‍යාවක සේවා තත්ත්වයන් වැඩි දියුණු කිරීමට ද වන්නේය.

ජලය ඝණ මීටර 54000 ක ධාරිතාවයකින් යුක්ත වූ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම ද, ජලය ඝණ මීටර 1500 ක ධාරිතාවයකින් යුක්ත වූ ඔසොව් කුළුණු 05 ක සංඛ්‍යාවක් ඉදි කිරීම ද, ජලය ඝණ මීටර 10000 ක ධාරිතාවයකින් යුක්ත වූ භූමි ජලාශයක් ඉදි කිරීම ද, කිලෝ මීටර 90 ක දිග ප්‍රමාණයකින් යුත් සම්ප්‍රේෂණ නල මාර්ගයක් ඉදි කිරීම හා කිලෝ මීටර 630 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ජලය බෙදා හැරීමේ නල මාර්ග ඉදි කිරීමද සිදු කිරීමට නියමිතව ඇත. ප්‍රධාන ජල ප්‍රභවය වශයෙන් ඝණ මීටර මිලියන 3.5 ක ධාරිතාවයකින් යුක්ත වූ ජලාශයක් ඉදි කිරීම සඳහා බස්නාගොඩ වේල්ලක් ඉදි කරනු ලබනවා ඇත.



ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, කරස්නාගල.

අත් පත් කර ගැනීමේ හා වන්දි ගෙවීමේ ප්‍රමාදයන් හේතකොට ගෙන වේල්ල හා තුළු මුව ඉදි කිරීමේ වැඩ කටයුතු ප්‍රමාද වූ අතර දැනට ඒවා ඉදි කරනු ලබමින් පවතී. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ, ඔසොව් කුළුණු 05 ක හා ජලාශයේ ඉදි කිරීම් වැඩ කටයුතු දැනට සිදු කරගෙන යමින් පවතී. පස්යාල, නයිවල, මිනුවන්ගොඩ, බැළුම්මහර හා අත්තනගල්ල යන ප්‍රදේශයන් තුළ සම්ප්‍රේෂණ නල මාර්ග කිලෝ මීටර 51 ක දිග ප්‍රමාණයක් එලීම හා කිලෝ මීටර 452 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ නල මාර්ග එලීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. නිට්ටඹුව හා ගම්පහ සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගයට අදාල කොන්ත්‍රාත්තු පැකේජ ආරම්භ කරනු ලැබ ඇති අතර ඒවායේ ජලය බෙදා හැරීමේ ප්‍රධාන නල මාර්ග වැඩ කටයුතු මෙතෙක් ආරම්භ කරනු ලැබ නැත.

සමස්ත භෞතික ප්‍රගතිය සියයට 75.84 ක් හා මූල්‍ය ප්‍රගතිය ලංකා රුපියල් මිලියන 34,308.64 ක් විය.

14. හෙම්මාතගම ජල සම්පාදන ව්‍යාපෘතිය

හෙම්මාතගම ජල සම්පාදන ව්‍යාපෘතිය හරහා අදහස් කරනු ලබන්නේ සබරගමු පලාතේ කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි මාවනැල්ල, අරනායක, හා රඹුක්කන යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 135 ක සංඛ්‍යාවක් ආවරණය කරමින් (2042 වර්ෂය වන විට) 169000 ක ජන ගහණයක් වෙත නල මාර්ගික ජලය සම්පාදනය කර දීම අරමුණු කර ගනිමින් නව ජල සම්පාදන යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට වේ. මුළු ව්‍යාපෘති පිරිවැය ලංකා රුපියල් මිලියන 17,422.29 ක් වන අතර ව්‍යාපෘතියේ කාලය (2018 දෙසැම්බර් සිට 2022 නොවැම්බර් දක්වා වූ) මාස 46.5 ක් වේ.



ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම

ව්‍යාපෘතිය සමන්විත වන අංගයන් වන්නේ දිනකට ජලය ඝණ මීටර 21000 ක ධාරිතාවයකින් යුක්ත වූ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, දිනකට ජලය ඝණ මීටර 24000 ක ධාරිතාවයකින් යුක්ත වූ තුළු මුව, බිම් ජලාශයන් 07 ක සංඛ්‍යාවක්, කිලෝ මීටර 0.63 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ අමු ජල ප්‍රධාන නල මාර්ගය, කිලෝ මීටර 38 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ සම්ප්‍රේෂණ ජාලය හා කිලෝ මීටර 74 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ බෙදා හැරීමේ ජාලය ද වන්නේය.

2021 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබී භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 65.3 ක් හා සියයට 65.8 ක් විය. මේ වන විට වතු අංශයෙන් ඉඩම් අත් පත් කර ගැනීම ව්‍යාපෘතිය විසින් මුහුණ දෙනු ලබන ප්‍රධාන ගැටළුවක් වශයෙන් හඳුනා ගනු ලැබ ඇති අතර අදාල ලිපි ඉඩම් අත් පත් කර ගැනීම සඳහා වතු යායේ ඡන්ද හිමිකම් වැඩියෙන් භුක්ති විඳින කොටස් හිමියන්ගේ (golden shareholders) අනුමැතිය ලබා ගැනීම සඳහා වතු කර්මාන්ත අමාත්‍යාංශය වෙත යොමු කරනු ලැබ ඇති අතර මෙතෙක් එම අනුමැතිය ලැබී නැත.

15. තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය

තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය දියත් කරන ලද්දේ තඹුත්තේගම, තලාව හා ගල්නෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ ඇති ග්‍රාම නිලධාරී වසම් 42 ක සංඛ්‍යාවක් තුළ ජීවත් වන ජනතාව වෙත ආරක්ෂිත හා විශ්වාසදායක නල මාර්ගික ජලල සම්පාදනයක් සපයා දීම සඳහා වන අතර ව්‍යාපෘතියේ කාල සීමාව වර්ෂ 2018 ජූලි මස 01 වැනි දින සිට වර්ෂ 2021 දෙසැම්බර් මස 31 වැනි දිනය දක්වා වේ.

රාජාංගනය ඒකාබද්ධ ගොවි සංවිධානය විසින් කරන ලද උද්ඝෝෂණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් පැන නගින ලද තුළු මුව හා සම්බන්ධ ගැටළුව හේතුකොට ගෙන හා කොවිඩ් 19 ලෝක වසංගත තත්ත්වය හේතුකොට ගෙක ව්‍යාපෘතියේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කිරීම ප්‍රමාද විය. ඒ කෙසේ වුව ද නව ජල ප්‍රභවයක් සොයා ගැනීමට හැකි වන ලද අතර ඒ නිසා තුළු මුව ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීමට හැකි විය. ඒ අනුව ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කිරීමේ දිනය වර්ෂ 2022.08.30 දක්වා දීර්ඝ කරන ලදි.



තුළු මුව

ජල ප්‍රභවය පිළිබඳ ගැටළුව විසඳාගත හැකි වූ නමුත් ඵලදායී ලෙස ජලය බෙදා ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, වාරි මාර්ග දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ යුතුව ඇත. සිමෙන්ති වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍යයන් සපයා ගැනීම හා අදාල වන ඇතැම් ගැටළු පැන නැගී ඇති අතර ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කිරීම තව දුරටත් ප්‍රමාද වීමට ඒවා ද හේතු වී තිබේ. ව්‍යාපෘති පසුවිපරම් කිරීමේ ඒකකය විසින් මේ සම්බන්ධයෙන් සැපයුම්කරුවන් සමග සෘජුවම සම්බන්ධ වී ද්‍රව්‍ය සම්පාදනය කිරීමේ ප්‍රමාදයන් අවම කිරීමේ උත්සාහයක යෙදී සිටී.

2021 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබුන භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 76.3 ක් හා සියයට 75.0 ක් විය.

16. පොල්ගහවෙල - පොතුහැර හා අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

පොල්ගහවෙල - පොතුහැර හා අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රම සම්පාදනය කොට, සැලැසුම් කොට ගොඩ නැගීමේ කොන්ත්‍රාත්තුවක් වන අතර එහි පරමාර්ථය වන්නේ ව්‍යාපෘති ප්‍රදේශය තුළ පිහිටා ඇති ග්‍රාම නිලධාරී වසම් 167 ක සංඛ්‍යාවක් තුළ ජීවත් වන්නා වූ 162725 ක් වන ජන ගහණයක් වෙත සුරක්ෂිත පානීය ජලය සම්පාදනය කොට බෙදා හැරීම වන්නේය. ඒ සඳහා අරමුදල් සම්පාදනය කර දෙනු ලබන්නේ ඉන්දියාවේ අපනයන ආනයන බැංකුව (සියයට 85 ක්) හා ලංකා බැංකුව (සියයට 15 ක්) විසින් වන අතර ව්‍යාපෘතිය සඳහා වැය වන මුළු පිරිවැය අමෙරිකානු ඩොලර් මිලියන 108 ක් වන්නේය.



ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

2021 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබෙන සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 90.0 ක් හා සියයට 90.7 ක් විය (ආපසු අය කර ගන්නා ලද ශේෂ අත්තිකාරම් සියයට 1.86 ක් ඇතුළුව).

2021 වර්ෂයේ නව සම්බන්ධතා සම්පාදනය කර දීමේ වැඩ සටහන යටතේ නව සම්බන්ධතාවයන් 500 ක සංඛ්‍යාවක් සම්පාදනය කර දීම සඳහා ආසන්න වශයෙන් කිලෝ මීටර 7.5 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල වීලීම් වයඹ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය වෙත භාර දෙන ලදි. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුකොට ගෙන ඇති වූ රට වසා දැමීමේ තත්ත්වය හා පලාත් අතර ගමනාගමනය සීමා කරනු ලැබූ තත්ත්වය හා මාස 6 කට අධික කාලයක් තුළ බල පවත්වන ලද අහිතකර කාල ගුණික තත්ත්වයන් යටතේ වුව ද පොල්ගහවෙල හා අලව්ව කලාපයන් තුළ තුළු මුවෙහි හා ජල ප්‍රතිකාරය යන්ත්‍රාගාරයෙහි මෙහෙයුම් තත්ත්වය සාක්ෂාත් කර ගැනීමේ හැකියාව අප වෙත ලැබිණි.

ක්‍රියාත්මක කරමින් සිටි කාලය තුළදී සිමෙන්ති, වානේ, අල්ලි සහිත තහඩු, ටයිල් වර්ග, සනීපාරක්ෂණ සවි කිරීම් ආදිය හිඟ වීම, කොන්ත්‍රාත් කරුගේ දුර්වල මුදල් ප්‍රවාහය, ලංකා ටුම්රිය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමේදී සිදු වූ ප්‍රමාදයන්, GSMB අනුමැතිය ලබා ගැනීමේදී සිදු වූ ප්‍රමාදයන්, නාගරික ප්‍රදේශයන් තුළ ගල් පුපුරවා හැරීමේ ද්‍රව්‍ය ලබා ගැනීමේදී සිදු වූ ප්‍රමාදයන්, වැසි සහිත කාල ගුණයන් යටතේ කළ හැකි වූයේ රසායනික පුපුරුවා හැරීම් පමණක් වීම හා ඒවා ඵලදායක නොවීම, වර්ෂා සෘතුව තුළදී මා ඔය තුළු මුවෙහි ජල මට්ටම ඉහළ යාම හා කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා සිදු වූ ද්‍රව්‍ය සැපැයීමේ ප්‍රමාදයන් වැනි අභියෝගයන් අබිභවා යාමට සිදු විය.

17. අළුත්ගම - මතුගම - අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය විසින් අරමුණු කරනු ලබන්නේ කෙත්හේන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම මගින් හා කොලේමෝදර නව තුළු මුවක් ඉදි කිරීම මගින් කුඩා ගඟෙන් අමු ජලය සම්ප්‍රේෂණය කිරීම හරහා දැනට පවතිනු ලබන ලවණතා ආක්‍රාන්තිය පිළිබඳ ගැටළුව අවම කිරීම මගින් මතුගම, දොඩංගොඩ, කළුතර, බේරුවල, අගලවත්ත හා මදුරාවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ පිහිටා ඇති ග්‍රාම නිලධාරී වසම් 269 ක සංඛ්‍යාවක් තුළ වැඩි වෙමින් පවතින ජලය සඳහා වූ ඉල්ලුම සපුරා ලීම පිණිස ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම වෙත වන්නේය.



කෙත්හේන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

මෙම ව්‍යාපෘතිය සැලැසුම් කරන ලද්දේ නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 32000 ක සංඛ්‍යාවක් සපයා දීම පිණිස හා දැනට සිටින පාරිභෝගිකයින් වෙත සපයනු ලබන සේවාවන්ගේ සේවා මට්ටම වැඩි දියුණු කිරීම අරමුණු කර ගෙන වේ. 300000 ක මුළු ජන සංඛ්‍යාවක් (පවුල් 60000 ක සංඛ්‍යාවක්) මෙම ව්‍යාපෘතිය හරහා ප්‍රතිලාභ ලබනු ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය පහසුකම් සපයා දෙනු ලබන්නේ ඉන්දියාවේ අපනයන ආනයන බැංකුව, ලංකා බැංකුව හා ශ්‍රී ලංකා ජන රජය විසින් වන අතර ව්‍යාපෘතිය වෙනුවෙන් වැය වනු ඇතැයි ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය ලංකා රුපියල් මිලියන 32,278 ක් වේ. ඒ අතුරින් ලංකා රුපියල් මිලියන 24,285 ක මුදල් ප්‍රමාණයක් ඉන්දියාවේ අපනයන ආනයන බැංකුව වෙතින් ද, ලංකා රුපියල් මිලියන 4,286 ක මුදල් ප්‍රමාණයක් ලංකා බැංකුව වෙතින් හා ලංකා රුපියල් මිලියන 3,707 ක මුදල් ප්‍රමාණයක් සිය දායකත්වය වශයෙන් ශ්‍රී ලංකා ජන රජය වෙතින් ද ලැබෙනු ඇත. මෙම ව්‍යාපෘතිය ජල සම්පාදන අමාත්‍යාංශයේ මග පෙන්වීම් යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන කොන්ත්‍රාත් කරු වන්නේ අයන් එක්ස්චේන්ජ් (ඉන්දියා) පෞද්ගලික සමාගම වන්නේය. අනු කොන්ත්‍රාත් කරුවන් වන්නේ සීමා සහිත කේ. ඩී. වී . වීරසිංහ සහ සමාගම හා සීමා සහිත ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන් කන්සෝර්ටියම් (පෞද්ගලික) සමාගම ද වේ. ව්‍යාපෘතියේ වැඩ කටයුතු වර්ෂ 2017.05.15 වැනි දින ආරම්භ කරන ලද අතර එය වර්ෂ 2022 මාර්තු මස 31 වැනි දින සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට සැලැසුම් කරනු ලැබ ඇත.

කොලේමෝදර ඉදි කරනු ලබන නව තුළු මුව ඉදි කිරීම් කටයුතු සෑහෙන තරම් දුරකට සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර පෝම්ප මෙහෙයුම් තත්ත්වයේ පවතී. අමු ජලය මිලි මීටර 800 ක විෂ්කම්භයකින් යුත් අමු ජලය පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය ඔස්සේ කෙත්හේන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත පෝම්ප කළ හැකි වේ. කෙත්හේන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය තුළ කරගෙන යනු ලබන නව ප්‍රතිකාරක වැඩ කටයුතු සෑහෙන දුරකට සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර එය සේවයේ යෙදවිය හැකි තත්ත්වයක පවතී. ජලය බෙදා හැරීමේ නල මාර්ග වලීමේ වැඩ කටයුතු සෑහෙන දුරකට සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර පලාතොට ජලය බෙදා හැරීමේ ප්‍රදේශය තුළ ජලය බෙදා හැරීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක වේ. දොඩංගොඩ භූමි ජලාශය ඉදි කිරීමේ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර එය සේවයේ යෙදවිය හැකි තත්ත්වයක ඇත. දොඩංගොඩ ජලය බෙදා හැරීමේ ප්‍රදේශයේ කොටසක් තුළ ජලය බෙදා හැරීමේ කටයුතු ආරම්භ කළ හැකි තත්ත්වයක පවතින අතර මතුගම, මතුගම කන්ද, අගලවත්ත හා නෑබොඩ ජල කුළුණු ඉදි කිරීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. 2021 වර්ෂයේ අවසානයට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කරගනු ලැබ තිබී සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 89.7 ක් හා සියයට 86.9 ක් විය.

18. කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටා ඇති ග්‍රාම නිලධාරී වසම් 46 ක සංඛ්‍යාවක් ආවරණය කරමින් කටාන දකුණ, කටාන මධ්‍යම හා කටාන උතුර යන කලාපයන් තුන තුළ ජීවත් වන මහ ජනතාව වෙත සුරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දෙනු ලබන අතර මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 156000 ක් වේ.

මෙම ව්‍යාපෘතිය සැලැසුම් කොට ගොඩ නැගීමේ ව්‍යාපෘතියක් වන අතර ඊට ඝණ මීටර 2000 ක ධාරිතාවයකින් යුක්ත වූ ඔසොව් ජල කුළුණු 3 ක සංඛ්‍යාවක් ද, කිලෝ මීටර 12 ක දිග ප්‍රමාණයකින් යුත් සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගයක් ද, කිලෝ මීටර් 240 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ පද්ධතියක් ද, අධීක්ෂණාත්මක පාලනය හා දත්ත අත් කර ගැනීම ක්ෂ* පද්ධතියක් ඇතුළු යාන්ත්‍රික හා විද්‍යුත් වැඩ හා ස්ථාන භාර නිලධාරී කාර්යාල 2 ක්, අවිවාහක නිල නිවාස 01 ක් හා පොම්පාගාර 2 ක් ද ඇතුළු ගොඩනැගිලි ද ඇතුලත් වේ. 2021 වර්ෂයේ අවසානයට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබී භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 100 ක් හා සියයට 90 ක් වූ අතර ව්‍යාපෘතිය ගම්පහ මෙහෙයුම් හා නඩත්තු අංශය විසින් 2021 මාර්තු 31 වැනි දින සාර්ථක ලෙස භාර ගන්නා ලදි. ඉඩම් අත් පත් කර ගැනීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට ඉතිරිව තිබේ.



ඡායා රූපය : ඇටම්පිටිය ජල පවිත්‍රාගාරය

19. ඔරුගොඩවත්තේ සිට කඩුවෙල දක්වා එලනු ලැබ ඇති සම්ප්‍රේෂණ හා ජලය බෙදා හැරීමේ ප්‍රධාන නල මාර්ගයන් ප්‍රතිස්ථාපනය කිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ ලබුගම, කලටුවාව හා අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන්ගේ සිට වීලනු ලැබ ඇති සම්ප්‍රේෂණ නල මාර්ගයන් මිලි මීටර 1200 හා මිලි මීටර 1000 මෘදු යකඩ නල යොදා ගනිමින් ඔරුගොඩවත්ත ගුවන් පාලමේ සිට කඩුවෙල අධිවේග මාර්ගීය අතුරු මාරුව දක්වා පහත මට්ටමේ මාර්ගය ඔස්සේ ප්‍රතිස්ථාපනය කරනු ලබනවා ඇත. ඊට අමතර වශයෙන් මෙම කොටස තුළ මිලි මීටර 355 විෂ්කම්භයකින් යුත් ඉහළ ඝණත්වයේ පොලි එතිලින් නල හා මිලි මීටර 160 විෂ්කම්භයකින් යුත් ඉහළ ඝණත්වයේ පොලි එතිලින් නල ද වීලනු ලැබේ.

වර්ෂය අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබී භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 82.1 ක් හා සියයට 71.7 ක් විය.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සමාන්තරව වේ. මාර්ග යේ ඇතැම් කොටස් තුළ ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු සම්පූර්ණයෙන් නිම කර නොමැති හෙයින් හා ඉවුරු පිරවීම කර නොමැති හෙයින් නල වීලීම කළ නොහැකි තත්ත්වයක් උද්ගත වී තිබේ. මාර්ග සංවර්ධන අධිකාරිය හා සම්බන්ධ ගැටළු වලට අමතර වශයෙන් (ලංකා විදුලිබල මණ්ඩලයට අයත්, LECO

ආයතනයට අයත් හා ටෙලිකොම් ආයතනයට අයත්) උපයෝගිතා මාර්ග හා කණු ඇතැම් ස්ථානයන් තුළ විතැන් කිරීමට සිදු වී තිබේ.

20. මාතර IV වැනි පියවර ජල සම්පාදන ව්‍යාපෘතිය

මාතර IV වැනි පියවර ජල සම්පාදන ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන්ම අරමුණු කරනු ලබන්නේ දැනට ක්‍රියාත්මක වන ජල සම්පාදන පද්ධතිය ගුණාත්මක හා ප්‍රමාණවත් ලෙස නංවාලමින් වී හරහා මාතර දිස්ත්‍රික්කය තුළ පිහිටි අළුත් ප්‍රදේශයන් වෙත නල මාර්ගික ජල සම්පාදන සේවාවක් සපයා දීම කෙරෙහි වන්නේය. මෙම ව්‍යාපෘතිය සමන්විත වී ඇත්තේ ගේට්ටු 05 ක සංඛ්‍යාවක් සහිත ලවණතා බාධකයක්, දිනකට ජලය ඝණ මීටර 60000 ක ධාරිතාවයකින් යුක්ත වූ තුළු මුවක්, දිනකට ජලය ඝණ මීටර 30000 ක ධාරිතාවයකින් යුක්ත වූ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක්, සේවා ජලාශයන් 05 ක සංඛ්‍යාවක් හා ඉහළ ඔසෝවි ජල කුළුණු 04 ක සංඛ්‍යාවක්, කිලෝ මීටර 75 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ සම්ප්‍රේෂණ පද්ධතියක්, කිලෝ මීටර 105 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ජලය බෙදා හැරීමේ පද්ධතියක්, ප්‍රධාන රසායනාගාරය, ස්ථාන භාර නිලධාරී කාර්යාලයන් 02 ක සංඛ්‍යාවක් හා කාර්ය මණ්ඩල නිල නිවාසයන් 08 ක සංඛ්‍යාවක් යන අංගයන් කෙරෙහි වේ. ව්‍යාපෘතිය මඟින් ආවරණය වනු ලබන ප්‍රදේශය තුළට මාතර දිස්ත්‍රික්කය හා හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් කොටසක් තුළ පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් 12 ක සංඛ්‍යාවක් තුළ පිහිටියා වූ ග්‍රාම නිලධාරී වසම් 236 ක සංඛ්‍යාවක් ඇතුලත් වේ.

අරමුදල් සපයා දෙනු ලබන ඒජන්සි වන්නේ ශ්‍රී ලංකා ජන රජය හා ජාතික සංවර්ධන බැංකුවයි. ව්‍යාපෘතියට අදාල වැඩ කටයුතු ආරම්භ කරන ලද දිනය වූයේ වර්ෂ 2017.10.10. දිනය වන අතර ව්‍යාපෘති පසුවිපරම් කිරීමේ ඒකකය විසින් ව්‍යාපෘතියේ කාලය 2022.06.02 දින දක්වා දීර්ඝ කිරීම නිර්දේශ කරනු ලැබ ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති (වැඩි වී ඇති ඩොලර් රේට් ප්‍රමාණයන් ඇතුළු) මුළු පිරිවැය ලංකා රුපියල් මිලියන 16,800 (දේශීය බැංකු අරමුදල්) හා ලංකා රුපියල් මිලියන 4,000 (ශ්‍රී ලංකා ජන රජය) හා අතර ලංකා රුපියල් මිලියන 20,800 කි. (ජාතික සංවර්ධන බැංකුවේ අනුමැතිය) ලැබීමට නියමිතව ඇත.

විවිධ හේතූන් ගණනාවක් හේතුකොට ගෙන ව්‍යාපෘතියේ වැඩ කටයුතු ප්‍රමාද වුව ද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාර වරයාගේ සම්බන්ධ වීමත් සමග වර්ෂ 2021 දෙසැම්බර් 31 වැනි දිනට පෙර තුළු මුවෙහි සිට ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත ජලය පොම්ප කිරීම මඟින් කොන්ත්‍රාත් කරු විසින් දෙනු ලැබ තිබූ ඉලක්කය සාක්ෂාත් කර ගන්නා ලදි. එසේම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ සිට මාලිම්බඩ පිහිටි බිම් ජලාශය වෙත පරීක්ෂණ ජල පොම්ප කිරීමක් ද සිදු කරන ලදි. ලවණතා බාධකය හේතුකොට ගෙන ඉඩම් ජලයෙන් යට වීම සම්බන්ධයෙන් ගොවීන් වෙත වන්දි ගෙවීමට සිදු වීම, කොවිඩ් 19 හේතුකොට ගෙන ශ්‍රමය භාවිතා කිරීම අස්ථිර තත්ත්වයක පැවැතීම, ඩොලර් වලින් කළ යුතු ගෙවීම් හිඟ හිටවා තිබීම හා ඩොලරයේ අගය වෙනස් වීම හේතුකොට ගෙන වැඩි වූ කොන්ත්‍රාත් මිළ ගණන් ගෙවීමට සිදු වීම යන ගැටළු වලට වර්තමානයේ මුහුණ දෙන්නට සිදු වී තිබේ.

2021 වර්ෂයේ අවසානයට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 86.5 ක් හා සියයට 78.0 ක් විය.

දේශීය බැංකු අරමුදල් වලින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන්

ප්‍රධාන ව්‍යාපෘතීන් 16 ක සංඛ්‍යාවක් ඇතුලත් රුපියල් බිලියන 3.5 ක දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය හා රුපියල් බිලියන 53 ක දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය 940000 ක ජන ගහණයක් වෙත ප්‍රතිලාභ සලසමින් ජල සම්පාදන පහසුකම් නංවා ලීම සඳහා දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. බෙන්තොට ජල සම්පාදන ව්‍යාපෘතිය, රුහුණුපුර ජල සම්පාදන යෝජනා ක්‍රමය, කොළඹ නාගරික ජල සම්පාදන ව්‍යාපෘතිය, අම්පාර ජල සම්පාදන යෝජනා ක්‍රමය, අවිස්සාවේල්ල හා කොස්ගම ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය, ගලගෙදර මාවතගම ජල සම්පාදන ව්‍යාපෘතිය සහ කොළඹ දිස්ත්‍රික්කයෙන් නැගෙනහිර පිහිටි නගර ජල සම්පාදන ව්‍යාපෘතිය පැකේජ අංක 1 හා පැකේජ අංක 11 නම් වූ ව්‍යාපෘති අටට අදාල වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබ ඇති අතර අනිකුත් ව්‍යාපෘතීන් වැඩි සංඛ්‍යාවකගේ වැඩ කටයුතු 2021 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරනු ලබනවා ඇත.

අ. ඇටම්පිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය ලංකා රුපියල් බිලියන 2.2 ක් වූ අතර ඒ මගින් බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 13 ක සංඛ්‍යාවක් තුළ ජීවත් වන මහ ජනතාව ප්‍රතිලාභ ලබමින් සිටිති. ව්‍යාපෘතිය සඳහා අමු ජලය උකහා ගනු ලබන්නේ මීටර 4000 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල මාර්ගයක් ඔස්සේ උමා ඔය ජලාශය වෙතින් වේ. ව්‍යාපෘතියට අයත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය දිනකට ජලය ඝණ මීටර 3000 ක ධාරිතාවයකින් යුක්ත වූ ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් වේ. පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගයන් ආසන්න වශයෙන් මීටර 7000 ක දිග ප්‍රමාණයකින් යුක්ත වන අතර එය ජලය ඝණ මීටර 225 ක ධාරිතාවයකින් යුක්ත වූ ටැංකි දෙකක සංඛ්‍යාවකින් ද, ජලය ඝණ මීටර 80 ක ධාරිතාවයකින් යුත් වැර ගැන්වූ සිමෙන්ති එක් ටැංකියකින් හා ජලය ඝණ මීටර 800 ක ධාරිතාවයකින් යුක්ත වූ එක් ටැංකියකින් ද සමන්විත වේ.ජලය බෙදා හැරීමේ ජාලය කිලෝ මීටර 120 කට වැඩි දිග ප්‍රමාණයකින් යුක්ත වේ. 2021 වර්ෂයේ අවසානයේදී ව්‍යාපෘතියේ වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම නිම කරන ලද අතර වර්ෂ 2021 ඔක්තෝබර් මස 31 වැනි දින ව්‍යාපෘතිය මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දෙන ලදි. ව්‍යාපෘතියේ මුළු මූල්‍ය විය පැහැදම් ගෙවීම ව්‍යාපෘතිය වෙනුවෙන් ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය වූ ලංකා රුපියල් මිලියන 2,244 ට වඩා රෙහිව ලංකා රුපියල් මිලියන 1,757 ක් විය. ව්‍යාපෘතිය විසින් නව ගෘහස්ත ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 3000 ක සංඛ්‍යාවක් දෙනු ලැබ ඇති අතර මෙහෙයුම් හා නඩත්තු අංශය විසින් නව ගෘහස්ත ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 1500 ක සංඛ්‍යාවක් දෙනු ලැබ ඇත.

ආ. ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය

ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ මාතලේ දිස්ත්‍රික්කයේ මොරගහ කන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය හේතුකොට ගෙන විතැන් වන්නට සිදු වූ ජන ගහණය නැවත පදිංචි කරවන ලද ප්‍රදේශය වෙත පානීය ජල පහසුකම් සම්පාදනය කර දීම සඳහා වන්නේය.

සැලැසුම් කෂිතිජ වර්ෂය වන 2036 වර්ෂය වන විට ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 24438 ක් වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන පිරිවැය ලංකා රුපියල් මිලියන 4,496 ක් වන අතර අරමුදල් සම්පාදනය කර දීම කරනු ලබන්නේ හැටන් නැෂනල් බැංකුව හා මහජන බැංකුව විසින් වේ. ව්‍යාපෘතිය හා අදාල වැඩ කටයුතු 2016 වර්ෂයේ ජුලි මාසය තුළදී ආරම්භ කරනු ලැබූ අතර 2018 වර්ෂයේ ජුලි මාසය වන විට වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලබනු ඇතැයි අපේක්ෂා කරන ලදි. ඒ කෙසේ වුව ද කොන්ත්‍රාත් කාල සීමාව 2022 වර්ෂයේ ඔක්තෝබර් 14 වැනි දිනය දක්වා දීර්ඝ කරනු ලැබ ඇත.

ජල ප්‍රභවය කළු ගඟ වන්නේය. මහජන උද්ඝෝෂණ හේතුකොට ගෙන තුළු මුව ඉදි කොට ඇති ස්ථානය වෙනස් කිරීමට සිදු වූ අතර ඒ අනුව ප්‍රධාන අමු ජල නල මාර්ගය වීලා තිබි මාර්ගය හා ප්‍රධාන ප්‍රතිකාරිත ජල නල මාර්ගය ද වෙනස් කරන ලද අතර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කරනු ලැබ තිබි ස්ථානයද වෙනස් කරන ලදි. සංශෝධනය කරන ලද විෂය පථය තුළට දිනකට ජලය ඝණ මීටර 4250 ක ධාරිතාවයකින් යුක්ත වූ තුළු මුවක් ද, දිනකට ජලය ඝණ මීටර 4000 ක ධාරිතාවයකින් යුක්ත වූ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ද, සේවා ජලාශයන් 03 ක සංඛ්‍යාවක් ද, පිළිවෙලින් කිලෝ මීටර 6.4 ක් පමණ දිග ප්‍රමාණයකින් යුක්ත වූ, කිලෝ මීටර 29 ක් පමණ දිග ප්‍රමාණයකින් යුක්ත වූ හා කිලෝ මීටර 190 ක පමණ දිග ප්‍රමාණයකින් යුක්ත වූ ප්‍රධාන අමු ජල නල මාර්ගයක් ද, ප්‍රධාන ප්‍රතිකාරිත ජල මාර්ගයක් හා ජලය බෙදා හැරීමේ නල පද්ධතියක් හා අනුබද්ධ ගොඩනැගිලි ද ඇතුලත් විය.

විෂය පථය වෙනස් කිරීම, කොවිඩ් 19 ලෝක වසංගත තත්ත්වය හා ඒ අදාලව රජය විසින් පණවන ලද රීති හා රෙගුලාසි, 2020 වර්ෂය තුළදී රජය විසින් පණවන ලද ආනයන සීමාවන් හේතුකොට ගෙන සිදු වූ ප්‍රතිසම්පාදන ප්‍රමාද වීම් හා දැනට බල පවත්වමින් තිබෙන විදේශ මුදල් ගැටළුව හා ඇණවුම් වල පිරිවැය වෙනස් වීම් අවසන් කිරීමේදී ඇති වූ ප්‍රමාදයන් ද හේතුකොට ගෙන ව්‍යාපෘතියේ වැඩ කටයුතු ප්‍රමාද විය. තව දුරටත් විෂය පථයේ සිදු වූ වෙනස් කම් හේතුකොට ගෙන සිදු වූ වෙනස් කම් යටතේ වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා (ආසන්න වශයෙන් රුපියල් මිලියන 379 ක) අමතර අරමුදල් අවශ්‍ය විය.

2021 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබි භෞතික ප්‍රගතිය සියයට 64.7 ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය සියයට 61.4 (මිලියන 2758.3) ක් විය.

ඇ. ගලගෙදර මාවතගම ජල සම්පාදන ව්‍යාපෘතිය

ගලගෙදර මාවතගම ජල සම්පාදන ව්‍යාපෘතිය පිහිටුවනු ලැබ ඇත්තේ වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටියා වූ මාවතගම හා මල්ලවපිටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ වේ. මෙම ව්‍යාපෘතිය සැලැසුම් කරනු ලැබ ඇත්තේ මෙම ව්‍යාපෘතිය හරහා ග්‍රාම නිලධාරී වසම් 29 ක සංඛ්‍යාවක් ආවරණය කරමින් ඒ තුළ ජීවත් වන ආසන්න වශයෙන් 33000 ක පමණ ජන සංඛ්‍යාවක් වෙත සේවා සම්පාදනය කර දීම සඳහා වේ.

මෙම ව්‍යාපෘතිය කිලෝ මීටර 27 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ඉහළ ඝණත්වයේ පොලි එතිලින් / මෘදු යකඩ ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගයක් එලීම, ජලය ඝණ මීටර 1000 ක ධාරිතාවයකින් යුත් ජල කුළුණක් ඉදි කිරීම, මාවතගම හා පිලැස්ස තුළ ජලය ඝණ මීටර 450 ක ධාරිතාවයකින් යුක්ත වූ බිම් ජලාශයක් ඉදි කිරීම, කිලෝ මීටර 146 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ජලය බෙදා හැරීමේ පද්ධතියක් ඉදි කිරීම, රසායනික ගොඩනැගිලි 02 ක සංඛ්‍යාවක් ඉදි කිරීම, සහ තුලණය කිරීමේ ජලාශයක් ඉදි කිරීම හා කාර්ය භාර නිලධාරී කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම යන අංගයන්ගෙන් සමන්විත වේ. ජල ප්‍රභවය වන්නේ මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයට අනුයුක්ත කටුගස්තොට ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වේ. ගලගෙදර ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙත දිනකට ජලය ඝණ මීටර 2000 ක පරිමාවක් සම්පාදනය කර දීමට හා මාවතගම ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙත දිනකට ජලය ඝණ මීටර 3000 ක පරිමාවක් සම්පාදනය කර දීමට ව්‍යාපෘතිය අපේක්ෂා කරයි.

වර්ෂ 2019 මැයි මස 31 වැනි දිනය වන විට ව්‍යාපෘතිය සෑහෙන දුරකට සම්පූර්ණයෙන් නිම කරනු ලැබ තිබිණි. ඉතිරි වී ඇති වැඩ

කටයුතු වශයෙන් හඳුනා ගනු ලැබ තිබී දීර්ඝ කිරීම් දෙකක් හා ස්ථාන භාර නිලධාරී කාර්යාලයේ අවසන් අදියර දෝෂ සඳහා වග කිව යුතු කාලය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි. ව්‍යාපෘති කාර්ය සාධනය සම්පූර්ණයෙන් නිම කිරීම පිළිබඳ සහතිකය 2020.08.07 වැනි දින නිකුත් කරන ලදි. ව්‍යාපෘතියට අදාල සියළුම වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරන ලද අතර අවසන් බිල් පත ද පියවන ලදි.

ව්‍යාපෘතිය 2022.01.06 වැනි දින සේවයේ යොදවන ලද අතර දැනට නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 700 ක සංඛ්‍යාවක් දෙනු ලැබ තිබේ. මීට අමතර වශයෙන් මාවතගම ආයෝජන මණ්ඩලය වෙත ජලය ඉණ මීටර 500 ක තොග සැපැයුමක් ද කරනු ලැබේ.

ඈ. ගාල්ල පොකුරු ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය වැලිගම, ගෝනාපීනුවල හා දික්කුඹුර ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අයත් ජලය බෙදා හැරීමේ ජාලය වැඩි දියුණු කිරීමට අදාල වැඩ කටයුතු වලින් සමන්විත වේ. සංශෝධනය කරන ලද ව්‍යාපෘති පිරිවැය ලංකා රුපියල් මිලියන 759 ක් වන අතර ඒ සඳහා අරමුදල් සපයා දෙනු ලබන්නේ මහජන බැංකුව විසින් රුපියල් මිලියන 432.5 ක් හා ලංකා බැංකුව විසින් ලංකා රුපියල් මිලියන 326.5 ක් වශයෙන් වේ.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධානතම අංගයන් වන්නේ කිලෝ මීටර 85.05 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ පීවීසී / මෘදු යකඩ නල සම්පාදනය කිරීම, මෘදු යකඩ හා වාත්තු යකඩ වෑල්ව හා උපාංගයන් සම්පාදනය කිරීම, කිලෝ මීටර 90.87 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ජලය බෙදා හැරීමේ ප්‍රධාන නල මාර්ගය සම්පාදනය කිරීම, කිලෝ මීටර 0.88 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ සම්ප්‍රේෂණ හා පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ග සම්පාදනය කිරීම යන අංගයන් වේ. ව්‍යාපෘතියේ අනිකුත් අංගයන් වන්නේ ඌරගස්මන්හන්දිය වෙත පෝම්ප සම්පාදනය කර දීම, හික්කඩුව, කොවුල්හේන, වක්වැල්ල හා වැලිගම ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙත පෝම්ප සම්පාදනය කොට ස්ථාපිත කර දීම, ජලය ඉණ මීටර 225 ක ධාරිතාවයකින් යුක්ත වූ භූමි ජලාශය ඉදි කිරීම, වැලිගම භාර කරුගේ නිල නිවාසය හා පොම්පාගාරය ඉදි කිරීම ද වන්නේය. මෙම ව්‍යාපෘතිය විසින් ග්‍රාම නිලධාරී වසම් 47 ක සංඛ්‍යාවක් සම්පූර්ණ වශයෙන් ආවරණය කරනු ලබයි. සම්පාදනය කර දෙනු ලැබීමට අපේක්ෂා කරනු ලබන ජල සම්පාදන සේවා සම්බන්ධතා සංඛ්‍යාව 11395 ක් වන අතර ඒ අතුරින් සම්බන්ධතාවයන් 1550 ක සංඛ්‍යාවක් දැනටමත් ලබා දෙනු ලැබ ඇත. ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2017 වර්ෂයේ මාර්තු මස මැදදී ආරම්භ කරන ලද අතර වර්ෂ 2021 සැප්තැම්බර් මස අවසානය වන විට එහි වැඩ කටයුතු සෑහෙන දුරකට සම්පූර්ණයෙන් නිම කරනු ලැබ තිබිණි. දැනට අදාල වැඩ මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දෙනු ලබමින් පවතී.

ඉ. ගිරිදර ජල සම්පාදන ව්‍යාපෘතිය.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වැය වන පිරිවැය ලංකා රුපියල් මිලියන 513.28 ක් වන අතර එය කිලෝ මීටර 100 ක මුළු දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල මාර්ග එලීම, විෂ්කම්භය මිලි මීටර 63 සිට 225 දක්වා වූ පීවීසී නල එලීම හා මිලි මීටර 250 සිට 350 දක්වා වූ මෘදු යකඩ නල එලීම ආදී අංගයන්ගෙන් සමන්විත වේ.

මෙම ව්‍යාපෘතිය මගින් දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 18 ක සංඛ්‍යාවක් ආවරණය කරනු ලබනවා ඇත. ජලය ලබා ගැනීම සඳහා ලබුගම - කලටුවාව අංක ඩී 20 දරන සම්ප්‍රේෂණ නල මාර්ගය හංවැල්ල පාලම අසලදී සම්බන්ධ කර ගනිමින් එ මගින් ලබා ගනු ලබන ජලය පාලමේ දැනට පවත්නා ප්‍රනාලය තුළින් මිලි මීටර 350 ක විෂ්කම්භයකින් යුත් මෘදු යකඩ නල මාර්ගයක් වලා ඒ ඔස්සේ හංවැල්ල පාලම මතින් කැළණි ගඟ හරහා ගෙන යනු ලබනවා ඇත.

මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමෙන් පසුව ගෘහස්ත ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 4500 ත සංඛ්‍යාවක් හා වාණිජ ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 500 ක සංඛ්‍යාවක් සම්පාදනය කර දීමේ පහසුකම් උදා වනු ඇත.

ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති වත්මන් භෞතික හා මූල්‍ය ප්‍රගති ප්‍රතිශතයන් පිළිවෙලින් සියයට 52.0 ක් හා සියයට 38.0 ක් වේ. ව්‍යාපෘතියට අදාල වැඩ කටයුතු අඛණ්ඩ ලෙස ක්‍රියාත්මක කරනු ලබමින් පවතින නමුත් කොවිඩ් 19 වසංගත තත්ත්වය හා අදාල අවාසි සහගත තත්ත්වයන් හා කොන්ත්‍රාත් කරුගේ මූල්‍ය කළමනාකරණයේ දුර්වල තාවයන් නිසා ව්‍යාපෘතියේ වැඩ කටයුතු ප්‍රමාද විය.

ඊ. විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතිය (බෙදා හැරීම)

විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතිය ස්ථාපිත කරනු ලැබ ඇත්තේ සබරගමුව පලාත තුළ පිහිටා ඇති රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ වන්නේය. මෙම ව්‍යාපෘතිය සැලැසුම් කරනු ලැබ ඇත්තේ මෙම ව්‍යාපෘතිය මගින් ග්‍රාම නිලධාරී වසම් 24 ක සංඛ්‍යාවක් ආවරණය කරමින් ඒවා තුළ වාසය කරනු ලබන ආසන්න වශයෙන් 35000 ක් පමණ වන ජන සංඛ්‍යාවක් වෙත සේවා සම්පාදනය කර දීම සඳහා වන්නේය. ව්‍යාපෘතියේ අංගයන් සමන්විත වන්නේ ජලය බෙදා හැරීමේ ජාලය වශයෙන් කිලෝ මීටර 178 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ඉහළ ඉණත්වයේ / ප්ලාස්ටික් නොකල පොලිවිනිල් ක්ලෝරයිඩ් මෘදු යකඩ නල මාර්ග යක් එලීම හා විෂ්කම්භය මිලි මීටර 450 සිට මිලි මීටර 63 දක්වා වූ නල වලින් වේ. රත්නපුර දිස්ත්‍රික්කය තුළ ඇති ගෘහස්තයන් 7000 ක සංඛ්‍යාවක් වෙත ජල සේවා පහසුකම් ලබා දීමට ව්‍යාපෘතිය අපේක්ෂා කරනු ලබයි.

ව්‍යාපෘතියට අදාල වැඩ කටයුතු 2019 වර්ෂයේ ජනවාරි මාසයේ ආරම්භ කරන ලද අතර ව්‍යාපෘතියේ වැඩ සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට මුලින් නියමිතව තිබුනේ වර්ෂ 2020.06.02 වැනි දිනය වන විට වේ. ඒ කෙසේ වුව ද විවිධ හේතූන් හේතුකොට ගෙන ව්‍යාපෘතියේ කාලය 2022 වර්ෂයේ ජුනි 30 වැනි දිනය දක්වා දීර්ඝ කරන ලදි. අවශ්‍ය වූ මෘදු යකඩ ද්‍රව්‍ය සපයා ගැනීමේදී සිදු වූ ප්‍රමාදය හේතුකොට ගෙන ව්‍යාපෘතියේ ප්‍රගතිය බෙහෙවින් ප්‍රමාද විය. රත්නපුරය තුළ නිෂ්පාදනය වන ජල ප්‍රමාණය ප්‍රදේශය තුළ දැනට තිබෙන්නා වූ ජලය සඳහා වූ ඉල්ලුම සපුරා ලීම සඳහා දීර්ඝ කිරීම් සම්පාදනය කර දීම සඳහා ප්‍රමාණවත් වන්නේ නැත. 2021 වර්ෂය අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබී භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 70.0 ක් හා සියයට 38.4 ක් විය.

උ. විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය

විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය ස්ථාන ගත කරනු ලැබ ඇත්තේ මධ්‍යම පලාතේ නැගෙනහිර මායිම තුළ පිහිටි මාතලේ දිස්ත්‍රික්කය තුළ විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇතුලත වන්නේය. මෙම ව්‍යාපෘතිය සැලැසුම් කරනු ලැබ ඇත්තේ ග්‍රාම නිලධාරී වසම් 39 ක් වූ මුළු සංඛ්‍යාව ආවරණය කරමින් ඒ තුළ වාසය කරන්නා වූ ආසන්න වශයෙන් 35000 ක් වූ ජන සංඛ්‍යාවක් වෙත මෙම ජල සම්පාදන ව්‍යාපෘතිය මගින් සේවා සම්පාදනය කර දීම සඳහා වේ. මෙම ව්‍යාපෘතියේ බලය ලත් නියෝජිතය වන්නේ සීමා සහිත සීවිම්වල් එම්ටීඩී ඉදි කිරීම් සමාගම වේ.

මෙම ව්‍යාපෘතියේ විෂය පථය දිනකට ජලය ඉණ මීටර 6000 ක ධාරිතාවයකින් යුක්ත වූ තුළු මුවක් සැලැසුම් කොට ඉදි කිරීම, දිනකට ජලය ඉණ මීටර 5500 ක ධාරිතාවයකින් යුක්ත වූ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම, මීටර 1000 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ප්‍රධාන අමු ජල සම්ප්‍රේෂණ නල මාර්ගය එලීම, කිලෝ මීටර 26 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ප්‍රධාන ප්‍රතිකාරිත ජල සම්ප්‍රේෂණ නල මාර්ගය එලීම, ඉණ මීටර 225 ක ධාරිතාවයකින්

යුක්ත වූ ජල කුළුණු 2 ක සංඛ්‍යාවක් ඉදි කිරීම, කිලෝ මීටර 115 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ජලය බෙදා හැරීමේ ප්‍රධාන පද්ධතිය ඉදි කිරීම හා ස්ථාන භාර නිලධාරී කාර්යාලය ඉදි කිරීම හා නිල නිවාසයන් 3 ක සංඛ්‍යාවක් ඉදි කිරීම ද යන අංගයන්ගෙන් සමන්විත වේ.

සීමා සහිත සීවම්වල් එම්ටීඩී ඉදි කිරීම් සමාගම හට මුහුණ පෑමට සිදු වූ මූල්‍ය ගැටළු හේතුකොට ගෙන 2020 වර්ෂයේ මුල් හත් මාසය තුළ කාර්ය සාධනය ඉතා දුර්වල තත්ත්වයක පැවැතිනි. ඒ කෙසේ වුව ද කොන්ත්‍රාත් කරු විසින් ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු 2019 වර්ෂයේ අගෝස්තු මාසය තුළදී නැවත ආරම්භ කරන ලද අතර ඉදි කිරීම් කටයුතු 2022 වර්ෂයේ ඔක්තෝබර් මාසය වන විට සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට නියමිතව ඇත.

ව්‍යාපෘතිය විසින් 2021 වර්ෂයේ අවසානය වන විට සාක්ෂාත් කර ගනු ලැබ තිබී භෞතික හා මූලන ප්‍රගතිය පිළිවෙලින් සියයට 68.0 ක් හා සියයට 43.3 ක් විය.

ඌ. මැදිරිගිරිය බෙදා හැරීම් 11 වැනි අදියර

මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ක්‍රියාත්මක වන ග්‍රාම නිලධාරී වසම් 31 ක සංඛ්‍යාවක් වෙත කිලෝ මීටර 230 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ප්ලාස්ටික් නොකළ පොලි විනිල් ක්ලෝරයිඩ් නල සපයා වැලීම මෙම ව්‍යාපෘතිය තුළට ඇතුලත් වේ. ව්‍යාපෘතියේ විෂය පථය තුළට පැරණි නගර කුළුණෙහි ප්‍රධාන ජලය බෙදා හැරීමේ නල මාර්ගය වෙනුවෙන් හා නව නගර / පැරැණි නගර කුළුණෙහි අභ්‍යන්තර ජලය ජබදා හැරීම් ප්‍රධාන නල මාර්ගය වෙනුවෙන් ප්ලාස්ටික් නොකළ පොලි විනිල් ක්ලෝරයිඩ් නල හා මෘදු යකඩ නල හා සවි කිරීම් හා විශේෂ උපාංගයන් සපයා වැලීම ද, කවුඩුල්ල ඔය හරහා නල පාලමක් ඉදි කිරීම ද, නිල නිවාසයන් සැලැසුම් කොට ඉදි කිරීම හා ජල සම්පාදන සේවා සම්පාදන සම්බන්ධතාවයන් 5000 ක සංඛ්‍යාවක් සපයා දීමද ඇතුලත් වේ.

සියළුම සැපයුම් අයිතමයන් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. මුල් විෂය පථය (කිලෝ මීටර 230) හා අතිරේක මිලි මීටර 63 විෂ්කම්භයකින් යුත් නල වැලීමේ කටයුතු (VO 25) (කිලෝ මීටර් 141) සම්පූර්ණයෙන් නිම කරන ලදුව මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දෙනු ලැබ ඇත. අතිරේක මිලි මීටර 63 විෂ්කම්භයකින් යුත් නල කිලෝ මීටර් 42 ක දුර ප්‍රමාණයකට වැලීමේ කටයුතු (VO 25) සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. අතර ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 5000 ක සංඛ්‍යාව අතුරින් සම්බන්ධතාවයන් 3495 ක සංඛ්‍යාවක් දෙනු ලැබ ඇත.

ව්‍යාපෘතියට අදාල සියළුම භෞතික ඉදි කිරීම් කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති මූල්‍ය ප්‍රගතිය සියයට 90.8 ක් විය.

ඔ. කොළඹ දිස්ත්‍රික්කයෙන් නැගෙනහිර පිහිටි නගර ජල සම්පාදන ව්‍යාපෘතිය

කොළඹ දිස්ත්‍රික්කයෙන් නැගෙනහිර පිහිටි නගර ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර කොටස තුළ ජීවත් වන ජනතාව වෙත සුරක්ෂිත නල මාර්ග පානීය ජලය සම්පාදනය කර දීම සඳහා වේ. ව්‍යාපෘති ප්‍රදේශය තුළට සීතාවක, කඩුවෙල, පාදුක්ක, හෝමාගම හා හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ ක්‍රියාත්මක වන ග්‍රාම නිලධාරී වසම් 118 ක සංඛ්‍යාවක් ඇතුලත් වේ.

කොළඹ දිස්ත්‍රික්කයෙන් නැගෙනහිර පිහිටි නගර ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් හඳුනා ගනු ලැබ ඇති ජල ප්‍රභවයන් වන්නේ ලබුගම හා කලටුවාව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් වේ. 2040 වර්ෂය වන විට මෙම ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභ ලබනු ඇති බවට ඇස්තමේන්තු කරනු ලැබ ඇති ජන ගහණ සංඛ්‍යාව 373304 ක් වන අතර සේවා සැපැයීම සිදු කරනු ලබන්නේ ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 91000 කට අධික සංඛ්‍යාවක් ඔස්සේය.

මෙම ව්‍යාපෘතිය පැකේජ 03 කින් සමන්විත වන අතර ඒවායේ වත්මන් තත්ත්වය පහත සඳහන් පරිදි වන්නේය.

1 වැනි පැකේජය : ප්‍රවාහ මණු සම්බන්ධතාවයන් 7 ක සංඛ්‍යාවක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. 2021 වර්ෂයේ අවසානය වන විට සාක්ෂාත් කර ගනු ලැබ තිබී භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 100.0 ක් හා සියයට 85.0 ක් විය.

11 වැනි පැකේජය : සම්ප්‍රේෂණ හා ජලය බෙදා හැරීමේ නල සපයා වැලීම සියයට 100 ක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ස්ථානය භාර නිලධාරී කාර්යාලයේ ඉදි කිරීම් කටයුතු සියයට 100 ක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. භූමි ජලාශය ඉදි කිරීමේ කටයුතු සිදු කරගෙන යමින් තිබෙන අතර සියයට 93.36 ක් නිම කරනු ලැබ ඇත. භූමි ජලාශ්‍ය ඉදි කිරීම හා අදාල සියළුම කොන්ක්‍රීට් වැඩ සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ජලයේ තද ගති පරීක්ෂණය, අංගන නල වැලීමේ කටයුතු හා භූ දර්ශන නිමැවුම් කටයුතු සම්පූර්ණ කළ යුතුව ඇත. 2021 වර්ෂයේ අවසානය වන විට සාක්ෂාත් කර ගෙන තිබී භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 92.6 ක් හා සියයට 57.9 ක් විය.

111 වැනි පැකේජය : ප්‍රවාහ මනු සවි කිරීම් 26 ක සංඛ්‍යාවක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. 2021 වර්ෂයේ අවසානය වන විට සාක්ෂාත් කර ගෙන තිබී භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 100 ක් හා සියයට 74.1 ක් විය.

ඕ. දේශීය බැංකු විසින් අරමුදල් සපයන ලද රුපියල් බිලියන 3.5 ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ (ඌව, දකුණු පලාත, උතුරු පලාත, බටහිර මධ්‍යම, බටහිර උතුරු, බටහිර දකුණු, නැගෙනහිර, වයඹ, උතුරු මැද, මධ්‍යම පලාත හා සබරගමුව පලාත යන) කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් 11 තුළ ජල සම්පාදන සේවා සම්බන්ධතා සංඛ්‍යාව දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතින ජලය බෙදා හැරීමේ පද්ධතීන් වෙත අවශ්‍ය දීර්ඝ කිරීම් හා හිඩැස් පිරවීම් ලබා දීම මගින් වැඩිදියුණු කිරීම වේ. ව්‍යාපෘතිය වෙනුවෙන් ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය ලංකා රුපියල් බිලියන 3.5 ක මුදල් ප්‍රමාණයක් වන අතර ව්‍යාපෘතිය අවසානයේදී අපේක්ෂා කරනු ලබන ජල සම්පාදන සේවා සම්බන්ධතා සංඛ්‍යාව 33250 ක් වේ. මේ අතුරින් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් 10 ක් තුළ දීර්ඝ කිරීමේ හා හිඩැස් පිරවීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර නැගෙනහිර පලාතේ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ වැඩ කටයුතු දැනටට සිදු කර ගෙන යමින් පවතී. ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2014 වර්ෂයේ ආරම්භ කරන ලද අතර 2021 වර්ෂය දක්වා දීර්ඝ කරනු ලැබ ඇත. 2021 වර්ෂයේ දෙසැම්බර් මාසය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය සියයට 98.8 ක් වන අතර මූල්‍ය ප්‍රගතිය සියයට 74.6 ක් විය.

පෙළ ගස්වනු ලැබ ඇති ව්‍යාපෘතීන්

(සියයට 100 ක්) වෙත පවිත්‍ර හා සුරක්ෂිත පානීය ජලය හා නලමාර්ගික ජලය ලබා ගැනීමේ හැකියාව සම්පාදනය කර දීමේ රජයේ අභිලාෂය මල් ඵල ගැන්වීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය කැප වීමෙන් යුතුව හා සූදානමින් යුතුව ඇත. රජයේ දැක්ව වූ ''සෞභාග්‍යයේ දැක්ම'' තුළ පානීය ජලය සම්බන්ධයෙන් දෙනු ලැබ ඇති පොරොන්දුව ඉටු කිරීම ඉලක්ක කර ගනිමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිය 2020 සිට 2025 දක්වා වූ සංයුක්ත සැලැසුම සංවර්ධනය කොට 2020 නොවැම්බර් 18 වැනි දින දියත් කරන ලදි. මෙම ලේඛනය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වත්මන් තත්ත්වය හා අංක 1 සිට අංක 6 දක්වා වූ සංස්ථානික සැලැසුම් සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගත් මණ්ඩලයේ සැලැසුම් කෙටියෙන් විස්තර කරයි. රට තුළ ජල සම්පාදන හා සනීපාරක්ෂණ ආවරණය වර්ධනය කිරීම ඉලක්ක කර ගත් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා 2021 වර්ෂය සඳහා වූ ''සැමට ජලය'' අය වැය රේඛාව යටතේ ලංකා රුපියල් බිලියන 29.5 ක් වූ අය වැය වෙන් කිරීමක් සිදු කරනු ලැබ ඇත.

ඉහතින් දක්වනු ලැබ ඇති කරුණු සමග සංස්ථානික ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම පසු විපරම් කිරීම හා සංයුක්ත සැලැසුම තුළ පනවනු ලැබ ඇති ඉලක්කයන් සපුරා ගැනීම අරමුණු කර ගනිමින් පහත සඳහන් ක්‍රියාකාරකම් වල යෙදෙමින් අදාල කලාපීය කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත අවශ්‍ය සහාය ලබා දීම ප්‍රතිපත්ති හා ක්‍රම සම්පාදන අංශය හා ක්‍රමෝපාය අංශය යන අංශයන්ගේ ප්‍රධානතම කර්තව්‍යයන් බවට පත් වී ඇත.

- සංයුක්ත සැලැසුම තුළ අන්තර්ගත වන සංශෝධිත ව්‍යාපෘති ලැයිස්තුව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම
- ව්‍යාපෘති 47 ක සංඛ්‍යාවක් වෙනුවෙන් ව්‍යාපෘති අගැයුම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම
- එකී ව්‍යාපෘතීන් වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතීන් ලබා ගැනීම.
- ඉඩම් අනුමැතීන්ගේ හා ජල ප්‍රභව අනුමැතීන්ගේ ප්‍රගතිය පසුවිපරම් කිරීම
- තොරතුරු තාක්ෂණ අංශයේ සහායෝගය ලබා ගනිමින් ව්‍යාපෘති හා ප්‍රතිසම්පාදන ක්‍රියාවලිය පසුවිපරම් කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම
- විවිධ වර්ගයන් යටතේ වූ භාවිතා කරන්නන් (ඉංජිනේරුවන්, ගණකාධිකාරී වරුන් හා ඉංජිනේරු සහායකයින් ආදීන්) වෙනුවෙන් පුහුණු කිරීම් වැඩ සටහන් කිහිපයක් පැවැත්වීම.
- මුදල් අමාත්‍යාංශය හා ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වනු ලබන විවිධ දෙපාර්තමේන්තු වෙත ව්‍යාපෘති වල ප්‍රගතිය වාර්තා කිරීම

සංයුක්ත සැලැසුම තුළ පනවනු ලැබ ඇති ඉලක්කයන් සපුරා ගැනීම සඳහා 2022 වර්ෂය වෙනුවෙන් අවශ්‍ය අය වැය පිළිබඳ අවශ්‍යතාවයන් පිළියෙල කරන ලද අතර අදාල ක්‍රියාත්මක සැලැසුම් සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගනු ලැබ ඇත.

ක්‍රම සම්පාදනය හා සැලැසුම් කිරීම (ජල සම්පාදන ව්‍යාපෘතීන්)

ක්‍රම සම්පාදන හා සැලසුම්කරණ අංශය විසින් සිය ප්‍රධාන කර්තව්‍යය වශයෙන් සිදු කරනු ලබන්නේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන්, තුළු මුව, ජලය බෙදා හැරීමේ ජාලයන් හා සම්ප්‍රේෂණ නල මාර්ගයන් වෙනුවෙන් සියළුම වර්ගයන්ට අයත් සැලැසුම් පිළියෙල කිරීම හා ඒවාට අදාල මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීම ද වන්නේය. තව දුරටත් ප්‍රමිතිගත ලංසු තැබීමේ ලිපි ලේඛන, සැලැසුම් කිරීමේ හා නඩත්තු කිරීමේ අත් පොත් හා ගාස්තු රේට් ප්‍රමාණ පොත් පිළියෙල කිරීම හා පළ කිරීම ද සිදු කරනු ලබන්නේ එකී අංශය විසින් වේ. ඊට අමතර වශයෙන් සාධ්‍යතා අධ්‍යයනයන් පිළියෙල කිරීම හා සමාලෝචනය කිරීම හා ව්‍යාපෘති අගැයීමේ කමිටුවේ වාර්තාවන් පිළියෙල කිරීම ද මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

ක්‍රම සම්පාදන හා සැලැසුම් කිරීමේ අංශය බටහිර, දකුණු / නැගෙනහිර, උතුරු / මධ්‍යම හා යාන්ත්‍රික හා විද්‍යුත් අංශය යන අංශ භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන් සිවු දෙනා යටතේ ක්‍රියාත්මක වනු ලබන ප්‍රධාන සැලැසුම් අනු බන්ධයන් හතරක සංඛ්‍යාවකින් සමන්විත වේ. ඉන් පසුව විළැඹෙන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් වෙනුවෙන් වූ සැලැසුම් පිළියෙල කිරීමේ වැඩ කටයුතු කරනු ලබන්නේ එකී අනු බන්ධයන් විසින් වේ.

සහකාර සාමාන්‍යාධිකාරී (බටහිර)

මෙහි පහත දැක්වෙන විස්තරාත්මක සැලැසුම් පිළියෙල කිරීම ප්‍රස්තුත වර්ෂය තුළදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බටහිර) ගේ විෂය පාත්‍රතාව යටතේ එකී අනු බන්ධය විසින් සිදු කරන ලදි.

අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පුළුල් කිරීම -

කොළඹ නගරය හා උප නගර තුළ ක්‍රියාත්මක කරන ලද බහුවිධ ආකාරයන්ගෙන් යුත් සංවර්ධන කටයුතු හේතුකොට ගෙන ප්‍රදේශය තුළ පවත්නා ජලය සඳහා වූ ඉල්ලුම ඉතා වේගයෙන් වර්ධනය වී තිබේ. ඒ හේතුකොට ගෙන අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ දිනකට ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 50000 ක ප්‍රමාණයකින් වැඩි කිරීම සඳහා අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සැලැසුම් කරන ලදි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වැය වනු ඇතැයි ඇස්තමේන්තු කරනු ලැබ ඇති පිරිවැය ලංකා රුපියල් මිලියන 2390 ක් වේ.

අවිස්සාවෙල්ලේ නව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය -

අවිස්සාවේල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් දිනකට ජලය ඝණ මීටර 5000 ක ධාරිතාවයකින් යුත් නව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් සැලැසුම් කරන ලද අතර එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වැය වෙතැයි ඇස්තමේන්තු කරනු ලැබ ඇති පිරිවැය ලංකා රුපියල් මිලියන 964 ක මුදල් ප්‍රමාණයක් වේ.

ජුබිලි පද්ධතිය වැඩි දියුණු කිරීම - සම්පාදන කාර්යක්ෂමතාවය වැඩි කිරීම අරමුණු කර ගනිමින් ජුබිලි පද්ධතිය තුළ පහසුකම් වැඩි දියුණු කිරීම යෝජනා කරනු ලැබ ඇත. ඒ අනුව ජලය ඝණ මීටර 6000 ක ධාරිතාවයකින් යුක්ත වූ හා ජලය ඝණ මීටර 10000 ක ධාරිතාවයකින් යුක්ත වූ භූමි ජලාශයන් 2 ක සංඛ්‍යාවක් ඉදි කිරීම ද, පෝම්ප හා විදුලි ජනන යන්ත්‍ර සම්පාදනය කොට ස්ථාපිත කිරීම ද, පොම්පාගාරය, ස්ථානය භාර නිලධාරී කාර්යාලය හා නිල

නිවාස ඉදි කිරීම ද සැලැසුම් කරනු ලැබ ඇති අතර එම ව්‍යාපෘතිය සඳහා වැය වෙතැයි අපේක්ෂා කරනු ලබන මුළු පිරිවැය ලංකා රුපියල් මිලියන 1280 ක් වේ.

මීරිගම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය -

දිනකට ජලය ඝණ මීටර 20000 ක ධාරිතාවයකින් යුක්ත වූ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් හා තුළු මුවක් සැලැසුම් කරන ලද අතර එම ව්‍යාපෘතිය වෙනුවෙන් වැය වෙතැයි ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය ලංකා රුපියල් මිලියන 3926 ක් වේ.

දිවුලපිටියේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය -

දිවුලපිටිය ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් දිනකට ජලය ඝණ මීටර 20000 ක ධාරිතාවයකින් යුක්ත වූ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් හා තුළු මුවක් ඉදි කිරීම සැලැසුම් කරන ලද අතර එම ව්‍යාපෘතිය වෙනුවෙන් වැය වෙතැයි ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය ලංකා රුපියල් මිලියන 3950 ක් වේ.

ප්‍රධාන කාර්යාලය සඳහා නව කාර්යාල ගොඩනැගිල්ල

දැනට තිබෙන්නා වූ ගෘහස්ත ක්‍රීඩා ශාලාව බිඳ හෙල දමා පස් මහල් කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම යෝජනා කරනු ලැබ ඇති අතර ඒ වෙනුවෙන් වන සවිස්තරාත්මක සැලැසුම සකස් කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. එම ව්‍යාපෘතිය වෙනුවෙන් වැය වෙතැයි ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය ලංකා රුපියල් මිලියන 233 ක් වේ.

ඉහත දක්වනු ලැබ ඇති කර්තව්‍යයන්ට අමතර වශයෙන් කළු ගඟ ජල සම්පාදනය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය හා අළුත්ගම, මතුගම හා අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය හා අදාල සැලැසුම් සමාලෝචනය කිරීමේ කටයුතු ද ප්‍රස්තුත වර්ෂය තුළදී සහකාර සාමාන්‍යාධිකාරී (බටහිර) ගේ විෂය පාත්‍රතාවය යටතේ සිදු කරනු ලැබ ඇත.

සහකාර සාමාන්‍යාධිකාරී (උතුර හා උතුරු මැද පලාත්)

සහකාර සාමාන්‍යාධිකාරී (උතුරු හා උතුරු මැද පලාත්) භාර සහකාර සාමාන්‍යාධිකාරී වරයාගේ අංශයේ විෂය පාත්‍රතාව යටතේ පහත සඳහන් සවිස්තරාත්මක සැලැසුම් කිරීමේ වැඩ කටයුතු ප්‍රස්තුත වර්ෂය තුළදී සිදු කරනු ලැබ ඇත.

ගිරිඋල්ල - දඹදෙනිය හා නාරම්මල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

ගිරිඋල්ල, දඹදෙනිය හා නාරම්මල යන ප්‍රදේශයන් වෙත ජල සම්පාදන සේවා සම්පාදනය කර දීම සඳහා දිනකට ජලය ඝණ මීටර 20000 ක ධාරිතාවයකින් යුක්ත වූ නව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් සැලැසුම් කර දෙන ලද්දේය. එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය කොන්ත්‍රාත් කරුගේ මූල්‍යකරණය යටතේ ලංකා රුපියල් මිලියන 4, 700 ක මුදල් ප්‍රමාණයක් විය.

කුරුණෑගල අදියර 1 ට උතුරු දෙසින් වූ නගර

ආසන්න වශයෙන් කිලෝ මීටර 85 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ප්‍රතිකාරිත ජල සම්ප්‍රේෂණ මාර්ගයක් කටුගස්තොට ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ සිට කුරුණෑගල ප්‍රදේශය දක්වා ඉදි කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද අතර 1 වැනි අදියර වෙනුවෙන් ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය ලංකා රුපියල් බිලියන 40 ක් විය.

කටුපොත / බමුණාකොටුව / පඬුවස්නුවර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 1 -

මෙම ව්‍යාපෘතියේ 1 වැනි පැකේජය වන්නේ ආසන්න වශයෙන් කොන්ත්‍රාත් කරුගේ මූල්‍ය සම්පාදනය යටතේ ලංකා රුපියල් මිලියන 5, 200 ක පිරිවැයක් වැය කරමින් දිනකට ජලය ඝණ මීටර 20000 ක ධාරිතාවයකින් යුක්ත වූ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදිකිරීම වේ.

බිංගිරිය / උඩුබද්දාව හා මාකඳුර / පන්නල / කුළියාපිටිය ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර අංක 1

මෙම ව්‍යාපෘතියේ 1 වැනි පැකේජය වන්නේ කොන්ත්‍රාත් කරුගේ මූල්‍ය සම්පාදනය යටතේ ලංකා රුපියල් මිලියන 5, 000 ක ඇස්තමේන්තු කරන ලද පිරිවැයක් වැය කරමින් දිනකට ජලය ඝණ මීටර 40000 ක ධාරිතාවයකින් යුක්ත වූ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම වේ.

දන්කොටුව ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර අංක 1

මෙම ව්‍යාපෘතියේ 1 වැනි පැකේජය වන්නේ කොන්ත්‍රාත් කරුගේ මූල්‍ය සම්පාදනය යටතේ ආසන්න වශයෙන් ලංකා රුපියල් මිලියන 4, 100 ක ඇස්තමේන්තු කරන ලද පිරිවැයක් වැය කරමින් මා වැඩ (headworks) කිරීම වේ.

දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය

මේ ව්‍යාපෘතිය යටතේ නාගොල්ලාගම හා මහව නව කලාපය ආවරණය කරමින් ජලය බෙදා හැරීමේ පද්ධතිය සැලැසුම් කරන ලදි.

මහනුවර නැගෙනහිර ජල සම්පාදන ව්‍යාපෘතිය

කටුගස්තොට දැනට ක්‍රියාත්මක වෙමින් තිබෙන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පරිශ්‍රය තුළ ජල ප්‍රතිකාරක ව්‍යුහයන් ඉහළ ඉහළ ඉහළ

හසලක ජල සම්පාදන ව්‍යාපෘතිය -

ගිල්වන ලද වේල්ලක් ඇතුලත් තුළු මුව ළිඳක් සහිතව දිනකට ජලය ඝණ මීටර 7500 ක ධාරිතාවයකින් යුක්ත වූ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් මහවැලි ගඟ තුළ ඉදි කිරීම සැලැසුම් කරන ලද අතර එය ඉදි කිරීම සඳහා ආසන්න වශයෙන් ලංකා රුපියල් මිලියන 1, 900 ක පිරිවැයක් වැය වනු ඇත.

පුපුරැස්ස ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය -

ගිල්වන ලද වේල්ලක් ඇතුලත් තුළු මුව ළිඳක් සහිතව දිනකට ජලය ඝණ මීටර 7500 ක ධාරිතාවයකින් යුක්ත වූ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම සැලැසුම් කරන ලද අතර එය ඉදි කිරීම සඳහා ඇස්තමේන්තු කරන ලද පිරිවැය ලංකා රුපියල් මිලියන 2,100 ක් වන්නේය.

අටබාගේ ජල සම්පාදන ව්‍යාපෘතිය -

දිනකට ජලය ඝණ මීටර 5000 ක ධාරිතාවයකින් යුක්ත වූ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම සැලැසුම් කරන ලද අතර ඒ සඳහා ආසන්න වශයෙන් ලංකා රුපියල් මිලියන 1,750 ක පිරිවැයක් වැය වනු ඇතැයි ඇස්තමේන්තු කරනු ලැබ ඇත.

සහකාර සාමාන්‍යාධිකාරී (දකුණු / නැගෙනහිර)

ප්‍රස්තුත වර්ෂය තුළදී (දකුණු / නැගෙනහිර) අංශය භාර සහකාර සාමාන්‍යාධිකාරිවරයාගේ විෂය පාත්‍රතාව යටතේ පහත සඳහන් කරනු ලැබ ඇති සැලැසුම් වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

ගාල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය -

වාතනයන්, තහඩු තැන්පතු (plate settlers), පෙරණයන්, ඝණ මීටර 5000 ක ධාරිතාවයකින් යුක්ත වූ පිරිසිදු ජල දෙණක්, ගොහොදු මඩ සම්බන්ධයෙන් කටයුතු කරන පද්ධතියක්, රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා වූ කුටියක්, ක්ලෝරිනීකරණ කුටියක් සහ වක්වැල්ලේ සිට බටුවන්තුඩාව දක්වා හා මහගොඩ සම්බන්ධතාවය දක්වා දිවෙන ප්‍රතිකාරිත ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගයක් යන අංගයන්ගෙන් සමන්විත දිනකට ජලය ඝණ මීටර 50000 ක ධාරිතාවයකින් යුක්ත වූ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් වක්වැල්ලේ ඉදි කිරීම හා සම්බන්ධ සැලැසුම් හා ප්‍රතිසම්පාදන ලිපි ලේඛන පිළියෙල කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ප්‍රතිසම්පාදන ක්‍රියාවලිය දැනට සිදු කරගෙන යනු ලබමින් පවතී.

ඇහැලියගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය -

පැකේජ අංක 1 - තුළු මුව, වාතනයක්, තහඩු තැන්පතු (plate settlers), පෙරණයන්, ඝණ මීටර 1600 ක ධාරිතාවයකින් යුක්ත වූ පිරිසිදු ජල දෙණක්, ගොහොදු මඩ සම්බන්ධයෙන් කටයුතු කරන පද්ධතියක්, රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා වූ කුටියක්, ක්ලෝරිනීකරණ කුටියක් යන අංගයන්ගෙන් සමන්විත දිනකට ජලය ඝණ මීටර 15000 ක ධාරිතාවයකින් යුක්ත වූ නව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඇහැලියගොඩ ඉදි කිරීම අංක 1 දරන පැකේජය තුළට ඇතුලත් වන අතර ඒ හා අදාල සැලැසුම් පිළියෙල කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

පැකේජ අංක 2 - කිලෝ මීටර 86 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ජලය බෙදා හැරීමේ පද්ධතිය හා කිලෝ මීටර 15. 6 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය සම්පාදනය කොට අවසන් වෙනුවෙන් වූ සැලැසුම් හා රූප සටහන් පිළියෙල කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ප්‍රමාණ පත්‍ර පිළියෙල කිරීමේ කටයුතු දැනට සිදු කරගෙන යමින් පවතී.

බණ්ඩාරවෙල ජල සම්පාදන යෝජනා ක්‍රමය -

තුළු මුව, වාතනය, තහඩු තැන්පතු (plate settlers), පෙරණයන්, ජලය ඝණ මීටර 2000 ක ධාරිතාවයකින් යුක්ත වූ පවිත්‍ර ජල දෙණ, ගොහොදු මඩ සම්බන්ධයෙන් කටයුතු කරන පද්ධතියක්, රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා වූ කුටියක්, ක්ලෝරිනීකරණ කුටියක් යන අංගයන්ගෙන් සමන්විත දිනකට ජලය ඝණ මීටර 20000 ක ධාරිතාවයකින් යුක්ත වූ නව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් බණ්ඩාරවෙල ඉදි කිරීම වෙනුවෙන් වූ සැලැසුම් හා ප්‍රතිසම්පාදන ලිපි ලේඛන පිළියෙල කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ප්‍රතිසම්පාදන ක්‍රියාවලිය දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

ගෝමරන්කඩවල ජල සම්පාදන යෝජනා ක්‍රමය -

වාතනයක්, DAF එකක් , පෙරණයක්, GAC පෙරණයක්, ජලය ඝණ මීටර 2000 ක ධාරිතාවයකින් යුක්ත වූ පවිත්‍ර ජල දෙණ, ගොහොදු මඩ සම්බන්ධයෙන් කටයුතු කරන පද්ධතියක්, රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා වූ කුටියක් හා ක්ලෝරිනීකරණ කුටියක් යන අංගයන්ගෙන් සමන්විත වූ දිනකට ජලය ඝණ මීටර 20000 ක ධාරිතාවයකින් යුක්ත වූ නව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ගෝමරන්කඩවල ඉදි කිරීම වෙනුවෙන් වූ සැලැසුම් හා ප්‍රතිසම්පාදන ලිපි ලේඛන පිළියෙල කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

බද්දේගම ජල සම්පාදන යෝජනා ක්‍රමය -

තුළු මුව, වාතනය, තහඩු තැන්පතු (plate settlers), පෙරණයන්, ජලය ඝණ මීටර 3000 ක ධාරිතාවයකින් යුක්ත වූ පවිත්‍ර ජල දෙණ, ගොහොදු මඩ සම්බන්ධයෙන් කටයුතු කරන පද්ධතියක්, රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා වූ කුටියක් හා ක්ලෝරිනීකරණ කුටියක් යන අංගයන්ගෙන් සමන්විත දිනකට ජලය ඝණ මීටර 30000 ක ධාරිතාවයකින් යුක්ත වූ නව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් බද්දේගම ඉදි කිරීම වෙනුවෙන් වූ සැලැසුම් හා ප්‍රතිසම්පාදන ලිපි ලේඛන පිළියෙල කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

වාලච්චේනෙයි ජල සම්පාදන යෝජනා ක්‍රමය -

වාතනයක්, ෆ්ත එකක් , පෙරණයක්, GAC පෙරණයක්, ජලය ඝණ මීටර 2000 ක ධාරිතාවයකින් යුක්ත වූ පවිත්‍ර ජල දෙණ, ගොහොදු මඩ සම්බන්ධයෙන් කටයුතු කරන පද්ධතියක්, රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා වූ කුටියක් හා ක්ලෝරිනීකරණ කුටියක් යන අංගයන්ගෙන් සමන්විත වූ දිනකට ජලය ඝණ මීටර 20000 ක ධාරිතාවයකින් යුක්ත වූ නව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් වාලච්චේනෙයිහි ඉදි කිරීම වෙනුවෙන් වූ විස්තරාත්මක සැලැසුම් හා රූප සටහන් පිළියෙල කිරීමේ කටයුතු දැනට සිදු කරගෙන යනු ලබමින් පවතී.

ලුනුගම්වෙහෙර ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය -

දිනකට ජලය ඝණ මීටර 56000 ක ධාරිතාවයකින් යුක්ත වූ තුළු මුවක්, වාතනය, තහඩු තැන්පතු (plate settlers), පෙරණයන්, GAC පෙරණයක්, ජලය ඝණ මීටර 2000 ක ධාරිතාවයකින් යුක්ත වූ පවිත්‍ර ජල දෙණ, ගොහොදු මඩ සම්බන්ධයෙන් කටයුතු කරන පද්ධතියක්, රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා වූ කුටියක්

හා ක්ලෝරිනීකරණ කුටියක්, ජල කුළුණු හා භූමි ජලාශයන් යන අංගයන්ගෙන් සමන්විත වූ දිනකට ජලය ඝණ මීටර 25000 ක ධාරිතාවයකින් යුක්ත වූ නව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම වෙනුවෙන් වූ ප්‍රතිසම්පාදන ලිපි ලේඛන පිළියෙල කිරීමේ වැඩ කටයුතු දැනට සිදු කර ගෙන යනු ලබමින් පවතී.

සහකාර සාමාන්‍යාධිකාරී (විදුලි හා යාන්ත්‍රික)

ඇහැලියගොඩ, විසල් ගාල්ල, කටුපොත, අඹතලේ, බිංගිරිය, දන්කොටුව, මීරිගම, අවිස්සාවේල්ල, බණ්ඩාරවෙල, හසලක, ලුනුගම්වෙහෙර, ගෝමරන්කඩවල, පළුගස්වැව, බද්දේගම, කිලිනොච්චි, ගල්නෑව හා ගෝමරන්කඩවල ජල සම්පාදන යෝජනා ක්‍රමයන් හා ගොතටුව හුවන පොම්පාගාරය හා ජුබිලි වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් යාන්ත්‍රික හා විද්‍යුත් කටයුතු භාර සහකාර සාමාන්‍යාධිකාරී වරයාගේ අංශයේ විෂය පාත්‍රතාව යටතේ යාන්ත්‍රික, විද්‍යුත් හා ස්වයංක්‍රිය කරණය හා අදාල ජල සම්පාදන කටයුතු සඳහා වූ පහත දක්වනු ලැබ ඇති සවිස්තරාත්මක සැලැසුම් පිළියෙල කරනු ලැබ ඇත. ප්‍රධාන කාර්යාලය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් විද්‍යුත් හා යාන්ත්‍රික වැඩ කටයුතු ක්‍රම සම්පාදනය හා සැලැසුම් සකස් කරනු ලැබීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ඉහතින් දක්වනු ලැබ ඇති වැඩ කටයුතු වලට අමතර වශයෙන් කළු ගඟ ජල සම්පාදනය විස්තාරණය කිරීමේ ව්‍යාපෘතිය හා අදාල සැලැසුම් සමාලෝචනය කිරීමේ වැඩ කටයුතු ද සිදු කරනු ලැබ ඇත. යාන්ත්‍රික හා විද්‍යුත් විෂය පාත්‍රතාව හා සම්බන්ධ උපදේශක සේවාවක් වශයෙන් ලංකා විදුලි බල මණ්ඩලය හා ලංකා විදුලි සමාගම වෙත විදුලි ස්ථාපනයන් සහතික කිරීම සඳහා අවශ්‍ය වරලත් ඉංජිනේරු සහතිකය නිකුත් කිරීම හා යාන්ත්‍රික හා විද්‍යුත් වැඩ කටයුතු වලට අදාල නඩත්තු කිරීම්, පරීක්ෂා කිරීම් හා සැලැසුම් පැතිකඩයන් ආවරණය කරමින් පුහුණු වැඩ සටහන් මෙහෙයවීමේ කාර්යය උදෙසා සම්පත් දායකයින් වෙන් කර දීම වැනි ක්‍රියාකාරකම් ද සිදු කරන ලදි.

සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රලේඛන)

ප්‍රලේඛන විද්‍යා අංශය විසින් ප්‍රලේඛන විද්‍යා වැඩ කටයුතු, සැලැසුම් අත් පොත් හා සම්බන්ධ වැඩ කටයුතු හා ප්‍රමාණ සමීක්ෂණ කටයුතු නම් වූ ප්‍රධාන ක්‍රියාකාරකම් තුන ක්‍රියාත්මක කිරීමෙහි යෙදී සිටිනු ලබයි.

ප්‍රලේඛන විද්‍යා වැඩ කටයුතු -

2021 වර්ෂය තුළදී නව ප්‍රලේඛනයන් 4 ක සංඛ්‍යාවක් පිළියෙල කිරීම හා සම්මත ලංසු තැබීමේ ප්‍රලේඛනයන් 39 ක සංඛ්‍යාවක් සංස්කරණය කිරීම සම්පූර්ණයෙන් නිම කරන ලදි. නිෂ්පාදක ආයතනයන්ගේ පූර්ව සුදුසු කම් සොයා බැලීමේ ක්‍රියාවලිය යටතේ ඉහළ ඝණත්වයෙන් යුත් පොලි එතිලින් නල හා සවි කිරීම් නිෂ්පාදන ආයතනයන් 4 ක සංඛ්‍යාවක් ද, මෘදු යකඩ නල හා සවි කිරීම් නිෂ්පාදන ආයතනයන් 06 ක සංඛ්‍යාවක් හා මෘදු යකඩ වෑල්ව නිෂ්පාදන ආයතනයන් 3 ක සංඛ්‍යාවක් ද අගැයීමට බඳුන් කිරීමේ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ඉහළ ඝණත්වයේ පොලි එතිලින් නල නිෂ්පාදන ආයතනයන් 6 ක සංඛ්‍යාවක් විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නව අයැදුම් පත්‍රයන්, මෘදු යකඩ නල හා සවි කිරීම් නිෂ්පාදන ආයතනයන් 02 ක සංඛ්‍යාවක් විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නව අයැදුම් පත්‍රයන්, සම්බන්ධක හා පලංජි අනුවර්තක නිෂ්පාදන ආයතනයක් විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති එක් නව අයැදුම් පත්‍රයක් හා වෑල්ව නිෂ්පාදන ආයතනයන් 02 ක සංඛ්‍යාවක් විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නව අයැදුම් පත් දෙකක් අගැයීමට භාජනය කරන ලද අතර ඊට අමතර වශයෙන් 2021 වර්ෂය තුළදී සම්මත ලංසු තැබීමේ ප්‍රලේඛන රැස්වීම් 09 ක සංඛ්‍යාවක් පවත්වන ලදි.

සැලැසුම් අත් පොත් වැඩ කටයුතු -

ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශයෙහි සැලැසුම් අත් පොත් වැඩ කටයුතු වලට ඇතුලත් වන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්ය පටිපාටි හා සැලැසුම් අත් පොත් පිළියෙල කිරීමේ හා යාවත්කාලීන කිරීමේ කාර්යයන් වන්නේය. ගත වූ 2021 වර්ෂය තුළදී ක්‍රම සම්පාදන හා සැලැසුම් අත් පොත් සමාලෝචන කමිටුවේ මග පෙන්වීම් හා උපදෙස් යටතේ මෙහි පහත සඳහන් කරනු ලැබ ඇති වැඩ කටයුතු කරනු ලැබ ඇති අතර ක්‍රම සම්පාදන හා සැලැසුම් අත් පොත් සමාලෝචන කමිටුව ප්‍රති ස්ථාපන ගත කරන ලද්දේ ප්‍රස්තුත වර්ෂය අග කොටස තුළදී වේ. වර්ෂය තුළදී මේ යටතේ ක්‍රියාත්මක කරනු ලැබ ඇති වැඩ කටයුතු වන්නේ (නාගරික ජල සම්පාදනය හා සනීපාරක්ෂණ වැඩ කටයුතු වලට අදාල) D 2 අත් පොත, (ජල සම්පාදන සැලැසුම් පිළියෙල කිරීම හා සම්බන්ධ යාන්ත්‍රික, විද්‍යුත් හා අවශ්‍ය උපකරණ සම්පාදන පැතිකඩයන්ට අදාල) D 5 අත් පොත, (ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන්ට අදාල) D 8 අත් පොත, (ව්‍යාපෘති කළමනාකරණයට හා කොන්ත්‍රාත්තු පරිපාලනය කිරීමට අදාල) P 7 අත් පොත හා (ජල සම්පාදන ව්‍යාපෘතීන් සේවයේ යෙදවීමට හා භාර දීමට හා භාර ගැනීමට අදාල) P 3 අත් පොත සංස්කරණය කිරීමේ කටයුතු ප්‍රස්තුත වර්ෂය තුළදී අඩ වශයෙන් නිම කරනු ලැබ ඇත.

ප්‍රමාණ සමීක්ෂණය කිරීමේ වැඩ කටයුතු -

ප්‍රමාණ සමීක්ෂණය කිරීමේ වැඩ කටයුතු වලට ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන සියළුම සැලැසුම් කටයුතු වලට අදාල ප්‍රමාණ පත්‍රයන් පිළියෙල කිරීම, ඉංජිනේරු වරුන්ගේ ඇස්තමේන්තු පිළියෙල කිරීම, ජල හා මළ අපවහන වැඩ කටයුතු සඳහා වූ අනුපාතික පොත පිළියෙල කිරීම, වෙනස් වීම් ආගණනය කිරීම, කාර්ය අයිතමයන් මිළ කිරීම සඳහා කාර්ය ප්‍රතිමාණයන් පිළියෙල කිරීම සඳහා ජල හා මළ අපවහන කාර්ය අධ්‍යයනයන් සිදු කිරීම හා ව්‍යාපෘතීන් විසින් පිළියෙල කරනු ලබන ඉංජිනේරු ඇස්තමේන්තු සමාලෝචනයට භාජනය කිරීම හා කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් වෙත හා ව්‍යාපෘතීන් වෙත පිරිවැය උපදෙස් ලබා දීම යනාදී කාර්යයන් ඇතුලත් වේ.

2021 වර්ෂය තුළදී මෙම අනු අංශය විසින් (ජල ප්‍රමාණ පත්‍ර 442 ක සංඛ්‍යාවක් හා මළ අපවහන ප්‍රමාණ පත්‍ර 78 ක සංඛ්‍යාවක් වශයෙන්) ප්‍රමාණ පත්‍ර 520 ක මුළු සංඛ්‍යාවක් ද, (ජල ඉංජිනේරු ඇස්තමේන්තු 12 ක සංඛ්‍යාවක් හා මළාපවහන ඉංජිනේරු ඇස්තමේන්තු 05 ක සංඛ්‍යාවක් ද වශයෙන්) ඉංජිනේරු ඇස්තමේන්තු 17 ක මුළු සංඛ්‍යාවක් ද, පිළියෙල කරනු ලැබ ඇති අතර (ජල හා මළ අපවහන) වෙනස් වීම් 08 ක සංඛ්‍යාවක් පරීක්ෂා කර බැලීම ද, කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්ට අදාල පිරිවැය පැහැදිළි කිරීම් 05 ක සංඛ්‍යාවක් සිදු කිරීම ද, ජල සම්පාදනය වෙනුවෙන් වූ වාර්ෂික අනුපාතික ප්‍රමාණ පොත (1 වැනි වෙළුම හා 11 වැනි වෙළුම) පිළියෙල කිරීම ද, 2021 දෙසැම්බර් මාසය තුළදී ජල සම්පාදනය වෙනුවෙන් වන වාර්ෂික රේට් ප්‍රමාණ පොත සංස්කරණය කිරීම හා 2021 වර්ෂය සඳහා වූ වාර්ෂික අනුපාතික ප්‍රමාණ පොත සංස්කරණය කිරීම ද සිදු කරන ලදි. (අනුපාතික ප්‍රමාණ පොත භාවිතා කරමින් ඇස්තමේන්තු පිළියෙල කිරීමට අදාල දැනුම වැඩි දියුණු කිරීම සඳහා) තාක්ෂණික කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් පුහුණු කිරීමේ වැඩ සටහන් 2 ක් මෙහෙයවන ලදි. ඇතැම් ව්‍යාපෘතීන් වෙනුවෙන් ප්‍රමාණ පත්‍රයන් හා ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීමේ කාර්යය සඳහා වැඩ බිම් 14 ක සංඛ්‍යාවක් වෙත පරීක්ෂණ ගමන් යන ලදි. ඒ අතර ඇතැම් ව්‍යාපෘතීන් වෙනුවෙන් කොන්ත්‍රාත් කරුවන් සමග මිළ ගණන් ප්‍රමන්ත්‍රණය කිරීම සඳහා සහභාගි වන ලදි. 2021 වර්ෂය තුළදී කමිටු රැස්වීම් 4 ක සංඛ්‍යාවකට සහභාගි වන ලදි.

ක්‍රියාත්මක වන ජල පිළිසැකැසුම් යෝජනා ක්‍රම

පලාත / කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය	යෝජනා ක්‍රම සංඛ්‍යාව
මධ්‍යම	02
නැගෙනහිර	00
උතුරු මැද	00
වයඹ	01
උතුරු	00
සබරගමුව	00
දකුණු	01
ඌව	01
බටහිර මධ්‍යම	07
බටහිර උතුර	03
බටහිර දකුණ	01
එකතුව	**16***

* කොළඹ මහ නගර සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන මල අපවහන යෝජනා ක්‍රමය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන යෝජනා ක්‍රම ද මීට ඇතුලත්ව ඇත.



කළමනාකරණයේ සාකච්ඡා හා ආර්ථික අගය එකතු කිරීම පිළිබඳ ප්‍රකාශය

ක්‍රියාත්මක කරනු ලබමින් පවතින ජල පිළිසැකැසුම් ව්‍යාපෘති



විදේශීය අරමුදල් යටතේ වූ මලාපවහන ව්‍යාපෘතීන්.

1. රත්මලාන / මොරටුව අපජලය බැහැර කිරීමේ ව්‍යාපෘතිය (2 වැනි අදියර - 1 වැනි පියවර)

මෙම ව්‍යාපෘතිය සැලැසුම් කරනු ලැබ ඇත්තේ රත්මලාන හා මොරටුව ප්‍රදේශය තුළ දැනට තිබෙන්නා වූ ආවරණය වැඩි කිරීම අරමුණු කර ගනිමින් දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවත්නා රැස් කිරීමේ ජාලය ව්‍යාප්ත කිරීම අරමුණු කර ගනිමින් වේ. මෙම ව්‍යාපෘතියේ විෂය පථය තුළට (ආසන්න වශයෙන් කිලෝ මීටර 23 ක පමණ දිග ප්‍රමාණයකින් යුක්ත වූ ආරෝහක ප්‍රධාන නල මාර්ගයකින් යුක්ත වූ) කිලෝ මීටර 128 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ පෝම්ප කිරීමේ ස්ථානයන් 06 ක සංඛ්‍යාවක් ඇතුලත් නව පල්දෝරු රැස්කිරීමේ කාණු ජාලයක් ද, දැනට ක්‍රියාත්මක වන පොම්ප කිරීමේ ස්ථානයන් හා අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙනස් කිරීම ද ඇතුලත් වේ. මේ වෙනුවෙන් වූ ශ්‍රී ලංකා ජන රජය හා ප්‍රංශ සංවර්ධන ඒජන්සිය අතර ණය පහසුකම් ගිවිසුම වර්ෂ 2019 පෙබරවාරි 18 වැනි දින අත්සන් කරන ලදි.

මේ වෙනුවෙන් වූ යාවත්කාල පිරිවැය ඇස්තමේන්තුව ලංකා රුපියල් මිලියන 16,073 ක් වූ අතර ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් වීමෙන් පසුව ඉන් ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 45500 ක් වනු ඇත. වර්ෂ 2050 (සැලැසුම් ක්ෂිතිජය වර්ෂය) වන විට ප්‍රතිලාභීන් 170890 ක් වෙත සේවා සම්බන්ධතාවයන් සම්පාදනය කර දෙනු ලැබීමට සැලැසුම් කරනු ලැබ ඇත.

පල්දෝරු රැස් කිරීමේ ජාලය වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තුව වර්ෂ 2021 දෙසැම්බර් මස 08 වැනි දින චීන තූ ඉංජිනේරු සංස්ථාව වෙත ප්‍රදානය කරන ලද අතර අදාල ගිවිසුමට වර්ෂ 2021 දෙසැම්බර් 13 වැනි දින අත්සන් තබන ලදි. කොන්ත්‍රාත් මුදල යුරෝ 22, 546, 258.17 ක් හා ලංකා රුපියල් 4,115, 667,908.27 ක් වන අතර කාර්යයෙහි යෙදවීමේ අත්තිකාරම් මුදල ද ගෙවන ලදි.

පොම්ප කිරීමේ ස්ථානයන් හා වෙනස් කිරීම් වෙනුවෙන් වූ ලංසු තැබීමේ ප්‍රලේඛනය පිළියෙල කිරීම දැනට සිදු කරගෙන යනු ලබමින් පවතී. පෝම්ප කිරීමේ ස්ථානයන් සඳහා ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු දැනට සිදු කරගෙන යනු ලබමින් පවතී. උපදේශක කොන්ත්‍රාත්තුව, යෝජනා ඉල්ලා සිටීමේ ලේඛනය පිළියෙල කිරීම CPCC විසින් අවසන් කරන ලදුව එය ''විරුද්ධතාවයක් නැත'' යන්න සහතික කිරීම සඳහා ප්‍රංශ සංවර්ධන ඒජන්සිය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත. ව්‍යාපෘතිය විසින් වර්ෂ 2021 දෙසැම්බර් මස අවසානයට සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 5.50 ක් හා සියයට 10.166 (ලංකා රුපියල් මිලියන 1,634.04) ක් විය.

2. මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය

මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය සතුව මුළු ආවරණ ප්‍රදේශය වශයෙන් හෙක්ටෙයාර 733 ක භූමි ප්‍රමාණයක් තිබෙන අතර 2030 වර්ෂය දක්වා ඒ මගින් පදිංචි ජන ගහණය 55000 ක් හා සංක්‍රමණික ජන ගහණය 150000 ක් වෙත සේවය සපයා දෙනු ලබනවා ඇත. මෙම ව්‍යාපෘතියේ විෂය පථය තුළින් අපේක්ෂා කරනු ලබන්නේ මහනුවර වැව තුළ, මහවැලි ගංගාව තුළ හා මහනුවර නගරය හරහා ගලා යනු ලබන දිය පහරවල් තුළ ඇති ජලයේ ගුණාත්මය වැඩි දියුණු කිරීම වන අතර ඉන් පසුව ඒ මගින් ඉහළ ජන ගහණ ඝණත්වයක් සහිත ප්‍රදේශයන් තුළ ජීවත් වන මිනිසුන්ගේ සනීපාරක්ෂණ තත්ත්වය වැඩි දියුණු වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. මෙම තත්ත්වය සාක්ෂාත් කර ගනු ලැබීම සඳහා ව්‍යාපෘතිය විසින් දිනකට ජලය ඝණ මීටර 14000 ක ධාරිතාවයකින් යුක්ත වූ අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම, රැස් කිරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම හා අඩු ආදායම් ලබන ජනයා ජීවත් වන ප්‍රදේශයන් වෙත සනීපාරක්ෂණ පහසුකම් සම්පාදනය කර දීම ඇතුළත් නිවාස වෙත සම්බන්ධතා ලබා දීම ද සිදු කරනු ලබනවා ඇත. ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය අරමුදල් සම්පාදනය කර දෙනු ලබන ප්‍රධාන ඒජන්සිය වන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ පිරිවැය ආසන්න වශයෙන් ලංකා රුපියල් බිලියන 22.8 ක් වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. 2021 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති මූල්‍ය ප්‍රගතිය සියයට 88.4 ක් වන අතර භෞතික ප්‍රගතිය සියයට 92 ක් විය. දැනට අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය දිනකට ඝණ මීටර 3400 ක සාමාන්‍ය ගලනයක් සමග ක්‍රියාත්මක වෙමින් පවතී. කිලෝ මීටර 249.7 ක මුළු දිග ප්‍රමාණයකින් යුක්ත වූ පල්දෝරු නල පද්ධතිය අතුරින් කිලෝ මීටර 245.5 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ පල්දෝරු නල වලනු ලැබ ඇති අතර දේ පල 2724 ක සංඛ්‍යාවක් ජාලය සමග සම්බන්ධ කරනු ලැබ ඇත.

අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය විවෘත කිරීමේ උත්සවය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා මහනුවර මහ නගර සභාව අතර අවබෝධතා ගිවිසුම අත්සන් කරනු ලැබීමට සමාන්තර ලෙස වර්ෂ 2021 නොවැම්බර් මස 17 වැනි දින පවත්වන ලදි. වැඩ කටයුතු ප්‍රමාද වීමට අහිතකර කාල ගුණය, කඳු සහිත භූ විෂමතාවය, ප්‍රමාණවත් නොවූ සම්පත් හා කොවිඩ් 19 ලෝක වසංගත තත්ත්වය ආදී ඇතැම් පොදු ගැටළු හේතු විය. ඒ කෙසේ වුව ද ඉතිරි වී ඇති නල වලීමේ කටයුතු හා දේ පල සේවා සම්බන්ධතාවයන් සැපයීම පිළිවෙලින් වර්ෂ 2022 මාර්තු මස අවසානය වන විට හා 2022 සැප්තැම්බර් මස අවසානය වන විට සම්පූර්ණයෙන් අවසන් කිරීම සඳහා සැලැසුම් කරනු ලැබ ඇත.

3. නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂිත පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් ඉලක්ක කරනු ලබන්නේ මීගමුව, ගාල්ල - උණවටුන හා කැළණිය - පෑලියගොඩ නම් වූ දකුණු හා බටහිර වෙරළ ආශ්‍රිත ප්‍රදේශයන් තුළ ජීවත් වන්නා වූ මිනිසුන් 200000 ක සංඛ්‍යාවක් වෙත අපජල බැහැර කිරීමේ යටිතල පහසුකම් සම්පාදනය කර දීම වෙත වේ. නගර සඳහා වූ සනීපාරක්ෂණ හා ස්වස්ථතා ව්‍යාපෘතියේ 1 වැනි අදියර තුළට ඇතුලත් වන්නේ මීගමු නගරය සඳහා අපජල බැහැර කිරීමේ යටිතල පහසුකම් සම්පාදනය කර දීම හා ගාල්ල - උණවටුන හා කැළණිය - පෑලියගොඩ ප්‍රදේශයන් වෙනුවෙන් සාධ්‍යතා අධ්‍යයනයන් කිරීම, සවිස්තරාත්මක සැලැසුම් හා මිළ ගණන් කැඳවීමේ ලිපි ලේඛන පිළියෙල කිරීම මෙන්ම ව්‍යාපෘති ප්‍රදේශය තුළ ජීවත් වන අඩු ආදායම් ලබන මිනිසුන් වෙත සනීපාරක්ෂණ පහසුකම් සම්පාදනය කර දීම සඳහා දිළින්දන් සඳහා වූ අරමුදල ස්ථාපිත කිරීම ද වන්නේය. මීට අමතර ලෙස ජල හා සනීපාරක්ෂණ අංශයේ ආයතනික රාමුව නංවා ලීම සඳහා නිර්දේශයන් සම්පාදනය කර දීමට ද, ඒ සඳහා වූ මූල්‍යකරණය තිරසාර භාවයට පත් වීම සහතික කිරීම සඳහා සහ මළ අපවහනය කළමනාකරණය කිරීමේ කුසලතා සංවර්ධනය කිරීමේ සැලැසුමක් ක්‍රියාත්මක කිරීම සඳහා ද තාක්ෂණික සහාය වැඩ සටහනක් ඒ මගින් සම්පාදනය කර දෙනු ලබනවා ඇත. නගර සඳහා වූ සනීපාරක්ෂණ හා ස්වස්ථතා ආයෝජන වැඩ සටහනේ මුල් අදියර ක්‍රියාත්මක කිරීම සඳහා වන අරමුදල් සම්පාදනය ප්‍රංශ සංවර්ධන ඒජන්සිය මගින් ලබා ගැනීම සඳහා කටයුතු කරනු ලැබ ඇති අතර තාක්ෂණික සහාය අංගය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් අරමුදල් සපයනු ලබන්නේ ප්‍රංශ සංවර්ධන ඒජන්සිය හරහා යුරොපියන් සංගමය විසින් වේ. සියළු ප්‍රදේශයන් තුනම වෙනුවෙන් වූ සාධ්‍යතා අධ්‍යයන වාර්තාව හා මීගමුව හා ගාල්ල - උණවටුන වෙනුවෙන් වූ මූලික සැලැසුම හා මීගමුව වෙනුවෙන් වූ සවිස්තරාත්මක සැලැසුම හා මීගමුව වෙනුවෙන් වූ ලංසු තැබීමේ ලේඛනය පිළියෙල කිරීම සැලැසුම් හා අධීක්ෂණ උපදේශක විසින් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ගාල්ල - උණවටුන ප්‍රදේශය

වෙනුවෙන් වූ සවිස්තරාත්මක සැලැසුම හා ලංසු තැබීමේ ප්‍රලේඛනය පිළියෙල කිරීමේ කටයුතු දැනට සිදු කර ගෙන යනු ලබමින් පවතී. සාධ්‍යතා අධ්‍යයනයේදී උපදේශක විසින් සොයා ගන්නා ලද කරුණු හේතුකොට ගෙන කැළණිය - පෑලියගොඩ වෙනුවෙන් වූ මූලික සැලැසුම හා සවිස්තරාත්මක සැලැසුම ඉවත් කරන ලදි. කැළණිය - පෑලියගොඩ ප්‍රදේශය වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තරික සැලැසුමක් භාවිතා කරමින් පුතික ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් (ස්ථානගත සනීපාරක්ෂණය) සැලැසුම් කොට ඉදි කරනු ලබනවා ඇත. සැලැසුම් හා අධීක්ෂණ උපදේශක වරයා විසින් ක්‍රියාත්මක කරන ලද මීගමු ප්‍රදේශය සම්බන්ධයෙන් වූ සාධ්‍යතා අධ්‍යයනයට අනුව ව්‍යාපෘතිය වෙනුවෙන් ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය ලංකා රුපියල් මිලියන 29,468 ක් වේ. ඒ කෙසේ වුව ද ලබාගත හැකි අරමුදල් වල ප්‍රමාණය ලංකා රුපියල් මිලියන 17, 665 ක් (යුරෝ මිලියන 107. 7 ක්) පමණක් වේ. මීගමුව ව්‍යාපෘතියේ සම්පූර්ණ 1 වැනි පියවර වෙනුවෙන් සැලැසුම් කරනු ලැබ ඇති ඉදි කිරීම් සඳහා තිබෙන අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුකොට ගෙන ව්‍යාපෘතිය අදියරයන් කිහිපයක් යටතේ ක්‍රියාත්මක කරනු ලැබීමට තීරණය කරන ලදි. ඒ අනුව මීගමුව අපජල කළමනාකරණ යෝජනා ක්‍රමයේ 1 වැනි අදියර ලබාගත හැකි අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලබනවා ඇත. 1 වැනි පියවරෙහි 1 වැනි අදියර සමන්විත වන්නේ දිනකට ජලය ඝණ මීටර 16000 ක ධාරිතාවයකින් යුක්ත වූ අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම, අපවාහ බැහැර කිරීමේ පද්ධතිය ස්ථාපනය කිරීම හා අපජලය රැස්කිරීමේ ජාලයේ කොටසක් ඉදි කිරීම යන අංගයන්ගෙන් වේ. අපේක්ෂා කරනු ලබන සේවා සම්බන්ධතා සංඛ්‍යාව 6000 ක් වනු ඇත. අපජලය රැස් කිරීමේ ජාලයේ ඉතිරි කොටස 1 වැනි පියවරෙහි 2 වැනි අදියර යටතේ ඉදි කරනු ලබනවා ඇත. 2021 වර්ෂයේ දෙසැම්බර් මස අවසානයට ව්‍යාපෘතියේ 1 වැනි පියවරෙහි 1 වැනි අදියර විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය සියයට 9.56 ක් වන අතර මූල්‍ය ප්‍රගතිය සියයට 5.62 ක් වේ. මීගමුව අංක 1 පැකේජය (රැස් කිරීම් ජාලය) හා අංක 2 පැකේජය (අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය) යන පැකේජයන් දෙක දැනට ප්‍රතිසම්පාදන අවස්ථාවේ පසු වන හෙයින් ඒවාට අදාල කොන්ත්‍රාත්තු 2022 වර්ෂයේ ජූලි මස අවසානයේ ප්‍රදානය කරනු ලැබීමට අපේක්ෂා කරනු ලැබේ.

සම්බන්ධතා නංවා ලීමේ ව්‍යාපෘතිය ("සැමට ජලය" යටතේ)

මෙම ව්‍යාපෘතියේ විෂය පථය වන්නේ සෘජු පල්දෝරු සේවා සම්බන්ධතාවයන්, වඩාත් පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි හා සම්ප්‍රදායික පල්දෝරු සේවා සම්බන්ධතාවයන්, වඩාත් පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි හා සම්ප්‍රදායික පල්දෝරු සේවා දීර්ඝ කිරීම් හා දැනට ක්‍රියාත්මක වන යෝජනා ක්‍රමයන් වෙත වැඩි දියුණු කිරීම් හා පෝම්ප කිරීම් සමග වඩාත් පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි දීර්ඝ කිරීම් මගින් දැනට ක්‍රියාත්මක වන නල මාර්ගික මළ අපවහන යෝජනා ක්‍රමයන් වෙත නව පල්දෝරු සේවා සම්බන්ධතාවයන් 8055 ක සංඛ්‍යාවක් සපයා දීම වේ. මීට අමතර වශයෙන් සම්බන්ධතාවයන් ලබා ගැනීම දිරිමත් කිරීම අරමුණු කර ගනිමින් සම්බන්ධතාවයන් ලබා දීමේ නව ප්‍රතිපත්තියක් මගින් සියළුම පාරිභෝගික වර්ගයන් වෙත මූල්‍ය සහාය ලබා දීමට කටයුතු කරනු ලැබේ. යෝජිත නව පල්දෝරු සංඛ්‍යාව හා දැනට ක්‍රියාත්මක වන මළ අපවහන යෝජනා ක්‍රමයන් වෙත කරන්නට යෝජිත වැඩි දියුණු කිරීම් මෙහි පහත දක්වනු ලැබ ඇත.

- කතරගම ප්‍රදේශය තුළ පල්දෝරු සේවා සම්බන්ධතාවයන් 450 ක සංඛ්‍යාවක් සම්පාදනය කර දීම.
- පල්දෝරු සේවා සම්බන්ධතාවයන් 500 ක සංඛ්‍යාවක් සම්පාදනය කර දීම හා හික්කඩුවේ දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවත්නා අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වර්ධනය කිරීම.
- MLP 1 පෝම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය වැඩි දියුණු කිරීම සමග දෙහිවල / ගල්කිස්ස ප්‍රදේශය වෙත පල්දෝරු සේවා සම්බන්ධතාවයන් 1500 ක සංඛ්‍යාවක් සම්පාදනය කර දීම.
- කොළඹ මහ නගර සභාවේ පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය වැඩි දියුණු කිරීම සඳහා වූ KP 4 සමග කොලොන්නාව ප්‍රදේශය තුළ පල්දෝරු සේවා සම්බන්ධතාවයන් 2205 ක සංඛ්‍යාවක් සම්පාදනය කර දීම.
- කුරුණෑගල ප්‍රදේශය තුළ පල්දෝරු සේවා සම්බන්ධතාවයන් 3400 ක සංඛ්‍යාවක් සම්පාදනය කර දීම.

සමස්ත භෞතික ප්‍රගතිය සියයට 8.5 ක් වන අතර හඳුනා ගැනීම, විමර්ෂණය කිරීම හා විස්තරාත්මක සැලැසුම් පිළියෙල කිරීම සියයට 78.0 ක ප්‍රතිශතයක් නිම කරනු ලැබ ඇත. මේ අතර කොලොන්නාව, කුරුණෑගල හා දෙහිවල ක්‍රියාකාරකම් වෙනුවෙන් වූ විස්තරාත්මක සැලැසුම් පිළියෙල කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ඒ අතර එබඳ 1 සිට වැල්ලවත්ත මෝය දක්වා වූ පෝම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගයේ වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු සියයට 35.0 ප්‍රතිශතයක් නිම කරනු ලැබ ඇත. ඒ අතර මීටර 560 ක නල එලීමේ කටයුතු වලින් මීටර 850 ක නල එලීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.



හික්කඩුව රැස් කිරීම් ජාලයේ සැලැසුම



වඩුගොඩවත්ත රැස් කිරීම් ජාලයේ ආකෘතිය

ක්‍රම සම්පාදනය හා සැලැසුම් කිරීම (ජල පිළිසැකැසුම්)

ක්‍රම සම්පාදනය හා සැලැසුම් කිරීම (ජල පිළිසැකැසුම්) අංශය විසින් ඉටු කළ යුතුව ඇති මූලික කාර්යයන් වන්නේ නාගරික ප්‍රදේශයන් සඳහා වූ මධ්‍යගත අපජල කළමනාකරණ ක්‍රමයන් වෙනුවෙන් සාධ්‍යතා අධ්‍යයනයන් පවත්වනු ලැබීම ද, පලාත් පාලන අධිකාරීන් විසින් පාලනය කරනු ලබන ප්‍රදේශයන් තුළ වූ අඟුවි සහිත ගොහොදු මඩ ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් (FSTPs) වෙනුවෙන් ක්‍රම සම්පාදන කටයුතු කිරීම හා සැලැසුම් සකස් කිරීම ද, දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවත්නා අපජල කළමනාකරණ ව්‍යාපෘතීන් වෙනුවෙන් වීවායේ සැලැසුම් සමාලෝචනය කිරීම ද, වෙනත් රජයේ හා පෞද්ගලික නියෝජිත ආයතනයන් විසින් ක්‍රියාත්මක කරනු ලබන්නා වූ අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් හා රැස් කිරීමේ පද්ධතීන් සඳහා පිරිවැය අය කර ගැනීමේ පදනම මත ක්‍රම සම්පාදන කටයුතු හා සැලැසුම් කටයුතු සිදු කිරීම ද, යෝජිත අපජල කළමනාකරණ ව්‍යාපෘතීන් සඳහා බාහිර උපදේශක වරුන් විසින් සිදු කරනු ලබන පාරිසරික බලපෑම් තක්සේරු කිරීම් හා මූලික පාරිසරික පරීක්ෂණයන් පරිපාලනය කිරීම හා පසුවිපරම් කටයුතු සිදු කිරීම හා පරදු ධාරීන් අතර සනීපාරක්ෂණ අංශය තුළ සිදු කරනු ලබන සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් භාවය නංවා ලීම ආදී ක්‍රියාකාර කම් ආදිය ද වේ.

ගත වූ 2021 වර්ෂය තුළදී ක්‍රම සම්පාදනය හා සැලැසුම් කිරීම (ජල පිළිසැකැසුම්) අංශය විසින් සම්පූර්ණයෙන් නිම කරන්නට යෙදුන ප්‍රධානතම කාර්යය වූයේ දත්ත රැස් කිරීම, අවශ්‍යතා තක්සේරු කිරීම හා නව ව්‍යාපෘතීන් හඳුනා ගැනීම ආදී කටයුතු සඳහා කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්ගේ සහාය ලබා ගනිමින් සනීපාරක්ෂණ ප්‍රධාන සැලැසුම පිළියෙල කිරීම වේ. ප්‍රධාන සැලැසුම අධ්‍යයනයට අමතර වශයෙන් ක්‍රම සම්පාදනය හා සැලැසුම් කිරීම (ජල පිළිසැකැසුම්) අංශය විසින් සනීපාරක්ෂණ අංශයේ ප්‍රවර්ධනයන් පිළිබඳව පලාත් පාලන අධිකාරීන් හා සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, පලාත් සභා හා පලාත් පාලන අධිකාරී අමාත්‍යාංශය හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ආදී කොට ඇති අනිකුත් පරදු ධාරීන් දැනුවත් කිරීමේ වැඩ සටහන් ද දියත් කොට ක්‍රියාත්මක කරන ලදි.

බටහිර වෙරළ තීරය තුළ පිහිටා ඇති කළුතර, අළුත්ගම හා බේරුවල නගරයන් වෙත නල මාර්ගික අපජල යටිතල පහසුකම් සම්පාදනය කර දීම අරමුණු කර ගනිමින් ඒ වන විටත් පෙර වර්ෂය තුළ ආරම්භ කරනු ලැබ තිබුණ සාධ්‍යතා අධ්‍යයනය හා අදාල කටයුතු අබන්ධ ලෙස කරගෙන යන ලද අතර වත්තල, කොලොන්නාව හා ත්‍රිකුණාමලය නගරයේ මළ අපවහන පද්ධතීන් වෙනුවෙන් වූ ඉඩම් හඳුනා ගැනීමේ කටයුතු හා සැලැසුම් පිළියෙල කිරීමේ වැඩ කටයුතු ද සිදු කරන ලදි. ලෝක බැංකුව විසින් මූල්‍ය පහසුකම් සපයනු ලබන බදුල්ල දිස්ත්‍රික්කය සඳහා වූ සනීපාරක්ෂණය නංවා ලීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් වූ සැලැසුම් කිරීමේ වැඩ කටයුතු හා ප්‍රතිසම්පාදන වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කර ගෙන යනු ලබමින් පවතී. ඇල්ල සංචාරක කලාපය හා ගම්පොල නාගරික ප්‍රදේශය වෙනුවෙන් මධ්‍යගත මළ අපවහන පද්ධතීන් සඳහා වූ සාධ්‍යතා අධ්‍යයනයේ වැඩ කටයුතු 2021 වර්ෂය තුළදී ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපෘතීන්ට අදාල ක්‍රම සම්පාදන වැඩ කටයුතු, ඉඩම් වෙන් කර දීමේ වැඩ කටයුතු හා ගම්පහ, අනුරාධපුර, පොලොන්නරුව, මඩකලපුව, කත්තන්කුඩි, හම්බන්තොට, දෙහිවල / ගල්කිස්ස, මහරගම - බොරලැස්ගමුව හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වැනි මළ අපවහන යෝජනාවන් සංවර්ධනය කරනු ලබන අනිකුත් ප්‍රදේශයන් තුළ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්ගේ සහාය ලබා ගනිමින් පරදු ධාරීන් දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරගෙන යනු ලබමින් පවතී.

ජල සම්පාදනය හා සනීපාරක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP) යටතේ ක්‍රියාත්මක කරනු ලැබීමට යෝජිත අඟුවි සහිත ගොහොදු මඩ ප්‍රතිකාරක යන්ත්‍රාගාර (FSTPs) හා සම්බන්ධ ක්‍රම සම්පාදන හා සැලැසුම් කිරීමේ වැඩ කටයුතු 2021 වර්ෂය තුළදී දිගටම සිදු කරගෙන යන ලදි. ඒ අනුව බදුල්ල, ඇල්ල හා නුවර එලිය ප්‍රදේශයන් තුළ ඉදි කරනු ලැබීමට යෝජිත අඟුවි සහිත ගොහොදු මඩ ප්‍රතිකාරක යන්ත්‍රාගාර (FSTPs) හා සම්බන්ධ විස්තරාත්මක සැලැසුම් කිරීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර හික්කඩුව, මාවනැල්ල හා බණ්ඩාරවෙල ඉදි කරනු ලැබීමට යෝජිත අඟුවි සහිත ගොහොදු මඩ ප්‍රතිකාරක යන්ත්‍රාගාර (FSTPs) හා සම්බන්ධ ක්‍රම සම්පාදන, විමර්ෂණ, ඉඩම් අත් පත් කර ගැනීම් හා විස්තරාත්මක සැලැසුම් සකස් කිරීමේ වැඩ කටයුතු දැනට සිදු කර ගෙන යනු ලබමින් පවතී. මීට අමතර වශයෙන්, කැස්බෑව, පානදුර, කැළණිය, වැලිගම හා කුරුණෑගල වැනි "සැමට ජලය" වැඩ සටහන යටතේ වූ ඉහළ ඉල්ලුමක් ඇති ප්‍රදේශයන් වෙනුවෙන් වෙනත් අඟුවි සහිත ගොහොදු මඩ ප්‍රතිකාරක යන්ත්‍රාගාර (FSTPs) ව්‍යාපෘතීන් දියත් කොට ඉදි කිරීමේ කටයුතු දැනට සිදු කර ගෙන යනු ලබමින් පවතී.

ඊට අමතර වශයෙන් ප්‍රධාන සනීපාරක්ෂණ සැලැසුම තුළ හඳුනා ගනු ලැබ ඇති ආකාරයට රට තුළ ඇති දිස්ත්‍රික්ක වැඩි සංඛ්‍යාවක් ආවරණය කිරීම ඉලක්ක කර ගනිමින් වර්ෂ 2021 සිට වර්ෂ 2023 කාල සීමාව තුළ නව අඟුවි සහිත ගොහොදු මඩ ප්‍රතිකාරක යන්ත්‍රාගාර (FSTPs) ව්‍යාපෘතීන් 20 ක මුළු සංඛ්‍යාවක් ඇති කිරීමේ අරමුණින් යුක්තව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වෙනත් අඟුවි සහිත ගොහොදු මඩ ප්‍රතිකාරක යන්ත්‍රාගාර (FSTPs) ව්‍යාපෘතීන් 14 ක සංඛ්‍යාවක් දියත් කොට ඉදි කිරීමේ කටයුතු සැලැසුම් කිරීම දැනට ආරම්භ කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘතීන් ඉදි කරනු ලැබීමේ පරමාර්ථය වන්නේ ස්ථානගත සනීපාරක්ෂණ සේවා දාමය තුළ දැනට ඇති දුර්වල සම්බන්ධතාවය ශක්තිමත් කිරීම තුළින් අවසානයේදී තිරසාර සංවර්ධන ඉලක්කයන්ට අනුව සනීපාරක්ෂණ ප්‍රධාන සැලැසුම මගින් යෝජනා කරනු ලැබ ඇති ආරක්ෂිත සනීපාරක්ෂණ ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම වන්නේය. ඒ අනුව නව අඟුවි සහිත ගොහොදු මඩ ප්‍රතිකාරක යන්ත්‍රාගාර (FSTPs) ව්‍යාපෘතීන් දියත් කොට ඉදි කිරීම සඳහා ප්‍රමුඛතා ප්‍රදේශයන් වශයෙන් අළුත්ගම / බේරුවල, යක්කල, ගම්පොල, මාතර, ගාල්ල, කඩුවෙල, කදුරුවෙල, දඹුල්ල, යාපනය හා වාලච්චේනෙයි වැනි ප්‍රදේශයන් හඳුනා ගනු ලැබ ඇත. සැලැසුම් සකස් කිරීමේ පියවර තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පලාත් පාලන බල ධාරීන්ගේ සහාය ලබා ගනිමින් යෝජිත අඟුවි සහිත ගොහොදු මඩ ප්‍රතිකාරක යන්ත්‍රාගාර (FSTPs) ව්‍යාපෘතීන් ඉදි කිරීම සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීම ආරම්භ කරන ලදි. ඊට අමතර වශයෙන් පලාත් පාලන බල ධාරී පරිශ්‍රයන් තුළ දැනුවත් කිරීමේ රැස්වීම් හා සාකච්ඡාවන් පවත්වන ලද අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්ට අනුයුක්ත කාර්ය මණ්ඩලයන්හි සම්බන්ධීකරණයෙන් යුක්තව සමාජ කණ්ඩායම් හා වෙනත් පරදු ධාරීන් දැනුවත් කිරීමේ වැඩ සටහන් දිස්ත්‍රික් සම්බන්ධීකරන කමිටු රැස්වීම් තුළදී පවත්වන ලදි.

ප්‍රති ආරෝපණය කළ හැකි ව්‍යාපෘති යටතේ විරාවුර් රෙදි පිළි නිෂ්පාදන කලාපය ගං මෝය වෙනුවෙන් වූ ක්‍රම සම්පාදන හා විස්තරාත්මක සැලැසුම් කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලබන පියවර තුළ පවතී. දෙහිවල උසස් තාක්ෂණවේද ආයතනයේ පල්දෝරු පද්ධතිය වෙනුවෙන් වූ විස්තරාත්මක සැලැසුම් වැඩ කටයුතු සැලැසුම් කරන ලද ආකාරයට ගත වූ වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි. නීල පියස රජයේ නිල නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් වූ මළ අපවහන ප්‍රතිකාරක යන්ත්‍රාගාරය සඳහා වූ ක්‍රම සම්පාදන හා සැලසුම් වැඩ කටයුතු 2021 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි.

මීට අමතර වශයෙන් මත්තේගොඩ පොකුණු පද්ධතිය පුනරුත්ථාපනය කිරීමේ වැඩ කටයුතු වෙනුවෙන් වූ විමර්ෂණයන් සිදු කිරීම හා විස්තරාත්මක සැලැසුම් පිළියෙල කිරීමේ කටයුතු 2021 වර්ෂය තුළදී දිගටම කරගෙන යන ලදි. එසේම ජල සම්පාදන අමාත්‍යාංශ ගොඩනැගිල්ල වෙනුවෙන් වූ ස්ථානීය සනීපාරක්ෂණ පද්ධතිය (Jokaosu) හා සම්බන්ධ ප්‍රතිකාර කරන ලද අපජලය

නැවත භාවිතා කිරීමේ පද්ධතිය ඉදි කිරීමේ වැඩ කටයුතු වර්ෂය අවසානයේ සම්පූර්ණයෙන් නිම කරන ලදි. හොරණ, මිල්ලව පිහිටි වැලිකඩ බන්ධනාගාරය ප්‍රති ස්ථානගත කිරීමේ ව්‍යාපෘතියේ වැඩ බිම තුළ අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කරනු ලැබීම හා අදාල ක්‍රම සම්පාදන හා සැලැසුම් පිළියෙල කිරීමේ වැඩ කටයුතු 2021 වර්ෂය තුළදී ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපෘතිය යටතේ අපජලය රැස් කිරීමේ ජාලයකින් හා ප්‍රතිකාර කරන ලද අපජලය පිටතට ගලා එන නල මාර්ගයකින් සමන්විත වූ දිනකට ජලය ඝණ මීටර 2000 ක ධාරිතාවයකින් යුක්ත වූ ජෛව විද්‍යාත්මක අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් (A^2O ක්‍රියාවලිය අනුගමනය කරමින්) ඉදි කිරීම සැලැසුම් පියවර යටතේ පවතී.

මීට අමතර වශයෙන් (දිනකට ජලය ඝණ මීටර 3250 ක ධාරිතාවයකින් යුක්ත වූ) දියවන්නාව අපජල බැහැර කිරීමේ පද්ධතිය වෙනුවෙන් වූ ක්‍රම සම්පාදන හා සැලැසුම් සකස් කිරීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි. මේ අනුව, දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ඇතුල්කෝට්ටේ පොම්ප කිරීමේ ස්ථානය සමග අපජලය සම්බන්ධ කිරීම සඳහා අපජලය රැස් කිරීමේ ජාලය හා පෝම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය සැලැසුම් කරනු ලබනවා ඇත. මීට වැඩිමනත් ලෙස හිඹුටු උයන නිවාස යෝජනා ක්‍රමය තුළ ඉදි කරනු ලැබ ඇති අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පුනරුත්ථාපනය කිරීම වෙනුවෙන් වන ක්‍රම සම්පාදන හා සැලැසුම් පිළියෙල කිරීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි. පුනරුත්ථාපනය කිරීම සඳහා වූ යෝජනාව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති අතර දිනකට ජලය ඝණ මීටර 250 ක ධාරිතාවයකින් යුක්ත වූ දැනට ක්‍රියාත්මක කරනු ලබන අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පුනරුත්ථාපනය කිරීම වෙනුවෙන් වූ විස්තරාත්මක සැලැසුම් සම්පාදනය කිරීමේ වැඩ කටයුතු දැනට කරගෙන යනු ලබමින් පවතී. දෙහිවල ජාතික සත්වෝද්‍යානය තුළ අපජලය රැස් කිරීමේ ජාලයක් හා දිනකට ජලය ඝණ මීටර 600 ක ධාරිතාවයකින් යුක්ත වූ අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම හා සම්බන්ධ ක්‍රම සම්පාදන හා සැලැසුම් සකස් කිරීමේ කටයුතු වර්ෂය අවසානය තුළදී ආරම්භ කරන ලදි.

පෙළ ගස්වනු ලැබ ඇති ප්‍රධාන මළ අපවහන ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් වන පාරිසරික බල පෑම් තක්සේරු කිරීම් හා මූලික පාරිසරික පරීක්ෂණ කටයුතු ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය හා අනුයුක්ත මළ අපවහන අංශය විසින් දැනට සිදු කරගෙන යනු ලැබේ. මේ යටතේ පුත්තලම අපජල කළමනාකරණ ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය මධ්‍යම පාරිසරික අධිකාරියේ පාරිසරික අවසරය ලබා ගන්නා ලද අතර හලාවත හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අපජල බැහැර කිරීම් ව්‍යාපෘතීන් සඳහා පාරිසරික අවසරය ලබා ගැනීම ඉතිරිව තිබේ.

පෙළ ගස්වනු ලැබ ඇති පියවර තුළ තිබෙන අපජල කළමනාකරණ ව්‍යාපෘතීන් හා සම්බන්ධ ඉඩම් අත් පත් කර ගැනීමේ වැඩ කටයුතු යටතේ දෙහිවල - ගල්කිස්ස, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, මාතර, හලාවත, පුත්තලම, මහරගම, බොරලැස්ගමුව, බදුල්ල, ගම්පහ, අළුත්ගම හා බේරුවල, කළුතර, පොලොන්නරුව, කාත්තන්කුඩි, මඩකලපුව, කල්මුනෙයි හා වීරාවුර් නම් වූ අපජල බැහැර කිරීම් ව්‍යාපෘතීන් තුළ අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් ඉදි කිරීම හා පෝම්ප කිරීමේ ස්ථානයන් ඉදි කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හඳුනා ගැනීමේ හා අත් පත් කර ගැනීමේ වැඩ කටයුතු අඛන්ඩ ලෙස කරගෙන යනු ලබමින් පවතී.

ඉහත කාරණා වලට අමතර වශයෙන් ගම්පොල නාගරික ප්‍රදේශය හා දියවන්නාව අපජල කළමනාකරණ ව්‍යාපෘතීන් හා සම්බන්ධ ව්‍යාපෘති හඳුනා ගැනීමේ වාර්තා පිළියෙල කිරීම් වැඩ කටයුතු 2021 වර්ෂය තුළදී සිදු කරන ලදි.



“ පිරිසිදු ජලය නිර්මාණය කිරීම සඳහා අපට නව මාර්ග නිර්මාණය කළ හැකිය.”

ක්‍රේග් වෙන්ටර්



ජලය ලබාගැනීම සංවර්ධනය

වැසි ජල ආවරණ ටැංකිය

ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථාන

බටහිර - මධ්‍යම ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය

බස්නාහිර - මධ්‍යම ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය යටතේ ඇති කලාපය කොළඹ මහ නගරය උතුර, කොළඹ මහ නගරය දකුණ, කෝට්ටේ හා මහරගම යන කළමනාකරණ කලාපයන්ගෙන් සමන්විත වේ. මෙකී කලාපයන් හතර මගින් භූගෝලීය ලෙස දෙහිවල, ගල්කිස්ස, රත්මලාන හා මොරටුව හැර කොළඹ දිස්ත්‍රික්කයෙහි සෙසු කොටස් මුළුමනින්ම ආවරණය කරනු ලබයි. ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 19 ක සංඛ්‍යාවක් විසින් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන අතර ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය සතුව ප්‍රස්තුත වර්ෂය තුළ සම්පාදනය කර දෙන ලද නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 27000 ක සංඛ්‍යාව ඇතුළු මුළු ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 543000 ක සංඛ්‍යාවක් ක්‍රියාත්මක වේ. මුළු නල මාර්ගික ජල සම්පාදන ආවරණය සියයට 91.1 ක් වශයෙන් වාර්තා වන අතර ඒ අතුරින් සියයට 90.2 ක ප්‍රතිශතයක් ක්‍රියාත්මක කරනු ලබන්නේ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයේ පරිපාලන මායිම් යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වේ.

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුකොට ගෙන ඇති වූ ආර්ථික බාධකයන් යටතේ බිල් පත් මත වූ ගෙවීම් එකතු කර ගැනීම සඳහා මෙන්ම නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් ලබා දීම සඳහා ද විශේෂ ජංගම වැඩ සටහන් මෙහෙයවන ලදි. නව සේවා සම්බන්ධතාවයන් ලබා දීමේ ඉලක්කය සපුරා ගැනීම සඳහා සහ සියයට 107.0 ක ගාස්තු රැස් කර ගැනීමේ කාර්යක්ෂමතාවයක් ද වර්ෂය තුළදී සාක්ෂාත් කර ගැනීමෙහි ලා මෙම වැඩ සටහන් මගින් සහාය ලැබිණි. ලෝක වසංගත තත්ත්වය පැවැති කාල සීමාව අතරතුරදී වුව ද 2020 වර්ෂයේ අවසාන භාගය වන විට වර්ෂය තුළදී බිල් කරන ලද ප්‍රමාණය ලංකා රුපියල් මිලියන 7,869.7 ක් වූ අතර වර්ෂය වෙනුවෙන් ණය වයස මාස 2.1 ක් සමග මුදල් රැස් කිරීම ලංකා රුපියල් මිලියන 8,457.2 ක් විය.

විසල් කොළම ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩ සටහන් ව්‍යාපෘතිය සමග සිදු කරනු ලබන ආදායම් රහිත ජලය අඩු කිරීමේ වැඩ සටහන් මගින් 2022 වර්ෂයේ අවසානය වන විට කොළඹ නගරයේ ආදායම් රහිත ජල පරිමාවේ ප්‍රතිශතය සියයට 18 ක් දක්වා අඩු කිරීමට ඉලක්ක කරනු ලැබ ඇත. ප්‍රස්තුත වර්ෂය තුළදී කොළඹ නගරය තුළ ආදායම් රහිත ජල පරිමාව සියයට 39.22 ක් සිට 34.75 ක් දක්වා අඩු වී ඇති අතර සියළුම දිස්ත්‍රික් මණ්ඩ කිරීම් ප්‍රදේශයන් පිහිටුවීම සම්පූර්ණයෙන් නිම කිරීමෙන් අනතුරුව සියයට 18 ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. දැනටමත් පිහිටුවීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති දිස්ත්‍රික් මණ්ඩ කිරීම් ප්‍රදේශයන් තුළ සියයට 18 ට වඩා අඩු ආදායම් රහිත ජල පරිමාවන් වාර්තා කරනු ලැබ තිබේ. කොළඹ නාගරික ප්‍රදේශයට පිටින් බටහිර මධ්‍යම කලාපය තුළ ඉහළම ආදායම් රහිත ජල ප රිමාව වාර්තා කරන ලද කෝට්ටේ කලාපය තුළ දැනට වාර්තා වන ආදායම් ජල ප්‍රතිශතය සියයට 29 ක් වේ. මේ අතර කලාපය තුළ තිබෙන්නා වූ පැරණි ජලය බෙදා හැරීමේ ජාලය හා ඊට අදාල ව්‍යුහයන් පුනරුත්ථාපනය කොට ප්‍රති ස්ථාපනය කිරීම අරමුණු කොට ගත් සැලැසුම් පිළියෙල කිරීමේ වැඩ කටයුතු දැනට සිදු කරගෙන යනු ලබමින් පවතී. 2040 වර්ෂය වෙනුවෙන් ප්‍රක්ෂේපණය කරනු ලැබ ඇති ජල ඉල්ලුම නිවැරදි ආදායම් රහිත ජල පරිමාව කළමනාකරණය කිරීමේ ක්‍රමෝපායයන් තිරසාර ලෙස යොදා ගනිමින් සපුරා ලීම ඉලක්ක කර ගනිමින් පුබ්බිලි කෝට්ටේ ප්‍රදේශයේ 01 වැනි පැකේජය තුළ ජල සම්පාදන පහසුකම් ඉහළ ශ්‍රේණිගත කිරීම සඳහා සහ කොලොන්නාව ප්‍රදේශයේ 01 වැනි පැකේජය තුළ හා 02 වැනි පැකේජය තුළ ජල සම්පාදන පහසුකම් ඉහළ ශ්‍රේණිගත කිරීම සඳහා අදාල සැලැසුම් පිළියෙල කරන ලද අතර දැනට එම කටයුතු ප්‍රතිසම්පාදන පියවර තුළ පවතී.

ලෝක වසංගත තත්ත්වය හේතුකොට ගෙන වෙළෙඳ පොල තුළ ඇති වූ ද්‍රව්‍ය හිඟයේ හා ශ්‍රම හිඟයේ බල පෑම නිසා පුනරුත්ථාපන කටයුතු කිරීමේ ප්‍රගතිය අඩු වුව ද ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ලංකා රුපියල් මිලියන 245.8 ක් වූ මුළු වෙන් කිරීම අතුරින් ලංකා රුපියල් මිළියන 116.6 ක් වූ මුදල් ප්‍රමාණයක් වැය කරමින් වැඩ කටයුතු සිදු කරනු ලැබ ඇත. ජල ගුණාත්ම අවේක්ෂණ ඒජන්සිය වූ කොළඹ මහ නගර සභාවේ රසායනාගාරය විසින් පරීක්ෂණයට භාජනය කරන ලද ජල නියැදි 3599 ක සංඛ්‍යාවක් තුළ වූ එකම නියැදියක් තුළින් හෝ ඉකෝල් හෝ කොලිෆෝම් දක්නට ලැබුනේ නැත. මෙය සහාය සේවා මධ්‍යස්ථානය විසින් සිය පාරිභෝගිකයින් වෙත සුරක්ෂිත පානීය ජලය ලබා දෙන බව ස්ථුට කරනු ලබන සාක්ෂියක් වේ. 2021 වර්ෂය තුළදී විධිමත් දීර්ඝ කිරීමේ වැඩ සටහන් මගින් මිලි මීටර 90 සිට මිලි මීටර 225 දක්වා වූ විෂ්කම්භයන්ගෙන් යුක්ත නල භාවිතා කරමින් ආසන්න වශයෙන් කිලෝ මීටර 17.5 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ජලය බෙදා හැරීමේ දීර්ඝ කිරීම් සිදු කරන ලද අතර මහරගම කළමනාකරණ ප්‍රදේශය තුළ සියළු දෙනා වෙත ජලය වැඩ සටහන යටතේ මිලි මීටර 63 සිට මිලි මීටර 90 දක්වා වූ විෂ්කම්භයන්ගෙන් යුක්ත වූ නල භාවිතා කරමින් ආසන්න වශයෙන් කිලෝ මීටර 358.08 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල එලීම් වැඩ කටයුතු සිදු කරන ලදි. ‘‘සැමට ජලය’’ අය වැය වෙන් කිරීම් යටතේ අවිස්සාවේල්ල ව්‍යාපෘතිය හා සම්බන්ධ පෙන්රිත්වත්ත ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වර්ධනය කිරීම සැලැසුම් කොට 2021 වර්ෂයේ ජුනි මාසයේදී එහි වැඩ කටයුතු ආරම්භ කරන ලදි. ඒ අතර අවිස්සාවේල්ල හල්තොටවත්ත තුළු මුව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය දැනට මිළ ගණන් කැඳවීමේ පියවර තුළ පවතී.

යාන්ත්‍රික හා විද්‍යුත් අංශය යටතේ සංවර්ධන හා පුනරුත්ථාපන කටයුතු විශාල සංඛ්‍යාවක් වෙනුවෙන් අධ්‍යයනයන් සිදු කිරීම, ලිපි ලේඛන පිළියෙල කිරීම හා ප්‍රති සම්පාදන කටයුතු ආරම්භ කිරීම සිදු කරන ලදි. යෝජිත ව්‍යාපෘතීන් අතුරින් ඉතා වැඩි සංඛ්‍යාවක් වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තු 2021 වර්ෂය තුළදී ප්‍රදානය කළ හැකි විය. පැලන්වත්ත, පුබ්බිලි එදිරිසිංහ, පුබ්බිලි බෙදා හැරීම්, මාකුඹුර හා මහරගම තිබෙන පෝම්ප වෙනුවට නව පෝම්ප යෙදීම පැලන්වත්ත හා ගලවිලවත්ත පෝම්ප කිරීමේ ස්ථානයන්හි මෝටර කරන ලද වෑල්ව වෙනුවට නව වෑල්ව යෙදීම සම්පූර්ණයෙන් නිම කළ යුතුව තිබේ. තවද බටපොත පෝම්ප කිරීමේ ස්ථානය තුළ දිගු කාලයක් මුළුල්ලේ පැවැති ගැටළුවක් වන විදුලි ජනන යන්ත්‍රය වෙනුවට නව යන්ත්‍රයක් යෙදීමේ අවශ්‍යතාවය 2021 වසර තුළදී සාර්ථක ලෙස සම්පූර්ණයෙන් විසඳන ලදි. දැනට ක්‍රියාත්මක වන බල පද්ධතිය ඉහළ ශ්‍රේණිගත කිරීම හා මෝටර කරන ලද වෑල්ව සපයා ස්ථාපිත කිරීම වෙනුවෙන් වූ පුනරුත්ථාපන ව්‍යාපෘතීන් ලංකා රුපියල් මිලියන 44.8 ක පිරිවැයක් වැය කරමින් සම්පූර්ණයෙන් නිම කරන ලදි. මේ අතර ප්‍රස්තුත වර්ෂය තුළදී බල ශක්තිය සංරක්ෂණය කිරීමේ ක්‍රියාකාරකම් වශයෙන් ලංකා රුපියල් මිලියන 79. 9 ක පිරිවැයක් දරමින් ක්‍රියාත්මක කරනු ලබන පුනරුත්ථාපන හා බල ශක්ති ව්‍යාපෘතීන් දැනට ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවත්නා අතර එම ව්‍යාපෘතීන් විවිධ ක්‍රියාත්මක කිරීමේ පියවරයන් තුළ දැනට පවතී.

බටහිර - දකුණ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය

බටහිර - දකුණ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය බටහිර - දකුණ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ කාර්යාලයෙන් හා කළමනාකරු (දෙහිවල), කළමනාකරු (පානදුර - හොරණ) හා කළමනාකරු (කළුතර) නම් වූ කලාපීය කළමනාකරණ කාර්යාල 3 ක සංඛ්‍යාව යන අංගයන්ගෙන් සමන්විත වේ. ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 13 ක සංඛ්‍යාවක් මෙහෙයුම් කටයුතු වල යෙදී සිටින අතර විෂය පාත්‍රගත වර්ෂය තුළදී ලබා දෙන ලද නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 13000 ක සංඛ්‍යාව සමග මෙම ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය සතුව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 296000 ක මුළු සංඛ්‍යාවක් ක්‍රියාත්මක වෙමින් පවතී. මුළු නල මාර්ගික ජල සම්පාදන ආවරණය සියයට 85.1 ක්

වශයෙන් වාර්තා වන අතර ඒ අතුරින් සියයට 82. 0 ක ප්‍රතිශතයක් ක්‍රියාත්මක කරනු ලබන්නේ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයේ පරිපාලන මායිම් යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වේ.

ප්‍රස්තුත වර්ෂය තුළදී මුදල් රැස් කර ගැනීමේ ඉලක්කයෙන් සියයට 108.0 ක ප්‍රතිශතයක් අය කර ගනු ලැබූ අතර එය ජලය ඝණ මීටර මිලියන 65.5 ක ප්‍රමාණයක් අලෙවි කිරීම තුළින් උපයාගනු ලැබූ ලංකා රුපියල් මිලියන 3,067. 2 ක මුදල් ප්‍රමාණයක් විය.

සියළුම කලාපයන් තුළ ඇති තොග මණු අළුත්වැඩියා කිරීම මගින් හා දෝෂ සහිත තොග මණු වෙනුවට නව තොග මණු යෙදීම මගින් බටහිර - දකුණ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයේ ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම සඳහා පියවර ගන්නා ලදි. කිලෝ මීටර 6 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ මිලි මීටර 500 ක විෂ්කම්භයකින් යුත් ඇස්බෙස්ටෝ සිමෙන්ති නල යොදා ගනිමින් බේරුවල සිට මීනච්චිකන්ද දක්වා ක්‍රියාත්මක වූ ඇස්බෙස්ටෝ සිමෙන්ති නල මාර්ගය ප්‍රති ස්ථාපන ගත කරන ලද අතර කිලෝ මීටර 2.5 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ඇස්බෙස්ටෝ සිමෙන්ති නල යොදා ගනිමින් අළුත්ගම ප්‍රදේශය තුළ වලනු ලැබ තිබුණ ඇස්බෙස්ටෝ සිමෙන්ති නල මාර්ගය ප්‍රති ස්ථාපන ගත කරන ලදි. තවද ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම සඳහා අල්විස් පෙදෙස තුළ පිහිටා ඇති ජලාශයේ ජල කාන්දුව අළුත්වැඩියා කිරීමේ වැඩ කටයුතු දැනට සිදු කර ගෙන යනු ලබමින් පවතී. ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය විසින් ප්‍රදානය කරන ලද ‘‘ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ බටහිර දකුණ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය තුළ මෙහෙයුම් කිරීමේ කාර්යක්ෂමතාවය හා වත් කම් කළමනාකරණ හැකියාව නංවා ලීමේ’’ ව්‍යාපෘතිය හා සම්බන්ධ වැඩ කටයුතු නියමු කලාපය වන පානදුර ප්‍රදේශය තුළ ජල කාන්දු පාලනය වෙත අවධානය යොමු කිරීම තුළින් 2021.8.31 වැනි දින සම්පූර්ණයෙන් නිම කරන ලදි. බටහිර දකුණ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය යටතේ පාලනය කරනු ලබන ඉඩම් භාවිතය හා ඉඩම් ආවරණය පිළිබඳ තොරතුරු භූගෝලීය තොරතුරු පද්ධති දත්ත පද්ධතිය තුළ ගොනු කරන ලදි.

බේරුවල හා සොයිසාපුර ඇතුලත විවිධ ප්‍රදේශයන් තුළ හයි ලිෆ්ට් (high lift) ස්ථාපිත කිරීම වැනි ක්‍රියා මාර්ගයන් හරහා බල ශක්ති සංරක්ෂණය කිරීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලදි. එම වැඩ කටයුතු සඳහා අරමුදල් ලැබුණ ප්‍රභවයන් වූයේ පිළිවෙලින් ‘‘බල ශක්තිය හා පුනරුත්ථාපනය’’ වෙනුවෙන් කරන ලද අය වැය වෙන් කිරීම් වලින් වේ. 2021 වර්ෂය සඳහා මධ්‍යම වායු සම්කරණ හා සූර්ය බල පද්ධති ක්‍රමය සේවා කිරීමේ හා නඩත්තු කිරීමේ වැඩ කටයුතු සිදු කිරීම යාන්ත්‍රික හා විද්‍යුත් අංශයේ කණ්ඩායම විසින් ආරම්භ කරන ලද අතර ඒ අනුව වාර්ෂික පිරිවැය ලංකා රුපියල් 403,180.00 ක ප්‍රමාණයකින් අඩු විය. ඊට අමතර වශයෙන් යාන්ත්‍රික හා විද්‍යුත් අංශය විසින් සොයිසාපුර පිහිටි පොම්පාගාරය සම්පූර්ණයෙන් ස්වයංක්‍රිය කරණය කිරීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.



නව සේවා සම්බන්ධතා ලබා දීමේ ජංගම වැඩසටහන

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය තුළ ප්‍රථම වරට සියළුම කලාපයන් තුන තුළම බටහිර - දකුණ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් (ජල මට්ටම, ප්‍රවාහය, ජලයේ ගුණාත්මය හා පෝම්ප කිරීමේ තත්ත්වය යන ක්ෂේත්‍රයන් ආවරණය කරමින්) පුළුල් ක්ෂේත්‍ර පසුවිපරම් කිරීමේ ක්‍රමය හඳුන්වා දෙන ලදි.

AMAIWSP සමග එක් වී නව සේවා සම්බන්ධතාවයන් ලබා දීමේ ජංගම වැඩ සටහන සංවිධානය කරන ලද අතර දිනකට රැස් කර ගන්නා ලද මුළු මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 3.62 ක් විය. අයැදුම් පත් 238 ක සංඛ්‍යාවක් සඳහා වූ ඇස්තමේන්තු එම දිනයේදීම නිකුත් කරන ලදි. 2021 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනය වන විට නල මාර්ගික ජලය සඳහා දෙනු ලැබ ඇති නව සේවා සම්බන්ධතාවයන්ගේ සංඛ්‍යාව 12388 ක් විය. ප්‍රජා මූල සංවිධාන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 134 ක සංඛ්‍යාවක් මගින් ප්‍රතිලාභී පවුල් 76525 ක සංඛ්‍යාවක් වෙනුවෙන් ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 17100 ක සංඛ්‍යාවක් සම්පාදනය කර දෙන ලද අතර එවැනි යෝජනා ක්‍රමයන් 8 ක සංඛ්‍යාවක් දැනට ක්‍රියාත්මක කරනු ලබමින් තිබෙන තත්ත්වයේ පවතී. කිලෝ මීටර 123.59 ක මුළු දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල මාර්ග දීර්ඝ කිරීම් සිදු කරන ලද අතර එම මුළු දිග ප්‍රමාණය සමන්විත වන්නේ කළුතර කලාපය තුළ කිලෝ මීටර 13 කින් ද, පානදුර - හොරණ කලාපය තුළ කිලෝ මීටර 107.59 කින් හා දෙහිවල කලාපය තුළ කිලෝ මීටර 3 කින් ද වශයෙනි. ප්‍රස්තුත වර්ෂය මුළුල්ලේ සියළුම කලාපයන් තුළ ප්‍රති ආරෝපණය කළ හැකි හා පුනරුත්ථාපන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි. ‘‘ප්‍රති ආරෝපණය කළ හැකි අරමුදල්’’ යොදා ගනිමින් සැලැසුම් සකස් කිරීමේ හා ඉදි කිරීමේ වැඩ කටයුතු වැනි ක්‍රියාකාරකම් ඔෂින්ටන්වත්ත ජල සම්පාදන යෝජනා ක්‍රමය හා අනුබද්ධිත නැවත පදිංචි කිරීමේ ප්‍රදේශයක් තුළ ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවතී. වියලි කාල ගුණික තත්ත්වය හේතුකොට ගෙන කළුතර කළමනාකරණ ප්‍රදේශය ලවණතා ආක්‍රාන්තිය පිළිබඳ ගැටළුවකට මුහුණ දුන්නේය. එම ගැටළුවට තාවකාලික විසඳුමක් වශයෙන් කළුතර කළමනාකාර වරයාගේ මුළු ප්‍රදේශය ආවරණය වන සේ බවුසර මගින් ජලය සපයා දීමේ සේවාවක් ආරම්භ කරන ලදි. කළුතර කලාපයේ ලවණතා ආක්‍රාන්තිය පිළිබඳ ගැටළුවට මධ්‍ය කාලීන විසඳුමක් වශයෙන් වියලි කාල ගුණික තත්ත්වය පවතින කාල සීමාවන් තුළදී කෙත්හේන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත අමු ජලය සම්ප්‍රේෂණය කිරීම ඉලක්ක කර ගනිමින් කොලේමෝදර ඉදි කරනු ලබන තුළු මුව ඉදි කිරීමේ වැඩ කටයුතු වලින් සියයට 90 ක් පමණ දැනට සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. තවද කළු ගඟෙහි මෝය අසල ලවණතා බාධකයක් ඉදි කිරීම ඉලක්ක කර ගනිමින් වාරි මාර්ග දෙපාර්තමේන්තුව විසින් දැනට සාධ්‍යතා අධ්‍යයනයක් පවත්වාගෙන යනු ලබමින් පවතී.

2021 - 2025 සංයුක්ත සැලැසුම තුළට ඇතුලත් කරනු ලැබ ඇති පහත දැක්වෙන ප්‍රධාන ව්‍යාපෘතීන් සඳහා සැලැසුම් පිළියෙල කිරීමේ වැඩ කටයුතු 2021 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි. එම ව්‍යාපෘතීන් නම් ඉංගිරිය ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීම, කඳාන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාවය වැඩි දියුණු කිරීම, අල්විස් පෙදෙසෙහි සිට වාද්දුව දක්වා ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය විලීම හා කෙත්හේන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ සිට මධ්‍යම හන්දිය දක්වා මිලි මීටර 500 ක විෂ්කම්භයකින් යුක්ත වූ මෘදු යකඩ නල මාර්ගය විලීම ද වේ. කළුතර දිස්ත්‍රික්කයේ මතුගම - අගලවත්ත ප්‍රදේශයන් තුළ ජලය බෙදා හැරීම පුළුල් කිරීම හා සම්බන්ධ සැලැසුම් පිළියෙල කිරීමට අමතර වශයෙන් කෙත්හේන වැඩි දියුණු කිරීමට හා පුළුල් කිරීමට අදාල පූර්ව සාධ්‍යතා අධ්‍යයනයේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි. කළු ගඟ ජල ධාරකයේ ආරක්ෂාව සඳහා වූ බහු පරදු ධාරී ප්‍රවේශය පිළිබඳ පූර්ව සාධ්‍යතා අධ්‍යයනය දැනට සිදු කරගෙන යනු ලබමින් පවතී. වලල්ලාවිට ජල සම්පාදන යෝජනාව සම්බන්ධයෙන් සිදු කරන ලද පූර්ව සාධ්‍යතා අධ්‍යයනයේ වාර්තාව සඳහා ව්‍යාපෘති අගැයීම් කමිටුවේ අනුමැතිය ලබා ගන්නා ලදි.

ඉංගිරිය - හඳපාන්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය යෝජනා කරන ලද්දේ පානදුර - හොරණ කළමනාකරුගේ කලාපය තුළ සේවා ආවරණය වැඩි දියුණු කිරීම අරමුණු කරගනිමින් වේ.

කුඹුක ජල සම්පාදන යෝජනා ක්‍රමය විසින් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වන ලද ජල සුරක්ෂිතතා සැලැසුම පිළිබඳ බාහිර විගණනය අනුව "අති උත්කෘෂ්ඨ" තත්ත්වය සාක්ෂාත් කර ගන්නා ලදි. මේ අතර බටහිර දකුණු ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය හා දෙහිවල කළමනාකාර කාර්යාලය විසින් "2020 වර්ෂය සඳහා වූ ජාතික ඵලදායිතා ප්‍රදාන විශේෂ ප්‍රශංසාව" දිනා ගන්නා ලදි. ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් හොරණ හා මතුගම අධ්‍යාපනික කලාපය තුළ සමාජ මාධ්‍ය (whats App) මඟින් 2021 වර්ෂයේ ලෝක ජල දිනය වෙනුවෙන් පෝස්ටර තරඟයක් සංවිධානය කරන ලදි. ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය සහ ඉදි කිරීම් අංශය විසින් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ පිළිගැනීම දිනා ගන්නා ලදි. ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ (ISO) 17025 රසායනාගාර සම්මාන පිළිගැනීම වර්ෂ 2024 දක්වා අළුත් කර ලබා ගන්නා ලදි. පුනරුත්ථාපන හා ආදායම් රහිත ජල අය වැය ලේඛන විසින් 2021 වර්ෂය වෙනුවෙන් ආසන්න වශයෙන් සියයට 100 ක සාර්ථකත්වයක් සාක්ෂාත් කර ගන්නා ලදි.

2022 ලෝක ජල දිනය වෙනුවෙන් සංවිධානය කරන්නට යෝජිත පෝස්ටර තරඟය සැලැසුම් කරනු ලැබ ඇති අතර එය දැන් ප්‍රතිසම්පාදන පියවර තුළ පවතී.

සියළුම කලාපයන් තුන විසින්ම මණු කියවීමේ යෙදවුම මෘදුකාංගය උපයෝගී කර ගනිමින් සිය මණු කියවීම් සියයට 100 ක් ලබාගෙන ඇත. විශේෂ විමර්ෂණ ඒකකය විසින් 2021 වර්ෂය තුළදී නීති විරෝධී සේවා සම්බන්ධතාවයන් 434 ක සංඛ්‍යාවක් පරීක්ෂණයට භාජනය කරන ලද අතර ඒ අතුරින් නීති විරෝධී සේවා සම්බන්ධතාවයන් 46 ක සංඛ්‍යාවක් තහවුරු කර ගැනීමට හැකි විය.

බටහිර උතුර ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය

ශ්‍රී ලංකාවේ දෙවැනි විශාලතම ජන ගහණය ජීවත් වන දිස්ත්‍රික්කය ආවරණය කරනු ලබන බටහිර - උතුර ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් මුළු මහත් ගම්පහ දිස්ත්‍රික්කය වෙත බීමට යෝග්‍ය පානීය ජලය සම්පාදනය කර දීමේ වගකීම දරනු ලබයි. ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 21 ක සංඛ්‍යාවක් මෙහෙයුම් කටයුතු වල යෙදී සිටින අතර ප්‍රස්තුත වර්ෂය තුළදී ලබා දෙන ලද නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 27000 ක සංඛ්‍යාවත් සමග සහාය සේවා මධ්‍යස්ථානය සතුව 332000 ක ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් මුළු සංඛ්‍යාවක් ක්‍රියාත්මක වේ. දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක වන මුළු නල මාර්ගික ජල සම්පාදන ආවරණය සියයට 57.5 ක් වශයෙන් වාර්තා වන අතර ඒ අතුරින් සියයට 51.7 ක ප්‍රතිශතයක් ක්‍රියාත්මක කරනු ලබන්නේ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයේ පරිපාලන මායිම් යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වේ. 2021 වර්ෂය තුළදී දිනකට ජලය ඝණ මීටර 180000 ක ජල ප්‍රතිකාරක ධාරිතාවයකින් යුක්ත වූ කැළණිය දකුණු ඉවුර 2 වැනි පියවර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද අතර ඒ මගින් කැළණිය, බියගම, මහර, වත්තල හා ජා ඇල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් වෙත සපයනු ලබන සේවාවන්ගේ තත්ත්වය වැඩි දියුණු වී ඇත. මීට අමතර වශයෙන් දිනකට ජලය ඝණ මීටර 16000 ක ධාරිතාවයකින් යුක්ත වූ කටාන ජල සම්පාදන යෝජනා ක්‍රමය ප්‍රස්තුත වර්ෂය තුළදී ආරම්භ කරන ලදි.

ප්‍රස්තුත වර්ෂය තුළදී මුදල් රැස් කිරීම සඳහා පිහිටුවාගන්නා ලද ඉලක්කය සියයට 103.0 කින් සාක්ෂාත් කර ගැනීමට හැකි වූ අතර ඒ අනුව ජලය ඝණ මීටර මිලියන 86.6 ක් අලෙවි කොට උපයා ගත හැකි වූ මුළු මුදල් ප්‍රමාණය ලංකා රුපියල් මිලියන 4,221. 6 ක් විය.

ආදායම් රහිත ජල පරිමාව අඩු කර ගැනීම කෙරෙහි වඩාත් හොඳ අවධානයකින් යුතුව කටයුතු කිරීමට හැකි වන පරිදි ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ අංශයක් 2021 සැප්තැම්බර් මාසය තුළදී බටහිර උතුර ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය වෙත එකතු කර ගන්නා ලදි. ඒ යටතේ වේයන්ගොඩ ජලය බෙදා හැරීමේ පද්ධතිය තුළ තිබී හිර කපොලු හඳුනා ගෙන ඒවා වැඩි දියුණු කරන ලද අතර දැනට කැළණිය කලාපය තුළ ප්‍රවාහ මණු ස්ථාපිත කිරීම සිදු කරගෙන යනු ලැබේ. 2021 වර්ෂයේ අවසානය වන විට ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයේ ආදායම් රහිත ජල පරිමාව සියයට 19.8 ක් විය. ප්‍රස්තුත වර්ෂය තුළදී ප්‍රති ආරෝපණය කළ හැකි අය වැය වෙන් කිරීම් යටතේ ලංකා රුපියල් මිලියන 52.65 ක ඉදි කිරීම් කටයුතු සිදු කරන ලදි.

වේයන්ගොඩ, යක්කල හා ගම්පහ ප්‍රදේශයන් තුළ ගත වූ වසර කිහිපය මුළුල්ලේ නවතා දමා තිබුණ ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් ලබා දීමේ වැඩ කටයුතු අභ්‍යන්තරික පද්ධති වැඩි දියුණු කිරීම් හරහා ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් නැවත වරක් ආරම්භ කරන ලදි. තවද, වසර ගණනාවක් තිස්සේ මිනුවන්ගොඩ හා උඩුගම්පොල පදිංචි කරුවන් හට ලැබෙමින් පැවැතියේ දිනකට පැය 2 කට වඩා අඩු ජල සම්පාදන සේවාවක් වූ අතර එය සිදු වූයේ ජල ප්‍රභවයන් සම්බන්ධයෙන් පැන නැඟුන බාධකයන් හේතුකොට ගෙන වේ. ඒ කෙසේ වුව ද 2021 වර්ෂය තුළදී සිය ජලය බෙදා හැරීමේ පද්ධතිය වැඩි දියුණු කොට දිනකට පැය 24 ක් මුළුල්ලේ සිය පාරිභෝගික ජනතාව වෙත අබන්ධ ලෙස ජලය සම්පාදනය කර දීම සහතික කිරීමේ හැකියාව ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයට ලැබුණ අතර ඊට අමතර ලෙස නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් ලබා දීමේ හැකියාව ද ඊට උදා විය. ප්‍රාදේශීය සහාය මධ්‍යස්ථානය විසින් ගම්පහ, දිවුලපිටිය, රද්දොළුගම හා රන්පොකුණවත්ත යන ප්‍රදේශයන් තුළ ක්‍රියාත්මක වන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් හතර වර්ධනය කිරීමේ වැඩ කටයුතු ආරම්භ කරනු ලැබ ඇත. මෙම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් ඉදි කිරීමේ වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවතින අතර ගම්පහ දිස්ත්‍රික්කයේ මහ ජනතාව වෙත සපයනු ලබන ජලය ගුණාත්මක ලෙස හා ප්‍රමාණාත්මක ලෙස වැඩි දියුණු කරමින් එම ඉදි කිරීම් කටයුතු 2022 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කිරීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. සියළුම දෙනා වෙත ජලය සැපයීමේ රජයේ දැක්ම අනුව කටයුතු කරමින් ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් සේවාවන් සපයනු ලබන ප්‍රදේශය වැඩි දුරටත් පුළුල් කිරීමේ අරමුණින් යුක්තව ප්‍රස්තුත වර්ෂය තුළදී කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් කිලෝ මීටර 385 කට වැඩි දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල මාර්ග දීර්ඝ කිරීම් වලන ලදි. එලදායී තාවය වැඩි දියුණු කිරීමේ අරමුණ සහිතව ඉහතින් සඳහන් කරනු ලැබ ඇති නල මාර්ග දීර්ඝ කිරීම් සඳහා ගබඩා තුළ ඒ වන විටත් තිබුණ ද්‍රව්‍යයන් වැඩි ප්‍රමාණයක් යොදා ගනු ලැබූ අතර, සියළුම ගබඩාවන් පරිගණකගත කිරීම මඟින් හා ගම්පහ සහ යක්කල පිහිටි තනි ගබඩාවන් ඒකාබද්ධ කිරීම, එසේම මිනුවන්ගොඩ, දිවුලපිටිය, මීරිගම හා උඩුගම්පොල පිහිටි තනි ගබඩාවන් ඒකාබද්ධ කිරීම හා කිරිඳිවෙල, පූගොඩ හා රද්දොළුගම පිහිටි තනි ගබඩාවන් ඒකාබද්ධ කිරීම යන පියවරයන් අනුගමනය කරමින් තොග මට්ටම් සාධාරණ මට්ටමක පවත්වාගෙන යනු ලැබීමට කටයුතු කරන ලදි. ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය තුළ වත් කම් කළමනාකරණ අංශය හඳුන්වා දෙන ලද අතර ප්‍රස්තුත වර්ෂය තුළදී නියමු වත් කම් කළමනාකරණ වැඩ සටහන මෙහෙයවන ලදි.



2021 සැප්තැම්බර් කටාන ජල සම්පාදන සේවා සම්බන්ධ කිරීමේ වැඩසටහන

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද මධ්‍යම පරිමාණ වර්ගයට අයත් සේවා අංශයේ ඵලදායිතා ප්‍රදානයන් අතුරින් තුන් වැනි ස්ථානය දිනා ගැනීමට කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් සමත් වන ලදි. මීට වැඩිමනත් වශයෙන් කැළණිය ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය විසින් කුඩා පරිමාණ සේවා වර්ගයේ විශේෂ ප්‍රශංශාව හිමි කර ගන්නා ලදි. කලාපය තුළ ක්‍රියාත්මක වන වෙනත් කාර්යාලයන් හතක් විසින් ද එකී වර්ගය වෙනුවෙන්ම ප්‍රශංසාවන් දිනා ගන්නා ලදි. කැළණියේ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය විසින් හා කළමනාකරුගේ කාර්යාලය විසින් ජාතික ඵලදායිතා ආයතනය විසින් 2021 වර්ෂය තුළ පිරිනමන ලද "5 S" සහතිකය දිනා ගන්නා ලදි. ලෝක බැංකු සහාය යටතේ ගම්පහ දිස්ත්‍රික්කය තුළ පූතික ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම සඳහා සාධ්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම ප්‍රාදේශීය සහාය මධ්‍යස්ථානය විසින් ආරම්භ කරන ලදි. මුළු වර්ෂය පුරාම බටහිර උතුර ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකා ප්‍රමිති 614 : 2013 ට අනුකූල වන සේ පානීය ජලය සම්පාදනය කර දෙන ලදි. ඊට වැඩිමනත් වශයෙන් ජල සුරක්ෂිතතා සැලැසුම හා සම්බන්ධ ජයග්‍රහණයන් කිහිපයක් සාක්ෂාත් කර ගැනීමට ද ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් සමත් වන ලදි.

දකුණු ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය

දකුණු ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ආවරණය කරනු ලබන ප්‍රදේශය ගාල්ල, මාතර හා හම්බන්තොට නම් වූ කළමනාකරණ කලාපයන් 3 ක සංඛ්‍යාවෙන් සමන්විත වන අතර ගාල්ල, මාතර හා හම්බන්තොට නම් වූ දිස්ත්‍රික්කයන් ඇතුලත් භූගෝලීය ප්‍රදේශය ආවරණය කරනු ලබයි. එකී ප්‍රදේශය තුළ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 51 ක සංඛ්‍යාවක් විසින් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන අතර විෂය පාත්‍රගත වර්ෂය තුළදී ලබා දෙන ලද නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 18000 ක සංඛ්‍යාව සමග මෙම ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය සතුව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 361000 ක මුළු සංඛ්‍යාවක් ක්‍රියාත්මක වෙමින් පවතී. මුළු නල මාර්ගික ජල සම්පාදන ආවරණය සියයට 62.0 ක් වශයෙන් වාර්තා වන අතර ඒ අතුරින් සියයට 50. 0 ක ප්‍රතිශතයක් ක්‍රියාත්මක කරනු ලබන්නේ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයේ පරිපාලන මායිම් යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වේ.

ප්‍රස්තුත වර්ෂය තුළදී මුදල් රැස් කිරීම සඳහා පිහිටුවාගන්නා ලද ඉලක්කය සියයට 104.0 කින් සාක්ෂාත් කර ගැනීමට හැකි වූ අතර ඒ අනුව ජලය ඝණ මීටර මිලියන 73. 4 ක් අලෙවි කොට උපයා ගත හැකි වූ මුළු මුදල් ප්‍රමාණය ලංකා රුපියල් මිලියන 2,953.2 ක් විය.

හානි වලක්වා ලීමේ නඩත්තු වැඩ සටහන් මෙහෙයවීම තුළින් හා නීති විරෝධී සේවා සම්බන්ධතාවයන් හඳුනා ගැනීමට කටයුතු කිරීම තුළින් ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම සඳහා පියවර ගන්නා ලදි. වේගවත් කරන ලද ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ වැඩ සටහන යටතේ ගාල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය, අම්බලන්තොට - අඟුනකොලපැලැස්ස - නුංගම - රිදියගම ඒකාබද්ධ ජලය බෙදා හැරීමේ ප්‍රදේශයන්, බලපිටිය ජල සම්පාදන යෝජනා ක්‍රමය හා අම්බලන්ගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය ක්‍රමය පුනරුත්ථාපනය කිරීමේ ආදායම් රහිත ජල කළමනාකරණය අවශ්‍ය ප්‍රමුඛතා යෝජනා ක්‍රමයන් වශයෙන් හඳුනා ගන්නා ලදි. සියයට 30 සිට සියයට 40 ක් දක්වා වූ ඉහළ ආදායම් රහිත ජල පරිමා ප්‍රතිශතයක අගයක් සහිත ගාල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ව්‍යාපෘති අගැයීම් කමිටුවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති අතර ඒ අනුව දිස්ත්‍රික් මණු කිරීම් වැඩ පිළිවෙල පදනම් කර ගත් ද්‍රාව ආකෘතිකරණය සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. නල සම්පාදනය කොට විලීම සඳහා වූ ප්‍රමාණ පත්‍රයන් පිළියෙල කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ තිබේ. මිළ ගණන් කැඳවීමේ ලේඛනය දැනට පිළියෙල කරගෙන යනු ලබමින් පවතී. ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන පිළියෙල කරගෙන යනු ලබමින් පවතී. අනිකුත් ව්‍යාපෘති තුන වෙනුවෙන් සැලැසුම් පිළියෙල කිරීමේ කටයුතු දැනට දැනට සිදු කරගෙන යනු ලබමින් පවතී. ගාල්ල, මාතර හා හම්බන්තොට කලාපයන් තුළ ජලය බෙදා හැරීමේ පද්ධති හා සම්බන්ධ සිතියම් පිළියෙල කිරීමේ කටයුතු දැනට සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

බල ශක්ති සංරක්ෂණය කිරීමේ වැඩ සටහන යටතේ මාතර කාර්යාලය සඳහා සූර්ය බල ශක්ති පැනලයක් ස්ථාපිත කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව හා අකාර්යක්ෂම පෝම්ප වෙනුවට ඇළුත් පෝම්ප සවි කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව නම් වූ කොන්ත්‍රාත්තු දෙක සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. මීට වැඩිමනත් වශයෙන් දකුණු පලාත තුළ හඳුනාගනු ලැබ ඇති යාන්ත්‍රික හා විද්‍යුත් ගැටළු නිවැරදි කිරීම සඳහා යාන්ත්‍රික හා විද්‍යුත් අංශය විසින් නව කොන්ත්‍රාත්තු 19 ක සංඛ්‍යාවක් ආරම්භ කරනු ලැබ තිබේ.



හලල්ල ජල සම්පාදන ව්‍යාපෘතියේ පියවර අංක 1 - කැටි ගස්වනය හා අවසාදන ටැංකිය

පුනරුත්ථාපන අය වැය වෙන් කිරීම යටතේ ලංකා රුපියල් මිලියන 115. 65 ක පිරිවැයක් දරමින් මාලිම්බඩ හා වක්වැල්ල වෙනුවෙන් කොටු දොර වෑල්ව (Penstock Valves) ස්ථාපිත කිරීම, මාතර රසායනාගාරය සඳහා පාර ජම්බුල දැක්වෙන වර්ණාවලී දීප්තිමානයක් (UV visible spectrophotometer) ස්ථාපිත කිරීම, මාලිම්බඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් පොරොත්තු විදුලි ජනන යන්ත්‍රයක් සහ පැති චූෂණ කේන්ද්‍රාපසාරී පෝම්ප (Side suction centrifugal pumps) සම්පාදනය කොට ස්ථාපිත කිරීම, පිටිගල ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් පෝම්ප කිරීමේ කට්ටල සම්පාදනය කර දීම, ගාල්ල කලාපය වෙනුවෙන් විද්‍යුත් චුම්බක ප්‍රවාහ මණු (Electromagnetic flowmeters) සම්පාදනය කිරීම, අඟුනකොලපැලැස්ස ජල සම්පාදන යෝජනා ක්‍රමය හා කතරගම ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් ඇලුමිනියම් ක්ලෝරයිඩ් හා පොලිමර් මාත්‍රා කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීම, අම්බලන්තොට ජල සම්පාදන යෝජනා ක්‍රමය හා තංගල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් රික්ත වර්ගයේ වායු ක්ලෝරිනීකරණයන් සපයා දීම හා රිදියගම ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් විදුලි බලයෙන් ක්‍රියා කරන කේන්ද්‍රාපසාරී පෝම්ප කට්ටල ස්ථාපිත කරනු ලැබීම සිදු කොට තිබේ. ඒ හැර සූරියවැව ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් මෝටර මගින් ක්‍රියාත්මක කරනු ලබන වෑල්ව සම්පාදනය කොට ස්ථාපිත කරනු ලැබීම සිදු කොට ඇති අතර සිවිල් වැඩ කටයුතු වශයෙන් නාදුගල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා වක්වැල්ල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය තුළ වේගවත් වැලි පෙරණයන් තුළ පෙරීම් මාධ්‍ය ඇළුත් කිරීම හා හික්කඩුව අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ පල්දෝරු නල පිරිසිදු කිරීම හා මාලිම්බඩ ජල සම්පාදන යෝජනා ක්‍රමයේ නල උපකාරක ඉදි කිරීම ද, කුඩාවැල්ල, කරගොඩ උයන්ගොඩ හා දෙනියායේ නිල නිවාස ඉදි කිරීමේ වැඩ කටයුතු ද, හපුගල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය තුළ වේගවත් වැලි පෙරණයන් පුනරුත්ථාපනය කිරීම හා බීක්ක ස්ථාන භාර නිලධාරි කාර්යාලයේ ගබඩා ගොඩනැගිල්ල හා මාර්ගය ඉදි කිරීම හා බද්දේගම නැලගම කලාපීය ගබඩාව ඉදි කිරීමේ වැඩ කටයුතු හා කට්ටකඩුව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පරිශ්‍රය තුළ ගොහොදු මඩ වියලන ස්ථානයන් ඉදි කිරීමේ වැඩ කටයුතු ද සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ගෘහස්ත සේවා සම්බන්ධතාවයන් ප්‍රති සංවිධානය කිරීමේ හා හම්බන්තොට කිලෝ මීටර 100000 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන මාර්ග සංවර්ධන

ව්‍යාපෘතියට සමාන්තර ලෙස නැවත නල එලීමේ සේවා කොන්ත්‍රාත්තු ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

ඉදි කිරීම් වැඩ කටයුතු යටතේ තිස්සමහාරාම ජල සම්පාදන යෝජනා ක්‍රමය වර්ධනය කිරීමේ පළමු අදියර සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. එහිම දෙවැනි අදියරෙහි දැනට ප්‍රගතිය සියයට 6 ක් වේ. වීරමිණියාය බන්ධනාගාර සංකීර්ණය වෙත පානීය ජල පහසුකම් සම්පාදනය කර දීම සඳහා මෙන්ම අඟුනකොලපැලැස්ස ප්‍රදේශයේ ජීවත් වන මිනිසුන් වෙත සේවය ලබා දීම සඳහා ද නැවත ආරෝපණය කළ හැකි (බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ) අරමුදල් යටතේ අඟුනකොලපැලැස්ස පෝම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය එලීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරන ලදි. මාතර කෙටි කාලීන වැඩි දියුණු කිරීමේ ප්‍රාග්ධන අය වැය වෙන් කිරීම (ශ්‍රී ලංකා ජන රජය) යටතේ ලැබුන අරමුදල් උපයෝගී කර ගනිමින් නයිගල සිට කුමාරතුංග මාවත දක්වා සහ වලස්ගල අයිස් නිෂ්පාදන යන්ත්‍රාගාරයේ සිට බෙලිඅත්ත මාර්ගය හා දික්වැල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ දියඇල වෙත සිදු කරන ලද නල මාර්ග දීර්ඝ කිරීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. හල්ලල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉහළ ශ්‍රේණිගත කිරීමේ වැඩ කටයුතු වල භෞතික ප්‍රගතිය - අදියර අංක 1 සියයට 21 ක් වේ.

2021 වර්ෂයේ අවසානය වන විට දකුණු පලාත තුළ ක්‍රියාත්මක වන ජල සම්පාදන යෝජනා ක්‍රම 53 අතුරින් ජල සම්පාදන යෝජනා ක්‍රම 44 ක සංඛ්‍යාවක් තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කරනු ලැබ තිබේ. ජල සම්පාදන යෝජනා ක්‍රම 53 ක සංඛ්‍යාව අතුරින් ජල සම්පාදන යෝජනා ක්‍රම 38 ක සංඛ්‍යාවක් තුළ සියළුම මොඩියුල 11 ම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ජල සම්පාදන යෝජනා ක්‍රම 34 ක සංඛ්‍යාවක් තුළ අභ්‍යන්තර අවිධිමත් විගණනයන් සිදු කරනු ලැබ ඇති අතර එම විගණනයන් තුළදී ඒවා සම්බන්ධයෙන් තක්සේරු කරනු ලැබ ඇති ලකුණු ප්‍රමාණයන් වන්නේ ලකුණු 79 සිට 102 ක් දක්වා වන (හොඳ හා සාමාන්‍ය ශ්‍රේණි පරාමාවන්) වේ. ඉන් පසුව ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 31 ක සංඛ්‍යාවක් අභ්‍යන්තර විධිමත් විගණනයන්ට භාජනය කරන ලද අතර එහිදී තක්සේරු කරන ලද ලකුණු ප්‍රමාණයන් වන්නේ ලකුණු 91 සිට 110 ක් දක්වා වන (ඉතා හොඳ හා හොඳ ශ්‍රේණි පරිමාවන්) වේ. ඉන් පසුව ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 23 ක සංඛ්‍යාවක් බාහිර අවිධිමත් විගණනයන්ට භාජනය කරන ලද අතර එහිදී තක්සේරු කරන ලද ලකුණු ප්‍රමාණයන් වන්නේ ලකුණු 79 සිට 114 ක් දක්වා වන (සාමාන්‍ය හා උත්කෘෂ්ඨ ශ්‍රේණි පරිමාවන්) වේ. ඉන් පසුව ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 14 ක සංඛ්‍යාවක් වෙනුවෙන් බාහිර විධිමත් විගණන පරීක්ෂණයන් සිදු කරන ලද අතර එහිදී තක්සේරු කරන ලද ලකුණු ප්‍රමාණයන් වන්නේ ලකුණු 91 සිට 114 ක් දක්වා වන (හොඳ හා ඉතා හොඳ ශ්‍රේණි පරිමාවන්) වේ. අංශයන් සැලැසුම් කිරීමේ වැඩ කටයුතු යටතේ ඇමුණුම් අංක 2 යටතේ වූ ව්‍යාපෘතීන් 14 ක සංඛ්‍යාවක් වෙනුවෙන් ද, ඇමුණුම් අංක 3 යටතේ වූ එක් ව්‍යාපෘතියක් වෙනුවෙන් හා ඇමුණුම් අංක 4 යටතේ වූ එක් ව්‍යාපෘතියක් වෙනුවෙන් ද ව්‍යාපෘති අගැයුම් කමිටුවේ අනුමැතිය ලබාගනු ලැබ තිබේ. ඇමුණුම් අංක 4 යටතේ වූ ව්‍යාපෘතීන් 4 ද සංඛ්‍යාවක් වෙනුවෙන් පූර්ව සාධ්‍යතා අධ්‍යයනයන් සිදු කරනු ලැබ අදාල වාර්තා පිළියෙල කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ සැලැසුම් කරන ලද ලුණුගම්වෙහෙර වීකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන තිබේ. බරවකුඹුර ජල සම්පාදන ව්‍යාපෘතියේ අදියර අංක 11 (A2 – 49) යටතේ යෝජනා කරනු ලැබ ඇති ජන්දුර හා ඉහළගම ජලය බෙදා හැරීම පුළුල් කිරීමේ ව්‍යාපෘතීන් හා රුහුණුපුර ජල සම්පාදන යෝජනා ක්‍රමයේ අදියර අංක 11 (A 4 – 63) යටතේ යෝජනා කරනු ලැබ ඇති මහඇළුත්ගම් ආර ජලය බෙදා හැරීම පුළුල් කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් වූ නල එලීමේ රේටි කොන්ත්‍රාත්තු ප්‍රදානය කරනු ලැබ ඇත. උඩුගම ජල සම්පාදන ව්‍යාපෘතිය (A 2 – 45), බරවකුඹුක ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර අංක 11 (A2 – 49) හා කතරගම ජල සම්පාදන ව්‍යාපෘතිය (කෙටි කාලීන) (A 2 – 47) පිටිගල ජල සම්පාදන ව්‍යාපෘතිය (A 2 – 44) හා වකමුල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය 11 වැනි අදියර (A 2 – 54) යටතේ වූ යෝජිත ජලය බෙදා හැරීමේ පද්ධතීන් වෙනුවෙන් වූ සැලැසුම් වැඩ කටයුතු, ද්‍රාව ආකෘතිකරණ කටයුතු හා පොකුරු කොන්ත්‍රාත් පැකේජ සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර මුළු දිග ප්‍රමාණය කිලෝ මීටර 833 ක් වේ. කතරගම ජල සම්පාදන ව්‍යාපෘතිය (කෙටි කාලීන) කලාප අංක 11 (A 2 – 47) යටතේ භූමි ජලාශයන් 2 ක සංඛ්‍යාවක් ඉදි කිරීම සඳහා වූ සිවිල් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලැබ ඇත.

ග්‍රාමීය ජල සම්පාදන වැඩ කටයුතු යටතේ මහඇළුත්ගම්ආර, ඉහළගම හා දෙනිය පිංගම නම් වූ ප්‍රජා මූල ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 4 ක සංඛ්‍යාව භාර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලද අතර ඉන් පසුව ඒවා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පද්ධතීන් සමග සම්බන්ධ කරනු ලැබ ඇත. ප්‍රජා මූල සංවිධාන යෝජනා ක්‍රමයන් 9 ක සංඛ්‍යාවක් හා ප්‍රාදේශීය සභා යෝජනා ක්‍රමයන් 02 ක සංඛ්‍යාවක් භාර ගනු ලැබීමේ ක්‍රියා පටිපාටිය බොහෝ දුරට නිම කරනු ලැබ ඇත. හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකු ගඩු රෝගය පාලනය කිරීමේ අරමුදල් යටතේ ගොන්නෝරුව, සූරියවැව හා මවුසිරිගම යන ප්‍රදේශයන් යා කරමින් කිලෝ මීටර 12 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල මාර්ගය එලීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ලංකා රුපියල් මිලියන 5.25 ක පිරිවැයක් දරමින් හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකු ගඩු රෝග යේ බල පෑමට ගොදරු වී ඇති ප්‍රදේශයන් තුළ ජීවත් වන ජනතාව අතර බවුසර මඟින් ජලය බෙදා හරින්නට අවශ්‍ය කටයුතු කරන ලදි.

ක්‍රම සම්පාදන හා සැලැසුම් පිළියෙල කිරීමේ වැඩ කටයුතු යටතේ කතරගම, බද්දේගම හා උඩුගම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් වර්ධනය කිරීමේ හා බරවකුඹුක, මොරවක හා වකමුල්ල නම් වූ ප්‍රදේශයන් තුළ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් ඉදි කිරීමේ වැඩ කටයුතු වලට අදාල සැලැසුම් පිළියෙල කිරීමේ හා ලිපි ලේඛන පිළියෙල කිරීමේ වැඩ කටයුතු ක්‍රම සම්පාදන හා සැලැසුම් පිළියෙල කිරීමේ අංශය විසින් 2021 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලද අතර අදාල ප්‍රතිසම්පාදන වැඩ කටයුතු දැනටමත් ආරම්භ කරනු ලැබ ඇත. ඊට අමතර වශයෙන් මාතර පියවර අංක IV දරන ජලය බෙදා හැරීමේ ජල සම්පාදන ව්‍යාපෘතියට හා බද්දේගම කෙටි කාලීන වැඩි දියුණු කිරීම් වලට අදාල නල එලීමේ කොන්ත්‍රාත්තු සම්පූර්ණයෙන් නිම කරන ලදුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත භාර දෙනු ලැබ ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ යෝජනා කරන ලද ලුණුගම්වෙහෙර වීකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ කිලෝ මීටර 78. 3 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ සම්ප්‍රේෂණ නල මාර්ගය හා කිලෝ මීටර 367 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ ජලය බෙදා හැරීමේ පද්ධතිය හා සම්බන්ධ නල එලීම සඳහා වූ සැලැසුම් පිළියෙල කිරීමේ වැඩ කටයුතු හා ප්‍රමාණ පත්‍ර හා මිළ ගණන් කැඳවීමේ ලිපි ලේඛන පිළියෙල කිරීමේ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

දකුණු පලාත තුළ ආරක්ෂිත ජල සම්පාදනයක් කරනු ලැබීම සහතික කිරීම සඳහා මාතර කලාපයෙන් ලබා ගත් ජල නියැදි 2977 ක සංඛ්‍යාවක් ද, හම්බන්තොට කලාපයෙන් ලබා ගත් ජල නියැදි 2039 ක සංඛ්‍යාවක් හා ගාල්ල කලාපයෙන් ලබා ගත් ජල නියැදි 1801 ක සංඛ්‍යාවක් ද පරීක්ෂණයට බඳුන් කරන ලදුව ඒවායේ පරීක්ෂණ වාර්තා අදාල ප්‍රජා මූල සංවිධානයන් වෙත හා ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත.

2021 වර්ෂයේ සිදු කරන ලද තොග හරි වැරදි බැලීමට අනුව වර්ෂ 2021. 12. 31 වැනි දිනට දකුණු කලාපය තුළ ඇති තොග වටිනාකම ආසන්න වශයෙන් ලංකා රුපියල් මිලියන 742 ක් වූ අතර භාවිතයට ගනු නොලබන තොග වල අගය ලංකා රුපියල් මිලියන 39 ක් ද, මද වශයෙන් භාවිතයට ගනු ලබන තොග වල වටිනාකම ලංකා රුපියල් මිලියන 37 ක් හා ප්‍රයෝජනයට ගත නොහැකි තොග වල වටිනාකම ලංකා රුපියල් මිලියන 04 ක් ද විය. ප්‍රයෝජනයට ගත නොහැකි තොග වෙන්දේස කිරීම සඳහා දැනටමත් පොල්වත්ත ප්‍රධාන ගබඩාව වෙත භාර දෙනු ලැබ ඇත.

වාණිජ ක්‍රියාකාරකම්, ඉහළ ඝණත්වයේ පොලි එතිලීන් නල ස්ථාපිත කිරීම හා ජල කාන්දු අළුත්වැඩියා කිරීම, (MPOS) යන්ත්‍රය හඳුන්වා දීම, විගණන සැලැසුම පිළියෙල කිරීම, ඉන්වෙන්ටරි කළමනාකරණ

ක්‍රමය, ජල GEMS හා ජලය බෙදා හැරීමේ හා සම්ප්‍රේෂණය කිරීමේ ක්‍රම ආකෘතිකරණය සඳහා භාවිතා කළ හැකි මෘදුකාංග ආදී විවිධ ක්ෂේත්‍රයන් වල පුහුණු වැඩ සටහන් මෙහෙයවන ලදි.

වයඹ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය

වයඹ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය කලාපය කුරුණෑගල හා පුත්තලම කළමනාකරණ කලාපයන්ගෙන් සමන්විත වන අතර ඒ මඟින් කුරුණෑලගල දිස්ත්‍රික්කය හා පුත්තලම දිස්ත්‍රික්කය නම් වූ භූගෝලීය ප්‍රදේශයන් දෙක ආවරණය කරනු ලබයි. එකී ප්‍රදේශය තුළ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 16 ක සංඛ්‍යාවක් විසින් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන අතර විෂය පාත්‍රගත වර්ෂය තුළදී ලබා දෙන ලද නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 13000 ක සංඛ්‍යාව සමග මෙම ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය සතුව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 108000 ක මුළු සංඛ්‍යාවක් ක්‍රියාත්මක වෙමින් පවතී. මුළු නල මාර්ගික ජල සම්පාදන ආවරණය සියයට 28.6 ක් වශයෙන් වාර්තා වන අතර ඒ අතුරින් සියයට 14.6 ක ප්‍රතිශතයක් ක්‍රියාත්මක කරනු ලබන්නේ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ පරිපාලන මායිම් යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වේ.

ප්‍රස්තුත වර්ෂය තුළදී මුදල් රැස් කිරීම සඳහා පිහිටුවාගන්නා ලද ඉලක්කය සියයට 103.0 කින් සාක්ෂාත් කර ගැනීමට හැකි වූ අතර ඒ අනුව ජලය ඝණ මීටර මිලියන 21.4 ක් අලෙවි කොට උපයා ගත හැකි වූ මුළු මුදල් ප්‍රමාණය ලංකා රුපියල් මිලියන 769. 7 ක් විය. එකී උපයා ගැනීම ඉතිහාසය තුළ උපයා ගනු ලැබ ඇති ඉහළම අගය වන අතර ඊට අමතර වශයෙන් ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 80000 ක සංඛ්‍යාවක් සංඛ්‍යාංක බවට පරිවර්තනය කරනු ලැබ ඇත.

“සැමට ජලය” නම් වූ වැඩ සටහන යටතේ කිලෝ මීටර 38 ක දිග ප්‍රමාණයකට මිලි මීටර 160, මිලි මීටර 110 හා මිලි මීටර 90 යන විෂ්කම්භ ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ නල මාර්ග එලීමේ වැඩ කටයුතු ගත වූ වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි. විවිධ අය වැය වෙන් කිරීම් කිහිපයක් යටතේ කිලෝ මීටර 90 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල මාර්ග දීර්ඝ කිරීම් ගත වූ වසර තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි. තවද කුරුණෑගල කලාපය තුළ ක්‍රියාත්මක වන සියළුම ගබඩාවන් (10 ක සංඛ්‍යාවක්) පසු ගිය වසර තුළදී ඉන්වෙන්ටරි කළමනාකරණ පද්ධතිය සමග සාර්ථක ලෙස සම්බන්ධ කරන ලදි. ඒ හේතුකොට ගෙන මෙතැන් සිට වයඹ කලාපය තුළ ක්‍රියාත්මක වන සියළුම ගබඩාවන් විසින් ඉන්වෙන්ටරි කළමනාකරණ පද්ධතිය සාර්ථක ලෙස උපයෝගී කර ගනු ලබනවා ඇත. බල ශක්ති සංරක්ෂණය කිරීමේ වැඩ සටහන යටතේ ජල පිළිසැකැසුම් අංශය තුළ ලංකා රුපියල් මිලියන 25 ක පිරිවැයක් වැය කරමින් කිලෝ වොට් 230 ක ධාරිතාවයකින් යුක්ත වූ සූර්ය බල ශක්ති ව්‍යාපෘතීන් 2 ක් ආරම්භ කරන ලද අතර එක් මාසයකට කිලෝ වොට් පැය 22000 ක මුළු බල ශක්ති ජනනය කිරීමක් සමග මසකට ලංකා රුපියල් 5,00,000 ක සාමාන්‍ය අතිරේක ආදායම් ප්‍රමාණයක් ජනනය කර ගනු ලැබීමට ඒ හේතුකොට ගෙන හැකියාව ලැබී ඇත. අකාර්යක්ෂම ජලය බෙදා හැරීමේ පෝම්ප කිරීමේ වැඩ පිළිවෙල වැඩි දියුණු කරමින් වාරියපොල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පුනරුත්ථාපනය කිරීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලදි. ජලය බෙදා හැරීමේ පෝම්ප වෙනුවට අළුත් පෝම්ප යෙදීම වෙනුවෙන් ලංකා රුපියල් මිලියන 35 ක මුළු ආයෝජනයක් කරන ලද අතර ඒ හේතුකොට ගෙන විදුලිය භාවිතය අඩු වීම නිසා වාර්ෂික මට්ටමින් ඉතිරි කර ගත හැකි මුදල් ප්‍රමාණය ලංකා රුපියල් මිලියන 25 ක් වනු ඇත. ප්‍රති ආරෝපණය කළ හැකි අය වැය වෙන් කිරීම් යටතේ බිංගිරිය ආයෝජන මණ්ඩල කලාපය වෙත දිනකට ප්‍රතිකාරිත ජලය ඝණ මීටර 1500 ක ප්‍රමාණයක් සම්පාදනය කර දීම සඳහා ලංකා රුපියල් මිලියන 184 ක ප්‍රමාණයක් ආයෝජනය කිරීම ගත වූ වර්ෂය තුළදී සාර්ථක ලෙස නිම කරන ලද අතර එකී එක් දිනකට ජලය ඝණ මීටර 1500 ක පරිමාව අතුරින් එක් දිනකට ජලය ඝණ මීටර 500 ක පරිමාවක් ආයෝජන මණ්ඩල කලාපය ආසන්නයේ ජීවත් වනු ලබන ගෘහස්ත පාරිභෝගික ජනතාව අතර බෙදා හරිනු ලැබීමට කටයුතු කරන ලදි. ජලය ගෙන යාම සඳහා භාවිතා කරන ලද්දේ ලංකා රුපියල් මිලියන 73. 0 ක පිරිවැයක් වැය කරමින් ස්ථාපිත කරන ලද සම්පූර්ණයෙන් ස්වයංක්‍රිය කරන ලද පෝම්ප පද්ධතිය වේ.

කුරුණෑගල කලාපය තුළ ක්‍රියාත්මක වන වාරියපොල ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ, ගිරිඋල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ හා නාරම්මල ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ මෙන්ම පුත්තලම කලාපය තුළ ක්‍රියාත්මක වන බිංගිරිය ජල සම්පාදන යෝජනා ක්‍රමය, නෙළුම්පොකුණ ජල සම්පාදන යෝජනා ක්‍රමය, දන්කොටුව ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ හා වීළුවන්කුලම ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ ද ජල සුරක්ෂිතතා සැලැසුම යටතේ වූ සියළුම මොඩියුලයන් ක්‍රියාත්මක කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

ගොකරුල්ල ආරෝග්‍ය ශාලාව, කෑගල්ල තැපැල් කාර්යාලය, තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය, මාවතගම ආයෝජන මණ්ඩල කලාපය හා බිංගිරිය ආයෝජන මණ්ඩල කලාපය වෙනුවෙන් කරන ලද සැලැසුම් පිළියෙල කිරීමේ වැඩ කටයුතු හා උපදෙස් දීමේ කාර්යයන් වෙනුවෙන් මළාපවහන උපදේශක සේවා ගාස්තු වශයෙන් ලංකා රුපියල් මිලියන 17.5 ක මුදල් ප්‍රමාණයක් උපයා ගන්නා ලදි. මීට අමතර ලෙස ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP) වෙනුවෙන් පූතික ප්‍රතිකාරක යන්ත්‍රාගාර ඉදි කිරීම අදාල උපදේශක සේවා කටයුතු 2021 වර්ෂය තුළදී ජල පිළිසැකැසුම් අංශය විසින් සිදු කරන ලදි.

වයඹ පලාතේ භූ ගත ජල අංශය විසින් ජල භූ විද්‍යාත්මක විමර්ෂණයන් 62 ක සංඛ්‍යාවක් සිදු කිරීම, නල ළිං 16 ක සංඛ්‍යාවක් විදිනු ලැබීම හා අත් පෝම්ප 16 ක සංඛ්‍යාවක් අළුත්වැඩියා කිරීම හා පුනරුත්ථාපනය කිරීම යන වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරන ලදි. එම වැඩ කටයුතු වලට වැඩිමනත් වශයෙන් කල්පිටියේ ඉදි කිරීමට යෝජිත විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාරය වෙනුවෙන් දිනකට ජලය ඝණ මීටර 960 ක පරිමාවක් ලබා දීම සඳහා නිර්දේශ කරන ලද ළිඳක් ඉදි කිරීම හා නාරම්මල ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් දිනකට ජලය ඝණ මීටර 768 ක පරිමාවක් ලබා දීම සඳහා නිර්දේශ කරන ලද ගැඹුරු නල ළිඳක් ඉදි කිරීම ද සිදු කරන ලදි.

බිංගිරිය - උඩුබද්දාව හා මාකඳුර - පන්නල - කුලියාපිටිය ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය, පොල්ගහවෙල - පොතුහැර - අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය, කුරුණෑගල කලාප අංක 03 තුළ ක්‍රියාත්මක වන ජල සම්පාදන ව්‍යාපෘතියේ, මාවතගම ජල සම්පාදන ව්‍යාපෘතියේ, හලාවත (පියවර අංක 11) ජල සම්පාදන යෝජනා ක්‍රමයේ, පුත්තලම (පියවර අංක 11) ජල සම්පාදන ව්‍යාපෘතියේ, කටුපොත - බමුණාකොටුව - පඩුවස්නුවර ජල සම්පාදන ව්‍යාපෘතියේ, දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතියේ හා කාක්කාපල්ලිය - වෙන්නප්පුව - දංකොටුව ජල සම්පාදන යෝජනා ක්‍රමයේ හිඩැස් පිරවීම හා සම්බන්ධ වැඩි දියුණු කිරීම් වෙනුවෙන් වූ මා වැඩ, නල සම්පාදනය කිරීම හා නල එලීමේ වැඩ කටයුතු සම්බන්ධයෙන් ලංකා රුපියල් මිලියන 20,000 ක අගයකින් යුක්ත වූ සැලැසුම් හා මිළ ගණන් කැඳවීමේ ලිපි ලේඛන ආදිය පිළියෙල කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

පුත්තලම දිස්ත්‍රික්කය වෙනුවෙන් වූ නව කළමනාකාර කාර්යාලය 2021 අප්‍රේල් මාසයේ සිට ආරම්භ කරන ලද අතර 2022 වර්ෂය වෙනුවෙන් ජල පිළිසැකැසුම් මධ්‍යස්ථානය සඳහා වූ පරිසර ආරක්ෂණ බල පත්‍රය ලබාගෙන ඇත. රජයේ ඉලක්කය අනුව කටයුතු කරමින් විසල් කුරුණෑගල ජල පිළිසැකැසුම් පද්ධතිය වෙනුවෙන් ප්‍රධාන සනීපාරක්ෂණ සැලැසුම පිළියෙල කිරීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි. එම ප්‍රධාන සැලැසුමෙහි කොටසක් වශයෙන් අළුතින් අත් පත් කර ගනු ලැබූ ඉඩම තුළ පූතික ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

තිඹිරිපොකුණ, නුග ඇල, ඉපලව, බුදුරුව කන්ද හා පනලිය ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වයඹ සංවර්ධන අරමුදල

යටතේ ඉදි කරන ලද අතර ඉන් පසු කුරුණෑගල ජල සම්පාදන දෙපාර්තමේන්තුව වෙත භාර දෙන ලදි. රාජ්‍ය අමාත්‍යංශයේ ග්‍රාමීය ජල සම්පාදන අරමුදල වෙතින් ලැබුණ ලංකා රුපියල් මිලියන 26.4 ක වෙන් කිරීම වැය කරමින් මුසල්පිටිය, මාරගම හා දිද්දෙනියවත්ත ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් සියල්ල සම්පූර්ණයෙන් නිම කරන ලද අතර තොරණේගෙදර ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය ඉදි කිරීමේ කටයුතු වලින් සියයට 90 ක ප්‍රතිශතයක් නිම කරනු ලැබ ඇත. රාජ්‍ය අමාත්‍යංශය වෙතින් ලබාගන්නා ලද හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකු ගඩු රෝගය පාලනය කිරීමේ අරමුදල් වලින් ලංකා රුපියල් මිලියන 13.6 ක මුදල් ප්‍රමාණයක් වැය කරමින් හෙට්ටිආරච්චිගම ජල සම්පාදන යෝජනා ක්‍රමය හා අඹුක්කගම ජල සම්පාදන යෝජනා ක්‍රමය සම්පූර්ණයෙන්ම නිම කරන ලද අතර මෝයෂිෆා ජල සම්පාදන යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු සියයට 98 ක ප්‍රතිශතයක් නිම කරන ලදි.

හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකු ගඩු රෝගය පාලනය කිරීමේ අය වැය වෙන් කිරීමෙන් සියයට 73.62 ක ප්‍රතිශතයක් හෙවත් ලංකා රුපියල් මිලියන 13.61 ක මුදල් ප්‍රමාණයක් ද, ග්‍රාමීය ජල සම්පාදන අය වැය වෙන් කිරීමෙන් සියයට 53.81 ක ප්‍රතිශතයක් හෙවත් ලංකා රුපියල් මිලියන 26.42 ක මුදල් ප්‍රමාණයක් ද, රාජ්‍ය අමාත්‍යාංශයේ කුඩා නගර සඳහා ජල සම්පාදනය කිරීමේ අරමුදල් වෙන් කිරීමෙන් සියයට 38.91 ක ප්‍රතිශතයක් හෙවත් ලංකා රුපියල් මිලියන 16.81 ක මුදල් ප්‍රමාණයක් ද, උපයෝගිතා විතැන් කිරීමේ අය වැය වෙන් කිරීමෙන් සියයට 64.20 ක ප්‍රතිශතයක් හෙවත් ලංකා රුපියල් මිලියන 7.51 ක මුදල් ප්‍රමාණයක් ද, පුනරුත්ථාපන අය වැය වෙන් කිරීමෙන් සියයට 53.06 ක ප්‍රතිශතයක් හෙවත් රුපියල් මිලියන 68.91 ක මුදල් ප්‍රමාණයක් ද, ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ අය වැය වෙන් කිරීමෙන් සියයට 32.48 ක ප්‍රතිශතයක් හෙවත් ලංකා රුපියල් මිලියන 12.18 ක මුදල් ප්‍රමාණයක් ද, බල ශක්ති සංරක්ෂණය වෙනුවෙන් ලංකා රුපියල් මිලියන 51 ක මුදල් ප්‍රමාණයක් හා "සැමට ජලය" වෙනුවෙන් ලංකා රුපියල් මිලියන 220.17 ක මුදල් ප්‍රමාණයක් ද ප්‍රස්තුත වර්ෂය තුළදී වැය කරනු ලැබ ඇත.

උතුරු මැද ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය

උතුරු මැද ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථාන කලාපය අනුරාධපුර හා පොලොන්නරුව කළමනාකරණ කලාපයන්ගෙන් සමන්විත වන අතර ඒ මගින් අනුරාධපුර දිස්ත්‍රික්කය හා පොලොන්නරුව දිස්ත්‍රික්කය නම් වූ භූගෝලීය ප්‍රදේශයන් දෙක ආවරණය කරනු ලබයි. එකී ප්‍රදේශය තුළ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 32 ක සංඛ්‍යාවක් විසින් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන අතර විෂය පාත්‍රගත වර්ෂය තුළදී ලබා දෙන ලද නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 15000 ක සංඛ්‍යාව සමග මෙම ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය සතුව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 160000 ක මුළු සංඛ්‍යාවක් ක්‍රියාත්මක වෙමින් පවතී. මුළු නල මාර්ගික ජල සම්පාදන ආවරණය සියයට 60.0 ක් වශයෙන් වාර්තා වන අතර ඒ අතුරින් සියයට 39.3 ක ප්‍රතිශතයක් ක්‍රියාත්මක කරනු ලබන්නේ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයේ පරිපාලන මායිම් යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වේ.

ප්‍රස්තුත වර්ෂය තුළදී මුදල් රැස් කිරීම සඳහා පිහිටුවාගන්නා ලද ඉලක්කය සියයට 102.0 කින් සාක්ෂාත් කර ගැනීමට හැකි වූ අතර ඒ අනුව ජලය ඝණ මීටර මිලියන 32.7 ක් අලෙවි කොට උපයා ගත හැකි වූ මුළු මුදල් ප්‍රමාණය ලංකා රුපියල් මිලියන 1,383.8 ක් විය.

අනුරාධපුර කලාපය තුළ ක්‍රියාත්මක කරන ලද ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ වැඩ කටයුතු අතර ජල කාන්දු වීම් 8790 ක සංඛ්‍යාවක් හඳුනාගෙන අළුත්වැඩියා කටයුතු කරන ලද අතර දෝෂ සහිත මණු 6995 ක සංඛ්‍යාවක් ද හඳුනාගන්නා ලදි. එම ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයක් වශයෙන් ආදායම් රහිත ජල පරිමාව සියයට 18 ක් දක්වා අඩු කර ගැනීමට හැකි විය. ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 110 ක සංඛ්‍යාවකට අදාල හිඟ මුදල් රැස් කරන අතර ඇස්තමේන්තු කරන ලද බිල් 346 ක සංඛ්‍යාවක් නිවැරදි කරන ලදි. පොලොන්නරුව කලාපය තුළ ජල කාන්දු වීම් 4814 ක සංඛ්‍යාවක් හඳුනාගෙන අළුත්වැඩියා කරන ලද අතර එමෙන්ම දෝෂ සහිත මණු 6995 ක සංඛ්‍යාවක් හඳුනා ගැනීම ද කරන ලදි. එම ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයක් වශයෙන් ආදායම් රහිත ජල පරිමාව සියයට 22.97 ක් දක්වා අඩු කර ගැනීමට හැකි විය.

"සැමට ජලය අය වැය වෙන් කිරීම" යටතේ මිළ ගණන් කැඳවීමේ ලේඛන 19 ක සංඛ්‍යාවක් ඉදිරිපත් කරන ලද අතර ඒවායේ වටිනාකම ලංකා රුපියල් මිලියන 5,302 ක් විය. ඊට වැඩිමනත් වශයෙන් හඳුනා නොගන්නා ලද හේතූන් නිසා ඇති වන නිදන්ගත වකු ගඩු රෝග පාලනය, පුනරුත්ථාපන කටයුතු හා මෙහෙයුම් හා නඩත්තු අරමුදල් යටතේ ලංකා රුපියල් මිලියන 246 ක වටිනාකමින් යුක්ත වූ මිළ ගණන් කැඳවීමේ ලියවිලි 160 සංඛ්‍යාවක් ද පිළියෙල කරන ලදි. ගල්නෑව, තුරුවිල, නුවර වැව, තිසා වැව, මින්නේරිය, හා ගල්ලෑල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයන් හා සම්බන්ධ මා වැඩ වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු වලට අදාල වූ සැලැසුම් පිළියෙල කිරීමේ වැඩ කටයුතු ප්‍රධාන කාර්යාලයේ ක්‍රම සම්පාදන හා සැලැසුම් පිළියෙල කිරීමේ අංශයේ සහාය ලබා ගනිමින් උතුරු මැද පලාත් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය හා අනුබද්ධිත ක්‍රම සම්පාදන හා සැලැසුම් පිළියෙල කිරීමේ අංශය විසින් සම්පූර්ණයෙන් නිම කරන ලදි. "සැමට ජලය අය වැය වෙන් කිරීම" යටතේ ලංකා රුපියල් මිලියන 2, 540 ක අගයකින් යුක්ත වූ කොන්ත්‍රාත්තු 13 ක සංඛ්‍යාවක වැඩ කටයුතු ආරම්භ කරන ලද අතර අනිකුත් අය වැය වෙන් කිරීම් යටතේ ලංකා රුපියල් මිලියන 1, 159 ක අගයකින් යුක්ත වූ කොන්ත්‍රාත්තු ප්‍රදානය කරන ලදි. "සියළු දෙනා වෙනුවෙන් ජලය අය වැය වෙන් කිරීම" යටතේ ලංකා රුපියල් මිලියන 1, 823 ක අගයකින් යුක්ත වූ බිල් පත් උතුරු මැද කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ඉදිරිපත් කරන ලදි. අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ අදියර අංක 1 විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 98. 78 ක් හා සියයට 78. 82 ක් වූ අතර ඒ ලෙසින්ම තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය විසින් වර්ෂය අවසාන වන විට සාක්ෂාත් කර ගනු ලැබ තිබී භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 76. 3 ක් හා සියයට 75 ක් විය. අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල ඉදි කිරීම් වැඩ කටයුතු 2022 වර්ෂය තුළදී ආරම්භ කරනු ලැබීමට නියමිත වේ.

ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 22 ක සංඛ්‍යාවක් තුළ ආරම්භ කරනු ලැබ ඇති අතර ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 13 ක සංඛ්‍යාවක් තුළ මොඩියුල 11 ක සංඛ්‍යාවක් දක්වා වූ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. බාහිර අවිධිමත් විගණනයන් 02 ක සංඛ්‍යාවක් හා බාහිර විධිමත් විගණනයන් එකක් පවත්වනු ලැබ ඇත. රඹෑව හා මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ ක්‍රියාත්මක වන ප්‍රජා මූල සංවිධානයන් විසින් මෙහෙයවනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රම 43 ක සංඛ්‍යාවක් භාර ගනු ලැබූ අතර විභව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් සංඛ්‍යාව හඳුනා ගැනීම සඳහා සමාජ සමීක්ෂණයන් පවත්වන ලදි. නුවර වැව, ගල්ලෑල්ල හා හොරොව්පොතාන යන ප්‍රදේශයන් තුළ රුක් රෝපණ වැඩ සටහන් ආරම්භ කරන ලදි. ලෝක බැංකුවේ සහාය ලබා ගනිමින් කුඩා නගර - ග්‍රාමීය ජල සම්පාදන අංශය විසින් ක්‍රියාත්මක කරන ලද පාසැල් සඳහා වූ ජල සම්පාදන පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩ සටහන පාඨ ශාලා 43 ක සංඛ්‍යාවක් තුළ සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

නිෂ්පාදන ළිං 41 ක සංඛ්‍යාවක් තුළ විදමන් ක්‍රියාකාරකම් සිදු කරන ලදි. ඊට වැඩිමනත් වශයෙන් ළිං 48 ක සංඛ්‍යාවක් සෝදා හැරීම ද, අත් පෝම්ප 45 ක සංඛ්‍යාවක් අළුත්වැඩියා කිරීමේ වැඩ කටයුතු හා ජල විද්‍යාත්මක අධ්‍යයනයන් 64 ක සංඛ්‍යාවක් පැවැත්වීම ද සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. යෝජිත ව්‍යාපෘතීන් වෙනුවෙන් අවශ්‍ය ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු (ඉඩම් කැබලි 72 ක සංඛ්‍යාවක්) දැනට සිදු කරගෙන යනු ලබමින් පවතී. උතුරු මැද ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය සතුව පවත්නා මුළු වත් කම් වල අගය ලංකා රුපියල් මිලියන 15, 380 ක් වේ. වාර්ෂික වත් කම් හරි වැරදී බැලීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ

ඇති අතර ව්‍යාපෘති ප්‍රාග්ධනීකරණය කිරීමේ වැඩ කටයුතු දැනට සිදු කර ගෙන යමින් පවතී. වර්ෂය තුළදී කලාපය තුළ සේවයේ යෙදී සිටිනු ලබන සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් කොවිඩ් 19 වසංගතය වලක්වා ගැනීමේ පුහුණු වැඩ සටහනක් හා එන්නත් ලබා දීමේ වැඩ සටහනක් පවත්වා අවසන් කරන ලදි. නව පැමිණීම් ක්‍රමය පිළිබඳ පුහුණු වැඩ සටහන ද පවත්වන්නට යෙදුනි.

පුනරුත්ථාපන අය වැය වෙන් කිරීමේ හා ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම අය වැය වෙන් කිරීමේ මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 50. 68 ක් හා සියය 83 ක් වූ අතර මැදිරිගිරිය ලෝක බැංකු අරමුදලින් ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතියේ හා පිබිදෙමු පොලොන්නරුව ව්‍යාපෘතියේ සියළු වැඩ කටයුතු 2021 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි.

මධ්‍යම පලාත ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය

මධ්‍යම පලාත ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථාන කලාපය මහනුවර - දකුණ, මහනුවර - නැගෙනහිර හා මහනුවර - උතුර යන කළමනාකරණ කලාපයන්ගෙන් සමන්විත වන අතර ඒ මගින් මහනුවර දිස්ත්‍රික්කය, මාතලේ දිස්ත්‍රික්කය හා නුවරඑලිය දිස්ත්‍රික්කය නම් වූ භූගෝලීය ප්‍රදේශයන් තුන ආවරණය කරනු ලබයි. එකී ප්‍රදේශය තුළ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 36 ක සංඛ්‍යාවක් විසින් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන අතර විෂය පාත්‍රගත වර්ෂය තුළදී ලබා දෙන ලද නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 16000 ක සංඛ්‍යාව සමග මෙම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය සතුව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 307000 ක මුළු සංඛ්‍යාවක් ක්‍රියාත්මක වෙමින් පවතී. මුළු නල මාර්ගික ජල සම්පාදන ආවරණය සියයට 56.8 ක් වශයෙන් වාර්තා වන අතර ඒ අතුරින් සියයට 40.1 ක ප්‍රතිශතයක් ක්‍රියාත්මක කරනු ලබන්නේ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ පරිපාලන මායිම් යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වේ.

ප්‍රස්තුත වර්ෂය තුළදී මුදල් රැස් කිරීම සඳහා පිහිටුවාගන්නා ලද ඉලක්කය සියයට 103.0 කින් සාක්ෂාත් කර ගැනීමට හැකි වූ අතර ඒ අනුව ජලය ඝණ මීටර මිලියන 61.7 ක් අලෙවි කොට උපයා ගත හැකි වූ මුළු මුදල් ප්‍රමාණය ලංකා රුපියල් මිලියන 2,195.0 ක් විය.



වලපනේ නල එලීම

විශ්ව විද්‍යාල ජල සම්පාදන යෝජනා ක්‍රමය පුනරුත්ථාපනය කිරීම, වෑගල ප්‍රජා මූල සංවිධානය විසින් මෙහෙයවනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රමය වර්ධනය කිරීම, ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථාන ගොඩනැගිල්ල නවීකරණය කිරීම, බලගොල්ල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වර්ධනය කිරීම, මැද දුම්බර ඝණ මීටර 1500 ක ජල ධාරිතාවයකින් යුක්ත වූ පැකේජ ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම හා අම්පිටිය - තලාතුඔය මහා මාර්ගය ඔස්සේ නල එලීම යන ව්‍යාපෘතීන් විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 58 ක්, සියයට 80 ක්, සියයට 12 ක්, සියයට 16 ක්, සියයට 18 ක් හා සියයට 57 ක් විය. රඹුක්පිටිය හා කීර්තිබණ්ඩාර පුර පිළිවෙලින් කිලෝ මීටර 5 ක හා කිලෝ මීටර 7.2 ක දිග ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ නල මාර්ග දීර්ඝ කිරීමේ කොන්ත්‍රාත්තුව මෑතදී ප්‍රදානය කරන ලදි. මධ්‍යම නැගෙනහිර කළමනාකරණ කලාපය තුළ රකිල්ලගස්කඩ කැටි ගස්වන ටැංකිය තුළ ප්‍රතිරෝධක පුවරු වෙනුවට අළුත් ප්‍රතිරෝධක පුවරු සවි කිරීම, මූල්ඔය තුළු මුව වටා වැට ඉදි කිරීම, මැද දුම්බර ඊජඔ නවීකරණය කිරීම, රංගල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය නවීකරණය කිරීම, දිගන ස්ථාන භාර නිලධාරී කාර්යාලය නවීකරණය කිරීම, රකිල්ලගස්කඩ එනසල්අරාවේ හා තලවකැලේ ජල සම්පාදන යෝජනා ක්‍රමයේ කොත්මලේ මහා මාර්ගය ඔස්සේ නල එලීම, තවත් අතුරු මාර්ග කිහිපයක් ඔස්සේ නල එලීම හා මධ්‍යම උතුර කළමනාකාර කලාපය තුළ මාතලේ, පොල්ගොල්ල හා අංකුඹුර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් පුනරුත්ථාපනය කිරීම, දඹුල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක වන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා ජලාශයන් නවීකරණයට භාජනය කිරීම, හාරිස්පත්තුව, අකුරන, පූජාපිටිය, දඹුල්ල, උකුවෙල හා මධ්‍යම දකුණ කළමනාකරුගේ කලාපය තුළ හිඩැස් පිරවීමේ වැඩ පිළිවෙල යටතේ නල එලීම, ඊරියගම ගබඩා ගොඩනැගිල්ල වටා වැටක් ඉදි කිරීම, මායිම් තාප්පය ඉදි කිරීම, බිත්ති වල සායම් ආලේප කිරීම හා අල්පිටියේ පිහිටි මාණ්ඩලීය හන්තාන ජල සම්පාදන යෝජනා ක්‍රමයේ නිල නිවාස වල බිත්ති වල සායම් ආලේප කිරීම හා වහල නවීකරණය කිරීම, දත්‍රි (Datry) තුළු මුව වැඩි දියුණු කිරීම, ගන්නොරුව කාර්යාලය නවීකරණය කිරීම, ගම්පොල ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ වූ ජලය ඝණ මීටර 1500 ක ධාරිතාවයකින් යුක්ත වූ මරියවත්ත ජල කුළුණෙහි හා කාර්යාල ගොඩනැගිල්ලෙහි සායම් ආලේප කිරීම හා ගම්පොල ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට අනුබද්ධ වාහන මඩුවෙහි තීන්ත ආලේප කිරීමේ කටයුතු ද සිදු කරන ලදි. කිලෝ මීටර 5 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල මාර්ග විතැන් කිරීමේ වැඩ කටයුතු ද සිදු කරන ලදි. නාවලපිටිය කුරුඳුවත්තේ පිහිටි කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානය වෙත ජල සම්පාදන පහසුකම් සම්පාදනය කර දෙන ලදි. කිලෝ මීටර 11.5 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල මාර්ග දීර්ඝ කිරීම් සිදු කරන ලදි. පාරදෙක ජලධාරකය තුළ ජල ධාරක ආරක්ෂා කිරීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

මෙහි ඉහතින් දක්වනු ලැබ ඇති කර්තව්‍යයන්ට අමතර වශයෙන් යටිවාවල, අඟුනාවල, මැද දුම්බර ගල් පල්ලිය (විශ්ව විද්‍යාලය) පෝම්ප කිරීමේ පද්ධති, සංස්ථානික සේවා ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ අධීක්ෂණාත්මක පාලනය හා දත්ත අත්පත් කර ගැනීමේ (SCADA) පද්ධතිය ස්ථාපිත කිරීමේ වැඩ කටයුතු මෙන්ම ලංකා රුපියල් මිලියන 154 ක පිරිවැයක් දරමින් බලගොල්ල හා මාරස්සන විද්‍යුත් හා යාන්ත්‍රික වර්ධන වැඩ කටයුතු ද සිදු කරන ලදි.

සේවා ජලාශය හා පොම්පාගාරය ඇතුලත් නාඋල - වහකෝට්ටේ ජල සම්පාදන ව්‍යාපෘතියේ, ගඟ ඉහළ කොරලේ ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් සේවා ජලාශයන් 3 ක සංඛ්‍යාවක් ඉදි කිරීම, අංකෙලිපිටිය ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල ශේෂ වී ඇති වැඩ කටයුතු නිම කිරීම, නාවලපිටිය පල්ලේගම ගලබොඩඇල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය හා මාරස්සන ජල සම්පාදන ව්‍යාපෘතිය හා සම්බන්ධ නල සම්පාදනය කර දීම, හසලක ජල සම්පාදන ව්‍යාපෘතියට අනුබද්ධිත ලෙස ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම, පුපුරුස්ස අටබාගේ ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රධාන අමු ජල නල මාර්ගයක් ඉදි කිරීම හා කලාපීය මට්ටමින් නල සම්පාදනය කිරීම හා කොත්මලේ ගං ඉවුරේ ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් හුවන පොම්පාගාරයක් හා සේවා ජලාශයක් ඉදි කිරීම යන වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සැලැසුම් සකස් කිරීම සම්පූර්ණයෙන් නිම කරන ලදුව එකී සැලැසුම් ප්‍රතිසම්පාදන වැඩ කටයුතු සඳහා යවනු ලැබ ඇත. හතරලියද්ද අංක 01 කලාපයට අදාල සමීක්ෂණ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරන ලද අතර හපුගස්තලාව ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල එම කටයුතු ආරම්භ කරනු ලැබ ඇත. ගම්පොල ජයමාල පුර ජල සම්පාදන ව්‍යාපෘතිය හා අනුබද්ධිත ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම සඳහා වූ මිළ ගණන් කැඳවීමේ ලිපි ලේඛන පිළියෙල කිරීමේ වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවතින අතර සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගය තුළ තිබී ප්‍රධාන ජල කාන්දු 3 ක සංඛ්‍යාවක් ද, ඇසට නොපෙනෙන ජල කාන්දු 78 ක සංඛ්‍යාවක් ද කිලෝ මීටර 24.3 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල මාර්ගයක් අහඹු ලෙස සමීක්ෂණය කිරීමේදී සොයා ගත හැකි විය. ඒ හැරුණ විට කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයට අනුයුක්ත කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් ප්‍රධාන හා සුළු ජල කාන්දු

45 409 ක සංඛ්‍යාවක් හඳුනා ගනු ලැබ ඒවා අළුත්වැඩිය කිරීමට කටයුතු කරන ලදි. විසල් දඹුල්ල 11 වැනි පියවර සම්බන්ධයෙන් වූ සාධ්‍යතා අධ්‍යයන වැඩ කටයුතු ආරම්භ කරනු ලැබ ඇත. ගම සමග පිළිසඳරට හා පාසැල් ජල සම්පාදන වැඩ සටහනට අදාල ඇස්තමේන්තු පිළියෙල කරන ලදි. සහයෝගී ව්‍යාපෘතීන් 15 ක සංඛ්‍යාවක් වෙනුවෙන් වූ දත්ත රැස් කිරීමට අදාල වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර මෙහෙයුම් හා නඩත්තු කටයුතු වලට අදාල ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු හා ‘‘සැමට ජලය’’ අය වැය වෙන් කිරීම යටතේ අවශ්‍ය අවශ්‍ය වන නව ඉඩම් කැබැලි 125 ක සංඛ්‍යාවක් අත් පත් කර ගැනීමේ වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවතී.

සමස්ත ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීමේදී කලාපය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති ප්‍රගතිය සියයට 91 ක් වූ අතර යෝජනා ක්‍රමයන් 06 ක සංඛ්‍යාවක් තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් හරි වැරදි බැලීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදි. පවත්වන ලද විගණන පරීක්ෂණයන්ට අනුව මීවතුර හා විසල් මහනුවර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් විසින් හොඳ හා ඉතා හොඳ තත්ත්වයන් දිනා ගන්නා ලදි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ජල නියැදි 11459 ක සංඛ්‍යාවක් හා බාහිර පාර්ශවයන් විසින් ජල නියැදි 1081 ක සංඛ්‍යාවක් ද ආදී වශයෙන් ජල නියැදි 12540 ක මුළු සංඛ්‍යාවක් රසායනික හා ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරාමිතීන් පිළිබඳව පරීක්ෂණයට භාජනය කරන ලද අතර ඊට ප්‍රජා මූල සංවිධානයන් විසින් කළමනාකරණය කරනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ පවත්වන ලද ජල ගුණාත්ම ප්‍රවීක්ෂණ වැඩ සටහන් 71 ක සංඛ්‍යාවක් ද ඇතුලත් විය. මධ්‍යම දකුණ කලාපීය රසායනාගාරය වෙත ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ 17025 තත්ත්වය ලබා ගැනීමේ කටයුතු ආරම්භ කරනු ලැබ ඇත. ජල භූ විද්‍යාත්මක විමර්ෂණයන් 62 ක සංඛ්‍යාවක් පැවැත්වීම ද, භූමි විදමන් ළිං සෑරීම් 15 ක සංඛ්‍යාවක් සිදු කිරීම හා බිම් විදමන් ළිං සෝදා හැරීම් 2 වරක් සිදු කිරීම ද ක්‍රියාත්මක කරන ලදි.

ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය හා අනුබද්ධිත පුහුණු කිරීම් අංශය විසින් අභ්‍යන්තර පුහුණු කිරීම් වැඩ සටහන් 03 ක සංඛ්‍යාවක් පවත්වනු ලැබ ඇත. මධ්‍යම පලාතට අයත් මලල ක්‍රීඩා කණ්ඩායම විසින් ජනසතු සේවා මලල ශූරතා තරඟාවලිය තුළදී ඉහළ මට්ටමේ ජයග්‍රහණයන් සාක්ෂාත් කර ගනු ලැබ ඇත.

සබරගමුව පලාත ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය

සබරගමුව පලාත ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථාන කලාපය රත්නපුර හා කෑගල්ල යන කළමනාකරණ කලාපයන්ගෙන් සමන්විත වන අතර ඒ මගින් රත්නපුර දිස්ත්‍රික්කය හා කෑගල්ල දිස්ත්‍රික්කය නම් වූ භූගෝලීය ප්‍රදේශයන් දෙක ආවරණය කරනු ලබයි. එකී ප්‍රදේශය තුළ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 24 ක සංඛ්‍යාවක් විසින් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන අතර විෂය පාත්‍රගත වර්ෂය තුළදී ලබා දෙන ලද නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 9000 ක සංඛ්‍යාව සමග මෙම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය සතුව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 137000 ක මුළු සංඛ්‍යාවක් ක්‍රියාත්මක වෙමින් පවතී. මුළු නල මාර්ගික ජල සම්පාදන ආවරණය සියයට 29.5 ක් වශයෙන් වාර්තා වන අතර ඒ අතුරින් සියයට 23.1 ක ප්‍රතිශතයක් ක්‍රියාත්මක කරනු ලබන්නේ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයේ පරිපාලන මායිම් යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වේ.

ප්‍රස්තුත වර්ෂය තුළදී මුදල් රැස් කිරීම සඳහා පිහිටුවාගන්නා ලද ඉලක්කය සියයට 104.0 කින් සාක්ෂාත් කර ගැනීමට හැකි වූ අතර ඒ අනුව ජලය ඝණ මීටර මිලියන 24.6 ක් අලෙවි කොට උපයා ගත හැකි වූ මුළු මුදල් ප්‍රමාණය ලංකා රුපියල් මිලියන 2, 195.0 ක් විය.

රාත්‍රී ජල කාන්දු වීම් සමීක්ෂණයන්, විසන්ධි කිරීම් හා නීති විරෝධී ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් පසු විපරමට භාජනය කිරීම්, සේවා සම්බන්ධතාවයන් තුළ හඳුනා ගනු ලබන ජල කාන්දු වීම් අළුත්වැඩියා කිරීම්, සහ අඩු පීඩන ශ්‍රේණිගත නල මාර්ග හා පරණ නල මාර්ග වෙනුවට නව නල මාර්ග යෙදීමේ වැඩ කටයුතු ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය තුළ ක්‍රියාත්මක කරන ලදි. ක්‍රියාත්මක කරගෙන යමින් පැවැති ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ වැඩ කටයුතු වෙනුවෙන් ප්‍රස්තුත 2021 වර්ෂය තුළදී රුපියල් මිලියන 30 ක මුදල් ප්‍රමාණයක් වැය කරන ලදි. ප්‍රස්තුත වර්ෂය තුලදී ක්‍රියාත්මක කරන ලද ඇතැම් බල ශක්ති සංරක්ෂණය කිරීම අරමුණු කොට ගත් වැඩ කටයුතු වූයේ අකාර්යක්ෂම පෝම්ප වෙනුවට අළුත් පෝම්ප ස්ථාපිත කිරීම හා විදුලි බලය සඳහා ඉහළම ඉල්ලුමක් ඇති අවස්ථාවන් තුළ පෝම්ප ක්‍රියාත්මක කිරීමෙන් වැලකී සිටීම ද විය. ප්‍රස්තුත 2021 වර්ෂය තුළදී බල ශක්ති භාවිතා කිරීමේ මාසික සාමාන්‍යය කිලෝ වොට් පැය 1420000 ක් වූ අතර ලංකා විදුලිබල මණ්ඩලයේ බිල් පත් වල මාසික සාමාන්‍යය ලංකා රුපියල් මිලියන 20.0 ක් විය.

තොග මට්ටම් අඩු කර ගැනීමේ අරමුණ සහිතව ඉන්වෙන්ටර් කළමනාකරණ පද්ධති මොඩියුලය සියළුම ගබඩාවන් තුළ ක්‍රියාත්මක කරන ලද අතර එක් ගබඩාවක් හැර අනිකුත් සියළුම ගබඩාවන් මාර්ගගත පහසුකම සමග සම්බන්ධ කරන ලදි. මෙම අංගය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 47 ක් හා සියයට 37 ක් විය.

ක්‍රියාත්මක කිරීම සඳහා නියමිත විසල් රුවන්වැල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 32 ක පිරිවැයක් වැය කරමින් දිනකට ජලය ඝණ මීටර 4000 ක ධාරිතාවයකින් යුක්ත වූ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කරනු ලබනවා ඇත. මෙම ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය සියයට 27.5 ක් වන අතර මූල්‍ය ප්‍රගතිය සියයට 27.5 ක් වේ. හෙම්මාතගම ජල සම්පාදන ව්‍යාපෘතියේ ඉදි කිරීම් වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවතින අතර ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති ප්‍රගතිය සියයට 65 ක් වේ. විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතියට අනුබද්ධිත ජලය බෙදා හැරීමේ අංගය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 68 ක් හා සියයට 41 ක් වේ. සියළු දෙනා වෙනුවෙන් ජලය වැඩ සටහන යටතේ කහවත්ත - පැල්මඩුල්ල සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ග ව්‍යාපෘතිය, බලංගොඩ පැරණි ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වර්ධනය කිරීමේ වැඩ කටයුතු, ඇහැලියගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය හා අනුබද්ධිත අමු ජල සම්ප්‍රේෂණ නල මාර්ගය වැඩි දියුණු කිරීමේ කටයුතු, ඇඹිලිපිටිය ජල සම්පාදන යෝජනා ක්‍රමය හා අනුබද්ධිත පදලන්ගල නල එලීමේ ව්‍යාපෘතිය හා කිරිඇල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ නල මාර්ග දීර්ඝ කිරීමේ වැඩ කටයුතු ද රත්නපුර කලාපය තුළ ආරම්භ කරනු ලැබ ඇත. කෑගල්ල කලාපය තුළ හඳුනා ගනු ලැබ ඇති ව්‍යාපෘතීන් 16 ක සංඛ්‍යාවක් අතුරින් ව්‍යාපෘති 6 ක සංඛ්‍යාවක වැඩ කටයුතු ආරම්භ කරනු ලැබ ඇති අතර දැනට එම වැඩ කටයුතු ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවතී. එම ව්‍යාපෘතීන් යටතේ කෑගල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය ඒකාබද්ධ කිරීම, මාවනැල්ල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා ජලය බෙදා හැරීමේ පද්ධතිය වර්ධනය කිරීම, කෑගල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය හා අනුබද්ධිත ඇදුරාපොත ටැංකියේ අමු ජල සම්ප්‍රේෂණ නල මාර්ගය වැඩි දියුණු කිරීම හා දෙහිඕවිට, රුවන්වැල්ල හා වරකාපොල ජල සම්පාදන යෝජනා ක්‍රමයන් ඉහළ ශ්‍රේණිගත කිරීම යනාදී වැඩ කටයුතු ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවතී. ඇහැලියගොඩ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පරිශ්‍රය තුළ පැකේජ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීමේ කටයුතු ප්‍රාග්ධන අය වැය වෙන් කිරීම් යටතේ ලංකා රුපියල් මිලියන 19 ක මුදල් ප්‍රමාණයක් වැය කරමින් සම්පූර්ණයෙන් නිම කරන ලදි. පදලන්ගල පෝම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය පෝෂණය කිරීම සඳහා ඇඹිලිපිටිය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පරිශ්‍රය තුළ ප්‍රතිකාරිත ජලය පෝම්ප කිරීමේ පොම්පාගාරයක් ඉදි කිරීමේ වැඩ කටයුතු හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකු ගඩු රෝගය පාලනය කිරීම සඳහා ඇති අරමුදල් යටතේ සිදු කරගෙන යනු ලබමින් පවතින අතර මේ සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය ලංකා රුපියල් මිලියන 40.0 ක් වේ.

ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම ගත වූ 2021 වර්ෂය තුළදී කලාපයන් දෙක තුළ අඛණ්ඩ ලෙස සිදු කරගෙන යන ලදි. ජල සුරක්ෂිතතා සැලැසුම් යටතේ දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහන් හා රුක් රෝපණ වැඩ සටහන් රත්නපුර කලාපය තුළ හා

කෑගල්ල කලාපය තුළ ක්‍රියාත්මක කරන ලද අතර, ඊට අමතර ලෙස ජල සුරක්ෂිතතා සැලැසුම් හා සම්බන්ධිත මොඩියුල ක්‍රියාත්මක කිරීම නිම කිරීමෙහි ලා රත්නපුර කලාපය විසින් ආසන්න වශයෙන් සියයට 60 ක ප්‍රගතියක් හා කෑගල්ල කලාපය විසින් සියයට 50 ක පමණ ප්‍රගතියක් සාක්ෂාත් කර ගනු ලැබ ඇත. උඩ වලව, ඇඹිලිපිටිය හා බලංගොඩ ජල සම්පාදන ව්‍යාපෘතීන් වෙනුවෙන් අභ්‍යන්තර අවධිමත් හා විධිමත් විගණනයන් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර කහවත්ත ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් කරන ලද බාහිර විධිමත් විගණන කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

වරාකැටිආර, ගල්අමුන, රන්දොල, ගෙවල් 72, පදලන්ගල හා මාදම්පේ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ජල සම්පාදන හා සනීපාරක්ෂණ සේවාවන් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP) යටතේ කළ යුතුව තිබුණ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. පඹහින්න නාගරික ජල සම්පාදන ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති ප්‍රගතිය සියයට 80 ක් වේ. ගලිගමුව ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ ජල සම්පාදන හා සනීපාරක්ෂණ සේවාවන් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP) යටතේ කළ යුතුව තිබුණ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘතිය වෙත අළුතින් එකතු කරන ලද විෂය පථය යටතේ වූ නල වැලිමේ වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවතී. කෑගල්ලේ නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතියේ වැඩ කටයුතු නැවත පදිංචි කිරීම් අරමුදල් උපයෝගී කර ගනිමින් ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ. ගත වූ 2021 වර්ෂය තුළදී අනු ව්‍යාපෘති 15 ක සංඛ්‍යාවක් වෙනුවෙන් දරනු ලැබ ඇති මුළු වැය ප්‍රමාණය ලංකා රුපියල් මිලියන 36. 80 ක් වේ.

ඌව පලාත ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය

ඌව පලාත ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථාන කලාපය බණ්ඩාරවෙල හා මොණරාගල යන කළමනාකරණ කලාපයන්ගෙන් සමන්විත වන අතර ඒ මගින් බණ්ඩාරවෙල දිස්ත්‍රික්කය හා මොණරාගල දිස්ත්‍රික්කය නම් වූ භූගෝලීය ප්‍රදේශයන් දෙක ආවරණය කරනු ලබයි. එකී ප්‍රදේශය තුළ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 35 ක සංඛ්‍යාවක් විසින් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන අතර විෂය පාත්‍රගත වර්ෂය තුළදී ලබා දෙන ලද නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් ආසන්න වශයෙන් 18000 ක සංඛ්‍යාව සමග මෙම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය සතුව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 136000 ක මුළු සංඛ්‍යාවක් ක්‍රියාත්මක වෙමින් පවතී. මුළු නල මාර්ගික ජල සම්පාදන ආවරණය සියයට 53.2 ක් වශයෙන් වාර්තා වන අතර ඒ අතුරින් සියයට 34.7 ක ප්‍රතිශතයක් ක්‍රියාත්මක කරනු ලබන්නේ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයේ පරිපාලන මායිම් යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වේ.

ප්‍රස්තුත වර්ෂය තුළදී මුදල් රැස් කිරීම සඳහා පිහිටුවාගන්නා ලද ඉලක්කය සියයට 104.0 කින් සාක්ෂාත් කර ගැනීමට හැකි වූ අතර ඒ අනුව ජලය ඝණ මීටර මිලියන 22.3 ක් අලෙවි කොට උපයා ගත හැකි වූ මුළු මුදල් ප්‍රමාණය ලංකා රුපියල් මිලියන 822. 7 ක් විය.

බණ්ඩාරවෙල හා මොණරාගල යන කලාප ද්විත්වය තුළම ආදායම් රහිත ජල පරිමාව පසුවිපරම් කිරීමේ හා අඩු කිරීමේ වැඩ කටයුතු කිරීම සඳහා ඉදි කිරීම් කටයුතු භාර ප්‍රධාන ඉංජිනේරු වරයා යටතේ ආදායම් රහිත ජල අංශය පිහිටුවන ලදි. රාත්‍රී ජල කාන්දු සමීක්ෂණය කිරීමට හා විසන්ධි කිරීම් හා නීති විරෝධී ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් පසුවිපරම් කිරීමට අදාල වැඩ කටයුතු එම අංශය විසින් ඉටු කරන ලදි. ක්‍රියාත්මක තත්ත්වයේ පවත්නා ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන්ගේ දෝෂ නිවැරදි කිරීමේ හා පහළ පීඩන ශ්‍රේණිගත නල මාර්ග හා පැරණි නල මාර්ග ආදිය වෙනුවට අළුත් නල මාර්ග යෙදීමේ වැඩ කටයුතු ආදායම් රහිත ජලය අඩු කිරීමේ අය වැය වෙන් කිරීම් යටතේ 2021 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි.

වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද ඇතැම් බල ශක්ති සංරක්ෂණය කිරීමේ ක්‍රියා මාර්ගයන් වන්නේ අකාර්යක්ෂම පොම්ප වෙනුවට නව පොම්ප යෙදීම හා විදුලි බල ඉල්ලුම උච්ච තත්ත්වයට පැමිණ ඇති අවස්ථාවන් තුළදී ජලය පොම්ප කිරීමේ කටයුතු කිරීමෙන් වැලකී සිටීමද වේ. විදුලි පිරිවැය අඩු කර ගැනීමට අමතර ලෙස සියළුම පෝම්ප කිරීමේ ස්ථානයන් තුළ නිවාරක නඩත්තු ක්‍රම ක්‍රියාත්මක කිරීම තුළින් නඩත්තු පිරිවැය හා පෝම්ප බිඳ වැටීම් කාලය අඩු කර ගැනීමේ හැකියාව ද ලැබිණි. එසේම කුඹුක්කන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය තුළ, වැල්ලවාය ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ හා මොණරාගල කර්මාන්ත ශාලා ගොඩනැගිලි මත සූර්ය බල ශක්ති තහඩු සවි කරන්නට කටයුතු කරන ලදි

ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය තුළ තොග මට්ටම් අඩු කර ගැනීම අරමුණු කර ගනිමින් ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය තුළ තිබුණ නල හා සවි කිරීම් උපයෝගී කර ගනිමින් ආසන්න වශයෙන් කිලෝ මීටර 35 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල වැලිම් සිදු කරන ලදි. කොන්ත්‍රාත්තු මගින් මෙන්ම ප්‍රජාවගේ සහභාගිත්වය ද ලබා ගනිමින් කරන ලද නල මාර්ග දීර්ඝ කිරීම් වලට අමතර වශයෙන් බදුල්ල කලාපය තුළ කිලෝ මීටර 70 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල මාර්ග දීර්ඝ කිරීම් හා මොණරාගල කලාපය තුළ කිලෝ මීටර 30 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල මාර්ග දීර්ඝ කිරීම් ද ප්‍රස්තුත වර්ෂය තුළදී සිදු කරන ලදි. ඊට අමතර වශයෙන් මහා මාර්ග වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු වලට සමාන්තර ලෙස ආසන්න වශයෙන් කිලෝ මීටර 40 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල මාර්ග ප්‍රති ස්ථාපනය කිරීම ද සිදු කරන ලදි. බදුල්ල දිස්ත්‍රික්කය තුළ A 5 මහා මාර්ගය ඔස්සේ ප්‍රති ආරෝපන වැඩ කටයුතු වශයෙන් ආසන්න වශයෙන් කිලෝ මීටර 43 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල මාර්ග වැලිමේ වැඩ කටයුතු 2019 වර්ෂය තුළදී ආරම්භ කරන ලද අතර මේ වන විට ඒ අතුරින් කිලෝ මීටර 34 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල මාර්ග වැලිමේ කටයුතු සම්පූර්ණයෙන් නිම කළ හැකි විය. පාඨශාලා වෙනුවෙන් වූ ජල සම්පාදන පහසුකම් වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් ලැබුණ අරමුදල් උපයෝගී කර ගනිමින් ග්‍රාමීය ජල සම්පාදන අංශය විසින් ක්‍රියාත්මක කරන ලදි.

පුනරුත්ථාපන වැඩ කටයුතු යටතේ බදුල්ල දිස්ත්‍රික්කය තුළ හා මොණරාගල දිස්ත්‍රික්කය තුළ කොන්ත්‍රාත්තු 100 කට වැඩි සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීමට ඌව කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය වෙත හැකියාව ලැබුණ අතර එකී කොන්ත්‍රාත්තු වල මුළු අගය ආසන්න වශයෙන් ලංකා රුපියල් මිලියන 200 ක් විය. ඉහතින් සඳහන් කරන ලද කොන්ත්‍රාත්තු යටතේ ඉටු කරනු ලැබූ වැඩ කටයුතු වූයේ ජල සම්පාදන යෝජනා ක්‍රමයන්, ස්ථාන භාර නිලධාරී කාර්යාලය හා සම්ප්‍රේෂණ හා ජලය බෙදා හැරීමේ පද්ධතීන් පුනරුත්ථාපනය කිරීම හා කලාපය තුළ යාන්ත්‍රික හා විද්‍යුත් වැඩි දියුණු කිරීම ද විය. මෙම වැඩ කටයුතු අතුරින් බොහෝ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර අනිකුත් වැඩ කටයුතු ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවතී. කොවිඩ් 19 ලෝක වසංගත තත්ත්වය මෙන්ම ආනයන සීමාවන් ඉදි කිරීම් කටයුතු මත අහිතකර බල පෑම් ඇති ඇති කළ නමුත් ප්‍රස්තුත 2021 වර්ෂය තුළදී පුනරුත්ථාපන අය වැය වෙන් කිරීම් උපයෝගී කර ගැනීමට හැකි වීම විශාල ජයග්‍රහණයක් විය. ඒ අතර ප්‍රස්තුත වර්ෂය තුළදී නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 15848 ක සංඛ්‍යාවක් ලබා දීමේ හැකියාව ලැබිණි.

සියළුම ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ මෙන් ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීමේ වැඩ කටයුතු ආරම්භ කරනු ලැබ ඇති අතර පලාත තුළ ක්‍රියාත්මක වන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 15 ක සංඛ්‍යාවක් තුළ සියළුම මොඩියුල ක්‍රියාත්මක කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ප්‍රස්තුත 2021 වර්ෂය තුළදී දෙමෝදර හා මොණරාගල ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙනුවෙන් බාහිර විගණන පරීක්ෂණයන් පැවැත්වීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 8 ක සංඛ්‍යාවක් වෙනුවෙන් අවධිමත් අභ්‍යන්තර විගණන පරීක්ෂණයන් පැවැත්වීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

2021 වර්ෂයේ සේවා අංශයේ (මධ්‍යම) ජාතික ඵලදායිතා ප්‍රදානයන් යටතේ බණ්ඩාරවෙල කලාපීය කළමනාකරන කාර්යාලය විසින් 3 වැනි ස්ථානය දිනා ගන්නා ලද අතර බදුල්ලේ පිහිටි ඌව කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ප්‍රශංසා සහතිකය දිනා ගන්නා ලදි. මෙය ප්‍රස්තුත වර්ෂය තුළදී දිනා ගන්නා ලද විශාල ජයග්‍රහණයක් විය.

ගත වූ 2021 වර්ෂය තුළදී පුහුණු කිරීම් අය වැය වෙන් කිරීම් මෙන්ම මාර්ග ගත පුහුණු කිරීම් ඇතුළු වෙනත් අනුග්‍රාහකත්වයන් යටතේ ද පුහුණු කිරීමේ වැඩ සටහන් 25 ක සංඛ්‍යාවක් පවත්වන ලදි.

ජල සම්පාදන අමාත්‍යාංශය හාර ගරු අමාත්‍ය තුමා හා අමාත්‍යාංශ ලේකම් වරයා ද පැමිණ දිස්ත්‍රික්ක දෙකම ආවරණය වන මුළු ප්‍රදේශය තුළ බල පවත්වන්නා වූ ජල සම්පාදනය හා අදාල විසඳුමක් නැති ගැටළු පසුවිපරම් කිරීම හා ඊට අමතර විෂයෙන් යෝජිත අනාගත ව්‍යාපෘතීන් පිළිබඳව ප්‍රදේශය තුළ සිටින දේශපාලන බල ධාරීන් දැනුවත් කිරීම ද සිදු කරන ලදි. ප්‍රස්තුත වර්ෂය තුළදී "සැමට ජලය" ව්‍යාපෘතිය යටතේ මා වැඩ කොන්ත්‍රාත්තු 3 ක සංඛ්‍යාවක් හා නල මාර්ග එලීමේ රේටි කොන්ත්‍රාත්තු 2 ක සංඛ්‍යාවක් ඇතුළු ප්‍රධාන කොන්ත්‍රාත්තු 5 ක සංඛ්‍යාවක් ප්‍රදානය කරන ලදි. ඒ අතර තවත් කොන්ත්‍රාත්තු 8 ක සංඛ්‍යාවක් වෙනුවෙන් මිළ ගණන් කැඳවන ලද අතර ඒවා දැනට අගැයීමට භාජනය කරනු ලබමින් පවතී. වැල්ලවාය 11 වැනි පියවර, තණමල්විල, සෙවනගල, ලොග්ගල්ඔය හා වැලිමඩ 11 වැනි පියවර ජල සම්පාදන ව්‍යාපෘතීන් වෙනුවෙන් ප්‍රස්තුත වර්ෂය තුළදී ව්‍යාපෘති අගැයීම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලදි.

උතුරු පලාත ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය

උතුරු පලාත ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථාන කලාපය යාපනය හා වවුනියාව නම් වූ කළමනාකරණ කලාපයන්ගෙන් සමන්විත වන අතර ඒ මගින් යාපනය දිස්ත්‍රික්කය, කිලිනොච්චි දිස්ත්‍රික්කය, වවුනියා දිස්ත්‍රික්කය, මුලතිව් දිස්ත්‍රික්කය හා මන්නාරම දිස්ත්‍රික්කය නම් වූ භූගෝලීය ප්‍රදේශයන් පහක සංඛ්‍යාව ආවරණය කරනු ලබයි. එකී ප්‍රදේශය තුළ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 34 ක සංඛ්‍යාවක් විසින් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන අතර විෂය පාත්‍රගත වර්ෂය තුළදී ලබා දෙන ලද නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් ආසන්න වශයෙන් 5000 ක සංඛ්‍යාව සමග මෙම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය සතුව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 37000 ක මුළු සංඛ්‍යාවක් ක්‍රියාත්මක වෙමින් පවතී. මුළු නල මාර්ගික ජල සම්පාදන ආවරණය සියයට 15.5 ක් වශයෙන් වාර්තා වන අතර ඒ අතුරින් සියයට 13.7 ක ප්‍රතිශතයක් ක්‍රියාත්මක කරනු ලබන්නේ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ පරිපාලන මායිම් යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වේ.

ප්‍රස්තුත වර්ෂය තුළදී මුදල් රැස් කිරීම සඳහා පිහිටුවාගන්නා ලද ඉලක්කය සියයට 97.0 කින් සාක්ෂාත් කර ගැනීමට හැකි වූ අතර ඒ අනුව ජලය ඝණ මීටර මිලියන 5.3 ක් අලෙවි කොට උපයා ගත හැකි වූ මුළු මුදල් ප්‍රමාණය ලංකා රුපියල් මිලියන 198.1 ක් විය.

ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම් වැඩ සටහන යටතේ කරවෙඩ්ඩි හා චුන්නාකම්හි තිබුණ ඇස්බෙස්ටෝ සිමෙන්ති නල මාර්ගය වෙනුවට නව නල මාර්ගයක් යෙදීම, වෑල්ව 44 ක සංඛ්‍යාවක් ස්ථාපිත කිරීම හා දෝෂ සහගත මණු 405 ක සංඛ්‍යාවක් වෙනුවට අළුත් මණු යෙදීම යනාදී වැඩ කටයුතු ප්‍රස්තුත වර්ෂය තුළදී සිදු කරන ලදි. පුනරුත්ථාපන අය වැය වෙන් කිරීම යටතේ කිලෝ මීටර 7.67 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල මාර්ග දීර්ඝ කිරීම් වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරන ලදි. ප්‍රති ආරෝපණය කළ හැකි අරමුදල් යටතේ ලංකා රුපියල් මිලියන 10.15 ක අගය ප්‍රමාණයකින් යුක්ත වූ නල මාර්ග දීර්ඝ කිරීමේ වැඩ කටයුතු හා නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් ලබා දීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරන ලදි. ඒ අතර වවුනියාව කලාපය යටතේ කිලෝ මීටර 3.09 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල මාර්ග දීර්ඝ කිරීම් වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

කිලෝ වොට් 70 ක ධාරිතාවයකින් යුක්ත වූ හා කිලෝ වොට් 65 ක ධාරිතාවයකින් යුක්ත වූ සූර්ය බල ශක්ති පද්ධතීන් දෙකක් පිළිවෙලින් වල්ලිපුරම් පොම්පාගාරය මත හා කිලිනොච්චි ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය මත ස්ථාපිත කරන ලදි.

විසල් කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් (වියලි ආරු ජල ප්‍රභවය) වෙනුවෙන් NPC වෙතින් හා වැලිඔය ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් (යෝජිත කිවුල් ඔය ජලාශය) වෙනුවෙන් මහවැලි අධිකාරිය වෙතින් ජලය බෙදා හදා ගැනීමේ අනුමැතිය ලබා ගන්නා ලදි. විසල් වවුනියා ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් ජාතික ක්‍රම සම්පාදන හා සැලැසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගන්නා ලද අතර විසල් මන්නාරම ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා පැහැදිළි කිරීම් ජාතික ක්‍රම සම්පාදන හා සැලැසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත. විසල් කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් අවශ්‍ය ව්‍යාපෘති අගැයුම් කමිටුවේ අනුමැතිය ලබා ගන්නා ලද අතර බෝගස්වැව ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ද ව්‍යාපෘති අගැයුම් කමිටුවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදි. ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 30ක් කිලෝ මීටර 1012 ක දිග ප්‍රමාණයක් ආර්ක් භූගෝලීය තොරතුරු පද්ධති භාවිතා කරමින් WAMS යටතේ සංඛ්‍යාංක බවට පරිවර්තනය කරනු ලැබ ඇත. පසු ගිය 2021 වසර තුළදී ප්‍රාග්ධන අය වැය වෙන් කිරීම් යටතේ ලැබෙන අරමුදල් දේශීය අරමුදල් සම්පාදනයන් යටතේ ලංකා රුපියල් මිලියන 1,127 ක අගයකින් යුත් සැලැසුම් වැඩ කටයුතු නිම කරනු ලැබ ඇත.

දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවත්නා පූතික ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් හා ඉදිරියේදී අවශ්‍ය වන පූතික ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් හා විමධ්‍යගත අපජල ප්‍රතිකාරක හා බැහැර කිරීම් පද්ධතීන් පිළිබඳ විස්තර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගෙන්, පලාත් පාලන බල ධාරීන්ගෙන්, ආරෝග්‍ය ශාලාවන්ගෙන් හා වෙනත් ආයතනයන්ගෙන් එක් රැස් කර ගන්නා ලදි. ප්‍රධාන සනීපාරක්ෂණ සැලැසුම් පිළියෙල කිරීම පිළිබඳව දැනුවත් භාවය ඇති කිරීමේ වැඩ සටහනක් පවත්වන ලද අතර උතුරු පලාත වෙනුවෙන් වූ වායු හා ජල දූෂණ සිතියම සංවර්ධනය කරන ලදි. වර්ෂ 2021 සිට වර්ෂ 2030 දක්වා වූ ප්‍රධාන සනීපාරක්ෂණ සැලැසුම් මුලතිව්, වවුනියා හා මන්නාරම නම් වූ දිස්ත්‍රික්කයන් වෙත ඉදිරිපත් කරන ලදි.

ජල සුරක්ෂිතතා සැලැසුම් ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 16 ක සංඛ්‍යාවක් තුළ පූර්ණ ලෙස ක්‍රියාත්මක කරනු ලැබ ඇති අතර ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 4 ක සංඛ්‍යාවක් තුළ අර්ධ වශයෙන් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. කිලිනොච්චි, මන්නාරම හා පේදුරු තුඩුව නම් වූ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙනුවෙන් ජල සම්පාදන ව්‍යාපෘතීන් වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන බාහිර විධිමත් විගණන පරීක්ෂණයන් පවත්වනු ලැබ ඇති අතර එහිදී එම ජල සම්පාදන යෝජනා ක්‍රමයන් විසින් හොඳ තත්ත්වයේ ලකුණු ලබාගෙන ඇත.

"සැමට ජලය", පුනරුත්ථාපන, ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම හා ප්‍රාග් ධන අරමුදල් උපයෝගී කරගනිමින් ලංකා රුපියල් මිලියන 150.23 ක අගයකින් යුක්ත වූ ඉදි කිරීම් වැඩ කටයුතු ප්‍රස්තුත වර්ෂය තුළදී ක්‍රියාත්මක කරනු ලැබ ඇත. ටෙන්ඩර හා මිළ ගණන් ඉදිරිපත් කිරීම් 97 ක සංඛ්‍යාවක් ප්‍රදානය කරනු ලැබ ඇත. දිනකට ජලය ඝණ මීටර 1196 ක පරිමාව භූ ගත ජල ප්‍රභවය සංවර්ධනය කිරීම මගින් වර්ධනය කරනු ලැබ ඇත. තුළු මුව ළිං වල පැවැතියා වූ මෙහෙයුම් ගැටළු ළිං 23 ක සංඛ්‍යාවක් සංවර්ධනය කිරීම මගින් විසඳා ගන්නා ලදි. නල ළිං 25 ක සංඛ්‍යාවක් ඉදි කිරීමේ වැඩ කටයුතු හා ජල භූ විද්‍යාත්මක විමර්ෂණයන් 42 ක සංඛ්‍යාවක් පැවැත්වීමේ කටයුතු ද සම්පූර්ණයෙන් නිම කරන ලදි.

යාපනයේ කලාපීය රසායනාගාරය වෙත ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් 5 S සහතික කිරීම ප්‍රදානය කරනු ලැබ ඇති අතර එම රසායනාගාරය මධ්‍යම පාරිසරික අධිකාරිය යටතේ පාරිසරික පසු විපරම් කිරීමේ හා අගැයීම් කිරීමේ රසායනාගාරයක් වශයෙන් ලියාපදිංචි කරනු ලැබ ඇත. විවිධ පරදු ධාරීන් වෙනුවෙන් රසායනාගාර සේවාවන් ඉටු කර දීම හරහා එම රසායනාගාරය විසින් රුපියල් මිලියන 3.5 ක මුදල් ප්‍රමාණයක් උපයා ගනු ලැබ ඇත. යාපනයේ කලාපීය කාර්යාලය වෙත රජත ප්‍රමත හරිත ගොඩනැගිලි සහතිකකරණය හා 5 S ප්‍රමිති සහතිකකරණය ද, ජාතික ඵලදායිතා ප්‍රදානය යටතේ "විශේෂ ප්‍රශංසාවක්" ද ප්‍රදානය කරන ලබ ඇත.

යාපනය තුළ නිරන්තරයෙන් සිදු වන බැක්ටීරියාවේදීව සිදු වන

දූෂණය හා ඔඩ්ඩුසුඩාන් හා නෙදුන්කර්නි ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ දක්නට ලැබෙන ඉහළ මට්ටමේ ෆ්ලූඔරයිඩ් අන්තර්ගතය ද වාර්තා කරනු ලැබ තිබේ. සාමාන්‍යයෙන් ගත් කල යාපනය කලාපය තුළ දක්නට ලැබෙන තද බව, ක්ලෝරයිඩ් මට්ටම, EC හා ක්ෂාරිය තාවයේ අන්තර්ගතය ප්‍රමිතිගත තත්ත්වයන්ට වඩා ඉහළ මට්ටමක පවතී.

නැගෙනහිර පලාත ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය

නැගෙනහිර පලාත ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථාන කලාපය ත්‍රිකුණාමලය, අම්පාර, මඩකලපුව හා අක්කරෙයිපත්තු නම් වූ කළමනාකරණ කලාපයන්ගෙන් සමන්විත වන අතර ඒ මගින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය, අම්පාර දිස්ත්‍රික්කය හා මඩකලපුව දිස්ත්‍රික්කය නම් වූ භූගෝලීය ප්‍රදේශයන් තුනක සංඛ්‍යාව ආවරණය කරනු ලබයි. එකී ප්‍රදේශය තුළ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 56 ක සංඛ්‍යාවක් විසින් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන අතර විෂය පාත්‍රගත වර්ෂය තුළදී ලබා දෙන ලද නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 29000 කට අධික සංඛ්‍යාව සමග මෙම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය සතුව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 332000 ක මුළු සංඛ්‍යාවක් ක්‍රියාත්මක වෙමින් පවතී. මුළු නල මාර්ගික ජල සම්පාදන ආවරණය සියයට 78.2 ක් වශයෙන් වාර්තා වන අතර ඒ අතුරින් සියයට 71.1 ක ප්‍රතිශතයක් ක්‍රියාත්මක කරනු ලබන්නේ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයේ පරිපාලන මායිම් යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වේ.

ප්‍රස්තුත වර්ෂය තුළදී මුදල් රැස් කිරීම සඳහා පිහිටුවාගන්නා ලද ඉලක්කය සියයට 107.0 කින් සාක්ෂාත් කර ගැනීමට හැකි වූ අතර ඒ අනුව ජලය ඝණ මීටර මිලියන 56.0 ක් අලෙවි කොට උපයා ගත හැකි වූ මුළු මුදල් ප්‍රමාණය ලංකා රුපියල් මිලියන 2,075.2 ක් විය. ජල සම්පාදන යෝජනා ක්‍රම මට්ටමින් ගත් කල ගෙයින් ගෙට යාමේ ප්‍රවේශය, පාරිභෝගිකයින් සතු ජංගම දුරකථන අංක රැස් කර ගැනීමේ කටයුතු සියයට 85 ක් නිම කිරීමට හැකි වීම හා පණිවුඩ යැවීමේ සේවය ආරම්භ කිරීම හා වට්ස්ඇප් මගින් පණිවුඩ යැවීම ආදී ප්‍රවේශයන් නිසා ජල සම්පාදන ගාස්තු රැස් කිරීමේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු විය. ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම සඳහා මෙන්ම සේවා නල මාර්ගයන් දීර්ඝ කිරීම සඳහා ද මිටි බැඳි නල වෙනුවට නව නල යෙදීමේ වැඩ කටයුතු සිදු කරන ලදි. ග්‍රාමීය ජල සම්පාදන ප්‍රදේශයන් වෙත තොග වශයෙන් ජලය සපයනු වෙනුවට ගෘහස්ත සම්බන්ධතාවයන් සමග ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් පවරා ගෙන ඒවා බිල් කිරීමේ ක්‍රමය තුළට ඇතුලත් කර ගනු ලැබ ඇත.

ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ වැඩ සටහන යටතේ ප්‍රස්තුත වර්ෂය තුළදී බොහෝ ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ වැඩ කටයුතු බොහෝ ප්‍රමාණයක් ක්‍රියාත්මක කරන ලදි. මිටි බැඳි නල වෙනුවට නව නල යෙදීමේ වැඩ කටයුතු, මණු විතැන් කිරීම්, ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් පවරා දීම් හා ප්‍රධාන නල මාර්ග වෙනුවට නව නල මාර්ග යෙදීම් වැනි වැඩ කටයුතු ප්‍රස්තුත වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි. බල ශක්තිය සංරක්ෂණය කිරීමේ වැඩ කටයුතු යටතේ පෝම්ප හා උපකරණ නිරන්තරයෙන් නිවාරණ නඩත්තුවට බඳුන් කිරීම, බල ශක්ති විගණනයන් පැවැත්වීම හා කාර්යක්ෂමතා / කාර්ය සාධන පරීක්ෂණ මෙහෙයවීම වැනි වැඩ කටයුතු ප්‍රස්තුත 2021 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි. තවද කිලෝ වොට් 80 ක ධාරිතාවයකින් යුත් සූර්ය බල ශක්ති පැනල පද්ධතියක් ත්‍රිකුණාමලය කලාපීය කළමනාකාර කාර්යාලය තුළද, කිලෝ වොට් 40 ක ධාරිතාවයකින් යුත් පැනල පද්ධතියක් මඩකලපුව කලාපීය කළමනාකාර කාර්යාලය තුළ හා කිලෝ වොට් 75 ක ධාරිතාවයකින් යුත් පැනල පද්ධතියක් අම්පාර ප්‍රාදේශීය කළමනාකාර කාර්යාලය තුළ ද ස්ථාපිත කිරීමේ වැඩ කටයුතු ප්‍රස්තුත 2021 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි.

කිලෝ මීටර 212.5 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල මාර්ග දීර්ඝ කිරීම් වැඩ කටයුතු ප්‍රස්තුත 2021 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි. පාරිභෝගික කළමනාකරණය හා වත් කම් කළමනාකරණය යටතේ ප්‍රාදේශීය මට්ටමින් පාරිභෝගික පැමිණිලි, බිඳ වැටීම් වාර්තා කිරීම්, ගාස්තු රැස් කර ගැනීම සඳහා පහසුවෙන් පාරිභෝගිකයින් වෙත ප්‍රවේශ වීම හා සියළුම වත් කම් භූගෝලීය තොරතුරු පද්ධතිය අනුව සිතියම්ගත කිරීම ආදිය සඳහා පණිවුඩ පද්ධතියක් ස්ථාපිත කිරීමේ වැඩ කටයුතු ආරම්භ කරනු ලැබ ඇත. ආපදාවන්ට මුහුණ දීමට සූදානම් වීමේ හා ආපදා අවදානම් තත්ත්වයන් අඩු කර ගැනීමේ වැඩ කටයුතු යටතේ සියළුම ජල ප්‍රතිකාරක යන්ත්‍ර පරිශ්‍රයන් තුළ ද, තුළු මුව පරිශ්‍රයන් තුළ හා පොම්පාගාරයන් තුළ ද පොරොත්තු විදුලි බල වැඩ පිළිවෙල සූදානම් කොට තිබෙන අතර සේවා බිඳ වැටෙන අවස්ථාවන්හිදී බවුසර මගින් අඛණ්ඩ ලෙස ජලය සම්පාදනය කර දීමේ සූදානම ද පවත්නා අතර වට්ස්ඇප් කණ්ඩායම් භාවිතා කරමින් සියළුම කලාපයන් තුළ තොරතුරු බෙදා හදා ගැනීමේ වැඩ පිළිවෙලක් ද ස්ථාපිත කරනු ලැබ තිබේ. ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීමේ වැඩ කටයුතු යටතේ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 57 ක සංඛ්‍යාව අතුරින් ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 40 ක සංඛ්‍යාවක් තුළ සියළුම මොඩියුල 11 ම ක්‍රියාත්මක කරනු ලැබ ඇති අතර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර තුළු මුව 17 ක සංඛ්‍යාව අතුරින් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර 12 ක තුළු මුව සංඛ්‍යාවක් තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. මීට අමතර වශයෙන් කොන්ඩුවට්ටුවාන් හා පදියතලාව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් තුළ පෙරීමේ මාධ්‍යයන් වෙනුවට නව පෙරීම් මාධ්‍යයන් යෙදීම මගින් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් වැඩි දියුණු කරනු ලැබ ඇත. කලාපී සහාය සේවා මධ්‍යස්ථාන විසින් ක්‍රියාත්මක කරනු ලබන ජල සුරක්ෂිතතා සැලැසුම් යටතේ තුළු මුව ක්‍රියාත්මක වන මහ ඔය ජල ධාරක ප්‍රදේශය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබ ඇත.

ප්‍රාග් ධන වෙන් කිරීම් යටතේ පුනරුත්ථාපන වැඩ කටයුතු වෙනුවෙන් සහ "සැමට ජලය" වැඩ සටහන වෙනුවෙන් ලංකා රුපියල් මිලියන 63.8 ක මුදල් ප්‍රමාණයක්, ලංකා රුපියල් මිලියන 539.8 ක මුදල් ප්‍රමාණයක්, ලංකා රුපියල් මිලියන 139.0 ක මුදල් ප්‍රමාණයක්, ලංකා රුපියල් මිලියන 92.4 ක මුදල් ප්‍රමාණයක්, ලංකා රුපියල් මිලියන 11.6 ක මුදල් ප්‍රමාණයක් හා ලංකා රුපියල් මිලියන 34.6 ක මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලැබ ඇති අතර උපයෝගිතා විතැන් කිරීමේ කටයුතු හා හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකු ගඩු රෝගය පාලනය කිරීමේ වැඩ කටයුතු වෙනුවෙන් ලංකා රුපියල් මිලියන 600 ක දේශීය බැංකු අරමුදල් විශේෂ වෙන් කිරීමක් සිදු කරනු ලැබ ඇත. මෙම විශේෂ වෙන් කිරීම වෙතින් ලංකා රුපියල් මිලියන 202.6 ක මුදල් ප්‍රමාණයක් පහත දක්වා ඇති පරිදි වැය කරනු ලැබ ඇත. එනම් එයින් ලංකා රුපියල් මිලියන 29.4 ක මුදල් ප්‍රමාණයක් හඳුනා නොගත් හේතූන් නිසා හට ගනු ලබන නිදන්ගත වකු ගඩු රෝගය පාලනය කිරීමේ අරමුදල් යටතේ අම්පාර කලාපය තුළ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම සඳහා සහ වැඩි දියුණු කිරීම් කටයුතු වෙනුවෙන් වැය කරනු ලැබ ඇති අතර ඉතිරි ශේෂය වූ ලංකා රුපියල් මිලියන 173.2 ක මුදල් ප්‍රමාණය ත්‍රිකුණාමල කලාපය තුළ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු වෙනුවෙන් සහ ජලාශ ඉදි කිරීමේ වැඩ කටයුතු වෙනුවෙන් වැය කරනු ලැබ ඇත. මෙම මුදල් ප්‍රමාණයන් වැය කරනු ලැබ ඇත්තේ ලංකා රුපියල් මිලියන 600 ක විශේෂ වෙන් කිරීම යටතේ වේ. ග්‍රාමීය ජල සම්පාදන වැඩ කටයුතු යටතේ අම්පාර කලාපය තුළ එක් ප්‍රජා මූල සංවිධාන ජල සම්පාදන යෝජනා ක්‍රමයක් පවරා ගනු ලැබ ඇති අතර ත්‍රිකුණාමල කලාපය තුළ තවත් එක් ප්‍රජා මූල සංවිධාන ජල සම්පාදන යෝජනා ක්‍රමයක් පවරා ගැනීමේ කටයුතු දැනට සිදු කර ගෙන යනු ලබමින් පවතී. මේ අතර පාසැල් වෙනුවෙන් ජල සම්පාදන පහසු කම් සම්පාදනය කර දීමේ වැඩ කටයුතු දැනට සිදු කරගෙන යනු ලබමින් පවතින අතර තෝරා ගනු ලැබූ පාසැල් 45 ක සංඛ්‍යාවක් වෙනුවෙන් හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකු ගඩු රෝගය පාලනය කිරීමේ ක්‍රියාකාරකම් යටතේ ජල සම්පාදන පහසුකම් සම්පාදනය කර දීමේ වැඩ කටයුතු ප්‍රස්තුත 2021 වර්ෂය තුළදී සම්පූර්ණ වශයෙන් නිම කරනු ලැබ ඇත. තොග මට්ටම් පහල තත්ත්වයක පවත්වාගෙන යාමේ වැඩ කටයුතු යටතේ "සැමට ජලය" ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය සතුව පවතින තොග භාණ්ඩ උපයෝගී කර ගනු ලබන අතර තොග මට්ටම් අඩු කිරීම පිණිස ද්‍රව්‍ය වෙනත් ස්ථානයන් වෙත යැවීම ද සිදු කරනු ලැබේ. අතිරික්ත හා ප්‍රයෝජනයට ගැනීමේ හැකියාවක් නැති භාණ්ඩ නියම මිළට නැවත මිළ කරනු ලබන අතර

එම භාණ්ඩ බැහැර කිරීමට හා අලෙවි කර දැමීමට ක්‍රියා කරනු ලැබේ.

ප්‍රස්තුත වර්ෂය තුළදී කලාපයන්ට අදාල සියළුම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වෙමින් පැවැතියේය. මේ අතර ත්‍රිකුණාමලය කලාපය වෙත දිනකට පැය 24 ක ජල සම්පාදනයක් ලබා දීමට හැකි වන පරිදි කන්තලේ නිෂ්පාදනය වර්ධනය කිරීමේ ගැටළුවට ද මුහුණ දෙන්නට සිදු විය. පැරණී නල මාර්ගයන් හා අවශ්‍ය ප්‍රමාණයට වඩා කුඩා නල මාර්ගයන් හේතුකොට ගෙන ත්‍රිකුණාමලය කලාපය තුළ ඉහළ මට්ටමේ ආදායම් රහිත ජල පරිමාවක් දක්නට ලැබුණ අතර ඒ හේතූන් නිසා නිතර නිතර සේවා බිඳ වැටීම් ද සිදු විය. මුහුණ දෙන්නට සිදු වූ තවත් ගැටළුවක් වූයේ විශේෂයෙන්ම නල සවි කරන්නන්, විදුලි කාර්මිකයින් හා බැක් හෝ ක්‍රියා කරවන්නන් වැනි පුහුණු සේවකයින්ගේ හිඟයයි.

බටහිර - නිෂ්පාදන ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය

බටහිර - නිෂ්පාදන ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් දැනට අඹතලේ, ලබුගම, කලටුවාව, බියගම, බම්බුකුලිය, කඳාන, කෙත්හේන හා නවගමුව (චිකෝ) නම් වූ පානීය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර 8 ක මෙහෙයුම් කටයුතු හා නඩත්තු කටයුතු ක්‍රියාත්මක කරගෙන යනු ලබන අතර ඒ සංඛ්‍යාව අතුරින් විශාලතම පහසුකම වන්නේ දිනක් තුළදී ආසන්න වශයෙන් ජලය ඝණ මීටර 550000 ක පරිමාවක් නිෂ්පාදනය කරනු ලබන අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වේ. තනි තනිව ගත් කල අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය විසින් පමණක් බටහිර - නිෂ්පාදන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ මුළු නිෂ්පාදනයෙන් සියයට 45 ක ප්‍රතිශතයක් තනිව නිෂ්පාදනය කරනු ලබයි. වර්ෂ 2020 නොවැම්බර් මාසය තුළදී දිනකට ජලය ඝණ මීටර 180000 ත නිෂ්පාදන ධාරිතාවයක් සහිත කැළණිය දකුණු ඉවුර 11 ව්‍යාපෘතියේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමත් සමග බටහිර - නිෂ්පාදන ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයේ මුළු නිෂ්පාදනය එක් දිනකට ජලය ඝණ මීටර මිලියන 1. 27 ක් දක්වා වර්ධනය වන ලදී. බටහිර - නිෂ්පාදන ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් එක් දිනක් තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිෂ්පාදනය කරනු ලබන මුළු නිෂ්පාදනයෙන් සියයට 50 කට අධික නිෂ්පාදනයක් එක් දිනක් තුළදී සිදු කරනු ලබයි. කෙත්හේන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ නිෂ්පාදන ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 72000 ක් දක්වා වැඩි කිරීමේ අරමුණ සහිතව දැනට ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවතින වර්ධන වැඩ කටයුතු වර්ෂ 2022 මාර්තු මාසය වන විට සම්පූර්ණයෙන් අවසන් කළ හැකි වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. අඹතලේ නිෂ්පාදන ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 50000 කින් නංවා ලීම හා වැලිවිට ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ නිෂ්පාදන ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 180000 ක් දක්වා නංවා ලීම හේතුකොට ගෙන බස්නාහිර පලාත තුළ දැනට වැඩි වෙමින් පවතින ජල ඉල්ලුම සපුරා ලිය හැකි වන පරිදි කෙටි කාලයක් තුළ නිෂ්පාදන ධාරිතාවය ඉහල යනු ඇතැයි කියා අපේක්ෂා කරනු ලැබේ. කඳාන 11 වැනි අදියර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ද වර්ෂ 2020 ඔක්තෝබර් මාසය තුළදී සිදු කරන ලද අතර එව කොන්ත්‍රාත්තුවට අදාල වැඩ කටයුතු ළඟදීම ආරම්භ කරනු ලබනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

බටහිර - නිෂ්පාදන ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් කොළඹ දිස්ත්‍රික්කය, ගම්පහ දිස්ත්‍රික්කය හා කළුතර දිස්ත්‍රික්කයේ කොටසක් වෙත පානීය ජලය සම්පාදනය කර දෙනු ලබයි. එම පානීය ජලය බෙදා හරිනු ලබන්නේ බටහිර මධ්‍යම, බටහිර උතුර හා බටහිර දකුණ නම් වූ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයන් තුන විසින් වේ. සුරක්ෂිත හා බාධාවකින් තොර ජල සම්පාදනයක් සහතික කිරීම පිණිස බටහිර - නිෂ්පාදන ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය හා සම්බන්ධ මෙහෙයුම් කිරීමේ හා නඩත්තු කිරීමේ කටයුතු මෙහෙයුම් කළමනාකරු, කඳාන කළමනාකරු, බියගම කළමනාකරු හා නඩත්තු කළමනාකරු යන කළමනාකරුවන් සිව් දෙනා අතර බෙදා දෙනු ලැබ ඇත.

අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ජල සම්පාදන ධාරිතාවය වර්ධනය කිරීම අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා කැළණි දකුණු ඉවුර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය සම්බන්ධ කිරීම මගින් ක්‍රියාත්මක කරන ලදී. පැරණී චර්චි හිල් නල මාර්ගය ඔස්සේ හා අළුතින් වලන ලද මිලි මීටර 800 ක විෂ්කම්භ ප්‍රමාණයකින් යුක්ත වූ මෘදු යකඩ නල මාර්ගය ඔස්සේ එක් දිනකට ජලය ඝණ මීටර 50000 ක ප්‍රතිකාරිත ජලය ධාරිතාවයක් සම්පාදනය කර දෙනු ලැබේ. මේ හේතුකොට ගෙන අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාවයන් තව දුරටත් විස්තාරණය කිරීමේ හැකියාව උදා විය.

අඹතලේ, බියගම හා බම්බුකුලිය නම් වූ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර 3 ක සංඛ්‍යාවක් විසින් ජාත්‍යන්තර ප්‍රමිති සංවිධාන 9001 - 2015 ගුණාත්ම කළමනාකරණ පද්ධති සහතිකකරණය අත්පත් කරගනු ලැබ ඇත. වර්ෂ 2021 ජනවාරි මාසය තුළදී ශ්‍රී ලංකා සම්මාන පිළිගැනීම් දීමේ මණ්ඩලය (SLAB) විසින් පවත්වන ලද නැවත සහතික කිරීමේ විගණන පරීක්ෂණයට අනුගාමී ලෙස අඹතලේ රසායනාගාරය විසින් අත් කරගෙන තිබූ ජාත්‍යන්තර ප්‍රමිති සංවිධාන 17025 - 2005 සම්මානිත පිළිගැනීම ජාත්‍යන්තර ප්‍රමිති සංවිධාන 17025 - 2017 සම්මානිත පිළිගැනීම ලෙස ඉහළ ශ්‍රේණිගත කරනු ලැබ ඇත. මේ හේතුකොට ගෙන අඹතලේ රසායනාගාරය වෙත නව සුණු ප්‍රමිතිය වූ ශ්‍රී ලංකා ප්‍රමිති 1577 - 2017 ලබා ගැනීමේ හැකියාව ලැබුණ අතර එකී ප්‍රමිතිය තුළට මැග්නීසියම් ඔක්සයිඩ් ඇතුලත් වේ. මීට අමතර වශයෙන් දැනට තිබෙන (පී එච් අගය, බොර භාවය, සන්නායකතාව, ක්ලෝරයිඩ්, තද භාවය හා ක්ෂාරිය තාවය නම් වූ) පිළිගත් ජල ගුණාත්ම පරාමිතීන් ලැයිස්තුවට යකඩ මිශ්‍ර භාවය, ෆ්ලූඔරයිඩ්, ෆොස්ෆේට් හා නයිට්‍රේට් නම් වූ තවත් ජල ගුණාත්ම පරාමිතීන් 4 ක සංඛ්‍යාවක් APHA 23 වැනි සංස්කරණය භාවිතා කරමින් එකතු කරනු ලැබ ඇත. දැනට අඹතලේ රසායනාගාරය සතුව සීනක්කාරම් තුළ ඇති කැඩ්මියම්, ඊයම්, ක්‍රෝමියම්, මැංගනීස් හා යකඩ ඇතුළු බැර ලෝහ වර්ග ඇතුලත් පරාමිතීන් 25 ක සංඛ්‍යාවක් වෙනුවෙන් ලැබුණ පිළිගැනීම් තිබේ. බියගම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා සම්බන්ධ රසායනාගාරය ද 2021 වර්ෂයේ ඔක්තෝබර් මාසය තුළදී ශ්‍රී ලංකා සම්මාන පිළිගැනීම් දීමේ මණ්ඩලය (SLAB) විසින් 17025 - 2017 සඳහා සහතික කරනු ලැබ ඇති අතර කඳාන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා සම්බන්ධ රසායනාගාරය ද එම පිළිගැනීම ලබා ගැනීම අරමුණු කොට ගත් විගණන පරීක්ෂණය 2021 වර්ෂයේ මාර්තු මාසය තුළදී කරවා ගැනීම සඳහා සැලැසුම් කරනු ලබමින් පවතී.

දවස මුළුල්ලේම ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීමේ ස්ථිර භාවය පවත්වාගෙන යාම ඉලක්ක කර ගත් ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් 7 ක සංඛ්‍යාවක් තුළ සිදු කරගෙන යනු ලබන අතර ජල සම්පාදන ව්‍යාපෘතීන් 3 ක සංඛ්‍යාවක් 2020 වර්ෂය තුළදී බාහිර විධිමත් විගණන පරීක්ෂණයන්ට භාජනය කරන ලදුව "හොඳයි" යනුවෙන් ශ්‍රේණිගත කරනු ලැබ ඇත. ලබුගම ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් වූ අභ්‍යන්තර අවිධිමත් විගණන පරීක්ෂණය 2020 වර්ෂය තුළදී පවත්වන ලද අතර ඉතිරි ජල සම්පාදන ව්‍යාපෘතීන් ද විගණන පරීක්ෂණයට මුහුණ දීමට සූදානමින් පවතී. මධ්‍ය පරිමාණ කර්මාන්ත වෙනුවෙන් 2018 වර්ෂය තුළදී පවත්වන ලද ඵලදායිතා තරඟයේ ප්‍රතිඵල අනුව බියගම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත 2 වැනි ස්ථානය ප්‍රදානය කරනු ලැබ ඇත. "ඵලදායිතාව" හා "5 S" වැඩි දියුණු කිරීම අරමුණු කොට ගත් පුහුණු වැඩ සටහන් හා වැඩ මුළු පැවැත්වීම වැනි වැඩ කටයුතු සියළුම ප්‍රතිකාරක යන්ත්‍රාගාර වැඩ බිම් වෙනුවෙන් පවත්වාගෙන යනු ලැබේ.

අඹතලේ පද්ධතියේ විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීම ඉලක්ක කොට ගත් අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩි දියුණු කිරීමේ හා බල ශක්ති සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය (AWSSIESP) විසින් එහි වැඩ කටයුතු ආරම්භ කරනු ලැබ තිබේ. කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා, බල ශක්ති සංරක්ෂණය කිරීම සඳහා සහ අධීක්ෂණාත්මක පාලනය හා දත්ත අත්පත් කර ගැනීම (SCADA) හරහා මෙහෙයුම් කිරීමට හැකි වන පරිදි පද්ධතිය ඉහළ ශ්‍රේණිගත කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය මගින් පද්ධතිය තුළ ඇති බොහෝ පැරණී පෝම්ප හා වෑල්ව වෙනුවට නව පෝම්ප හා වෑල්ව යෙදීමේ කටයුතු සිදු කරනු ලබනවා ඇත. පාරිසරික ආරක්ෂිත භාවය කෙරෙහි ඇති කැපවීම වැඩි දියුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය මගින් දිනකට ඝණ මීටර 8000 ක ධාරිතාවයකින් යුක්ත වූ ගොහොදු මඩ ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ද ක්‍රියාත්මක කරනු ලබනවා ඇත.

ජල ගුණාත්මය ප්‍රවීක්ෂණය කිරීම බටහිර නිෂ්පාදන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් එදිනෙදා ක්‍රියාත්මක කරනු ලබන කර්තව්‍යයක් වේ. මේ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති 614 : 2013 ප්‍රමිතිය හා අනුකූල වන බව සහතික කිරීම සඳහා නල මාර්ගික පානීය ජලය පාරිභෝගිකයා වෙත බෙදා හරිනු ලැබීමේ ලක්ෂ්‍යය දක්වා පසුවිපරමට බඳුන් කරනු ලැබේ.

තිබෙන භාණ්ඩ තොග අතර ඇති ප්‍රයෝජනයට ගත නොහැකි හා ඉල්ලුමක් නොමැති අයිතමයන් හඳුනා ගැනීම සඳහා වාර්ෂික තොග හරි වැරදි බැලීමේ කටයුතු හා ස්ථාවර වත් කම් හරි වැරදි බැලීමේ කටයුතු සිදු කරනු ලැබේ. තොග මට්ටම් අඩු කර ගැනීම සඳහා සහ වත් කම් කළමනාකරණ ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහා තොග හරි වැරදි බැලීමේ ප්‍රතිඵල විශ්ලේෂණයට භාජනය කරනු ලැබේ.

තිරසාර භාවය හා හදිසි අවස්ථා ප්‍රතිචාර

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සියළුම එදිනෙදා වැඩ කටයුතු ස්වභාවයෙන්ම දිශානතිගත වී ඇත්තේ තිරසාර සංවර්ධන ඉලක්කයන්ගේ අංක 6 වැනි ඉලක්කය, එනම් : ''සැමට ජලය හා සනීපාරක්ෂණය ලබා දීම තිරසාර ලෙස කළමනාකරණය කිරීම'' වෙත වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ක්‍රියාශීලී ලෙස යෙදී සිටින්නේ ශ්‍රී ලංකාව තුළ තිරසාර සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමේ ජාතික මට්ටමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීමෙහි වේ. සහශ්‍ර වාර්ෂික සංවර්ධන ඉලක්කයන්ගේ සිට තිරසාර සංවර්ධන ඉලක්කයන් වෙත පරිනාමණය වීමේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මහා නගර සැලැසුම් කිරීමේ, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ යෙදී සිටින ලද්දේ අංක 6. 1 ඉලක්කය, එනම් වර්ෂ 2030 වන විට කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ අවශ්‍යතාවයන් වෙත විශේෂ අවධානය යොමු කරමින් සියළු දෙනා වෙනුවෙන් ආරක්ෂිත හා සාධාරණ මිළකට ලබා ගත හැකි ජලය ලබා ගැනීමේ සර්වත්‍ර හා සාධාරණ භාවයක් සාක්ෂාත් කර ගැනීම හා අංක 6.2 ඉලක්කය, එනම් සියළු දෙනා වෙනුවෙන් ප්‍රමාණවත් හා සාධාරණ සනීපාරක්ෂණ පහසුකම් හා ස්වස්ථතා පහසුකම් ලබා ගැනීමේ හැකියාව සාක්ෂාත් කර ගැනීම හා විවෘත මළ පහ කිරීම අවසන් කිරීමේ හැකියාව ලබා ගැනීම පිළිබඳව පසුවිපරම් කිරීමට හා වාර්තා කිරීමට හැකි වන පරිදි ජාතික දර්ශකයන් ගොඩ නැගීමේ හා ඉලක්ක පිහිටුවීමේ යෙදී සිටින ලදි.

ජාතික ජල සම්පාදන මණ්ඩලයේ සංයුක්ත ක්‍රියාකාරී සැලැසුම් දිශානතිගත කරනු ලැබ තිබුණේ අදාල තිරසාර සංවර්ධන ඉලක්කයන් වෙත වේ. එසේම මහා නගර සැලැසුම් කිරීමේ, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වරයා විසින් පිහිටුවන ලද කමිටුවක් විසින් පාද රේඛාව හා ඉලක්කයන් ස්ථාපිත කිරීමේ වැඩ කටයුත්තෙහි යෙදී සිටින ලදි. මෙම විශේෂ කමිටුව විසින් නිර්දේශ කරන ලද ඉලක්කයන් හා අරමුණු අවසන් කිරීමේ හා වලංගු බවට පත් කිරීමේ වැඩ කටයුතු 2019 වර්ෂයේ ජුනි මාසය තුළදී පරදු ධාරීන් විසින් ක්‍රියාත්මක කරන ලදි. එහි පිහිටුවනු ලැබ ඇති ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිය අනාගත මෙහෙයුම් හා සංවර්ධන සැලැසුම් තුළට අදාල ක්‍රියාකාරකම් හා අදාල අය වැය වෙන් කිරීම් අන්තර්ගත කිරීමෙහි අඛණ්ඩ ලෙස ක්‍රියා කරමින් සිටී.

තවද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2019 වර්ෂය තුළදී මෙම පරමාර්ථය සාක්ෂාත් කර ගැනීමේ අරමුණ සහිතව දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලියක් සකස් කිරීම පිළිබඳව අමාත්‍යාංශයේ නායකත්වය යටතේ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලදි.

2021 වර්ෂය තුළදී ද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අදාල රජයේ ආයතනයන් සමග එක් වී තිරසාර භාවය හා හදිසි අවස්ථා ප්‍රතිචාර වැඩ කටයුතු වල අඛණ්ඩ ලෙස යෙදී සිටින ලද අතර රජයේ ආයතනයන් විසින් මෙහෙයවන ලද වැඩ මුළු කිහිපයකට සහභාගි වෙමින් සිය දායකත්වය ලබා දෙන ලදි. ඒවායේ විස්තර මෙහි පහත සඳහන් කරනු ලැබ ඇති පරිදි වේ :

i. ශ්‍රී ලංකා ස්වේච්ඡා ජාතික ශාස්ත්‍රීය සඟරාව (Sri Lanka Voluntary National Review) වෙනුවෙන් පවත්වන ලද ජාතික බහු පරදුධාරී උපදේශක වැඩ මුළුව - ශ්‍රී ලංකා පදනම් ආයතනයේ ශ්‍රවණාගාරය - 2018. 04. 24

ii. තිරසාර සංවර්ධන ඉලක්කය අංක 6 පසුවිපරම් කිරීම - පරදුධාරී උපදේශක වැඩ මුළුව - මහා නගර සැලැසුම් කිරීමේ හා ජල සම්පාදන අමාත්‍යාංශය - මහා නගර සැලැසුම් කිරීමේ හා ජල සම්පාදන අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරය - 2018. 04. 26

iii. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබීමට නියමිත ගෘහස්ත සමීක්ෂණය වෙනුවෙන් අවශ්‍ය ජල ගුණාත්මය පරීක්ෂා කිරීම - තිරසාර සංවර්ධන ඉලක්ක අංක 6 - අරමුණු අංක 6. 1 - මහා නගර සැලැසුම් කිරීමේ හා ජල සම්පාදන අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරය - 2018. 10. 23

iv. තිරසාර සංවර්ධන ඉලක්ක අංක 6 දර්ශක කමිටු රැස්වීම - මහා නගර සැලැසුම් කිරීමේ හා ජල සම්පාදන අමාත්‍යාංශය - 2018. 08. 17

v. ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය ශක්තිමත් කිරීම. තිරසාර සංවර්ධන ඉලක්කයන් සඳහා සූදානමින් සිටීම පිළිබඳව පරදුධාරීන් සමග පවත්වන ලද රැස්වීම - එවකට තිබුණ මහා නගර සැලැසුම් කිරීමේ හා ජල සම්පාදන අමාත්‍යාංශය - 2018. 03. 28

vi. ලෝක සෞඛ්‍ය සංවිධානය හා එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා හදිසි අවස්ථා අරමුදල (UNICEF) ඒකාබද්ධ පසුවිපරම් කිරීමේ වැඩ සටහන විසින් පවත්වන ලද තිරසාර සංවර්ධන ඉලක්ක 6. 1 හා 6. 2 සාක්ෂාත් කර ගැනීම සඳහා සුරක්ෂිත ලෙස කළමනාකරණය කරන ලද ජල සම්පාදනය හා සනීපාරක්ෂණය සම්බන්ධ ගෝලීය පසුවිපරම් ක්‍රමය පිළිබඳව පවත්වන ලද ජාල සම්මන්ත්‍රණය (Webinar) - මහා නගර සැලැසුම් කිරීමේ, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරය - 2019. 05. 28

vii. තිරසාර සංවර්ධන ඉලක්ක අංක 6 අරමුණු - ජල සම්පාදනය හා සනීපාරක්ෂණය පිළිබඳ තිරසාර සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම සඳහා වූ ජාතික ඉලක්කයන් පිළියෙල කිරීම - මහා නගර සැලැසුම් කිරීමේ, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරය - 2019. 06. 26

viii. තිරසාර සංවර්ධන ඉලක්ක අංක 6 ට අදාල දර්ශකයන් සම්බන්ධයෙන් වූ ලෝක සෞඛ්‍ය සංවිධානයේ හා එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා හදිසි අවස්ථා අරමුදල

(UNICEF) ඒකාබද්ධ පසුවිපරම් කිරීමේ වැඩ සටහනේ සහාය ඇතිව පවත්වන ලද වැඩ මුළුව - වෝටර්ස් එජ් හෝටලය - 2019 . 07. 23

ix. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන් වෙනුවෙන් තිරසාර සංවර්ධන ඉලක්ක මුඛ්‍ය ධාරාත්මක පොදු සේවා පිළිබඳ දැනුවත් කිරීම් පිළියෙල කිරීම හා තිරසාර සංවර්ධන වැඩ මුළුව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා ක්‍රමෝපාය සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම - මවන්පික් හෝටලය - 2019. 09. 20

x. 2020 - 2021 ඒකාබද්ධ පසුවිපරම් කිරීමේ වැඩ සටහන සමාලෝචනය කිරීමේ රැස්වීම - නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරය - 2020. 03. 05

xi. තිරසාර සංවර්ධනය වෙනුවෙන් වූ ජාතික ප්‍රතිපත්තිය හා ක්‍රමෝපාය වලංගු භාවයට පත් කිරීමේ වැඩ මුළුව - ජයික් හිල්ටන් හෝටලය හා ජෙට් විංග් බිලූ හෝටලය - 2020. 03. 12 හා 2021.3.14

xii. තිරසාර සංවර්ධනය හා සම්බන්ධ ජාතික ප්‍රතිපත්ති කෙටුම් පත හා ක්‍රමෝපාය සමාලෝචනය කිරීම - ජල සම්පාදන අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරය - 2020. 06. 22

xiii. මුඛ්‍ය ධාරාගත කිරීමේ හා දත්ත හැකියාව ගොඩ නැගීමේ වැඩ මුළුව - ජල සම්පාදන අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරය - 2021. 03. 19

xiv. 2021. 03. 19 වැනි දින පවත්වන ලද ඉල්ලා සිටිනු ලැබ ඇති දත්ත ඉදිරිපත් කිරීමේ වැඩ මුළුව –

xv. ජල සම්පාදන අංශයේ තිරසාර සංවර්ධන ඉලක්කයන් පිළිබඳ දර්ශකයන් හා සම්බන්ධ දත්ත ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම - 2021. 08. 17

xvi. මුඛ්‍ය ධාරාගත කිරීමේ හා දත්ත හැකියා ගොඩ නැංවීමේ වැඩ මුළුව සම්බන්ධයෙන් වූ තාක්ෂණික සැසි වාරය - වෝටර්ස් එජ් හෝටලය - 2021. 09. 05

ශ්‍රී ලංකා ජන රජයේ මානව හිමිකම් ක්‍රියාත්මක සැලැස්ම හා අනුකූල වන සේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2018 වර්ෂය තුළදී "හදිසි ආපදා තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමේ සැලැසුමක්" සංවර්ධනය කරන ලදි. හදිසි ආපදා තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමේ සැලැසුම සැලැසුම් කරනු ලැබ ඇත්තේ ජල සම්පාදන පද්ධතීන් තුළ පැන නැගිය හැකි විවිධ හදිසි ආපදා තත්ත්වයන් සම්බන්ධයෙන් අවශ්‍ය වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීමට මෙන්ම සිය පාරිභෝගික ජනතාව වෙත හා සාමාන්‍ය පොදු ජනතාව වෙත විධිමත් ලෙස ජලය සම්පාදනය කර දීමේදී ඇති විය හැකි බාධාවන් අවම කර ගැනීමේ අරමුණින් යුක්තව මෙහෙයුම් කරුවන් වෙත හා පරිපාලනය වෙත මාගෝපදේශයන් ලබා දීම පිණිස හා හදිසි ආපදා තත්ත්වයක් තුළදී මහ ජනතාව වෙත සෞඛ්‍ය ආරක්ෂාව හා සුරක්ෂිත භාවය ලබා දීම සඳහා ද වේ. 2021 වර්ෂය තුළදී ද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මෙම හදිසි ආපදා තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමේ සැලැසුමට යාවත්කාලීන කිරීම් සිදු කරන ලදි. 2021 වර්ෂය තුළදී අද්‍යාල නව විකාශනයන් සැලැකිල්ලට ගනිමින් පානීය ජල ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම ද අබන්ඩ ලෙස ක්‍රියාත්මක කරන ලදි.

හදිසි ආපදා තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීම මත රට තුළ මතු වූ කොවිඩ් 19 ලෝක වසංගත තත්ත්වය වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දෙන ලද දායකත්වය.

හදිසි ආපදා තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමේ පදනම මත දීප ව්‍යාප්ත කොවිඩ් 19 මධ්‍යස්ථානයන් වෙත හා නිරෝධායන මධ්‍යස්ථානයන් වෙත ඉල්ලුම මත පදනම් වෙමින් ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් හා අභ්‍යන්තර ජලය බෙදා හැරීමේ පද්ධතීන් සම්පාදනය කර දෙන ලදි. ඊට අමතර වශයෙන් කොවිඩ් 19 මධ්‍යස්ථානයන් වෙත හා නිරෝධායන මධ්‍යස්ථානයන් වෙත බවුසර මගින් ජලය සැපැයීමේ වැඩ පිළිවෙලක් ද ක්‍රියාත්මක කරන ලද අතර පොදු ස්ථානයන්හි අත් සේදීමේ පහසුකමක් වශයෙන් ජල ටැංකි තැබීම ද සිදු කරන ලදි.

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

"විගණන කමිටුවේ සෑම නිර්දේශයක්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර ඇතැම් කරුණු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් තුළදී තව දුරටත් සාකච්ඡාවට භාජනය කරනු ලබනවා ඇත"

කමිටුවේ සංයුතිය

2021 වර්ෂය තුළදී විගණන කමිටුව මෙහි පහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

■ **අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්**

1. ඒ. ආර්. වික්‍රමසිංහ මහත්මිය - විගණන කමිටුවේ සභාපතිනිය
2. ඉංජිනේරු ටී. එම්. ආර්. පී. තෙන්නකෝන් - සාමාජික
3. බී. එන්. දම්මින්ද කුමාර මහතා - සාමාජික

■ **ආරාධනය අනුව සහභාගි වන නිත්‍ය සහභාගි වන්නන්**

4. නිමල් ආර්. රණවක මහතා - උප සභාපති / අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
5. ටී. එස්. විජේතුංග මහතා - සාමාන්‍යාධිකාරී
6. ආර්. එම්. ඒ. එස්. වීරසේන මහතා - අතිරේක සාමාන්‍යාධිකාරී (මුදල්)
7. ජී. කේ. ඉද්දමල්ගොඩ මහතා - අතිරේක සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමනාකරණ)
8. එස්. ජී. ජී. රාජ්කුමාර් මහතා - අතිරේක සාමාන්‍යාධිකාරී (සාමූහික සේවා)
9. යූ. ජේ. සමරසිංහ මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) - 2021 අගෝස්තු 18 දින සිට
10. ඒ. ශ්‍රියාලතා මහත්මිය - වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) /ප්‍රධාන අභ්‍යන්තර විගණක – 2021 අගෝස්තු 18 දිනය දක්වා
11. ඩී. එන්. පීරිස් මහත්මිය - රජයේ විගණන අධිකාරී
12. එස්. ඩබ්ලිව්. ගුණවර්ධන මහත්මිය - ප්‍රධාන අභ්‍යන්තර විගණක, ජල සම්පාදන අමාත්‍යාංශය – 2021 නොවැම්බර් 30 වැනි දිනය දක්වා

■ **කමිටුවේ ලේකම්**

ඩබ්. පී. සඳමාලි ද සිල්වා මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

රැස්වීම් සඳහා සහභාගි වීම

නම	සහභාගි වීමේ සුදුසුකම	සහභාගි වීම
ඒ. ආර්. වික්‍රමසිංහ මහත්මිය	07	07
ඉංජිනේරු ටී. එම්. ආර්. පී. තෙන්නකෝන්	07	06
බී. එන්. දම්මින්ද කුමාර මහතා	07	02

විගණන කමිටුව පිහිටුවන ලද්දේ වර්ෂ 1999 නොවැම්බර් 19 වැනි දින දරණ අංක PF/PE/03 දරණ චක්‍ර ලේඛය අනුව වන අතර ඒ සඳහා අංක 590 දරණ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම තුළදී ගන්නා ලද අංක 2965 (බී) දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මඟින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාවය ලබා ගන්නා ලදි. මෙම කමිටුවේ පරමාර්ථය වන්නේ PED 01/2021 හා 2021. 11. 16 දාතම දරණ චක්‍ර ලේඛයේ අන්තර්ගතව ඇති මාර්ගෝපදේශයන් අනුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිය සහාය ලබා දීම වේ.

භූමිකා හා වග කීම්

කමිටුව වෙනුවෙන් නියම කරනු ලැබ ඇති භූමිකාවන් හා වග කීම් මෙහි පහත සඳහන් කරනු ලැබ ඇති පරිදි පෙන්වා දෙනු ලැබ තිබේ.

- වාර්ෂික විගණන සැලැසුම හා එකී සැලැසුම තුළ කරනු ලබන සියළුම ප්‍රධාන වෙනස් කම් විගණන කමිටුව විසින් අනුමත කරනු ලැබිය යුතු වේ.
- අභ්‍යන්තර විගණන පරීක්ෂක වරුන්ගේ අඛණ්ඩ අපක්ෂපාතී භාවය හා ඔවුන්ගේ කාර්ය සාධකත්වය විගණන කමිටුව විසින් සමාලෝචනයට බඳුන් කිරීම අවශ්‍ය වේ.
- මූල්‍ය වාර්තා කිරීම අදාල ශ්‍රී ලංකා ගිණුම් තැබීමේ ප්‍රමිතීන්ට හා වෙනත් අදාල කර ගත හැකි නෛතික අවශ්‍යතාවයන්ට අනුකූල ලෙස සිදු කරනු ලබන බවට වග බලා ගැනීම පිණිස කරනු ලබන අභිප්‍රේක්ෂණ කර්තව්‍යයේදී විගණන කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිය සහාය ලබා දිය යුතු වේ.
- රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන සියළුම අදාල රීති, රෙගුලාසි හා චක්‍ර ලේඛ වලට අනුකූල ලෙස කටයුතු කරනු ලබන බවට වග බලා ගැනීම සඳහා විගණන කමිටුව විසින් සිය සහාය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දිය යුතු වන අතර එසේ කිරීමේදී පසුවිපරම් කිරීම මෙන්ම ඒවාට අනුකූල නොවන ලෙස කටයුතු කිරීම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිය නිර්දේශයන් ඉදිරිපත් කිරීම ද කළ යුතු වන්නේය.
- විගණන කමිටුව විසින් අභ්‍යන්තර / බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි හා රාජ්‍ය ව්‍යවසායයන් පිළිබඳ කමිටුවේ (COPE) නිර්දේශයන් ද සිය සමාලෝචනයට බඳුන් කොට ප්‍රතිකාර්මික පියවර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිය සහාය ලබා දිය යුතු වේ.
- ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් හඳුන්වා දී එය ක්‍රියාත්මක කරමින් සංස්ථාපිත පාලන ප්‍රාගුණ්‍යයන්ගේ ඉහළ ප්‍රමිතීන්ට අනුව කටයුතු කිරීම සඳහා විගණන කමිටුව විසින් සිය සහාය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දිය යුතු වේ.
- සංකීර්ණ හෝ අසාමාන්‍ය ගණු දෙනු, ඉහළ මට්ටමේ තීරණාත්මක කරුණු හා මෑතදී කරන ලද වෘත්තීය හා නියාමන ප්‍රකාශයන් ඇතුළු වැදගත් ගිණුම් තැබීමේ හා වාර්තා කිරීමේ ගැටළු විගණන කමිටුව විසින් සමාලෝචනයට බඳුන් කොට මූල්‍ය ප්‍රකාශනයන් මත ඒවා

මඟින් සිදු විය හැකි බල පෑම අවබෝධ කරගත යුතු වන්නේය.

- මූල්‍ය තත්ත්වය අනාවරණය කිරීම සඳහා පිළියෙල කරනු ලැබ ඇති මූල්‍ය ප්‍රකාශනයන්ගේ පූර්ණත්වය හා අවංක භාවය පසුවිපරම් කිරීම සඳහා ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබීමට පෙරාතුව විගණන කමිටුව විසින් එකී වාර්ෂික මූල්‍ය වාර්තා සමාලෝචනයට භාජනය කළ යුතු වන්නේය.
- විගණන කමිටුව විසින් ප්‍රතිසම්පාදන කාර්ය පටිපාටිය හා ප්‍රතිසම්පාදන සැලැසුම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනයට බඳුන් කළ යුතු වන්නේය.

2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්

2021 දෙසැම්බර් 31 වැනි දිනයෙන් අවසන් වූ වර්ෂය තුළදී විගණන කමිටුව විසින් රැස්වීම් හතක (07) සංඛ්‍යාවක් පවත්වන ලද අතර එම රැස්වීම් වලදී නෲය පත්‍ර අයිතමයන් යටතේ පහත දක්වනු ලැබ ඇති වැදගත් කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදි.

- ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ කාර්ය සාධකත්වය
- රජයේ විගණන විමසුම් සඳහා ප්‍රතිචාර දැක්වීමේදී සිදු වී ඇති ප්‍රමාදයන්
- 2019 වර්ෂයේ අවසානයට තිබුණ තොග ශේෂය පිළිබඳ මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය
- ප්‍රදානයන් සම කොටස් බවට පරිවර්තනය කිරීම
- 2019. 12. 31 දිනයෙන් අවසන් වූ වර්ෂය වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කටයුතු පිළිබඳව විගණකාධිපති විසින් නිකුත් කරනු ලැබ ඇති මූල්‍ය ප්‍රකාශන ඇතුළු සවිස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව.
- 2020. 12. 31 වැනි දිනයෙන් අවසන් වූ වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීම
- 2021. 03. 31 වැනි දිනට පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීම
- 2021 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැසුම
- වත් කම් කළමනාකරණය (සිදු කරගෙන යනු ලබමින් පවතින ඉඩම් මිළ දී ගැණුම් හා අත් පත් කර ගැනීම්)
- 2019 වර්ෂයේ 2 වැනි, 3 වැනි හා 4 වැනි කාර්තු වෙනුවෙන් වූ විගණන සාරාංශයන් හා 2020 වර්ෂයේ 1 වැනි හා 2 වැනි කාර්තු වෙනුවෙන් වූ විගණන සාරාංශයන්
- සංයුක්ත සැලැසුමේ, ක්‍රියාකාරී සැලැසුමේ හා ව්‍යාපාරික සැලැසුමේ කලාපීය ප්‍රගතිය
- නව රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ හඳුන්වා දීම
- පාර්ලිමේන්තු මන්ත්‍රී වරුන්ගේ නිල නිවාසයන් වෙතින් අය කර ගත යුතු හිඟ මුදල් ලැයිස්තුව
- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් වාහන ලැයිස්තුව
- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් වත් කම් පරිගණක ගත කිරීමේ දැනට ප්‍රගතිය වාර්තා කිරීම
- මණ්ඩලයේ නිල නිවාස අධිකාර පත්‍රය
- 2022 වර්ෂය සඳහා වූ අය වැය ඇස්තමේන්තුව

රජයේ විගණන දෙපාර්තමේන්තුවේ නියෝජිතයින් වෙත කරන ලද ආරාධනයන් අනුව වර්ෂය තුළදී රැස්වීම් හත (07) ක සංඛ්‍යාවකට සහභාගි වූහ. අවශ්‍යතාවය මත පදනම් වෙමින් විගණන කමිටුව විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සාමාජිකයින් වෙත ද රැස්වීම් වලට සහභාගි වන ලෙස විටින් විට ඇරයුම් කරන ලදි.

මූල්‍ය ප්‍රකාශය

104-105 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

106 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

107 ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

108 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

109-128 මූල්‍ය ප්‍රකාශනයන්ට අදාල සටහන්

129 2021 දෙසැම්බර් 31 වැනි දිනයෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ විගණකාධිපතිගේ වාර්තාව




Rs

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය



2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන

විස්තීරණ ආදායම් ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		අයවැය 2021 රු.	සත්‍ය 2021 රු.	යලිප්‍රකාශිත 2020 රු.
අයභාරය (ඒ.අ.බදු හැර)	7	33,126,589,400	**28,935,444,532**	27,761,775,794
විකුණුම් පිරිවැය	8	(20,462,063,409)	**(19,162,945,539)**	(16,754,645,376)
දල ලාභය		12,664,525,991	**9,772,498,993**	11,007,130,418
වෙනත් මෙහෙයුම් ආදායම් හා ලාභ	9	1,852,428,600	**1,796,124,476**	1,482,081,558
පරිපාලන වියදම්	10	(14,698,127,591)	**(13,657,858,647)**	(12,035,048,008)
වෙනත් මෙහෙයුම් වියදම්	11	(700,000,000)	**(997,912,577)**	(839,273,459)
මෙහෙයුම් ලාභය / (අලාභය)		(881,173,000)	**(3,087,147,754)**	(385,109,491)
මූල්‍ය ආදායම්	12	500,000,000	**842,533,384**	1,571,188,666
මූල්‍ය පිරිවැය	13	(258,841,000)	**(752,071,879)**	(543,298,051)
බදු පෙර ලාභය / (අලාභය)		(640,014,000)	**(2,996,686,249)**	642,781,124
ආදායම් බද්ද (ආර්ථික සේවා ගාස්තු)	14	-	**(138,860,749)**	(133,867,482)
වර්ෂය සඳහා ලාභය/ අලාභය		(640,014,000)	**(3,135,546,998)**	508,913,642

පිටු අංක 08 සිට 26 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	අයවැය 2021	සත්‍ය **2021**	යලිප්‍රකාශිත 2020
	රු.	රු.	රු.
වර්ෂය සඳහා ලාභය/ අලාභය	(640,014,000)	**(3,135,546,998)**	508,913,642
වර්ෂය සඳහා වෙනත් විස්තීරණ ආදායම්			
වර්ෂය සඳහා හදුනාගත් ආයුගණක ලාභ/(අලාභ)	-	**(223,219,689)**	-
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම්	(640,014,000)	**(3,358,766,687)**	508,913,642

පිටු අංක 08 සිට 26 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

මූල්‍ය තත්ව ප්‍රකාශය
2021 දෙසැම්බර් 31 දිනට

	සටහන්	සත්‍ය 2021 රු.	යලිප්‍රකාශිත 2020 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත හා උපකරණ	15	**263,568,177,495**	251,992,187,547
අස්පෘශ්‍ය වත්කම්	16	**20,429,157**	14,122,453
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ	17	**443,737,128,772**	373,462,655,570
මූල්‍ය වත්කම්	18	**1,889,780**	1,853,507
මුළු ජංගම නොවන වත්කම්		**707,327,625,205**	625,470,819,078
ජංගම වත්කම්			
මෙහෙයුම් නොවන වත්කම්		**149,748,448**	149,681,812
තොග	19	**9,830,918,912**	8,382,106,647
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	20	**10,709,918,219**	11,136,884,898
කැන්පතු සහ අත්තිකාරම්	21	**28,866,235,652**	28,708,013,898
ආයෝජන	22	**24,349,404,858**	23,598,991,188
මුදල් හා මුදල් සමාන දෑ	23	**4,233,330,332**	1,834,937,637
මුළු ජංගම වත්කම්		**78,139,556,420**	73,810,616,080
මුළු වත්කම්		**785,467,181,625**	699,281,435,158
ස්කන්ධ හා බැරකම්			
ස්කන්ධය			
රජයේ දෙපාර්තමේන්තු වලින් පවරාගත් වත්කම්	24	**185,480,387**	185,480,387
රාජ්‍ය ප්‍රාග්ධනය	25	**100,263,323,220**	88,531,428,611
කාර්ය මණ්ඩල සුභ සාධන අරමුදල හා වෙනත් අරමුදල්	26	**33,115,808**	20,608,827
රඳවාගත් ඉපයුම්		**(12,387,333,301)**	(9,016,059,633)
රජයේ ප්‍රදාන	27	**117,548,897,076**	109,812,274,767
ප්‍රාග්ධන ප්‍රදාන	28	**292,056,546,906**	267,289,006,096
මුළු ස්කන්ධය		**497,700,030,097**	456,822,739,054
ජංගම නොවන වගකීම්			
ගෙවිය යුතු ණය	29	**227,420,934,401**	198,175,771,364
වෙනත් විලම්බිත වගකීම්	30	**4,414,833,084**	4,019,409,604
මුළු ජංගම නොවන වගකීම්		**231,835,767,485**	202,195,180,969
ජංගම වගකීම්			
මෙහෙයුම් නොවන වගකීම්		**71,927,749**	71,927,749
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	31	**40,111,024,288**	33,724,877,505
ගෙවිය යුතු ණය ප්‍රාග්ධනය	29	**12,578,838,828**	2,920,569,236
ගෙවිය යුතු ණය පොලිය		**3,169,593,179**	3,546,140,644
මුළු ජංගම වගකීම්		**55,931,384,044**	40,263,515,135
මුළු ස්කන්ධ හා බැරකම්		**785,467,181,625**	699,281,435,158

ආර්.එම්.ඒ.එස්.වීරසේන
අතිරේක සාමාන්‍යාධිකාරී (මුදල්)

තිලින එස් විජේතුංග
සාමාන්‍යාධිකාරී

පිටු අංක 08 සිට 14 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරන ප්‍රතිපත්ති හා පිටු අංක 15 සිට 26 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරන සටහන් මූල්‍ය ප්‍රකාශන වල අත්‍යාවශ්‍ය අංගයකි. මූල්‍ය ප්‍රකාශන පිලියල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ලබයි. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති අතර ඒ වෙනුවෙන් අත්සන් කරනු ලැබේ.

නිශාන්ත රණතුංග
සභාපති
කොළඹ
2022 පෙබරවාරි

නිමල් ආර්. රණවක
උප සභාපති

ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	රජයේ දෙපාර්තමේන්තු	රජයේ ප්‍රදාන	රාජ්‍ය ප්‍රාග්ධනය	ප්‍රාග්ධන ප්‍රදාන	කාර්ය මණ්ඩල සුභ සාධන අරමුදල හා වෙනත්	සමුච්චිත ලාභය / පාඩුව	එකතුව
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
2020 ජනවාරි 01 දිනට ශේෂය		185,480,387	105,903,930,027	85,106,439,687	241,308,488,604	29,411,874	(9,432,518,036)	**423,101,232,544**
පූර්ව වර්ෂ නිවැරදි කිරීම් -								
වත්කම් හඳුනාගැනීම හා ඉවත් කිරීම	**34.1.1**	-	-	-	-	-	(6,273,542)	**(6,273,542)**
වත්කම් හඳුනාගැනීම හා ඉවත් කිරීම සඳහා ක්ෂය ගැලපීම	**34.1.2**	-	-	-	-	-	16,059,814	**16,059,814**
තොග	**34.2**						(12,114,655)	**(12,114,655)**
වෙලඳ හා අනෙකුත් ණය ලැබීම්	**34.2**	-	-	-	-	-	(1,243,209)	**(1,243,209)**
කැමිපතු	**34.2**	-	-	-	-	-	(300,000)	**(300,000)**
ප්‍රාග්ධන ප්‍රදාන	**34.2**	-	-	-	(4,800,000)	-	4,800,000	-
2020.01.01 දිනට යලි ප්‍රකාශිත ශේෂය		185,480,387	105,903,930,027	85,106,439,687	241,303,688,604	29,411,874	(9,431,589,628)	**423,097,360,952**
වර්ෂය සඳහා ශුද්ධ ලාභය		-	-	-	-	-	508,913,642	**508,913,642**
වත්කම් හඳුනාගැනීම හා ඉවත් කිරීම	**34.1.1**						4,886,674	**4,886,674**
වර්ෂය තුල ලැබීම් / මාරු කිරීම්		-	3,908,344,739	-	25,985,317,491	-	-	**29,893,662,231**
ණය, ස්කන්ධ ප්‍රාග්ධනය ලෙස පරිවර්ථනය	**34.2**	-	-	3,424,988,924	-	-	-	**3,424,988,924**
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	**34.2**	-	-	-	-	-	19,653,330	**19,653,330**
තොග	**34.2**	-	-	-	-	-	1,520,861	**1,520,861**
වෙලඳ හා අනෙකුත් ණය ලැබීම්	**34.2**	-	-	-	-	-	(128,247,558)	**(128,247,558)**
කාර්ය මණ්ඩල සුභසාධන අරමුදලට මාරුකිරීම්		-	-	-	-	(8,803,047)	8,803,047	-
2020.12.31 දිනට යලි ප්‍රකාශිත ශේෂය		185,480,387	109,812,274,767	88,531,428,611	267,289,006,096	20,608,827	(9,016,059,633)	**456,822,739,054**
වර්ෂය සඳහා ශුද්ධ ලාභය		-	-	-	-	-	(3,358,766,687)	**(3,358,766,687)**
වර්ෂය තුල ලැබීම් හා මාරුකිරීම්		-	7,736,622,310	-	24,767,540,811	-		**32,504,163,120**
ණය, ස්කන්ධ ප්‍රාග්ධනය ලෙස පරිවර්ථනය		-	-	11,731,894,610	-	-	-	**11,731,894,610**
කාර්ය මණ්ඩල සුභසාධන අරමුදලට මාරුකිරීම්		-	-	-	-	12,506,981	(12,506,981)	-
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය		**185,480,387**	**117,548,897,076**	**100,263,323,220**	**292,056,546,906**	**33,115,808**	**(12,387,333,301)**	**497,700,030,097**

පිටු අංක 08 සිට 26 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		සත්‍ය	යලිප්‍රකාශිත
අවසන් වර්ෂය සඳහා	සටහන්	2021 රු.	2020 රු.
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ / (යෙදවූ) මුදල්			
බදු වලට පෙර ශුද්ධ ලාභය / (අලාභය)		(2,996,686,249)	642,781,124
ගැලපීම්			
පොලී ආදායම්	12	(842,533,384)	(1,571,188,666)
ස්ථාවර වත්කම් ඉවත් කිරීමේ ලාභය / අලාභය		21,504,234	30,886,759
ක්ෂයවීම්	10.2	4,970,880,560	4,721,091,062
විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදන	30.1	710,138,294	485,960,193
පොලී වියදම්	13	752,071,879	543,298,051
කාරක ප්‍රාග්ධන වෙනසට පෙර මෙහෙයුම් ලාභය		2,615,375,333	4,852,828,522
තොග (වැඩිවීම්) / අඩුවීම්		(1,448,812,265)	348,800,327
ණයගැනියන් , ලැබිය යුතු සහ තැන්පතුවල (වැඩිවීම) / අඩුවීම		129,817,540	7,630,505,289
ණය හිමියෝ සහ වෙන්කිරීම් සහ තැන්පතුවල වැඩිවීම් / (අඩුවීම්)		6,417,129,197	(5,557,663,406)
මෙහෙයුම් වලින් ජනනය වූ මුදල්		7,713,509,806	7,274,470,733
ගෙවූ බදු		-	(33,795,903)
පාරිතෝෂික ගෙවීම්	30.1	(568,916,918)	(485,960,193)
මෙහෙයුම් කටයුතු වලින් වූ ශුද්ධ මුදල්		7,144,592,889	6,754,714,637
ආයෝජන කටයුතු වලින් ජනනය වූ / (යෙදවූ) මුදල්			
ස්ථාවර වත්කම් වල හා කෙරිගෙන යන වැඩ වල ආයෝජනය		(80,964,032,084)	(82,840,865,257)
මූල්‍ය වත්කම්		(36,273)	196,703
අපහරණය කළ වත්කම් විකුණුම් වලින් ලැබීම්		5,772,078	39,740,056
ආයෝජන ආදායම් ලැබීම්		842,533,384	1,571,188,666
(ආයෝජන) / ආයෝජනය ඉවත් කිරීම්		(750,413,670)	4,137,385,474
ආයෝජන කටයුතුවල යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය		(80,866,176,564)	(77,092,354,359)
මූල්‍ය කටයුතු වලින් ජනනය වූ / (යෙදවූ) මුදල්			
කාල පරිච්ඡේදය තුළ රජයේ ප්‍රදාන		7,736,622,310	3,908,344,739
කාල පරිච්ඡේදය තුළ ලද ප්‍රාග්ධන ප්‍රදාන		27,180,224,843	28,164,456,217
නව ණය හා ස්කන්ධය		63,526,231,118	67,517,911,260
ණය ආපසු ගෙවීම්		(12,890,903,881)	(14,347,558,260)
පොලී ගෙවීම්		(9,432,198,020)	(16,982,307,363)
මූල්‍ය කටයුතු වලින් ජනනය වූ / (යෙදවූ)ශුද්ධ මුදල් ප්‍රවාහය		76,119,976,371	68,260,846,593
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම		2,398,392,695	(2,076,793,130)
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		1,834,937,637	3,911,730,765
කාල පරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		4,233,330,332	1,834,937,637

පිටු අංක 08 සිට 26 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2021 දෙසැම්බර් 31

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

සංස්ථාගත තොරතුරු

1.1 පොදු කරුණු

පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 1974 අංක 2 දරණ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සංස්ථාපිත මණ්ඩලයකි. මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලය ගාලු පාර, රත්මලාන යන ස්ථානයේ පිහිටුවා ඇති අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයද එම පරිශ්‍රයේ පිහිටුවා ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ජා.ජ.ජ.ප.ම) ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයකි.

1.2 ප්‍රධාන කාර්යයන්

මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වන්නේ පිරිපහදු කරන ලද පානීය ජලය නිෂ්පාදනය කිරීම හා ප්‍රජාවට විකිණීම වේ.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අරමුණු වන්නේ රට පුරා පිරිපහදු කළ පානීය ජලය සංවර්ධනය කිරීම සහ එ සඳහා ශ්‍රී ලංකාවාසී ජනතාවට ප්‍රවේශවීමේ හැකියාව ලබා දීමය.

1.3 අඛන්ඩ පැවැත්ම පිලිබඳ මණ්ඩලයට ඇති හැකියාව පිළිබඳව කළමනාකාරිත්වය තක්සේරුවක් කර ඇති අතර අපේක්ෂා කළ හැකි අනාගතය සඳහා ව්‍යාපාරයේ දිගටම කරගෙන යාමට සම්පත් ඇති බවට සැහීමකට පත්වේ. තවද, අඛන්ඩ පැවැත්ම පිලිබඳ මණ්ඩලයට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් පිළිබඳව කළමනාකාරිත්වය නොදන්නා අතර ඔවුන් මණ්ඩලයේ කටයුතු ඇවර කිරීමට හෝ නැවැත්වීමට අදහස් නොකරයි. එබැවින්, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව ක්‍රියාත්මක වන පදනම මත සකස් කරනු ලැබේ.

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලවීමේ ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කරන ලද පරිදි, ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, හිමිකම වෙනස්වීම් ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඇතුළත් මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට (SLFRS/ LKAS)) අනුකූලව සකස් කර ඇත.

2.2 අගය කිරීමේ පදනම

මූල්‍ය උපකරණ හා සාධාරන වටිනාකමට අගය කරන ලද විකිනීම් සඳහා පවතින අනෙකුත් මූල්‍ය වත්කම් හා වගකීම් හැර මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත. විශ්‍රාම පාරිතෝෂිතය සඳහා බැඳීම් වර්ථමාන අගයට හඳුනාගෙන ඇත.

2.3 මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් (LKR) ඉදිරිපත් කරනු ලැබේ. එය මණ්ඩලයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වේ.

3. ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

3.1 දේපල, පිරියත හා උපකරණ

දේපල , පිරියත හා උපකරණවල පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ යම් සමුච්චිත හානි කරන අලාභයන් තිබේ නම් ඒවා අඩු කොට ශුද්ධ අගයට පෙන්නුම් කරනු ලැබේ. මෙම පිරිවැයෙහි දේපල හා උපකරණ ප්‍රතිසම්පාදන පිරිවැය සහ ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනිත කළ හැකි නිර්නායකයන් සම්පූර්ණ කරනු ලබන , දීර්ඝ කාලීන ව්‍යාපෘති වල ණය ගැනුම් පිරිවැයද අන්තර්ගත වේ. දේපල පිරියත හා උපකරණ වල ප්‍රධාන කොටස් කාලීනව නැවත ප්‍රසම්පාදනය කළ යුතු නම්, ජා.ජ.ජ.ප.ම. එම කොටස් වෙන් වෙන් වශයෙන් වූ වත්කම් වශයෙන් හඳුනාගෙන එම වත්කම් වල නිශ්චිත ඵලදායී ජීවිත කාලය තුළ ක්ෂය කරනු ලැබේ. එසේම, පුළුල් පරීක්ෂාවක් සිදුකළ විට, හඳුනා ගැනීම් නිර්ණායකයන් සම්පූර්ණ කරන්නේ නම්, එහි පිරිවැය පිරියත හා උපකරණ ඉදිරියට ගෙන යනු ලබන මුදලක් ලෙස හඳුනා ගනු ලැබේ. අනෙකුත් සියළුම අළුත්වැඩියා හා නඩත්තු වියදම් ලාභ හෝ අලාභ සඳහා දරන ලද වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

ප්‍රයෝජනයට ගැනීමෙන් පසුව, යලි වත්කම් භාවිතයෙන් ඉවත් කිරීම සඳහා දැරීමට සිදුවේ යැයි අපේක්ෂිත පිරිවැයෙහි වර්තමාන අගය, වෙන් කිරීම් සිදුකිරීමට අදාල නිර්ණායකයන්ට අනුකූල වන්නේ නම්, අදාල වත්කම් පිරිවැයට ඇතුළත් කරනු ලැබේ.

3.1.1 ක්ෂය

වත්කම්වල ඇස්තමේන්තු කරන ලද ඵලදායී ජීවිත කාලය පදනම් කර ගෙන අදාල වත්කම් පහත සඳහන් පරිදි සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

දේපල පිරියත හා උපකරණ	අනුපාතය
ගොඩනැගිලි හා ව්‍යුහයන්	1.67% - 2%
පිරියත හා පොම්ප උපකරණ	5%
සේවා හා තොග ජල මනු	10%
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්	1.67%
උපකරණ	10%
ලී බඩු සහ සවිකිරීම්	10%
පරිගණක උපාංග හා ජංගම දුරකථන	20% - 33.3%
මෝටර් රථ	10% - 20%
කල් බදු මෝටර් රථ	14.3%

3.1.2 කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

ශේෂ පත්‍ර දිනට ප්‍රාග්ධනිත නොකරන ලද හා වර්ෂය තුළ දරන ලද ප්‍රාග්ධන වියදම් කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස පෙන්නුම් කරනු ලබන අතර වර්ෂය තුළ ප්‍රාග්ධනිත කරන ලද හා භාවිතයට ගනු ලබන වත්කම් දේපල, පිරියත හා උපකරණ වලට මාරු කරනු ලැබේ.

3.1.3 කල්බදු

කල්බද්ද ආරම්භයේදී නිශ්චිත වත්කමක් හෝ වත්කම් භාවිතා කිරීමේ අයිතිය ප්‍රමාණවත් ලෙස පැවරීම සම්බන්ධව ඇතිකරගනු ලබන එකඟතාවය හෝ නිශ්චිතව දක්වා නොමැති අවස්ථාවකදි පවා වත්කම් භාවිතා කිරීමට එකඟවීම මගින් කල් බද්දක් පවතීද නැද්ද යන්න තීරණය වේ.

3.1.4 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කරගනු ලබන අස්පෘශ්‍ය වත්කම්වල අගය මුලිකව පිරිවැයට හඳුනාගනු ලැබේ. මුලික හඳුනා ගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම් වල අගය, සමුච්චිත ක්ෂය සහ හානිකරන අලාභයන් ඇත්නම් එම අගයන් අඩු කර ඉදිරියට ගෙන යනු ලැබේ. අභ්‍යන්තරව ජනනය කරනු ලබන අස්පෘශ්‍ය වත්කම්, ප්‍රාග්ධනගත කරන ලද සංවර්ධන වියදම් හැර, ප්‍රාග්ධනිත නොකරන අතර, එම වියදම්, වියදම් දරන ලද වර්ෂයේ වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයෙහි පෙන්නුම් කරනු ලැබේ. පරිගණක මෘදුකාංග වසර 7ක් දක්වා හායනය කරනු ලබයි.

3.1.5 පර්යේෂණ හා සංවර්ධන පිරිවැය.

පර්යේෂණ පිරිවැය වියදමක් ලෙස සලකනු ලබයි. ජා.ජ.ජ.ප.ම. විසින් පහත දැ සම්පූර්ණ වන්නේ නම් පමනක්, තනි ව්‍යාපෘති වෙනුවෙන් දරන ලද සංවර්ධන පිරිවැය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලබයි. එසේ හඳුනා ගනුයේ,

- වත්කමක් විකිණීමට හෝ භාවිතයට ගත හැකි වන පරිදි තාක්ෂණික ශක්‍යතා මට්ටමක් සම්පූර්ණ කර ඇති අස්පෘශ්‍ය වත්කම්.
- විකිණීමට හෝ භාවිතයට ගත හැකි බව පෙන්නුම් කර ඇති සහ සම්පූර්ණ කිරීමට අදහස් කර ඇති වත්කම්,
- අනාගත ආර්ථික ප්‍රතිලාභ ජනනය කරනු ලබන්නේ කෙසේද යන බව පැහැදිලි වීම,
- වත්කම සම්පූර්ණ කිරීමට අවශ්‍ය සම්පත් පවතින බව,
- වත්කම් සංවර්ධනය කිරීමේදී දරන ලද වියදම් විශ්වාසවන්තව ගණනය කිරීමේ හැකියාව.

සංවර්ධන කටයුතු සඳහා දරන ලද මුලික වියදම් වත්කමක් ලෙස හඳුනාගත් පසුව, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකර ඉදිරියට ගෙන යනු ලබයි. සංවර්ධන කටයුතු අවසන් කර අදාල වත්කම භාවිතයට ගන්නා අවස්ථාවේ සිට ක්‍රමක්ෂය කිරීම ආරම්භ කරන අතර වත්කමේ ඵලදායී ජීවිත කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ. ක්‍රමක්ෂය විකුණුමේ පිරිවැය තුළ දක්වනු ලබන අතර වත්කම සංවර්ධනය කරනු ලබන කාලය තුළ අගය අඩුවීම් පිළිබඳ පරීක්ෂාවන්ට වාර්ෂිකව භාජනය කරනු ලබයි.

3.1.6 මූල්‍ය නොවන වත්කම්වල අගය අඩුවීම

ජා.ජ.ජ.ප.ම. වත්කම්වල අගය හානිවීමක් පෙන්නුම් කරන්නේ දැයි හඳුනා ගැනීම සඳහා සෑම ගිණුම් කාල පරිච්ඡේදයක් අවසානයේදීම තක්සේරුවක් කරනු ලබයි. අගය අඩුවීමක් පෙන්නුම් කරනවිට හෝ වත්කම් සඳහා වාර්ෂික අගය අඩුවීම් පරීක්ෂාවක් අවශ්‍යවිට ජා.ජ.ජ.ප.ම විසින් අදාල වත්කම් අයකර ගත හැකි වටිනාකමට තක්සේරු කරනු ලැබේ. වත්කමකින් මුදල් ජනනය කිරීමක් සිදු නොවන්නේ නම්, එම වත්කම් අනෙකුත් වත්කම් හෝ වත්කම් වර්ගයකින් බොහෝ දුරට ස්වාධීනව පවතින අවස්ථා වලදී හැර වත්කමක හෝ මුදල් ජනනය කිරීමේ ඒකකයක (cash generating unit) නැවත අයකර ගත හැකි වටිනාකම අතිරික්ත වන විට එහි සාධාරණ අගයෙන් බැහැර කිරීමේ පිරිවැය අඩුකර එක් එක් වත්කමේ භාවිතා කිරීමේ අගය තීරණය කරනු ලබයි. වත්කමක හෝ මුදල් ජනනය කිරීමේ ඒකකයක ඉදිරියට ගෙන එන ලද වටිනාකම එහි අයකර ගත හැකි අගයට වඩා වැඩි වන විට, එය අගය අඩුවීමක් ලෙස සලකා අයකර ගත හැකි වටිනාකම දක්වා ලියා හරිනු ලැබේ. භාවිතා කිරීමේ වටිනාකම තීරණය කිරීමේදී වත්කමක ඇස්තමේන්තු කරන ලද අනාගත මුල්‍ය ප්‍රවාහයෙහි වර්තමාන අගය , වර්තමාන වෙළඳපළ වටිනාකම තක්සේරු කළ හැකි මුදලේ කාල වටිනාකම සහ වත්කමට ආවේනික වූ අවදානම් තත්ත්වය පිළිබිඹු කරණ බදු පෙර වට්ටම් අනුපාතයත් මත වට්ටම් කර තීරණය කරනු ලබයි. සාධාරණ අගය ගණනය කිරීමේදී විකිණීම සඳහා දැරිය යුතු පිරිවැය අඩුකරනු ලබන අතර, විස්තර ඇන්නම් ඒ සඳහා මෑතකදී කරනලද ගනුදෙනු වල විස්තර පදනම් කර ගනු ලැබේ. එවැනි ගනුදෙනු වල විස්තර නොමැතිනම්, සුදුසු තක්සේරු කිරීමේ පදනමක් යොදා ගනු ලැබේ.

3.2.1 තොග

හරිත සාමාන්‍ය මිල කිරීමේ ක්‍රමය මත සහ හානි වූ හා සෙමින් වලනය වන තොග සඳහා සාධාරණ වෙන්කිරීම් කළ පසු, තොග හාණ්ඩ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකින් වඩා අඩු අගයට තක්සේරු කරනු ලබයි. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී හාණ්ඩ විකුණු ලබන මිලෙන්, එම හාණ්ඩ නිම කිරීමට ඇස්තමේන්තු කරන ලද පිරිවැය සහ විකිණීම සිදුකිරීම සඳහා දැරීමට සිදුවේයැයි ඇස්තමේන්තු කරන ලද පිරිවැය අඩුකර ශුද්ධ උපලබ්ධි අගය තීරණය කරනු ලැබේ.

තොග මැනීම

3.2.2 තොග පිරිවැය

අමු ද්‍රව්‍ය

ගැණුම් පිරිවැය හා යම්කිසි දැරීමට සිදුවිය හැකි පිරිවැය ඇතුළුව.

අනෙකුත් තොග

හරින කළ සාමාන්‍ය මිල මත

3.3. මුදල් හා මුදලට සමාන වත්කම්

අතැති මුදල් , බැංකු ශේෂ සහ කෙටි කාලීන ආයෝජන වලින් ගෙවීමට ඇති බැංකු අයිරාවක් අඩුකළ පසු වටිනාකම්න් මුදල් හා මුදලට සමාන වත්කම් සමන්විත වේ.

4. වගකීම්, වෙන්කිරීම් සහ ස්කන්ධය

4.1. විශ්‍රාම පාරිතෝෂික සඳහා බැඳීම්

4.1.1 විශ්‍රාම පාරිතෝෂික සඳහා බැඳීම් (ශ්‍රීලංගිප්‍ර 19)

අ) ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 (LKAS-19) අනුකූල වන පරිදි සෑම සේවකයෙකුගේම සේවා කාලයෙහි ආරම්භක වර්ෂයේ සිට පාරිතෝෂික සඳහා වෙන්කිරීම් කරනු ලැබේ.

ආ) විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය

ජා.ජ.ජ.ප.ම. නම් කරන ලද ප්‍රතිලාභ සැලසුමක් ක්‍රියාත්මක කරනු ලැබේ. නම් කරන ලද සැලසුම යටතේ කරනු ලබන වෙන්කිරීම් ඇස්තමේන්තුගත ඒකක බැර ක්‍රමය (Projected Unit Credit Method) භාවිතා කරමින් තීරණය කරනු ලබයි. ප්‍රතිලාභ සැලසුමෙහි ආයුගණක (Actuarial) ලාභ සහ පාඩු එය ඇතිවූ කාල පරිච්ඡේදයේදී අනෙකුත් විස්තීරණ ආදායම් යටතේ සම්පූර්ණයෙන් හඳුනා ගනු ලැබේ. මෙම ආයුගණක ලාභ සහ පාඩු වහාම රදවාගත් ඉපයීම් වලින් හඳුනාගන්නා අතර පසු වර්ෂයේ ලාභ හෝ පාඩු ලෙස වර්ගීකරණය කරනු නොලැබේ.

ප්‍රතිලාභ සඳහා හිමිකම ලබන කාල පරිච්ඡේදය වෙනුවෙන් හිමිකම් නොලබන කාල පරිච්ඡේදයේදී දරන ලද ඉකුත් සේවා වියදම්, වියදම් ලෙස හඳුනාගෙන සරල මාර්ග ක්‍රමයකයට සාමාන්‍ය කාලය තුළ ලියා හරිනු ලැබේ. ප්‍රතිලාභ සඳහා දැනටමත් හිමිකම් ලබන්නේ නම්, ඉකුත් සේවා වියදම්, විශ්‍රාම සැලසුමේ සඳහන් පරිදි හෝ සැලසුමට කරන වෙනස් කිරීමක් ලෙස වහාම හඳුනාගත යුතුය.

නම් කරන ලද ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයෙන් (උසස් තත්ත්වයේ සංස්ථා බැඳුම්කර පදනම් කර ගත් මට්ටම් අනුපාතයක් යොදා ගණනය කරන ලද) හඳුනා නොගත් ඉකුත් සේවා වියදම් හා සැලසුම්කරණය කරන ලද වත්කම් වල සාධාරණ අගයෙන් නිරවුල් කළ යුතු බැඳීම් අඩු කළ පසු වටිනාකම් වලින්, නම් කරන ලද ප්‍රතිලාභ වත්කම් හා වගකීම් සමන්විත වේ.

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම සෑම වසර තුනකට වරක්ම ආයුගණකයකු සේවය හරහා මනිනු ලබන අතර වැටුප් සංශෝධනයට අනුකූලව වසර තුනක කාලය තුළ එවැනි වගකීම් පවත්වාගෙන යයි. එබැවින්, ඉදිරි වසර දෙක සඳහා අබණ්ඩව සිදු වූ පාරිතෝෂික වගකීම් පළමු වසර තුළ සහාය වගකීම් හඳුනා ගත් වහාම වියදම ලෙස සලකනු ලැබේ.

නම් කරන ලද දායකත්වමේ සැලසුම් -සේ.අ.සා හා සේ.නි.හා.අ

සේවක අර්ථ සාධක සේවක භාරකාර අරමුදල දක්වා ඇති නියමයන්ට හා රෙගුලාසි වලට අනුකූලව සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායකවීම සඳහා සේවකයන් සුදුසුකම් ලබයි. දළ සේවක ඉපයීම් වලින් 12 % ක් හා 3% ක් මණ්ඩලය විසින් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ගෙවනු ලබයි.

4.2 වෙන්කිරීම

පොදු කරුණු

අතීත සිද්ධීන් වල ප්‍රතිඵලයක් ලෙස ජා.ජ.ජ.ම. වර්තමානයේදී මුහුණුදීමට ඇති බැඳීම් (නීතිමය හෝ වටහාගත හැකි ආකාරයට) සඳහා වෙන්කිරීම් කරනු ලබන අතර වෙන්කිරීම් සඳහා බැඳුණු ආර්ථික ප්‍රතිලාභ හා වගකීම් ප්‍රමාණය පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයක් පවතී. ජා.ජ.ජ.ප.ම. වෙන් කිරීම් වලින් කොටසක් හෝ සම්පූර්ණ ප්‍රමාණයම ප්‍රතිපූරණය කිරීමට අදහස් කරන්නේ නම් (උදා:- රක්ෂණ ඔප්පුවක් මත) ප්‍රතිපූර්ණය කරනු ලබන ප්‍රමාණය සහාය වශයෙන්ම තහවුරු කර ගත හැකි නම්, වෙන්කිරීම් වලින් ප්‍රතිපූර්ණයන් අඩුකළ පසු අගය ආදායම් ප්‍රකාශයෙහි පෙන්නුම් කරනු ලැබේ.

4.3 රජයේ ආධාර

රාජ්‍ය ආධාර ලැබෙන බවට සාධාරණ තහවුරුවක් ඇතිවීම සහ ආධාර ලැබීමට අවශ්‍ය කොන්දේසි සපුරා ඇති විට අදාල රජයේ ආධාර හඳුනා ගනු ලැබේ. රජයේ ආධාර වියදම් අයිතම හා සම්බන්ධවීම එම වියදම දරනු ලබන කාලපරිච්ඡේදයට අදාලව ක්‍රමානුකූල පදනමක් මත වියදමට විලම්භීත වන පරිදි ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ. රජයේ ආධාර වත්කමක් හා සම්බන්ධ වන විට, අදාල වත්කමේ ඵලදායී ජීවිත කාලය තුළ ගණනය කරනු ලබන අගයකින් ආදායමක් ලෙස හඳුනා ගනු ලැබේ.

ජා.ජ.ජ.ප.ම. මුල්‍ය නොවන ආධාර ලැබුණු විට, අදාල වත්කම හා ආධාර නාමික අගය මත සටහන් කර, එම වත්කම උපයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ වත්කමේ අපේක්ෂිත ඵලදායී ජීවිත කාලය තුළදී සමාන වාරික වශයෙන් ලාභයට හෝ අලාභයට ගලපනු ලබයි. රජය විසින් හෝ රජයට සම්බන්ධ ආයතන විසින් ණය හෝ සමාන ආධාර ප්‍රදානය කළ විට ගෙවිය යුතු පොලී අනුපාතය වෙළඳපළ පොලී අනුපාතයට වඩා අඩුනම් වෙනස රජයේ ආධාරයක් ලෙස සලකනු ලැබේ.

අංක 20/0974/204/029-VI දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව වසර 15ක කාලයක් සඳහා මහා භාණ්ඩාගාරය විසින් පහසුකම් සපයනු ලබන ණය වලින් පැන නගින පොලී හා අනෙකුත් වියදම් පියවීම සඳහා ජා.ජ.ජ.ම. සඳහා හිමිකම් ප්‍රාග්ධනය ලෙස අවශ්‍ය අයවැය ප්‍රතිපාදන ලබාදීමට නියමිතය. තවද එම ණය වල ප්‍රාග්ධන කොටස, කොටස් ප්‍රාග්ධනය වශයෙන් හඳුනාගෙන ඇති අතර ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත වලට අනුකූලව පොලී සංරචකය ආදායම් ප්‍රදානයක් ලෙස පිළිගනු ලැබේ.

5. ආදායම් ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා, ජා.ජ.ජ.ප.ම. කාර්ය සාධනයේ මූලිකාංග සාධාරණ ලෙස නියෝජනය කරන බැවින්, වියදම් යාකාරිත්ව ක්‍රමයේ අනුගමනය කරනු ලැබේ.

5.1.1 ආදායම් හඳුනාගැනීම

ගෙවීම් කරනු ලබන කාල පරිච්ඡේදය නොසලකා ජා.ජ.ජ.ප.ම වෙත ආර්ථික ප්‍රතිලාභ ගලාඒමේ හැකියාව සහ ආදායම් ලැබීම් විශ්වාසවන්තව මැනිය හැකි බව පදනම් කර ගෙන ආදායම් හඳුනාගනු ලැබේ. ගිවිසුම් මගින් නිරණය කර ඇති ගෙවීම් කොන්දේසි සැලකිල්ලට ගනිමින් ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවන් වල සාධාරණ අගය මත ආදායම් හඳුනාගනු ලැබේ. ආදායම් හඳුනා ගැනීමට පෙර පහත සඳහන් නිශ්චිත ආදායම් හඳුනා ගැනීමේ නිර්ණායකයන් සැලකිල්ලට ගනු ලැබේ.

භාණ්ඩ විකිණීම

භාණ්ඩ වල අයිතියට අදාල අවදානම් හා ප්‍රතිලාභ වලින් සැලකිය යුතු ප්‍රමාණයක් ගැණුම්කරුවට පවරා ඇති විට, සාමාන්‍යයෙන් භාණ්ඩ භාරදී ඇති විට භාණ්ඩ විකිණීමේ ආදායම හඳුනා ගනු ලැබේ.

ජලය විකිණීම

ජල මනු කියවා දින 30 ක කාලසීමාවක් තුල පාරිභෝගිකයකු විසින් පාරිභෝජනය කරනලද ජල ඒකක ප්‍රමානය පරිගණක පද්ධතියේ යාවත්කාලීනවූ පසු ජලය විකිණීම ආදායමක් ලෙස හඳුනා ගැනේ.

අනෙකුත් ආදායම්
අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

පොලී ආදායම්
සෑම මුල්‍ය වත්කමක්ම ක්‍රමක්ෂය කළ වටිනාකම මත අගය කරන අතර පොලී ආදායම් හිමි මූල්‍ය වත්කම් විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ග කෙරේ. පොළී ආදායම හෝ වියදම සළුල පොලී අනුපාතය (EIR) යොදා ගනිමින් සටහන් කරන අතර මූල්‍ය වත්කමේ ඵලදායි ජීවිත කාලය තුළ හෝ උචිත වන පරිදි ඊට කෙටි කාලයක් තුළ වත්කමෙන් ඉපයීමට අපේක්ෂිත අනාගත මුදල් ප්‍රමානයන් මත ගෙවීමට හෝ ලැබීමට අපේක්ෂිත ඇස්තමේන්තු කරන ලද අනාගත මුදල් ප්‍රමානයන් නිශ්චය මට්ටම් කරනු ලබන අනුපාතය EIR ලෙස හැඳින්වේ. පොලී ආදායම මූල්‍ය ආදායම් ලෙස ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලැබේ.

නැවත අයකළ හැකි වැඩ

ස්ථාවර මිල ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවෙන් ලැබෙන ආදායම කොන්ත්‍රාත්තුව සම්පූර්ණයෙන් අවසන් වූ පසු පිළිගැනේ.

5.1.2 වියදම්
වර්ෂයේ ලාභය හෝ අලාභය තීරණය කිරීම සඳහා ව්‍යාපාරය පවත්වාගෙන යාමට දරනු ලබන වියදම් ආදායමට ලියාහරිනු ලබයි. අළුත්වැඩියා හා අළුත් කිරීමේ ගාස්තු වියදම් දරන ලද වර්ෂයේ ලාභයට හෝ අලාභයට ලියාහරනු ලබයි.

5.2 විලම්බිත බදු

භාවිතා නොකරන ලද බදු අලාභ පැවතීම හා අනාගතයේදී පොලී වැනි අඩුකල හැකි වියදම් හේතුවෙන් බදු අයකල හැකි ආදායම් ඇති නොවීම තහවුරු කරන ප්‍රභල සාක්ෂියක් වේ. ජා.ජ.ජ.ප. මණ්ඩලය ආදායම් බදු ගෙවීම ඉතා අවිනිශ්චිත වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ගිණුම්වල විලම්බිත බදු වත්කම්/වගකීම් හඳුනා නොගනී.

6. මූල්‍ය උපකරණ - මූලික හඳුනා ගැනීම හා පසුව අගය කිරීම

6.1 මූල්‍ය වත්කම්

6.1.1 මූලික හඳුනාගැනීම හා අගය කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 (LKAS-39) සඳහන් විෂය පථයට අදාලව ලාභ හෝ අලාභ මගින් ඇතිවන, සාධාරණ අගයට දක්වා ඇති මූල්‍ය වත්කම් ණය හා ලැබිය යුතුදෑ, පරිනතවීම දක්වා තබාගෙන ඇති ආයෝජන, විකිණීම් සඳහා ඇති

මූල්‍ය වත්කම් උචිත වන පරිදි සාධාරණ අගය මත මුලිකව මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබයි. වත්කම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නොදැක්වෙන විට වත්කම්වල සාධාරණ අගයට වත්කම් හුවමාරු පිරිවැය ඇතුළත් කොට මූලික අවස්ථාවේදී හඳුනාගනු ලැබේ.

ජා.ජ.ජ.ප.ම. මූල්‍ය වත්කම් වලට, මුදල් හා කෙටි කාලීන ආයෝජන, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දේ, සේවක ණය සහ අනෙකුත් ලැබිය යුතු දේ ඇතුළත් වේ.

6.1.2 පසුගණනය කිරීම

මූල්‍ය වත්කම් වල අගය පසුව හඳුනා ගැනීම පහත සඳහන් පරිදි එම වත්කම් වල වර්ගීකරණය මත තීරණය වේ.

6.1.2.1 ලාභ හෝ අලාභ මඟින් ඇතිවන සාධාරණ අගයට දක්වා ඇති මූල්‍ය වත්කම්

ලාභ හෝ අලාභ මඟින් ඇතිවන සාධාරණ අගයට දක්වා ඇති මූල්‍ය වත්කම් වලට, විකිණීමට ඇති මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ මඟින් ඇති වන සාධාරණ අගයට මුලිකව හඳුනාගත් සහ නම් කරනු ලද මූල්‍ය වත්කම් ඇතුළත් වේ. විකිණීමේ පරමාර්ථයෙන් හෝ අත්පත් කර ගත් සහ නුදුරු අනාගතයේදී නැවත මිලට ගනු ලබන මූල්‍ය වත්කම් විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ.

6.1.2.2 ණය හා ලැබිය යුතු දෑ

සක්‍රීය වෙළඳපලකදී ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් කිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් නොකරන ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ගණයට ණය හා ලැබිය යුතු දේ අයත් වේ. මෙවැනි වත්කම් මුලිකව අගයකළ පසු, සඵල පොලී අනුපාත ක්‍රමය (EIR) භාවිතා කරමින් අගය අඩුවීම් සඳහා ගැලපීම් කර, අයකරනු ලබන වටිනාකම තීරණය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේදී දරන ලද වියදම් ලැබුණු වටිනාකම හෝ ගෙවූ අධිමිල සහ පිරිවැය හා ගාස්තු EIR හි මුලිකාංග වේ. EIR අගය මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය ආදායම යටතේ පෙන්නුම් කරනු ලබන අතර අගය අඩුවීමේ අලාභ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වියදමක් ලෙස පෙන්නුම් කරනු ලබයි.

ණය මුදල් සැපයීම අමාත්‍ය මණ්ඩල තීරණ අංක 16/0158/719/005 ප්‍රකාරව ක්‍රියාත්මක වන අතර එහිදී නාගරික ජල සම්පාදන ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධනයෙන් 50% සහ පොලිය, ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතිවලින් 75% සහ මලාපවහන හා අපජල ව්‍යාපෘතිවලින් 100% ක් දරනු ලබන්නේ මහා භාණ්ඩාගාරය විසිනි.

6.1.2.3 කල්පිරෙනතුරු තබා ගන්නා ආයෝජන

ජා.ජ.ජ.ප.ම. කල්පිරෙන තුරු තබා ගැනීමට ධනාත්මක ඇල්මක් හා හැකියාවක් තිබෙන විට, ව්‍යුත්පන්න නොවන ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් කරන මූල්‍ය වත්කම් කල්පිරෙන තුරු තබාගන්නා ආයෝජන ලෙස වර්ග කෙරේ.මූලික අගය කිරීමෙන් පසුව, කල්පිරීම් දක්වා තබා ගන්නා ආයෝජන , එහි අගය අඩුවීම් ගලපා සඵල පොලිය පදනම් කර ගෙන ක්‍රමක්ෂය වටිනාකමට අගය කරනු ලැබේ. අත්පත් කර ගැනීම සඳහා දරන ලද වියදම්, ලැබුණු වටිනාම හෝ ගෙවූ අධි මිල සහ පිරිවැය හා ගාස්තු සඵල පොලී අනුපාතයෙහි මූලිකාංග වේ. EIR මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය ආදායමක් ලෙස පෙන්නුම් කරන අතර අගය අඩුවීමේ අලාභ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වියදමක් ලෙස පෙන්නුම් කරනු ලබයි.

6.1.2.4 විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන

ස්කන්ධය හා ණය සුරකුම් විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන වලට ඇතුළත් වේ. විකිණීම සඳහා නොවන සහ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට දන්වා නොමැති අයිතම ස්කන්ධ ආයෝජන ලෙස වර්ගීකරණය කරනු ලබයි. ද්‍රවශීල අවශ්‍යතා සහ වෙළඳපොළ තත්ත්වයෙන් වෙනස්වීම් වලට අනුගතවීම සඳහා අවිනිශ්චිත කාලයක් තබා ගැනීමට අපේක්ෂා කරන ආයෝජන ණය සුරකුම් පත් ලෙස වර්ග කෙරේ. මූලික අගය කිරීමෙන් පසුව, විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන නැවත අගය කිරීම එම වත්කම් වල දක්වා සාධාරණ වටිනාකම මත සිදුකරයි. උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු විස්තිර්ණ ආදායම් ලෙස හඳුනා ගැනේ.

6.1.2.5 හඳුනාගැනීම් ඉවත් කිරීම (Derecognition)

මූල්‍ය වත්කමක් (මූල්‍ය වත්කමක අදාල වන කොටස හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක අදාල වන කොටස්) පහත අවස්ථාවලදී හඳුනා ගැනීම ඉවත් කරනු ලබයි. එනම්

(i) වත්කමක කාලය ඉකුත් වී මුදල් ප්‍රවාහයන් ලැබීමට අයිතිය නිබෙන විට

(ii) ජා.ජ.ජ.ප.ම. වත්කම් වලින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය හෝ ලැබෙන මුදල් ප්‍රමාණයන් ප්‍රමාණාත්මක කාල පමාවකින් තොරව තුන්වන පාර්ශ්වයන් වෙත ප්‍රේෂණය කිරීම. (Pass Through) ගිවිසුම් යටතේ කළ යුතු බවට උපකල්පනය කරන විට එසේත් නැත්නම්,

(අ) ජා.ජ.ජ.ප.ම. වත්කම් වල සියළුම අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණාත්මක ලෙස පවරා ඇති විට, හෝ

(ආ) ජා.ජ.ජ.ප.ම. විසින් වත්කම් වල සියළුම අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණාත්මක ලෙස පවරා නැති අවස්ථාවල අදාල වත්කම් වල පාලනය පවරා ඇතිවිට.

6.1.2.6 මූල්‍ය වත්කම් වල හානිකරණය

එක් එක් වාර්තාකරණ දිනට ඇති මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩ වල අගය අඩුවීම පිළිබඳ අරමුණු ගත සාක්ෂි තිබේ දැයි ජා.ජ.ජ.ප.ම. විසින් තක්සේරු කරනු ලබයි. මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක අගය මූලික හඳුනාගැනීමෙන් පසුව, මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක අගය හෝ අනාගත මුදල් ප්‍රවාහයක අඩුවීම කෙරෙහි බලපාන එක් සිද්ධියක් හෝ සිද්ධීන් කීපයක් ඇති විය හැකි බව විශ්වාසදායි ලෙස ඇස්තමේන්තු කළ හැකි නම් එම වත්කම් වල අගය අඩුවන බව හා එසේ ඇතිවන බව නිගමනය කරනු ලබයි.

ණය ගැතියන් හෝ ණය ගැතියන් කණ්ඩායමක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතාවක්, පැහැර හැරීමක් හෝ පැහැර හැරීමක් අත්විඳින බවට ඇඟවීම්, ඔවුන් බංකොලොත් භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ඇතුළත් වීමේ සම්භාවිතාව, සහ නිරීක්ෂණය කළ හැකි දත්ත පෙන්නුම් කරන විට, දුර්වලතා පිළිබඳ සාක්ෂි ඇතුළත් විය හැකිය. හිඟ මුදල්වල වෙනස්වීම් හෝ පැහැර හැරීම් සමඟ සහසම්බන්ධ වන ආර්ථික තත්ත්වයන් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් සැලකේ.

6.1.2.7 මූල්‍ය වත්කම් වල හානිකරණය

ප්‍රතික්ෂේප කරන ලද පිරිවැයක් යටතේ ගෙන යන මූල්‍ය වත්කම් සඳහා, ජා.ජ.ජ.ප.ම.පළමුව තක්සේරු කරන්නේ දුර්වලතා පිළිබඳ වෛෂයික සාක්ෂි තනි තනිව වැදගත් වන මූල්‍ය වත්කම් සඳහාද, නැතහොත් සාමූහිකව තනි තනිව වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහාද යන්නයි. සැලකිය යුතු හෝ නැතත් තනි තනිව තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් සඳහා දුර්වලතා පිළිබඳ වෛෂයික සාක්ෂි නොමැති බව ජා.ජ.ජ.ප.ම. තීරණය කරන්නේ නම්, එයට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් සමූහයක වත්කම් ඇතුළත් වන අතර සාමූහිකව ඒවා දුර්වලතා සඳහා තක්සේරු කරයි. දුර්වලතා සඳහා තනි තනිව තක්සේරු කරන ලද සහ අලාභහානි පාඩුවක් හඳුනාගෙන ඇති හෝ දිගටම පවතින වත්කම්, සාමූහික තක්සේරුවකට ඇතුළත් නොවේ.

අලාභහානි අලාභයක් සිදුවී ඇති බවට වෛෂයික සාක්ෂි තිබේ නම්, අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කම් රැගෙන යන මුදල සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම අතර වෙනස (නවමත් සිදුවී නොමැති අනාගත අපේක්ෂිත ණය පාඩු හැර) . ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම මූල්‍ය වත්කම්වල මුල් ඵලදායී පොලී අනුපාතයට වට්ටම් කර ඇත.

6.2 මූල්‍ය වගකීම්

මූලික හඳුනාගැනීම සහ මැනීම

LKAS/SLFRS හි විෂය පථය තුළ ඇති මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වගකීම් ලෙස, ක්‍රමක්ෂ කළ පිරිවැයක් යටතේ හෝ සුදුසු පරිදි ඵලදායී ඇප සාධන පත්‍ර ලෙස නම් කර ඇති උපකරණ ව්‍යුත්පන්නයන් ලෙස වර්ග කෙරේ. ජා.ජ.ජ.ප.ම.මූලික හඳුනාගැනීමේදී එහි මූල්‍ය වගකීම් වර්ගීකරණය තීරණය කරයි.

සියලුම මූල්‍ය වගකීම් සාධාරණ වටිනාකමින් මුලින් හඳුනාගෙන ඇති අතර, ණය සහ ණය ගැනීම් සම්බන්ධයෙන්, ක්‍රමක්ෂ වියදම් යටතේ සිදු කෙරේ. මෙයට සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය ඇතුළත් වේ. ජා.ජ.ජ.ප.ම. හි මූල්‍ය වගකීම්වලට වෙළඳාම සහ අනෙකුත් ගෙවිය යුතු දෑ ඇතුළත් වේ.

පසුකාලීන මිනුම්
පසුකාලීන මූල්‍ය වගකීම් මැනීම ක්‍රමක්ෂය කළ පිරිවැයකින් සිදු කෙරේ.

හඳුනා නොගැනීම

මූල්‍ය වගකීමක් වගකීම් යටතේ ඇති වගකීම ඉවත් කළ විට හෝ අවලංගු කළ විට හෝ කල් ඉකුත් වූ විට හඳුනා නොගනී.

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

		සත්‍ය	යලිප්‍රකාශිත
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		2021	2020
		Rs.	Rs.
7. අයභාරය			
මනුගත විකුණුම්		**25,258,459,667**	25,218,395,326
තොග විකුණුම්		**302,786,383**	309,583,406
බවුසර් සැපයුම්		**174,226,590**	80,113,424
ප්‍රධාන මෙහෙයුමෙන් වූ ආදායම	7.1	**3,199,971,893**	2,153,683,639
		28,935,444,532	27,761,775,794
7.1 ප්‍රධාන මෙහෙයුම් ආදායම්			
නව සම්බන්ධතාවය සහ අනෙකුත්		**4,097,909,691**	2,850,936,522
ප්‍රධාන මෙහෙයුම් සම්බන්ධ ආදායම			
ප්‍රාග්ධන ආවරණ ආදායම		**1,058,843,764**	706,609,881
නව ජලසම්බන්ධන සඳහාවූ වියදම්		**(1,956,781,562)**	(1,403,862,765)
		3,199,971,893	2,153,683,639
8. විකුණුම් පිරිවැය			
සේවක පිරිස් පිරිවැය		**8,265,455,789**	6,995,067,804
පොම්ප කිරීමේ පිරිවැය		**4,751,630,799**	4,615,722,138
රසායනික ද්‍රව්‍ය		**1,242,760,106**	1,065,876,772
අළුත් වැඩියා සහ නඩත්තු		**2,204,735,725**	1,817,938,416
ආයතනික වියදම්		**819,171,330**	676,380,644
ගෙවල් කුලී , වරිපනම් බදු, ආරක්ෂක හා අනෙකුත් වියදම්		**1,772,169,781**	1,487,318,903
සහනාධාර		**107,022,009**	96,340,699
		19,162,945,539	16,754,645,376
9. වෙනත් මෙහෙයුම් ආදායම්			
වෙනත් ආදායම්	9.1	**1,768,137,060**	1,468,557,203
සේවක ණය ප්‍රතිලාභ		**27,987,416**	13,524,354
		1,796,124,476	1,482,081,558
9.1 වෙනත් ආදායම්			
මලාපවහන හා භූගත ජල ආදායම්		**389,053,519**	348,766,415
අධිඅය හා දන්ඩන ආදායම් ඇතුළු අනෙකුත් ආදායම්		**1,379,083,541**	1,119,790,788
		1,768,137,060	1,468,557,203

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		සත්‍ය	යලිප්‍රකාශිත
		2021	2020
		රු.	රු.
10. පරිපාලන වියදම්			
අළුත් වැඩියා සහ නඩත්තු		**243,593,490**	217,803,115
ආයතනික වියදම්		**897,881,429**	744,179,117
ගෙවල් කුලී , වරිපනම් බදු , ආරක්ෂක හා වෙනත් වියදම්		**633,122,909**	605,098,526
කාර්ය මණ්ඩල පිරිවැය	10.1	**6,902,380,259**	5,736,876,187
ක්ෂය	10.2	**4,970,880,560**	4,721,091,062
විගණන ගාස්තු-විගණකාධිපති දෙපාර්ථමේන්තුව		**10,000,000**	10,000,000
		13,657,858,647	12,035,048,008
10.1 කාර්ය මණ්ඩල පිරිවැය			
ලබාදුන් සේවක ණය මත සේවක පිරිවැය		**27,987,416**	13,524,354
සේවක පිරිවැය		**6,874,392,843**	5,723,351,833
		6,902,380,259	5,736,876,187
10.2 ක්ෂය			
ගොඩනැඟිලි හා ව්‍යුහයන්		**1,616,406,486**	1,557,184,971
පිරියත හා යන්ත්‍ර		**4,739,139,990**	4,498,239,994
උපකරණ		**512,992,293**	434,054,026
ලී බඩු සහ සවිකිරීම්		**51,410,565**	44,157,624
පරිගනක හා ආශ්‍රිත උපකරණ		**111,414,242**	106,911,165
මෝටර්වාහන		**358,507,720**	274,428,131
මුළු ක්ෂය		**7,389,871,297**	6,914,975,913
අඩු කලා - ප්‍රදාන මගින් මූල්‍යනය වූ වත්කම් වල ක්ෂයවීම්		**(2,411,900,057)**	(2,202,508,903)
අඩු කලා - නැවත අයකරනු ලබන වත්කම් වල ක්ෂයවීම්		**(9,041,487)**	(9,569,738)
එකතු කලා: කල්බදු වත්කම් ක්‍රමක්ෂය		**-**	15,949,142
එකතු කලා - අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය		**1,950,807**	2,244,648
ක්ෂය පිරිවැය		**4,970,880,560**	4,721,091,062
20,081,608 ක් වටිනා ක්ෂයවීම් 2020 වර්ෂය සඳහා ගැලපීම් කර ඇත			
11. වෙනත් මෙහෙයුම් වියදම්			
බොල් හා අඩමාන ණය		**87,833,212**	233,007,208
කල් ඉකුත් වූ තොග සඳහා අධි වෙන්කිරීම්		**92,426,248**	-
විශ්‍රාම පාරිතෝෂික		**710,138,294**	485,960,193
අයභාර ප්‍රදාන		**107,514,823**	120,306,058
		997,912,577	839,273,459
12. මූල්‍ය ආදායම්			
ආයෝජන ආදායම්		**842,533,384**	1,571,188,666
		842,533,384	1,571,188,666
13. මූල්‍ය වියදම්			
ණය මත පොලිය		**9,055,650,555**	12,449,809,359
අඩු කලා - නිර්මාන ව්‍යාපෘතිවල ප්‍රාග්ධනිත කළ පොලිය		**(8,303,578,676)**	(11,906,511,308)
		752,071,879	543,298,051
14. බදු			
ආර්ථික සේවා ගාස්තු		**138,860,749**	133,867,482
		138,860,749	133,867,482

2018 සහ 2019 වර්ෂවල ගෙවූ ආ.සේ.ගාස්තු පිළිවෙලින් 2020 සහ 2021 වියදම් ලෙස හඳුනාගෙන ඇත.

මූල්‍ය ප්‍රකාශන වලට සටහන
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

15. දේපල පිරියත හා උපකරණ

15.1 දල ධාරණ අගය	2021.01.01 දිනට යලි ප්‍රකාශිත ශේෂය	ගැලපීම් වලට පසු එකතු කිරීම්	මාරු කිරීම්	ඉවත්කිරීම්	2021.12.31 දිනට ශේෂය
පිරිවැය	රු.	රු.	රු.	රු.	රු.
සින්නක්කර වත්කම්					
සින්නක්කර ඉඩම්	8,690,701,194	1,736,151	(2,738,529)	-	**8,689,698,816**
කල්බදු ඉඩම්	599,500,254	-	700,000	-	**600,200,254**
යටිතල පහසුකම්	9,506,383,424	(72,607,438)	454,060,418	-	**9,887,836,404**
සින්නක්කර ගොඩනැඟිලි	19,552,776,472	2,872,261,864	1,499,744,620	(34,548,191)	**23,890,234,765**
ව්‍යුහයන්	59,845,898,666	1,055,029,798	(1,623,727,463)	-	**59,277,201,001**
පිරියත හා පොම්ප උපකරණ	47,907,978,613	4,181,844,702	(939,701,356)	-	**51,150,121,959**
සේවා මනු	3,698,907	90,910	(2,487,912)	-	**1,301,905**
තොග ජල මනු	671,812,651	28,369,499	73,954,384	-	**774,136,535**
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්	135,049,364,481	10,875,155,944	145,209,945	-	**146,069,730,369**
ජංගම උපකරණ	1,312,832,020	60,526,701	179,072,437	-	**1,552,431,157**
මැනුම් උපකරණ	100,013,530	37,093,623	8,930,526	-	**146,037,679**
රසායනාගාර උපකරණ	941,709,863	34,579,555	(10,510,706)	-	**965,778,712**
වෙනත් උපකරණ	3,651,532,182	(11,747,918)	44,059,778	-	**3,683,844,042**
ලී බඩු සහ සවි කිරීම් - පරිගණක	672,093,233	88,548,963	(113,593,355)	-	**647,048,841**
පරිගණක හා පර්යන්ත උපකරණ	822,397,959	99,907,273	4,262,140	-	**926,567,373**
මෝටර් වාහන - කාර් රථ	999,664,718	(243,058,517)	921,697,045	(700,000)	**1,677,603,247**
වෑන්, බස් හා ජීප් රථ	414,841,354	88,244,998	(127,612,759)	(2,400,000)	**373,073,593**
ලොරි හා ට්‍රක් රථ	1,963,849,283	220,568,857	(835,892,610)	(1,703,261)	**1,346,822,270**
ට්‍රැක්ටර් සහ වෙලර්	55,570,191	-	1,320,000	-	**56,890,191**
ජල බවුසර් හා බර වාහන	1,709,634,338	57,485,577	(48,083,132)	-	**1,719,036,783**
මෝටර් සයිකල්	27,605,559	(216,575)	(720,595)	(202,021)	**26,466,368**
ත්‍රී රෝද රථ	45,970,519	-	406,514	-	**46,377,033**
මුළු ක්ෂය කළ හැකි වත්කම් වල වටිනාකම	294,545,829,412	19,373,813,968	(371,650,610)	(39,553,473)	**313,508,439,297**

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

15.2 ක්ෂය

	2021.01.01 දිනට යලි ප්‍රකාශිත ශේෂය	වර්ෂය සඳහා ක්ෂය	ගැලපීම්	ඉවත්කිරීම්	2021.12.31 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.	රු.
ක්ෂය					
සින්නක්කර වත්කම්					
සින්නක්කර ඉඩම්	-	-	-	-	-
කල්බදු ඉඩම්	-	-	-	-	-
යටිතල පහසුකම්	1,150,443,109	193,102,290	(0)	-	**1,343,545,399**
සින්නක්කර ගොඩනැඟිලි	2,322,618,242	429,179,679	0	(9,194,741)	**2,742,603,179**
ව්‍යුහයන්	7,154,394,195	994,124,518	(0)	-	**8,148,518,713**
පිරියත හා පොම්ප උපකරණ	12,934,449,945	2,376,942,037	(0)	-	**15,311,391,982**
සේවා මනු	3,309,458	12,642	(2,553,034)	-	**769,065**
තොග ජල මනු	367,800,363	61,772,392	2,553,034	-	**432,125,789**
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්	12,993,100,793	2,300,412,919	0	-	**15,293,513,712**
ජංගම උපකරණ	469,161,116	122,309,016	6,875	-	**591,477,007**
මැනුම් උපකරණ	22,927,408	8,599,841	-	-	**31,527,249**
රසායනාගාර උපකරණ	485,192,959	71,369,485	(0)	-	**556,562,444**
වෙනත් උපකරණ	1,621,607,565	310,713,952	11,058	-	**1,932,332,575**
ලී බඩු සහ සවි කිරීම් - පරිගණක	384,703,404	51,410,565	(9,892,506)	-	**426,221,462**
පරිගණක හා පර්යන්ත උපකරන	664,836,570	111,414,242	9,869,625	-	**786,120,438**
මෝටර් වාහන - කාර් රථ	373,729,993	161,075,988	22,117,170	-	**556,923,152**
වෑන්, බස් හා ජීප් රථ	294,995,986	35,351,929	(9,686,849)	(1,603,030)	**319,058,036**
ලොරි හා ට්‍රක් රථ	785,285,182	71,019,368	(3,424,034)	(1,307,786)	**851,572,730**
ට්‍රැක්ටර් සහ ට්‍රේලර්	30,240,380	3,931,116	-	-	**34,171,496**
ජල බවුසර් හා බර වාහන	477,528,556	81,259,694	(0)	-	**558,788,250**
මෝටර් සයිකල්	13,616,882	1,754,291	24,462	(171,604)	**15,224,032**
ත්‍රි රෝද රථ	3,699,757	4,115,333	-	-	**7,815,090**
	42,553,641,865	7,389,871,297	9,025,801	(12,277,161)	**49,940,261,802**

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

15. දේපල පිරියත හා උපකරණ

15.3 ශුද්ධ පොත් අගය	**2021** රු.	2020 රු.
පිරිවැය		
සින්නක්කර ඉඩම්	**8,689,698,816**	8,690,701,194
කල්බදු ඉඩම්	**600,200,254**	599,500,254
යටිතල පහසුකම්	**8,544,291,005**	8,355,940,315
සින්නක්කර ගොඩනැඟිලි	**21,147,631,586**	17,230,158,231
ව්‍යුහයන්	**51,128,682,288**	52,691,504,470
පිරියත හා පොම්ප උපකරණ	**35,838,729,977**	34,973,528,668
සේවා මනු	**532,840**	389,450
තොග ජල මනු	**342,010,746**	304,012,288
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්	**130,776,216,657**	122,056,263,687
ජංගම උපකරණ	**960,954,150**	843,670,903
මැනුම් උපකරණ	**114,510,430**	77,086,122
රසායනාගාර උපකරණ	**409,216,268**	456,516,904
වෙනත් උපකරණ	**1,751,511,468**	2,029,924,617
ලී බඩු සහ සවි කිරීම් - පරිගණක	**220,827,379**	287,389,829
පරිගණක හා පර්යන්ත උපකරන	**140,446,935**	157,561,389
මෝටර් වාහන - කාර් රථ	**1,120,680,095**	625,934,725
වෑන්, බස් හා ජීප් රථ	**54,015,557**	119,845,368
ලොරි හා ට්‍රක් රථ	**495,249,538**	1,178,564,101
ට්‍රැක්ටර් සහ ට්‍රෙලර්	**22,718,695**	25,329,811
ජල බවුසර් හා බර වාහන	**1,160,248,533**	1,232,105,782
මෝටර් සයිකල්	**11,242,336**	13,988,677
ත්‍රී රෝද රථ	**38,561,943**	42,270,762
දේපල පිරියත හා උපකරණ වල මුළු ධාරන අගය.	**263,568,177,496**	251,992,187,547

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		සත්‍ය	යලිප්‍රකාශිත
		2021	2020
		රු.	රු.
16.	**අස්පෘශ්‍ය වත්කම්**		
	පරිගණක මෘදුකාංග	**20,429,157**	14,122,453
		20,429,157	14,122,453

වර්ෂය තුළ ඉහත මෘදුකාංග සඳහා ක්‍රමක්ෂය සඳහා රුපියල් 3,286,735 ක් ලබා දී ඇති අතර නව මෘදුකාංග 8,667,181 ක් එකතු කර ඇත.

17.	**කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ**		
	ඉදිකිරීම් වැඩ	**435,882,107,400**	366,959,156,027
	පුනරුත්ථාපන	**7,855,021,373**	6,503,499,543
		443,737,128,772	373,462,655,570

18.	**මූල්‍ය වත්කම්**		
	සේවක නිවාස ණය සඳහා HDFC හි ආයෝජනය.	**434,368**	441,068
	ලංකා බැංකුව ඉතුරුම් - II	**1,455,412**	1,412,440
		1,889,780	1,853,507

19.	**තොග**			
	පිවිසි වානේ පයිප්ප	**34.2**	**6,309,746,897**	5,034,648,952
	ජලමනු හා පිත්තල අයිතම		**652,421,298**	745,219,930
	රසායනික ද්‍රව්‍ය	**34.2**	**266,035,627**	330,636,834
	විදුලි උපකරණ	**34.2**	**766,970,906**	727,923,643
	ගොඩනැගිලි ද්‍රව්‍ය		**62,798,913**	70,345,208
	පයිප්ප හා අමතර උපාංග	**34.2**	**1,138,476,173**	1,248,510,037
	වාහන අමතර කොටස්		**97,758,030**	308,596,261
	ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ		**96,557,311**	76,141,325
	වෙනත් අයිතම	**34.2**	**917,466,285**	555,826,008
	තොග ගැලපුම්		**155,974,054**	35,732,252
			10,464,205,491	9,133,580,448
	අඩුකලා- ප්‍රධාන අමතර කොටස්			
	ගබඩාවල තිබෙන දේපල පිරියත හා උපකරණ		**(396,328,070)**	(606,941,540)
	කල් ඉකුත් වූ තොග සඳහා වෙන්කිරීම		**(236,958,510)**	(144,532,262)
			9,830,918,912	8,382,106,647

සැමට ජල ව්‍යාපෘති සඳහා රුපියල් 546,969,384ක් වටිනා බඩු තොග ලැබීම් 2021.12.31 දිනට වාර්තා කර ඇත.

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		සත්‍ය	යලිප්‍රකාශිත
		2021	2020
		රු.	රු.
20. වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ			
වෙළඳ ණයගැතියෝ	34.2	**7,494,937,600**	7,958,524,363
වෙනත් ණයගැතියෝ		**459,708,385**	359,403,706
අඩුකළා : ණයගැති හානිකරණ		**(1,516,901,595)**	(1,466,952,481)
ණයගැති පාලන ගිණුම	34.2	**735,918,131**	421,699,404
ලැබිය යුතු ඒ.අ.බදු		**3,019,434**	11,888,233
ලැබිය යුතු රඳවා ගැනීම් බදු		**246,511,483**	247,129,963
ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තුව		**33,795,903**	172,656,652
සේවක අත්තිකාරම්		**14,169,556**	19,984,791
සේවක ණය		**2,509,912,053**	2,704,816,354
මහා භාණ්ඩාගාරයෙන් අයවිය යුතු මුදල්		**659,277,280**	659,277,280
ලැබිය යුතු පොලී හා වෙනත්		**69,569,989**	48,456,634
		10,709,918,219	11,136,884,898
21. තැන්පතු සහ අත්තිකාරම්			
කලින් ගෙවීම්		**2,387,651**	956,151
බලමුලු ගැන්වීම සහ අනෙකුත් අත්තිකාරම්		**28,469,734,734**	28,412,896,392
තැන්පතු	34.2	**394,113,267**	294,161,356
		28,866,235,652	28,708,013,898
22. ආයෝජන			
පරිණතිය තෙක් තබාගන්නා (නැවත අයකරගන්නා අරමුදල් අයත් ආයෝජන ඇතුළුව)		**24,349,404,858**	23,598,991,188
		24,349,404,858	23,598,991,188
23. මුදල් හා මුදල් සමාන දෑ			
බැංකුවේ මුදල්		**4,013,569,719**	1,575,845,777
ප්‍රධාන කාර්යාලයේ මුදල් අග්‍රිමය		**2,225,000**	4,107,362
ප්‍රාදේශීය මුදල් අග්‍රිමය		**6,394,030**	6,272,935
මාර්ගස්ථ මුදල්		**155,495,984**	166,479,620
ඉතිරි කිරීමේ ගිණුම්		**55,645,599**	82,231,943
		4,233,330,332	1,834,937,637

සැමට ජල ව්‍යාපෘති සඳහා බිල්පත් ගෙවීම සහ ණය ආපසු ගෙවීම් සඳහා රුපියල් 2,343,418,124 ක් බැංකුවේ මුදල් ඉතිරිව තිබුණි.

24. රජයෙන් අත්පත් කරගත් වත්කම්			
රජයේ දෙපාර්තමේන්තු වලින් අත්පත් කර ගත් වත්කම්		**185,480,387**	185,480,387
		185,480,387	185,480,387
25. රාජ්‍ය ස්කන්ධය			
ණය, ස්කන්ධ ප්‍රාග්ධනය ලෙස පරිවර්ථනය		**86,363,339,295**	74,631,444,685
රාජ්‍ය දායකත්වය (බැදුම්කර)		**13,899,983,925**	13,899,983,925
		100,263,323,220	88,531,428,611

2014.12.31 දිනට ගෙවිය යුතු විදේශ ණය සහ පොලිය රජයේ ස්කන්ධය ප්‍රාග්ධනය බවට පරිවර්තනය කිරීමට ශ්‍රී ලංකා රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේ.

මුල්‍ය ප්‍රකාශන වලට සටහන

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		සත්‍ය	යලිප්‍රකාශිත
		2021	2020
		රු.	රු.
26. සේවක සුභසාධන අරමුදල හා වෙනත්			
ආරම්භක ශේෂය		20,608,827	29,411,874
වර්ෂය තුළ ලැබීම් /(ගෙවීම්)		12,506,981	(8,803,047)
		33,115,808	20,608,827
27. රජයේ ප්‍රදාන			
භාණ්ඩාගාර ප්‍රදාන		117,548,897,076	109,812,274,767
		117,548,897,076	109,812,274,767
28. ප්‍රාග්ධන ප්‍රදාන			
විදේශීය ප්‍රදාන	34.2	290,279,249,382	265,544,944,453
දේශීය ප්‍රදාන		1,777,297,524	1,744,061,642
		292,056,546,906	267,289,006,096
29. ගෙවිය යුතු ණය			
විදේශ ණය		195,618,735,427	163,342,347,199
දේශීය ණය		31,802,198,974	34,833,424,166
ගෙවිය යුතු ණය වල දිගුකාලීන කොටස		227,420,934,401	198,175,771,364
ගෙවිය යුතු ණය වල කෙටිකාලීන කොටස		12,578,838,828	2,920,569,236
ගෙවිය යුතු ණය		239,999,773,229	201,096,340,601

තවද, මහා භාණ්ඩාගාරය විසින් 2021.12.31 දිනට මණ්ඩලයේ ව්‍යාපෘති 10ක් සඳහා රුපියල් බිලියන 196.35ක් වටිනා ණය මුදලක් අත්සන් කර ඇති අතර ඒවායින් කොටසක් ශේෂ පත්‍ර දින වන විට ප්‍රදානයන් යටතේ ඇතුළත් වේ.

30. වෙනත් අයමිභාව්‍යය වගකීම්			
විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම සඳහා වෙන් කිරීම	30.1	4,368,425,143	4,003,984,078
ගනුදෙනුකරු හා සේවක ආරක්ෂිත තැම්පතු		46,407,941	15,425,526
		4,414,833,084	4,019,409,604
30.1 පාරිතෝෂික වෙන්කිරීමේ වෙනස්වීම			
කාලපරිච්ඡේදය ආරම්භක ශේෂය		4,003,984,078	4,003,984,078
එකතු කළා - කාල පරිච්ඡේදය සඳහා වෙන්කිරීම්			
වත්මන් සේවා පිරිවැය සහ පොලී පිරිවැය ගැලපීම		933,357,983	485,960,193
අඩුකලා - කාල පරිච්ඡේදය තුළ පාරිතෝෂික ගෙවීම		(568,916,918)	(485,960,193)
අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලැස්ම සඳහා ප්‍රතිපාදන		4,368,425,143	4,003,984,078

ආයුගණක උපකල්පන වනුයේ; මරණ අනුපාතය: 1967/70 මරණ වගුව භාවිතා කරන ලදී, ආබාධිතභාවය : සම්මත, සාමාන්‍ය විශ්‍රාම වයස : අවුරුදු 62, වට්ටම් අනුපාතය : 11.60% වර්ෂයකට., වැටුප් වැඩි කිරීමේ අනුපාතය : 2% වර්ෂයකට. සහ වසර 3කට වරක් 20% මීළඟ 2024 වැඩිවීම, කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාත : 1% වර්ෂයකට. වයස අවුරුදු 54 දක්වා මණ්ඩලය පුරා.

31. වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ			
නැවත අයකර ගත හැකි වැඩ සඳහා			
ගනුදෙනුකරුවන්ගේ අත්කිකාරම්	34.2	9,724,152,467	9,285,082,967
කොන්ත්‍රාත්කරුවන්ගේ රඳවා ගැනීම්		17,334,616,810	15,016,366,516
ණයගිම් පාලන ගිණුම	34.2	2,771,618,480	2,108,187,891
වෙනත් ණයගිම්යෝ		351,925,188	339,170,471
උපචිත වියදම්	34.2	9,172,705,908	6,314,247,943
තැන්පතු		315,536,883	283,501,586
ගෙවිය යුතු එකතු කළ අගය මත බදු		220,602,860	200,605,713
රඳවා ගැනීම් බදු		129,122	141,677
වැටුප් හා වෙනත් ගෙවිය යුතු දෑ		219,736,570	177,572,741
		40,111,024,288	33,724,877,505

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

32. සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු

රජයේ සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන සමඟ ගනුදෙනු.

මණ්ඩලය විසින් සිදුකරනු ලබන සාමාන්‍ය ගනුදෙනු සමඟ සම්බන්ධිත පාර්ශවයන් සමඟ ද ගනුදෙනු කරනු ලැබේ. ශ්‍රී ලංකා රජය (මණ්ඩලයේ අවසන් බලාධිකාරිය දක්වනු ලබන) විවිධ වූ රාජ්‍ය දෙපාර්තමේන්තු සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන සම්බන්ධිත පාර්ශව වලට අයත් වේ. රජයේ සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන වලට අදාළ තනි තනි වශයෙන් වැදගත් වන සහ තනි තනි වශයෙන් වැදගත් නොවූවද සාමූහික වශයෙන් ගත්කළ වැදගත් වන, මණ්ඩලය විසින් සිදු කරන ලද ගනුදෙනු සහ විධිවිධානයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

33. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

සියලුම ප්‍රමාණාත්මක ශේෂපත්‍ර දිනට පසු සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර සුදුසු ගැලපීම් අවශ්‍ය වන පරිදි මූල්‍ය වාර්තා වල සිදුකර ඒවා අනාවරණය කරනු ලබයි.

34. පූර්ව වර්ෂ ගැලපීම්

34.1 ජා.ජ.ජ.ප.ම විශාල වත්කම් පදනමක් ඇති බැවින් තක්සේරු දෙපාර්තමේන්තුවේ සේවය ලබා ගැනීමෙන් නැවත තක්සේරු කරන ලදී. 2010 වර්ෂයේදී තක්සේරු කරන වටිනාකම් පොත් වල සටහන් කරන ලද අතර එම අගයන් වර්තමානයේදී දේපල පිරියත හා උපකරණ හි පිරිවැය ලෙස සලකනු ලබන අතර ඒ සඳහා යම් පූර්ව වර්ෂ ගැලපීම් අවශ්‍ය වේ. තවද, වත්කම් කළමනාකරණ පද්ධතිය (AMS) ක්‍රියාත්මක කිරීම යටතේ, සමහර වත්කම් වර්ගීකරණයන් 2021 වර්ෂය තුළ සංශෝධනය කරන ලදී. එබැවින්, ශුද්ධ බලපෑම රු. 1,386,868 දේපල පිරියත හා උපකරණ හි ධාරණ අගයට ගලපා ඇති අතර 2020.12.31 දිනට පහත පරිදි ක්ෂයවීම් සඳහා 4,021,795 ගලපා සකස් කර ඇත.

34.1.1 දල ධාරණ අගය

පිරිවැය සින්නක්කර වත්කම්	2020.12.31 දිනට ශේෂය රු.	පූර්ව වර්ෂ ගැලපීම් රු.	2020.12.31 දිනට යලි ප්‍රකාශිත ශේෂය රු.
සින්නක්කර ඉඩම්	8,692,307,065	(1,605,871)	8,690,701,194
කල්බදු ඉඩම්	599,500,254	-	599,500,254
යටිතල පහසුකම්	9,088,507,657	417,875,768	9,506,383,424
සින්නක්කර ගොඩනැඟිලි	19,301,164,859	251,611,613	19,552,776,472
ව්‍යුහයන්	59,921,379,719	(75,481,053)	59,845,898,666
පිරියත හා පොම්ප උපකරණ	48,612,342,019	(704,363,407)	47,907,978,613
සේවා මනු	3,789,817	(90,910)	3,698,907
තොග ජල මනු	665,892,353	5,920,298	671,812,651
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්	135,098,945,324	(49,580,843)	135,049,364,481
ජංගම උපකරණ	1,248,278,546	64,553,473	1,312,832,020
මැනුම් උපකරණ	99,731,530	282,000	100,013,530
රසායනාගාර උපකරණ	944,303,825	(2,593,962)	941,709,863
වෙනත් උපකරණ	3,521,344,357	130,187,825	3,651,532,182
ලී බඩු සහ සවි කිරීම් - පරිගණක	697,253,114	(25,159,881)	672,093,233
පරිගණක හා පර්යන්ත උපකරන	835,304,508	(12,906,549)	822,397,959
මෝටර් වාහන - කාර් රථ	711,066,309	288,598,410	999,664,718
වෑන්, බස් හා ජීප් රථ	503,086,352	(88,244,998)	414,841,354
ලොරි හා ට්‍රක් රථ	2,173,473,141	(209,623,857)	1,963,849,283
ට්‍රැක්ටර් සහ ට්‍රේලර්	55,570,191	-	55,570,191
ජල බවුසර් හා බර වාහන	1,700,834,338	8,800,000	1,709,634,338
මෝටර් සයිකල්	27,170,484	435,075	27,605,559
ත්‍රී රෝද රථ	45,970,519	-	45,970,519
මුළු ක්ෂය කළ හැකි වත්කම් වල වටිනාකම	294,547,216,280	(1,386,868)	294,545,829,412

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

34.1.2 ක්ෂය	2020.12.31 දිනට ශේෂය	පූර්ව වර්ෂ ගැලපීම්	2020.12.31 දිනට යලි ප්‍රකාශිත ශේෂය
සින්නක්කර වත්කම්	රු.	රු.	රු.
සින්නක්කර ඉඩම්	-	-	-
කල්බදු ඉඩම්	-	-	-
යටිතල පහසුකම්	1,137,308,141	13,134,968	1,150,443,109
සින්නක්කර ගොඩනැඟිලි	2,296,632,162	25,986,079	2,322,618,242
ව්‍යුහයන්	7,173,131,092	(18,736,897)	7,154,394,195
පිරියත හා පොම්ප උපකරණ	12,970,537,339	(36,087,394)	12,934,449,945
සේවා මනු	3,309,458	-	3,309,458
තොග ජල මනු	366,647,551	1,152,812	367,800,363
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්	12,999,114,528	(6,013,734)	12,993,100,793
ජංගම උපකරණ	450,616,514	18,544,603	469,161,116
මැනුම් උපකරණ	22,648,228	279,180	22,927,408
රසායනාගාර උපකරණ	486,984,590	(1,791,631)	485,192,959
වෙනත් උපකරණ	1,604,277,373	17,330,192	1,621,607,565
ලී බඩු සහ සවි කිරීම් - පරිගණක	389,826,225	(5,122,821)	384,703,404
පරිගණක හා පර්යන්ත උපකරන	677,865,440	(13,028,870)	664,836,570
මෝටර් වාහන - කාර් රථ	177,656,629	196,073,364	373,729,993
වෑන්, බස් හා ජීප් රථ	435,685,995	(140,690,008)	294,995,986
ලොරි හා ට්‍රක් රථ	825,894,414	(40,609,231)	785,285,182
ට්‍රැක්ටර් සහ ට්‍රේලර්	52,398,339	(22,157,958)	30,240,380
ජල බවුසර් හා බර වාහන	462,168,738	15,359,818	477,528,556
මෝටර් සයිකල්	13,217,557	399,325	13,616,882
ත්‍රී රෝද රථ	3,699,757	-	3,699,757
මුළු ක්ෂය වල වටිනාකම	42,549,620,070	4,021,795	42,553,641,865

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

34.2 දේපල පිරියත උපකරණ වලට අදාල පෙර වර්ෂ ගැලපීම් වලට අමතරව පහත සඳහන් අයිතමද පූර්ව වර්ෂ සඳහා බලපාන ලෙස ගලපා ඇත.

	2020.12.31 දිනට ශේෂය	පූර්ව වර්ෂ ගැලපීම්	2020 වර්ෂයට අදාල ගැලපීම්	2020.12.31 දිනට යලි
	රු	රු	රු	රු
තොග (සටහන් 19)				
පිවිසි වානේ පයිප්ප	5,032,247,170		2,401,782	5,034,648,952
රසායනික ද්‍රව්‍ය	328,604,834	2,032,000		330,636,834
විදුලි උපකරණ	735,849,788	(7,926,145)		727,923,643
පයිප්ප හා අමතර උපාංග	1,249,805,822	(2,035,456)	739,671	1,248,510,037
වෙනත් අයිතම	561,631,653	(4,185,053)	(1,620,592)	555,826,008
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ (සටහන් 20)				
වෙනත් ණයගැතියෝ	8,030,015,131	(1,243,209)	(70,247,558)	7,958,524,363
ණය ගැති එකතු කිරීමේ පාලන ගිණුම	479,699,404	-	(58,000,000)	421,699,404
තැන්පතු සහ අත්තිකාරම්				
තැන්පතු	294,461,356	(300,000)		294,161,356
ප්‍රාග්ධන ප්‍රදාන (සටහන් 28)				
විදේශීය ප්‍රදාන	265,549,744,453	(4,800,000)		265,544,944,453
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ (සටහන් 31)				
නැවත අයකර ගත හැකි සඳහා ගනුදෙනුකරුවන්ගේ අත්තිකාරම්	9,285,334,967		(252,000)	9,285,082,967
ණයහිමි පාලන ගිණුම	2,127,054,981	-	(18,867,090)	2,108,187,891
උපචිත වියදම්	6,314,782,183	-	(534,240)	6,314,247,943

ඩබ්එස්එස්/ඒ/එන්ඩබ්එස්ඩීබී/එෆ්ඒ/01/2021 2022 මැයි 31

සභාපති

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ (ජාජසජම) ("මණ්ඩලය") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මෙම වාර්තාවේ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති භාවිතයෙන් බැහැරවීම (එල්කේඒඑස්/එස්එල්එෆ්ආර්එස්)

(i) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමිතයෙහි (ශ්‍රී.ලං.ගි.ප්‍ර 01) ඡේද අංක 32 ට පටහැනි ලෙස ජංගම වත්කම් නියෝජනය කරනු ලබන වෙළෙඳ ලැබිය යුතු දෑ හි රු.8,506,031ක අසාමාන්‍ය බැර ශේෂය බැරකම් වලට හිලව් කොට සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ක්‍රියාකාරී නොවන වගකීම් ලෙස හඳුනාගෙන තිබුණි. ඊට සමානව ජංගම වගකීම් නියෝජනය කරන රු. 1,078,112 ක රඳවා ගැනීම් හර ශේෂයක් ලැබිය යුතු දෑට එරෙහිව හිලව් කොට සමාලෝචනය කළ වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ක්‍රියාකාරී නොවන වත්කම් ලෙස හඳුනාගෙන තිබුණි. ඊට අමතරව දෙහිවල කළමනාකාර කාර්යාලයට සහ මොරටුව ප්‍රදේශයේ ඉංජිනේරු කාර්යාලයට අදාළව සමාලෝචිත වර්ෂය තුළ බොල් ණය ලෙස කපා හැර තිබූ රු.51,411,173 ක් සහ රු.65,226,954 ක් වෙනත් මෙහෙයුම් වියදම් ලෙස හඳුනා ගැනීමකින් තොරව මනු ගත විකුණුම් වලට එරෙහිව හිලව් කොට තිබුණි.

(ii) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමිතයෙහි (ශ්‍රී.ලං.ගි.ප්‍ර 01) ඡේද අංක 60 ට පටහැනි ලෙස තොග, ණය ගැති, අත්තිකාරම් සහ මුදල් පොත් ශේෂයන් ඇතුලත් වන රු. 149,681,812 ක ක්‍රියාකාරී නොවන වත්කම් වටිනාකමක් හඳුනා ගෙන තිබූ අතර එකිනෙක අයිතමයන්ගේ ද්‍රවශීලතාවය වෙන වෙනම සැලකිල්ලට ගැනීමකින් තොරව එය ඉතා ඉහළ අද්‍රවශීලී අයිතමයන් ලෙස දක්වා තිබුණි.

(iii) තොග පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං. ගි.ප්‍ර 02) 9 වෙනි ඡේදයට පටහැනිව, වසර තුනකට වඩා වැඩි කාලයක් චලනය නොවූ මුළු වටිනාකම රු. 632,408,899 ක් වූ තොග ඒවායෙහි ශුද්ධ උපලබ්ධි වටිනාකම තක්සේරු නොකර එහි පිරිවැයට වාර්තා කර තිබුණි.

(iv) මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර.07) 07 වන වගන්තියට පටහැනිව, ඉතිරි කිරීම් ගිණුමක තැන්පත් කරනු ලැබූ රු.1,455,412 ක් සහ එස්ක්‍රෝ ඉතිරි කිරීම් ගිණුමක තැන්පත් කර තිබූ රු.මිලියන 11,828.23 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය තුල මූල්‍ය වත්කම් හා ආයෝජන යටතේ වර්ගීකරණය කර තිබුණි. කෙසේ වෙතත්, එස්ක්‍රෝ ඉතුරුම් ගිණුමේ ශේෂයෙන් රු.මිලියන 2,065.8 කට සමාන මුදලක් වර්ෂය තුළ උපයෝජනය කර තිබූ බව නිරීක්ෂණය විය.

(v) ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ දෝෂ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර.08) 41 සහ 42 ඡේදවලට පටහැනිව, 2020 වර්ෂය සඳහා ජල සම්පාදන අමාත්‍යාංශයෙන් ලැබුණු රු. 3,797,412 ක කුලී ආදායම සහ 2020 වර්ෂයට අදාළව සීතාවක කළමණාකාර කාර්යාලයෙන් සහ ගාල්ල කළමණාකාර කාර්යාලයෙන් ලද පිළිවෙලින් රු. 354,080 ක සහ රු. 1,078,301 ක මලාපවහන ආදායම සමාලෝචිත වර්ෂය සඳහා ආදායම ලෙස හඳුනාගෙන තිබුණි. තවද, මහ කොළඹ මලාපවහන අංශයට අදාළව 2020 පෙබරවාරි 07 වන දින සිදු වූ දෝෂය නිවැරදි කිරීම සඳහා වර්ෂය තුළ මලාපවහන ආදායම රු. 436,090 කින් හර කර තිබූ අතර කල් බදු ඉඩම්වල පිරිවැයට පූර්ව වර්ෂයේ ගැලපීමක් ලෙස හඳුනාගත යුතුව තිබූ රු. 700,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ කල් බදු ඉඩම් මාරුකිරීමක් ලෙස වැරදියට හඳුනාගෙන තිබුණි. ඊට අමතරව බස්නාහිර-මධ්‍යම ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයට (මාලිගාවත්ත) අදාළව නිකුත් කල වැරදි බිල්පත් හේතුවෙන් පසුගිය වර්ෂවල බිල්පත් ආදායම ලෙස හඳුනාගෙන තිබූ රු. 22,696,939 ක් සමාලෝචිත වර්ෂයේ අඩු කළ හැකි ගැලපුම් ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ දෝෂ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්කේඒඑස්08) 41 සහ 42 ඡේදයට අනුව එය ගැලපීම් කිරීමට කටයුතු නොකර එය වර්ෂයේ මනුගත ආදායමට ගලපා තිබුණි.

(vi) වක්වැල්ල ජල පවිත්‍රාගාරයේ සහ ගොඩනැඟිල්ලේ අලුත්වැඩියා සඳහා 2018 සහ 2019 වර්ෂයන් තුළදී දැරූ රු. 5,855,591 ක අළුත්වැඩියා වියදම කල වැඩ වටිනාකමක් ලෙස වරදවා හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, නිවැරදි කිරීම සිදු කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ දෝෂ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර.08) 42 වැනි වගන්තිය ප්‍රකාරව ගැලපීම් සිදු කිරීම වෙනුවට ඊට සමාන මුදලක් වර්ෂය තුළ දරන ලද වියදම් ලෙස හඳුනාගෙන තිබුණි. තවද, අංක 80836249 දරන ස්ථාවර තැන්පතුවට අදාළව පොලී වශයෙන් 2017 වර්ෂය තුළ ලැබුණු රු. 1,224,986 ක් වැරදියට 2017 වර්ෂයේදී මාර්ගස්ථ මුදල් ගිණුමට බැර කොට තිබුණි. කෙසේ වෙතත්, ඉහත ප්‍රතිපාදනයට අනුව වසර ආරම්භයේ රඳවා ගත් අලාභයට ගැලපීම වෙනුවට වර්ෂය සඳහා ආදායමක් ලෙස හඳුනාගෙන සමාලෝචිත වර්ෂය තුළ එය නිවැරදි කර තිබුණි.

(vii) ස්ථාවර වත්කම් අටක (08) වර්ගීකරණයන් පහක් (05) වෙනස් කිරීම හේතුවෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ දෝෂ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර.08) 42 වැනි වගන්තිය ප්‍රකාරව හඳුනාගැනීම වෙනුවට ක්ෂයවීම් සඳහා රු.293,125 ක අතිරේක ප්‍රතිපාදනයක් සමාලෝචිත වර්ෂය තුළ සිදු කර

තිබුණි. තවද, වර්ෂය තුළ ජංගම නොවන වත්කම්වලට එකතු කරන ලද එකතු කිරීම් ඉක්මවන රු.මිලියන 1,252.33 ට සමාන මුදලක් ඉහත ප්‍රමිතියේ 42 වැනි වගන්තිය ප්‍රකාරව හඳුනා ගැනීමකින් තොරව දේපල පිරියත සහ උපකරණවල පිරිවැයෙන් මාරු කර තිබුණි. ඊට අමතරව විගණනය මගින් සිදු කරන ලද ගණනය කිරීම්වලට අනුව ස්ථාවර වත්කම් අටක (08) වර්ගීකරණයන් පහක් (05) වෙනස් කිරීම සඳහා ප්‍රත්‍යාවර්තී ගැලපීම් ලෙස වර්ෂය ආරම්භයේ අලාභයට රු.845,272 ක ඌන ක්ෂය ප්‍රතිපාදන සිදු කර තිබුණි. එබැවින් වසර ආරම්භයේ රඳවාගත් අලාභය සහ ක්ෂයවීම් සඳහා වූ ප්‍රතිපාදන ඊට සමාන ප්‍රමාණයකින් අවතක්සේරු වී තිබුණි.

(viii) දේපල,පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං. ගි.ප්‍ර 16) 51 වන වගන්තිය ප්‍රකාරව, වත්කම් වල ඵලදායී ජීවිත කාලය අවම වශයෙන් ඒ ඒ ගිණුම් වර්ෂය අවසානයේදී සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තු සමග වෙනස් වේ නම් එම වෙනස ශ්‍රී.ලං. ගි.ප්‍ර 08 ට අනුව ගිණුම්ගත කල යුතුය. කෙසේවෙතත්, තවමත් භාවිතයේ පවතින ස්ථාවර වත්කම් කාණ්ඩ 17 කට අයත් වටිනාකම රු. 2,604,392,336 ක් වන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම් ගත කර නොතිබුණි. ඊට අමතරව වසර 20කට වැඩි කාලයක් පවතින රු. 396,328,070 ක් වූ ප්‍රධාන අමතර කොටස් ද ඒවායේ අපේක්ෂිත ඵලදියී ජීවිත කාලය සමාලෝචනය නොකර සියයට 5ක අනුපාතයක් යොදා ගනිමින් ක්ෂය කර තිබුණි.

(ix) රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම සහ රජයේ ආධාර හෙළිදරව් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 20) විධිවිධානවලට පටහැනිව, වසර 15 කට වඩා වැඩි කාලයක් තුළ ක්‍රමක්ෂය කිරීමෙන් තොරව පැවති ව්‍යාපෘති 29 කට අදාළව එකතුව රු.මිලියන 10,445.59 ක් වූ විදේශ ප්‍රදාන ශේෂයන්ද, වසර 12 කට වඩා වැඩි කාලයක් තුළ ක්‍රමක්ෂය කිරීමෙන් තොරව පැවති ව්‍යාපෘති 05 කට අදාළව එකතුව රු.මිලියන .3,258.98 ක් වූ විදේශ ප්‍රදාන ශේෂයන්ද 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. එම විදේශීය ප්‍රදානවලට අදාළ තොරතුරු කිසිවක් නොමැති හෙයින් මූල්‍ය ප්‍රකාශන සඳහා ක්‍රමක්ෂය නොකිරීමේ බලපෑම විගණනයේදී නිශ්චය කර ගත නොහැකි විය. තවද, ප්‍රමිතයේ 12 වන ඡේදයට පටහැනිව එක් එක් විදේශ ප්‍රදානයට අදාළ නිශ්චිත ව්‍යාපෘතිය වෙන වෙනම හඳුනා නොගෙන ස්ථාවර වත්කම් අයිතම කාණ්ඩ 13 කට අදාල ක්ෂය වීම් ලෙස රු. 110,142,908 ක් ක්‍රමක්ෂය ලෙස වෙනම විදේශ ප්‍රදාන ගිණුමකට හර කොට තිබුණි. එබැවින් විදේශ ප්‍රදානයන්හි එකතු වටිනාකමෙහි රු.110,142,908 ක අසාමාන්‍ය හර ශේෂයක් නිරීක්ෂණය විය.

(x) හම්බන්තොට කළමණාකරන කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ සිදුකල භාණ්ඩ සමීක්ෂණය තුලදී හඳුනාගත් රුහුණුපුර ජල සම්පාදන ක්‍රමයේ කොන්ත්‍රාත්කරුගෙන් ලද රු.27,669,420 ක් වටිනා තොග අයිතමයන්ද අක්කරෛපත්තු කළමණාකරන කාර්යාලයට ප්‍රදාන ලෙස ලද රු. 52,739,979 ක් වටිනා තොග අයිතමයන්ද රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම හා රජයේ ආධාර හෙළිදරව් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 20) 03 වන වගන්තිය ප්‍රකාරව මූලාශ්‍රය විධිමත්ව හඳුනා ගැනීමකින් තොරව විදේශ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස හඳුනා ගෙන තිබුණි.

(xi) සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 24) 8 වැනි වගන්තියට අනුව මණ්ඩලයේ මෙහෙයුම් ඇගයීමට බලපාන සම්බන්ධිත පාර්ශ්ව සම්බන්ධතා මණ්ඩලය විසින් හඳුනාගෙන නොතිබුණි. තවද, මූල්‍ය ප්‍රකාශනවල හෝ එහි වාර්ෂික වාර්තාවේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු හඳුනාගෙන හෙළිදරව් කිරීමේ ක්‍රමවේදයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් හඳුන්වා දී නොතිබුණි. එබැවින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවල ස්වභාවය සහ ප්‍රමාණය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

(xii) ආයෝජන දේපල පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 40) විධිවිධාන වලට පටහැනිව, ධාරණ අගය රු. 328,259,619 ක් වූ අයෝජන දේපළ 2021 දෙසැම්බර් 31 දිනට ආයෝජන දේපළ ලෙස දැක්වීම වෙනුවට දේපළ පිරියත හා උපකරණ ලෙස දක්වා තිබුණි.තවද, ප්‍රමිතියේ 75 (ඊ) (i) සහ 79 වගන්තිවලට අනුව, ආයෝජන දේපල වලින් ලැබෙන ආදායම හෙළිදරව් කර නොතිබූ අතර, ක්ෂය කිරීමේ ක්‍රමය, ඵලදායී ජීවිත කාලය හෝ ක්ෂය වීමේ අනුපාතය, දළ ධාරණ වටිනාකම සහ කාල පරිච්ඡේදය ආරම්භක හා අවසාන දිනට සමුච්චිත සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නිසි හෙළිදරව්කිරීම් සිදු කර නොතිබුණි.

(xiii) මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ (එස්එල්එෆ්ආර්එස් 09) 5.5 වගන්තියට පටහැනිව, අපේක්ෂිත ණය අලාභය හඳුනා නොගෙන ස්ථාවර අනුපාතයක් මත රු. 30,617,873 ක් මලපවහන ණය ගැනියන් සහ අනෙකුත් ණය ගැනියන් සඳහා අපාහයන වෙන්කිරීම් සිදු කර තිබුණි.

(xiv) අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 38) 12 වැනි වගන්තියට පටහැනිව, මධ්‍යම ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයට අදාලව පසුගිය වර්ෂවලදී ගෘහ භාණ්ඩ සහ සවි කිරීම්, වෙනත් උපකරණ, පිරියත සහ උපකරණ ආදිය ලෙස හඳුනාගෙන තිබූ රු. 9,593,438 ක් හඳුනාගත හැකි අස්පෘශ්‍ය වත්කම්හි නිර්ණායකයන් නිසි පරිදි සැපිරීමකින්

තොරව අස්පෘශ්‍ය වත්කම් ලෙස වර්ෂය තුළදී හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ දෝෂ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 08) නියම කර ඇති පරිදි ඉහත අස්පෘශ්‍ය වත්කම් කාණ්ඩය වෙනස් කිරීමේ බලපෑම පිළිබිඹු කිරීම සඳහා පිරිවැය, සමුච්චිත ක්ෂයවීම් සහ වර්ෂය ආරම්භයේදී රඳවා ගත් අලාභයන්ට අදාලව නිසි ගැලපීම් සිදු කිරීමකින් තොරව එය සමාලෝචිත වර්ෂයේ අස්පෘශ්‍ය වත්කම්වලට එකතු කිරීම් ලෙස දක්වා තිබුණි.

(xv) අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 38) 118 වගන්තියට අනුව, සීමිත ඵලදායී ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් සඳහා භාවිතා කරන ක්‍රමක්ෂය ක්‍රම සහ දළ ධාරණ වටිනාකම සහ කාලච්ඡේදය ආරම්භයේ දී සහ අවසානයේ සමුච්චිත ක්‍රමක්ෂයක් වැනි අදාළ හෙළිදරව් කිරීමේ අවශ්‍යතා මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. තවද, අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය (ශ්‍රී.ලං.ගි.ප්‍ර 38) 104 වැනි වගන්තියේ දක්වා ඇති පරිදි අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකම අස්පෘශ්‍ය වත්කම් සඳහා ක්‍රමක්ෂ කිරීමේ කාලසීමාව සහ ක්‍රමක්ෂ කිරීමේ ක්‍රමය සමාලෝචනය කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(i) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල 3.2.1 වගන්තියට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට තොග ශේෂය භරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමයට තක්සේරු කළ යුතු වේ. කෙසේ වෙතත්, තොග ලැබීම් සහ නිකුත් කිරීම් අතර අසාමාන්‍ය මිල අපගමනයන් හේතුවෙන් කළමනාකරණ තොරතුරු පද්ධතියෙන් ලබාගත් තොග ශේෂය භරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමයට අනුකූල වී නොමැති බව නියැදි විගණන පරීක්ෂණ පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් තොග ශේෂයේ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

(ii) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල 3.2.1 වගන්තියට අනුව, තොග ශේෂ වටිනාකමින් යල් පැන ගිය සහ සෙමින් චලනය වන තොග සඳහා වෙන් කිරීම් සිදු කල යුතු වේ. කෙසේ වෙතත්, ගිණුම් පොත්වලට අනුව සෙමින් චලනය වන තොග සඳහා කිසිදු වෙන් කිරීමක් සිදු කිරීමකින් තොරව යල් පැන ගිය සහ භාවිතයට ගත නොහැකි තොග සඳහා රු. 236,958,510 ක් පමණක් වෙන් කර තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ සඳහා සත්‍ය ආදායම් බදු වියදම හඳුනාගැනීමට විස්තරාත්මක අදායම් බදු ගණනය කිරීමක් සිදු කිරීමකින් තොරව 2019 වර්ෂය තුළ ගෙවන ලද රු.138,860,749 ක ආර්ථික සේවා ගාස්තු (ආ.සේ.ගා) විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ආදායම් බදු වියදම ලෙස වැරදියට හඳුනාගෙන තිබුණි.

(iv) 2016 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 0.5 දක්වා අනුපාත සංශෝධනය කර තිබුණද 2016/2017 තක්සේරු වර්ෂය සඳහා වූ ආර්ථික සේවා ගාස්තුව සියයට 0.25 ක් පදනම් කරගෙන ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් දේශීය දෙපාර්තමේන්තුව විසින් දඩ මුදලක්ද ඇතුළුව රු. මිලියන 128.76 ක තක්සේරු දැන්වීමක් ඉදිරිපත් කර තිබුණි. මණ්ඩලයේ වාර්තා වලට අනුව අනුපාත වෙනස්වීම් හේතුවෙන් රු. මිලියන 66.37 ක මුදලක්(දඩ මුදල් රහිතව) මණ්ඩලය විසින් ගෙවිය යුතු ව ඇත. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගෙවිය යුතු ඉතිරි බදු සඳහා ගිණුම් පොත්වල කිසිදු ප්‍රතිපාදනක් සිදු කර නොතිබුණි.

(v) කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ ජල සම්පාදන යෝජනා ක්‍රම 16 කට අදාළ එකතු වටිනාකම රු.65,852,393 ක් වූ ස්ථාවර වත්කම් භාවිතා කළ නොහැකි මට්ටමේ පවතින අතර දිගු කාලයක් තිස්සේ ස්ථාවර වත්කම් ලෙස පවතින බව 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ඒවා ගිණුම් පොත්වලින් ඉවත් කිරීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.තවද, විගණනය විසින් සිදු කල ගණනය කිරීම් අනුව, වටිනාකම රු.40,605,148 ක් වන ක්ෂය කල හැකි අයිතම 42 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී මෙන්ම ඉකුත් වර්ෂයේදී ද රු.851,398 ක ක්ෂය ප්‍රතිපාදන සිදු කර තිබූ බව විගණනයට අනාවරණය විය.

(vi) රු. 4,900,000 ක් වටිනා සොයිසාපුර සහ කොළොන්නාව මලාපවහන අංශයන්ට අයත් අංක 252-7905,252-8054 සහ PA-2052 දරන වාහන තුනක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගිණුම් පොත්වල ගිණුම්ගත කර නොතිබුණි. තවද, විගණනය විසින් සිදු කරන ලද ගණනය කිරීම්වලට අනුව එම වාහන සඳහා වාර්ෂිකව රු.445,000 ක ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන වෙන්කල යුතුව තිබුණි.

(vii) මණ්ඩලයේ ස්ථාවර වත්කම් ලේඛනවල හෝ ගිණුම් පොත්වල සටහන් කර නොතිබූ ස්ථාවර වත්කම් අයිතම හතරක් සමාලෝචිත වර්ෂය තුළ ඉවත් කර තිබුණි. කෙසේ වෙතත්, මිලදී ගත් දිනය සැලකිල්ලට ගැනීමෙන් පසු ක්ෂයවීම් වෙනුවෙන් නිසි පරිදි පූර්ව වර්ෂය

සඳහා කිසිදු ගැලපීමක් සිදු නොකර, ඉවත් කිරීමෙන් ලද විකුණුම් ආදායම රු. 1,178,000 ක් වර්ෂය සඳහා ලාභය ලෙස හඳුනාගෙන තිබුණි.

(viii) භෞතික සමීක්ෂණ වාර්තා සහ ස්ථාවර වත්කම් ලේඛනයන් අනුව අම්පාර, යාපනය, මඩකලපුව සහ උතුරු මැද ප්‍රාදේශීකයන්හි පිරිවැය මධ්‍යස්ථාන පහකට (05) අදාලව එකතු වටිනාකම රු.24,797,847 ක ස්ථාවර වත්කම් සත්‍යාපනය කර ගත නොහැකි වූ අතර භෞතිකව නොතිබුණි. කෙසේ වෙතත්,ඒවා පොත් වලින් ඉවත් කිරීමට ක්‍රියාමාර්ග නොගෙන සමාලෝචිත වර්ෂය තුලදී ක්ෂය වීම් සඳහා රු.605,749 ක ප්‍රතිපාදන සිදු කර තිබුණි.

(ix) මධ්‍යම උතුර ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය,වව්නියාව,යාපනය,නැගෙනහිර, අම්පාර,අක්කරෛපත්තු සහ මඩකලපුව ප්‍රාදේශිකයන්හි භෞතික සත්‍යාපන වාර්තාවලට අනුව පිරිවැය මධ්‍යස්ථාන විසි දෙකකට අදාල එකතු වටිනාකම රු.52,399,850 ක් වන සින්නක්කර ගොඩනැගිලි, ආකෘතීන්, යටිතල පහසුකම්, පරිගණක සහ අනෙකුත් උපකරණ,මිනුම් උපකරණ, ජංගම උපකරණ ආදිය හානියට පත්ව, භාවිතයෙන් ඉවත් කර හා කඩා දමා තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ඒවා පොත් වලින් ඉවත් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී ක්ෂය වීම් සඳහා රු.1,637,717 ක ප්‍රතිපාදන සිදු කර තිබුණි.

(x) මධ්‍යම උතුරු ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය, මාතලේ, කටුගස්තොට, වවුනියාව සහ යාපනය යන ප්‍රාදේශිකයන්හි ස්ථාවර වත්කම් සමීක්ෂණයේදී පැහැදිලිව හඳුනාගෙන නොතිබූ රු.946,780,882ක ස්ථාවර වත්කම් අයිතම හැට හයක් (66) ස්ථාවර වත්කම් ලේඛනයන්ට හා ගිණුම් පොත් වලට ඇතුළත් කර තිබූ අතර ඒවා සඳහා ක්ෂය ප්‍රතිපාදන ලෙස රු. 39,211,284 ක් වෙන් කර තිබුණි.

(xi) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට නව සම්බන්ධතා ණයගැතියන් ද ඇතුළුව වෙළෙඳ ණයගැති ශේෂය රු. 7,733,111,838 ක් විය. කෙසේ වෙතත්, වටිනාකම රු.7,662,021,591 ක් වන ණයගැතියන් සඳහා පමණක් අපහනය වෙන්කිරීම් කර තිබුණි. එබැවින් එකතු වටිනාකම රු.71,090,247ක් වන ණයගැතියන් සඳහා ප්‍රතිපාදනය සිදු කර නොතිබුණි. ඊට අමතරව මූල්‍ය ප්‍රකාශනවල වූ ක්‍රියාකාරී නොවන වත්කම්වල ඇතුළත් සහ වසර 5 කට වැඩි කාලයක් ගිණුම් පොත්වල තිබූ රු. 3,743,920 ක අනෙකුත් ණය ගැතියන් සඳහා ප්‍රතිපාදන සිදු කර නොතිබුණි.

(xii) 2021 අප්‍රේල් මස රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් කපා හැරීමට අනුමත කර තිබූ රු. 1,243,209 ක වෙළඳ ණය ගැනියන් සමාලෝචිත වර්ෂයේ ලාභයට අය කිරීම වෙනුවට වර්ෂය ආරම්භයේ රඳවා ගත් අලාභයන්ට පූර්ව වර්ෂ ගැලපීමක් ලෙස ගලපා තිබුණි. එබැවින් වර්ෂය සඳහා ලාභය සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි.

(xiii) ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත්කරුවන්ට එකතු කළ අගය මත බදු වශයෙන් මණ්ඩලය ගෙවූ රු.12,697,619 ක් ඒවා මණ්ඩලයේ නිමැවුම් මත වන එකතු කළ අගය මත බදු වලට එරෙහිව දැනටමත් හිමිකම් ලබා තිබූයෙන් ඒවා ලැබිය යුතු එකතු කළ අගය මත බදු ලෙස ගිණුම් ගත නොකර වැරදි ලෙස කෙරීගෙන යන වැඩ ලෙස හඳුනාගෙන තිබුණි. එබැවින් ඒ සමාන අගයකින් මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ ශේෂය වැඩියෙන් දක්වා තිබූ අතර ලැබිය යුතු එකතු කළ අගය මත බදු අඩුවෙන් දක්වා තිබුණි.

(xiv) ලැබී ඇති තොරතුරු වලට අනුව, රු.මිලියන 70,625.98 ක් වටිනා නිම කර ජනතා අයිතියට පත් කරන ලද ජල සම්පාදන හා පුනරුත්ථාපන ව්‍යාපෘති එකසිය දහ හතරක (114) පිරිවැය ප්‍රාග්ධනිත ගත නොකර 2021 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ තුළ පැවතුණි.

(xv) නැවත අයකර ගැනීමේ වැඩ සඳහා ලද අත්තිකාරම් අතරින් අක්කරෛපත්තු සහ අම්පාර ප්‍රාදේශිකයට, බටහිර මධ්‍යම ප්‍රාදේශීය සභය සේවා මධ්‍යස්ථානයට, බටහිර දකුණ ප්‍රාදේශීය සභය සේවා මධ්‍යස්ථානයට අයත් ව්‍යාපෘති 44 කට අදාල රු.171,985,691 ක් 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිම කර තිබුණි. කෙසේවෙතත්, 2022 අප්‍රේල් 30 වන විටත් ඒවා ප්‍රාග්ධනිතගත කිරීමට හෝ පවතින ශේෂය අදාල ආදායම් ගිණුමට මාරු කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(xvi) 2018, 2019 සහ 2020 වර්ෂවලට අදාළව 2020 සහ 2021 වර්ෂවල මූල්‍ය ප්‍රකාශනයන්හි මණ්ඩලය විසින් පෙර වර්ෂයේ ගැලපුම් සිදු කර ඇති බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2020 වසර අවසානයට වූ සමුච්චිත අලාභය රු. මිලියන 123.22 කින් විකෘති වී තිබුණි. එබැවින්, ඉදිරි වර්ෂය තුළදී සමාලෝචිත වර්ෂයේ ලාභයට ගැලපීම් කිරීමට ඇති හැකියාව විගණනයේදී බැහැර කර නොහැකි විය. සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂවල සිදු කරන ලද එවැනි පූර්ව වර්ෂයේ ගැලපීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

වර්ෂය	හර කල වටිනාකම	බැර කල වටිනාකම	සමුච්ඡිත ලාභය/අලාභයට ශුද්ධ බලපෑම
	රු.	රු.	රු.
2020	128,247,558.00	34,863,912.00	(93,383,646)
2019	29,519,766.00	24,240,710.00	(5,279,056)
2018	37,682,729.00	13,121,667.00	(24,561,062)

(xvii) ව්‍යාපෘති හතක් (07) සම්බන්ධයෙන් කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබූ මුළු ශේෂ වටිනාකම රු.198,729,791 ක් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍ය ගැලපීම් සිදු කිරීම සඳහා විමර්ශනය නොකර වසර දොළහකට වඩා වැඩි කාලයක් නොවෙනස්ව පැවතුණි.

(xviii) සුභසාධන අරමුදලේ රු. 12,506,980 ක් මූල්‍ය ප්‍රකාශ තුල ඇතුලත් මූලික ගාස්තු අයකර ගැනීමේ ආදායම් ප්‍රභවයට එරෙහිව කිසිදු හේතුවක් නොමැතිව ගලපා ඇති බව නිරීක්ෂණය වූ අතර එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි. තවද, 2020 වර්ෂය සඳහා ආයතනික සමාජ වගකීම් අරමුදලට ලද රු. 1,199,700 ක් ද ඒ තුල ඇතුලත් බව නිරීක්ෂණය විය.

(xix) විසල් කුරුණෑගල මලාපවහන පද්ධතිය නඩත්තු කිරීම සඳහා 2021 මාර්තු මාසයේදී කුරුණෑගල නගර සභාව සහ මණ්ඩලය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුමට අනුව නගර සභාවෙන් රු. මිලියන 2.5ක මාසික ආදායමක් ලැබිය යුතු වේ. කෙසේ වෙතත්, 2021 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා මාස පහක් සඳහා වන රු. මිලියන 12.5 ක ආදායම ගිණුම් පොත්වල හඳුනාගෙන නොතිබුණි.

(xx) වෙනත් ණයගැතියෝ, අත්තිකාරම්, වෙළඳ ණයහිමියෝ, ඉල්ලුම් නොකළ වේතන යනාදිය ඇතුලත් දීර්ඝ කාලීනව පැවත එන පිළිවෙලින් රු.149,748,448 ක හා රු.71,927,749 ක වත්කම් හා වගකීම් ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගැනීමකින් තොරව ක්‍රියාකාරී නොවන වත්කම් හා ක්‍රියාකාරී නොවන වගකීම් ලෙස හඳුනාගෙන තිබුණි. තවද, රු.95,796,513 ක හඳුනා නොගත් පූර්ව වර්ෂ ශේෂයක්ද, රු.22,007,307 ක ප්‍රාදේශික හතරක තොග ශේෂය සහ රු.5,906,882 ක බැංකු ශේෂයක් ද විමර්ශනය කොට නිරවුල් කිරීමට පියවර ගැනීමකින් තොරව ඉහත සඳහන් ශේෂය තුල ක්‍රියාකාරී නොවන වත්කම් ලෙස පැවතුණි.

(xxi) මීට වසර හයකට පෙර කැලණිය ප්‍රාදේශිකයේ රු.2,549,788 ක සොරකම් කරන ලද තොග ශේෂය සහ බටහිර මධ්‍යම සහය සේවා මධ්‍යස්ථානයේ (කොහුවල) රු. 1,211,323 ක තොග ඌනතාවය 2021 දෙසැම්බර් 31 දිනටද තොගයට ඇතුළත් කර තිබුණි. කෙසේවෙතත්, එම අලාභයන් අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(xxii) 2020 ජූලි 02 දින ගත් කැබිනට් මණ්ඩල තීරණය ප්‍රකාරව, ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබා ගත් රු.බිලියන 30 ණය මුදල සඳහා පොලී පිරිවැය මහා භාණ්ඩාගාරය විසින් දරා ගනු ලබන අතර පසුගිය වර්ෂය තුලදී එම ණය සඳහා පොලිය වශයෙන් රු.699,702,314ක් මණ්ඩලය විසින් දරා තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන වලද රු.659,277,279 ක් පමණක් භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් වශයෙන් හඳුනාගෙන තිබූ අතර 2022 මාර්තු අවසානය වන විටත් එය භාණ්ඩාගාරයෙන් අය කර ගෙන නොතිබුණි.

(xxiii) දැනට ක්‍රියාත්මක විදේශ අරමුදල් ව්‍යාපෘති හයකට අදාලව පූර්ව වර්ෂය සඳහා පොලී වියදම ලෙස (මණ්ඩලයේ සහ භාණ්ඩාගාරයේ කොටස ඇතුළුව) හඳුනාගත යුතුව තිබූ රු. 821,996,056 ක් වැරදි ලෙස සමාලෝචිත වර්ෂය සඳහා පොළිය ලෙස හඳුනාගෙන තිබුණි. එබැවින් වර්ෂය ආරම්භයේ කෙරීගෙන යන වැඩ වටිනාකම ඒ හා සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(xxiv) දේශීය හා විදේශ මූල්‍යන ව්‍යාපෘති දහහතක (17) උපචිත ණය පොළියට අදාලව බැංකුවලින් ලද තහවුරු කිරීම් සැසඳීමේදී, රු. 318,850,651 ක ඌන ප්‍රතිපාදනයක් සිදුකර තිබූ බව නිරීක්ෂණය විය. එබැවින් සමාලෝචිත වර්ෂයේ ලාභය සහ වර්ෂය අවසානයට උපචිත පොළිය ඒ හා සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(xxv) බියගම සහ සීතාවක කළමණාකාර කාර්යාලවලට අදාළව, සැප්තැම්බර් මාසය සඳහා රු. 5,013,530 ක මලාපවහන ආදායම සහ අගෝස්තු මාසය සඳහා රු. 8,040,601 ක මලාපවහන ආදායම දෙවරක් ගිණුම්ගත කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා වූ අලාභය අඩුවෙන් දක්වා වර්ෂය අවසානයට මලාපවහන ණයගැතියන් රු.13,054,131 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(xxvi) විගණනය මගින් කරන ලද ගණනය කිරීම්වලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ආයෝජන මත ලැබිය යුතු පොලී ශේෂය රු. 1,500,542 කින් වැඩියෙන් දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වර්ෂය ආරම්භයේදී රඳවා ගත් අලාභය සහ සමාලෝචිත වර්ෂය සඳහා වූ අලාභය පිළිවෙලින් රු.1,476,322 කින් සහ රු. 24,220 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(xxvii) අංක 85304025 දරන ස්ථාවර තැන්පතුව සම්බන්ධයෙන් 2020 වර්ෂයට අදාල (28/12/2020 සිට 31/12/2020 දක්වා) රු.302,055 ක පොළිය, ලැබිය යුතු පොළියේ ආරම්භක ශේෂයෙන් අයකර ගැනීම වෙනුවට වර්ෂයේ පොලී ආදායම ලෙස හඳුනාගෙන තිබුණි. තවද, අංක 85304053 දරන ස්ථාවර තැන්පතුවට ආරම්භක ලැබිය යුතු පොලියෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 86,302 ක් අඩුවෙන් අයකරගෙන තිබුණි.

(xxviii) අංක 83641912 දරන ස්ථාවර තැන්පතුවට අදාලව 2021 සැප්තැම්බර් 30 සිට 2021 දෙසැම්බර් 30 දක්වා කාලය වෙනුවෙන් රු. 4,986,301 ක පොලියක් සමාලෝචිත වර්ෂය තුළ පොලී ආදායම ලෙස හඳුනාගෙන නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ ලාභය ඒ හා සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(xxix) මහ කොළඹ ජල සහ අපජල වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනට අදාළව දරන ලද රු. 2,816,590 (රු. 80,198 විශේෂ අත්තිකාරම් ඇතුළුව) පොදු වියදම් මණ්ඩලයේ කෙරීගෙන යන වැඩ තුල සහ මුදල් අග්‍රිම ගිණුමේ (00/2/59/ 289/1) දෙවරක් ගිණුම් ගත කොට තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මුදල් අග්‍රිම ගිණුමේ රු.2,816,590 ක අසාමාන්‍ය බැර ශේෂයක් නිරීක්ෂණය විය. ඒ හා සමානව, වර්ෂය අවසානයට කෙරීගෙන යන වැඩ ශේෂය සමාන මුදලකින් (රු. 80,198 විශේෂ අත්තිකාරම් ද ඇතුළුව) වැඩියෙන් දක්වා තිබුණි.

(xxx) වර්ෂය තුළ හඳුනාගත් අස්පෘශ්‍ය වත්කම් සඳහා මුල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම් සඳහා ක්‍රමක්ෂය ලෙස රු.206,361 ක මුදලක් වෙන් කොට තිබුණි. කෙසේ වෙතත්, විගණනයේ ගණනය කිරීම් අනුව රු. 342,622 ක් ක්‍රමක්ෂය ලෙස හඳුනා ගත යුතුව තිබුණි. එබැවින් රු.136,261 කින් ක්‍රමක්ෂය වියදම් අඩුවෙන් දක්වා තිබූ අතර මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අස්පෘශ්‍ය වත්කම්වල ධාරණ වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

(xxxi) ප්‍රාදේශික හතළිහක රු.131,828,414 ක් වූ වෙන්දේසි කල යුතු තොග අයිතමයන් අපහරණය කිරීමට පියවර නොගෙන, එය මූල්‍ය ප්‍රකාශනවල තොග ලෙස ද හඳුනාගෙන තිබුණි.

(xxxii) 2000 වර්ෂයට පෙර මිලදී ගෙන බටහිර නිෂ්පාදන ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථාන ගබඩාවේ තිබූ රු. 2,000,000 ක පිරිවැයකින් යුතු නල කපන යන්ත්‍රයක් ප්‍රාග්ධනිත කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් තොග අයිතමයක් ලෙස හඳුනාගෙන තිබුණි.

(xxxiii) කළුතර ප්‍රදේශිකයේ වර්ෂය තුළ අපහරණය කරන ලද රු. 3,197,000 ක් වටිනා ජල බවුසරයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගිණුම් පොත්වලින් ඉවත් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ ක්ෂයවීම් වශයෙන් රු. 159,850 ක ප්‍රතිපාදනයක් පොත්වල සිදුකර තිබුණි.

(xxxiv) බස්නාහිර දකුණ ප්‍රාදේශීය සභය සේවා මධ්‍යස්ථානය යටතේ වන වස්කඩුව ගබඩාවට 2018 නොවැම්බර් මාසය තුළ මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලද තොග අයිතමයන්හි වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගිණුම් පොත්වල සටහන් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. කෙසේ වෙතත් තොරතුරු නොමැති වීම හේතුවෙන් එම මගහැරීමෙන් මූල්‍ය ප්‍රකාශනවලට ඇති වූ බලපෑම විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

(xxxv) සමාලෝචිත වර්ෂය අවසානයට තොග ගැලපුම් ගිණුමේ වූ රු.155,974,054 ක ශේෂය නිරවුල් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනයන්හි තොග ලෙස සලකා තිබුණි.කෙසේ වෙතත්, නියැදි විගණන පරීක්ෂාවට අනුව මාතලේ, කොහුවල, යාපනය කිලිනොච්චි ගබඩාවන්හි, බණ්ඩාරගම වැඩභාර නිලධාරී කාර්යාලයේ සහ වාරියපොළ භූගත ජල අංශයේ රු.2,086,329ක හඳුනාගත් තොග ඌනතාවයක් විධිමත් විමර්ශනයකින් පසු ගිණුම් පොත්වලින් ඉවත් කිරීමට පියවර නොගෙන ඊට ඇතුළත් කර තිබූ බව නිරීක්ෂණය විය.තවද, මාතලේ ප්‍රාදේශීය කාර්යාලයට අදාළ රු. 81,407,868 ක තොග ගැලපුම් ශේෂයෙන් රු. 41,739,680 ක විචලනය පෙර වර්ෂවල තොග ගනුදෙනු වාර්තා නොකිරීම හේතුවෙන් වූ බවට හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒවා නිරවුල් කිරීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු නොකොට එය මූල්‍ය ප්‍රකාශනවල තොග ලෙස හඳුනාගෙන තිබුණි.

(xxxvi) "සැමට ජලය" ව්‍යාපෘතිය සඳහා ආනයනය කරන ලද තොග සඳහා සමාලෝචිත වර්ෂය තුළදී අදාළ කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 23,805,258 ක මුදලක් ප්‍රමාද ගාස්තු වශයෙන් දරා තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානයේ ඒ සඳහා ගිණුම් පොත්වල වෙන් කිරීම් සිදු කොට නොතිබුණි.

(xxxvii) විගණනයට සපයා ඇති තොරතුරුවලට අනුව, කිරම කටුවන ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගැනීමට යෝජිත හම්බන්තොට ප්‍රදේශයේ පිහිටි ඉඩම් 2013 සහ 2014 වර්ෂයන් තුළ මණ්ඩලය විසින් නීත්‍යානුකූලව අත්පත් කර ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

කෙසේ වෙතත්, එම ඉඩම් සඳහා ගෙවා තිබූ රු. 6,626,000 ක අත්තිකාරම් මුදල, ඉඩම් අත්තිකාරම්වල මෙන්ම මණ්ඩලයේ ස්ථාවර වත්කම්වලද ගිණුම්ගත කර තිබුණි.

(xxxviii) 2014,2017 සහ 2020 වර්ෂවල මිල දී ගත් රු. 1,234,790 ක් වටිනා තොග රත්නපුර ප්‍රාදේශිකයේ තොග කළමනාකරණ පද්ධතියට සහ ගිණුම් පොත් වලට ගෙන නොමැති බව අභ්‍යූ විගණන පරීක්ෂණයට අනුව නිරීක්ෂණය විය. එබැවින් වසර අවසානයේ තොගයේ වටිනාකම ඒ සමාන ප්‍රමාණයකින් අවතක්සේරු වී තිබුණි.

(xxxix) මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (ව්‍යාපෘති 01) කොන්ත්‍රාත් අත්තිකාරම් වලට අදාලව මාස තුනක කාලය සඳහා ගොඩනැගිලි කුලිය රු. 900,000 වැඩියෙන් ගලපා ඇති බවත් රු. 3,029,984 ක විනිමය ලාභය දෙවරක් ගිණුම්ගත කර ඇති බවත් නිරීක්ෂණය විය. එබැවින් වර්ෂය අවසානයට කොන්ත්‍රාත් අත්තිකාරම් සහ කෙරීගෙන යන වැඩ ශේෂය පිළිවෙලින් රු. 2,129,984 කින් සහ රු. 900,000 කින් වැඩියෙන් දක්වා තිබූ අතර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනයන්හි වර්ෂය සඳහා අලාභය රු. 3,029,984 කින් අඩුවෙන් දක්වා තිබුණි. ඊට අමතරව නුවර නගර අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු විසින් වර්ෂයේ තුන්වන කාර්තුවේදී ඉදිරිපත් කරන ලද අන්තර්කාලීන බිල්පත්වලින් අයකරගෙන තිබූ රු.32,933,980ක අත්තිකාරම මණ්ඩලයේ ගිණුම් පොත්වල දෙවරක් ගිණුම්ගත කර තිබුණි. එබැවින් ඒ සමාන වටිනාකමකින් කොන්ත්‍රාත් අත්තිකාරම් ශේෂය අඩුවෙන් දක්වා තිබූ කෙරීගෙන යන වැඩ ශේෂය වැඩියෙන් දක්වා තිබුණි.

(xl) නුවර නගර අපජල කළමනාකරණ ව්‍යාපෘතියට අදාලව කොන්ත්‍රාත්කරු වර්ෂයේ තුන්වන කාර්තුව සඳහා ඉදිරිපත් කරන ලද බිල්පත් වලින් මණ්ඩලය විසින් සිදු කල රඳවා ගැනීම් රු.52,336,400 ක් දෙවරක් ගිණුම්ගත කර තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය අවසානයේ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රඳවා ගැනීම් සහ කෙරීගෙන යන වැඩ ශේෂය ඒ හා සමාන මුදලකින් වැඩියෙන් දක්වා තිබුණි.

1.2.3 නොසැසඳූ ශේෂ

(i) මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ශේෂයන් හා මණ්ඩලයේ වාණිජ අංශය විසින් ඉදිරිපත් කරන ලද වයස් විශ්ලේෂණ උපලේඛනයේ සඳහන් ශේෂයන් අතර වෙළඳ ණයගැතියන්ගේ රු. 56,043,212 ක සහ නව සම්බන්ධතා ණයගැතියන්ගේ රු.127,184,503 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ii) මනුගත විකුණුම්, තොග විකුණුම් සහ බවුසර් සැපයුම් වටිනාකමෙහි වාණිජ අංශ වාර්තා සහ මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබූ වටිනාකම් අතර රු. මිලියන 3,939.7 ක සැසඳුම් නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

(iii)මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අදාළ ඒ ඒ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන සමඟ සන්සන්දනය කිරීමේදී වියළි කලාපීය නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් ව්‍යාපෘතියේ, යාපනය කිලිනොච්චි ජල සැපයුම් හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ සහ කළුගඟ ජල සැපයුම වැඩිදියුණු ව්‍යාපෘතියේ විදේශ ප්‍රදානයන්හි එකතු වටිනාකම රු.මිලියන 12,316.62 ක වෙනසක් නිරීක්ෂණය විය.

(iv)සිදු කරන ලද නියැදි පරීක්ෂණයට අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති කෙරීගෙන යන වැඩ ශේෂය සහ විදේශ මූල්‍යන ව්‍යාපෘති හයක (06) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අනුරූප ශේෂයන් අතර එකතු වටිනාකම රු. මිලියන 10,633.08 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (ව්‍යාපෘතිය i, ii සහ iii)- ඒඩීබී සහ මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන- ඒෆ්ඩී සඳහා සකස් කරන ලද සැසඳුම් විශ්ලේෂණය කිරීමේදී ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා වර්ෂයේදී වෙන් කරන ලද සහ ගෙවන ලද රු.මිලියන 15.48 ක පාරිතෝෂික මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් වී නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(v) සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයට අනුව බැංකු ගිණුම් පහක් (05) ක් සම්බන්ධයෙන් බැංකු සැසඳුම් ප්‍රකාශවල 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ පිළිවෙලින් රු.6,292,288 ක සහ රු.361,841 ක හඳුනානොගත් හර ශේෂයන් සහ බැර ශේෂයන් නිරවුල් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(vi)රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2015 ජූලි 08 දිනැති ඔහුගේ පීඊ/ඩබ්එස්/එන්ඩබ්එස්ඩීබී/ජීඊඑන්/2015 ලිපිය මඟින් ලබා දුන් උපදෙස් මත සහ 2016 පෙබරවාරි 04 දින ගත් කැබිනට් තීරණය ප්‍රකාරව, හිඟ ණය ශේෂය රු. 100,263,323,220 ක් 2015 වසරේ සිට බලපැවැත්වෙන පරිදි වර්ෂය අවසානය දක්වා රජයේ ස්කන්ධ ගිණුමට මාරු කර තිබුණි. කෙසේ වෙතත්, මහා භාණ්ඩාගාරයේ වාර්තා වලට අනුව රු.75,388,884,922 ට සමාන මුදලක් මණ්ඩලයට දුන් ප්‍රාග්ධන දායකත්වය ලෙස හඳුනාගෙන තිබුණි. එබැවින් විදේශීය ණය වශයෙන් මණ්ඩලය විසින් ගෙවිය යුතු රු. 24,874,438,298 ට සමාන මුදලක්

කිසිදු අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානයට රජයේ ස්කන්ධ ගිණුමට මාරු කර තිබූ බව නිරීක්ෂණය විය.

(vii) අනුරාධපුර ජල සම්පාදන ව්‍යාපෘතියට (අදියර 1) අදාළව මුදල් අග්‍රිම ගිණුමේ පැවති රු.7,351,693 ක හඳුනා නොගත් බැර ශේෂයක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

1.2.4 විගණනයට සාක්ෂි නොවීම්

පහත දක්වා ඇති එක් එක් අයිතමයන් සඳහා වන සාක්ෂීන් විගණනය වෙත ඉදිරිපත් නොවීය.

	අයිතමය	වටිනාකම රු.	නොසැපයූ විගණන සාක්ෂි
	---	---	---
(අ)	වෙනත් ණයගැතියන්	102,867,223	විස්තරාත්මක උපලේඛන
(ආ)	වෙනත් ණය හිමියන්	342,938,996	විස්තරාත්මක උපලේඛන
(ඇ)	චලනය නොවන හා සෙමින් චලනය වන තොග	1,315,539,477	වයස් විශ්ලේෂණය
(ඈ)	බදු වියදම	138,860,749	වර්ෂය සඳහා විස්තරාත්මක ආදායම් බදු ගණනය කිරීම්
(ඉ)	වෙනත් ආයතනවල තබා ඇති කෙටිකාලීන තැන්පත්	12,779,730	විස්තරාත්මක උපලේඛන
(ඊ)	නිවාස ණය සඳහා එච්ඩීඑෆ්සී ආයෝජන	434,368	බැංකු සනාථ කිරීම්
(උ)	දේශීය බැංකු ණය	26,254,511	බැංකු සනාථ කිරීම්
(ඌ)	රඳවා ගැනීම් බදු	111,540,855	විස්තරාත්මක උපලේඛන සහ සහතික

(එ)	ආරක්ෂිත තැන්පතු (රජයේ නිල නිවාස)	2,354,032	විස්තරාත්මක උපලේඛන (සේවකයින් අනුව)
(ඒ)	කොන්ත්‍රාත් අත්තිකාරම්	5,772,482	විස්තරාත්මක උපලේඛන
(ඔ)	පුනුරුත්ථාපන බදු	1,757,515	විස්තරාත්මක බදු ගණනය, උපලේඛන
(ඕ)	රජයේ දෙපාර්තමේන්තු වෙතින් පවරා ගත් වත්කම්	185,480,387	පවරා ගත් විස්තරාත්මක වත්කම් වාර්තාව
(ක)	භාණ්ඩාගාර ප්‍රදාන	98,979,261,620	ප්‍රදානයන්ට සම්බන්ධ ව්‍යාපෘති සමග විස්තරාත්මක උපලේඛන
(ග)	ප්‍රාග්ධන ප්‍රදාන- පළාත් පාලන ආයතන	854,660,910	ප්‍රදානයන්ට සම්බන්ධ ව්‍යාපෘති සමග විස්තරාත්මක උපලේඛන
(ව)	විදේශීය ප්‍රාග්ධන ප්‍රදාන	7,347,045,563	ප්‍රදානයන්ට සම්බන්ධ ව්‍යාපෘති සමග විස්තරාත්මක උපලේඛන
(ජ)	අඩුකල ණය හිමියෝ	2,321,570	විස්තරාත්මක උපලේඛන
(ට)	ක්‍රියාකාරී නොවන වගකීම්		
	(i) වෙළඳ ණය හිමියන්	4,131,522	විස්තරාත්මක උපලේඛන
	(ii) හිමිකම් නොපැ වැටුප් සහ වැටුප් ලේඛන නිෂ්කාශනය	20,639,944	විස්තරාත්මක උපලේඛන
(ඩ)	ක්‍රියාකාරී නොවන වත්කම්		
	(i) වෙනත් ණය හිමියෝ	3,743,920	විස්තරාත්මක උපලේඛන
	(ii) අත්තිකාරම්	15,274,131	විස්තරාත්මක උපලේඛන

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු (කෙටුම්පත් වාර්ෂික වාර්තාව) පිළිබඳව මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයට අනුව පහත හෙළිදරව් කිරීම් සිදු කර නොමැති බව මම නිරීක්ෂණය කළෙමි.

(අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳ විස්තර

(ආ) මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂවරයකු සහභාගි වූ මණ්ඩල රැස්වීම් සහ අනු කමිටු රැස්වීම් සංඛ්‍යාව/ප්‍රතිශතය

(ඇ) ආයතනික පාලන වාර්තාව

(ඈ) අවදානම් කමිටු වාර්තාව යනාදිය

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා මණ්ඩලය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මගේ නිගමන පදනම් වී ඇත්තේ මගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව 1.2.1(අ), 1.2.1(ආ), 1.2.1(ඇ), 1.2.1(ඈ), 1.2.1(ඉ), 1.2.1(එ), 1.2.1(ඔ), 1.2.1(ඕ) 1.2.2(අ), 1.2.2(ආ), 1.2.2(ඇ), 1.2.2(ඉ), 1.2.2(උ), 1.2.2(එ), 1.2.2(ඒ) , 1.2.2(ඔ), 1.2.2(ඕ), 1.2.2(ක), 1.2.2(ව) , 1.2.2(ජ), 1.2.2(ඩ),1.2.3(අ), 1.2.3(ආ), 1.2.3(ඇ), 1.2.3(ඈ), 1.2.3(ඉ), වගන්තීන් හැර ඉකුත් වර්ෂයේ අවසන් වාර්තාවේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය එළඹ ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ වක්‍රාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත අවස්ථාවලදී හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට මණ්ඩලය අනුකූල වී නොතිබූ බව.

	නීති/මගපෙන්වීම් ආදියට යොමුව	**විස්තරය**
	---	---
(අ)	**සාමාන්‍යාධිකාරී වක්‍රලේඛ හා**	

මාර්ගෝපදේශයන්		
(i)	2015 අගෝස්තු 12 දිනැති පාලන/ 12/2015	විසන්ධි කිරීමෙන් මාස 3 ක් ඇතුලත හිඟ හිටි ණය ගැනි ශේෂ අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගත යුතු වේ. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු.මිලියන 431.5 ක් වන රු.50,000 වඩා වැඩි බිල්පත් වටිනාකමක් සහිත විසන්ධි කරන ලද පාරිභෝගිකයින් 3,846 ක් සම්බන්ධයෙන් හිඟ ණයගැනි ශේෂය අයකර ගැනීමට නීතිමය පියවර ගෙන නොතිබුණි. තවද, රත්නපුර දිස්ත්‍රික්කයේ රු. 439,371 ක හිඟ බිල්පත් වටිනාකමක් ඇති රජයේ නිල නිවාස 12 ක් සඳහා ජල සැපයුම විසන්ධි කර වසර 3 සිට 11 ක් ගතවී ඇතත් නැවත සම්බන්ධතාවය ලබාගෙන නොතිබුණද ජල සැපයුම ප්‍රධාන නලයෙන් විසන්ධි කිරීමට කටයුතු කර නොතිබුණි.
(ii)	2018 සැප්තැම්බර් 26 දිනැති පාලන/ 09/2018 චක්‍රලේඛය සහ මණ්ඩලයේ නිල නිවාස කාර්ය සංග්‍රහයේ 8.1.1 සහ 8.2.2 වැනි ඡේදය	වෙළඳපල කුලියට සමාන මාසික කුලියක් සහ වැටුපෙන් සියයට 12.5 ක අධිභාරයක් වසර 5 කට වඩා වැඩි කාලයක් නිල නිවාසයන්හි පදිංචි සේවකයින්ගෙන් අය කල යුතු වේ. කෙසේවෙතත්, නියැදි විගණන පරීක්ෂාවට අනුව ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථාන හයක සහ ප්‍රධාන කාර්යාලයේ සේවකයින් හැට හය (66) දෙනෙකු වසර 5 කට වඩා වැඩි කාලයක් නිවාසයන්හි පදිංචිවී සිටියද, වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ රු.29,996,237 ක දඩකුලිය (වෙළෙඳපොල කුලිය හැර), 2022 පෙබරවාරි අවසානය වන විටත් අය කර ගෙන නොතිබුණි.
(iii)	මණ්ඩලයේ නිල නිවාස කාර්ය සංග්‍රහයේ 11.2 වැනි ඡේදය	සේවා ස්ථානයේ සිට නිල නිවාස දක්වා කිලෝමීටර් 25 කට අඩු දුරකින් ස්ථිර ලිපිනයන් පිහිටි බටහිර නිෂ්පාදන ප්‍රාදේශීය සහය සේවා

		මධ්‍යස්ථානයේ සේවකයින් හය දෙනෙකු සඳහා නිල නිවාස හයක් වෙන් කර තිබුණි. තවද, සේවා ස්ථානයේ සිට නිල නිවාස දක්වා කිලෝමීටර් 25 කට අඩු දුරකින් ස්ථිර ලිපිනයන් පිහිටි සේවකයන් හය දෙනෙකුට 2019 පෙබරවාරි සිට 2021 නොවැම්බර් දක්වා රු. 2,997,000 ට සමාන මුදලක් අඔතලේ බලශක්ති ඉතුරුම් කිරීමේ ව්‍යාපෘතියේ අරමුදල්වලින් ගෙවා තිබුණි.
(iv)	2020 සැප්තැම්බර් 02 දිනැති පාලන/ 16/2020 හි 2.1 සහ 2.3 ඡේද	බටහිර නිෂ්පාදන ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයට අනුයුක්ත නිලධාරීන් දහහත් දෙනෙකු (17), අම්පාර ප්‍රාදේශිකයට අනුයුක්ත නිලධාරීන් දෙසිය තුන් දෙනෙකු (203) සහ අක්කරෛපත්තු ප්‍රාදේශිකයට අනුයුක්ත නිලධාරීන් එකසිය තිස් අටදෙනෙකු දෙනෙකු (138) පිළිවෙලින් වසර 06 සිට 27 දක්වාත්, වසර 05 සිට 38 දක්වා සහ වසර 05 සිට 16 දක්වා වූ කාල පරාසයක් එම සේවා ස්ථානයේම සේවය කරනු ලබයි.
(v)	මණ්ඩලයේ නිල නිවාස කාර්ය සංග්‍රහයේ 12.2 වැනි ඡේදය සහ 2015 නොවැම්බර් 30 දිනැති අංක පා18/2015 දරන මණ්ඩල චක්‍රලේඛයේ 3 ඡේදය	ජල බිල්පත් හිඟ සේවකයින්ගෙන් වැටුපෙන් සියයට 10 ක අධිභාරයක් සහිත මාසික බිල්පත් වටිනාකම අය කළ යුතු වේ. කෙසේ වෙතත්, හිඟ ජල බිල්පත් වටිනාකම මාස තුනක කාල සීමාවක් පුරා රු.1,000 ඉක්මවූ ජල සම්බන්ධන 201 කින් එකතු වටිනාකම රු.1,710,387 ක් වන හිඟ ජල බිල්පත් ගාස්තුව අධිභාරය සමග අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, බටහිර නිෂ්පාදන ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ නිලධාරීන් 9 දෙනෙකුගෙන් පදිංචි දිනයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ජල පරිභෝජනය සඳහා කිසිදු ගාස්තුවක් අය කර නොතිබූ අතර එම නිසා මණ්ඩලයට දළ වශයෙන් රු. 255,600 ක පාඩුවක්

		දැරීමට සිදු ව තිබුණි.
(ආ)	2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ, රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 3.2(i) වගන්තිය	මණ්ඩලයේ බඳවා ගැනීම් හා උසස්කිරීම් පටිපාටිය සඳහා 2022 මාර්තු අවසානය වන විටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ඇ)	2020 ජනවාරි 27 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය	
	(i) 1.2 ඡේදය	සමාලෝචිත වර්ෂයේ දී සභාපතිවරයා සඳහා වාහන දෙකක් වෙන් කර තිබුණි.
	(ii) 1.4 ඡේදය	සමාලෝචිත වර්ෂයේ දී උප සභාපතිවරයා සඳහා වාහන දෙකක් වෙන් කර තිබුණි.
(ඈ)	2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 4.3 වගන්තිය	මණ්ඩලයේ ක්‍රියාකාරිත්වයට බලපෑම් ඇති කළ හැකි අවදානම් තක්සේරු කිරීමට, මූල්‍ය හා මූල්‍ය නොවන එවැනි අවදානම් වල බලපෑම ගණනය කිරීමට අවදානම් කමිටුවක් 2022 මාර්තු අවසානය වන විටත් පත් කර නොතිබුණි.
(ඉ)	2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයෙහි 2.3.2 වගන්තිය	මාතර අදියර (iv) ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා 2021 සැප්තැම්බර් මාසයේ සිට 2022 මාර්තු 31 දක්වා පවා පූර්ණ කාලීන ව්‍යාපෘති අධ්‍යක්ෂවරයකු පත් කර නොතිබුණි.
(ඊ)	2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 3.5 වගන්තිය	2021 දෙසැම්බර් 31 වන විට රේඛීය අමාත්‍යාංශයට මුදා හරින ලද සේවකයින් විසිඑක් (21) දෙනෙකුගේ වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන 28.73 ක් සමාලෝචිත වර්ෂය තුළ දී

		මණ්ඩලය විසින් ගෙවා තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් සිට 2021 දෙසැම්බර් 31 දක්වා මණ්ඩලයෙන් නිදහස් කරන ලද සේවකයින් සඳහා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් රු. මිලියන 216.12 ක් ප්‍රතිපූරණය කළ යුතු වේ.
(උ)	2002 අංක 14 දරන සංශෝධිත එකතු කල අගය මත බදු පනත	
	(i) 22 (i) ඡේදය	2021 ජනවාරි මාසය සඳහා රු. 26,123,533 ක මලාපවහන ආදායමට (සැපයුමේ වටිනාකම) අදාළ රු.2,081,107 ක එකතු කළ අගය මත බද්ද ජනවාරි මාසයේදී ගිණුම්ගත කර නොතිබූ අතර එබැවින් 2021 පෙබරවාරි මාසය අවසන් වීමට පෙර ගෙවා නොතිබුණි.
	(ii) 21(i) ඡේදය	2021 වර්ෂයේ මුළු කාර්තු හතර සඳහාම වන එකතු කල අගය මත බදු වාර්තා මාස තුනේ සිට මාස හතර දක්වා ප්‍රමාදයකින් යුතුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබුණි.
(ඌ)	2019 ජූලි 09 දිනැති අංක සීජීඅයිආර්/2019/3වී(අයිඑන්එස් ඇන්ඩ් සීඅයිආර්) දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 1.4 ඡේදය	සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයට අනුව, වැට් බදු අක්‍රීය සැපයුම්කරුවන් පහළොස් (15) දෙනෙකුට සමාලෝචිත වර්ෂයේ අවස්ථා පනස් දෙකකදී රු. 2,465,952 ක එකතු කළ අගය මත බදු මුදලක් ගෙවා තිබුණි.
(එ)	2002 අංක 14 දරණ එකතු කළ බදු පනතේ 2 ඒ වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද 2019 නොවැම්බර් 29 දිනැති අංක 2151/52 දරන අති විශේෂ ගැසට් නිවේදන ප්‍රකාශය	ප්‍රදේශික 08 ක ගෘහස්ථ, රජයේ නිල නිවාස, වාණිජ ආයතන සහ රාජ්‍ය ආයතනවල මනුගත විකුණුම් මත 2021 ජනවාරි මාසය තුළ සියයට 8 ක් වෙනුවට අඩු ප්‍රතිශතයක් අය කර ගෙන තිබුණි. එබැවින් වැට් බද්දෙහි ව්‍යවස්ථාපිත ප්‍රතිශතයට වඩා රු.2,088,094 අඩු මුදලක් මණ්ඩලය විසින් ප්‍රකාශ කර ගෙවා තිබුණි. තවද, 2021 වසරේ මුල්

		කාර්තු දෙක සඳහා ගම්පහ, කොළඹ සහ අම්පාර ප්‍රාදේශිකයන්ට අදාළව මනුගත විකුණුම් මත වන රු.10,268,679 ක එකතු කළ අගය මත බදු මුදලක් 2021 ජූලි 31 අවසන් වන විටත් මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කර ගෙවා නොතිබුණි.
(ඒ)	මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2017 ජුනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 හි 06 වැනි වගන්තිය	2016 වර්ෂයෙන් පසුව වාහන හැර ස්ථාවර වත්කම් එකතු කිරීම් සහ අපහරණයන් 2022 මාර්තු 30 දින වන විටත් කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර නොතිබුණි.
(ඔ)	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
	(i)XIX පරිච්ඡේදයේ 5 වන වගන්තිය	සිදු කල නියැදි විගණන පරීක්ෂාවට අනුව ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථාන හයකට සහ ප්‍රධාන කාර්යාලයට අදාලව රු.85 සිට රු.4000 පමණක් දක්වා වූ පරාසයක මාසික කුලියක් අයකරන බවත් සේවකයින් 20 දෙනෙකුගෙන් කිසිදු කුලියක් අය නොකරන බවත් නිරීක්ෂණය විය.
	(ii)VII පරිච්ඡේදයේ 1.8,4.6 සහ 7.4 වන වගන්තිය	සේවය හැර ගිය (තනතුරෙන් ඉවත් වූ), ඉල්ලා අස් වූ සහ සේවයෙන් පහ කළ සේවකයින් දාහතක් (17) සම්බන්ධයෙන් පිළිවෙලින් රු.328,276 ක්, රු.442,815 ක් සහ රු.197,426 කින් සමන්විත එකතු වටිනාකම රු.968,517 ක් ඔවුන් සිය පුද්ගල පඩිනඩි සඳහා හිමිකමක් නොලැබුවද, වසර තුනකට වැඩි කාලපරිච්ඡේදයක් පුරා ගිණුම්වල වෙන්කොට තිබුණි.
(ඕ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 113	මැදිරිගිරිය ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාළව ගෘහස්ථ පාරිභෝගිකයන්ගෙන්, කොළඹ නගර

	වන ඡේදය	සභාව, කොළඹ නගරය දකුණ, කොළඹ නගරය උතුර (මට්ටක්කුලිය), කළමනාකරු කෝට්ටේ (බත්තරමුල්ල), දෙහිවල කළමනාකාර කාර්යාලය, පානදුර (හොරණ) කළමනාකාර කාර්යාලය, අමාත්‍ය නිල නිවාසයන්ගෙන් ලැබිය යුතු රු.75,868,821 ක හිඟ ජල බිල්පත් ශේෂයක් සමාලෝචිත වර්ෂය තුළදී භාණ්ඩාගාර අනුමැතියක් ලබා නොගෙන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත පදනම්ව පමණක් කපා හැර තිබුණි.
(ක)	2017 පෙබරවාරි 27 දිනැති අංක 17/0453/714/008 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට 2017 මාර්තු 13 දිනැති අංක සීඑෆ්17/0453/714/006 දරන ලිපියේ වූ මුදල් අමාත්‍යවරයාගේ 03 වන නිරීක්ෂණය	අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ව්‍යාපෘතිය සඳහා ලංකා බැංකුවෙන් ලබාගත් ණය සඳහා අදාල වන 492,381,118 ක පොලී ගෙවීමට අදාළව ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ලබාගත් ණය සඳහා පොලි මූල්‍යයනය කිරීමට භාණ්ඩාගාරයෙන් ලැබුණු අරමුදල්වලින් රු. 29,912,098 ක් වැය කර තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ අවශ්‍යතාවන්ට අනුව ර මණ්ඩලය විසින් එහි බලතල, කාර්යයන් හා රාජකාරී වලට අනුව කටයුතු කර නොතිබූ බව සඳහන් කිරීමට

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ අවශ්‍යතාවන්ට අනුව පහත අවස්ථාවලදී හැර මණ්ඩලයේ සම්පත් අදාළ කාල රාමුව ඇතුළත හා අදාළ වන නීතිවලට අනුකූලව අර්ථිකමය වශයෙන්, කාර්යක්ෂම හා සඵලදායී ලෙස ප්‍රසම්පාදනය හා උපයෝජනය කර නොතිබූ බව සඳහන් කිරීමට

(i) අම්පාර, මොණරාගල සහ මඩකලපුව ප්‍රදේශ සඳහා ජල සැපයුම ලබා දීමට අම්පාර ජල සම්පාදන ව්‍යාපෘතිය (අදියර III) රු. මිලියන 20,825 ක ඇස්තමේන්තුගත වියදමකින් 2010 නොවැම්බර් මස ආරම්භ කර 2015 දෙසැම්බර් මස අවසන් කිරීමට නියමිතව තිබුණි. ව්‍යාපෘතියේ සංරචක (ii) යටතේ උස් ජල ටැංකි හයක් ඉදිකිරීමට සැලසුම් කර තිබූ අතර 2014 අගෝස්තු සහ 2015 මාර්තු හිදී අවසන් කිරීමේ අපේක්ෂාවෙන් 2013 ජනවාරි සහ

මාර්තුහිදී කොන්ත්‍රාත් ප්‍රදානය කොට තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් එය 2020 අගෝස්තු 24 වැනි දින අවසන් කරන ලදී. ඒ අනුව රු.30,351,710 ක් වැය කරමින් අර්ධ වශයෙන් ඉදිකරන ලද ජල කුළුණු හයක් සහ රු.15,790,210 ක වටිනාකමකින් යුත් ඩීඅයි පයිප්ප සහ උපාංග 2022 පෙබරවාරි මාසය අවසන් වන විටත් නිෂ්කාර්යයව පැවතුනි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ඉතිරි වැඩ නිම කිරීමට නව කොන්ත්‍රාත්තු පිරිනමා නොතිබුණි. එබැවින් නියමිත කාලයේදී ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට නොහැකිව පැවතුනි.

(ii) රු.33,148,739 ක වියදමින් ඉදිකරන ලද දමන ජල සම්පාදන යෝජනා ක්‍රමයේ, ඉරක්කාමන් ජල සම්පාදන යෝජනා ක්‍රමයේ, සාගම්ම ජල සම්පාදන යෝජනා ක්‍රමයේ සහ මන්දන ජල සම්පාදන යෝජනා ක්‍රමයේ නිල නිවාස දහතුනක් (13) සමාලෝචිත වර්ෂය අවසානය වන විට නිෂ්කාර්යයව පැවතුණි.

(iii) රත්නපුර රෝහලේ ජල පවිත්‍රාගාරය ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා අවශ්‍ය අරමුදල් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2015 සහ 2016 වර්ෂයන්හිදී ලබා දී තිබුණද, එය වසර 3ක ප්‍රමාදයකින් පසුව 2018 ඔක්තෝම්බර් 17 වැනි දින ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව කොන්ත්‍රාත්තුව 2019 පෙබරවාරි 28 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන්, 2021 නොවැම්බර් අවසානය වන විටත් කොන්ත්‍රාත්තුව අවසන් කර නොතිබුණි. තවද, අත්තිකාරම් බැදුම්කරයේ වලංගු කාලය ඉක්මවන තුරු වැඩ ආරම්භ කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත්ව පැවතුනි.

(iv) ඉඟිනියාගල හා වඩිනාගල ජල සම්පාදන යෝජනා ක්‍රමයට සහ දමන ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාළ පිළිවෙලින් රු.5,585,337 ක් සහ රු. 84,235,632 ක් වටිනා සියලුම ඉදිකිරීම්, බෙදාහැරීමේ මාර්ග පරගහකැලේ ජල සම්පාදන යෝජනා ක්‍රමය සහ හිඟුරාන ජල සම්පාදන යෝජනා ක්‍රමය දක්වා වෙනස් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේදී අක්‍රියව පැවතුණි.

(v) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 වගන්තියට අනුව, ඉඩම් අත්පත් කර ගැනීම අවසන් කර සහ වන්දි, උපයෝගිතා නැවත ස්ථානගත කිරීම ඇතුළුව නැවත පදිංචි කිරීමේ ගැටළු සහ ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනත් කරුණු සම්පූර්ණ කර ඇති බවට සෑහීමකට පත්වීමට මණ්ඩලය අපොහොසත්ව පැවතුනි. කෙසේ වෙතත්, ගම්පහ අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල යෝජනා ක්‍රමය සඳහා නැවත පදිංචි කිරීම් සහ ජල කුළුණු ඉදිකිරීම සඳහා යෝජිත ඉඩම් අත්පත් කර ගැනීම, ලබා දී ඇති 2 වැනි කාල දිගුවේ කාලය ඉකුත් වී ඇතත් සම්පූර්ණ කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(vi) ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා චීන සංවර්ධන බැංකුව විසින් ලබා දුන් ණය සඳහා සහන කාලයෙන් පසුව, සමාලෝචිත වර්ෂය අවසානය වන විට එක්සත් ජනපද ඩොලර් මිලියන 37.5 ක් වන ණය වාරික පහක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, එදිනට චීන සංවර්ධන බැංකුව විසින් ලබා දී ඇති ණය මුදලින් රු.මිලියන 11,828.23 ට සමාන එක්සත් ජනපද ඩොලර් 58,267,381.31 ක මුදලක් හෙවත් ණය මුදලින් සියයට 30 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ව්‍යාපෘති කටයුතු සඳහා උපයෝජනය නොකර එස්ක්‍රෝ ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(vii) කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය, ඉඩම් නිරවුල් කර ගැනීමේ ප්‍රමාදය, පාරිසරික හා නැවත පදිංචි කිරීමේ ගැටළු, කොන්ත්‍රාත් ප්‍රදානයේ ප්‍රමාදය ආදිය හේතුවෙන් විදේශ මූල්‍යන ව්‍යාපෘති දහසයකට සහ දේශීය මූල්‍යන ව්‍යාපෘති හයකට අදාලව අවස්ථා 01 සිට 09 දක්වා පරාසයක කාල දිගුවන් ලබා දීමෙන් පසුවද, දින 184 සිට දින 1778 දක්වා කාල පරාසයක සැලකිය යුතු ප්‍රමාදයක් පවතින බව ද නිරීක්ෂණය විය.

(viii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 6.3.3(ආ) වගන්තියට පටහැනිව, කාර්තිව් වැඩභාර නිලධාරී කාර්යාලය පුළුල් කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළ ලංසු විවෘත කිරීමට දින 48ක කාලයක් ගත කර තිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 7.8.6 වගන්තියට පටහැනිව සාරානුකූල ප්‍රතිචාරාත්මක ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි.

(ix) ඉංජිනේරු ඇස්තමේන්තුවක් සකස් නොකර අක්කරෙයිපත්තු වැඩභාර නිලධාරී කාර්යාලයේ තිබූ කිලෝවොට් ඇම්පියර් 800 ක ධාරිතාවයකින් යුත් විදුලි ජනක යන්ත්‍රය 2019 ජූලි 08 වන දින ඇස්තමේන්තුගත අලුත්වැඩියා පිරිවැය රු.10,466,352 කට සඳහා එහි සැපයුම්කරු වෙත භාර දී තිබුණි. පසුව, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් ගනු ලැබූ තීරණය මත අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව 2021 අගෝස්තු 16 වන දින රු.9,960,575 ක කොන්ත්‍රාත් මුදලකට වෙනත් ලංසුකරුවෙකුට නැවත ප්‍රදානය කොට තිබුණි. අනතුරුව මුල් කොන්ත්‍රාත් මිලෙන් නැවත ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත් මිල රු.12,625,465 ක් සඳහා හෙවත් සියයට 27කින් සංශෝධනය කර තිබුණි. කෙසේ වෙතත්, මුල් සැපයුම්කරු විසින් ප්‍රවාහනය සහ පරීක්ෂා කිරීම සඳහා රු.195,975 ක මුදලක් වැය කර තිබුණද, 2022 ජනවාරි මස අවසානය වන විට විදුලි ජනක යන්ත්‍රය නිෂ්කාර්යයව වසර 2 1/2 ක් ගතවී ඇතත් එය අලුත්වැඩියා කිරීමට කළමනාකාරීත්වය විසින් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(x) මාතර අදියර (IV) ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ලබා ගත් ණයමුදලට අදාලව මණ්ඩලය විසින් වාරිකය ආපසු ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් රු. 162,900 ට සමාන මුදලක් දඩ පොලී ලෙස දැරීමට සිදුව තිබුණි. තවද, 2020 අප්‍රේල් සිට 2021 ඔක්තෝබර් දක්වා කාලය සඳහා බටහිර නිෂ්පාදන ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ විදුලි බිල්පත් ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් රු. 1,815,460 කට සමාන මුදලක් දඩ පොලී ලෙස දරා තිබුණි.

(xi) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.4 වගන්තියට පටහැනිව, වලංගු ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව 2021 ජනවාරි 01 දින සිට 2021 ජූනි 30 දක්වා රුපියල් 1,417,515 ක මුදලක් ගාල්ල කළමනාකාර කාර්යාලය සෘජුවම සැපයුම්කරුවන් වෙත ගෙවා තිබුණි. එසේම ඒ අතරින් අවස්ථා 6කදී නිදහස් කරන ලද රු. 223,000 කට සමාන මුදලක් 2021 ජූනි 30 වන විටත් අදාළ සැපයුම්කරු විසින් පියවා නොතිබුණි.

(xii) කළුතර අල්විස් පෙදෙසේ භූගත ජලාශය ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා එකම ප්‍රමාණපත්‍ර අයිතම වෙනුවෙන් අවස්ථා දෙකකදී සකස් කරන ලද ඉංජිනේරු ඇස්තමේන්තු දෙක අතර සියයට 18.3 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. එබැවින් ඉංජිනේරු ඇස්තමේන්තු සකස්කිරීමේ විශ්වසවන්තභාවය සැකසහිත වේ. තවද, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අකාර්යක්ෂමතාව හේතුවෙන් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට වසරකට ආසන්න කාලයක් ගතවී තිබුණි. ඊට අමතරව කොන්ත්‍රාත්තුවේ විෂය පථය නිසියාකාරව හඳුනා නොගැනීම හේතුවෙන් විවල්‍යතා නියෝග සඳහා රු. 3,736,057ක අතිරේක ගෙවීම් සිදු කර තිබුණි. තවද, ව්‍යාපෘතිය 2020 සැප්තැම්බර් 15 වන දින ප්‍රදානය කර තිබූ අතර මාස තුනක් ඇතුළත අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, 2021 ඔක්තෝබර් 20 වන විටත් අපේක්ෂා කළ පරිදි කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම හේතුවෙන් මණ්ඩලය විසින් කාලදිගුවන් දෙකක් ලබා දී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලය විසින් ලබා දී තිබූ රු. මිලියන 14.8 ක අත්තිකාරම් මුදලින් 2021 ජූලි 31 වන විටත් රු. මිලියන 3.8 ට සමාන මුදලක් පමණක් අය කර ගෙන තිබුණි.

(xiii) කොළඹ දිස්ත්‍රික් නැගෙනහිර ජල සම්පාදන ව්‍යාපෘතියේ අරමුදල්වලින් රු. මිලියන 22.3ක් වැය කරමින් බටහිර නිෂ්පාදන ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ භාවිතය සඳහා 2018 වර්ෂය තුළ කැණීම් යන්ත්‍රයක් ප්‍රසම්පාදනය කර ගෙන තිබුණි. කෙසේ වෙතත්, එය 2021 දෙසැම්බර් වන විටත් පැය 60.5ක් පමණක් භාවිත කර තිබූ අතර 2021 අප්‍රේල් 28 දින සිට (බටහිර නිෂ්පාදන) ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු සඳහා භාවිත කර නොතිබුණි.

(xiv) පොතුවිල් වැඩභාර නිලධාරී කාර්යාලයේ තබා තිබූ රු. මිලියන 10ක් වටිනා බූබල් කැමරා පද්ධතියක් 2017 ජූලි 03 දින අක්කරෙයිපත්තු කළමණාකාර කාර්යාලයට යවා තිබුණි. කෙසේවෙතත්, 2022 ජනවාරි මාසය අවසන් වන විටත් එය අලුත්වැඩියා කර නොතිබුණි.

3. වෙනත් විගණන ගැටළු

(i) එකතුව රු. මිලියන 1,992.88 ක් වූ වෙළඳ ණයගැතියන්, නව සම්බන්ධතා ණයගැතියන්, මලාපවහන ණයගැතියන් සහ වෙනත් ණයගැතියන් ආපසු අයකර නොගෙන වසර දෙකකට වැඩි කාලයක් පැවතුණි. ඉහත ණයගැතියන් අතරින් සියයට 59 ක් කොළඹ, කැලණිය, කෝට්ටේ සහ හම්බන්තොට ප්‍රාදේශිකයන් නියෝජනය කරනු ලැබේ. නව සම්බන්ධතා ණය ගැතියන් වාරික 3 කින් අයකර ගැනීමට නියමිතව තිබුණද, රු.7,359,256 ක් අයකර නොගෙන වසර 3කට වැඩි කාලයක් පැවතුනි.

(ii) බිල්පත් වටිනාකම රු.50.000 වැඩි සහ 2021 නොවැම්බර් 30 දිනට දින 365ක් අඛණ්ඩව නොගෙවූ පාරිභෝගික කාණ්ඩ 20කට අදාළව වෙළෙඳ ණය ගැතියෝ 1975 දෙනෙකුගෙන් රු.මිලියන 244.63ක මුදලක් හිඟව පැවතුණි. ඉහත ශේෂයෙන් රු. මිලියන 4.57 ක් අමාත්‍ය කාර්යාල නිල නිවාස 8 (අටක්) නියෝජනය කරයි.

(iii) බිල්පත් වටිනාකම රු.5.000 ට වැඩි සහ දින 365ක් අඛණ්ඩව නොගෙවූ අමාත්‍ය නිල නිවාස සඳහා ලබාදී ඇති ජල සම්බන්ධතා 42ක් සම්බන්ධයෙන් රු.6,996,050 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට අයකර නොගෙන පැවතුනි. එම සම්බන්ධතා අතරින්, රු.2,277,723 ක බිල්පත් වටිනාකමක් ඇති සම්බන්ධතා 33 ක් අක්‍රියව තිබූ අතර වසර තුනකට වඩා වැඩි කාලයක් ගෙවීම් කර නොතිබුණි.

(iv) මණ්ඩලයේ පාරිභෝගික ප්‍රඥප්තියට අනුව, නව සම්බන්ධතාව ලබාගත් දින සිට දින 30ක් ඇතුළත පළමු බිල්පත පාරිභෝගිකයා වෙත නිකුත් කළ යුතු වේ. කෙසේ වෙතත්, දකුණු කොළඹ, මහරගම, කැස්බෑව, කළුතර සහ මාතර යන ප්‍රාදේශිකයන්හි 2021 නොවැම්බර් 30 දිනට අවස්ථා 149කදී පළමු බිල්පත් භාරදීමේ දී දින 37 සිට දින 329 දක්වා වූ සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

(v) ගාල්ල නගර සභාවේ අනවසර සම්බන්ධතා දෙකකට අදාලව වසර 19 ක ජල පරිභෝජනය සඳහා වූ රු. 1,765,352 ක හිඟ ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි. තවද, ගාල්ල ප්‍රාදේශිකයේ පුද්ගලික කුටුම්භයන්ගේ නීත්‍යානුකූල නොවන

සම්බන්ධතා තුනකට අදාළව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී, රු. 921,097 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(vi) කොළඹ මහ නගර සභාවෙන් අයවිය යුතු රු.28,519,949 ක මුදලක් වසර 5 කට වැඩි කාලයක් තිස්සේ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි.

(vii) 2021 දෙසැම්බර් 31 වන විට විසන්ධි කල හිඟ ණයගැති ශේෂය රු.1,334,585,928 ක් විය. ඒ අතරින් රු.461,330,874 ක ණයගැතියන් හෙවත් සියයට 85 කට සමාන ප්‍රමාණයක් අයකර ගැනීමෙන් තොරව වසර දෙකකට වැඩි කාලයක් පැවතුණි.

(viii) මධ්‍යම ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය සහ හම්බන්තොට ප්‍රදේශිකයේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා තැන්පතු සහ අත්තිකාරම් ලෙස ගෙවා තිබූ පිළිවෙලින් රු. 103,259,692 ක් සහ රු. 28,969,283 ක් විමර්ශනය කර අයකර ගැනීමට පියවර නොගෙන වසර පහකට වැඩි කාලයක් ගිණුම් පොත්වල පැවතුනි. තවද, මධ්‍යම ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයට අදාළව ගෙවන ලද ඉඩම් අත්තිකාරම් සම්බන්ධයෙන් අදාළ ඉඩම් අත්පත් කර ගෙන ඇත්ද හෝ නැද්ද යන්න පිළිබඳව විගණනයට තොරතුරු සැපයීමට වගකිවයුතු නිලධාරීන්ට නොහැකි විය.

(ix) මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සපයන ලද ජල සැපයුම් සහ මලාපවහන පහසුකම් වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල රු. 960,074 ක් විය. කෙසේ වෙතත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව එය රු.467,916ක් ලෙස දක්වා තිබුණි. එබැවින් රු.492,158 ක වෙනසක් නිරීක්ෂණය විය.

(x) හිටපු සේවකයන්ට ලබාදුන් ණය සහ අත්තිකාරම් රු. 17,535,788 ක් අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග නොගෙන වසර අටකට වැඩි කාලයක් ගිණුම් වල පැවතුනි.කෙසේ වෙතත්, විගණනය මගින් සිදු කරන ලද නියැදි පරීක්ෂාව අනුව, ණය සහ අත්තිකාරම් ලබා ගෙන ඇති ඉහත සේවකයින්ගෙන් සියයට 90 කට වැඩි පිරිසකගෙන් නියමිත මුදල අය නොකර විශ්‍රාම ලබා දී ඇති බව නිරීක්ෂණය විය.

(xi) මහනුවර, මහනුවර උතුර, මහනුවර දකුණ සහ දෙහිවල යන ප්‍රාදේශිකයන්හි රු. 43,267,366 ක වෙළෙඳ ණයහිමි ශේෂය වසර 5කට වැඩි කාලයක් නිරවුල් කිරීමට පියවර නොගෙන සමාලෝචිත වර්ෂය අවසානයටත් පැවතුනි. කෙසේ වෙතත්, විගණනයට ලද තොරතුරු අනුව, ගිණුම් පොත්වල නිවැරදිව ගිණුම්ගත කර නොතිබුණද, ඉහත සියලු ණයහිමියන්ට ගෙවිය යුතු මුදල් ගෙවා ඇති බව අනාවරණය විය.

(xii) මධ්‍යම ප්‍රාදේශීය සභය සේවා මධ්‍යස්ථානයේ අවසන් කරන ලද ව්‍යාපෘති සඳහා 2008 වර්ෂය තුළ කොන්ත්‍රාත්කරුවන් තිදෙනකුට ලබා දුන් එකතුව රු. 9,648,214 ක අත්තිකාරම් 2022 අප්‍රේල් 30 වන විටත් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(xiii) ප්‍රධාන කාර්යාලයට අදාළව අවසන් කරන ලද ව්‍යාපෘති සඳහා 2010-2016 කාලපරිච්ඡේදය තුළ කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී ඇති එකතුව රු.මිලියන 41.11ක අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(xiv) නැගෙනහිර ප්‍රාදේශීය සභය සේවා මධ්‍යස්ථානය , බටහිර දකුණ ප්‍රාදේශීය සභය සේවා මධ්‍යස්ථානය, වයඹ ප්‍රාදේශීය සභය සේවා මධ්‍යස්ථානය, සබරගමුව ප්‍රාදේශීය සභය සේවා මධ්‍යස්ථානය, රුහුණුපුර ජ.ස.ව සහ සිතුල්පුව ජල යෝජනා ක්‍රමයට අදාලව නිම කරන ලද ව්‍යාපෘති හයක් (06) සහ අවසන් කරන ලද ව්‍යාපෘති හතරක් (04) සම්බන්ධයෙන් කොන්ත්‍රාත් රඳවාගැනීම් ලෙස තබා ගෙන තිබූ පිළිවෙලින් රු. 1,963,560 ක් සහ රු. 666,375 ක මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ පාර්ශ්ව වෙත නිදහස් කිරීමට හෝ නිසි ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

(xv) මාර්ග සංවර්ධන අධිකාරිය, කොළඹ මහ නගර සභාව, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සහ බේරුවල මහ නගර සභාව ඇතුළු බාහිර ආයතනවල තබා ඇති රු.53,408,746 ක කෙටිකාලීන තැන්පතු ආපසු අයකර නොගෙන වසර තුනකට වඩා වැඩි කාලයක් හිඟව පැවතුනි.තවද, රේඛීය අමාත්‍යාංශයේ තබා තිබූ රු.4,378,828 ක අත්තිකාරම් අයකර නොගෙන වසර නවයකට වඩා වැඩි කාලයක් හිඟව පැවතුනි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා රේඛීය අමාත්‍යාංශයේ බැරකම් ප්‍රකාශයේ එය දක්වා නොතිබූයෙන් මෙම අත්තිකාරම ආපසු අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිත වේ.

(xvi) ආපසු ගෙවිය හැකි තැන්පතු වලට අදාල ව්‍යාපෘති දැනටමත් අවසන්ව තිබුණද, වයඹ ප්‍රාදේශීය සභය සේවා මධ්‍යස්ථානය විසින් මීට වසර දෙකකට පෙර මාර්ග සංවර්ධන අධිකාරියේ තබා තිබූ රු.7,068,327 ක ආපසු ගෙවිය හැකි තැන්පතු අයකර ගැනීමට සැලකිය යුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(xvii) රු.4,466,358 ක් වන ආපසු ගෙවිය හැකි ටෙන්ඩර් තැන්පතු අදාළ පාර්ශ්වයන් වෙත මුදා නොහැර වසර තුනකට වැඩි කාලයක් පැවතුනි. පුරා ඉතිරිව තිබුණි. තවද, ශ්‍රී ලංකා මූදල් රෙගුලාසි සංග්‍රහයේ 571(2) වගන්තියට අනුව පියවීමට ක්‍රියා නොකර දැනටමත් ආදායමට මාරු කර ඇති තැන්පතු ආපසු ගෙවීම හේතුවෙන් රත්නපුර ප්‍රදේශිකයේ ආපසු ගෙවිය හැකි ටෙන්ඩර් තැන්පතුවෙහි රු.188,808 ක අසාමාන්‍ය හර ශේෂයක් පැවතුනි. කෙසේ වෙතත්,

වර්ෂය අවසන් වන විටත් අසාමාන්‍ය හර ශේෂය නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(xviii) 1999 සිට 2006 දක්වා වර්ෂයන් තුළ ත්‍රිකුණාමලය, කැලණිය සහ අම්පාර ප්‍රාදේශිකවල සිදු කරන ලද රු.මිලියන 246.64 ක මුදල් වංචාවන් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. කෙසේ වෙතත්, ත්‍රිකුණාමලය ප්‍රාදේශිකය හා සම්බන්ධව රු. මිලියන 171.9 ක මුදල් වංචාව අතරින් රු.මිලියන 24.15 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානයට වෙනත් ණය ගැතියන් ලෙස වාර්තා කොට තිබුණි. තවද, 2001 වර්ෂය තුළ බණ්ඩාරවෙල ප්‍රාදේශිකයේ සිදු කළ රු. 272,735 ක තවත් මුදල් වංචාවක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් වගකිව යුතු පුද්ගලයින්ගෙන් අය කරගෙන නොතිබුණි.

(xix) මූල්‍ය ප්‍රකාශනයන් අනුව 2021 දෙසැම්බර් 31 දිනට මාර්ගස්ථ තොග (දේශීය මිලදී ගැණුම්) සහ ආනයනික මාර්ගස්ථ තොග පිළිවෙලින් රු. 61,113,682 ක් සහ රු. 2,224,233,337 ක් විය.ඒ අතරින් වටිනාකම රු. 454,921,632 ක් වන තොග විමර්ශනයකින් තොරව වසරකට වඩා වැඩි කාලයක් පැවතුණි.

(xx) ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ "සැමට ජලය" සංකල්පය සමඟ ඒකාබද්ධව 2020-2025 සඳහා ආයතනික සැලැස්මට අනුව වර්ෂය සඳහා 301,762 ක නව සම්බන්ධතා ඉලක්කයක් ස්ථාපිත කර තිබූ අතර පසුව එම ඉලක්කය වසර තුළදී 215,000 දක්වා සංශෝධනය කර තිබුණි. කෙසේ වෙතත්, වර්ෂය තුළ ලබා දුන් නව සම්බන්ධතා සංඛ්‍යාව 192,087 ක් විය. එසේ වුවද, පසුගිය වර්ෂය හා සංසන්දනය කිරීමේදී නව සම්බන්ධතා සංඛ්‍යාව සියයට 56 කින් වැඩි වී තිබුණද, 2019 සිට 2020 දක්වා වර්ධනයට සාපේක්ෂව 0.06 ක සෘණ වර්ධනයක් පෙන්නුම් කරමින් පූර්ව වර්ෂය හා සැසඳීමේදී මනුගත විකුණුම් ආදායම සියයට 0.1 කින් පමණක් වැඩි වී තිබුණි.

(xxi) බණ්ඩාරවෙල ප්‍රදේශිකයේ, මොනරාගල, මාතර සහ ගාල්ල ප්‍රදේශිකයන්හි රු. 157,743,595 ක් වූ වෙළෙඳ ණයහිමියන්ගේ අසාමාන්‍ය හර ශේෂයක් විමර්ශනය කොට නිරවුල් කිරීමට පියවර නොගෙන ගිණුම්වල පැවතුනි. ඉහත ශේෂයෙන් 2015 සහ 2016 වර්ෂවල සිට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් රු.17,482,910ක් බණ්ඩාරවෙල ප්‍රාදේශිකයේ පැවතුනි.

(xxii) විදේශීය මූල්‍යන ව්‍යාපෘති පහකට (05) අදාලව කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගන්නා ලද රු. 321,662,628ක ජාතික ගොඩනැගීමේ බද්ද 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මණ්ඩලය විසින් ගෙවා නොතිබුණි.

(xxiii) පානදුර ප්‍රාදේශිකයට අදාළව නව සම්බන්ධතා ණය ගැතියන්ගේ පැවති රු.5,545,062 ක අසාමාන්‍ය බැර ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විමර්ශනය කොට නිරවුල් කර නොතිබුණි.

(xxiv) උඟව ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ මාර්ගස්ථ මුදල්හි පැවති රු.858,379 ක අසාමාන්‍ය බැර ශේෂයක් විමර්ශනය කොට නිරවුල් කිරීමකින් තොරව පැවතුනි.

(xxv) ව්‍යාපෘති අටකට අදාලව කොන්ත්‍රාත් අත්තිකාරම්හි(00/0/07/242/0 සහ 00/0/05/242/0) රු. 1,202,772 ක අසාමාන්‍ය බැර ශේෂයක් විමර්ශනයකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානයට පැවති බව නිරීක්ෂණය විය.

(xxvi) කළුතර කළමණාකාර කාර්යාලයට අදාළව සම්බන්ධතා ලබාදුන් දින සහ පාරිභෝගිකයන් වෙත පළමු බිල්පත් නිකුත් කරන දිනය අතර දින 57 සිට 186 දක්වා සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(xxvii) මුදල්, ආර්ථිකය සහ ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් 2020 ජූනි 18 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය මත පදනම්ව මණ්ඩලයේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා, ව්‍යාපෘති සහ මූල්‍ය බැඳීම් මූල්‍යනය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් රු. බිලියන 30 ක ණයක් ලබා ගැනීමට 2020 ජූනි 24 වැනි දින අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ඉහත තීරණයට පටහැනිව 2019 සිට 2021 දක්වා අවස්ථා තුනකදී රු. බිලියන 32 ක ණය මුදලක් ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් මණ්ඩලය ලබාගෙන තිබුණි. තවද, එම ණය මුදල සඳහා පොලී ගෙවීම ලෙස රු. මිලියන 2,181.17 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ අතර එම පොළියෙන් එම ණය මුදලෙන් සිදු කල ණය සේවාකරණ සඳහා පොළිය ලෙස රු. 2,080.58 ට සමාන මුදලක් වැය කර තිබුණි. ඊට අමතරව මණ්ඩලයේ වාර්ෂික අයවැය තුල රු.බිලියන 17ක් දැනටමත් වෙන් කර තිබුණද, ලබා දුන් ණය මුදලින් ණය අරමුණුවලට පටහැනිව "සැමට ජලය ව්‍යාපෘතිය" සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රු.මිලියන 66.6ක් වැය කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ණය මුදලින් සැමට ජලය ව්‍යාපෘතිය සඳහා දැරූ මුදල වෙනුවෙන් රු.මිලියන 10.43ක් ජල සම්පාදන අමාත්‍යාංශය විසින් ප්‍රතිපූරණය කිරීමට සිදු ව තිබුණි.

(xxviii)රු.245,893,002 ක මුදලක් ආපසු ලබා ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන වසර තුනකට වැඩි කාලයක් ලැබිය යුතු රඳවා ගැනීමේ බදු ලෙස පැවතුනි. කෙසේ වෙතත්, රු.111,540,855 ක සවිස්තරාත්මක උපලේඛන විගණනය වෙත සපයා නොතිබුණු බැවින්

සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හරහා ශේෂය තහවුරු කර නොතිබීම හේතුවෙන් ශේෂයේ පැවැත්ම තහවුරු කරගත නොහැකි විය.

(xxix) වසර 5ක් සහ වසර 6ක් ඇතුළත අයකර ගැනීමට සේවකයන්ට ලබාදී ඇති රු.2,509,328,912ක ආපදා ණයවලින් සේවකයින් 187 දෙනෙකුට ලබාදී තිබූ රු. 13,773,945ක ණය ශේෂය නියමිත දින තුළ අයකරගෙන නොතිබුණි. ඒ හා සමානව, 2011 සිට 2020 දක්වා කාලය තුළ සේවකයින් 123 දෙනෙකුට ලබා දුන් රු. 599,250 ක උත්සව අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි.

(xxx) බටහිර නිෂ්පාදන ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ සේවකයින් 11 දෙනෙකු පදිංචිව සිටින නිල නිවාස සඳහා නියමිත ගාස්තුවලට වඩා අඩු ගාස්තුවක් අය කිරීම හේතුවෙන් මණ්ඩලයට රු.1,432,839 ක් අහිමි වී තිබුණි.

(xxxi) ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි සංග්‍රහයේ 806 වගන්තියට අනුව නිසි අනුමැතියකින් තොරව ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ(ජල සම්පාදන අමාත්‍යාංශය මගින් අධීක්ෂණය කරනු ලබන) තනි කොන්ත්‍රාත්කරුවෙකුට ලබා දී ඇති රු. මිලියන 31.06 ක් වටිනා ඩීසල් පයිප්ප සහ උපාංග ලබා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(xxxii) ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර අවශ්‍ය අරමුදල් ලබා නොගෙන ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා මණ්ඩලයේ උතුරු මැද ප්‍රාදේශිකය විසින් රු.1,417,916 ක් වැය කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් දරන ලද පිරිවැය ප්‍රතිපූරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

කෙටි යෙදුම්

AC	ඇස්බෙස්ටෝ සිමෙන්ති
ADB	ආසියානු සංවර්ධන බැංකුව
ADRA	ඇඩ්වෙන්ටිස්ට් සංවර්ධන හා සහන ඒජන්සිය
AE	ප්‍රාදේශීය ඉංජිනේරු
AFD	ප්‍රංශ සංවර්ධන ඒජන්සිය
AGM	සහකාර සාමාන්‍යාධිකාරී
AIWSP	ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය
AWSSIP	අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩි දියුණු කිරීමේ හා බල ශක්ති සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය
BMICH	බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව
BOC	ලංකා බැංකුව
BOQ	ප්‍රමාණ පත්‍රය
BOI	ආයෝජන මණ්ඩලය
CBO	ප්‍රජා මූල සංවිධානය
CCN	කොළඹ නගරය උතුර
CCS	කොළඹ නගරය දකුණ
CCTV	සංවෘත පරිපථ රූපවාහිනිය
CEA	මධ්‍යම පරිසර අධිකාරිය
CEB	ලංකා විදුලි බල මණ්ඩලය
CETRAC	ඉදි කිරීම් උපකරණ පුහුණු කිරීමේ මධ්‍යස්ථානය
CHPB	නිවාස සැලැසුම් කිරීම හා ඉදි කිරීම වෙනුවෙන් වූ මධ්‍යස්ථානය
CI	වාත්තු යකඩ
CIPM	කාර්ය මණ්ඩල කළමනාකරණය පිළිබඳ වරලත් ආයතනය
CKDU	නොදන්නා හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය
CMC	කොළඹ මහා නගර සභාව
CP	සමූහික සැලැසුම්කරණය / සාමූහික සැලැසම
CRIP	දේශගුණික ප්‍රත්‍යස්ථ භාවය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය
CRIWMP	දේශගුණික ප්‍රත්‍යස්ථ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය
CS	සාමූහික සේවා
Cu. m	ඝණ මීටර
DAB	ආරාවුල් විනිශ්චය කිරීමේ මණ්ඩලය
DEWATS	විමධ්‍යගත අපජල ප්‍රතිකාරිත කිරීමේ හා බැහැර කිරීමේ ක්‍රමය
DGM	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
DGM (WC)	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බටහිර මධ්‍යම)
DI	මෘදු යකඩ
DMA	ඩිස්ත්‍රික් මණ්ඩ ප්‍රදේශ
DoNCWS	ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව
DS	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
DSC	සැලැසුම් හා අධීක්ෂණ උපදේශක මණ්ඩලය
DSD	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
DZUWSP	වියළි කලාපීය නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය
EIA	පාරිසරික බල පෑම් තක්සේරුව
EPZ	අපනයන සකස් කිරීමේ කලාපය
EWSP	ඇටම්පිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය
GCWWMIIP	විසල් කොළඹ ජල හා අපජල කළමණාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩ සටහන
GIS	භූගෝලීය තොරතුරු පද්ධතිය
GKWRC	විසල් කුරුණෑගල ජල පිළිසැකැසුම් මධ්‍යස්ථානය
GM	සාමාන්‍යාධිකාරී
GMWSP	විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය
GN	ග්‍රාම නිලධාරී
GND	ග්‍රාම නිලධාරී කොට්ඨාශය
GOSL	ශ්‍රී ලංකා ජන රජය
GPOBA	නිමැවුම් පදනම් වූ ආධාර පිළිබඳ ගෝලීය හවුල
GR	බිම් ජලාශය
HDPE	ඉහළ ඝණත්වයේ පොලි එතිලින්
HRM	මානව සම්පත් කළමනාකරණය
IEC	ජාත්‍යන්තර විද්‍යුත් තාක්ෂණික කොමිසම
ICT	තොරතුරු හා සංනිවේදන තාක්ෂණවේදය
ICTAD	ඉදි කිරීම් පුහුණු කිරීම් හා සංවර්ධනය වෙනුවෙන් වූ ආයතනය
IWA	ජාත්‍යන්තර ජල සංගමය
IWSP	ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය
IEE	මූලික පාරිසරික පරීක්ෂණය
IESL	ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය
IMS	ඉන්වෙන්ටරි (වට්ටෝරු පොත්) කළමනාකරණ පද්ධතිය
IoT	දේවල් වල අන්තර්ජාලය
ISO	ප්‍රමිතිකරණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය
IT	තොරතුරු තාක්ෂණවේදය
ITEC	ඉන්දියානු තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාවය
IPVPN	අන්තර්ජාල මූල ලේඛ අතථ්‍ය පෞද්ගලික ජාලය
JICA	ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය
JPY	ජපන් යෙන්
KCWMP	මහනුවර මහ නගර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය
Km	කිලෝ මීටර
KRB	කැළණි දකුණු ඉවුර
LBF	දේශීය බැංකු අරමුදල්
LKR	ශ්‍රී ලංකා රුපියල්
M&E	යාන්ත්‍රික හා විද්‍යුත්
MD&T	මිනිස් බල සංවර්ධන හා පුහුණු කිරීම්
MIS	කළමනාකරණ තොරතුරු ක්‍රමය (පද්ධතිය)
MoU	අවබෝධතා ගිවිසුම
M Sc	විද්‍යාපති
MMDC	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
NAITA	ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
NBRO	ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
NC	උතුරු මැද
NCP	උතුරු මැද පලාත
NDB	ජාතික සංවර්ධන බැංකුව
NDT	ජාතික තාක්ෂණවේදී ඩිප්ලෝමාව
NGOs	රාජ්‍ය නොවන සංවිධාන
NHDA	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
NIBM	ව්‍යාපාර කළමනාකරණ ජාතික ආයතනය

NPD	ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව
NRW	ආදායම් රහිත ජලය
NWSDB	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
O&M	මෙහෙයුම් හා නඩත්තු
OKP	ඔරේන්ජ් දැනුම වැඩ සටහන
PAM	පොලිඇක්‍රිලමයිඩ්ස්
PE	පොලි එතිලින්
PVC	පොලිවිනිල් ක්ලෝරයිඩ්
OIC	ස්ථානය භාර නිලධාරි
P&D	ක්‍රම සම්පාදනය හා සැලැසුම් කිරීම
PAC	ව්‍යාපෘති අගැයීම් කමිටුව
PDMRC	ක්‍රම සම්පාදන හා සැලැසුම් අත්පොත් සමාලෝචන කමිටුව
PMU	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
PRDA	පලාත් මාර්ග සංවර්ධන අධිකාරිය
PTB	ෆිසිකැලිෂ් ටෙක්නිෂේ බුන්ඩෙසන්ස්ඩාල්ට්
PWD	පොදු වැඩ දෙපාර්තමේන්තුව
R&D	පර්යේෂණ හා සංවර්ධනය
RDA	මාර්ග සංවර්ධන අධිකාරිය
RDB	ග්‍රාමීය සංවර්ධන බැංකුව
RFP	යෝජනා ඉල්ලා සිටීම
RIDEP	ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
RM	ප්‍රාදේශීය කළමනාකරු
RO	විලෝම ආශ්‍රැති
RSC	කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය
RSC (WN)	කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය (බටහිර උතුර)
RSC (WS)	කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය (බටහිර දකුණ)
RSC (N)	කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය (උතුර)
RSC (NW)	කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය (වයඹ)
RWS	ග්‍රාමීය ජල සම්පාදනය
SBD	සම්මත ලංසු තැබීමේ ප්‍රලේඛන
SCADA	අධීක්ෂණාත්මක පාලනය හා දත්ත අත් පත් කර ගැනීම
SCAPC	අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රති සම්පාදන කමිටුව
SDG	තිරසාර සංවර්ධන ඉලක්ක
SEP	සනීපාරක්ෂණය නංවා ලීමේ ව්‍යාපෘතිය
SHIFT	නගර වෙනුවෙන් වූ සනීපාරක්ෂණ හා ස්වස්ථතා ආරම්භක ක්‍රියා
SIDA	ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය
SLIDA	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
SLSI	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
SMS	කෙටි පණිවුඩ සේවාව
ST	කුඩා නගරය
STP	පුතික ප්‍රතිකාරක යන්ත්‍රාගාරය
TA	තාක්ෂණික සහාය
TCE	මුළු පිරිවැය ඇස්තමේන්තුව
THM	ට්හාලෝමීතේන්
ToR	යොමු වීමේ නියමයන්
ToT	පුහුණු කරන්නන් පුහුණු කිරීම
UDA	නාගරික සංවර්ධන අධිකාරිය
UNDP	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන
UNICEF	එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා හදිසි අවස්ථා අරමුදල
UPVC	ප්ලාස්ටික් නොකරන ලද පොලිවිනිල් ක්ලෝරයිඩ්
USD	එක්සත් ජනපද ඩොලර
VPN	අතථ්‍ය පෞද්ගලික ජාලය
VPP	වවුනියා සහභාගිත්ව ක්‍රම සම්පාදනය
VAT	අගය එකතු කළ බද්ද
WaSSIP	ජල සම්පාදනය හා සනීපාරක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය
WDCE	ජල හා සංවර්ධන සම්මන්ත්‍රණය හා ප්‍රදර්ශනය
WHO	ලෝක සෞඛ්‍ය සංවිධානය
WSP	ජල සම්පාදන ව්‍යාපෘතිය / ජල සුරක්ෂිතතා සැලැසුම
WSS	ජල සම්පාදන යෝජනා ක්‍රමය
WTP	ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය
WWDS	අපජලය බැහැර කිරීමේ පද්ධතිය / ක්‍රමය
WWTP	අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

සංස්ථානික තොරතුරු

සංවිධානයේ නම
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

නෛතික ආකෘතිය
රජයට අයත් ව්‍යවස්ථාපිත මණ්ඩලය

ස්ථාපිත කරන ලද දිනය
1974 අංක 2 දරණ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල නීති පාර්ලිමේන්තු පණත මගින් 1974 මාර්තු 1 වැනි දින 1992 අංක 13 දරණ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පණත මගින් 1992. 03.11 වැනි දින පණත සංශෝධනය කරන ලදි.

බදු හැඳුනුම් අංකය
4090 31820

අගය එකතු කළ බදු ලියාපදිංචි අංකය
4090 31820 7000

සම්බන්ධ වීම - ප්‍රධාන කාර්යාලය
ගාළු පාර, රත්මලාන, ශ්‍රී ලංකාව දුරකථන +94 11 2638999 (හිසැරුම්),
+94 11 2637194, +94 11 2611589
ෆැක්ස් : +94 11 2636449
විද්‍යුත් තැපෑල : gm@waterboard.lk වෙබ් අඩවිය : www.waterboard.lk

රේඛීය අමාත්‍යාංශය
ජල සම්පාදන අමාත්‍යාංශය

ඇමතුම් මධ්‍යස්ථානය
1939 (පැය 24)

ගණුදෙනුකාර සේවා ඒකකය
+94 11 2623623 (කාර්යාල වේලාවන් තුළ)

බැංකු කරු
ලංකා බැංකුව

විගණකයින්
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) රජයේ විගණන ඒකකය

අධ්‍යක්ෂ මණ්ඩලය
නිශාන්ත රණතුංග මහතා - සභාපති,
ජා. ජ ස හා ජ. ම. (2020. 01. 16 වැනි දින සිට)

නිමල් ආර් . රණවක මහතා - උප සභාපති,
ජා. ජ ස හා ජ. ම. (2020. 01. 23 වැනි දින සිට)

ආචාර්ය එල් ටී. ගම්ලත් - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
ජා. ජ ස හා ජ. ම. (2020. 01. 22 වැනි දින සිට)

ඒ. ආර්. වික්‍රමසිංහ මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
ජා. ජ ස හා ජ. ම. (2020. 01. 11 වැනි දින සිට)

ඉංජිනේරු ටී. එම්. ආර්. පී. තෙන්නකෝන්, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
ජා. ජ ස හා ජ. ම. (2020. 01. 09 වැනි දින සිට)

ඉංජිනේරු ආර්. ඒ. එස්. එල්. රණසිංහ, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
ජා. ජ ස හා ජ. ම. (2020. 02. 18 වැනි දින සිට)

බී. එන්. දම්මිත්ද කුමාර මහතා, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
ජා. ජ ස හා ජ. ම. (2020. 06. 22 වැනි දින සිට)

වී. ටී. එස්. කේ. සිරිවර්ධන මහතා, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
ජා. ජ ස හා ජ. ම. (2021. 03. 12 වැනි දින සිට)

නයනා නාතවිතාරණ මෙනෙවිය, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
ජා. ජ ස හා ජ. ම. (2021. 09. 23 වැනි දින සිට)

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්
ඩබ්ලිව්. පී. සඳමාලි ද සිල්වා මහත්මිය

ජ්‍යෙෂ්ඨ කළමනාකරණය
ඉංජිනේරු ටී. එස්. විජේතුංග සාමාන්‍යාධිකාරී

ඉංජිනේරු කේ. ඩී. පී. එෆ්. සිරිවර්ධන -
අතිරේක සාමාන්‍යාධිකාරී (මධ්‍යම / වයඹ / සබරගමුව)

ඉංජිනේරු එම්. කේ. ඩී. ජේ. එච්. මීගොඩ
අතිරේක සාමාන්‍යාධිකාරී (උතුර / උතුරු මැද)

ඉංජිනේරු අයි. වී. ඩබ්ලිව්. එදිරිවීර
අතිරේක සාමාන්‍යාධිකාරී (ජල පිළිසැකැසුම්)

ඉංජිනේරු වසන්තා ඉලංගසිංහ (මහත්මිය)
(ප්‍රතිපත්ති හා ක්‍රම සම්පාදන)

ඉංජිනේරු ආර්. ඒ. ඒ. රණවක -
අතිරේක සාමාන්‍යාධිකාරී (දකුණු / ඌව / නැගෙනහිර)

ඉංජිනේරු කේ. පී. ආර්. එස් . සමරසිංහ
අතිරේක සාමාන්‍යාධිකාරී (ජල සම්පාදන ව්‍යාපෘති)

ඉංජිනේරු සී. සී. එච්. එස්. ප්‍රනාන්දු
අතිරේක සාමාන්‍යාධිකාරී (බටහිර)

ඉංජිනේරු එස්. ජී. ජී. රාජ්කුමාර් (සාමූහික සේවා)

ජී. කේ. ඉද්දමල්ගොඩ මහතා (මානව සම්පත් කළමනාකරණය

ආර්. ඒ. එම්. එස්. වීරසේන මහතා
අතිරේක සාමාන්‍යාධිකාරී (මුදල්)

එස්. ඒ. රෂීඩ් මහතා -
අතිරේක සාමාන්‍යාධිකාරී (පාරිභෝගික හා වත්කම් කළමනාකරණ)

අංශ භාරව කටයුතු කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන්

එන්. වයි. එස්. අබේගුණවර්ධන මහත්මිය (කාර්මික සම්බන්ධතා)
එම්. ඒ. එස්. එස්. කේ. චන්ද්‍රසිරි මහතා (මානව සම්පත්)
ආර්. එම්. ඒ. බණ්ඩාර මහතා (සැපැයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය) -
එම්. එම්. එස්. පීරිස් මහත්මිය (මුදල්)
ඒ. ජී. එස්. කුමාර මහතා (පිරිවැයකරණය)
ඉංජිනේරු ජී.ඒ. පී. පත්මනාත (වාණිජ)
ඉංජිනේරු එම්. කේ. ඒ. ජේ. එම්. විජේසිංහ (මහත්මිය) (සාමූහික සැලසුම්)
ඉංජිනේරු එම්. ඒ. සී. හේමචන්ද්‍ර (කුඩා නගර හා ග්‍රාමීය ජල සම්පාදන)
ඉංජිනේරු ජේ. ඒ. ඒ. පී. ජයසිංහ (සංවර්ධන) - ආවරණ
ඉංජිනේරු ජේ. එල්. සීක්කුගේ
(ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති)
ඉංජිනේරු ටී. වී. ජී. යූ. රංජිත් (යාන්ත්‍රික හා විද්‍යුත්)
ඉංජිනේරු ඒ. මුණසිංහ (ක්‍රම සම්පාදන හා සැලැසුම්)
ඉංජිනේරු ජේ. චන්ද්‍රදාස (තොරතුරු තාක්ෂණවේදය)
ඉංජිනේරු ධනේෂ් ගුණතිලක (ජල පිළිසැකැසුම්)
යූ. ජේ. සමරසිංහ මහතා (අභ්‍යන්තර විගණන)

පලාත් හා ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයන් භාරව සිටින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්
ඉංජිනේරු ඒ. කේ. කපුරුගේ (බටහිර මධ්‍යම)
ඉංජිනේරු එම්. ටී. එම්. රසිල් (බටහිර දකුණ)
ඉංජිනේරු එන්. යූ. කේ. රණතුංග (බටහිර උතුර
ඉංජිනේරු එල්. පී. ඒ. පී. පෙරේරා (නිෂ්පාදන) ආවරණ
ඉංජිනේරු ඩී. වී. මැදවත්ත (වයඹ)
ඉංජිනේරු ටී. එම්. එම්. එච්. තෙන්නකෝන් (මහත්මිය) (උතුරු මැද)
ඉංජිනේරු ජී. වී. විජේරත්න (මධ්‍යම)
ඉංජිනේරු ඒ. එම්. ඒ. රෆීක් (උතුර)
ඉංජිනේරු එම්. එම්. එම්. නසීල් (ඌව)
ඉංජිනේරු ඩබ්ලිව්. ජී. සී. එල් . වීරසේකර (සබරගමුව)
ඉංජිනේරු ඒ. මහතන්තිල (දකුණු)
ඉංජිනේරු එන්. සුදේෂන් (නැගෙනහිර)

ව්‍යාපෘති අධ්‍යක්ෂ වරුන් වශයෙන් කටයුතු කරනු ලබන අතිරේක සාමාන්‍යාධිකාරීවරුන් හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන්
ඉංජිනේරු එන්. එච්. ඩී. පී. ධර්මපාල
(ගම්පහ අත්තනගල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය)
ඉංජිනේරු ටී. බරතිදාසන්
(යාපනය කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතිය)
ඉංජිනේරු එන්. ඒ. එස්. ශාන්ත
(කැළණි දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය)
ඉංජිනේරු ටී. ආර්. ජේ. ප්‍රනාන්දු
(කළු ගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය)
ඉංජිනේරු ජී. එම්. තිලකරත්න
(පොල්ගහවෙල, පොතුහැර හා අලව්ව ජල සම්පාදන ව්‍යාපෘතිය)
ඉංජිනේරු ඒ. පී. ගුණවර්ධන මහත්මිය
(ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය)